බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 32

සූත්‍රාන්තපිටකයෙහි

26 වන ග්‍රන්ථය

කුද්දගත්සහියේ දෙළොස්වැනි වූ

ජාතකපාළි

තෘතීය භාගය

එක්සත් අමරපුර නිකායික මහාසංඝසභාවේ සභාපති
මඩිහේ සිරි පඤ්ඤාසීහාභිධාන
මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් කළ
සිංහල අනුවාදය
සතර කෝරළ මහදිසාවේ ප්‍රධාන සංඝනායක ධුරන්ධර
මාකඩවර ශ්‍රී රෙවත පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත
ශ්‍රී ධම්මක්ඛන්ධ රෙවත
කරහම්පිටිගොඩ ශ්‍රී සුමනසාර
නායක ස්ථවිරයන් වහන්සේ විසින්
පාඨශෝධන පූර්වක වැ කළ විශේෂ සංස්කරණයෙන් යුක්ත යි.

ශ්‍රී බු: ව: 2550
රාජ්‍ය වර්ෂ: 2006

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

Buddha Jayanti Tripitaka Series, Volume 32

The Twenty-sixth Book in the

Suttanta-Pitaka

Khuddaka-Nikāya (9)

26

JĀTAKA PĀLI (III)

With the Sinhala translation by

Venerable Siri Madihe Paññāsīha

Mahānāyaka Thera

The President of United Amarapura Nikāyika Mahā Sanghasabhā

&

The Special Edition by

Venerable Pandit Sri Dharmaskandha Rewata

Karahampitigoda Sumanasāra

Nāyaka Thera

The Principal of Sri Rewata Pirivena Makadawara &

The Chief High Priest of The Province of Four Koralas

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.



නමෝ තස්ස භගවෙතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !
නමෝ තස්ස භගවෙතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!
නමෝ තස්ස භගවෙතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

මෙම බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව,
නිවනේ සැනසීම සොයන සෑම ලොවසියෙකුටම
පරිහරණය කළහැකි ලෙස සැකසීමට නන් අයුරින් දායකත්වය දැක්වූ
සෑම උතුමන්ටම පළමුව ස්තුතිය පුදකරන අතරම
යමෙක් මෙම බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව පරිහරණයෙන්,
යම් සත් කටයුත්තක් කරන්නේනම් එහි ද,
නිවනේ සැනසීම ලාබනම් එහි ද
සියලු ආනිසංසයෝ මෙම බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව
මේ අයුරින් සැකසීමට දායකත්වය දැක්වූ
ඔවුන් සෑම දෙනාටම අනුමෝදන් වෙත්වා!!!
නිවන් දකින තුරු අභිවුර්ධියක්ම වෙත්වා!!!
පතනා බෝධියකින් වහා වහා නිවනේ සැනසීම ම අත්වේවා!!!

ඔබ සැමට යහපතක්ම වෙත්වා!!!

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සැලකිය යුතුය :

මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත. එහි පටුන මත ඇති මාතෘකා මත click කිරීම මඟින් ඊට අදාල පිටුව වෙතට යොමුවේ.
නැවත පටුන වෙතට යොමුවීමට Table of Contents හෝ පිටු අංකය (20) සටහන් කර යොමු වන්න.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

ජාතකපාළි

තතියො භාගො

සූත්‍රාන්තපිටකයෙහි කුද්දගත්සඟියේ

ජාතකපාළි

තෘතීය භාඟය

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

පටුන
CONTENTS

	පිටු
සංස්කාරක නිවේදනය	xv
ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය	xvii
සඞ්ක්ෂිප්ත නිරූපණය	xix
සංඥාපනය	xxi–xxvii
පාළි හෝඩිය	xxix
විසය සූචි	xxxi–xxxii
පෙළ හා පරිවර්තනය	2–487
ගාථාදිපාදානුක්‍රමණිකා	489–535
සඤ්ඤානාමානුක්‍රමණිකා	537–541
විසෙසපදානුක්‍රමණිකා	543–557
ශෝධ්‍යස්ථාන දර්ශනය	559
බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා	561

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සංස්කාරක නිවේදනය

තිලෝගුරු සම්මාසම්බුදුන් බුද්ධත්වයට පැමිණ දම්සක් පවත්වා ආරම්භ කළ පයවත්පති ශාසනය පරිනිර්වාණමඤ්චකය දක්වා දිව්‍යමනුෂ්‍යාදි අනන්ත අපරිමාණ සත්ත්වගියාට ලොවිලොවුතුරු හිතසුව සාධමින් ආකාශගඞ්ගාප්‍රවාහයක් සෙයින් අවිච්ඡින්න වැ පැවැත්තේ යැ. මලස්නෙකැ හුයෙන් නොගොතා ලූ මල්රැසක් සෙයින් සම්මිශ්‍ර වැ තුබූ චතුරාසීති-සහස්‍රසංඛ්‍යාත ධර්මස්කන්ධය මහාකාශ්‍යප සථවිරාදි සංගීතිකාරක මහතෙරවරුන් විසින් ග්‍රහණධාරණාදියෙහි සෞකර්‍ය්‍ය පිණිස ධර්මවිනය විසින් නිකායාදි විසින් සංග්‍රහ කොට සංගීත විය. (සංගීතිකථා මහාවග්ග-ප්‍රස්තාවනායෙන් දන්නේ යැ.)

තවද ත්‍රිපිටකධර්මයෙහි අංගවශයෙන් කළ බෙදීමෙක් ද ඇත. ඒ වූකලි ''ඉධ පන භික්ඛවෙ එකච්චෙ කුලපුත්තා ධම්මං පරියාපුණන්ති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුත-ධම්මං වෙදල්ලං'' යී බුදුරදුන් විසින් මැ අලගද්දූපමසූත්‍රාදියෙහි වදළ ධර්ම්ය අංගවශයෙන් නවවැදැරුම් වන පරිදි බුදුන් විසින් මැ වදරනලද්දේය. සංගීතිකාරක තෙරවරුන් විසින් මේ නවාංගයෙහි උදාන ඉතිවුත්තක ජාතක යන අංගත්‍රය වෙන වෙන ග්‍රන්ථ වශයෙන් කුදුගත්සඟි-යෙහි ලා සංගීත වූව ද ඉතිරි අංග සය ත්‍රිපිටකයෙහි ඒ ඒ තැනින් ලක්ෂණවශයෙන් නහාගතයුතු වෙයි. ජාතක වූකලි බුදුරජාණන්වහන්සේ ජීවමාන ව වැඩහුන් පන්සාළිස් හවුරුද්ද මුළුල්ලෙහි ඒ ඒ කාරණයට පැමිණ වදරනලද අපණ්ණක ජාතකාදි පන්සියපනසක් පමණ වූ බොධිසත්වාපදනයෝ යැ. එහෙයින් ජාතකකථා බුද්ධචරිතයෙහි ලා සංග්‍රහ වෙති. එහි ජාතකගාථා හා අතීත කථාව ද බුදුරදුන් විසින් මැ වදරනලද්දේ ය. සිංහල ජනතාවගේ බෞද්ධසංස්කෘතිය ගොඩනහා-ලීමෙහි ලා ජාතකකථායෙන් ලැබුණු පිටිවහල ද අසීමිත වෙයි. ජාතක-දෙශනාව පිළිබඳ වැ අන්‍යත් කියැයුතු දැ මෙහි සංඥාපනයෙන් දන්නේ යැ.

දෙදහස්පන්සියවැනි බුද්ධජයන්ති පූජොත්සවය අනුස්මරණය කරනු සඳහා ලංකාබෞද්ධමණ්ඩලය මගින් ආරම්භ කළ සත්කාර්‍ය්‍යයන් කෙරෙහි අතිශයින් අර්ථාවහ වූයේ ත්‍රිපිටකධර්මය සියබසට නහා මුද්‍රණය කරවාලීම යැ. එහි ජාතකපාළි සිංහල පරිවර්තනය සඳහා ආරාධිත වූවාහු අමරපුර මහාසංඝසභාවේ වර්තමාන සභාපතිධුරන්ධර මඩිහේ සිරි පඤ්ඤාසීහාභිධාන මහානායකස්ථවිරයන් වහන්සේ ය. උන්වහන්සේ විසින් යථාකාලයෙහි කරනලද සිංහල පරිවර්තනය පාඨශොධනපූර්වක වැ ත්‍රිපිටක සම්පාදක-මණ්ඩලය මගින් සංස්කරණය කළයුතු විය. විශෙෂයෙන් ජාතකපරිවර්තන සංස්කරණය ත්‍රිපිටකයෙහි විසාරද බුද්ධිප්‍රභා ඇති හිඟුලේ මාකඩවර ශ්‍රී රෙවත පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත කරහම්පිටිගොඩ ශ්‍රී සුමන-

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සාරාභිධාන සතරකෝරළ මහදිශායෙහි ප්‍රධාන සංඝනායක ස්ථවිරයන් වහන්සේ විසින් සිදුකරන ලද්දේ ය. වෙස්සන්තර ජාතක අනුවාදය උන්වහන්සේ විසින් අමුතු වැ ලියන ලද්දේ ය.

බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලායෙහි මෙමැ ජාතකපාළි තෘතීයභාගය 32වැනි ග්‍රන්ථය වශයෙන් සලකනලද්දේ ය. සූත්‍රාන්තපිටකයෙහි සවිසිවන ග්‍රන්ථය යි. මෙහි ද ධර්මගවෙෂීනට එලවත් වූ ගාථාදිපාද, සංඥානාම හා විශෙෂපදයනුදු සූවිගත කොට ඇත. තවද කවිශ්‍රෙෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ විසින් පද්‍යබන්ධවශයෙන් දෙශනා කළ ජාතකගාථා සදහස්-නවසියපහක් (6905) පමණ වෙති. එයින් ගාථා දෙදහස්දෙසියඅටළොසක් (2218) ප්‍රථම භාගයෙහි ද, දෙදහස්එක්සියඑකක් ද්විතීයභාගයෙහි ද, මේ තෘතීයභාගයෙහි දෙදහස්පන්සියසයාසූවක් (2586) ද ඇතුළත් වෙත්.

ලංකා බෞද්ධමණ්ඩලය මඟින් ආරබ්ධ වූ. ත්‍රිපිටකග්‍රන්ථ ප්‍රකාශනය වර්තමාන ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති-තන් පත් ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්ගේ අනුග්‍රහයෙන් සිදුවන බව ආශීර්වාදමුඛයෙන් පවසම්හ. ශ්‍රද්ධා පූර්වක වැ ධර්මප්‍රකාශනය මෙහෙයවන සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තන් පත් ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාණන් ද මෙහි ලා විශෙශයෙන් ප්‍රයුක්ත වැ ක්‍රියා කරන සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලෙකම් සෝමපාල ජයවර්ධන මහතාණන් ද ප්‍රශංසා පෙරටු කොට සඳහන් කරම්හ. එසේ ම සද්ධර්ම ප්‍රවර්තනයට උපස්තම්භක වන තිසර මුද්‍රණාලයාධිකාරීතුමා ඇතුළු සේවක මණ්ඩලය ද, ත්‍රිපිටකසම්පාදක මණ්ඩලයට උපකාරී වැ ක්‍රියා කරන කොළඹ මහානායක චාරිකාරාමයේ නියුක්ත වූ ඇම්. ඒ. ආර්. සමරසිංහ මහතා ද කෘතඥතා-යෙන් සඳහන් කරම්හ. ශාසනායුවර්ධනයට කාරණ වැ පවත්නා මේ සත්කාර්‍යයට අනුබල දෙන හැම සුධීහු සුබභාගී වෙත්වා' යි ආශංසනය කරම්හ.

මේ වගට ශාසනොදයකාරී:

ලබුගම ලඩකානන්ද
මහානායකස්ථවිර
ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයේ
ප්‍රධාන සංස්කාරක.

2529
1986 දෙසැම්බර් මස 20 වැනි දින
ප්‍රවචනොදය පිරිවෙන්හි දී යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

උපදේශක:

අග්ගමහාපණ්ඩිත, **බළන්ගොඩ ආනන්දමෛත්‍රේය** මහානායක මහාසඨවිරපාදයන් වහන්සේ.

සභාපති:

අභිංගම විද්‍යාවන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය, සාහිත්‍ය චක්‍රවර්ති, රාජකීය පණ්ඩිත, **කෝදගොඩ ශ්‍රී ඥානාලෝක** දක්ෂිණ-ලඞ්කාවෙහි ප්‍රධාන සඞ්ඝනායක සඨවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක:

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති ශ්‍රී මහාවිහාරවංශාලඞ්කාර විමල කීර්ති ශ්‍රී ත්‍රිපිටකවාගීශ්වර, සාහිත්‍යචක්‍රවර්ති රාජකීය පණ්ඩිත **ලබුගම ශ්‍රී ලඞ්කානන්දාභිධාන** — කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවෙහි මහානායක **සඨවිරයන් වහන්සේ.**

සම්පාදක:

කිරුළපන පූර්වාරාමයෙහි හා නාරාහේන්පිට අභයාරාමයෙහි අධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, **රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක** — කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවෙහි අනුනායක **සඨවිරයන් වහන්සේ.**

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද රාජකීය පණ්ඩිත, **වෙඩරුවේ ශ්‍රී අනවමදර්ශී**—කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවෙහි අනුනායක සඨවිරයන් වහන්සේ.

හිඟුලේ, මාකඩවර ශ්‍රී රෙවත පරිවෙණාධිපති, සතරකෝරළ මහ-දිසාවේ ප්‍රධාන සංඝනායකධුරන්ධර රාජකීය පණ්ඩිත **කරහම්පිටිගොඩ ශ්‍රී සුමනසාර සඨවිරයන් වහන්සේ.**

කොළඹ කිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීය **පණ්ඩිත, කරඳන ශ්‍රී ප්‍රඥාලඞ්කාර** නායක **සඨවිරයන් වහන්සේ.**

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි ත්‍රිපිටක අංශයෙහි මහාචාර්‍ය, ශාස්ත්‍රාචාර්‍ය රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකාචාර්‍ය, රයිගම් කෝරළයේ ප්‍රධාන සංඝනායකධුරන්ධර **උඩුවේ ශ්‍රී ඥානානන්ද සඨවිරයන් වහන්සේ.**

ලේකම්:

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, **පණ්ඩිත දෙරගමුවේ සිරි ධම්මපාල** – කොළඹදිස්ත්‍රික්කයෙහි ප්‍රධාන සංඝ-නායක **සඨවිරයන් වහන්සේ.**

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සංකේත නිරූපණය

සී.මු. – සිහළකඛරමුද්‍රිත ජාතකපාළි
අට්ඨකථා – සිහළකඛර මුද්‍රිත ජාතකට්ඨකථා
ම.ජ.සං – මරඞ්ඡට්ඨසංගීතියා සොධිත ජාතකපාළි
සාහා. – තායාසකඛරමුද්‍රිත ජාතකපාළි
වි. – විදුරුපොල විහාරෙ තාලපණ්ණ පොත්කං

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සංඥපන

සුත්තනාමපිටකාගත ආභවවභාසිතයෙහි නොයෙක් තැනැ වැද සිටුනා ''සෝ ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදනං ඉතිවුත්තකං ජාතකං අබ්භූත ධම්මං වෙදල්ලං'' යන නවාංග ශාස්තෘ ශාසනයෙහි සත්වැනි අඩගය ''ජාතක'' නම් වෙයි.

අප මහ බෝසත් සුමෙධ තවුස් වැ දීපංකරු බුදුන් වෙතැ බුදුබවට නියත විවරණ ලැබැගෙනැ සාරාසැකි කප්සුවහසක් මුළුල්-ලෙහි දස පැරැමිදම් පුරනුව නොයෙක් කෙළසුවහස් ජාතියෙහි පුරුදු කළ බෝසත් සිරිත් පවසන කථා අතුරෙන් ධරමාන බුදුන් දවස් දඹදිවහි ඒ ඒ තන්හි පහළ වූ ඒ ඒ කරුණට පැමිණැ අර්ථමෝපසංහිත කොට වදළ පාරමිදම් ප්‍රකාශක වූ 'අපණ්ණක' ජාතක පටන් 'වෙස්සන්තර' ජාතක හිමි කොට ඇති කථා පන්සිය පනසක් පමණ වූ ආභවවභාසිතය ජාතක නමින් වෙසෙසා හඳුන්-වනු ලැබේ.

බුද්දකනිකායාගත අවශේෂ ග්‍රන්ථයන් සෙයින් මැ 'ජාතකපාළි' ද ධරමාන බුදුහු දවස්හි මැ සඞ්ගායිත වැ 'ජාතකභාණක' ගණයෙහි පඨන පාඨන වීසින් පැවැත්තේ යැ. ඒ පිළිබඳ නිදානකථා අතීතකථා සහිත අට්ඨකතා ද එහි මැ පවත්වාගෙනැ එනලද යැ. බුදුන් දවසැ වාස කළ 'ජාතකභාණක' තෙර කෙනකුන් ගැනැ පපඤ්චසූදනී මජ්ඣිමනිකාය අට්ඨකථායෙහි සඳහන් කරති. මහාකාශ්‍යප මහරහතුන් වහන්සේ ප්‍රමුඛ පන්සියක් ක්ෂීණාස්‍රවයන් වීසින් ග්‍රහණධාරණ පහසුව තකා ඒකක දුකාදි වීසින් සංග්‍රහ කොට සංගීතියට නඟන ලදු.

එහි එකෙකි ගාථායෙන් යුත් කථා සංග්‍රහය ඒකක නිපාත යැ ගාථා දෙක බැවින් ඇති කථාසංග්‍රහය දුකනිපාත යැ ආදි වීසින් සංඛ්‍යා පිළිවෙළින් තෙරසකය (13) තෙක් නිපාත සංග්‍රහ වෙයි. ඉක්බිති අසඛ්‍යාන සංඛ්‍යා සහිත ගාථා සංග්‍රහය 'පකිණ්ණකනිපාත'යි නම් කරන ලද්දෙ යැ. එතන් සිට විස්සත් වීසිනවයත් අතර වූ සංඛ්‍යා සහිත ගාථාසංග්‍රහ 'වීසති නිපාත' යැ තිසත් තිස්නවයත් අතර වූ ගාථාසංග්‍රහ 'තිංසතිනිපාත' යැ ආදි වීසින් 'අසීතිනිපාත'යැ තෙක් දසකයෙන් වැඩිහිය නිපාත ද තම කොට අවසන්හි එන ජාතක දසය 'මහානිපාත' නමින් සංග්‍රහ කරන ලද්දෙ යැ. ජාතකපාළියෙහි සියලු ගාථා 6905 කි.

ජාතක සංඛ්‍යා: 'පන්සිය පනස් ජාතක'යි ව්‍යවහාරයෙහි ජාතක සංඛ්‍යාව 550 කි. මෙරට පළ වැ ඇති ජාතක ගණන 547 කි. ජාතකපාළියෙහි නො දක්නා තවද ජාතක ග්‍රන්ථාන්තරයෙහි දක්නා ලැබෙයි. 'ධම්මසොණ්ඩ ජාතක' ද නිකායාන්තර 'ජාතක-මාලා'යෙහි දක්නා 'ව්‍යාඝ්‍ර ජාතක' ද ජාතක පාළියෙහි නැත.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

චූළනිදෙස 'පොසාල' සුත්තනිදෙසයෙහි ''**භගවා පඤ්චජාතකසතානි භාසතෙනා අත්තනො ච පරෙසං ච අතීතං ආදිසති**'' යන තන්හි ජාතක පන්සියක් සඳහන් වෙයි. සුමඞ්ගල විලාසිනී දීඝනිකායට්ඨකථායෙහි ''අපණ්ණක ජාතකාදීනි **පඤ්ඤාසාධිකානි පඤ්ච** ජාතක සතානි ජාතකන්ති වෙදිතබ්බං'' යි පන්සිය පනස් ජාතක ගැනැ සඳහන් කරති.

සුත්තන්තපිටකයෙහි 'චරියාපිටක' ද පාරමීධර්ම සැකෙවින් දැක්වෙන ජාතක සංග්‍රහයෙකි. එහි දන, සීල, නෙක්ඛම්ම, අධිට්ඨාන **සච්ච**, මෙත්තා, උ**පෙක්ඛා** යන පාරමීවය්‍යාවන් දක්වනු පිණිස ජාතක පන්තියක් (35) සංග්‍රහ කරන ලද්දෙ යැ. බෞද්ධ සංස්කෘත **ග්‍රන්ථ** අතුරෙහි 'ආර්‍යශූර'යන්ගේ 'ජාතකමාලා' නම් ග්‍රන්ථය චරියාපිටක ඇසුරින් රචිත වෙයි. ග්‍රන්ථ දෙක්හි මඳ වශයෙන් අසමානතා ද ඇත. එහි ජාතක සංඛ්‍යාව සූතියෙකි.

ඒකක දුක ආදි නිපාතයන්හි සඳහන් වනුයේ ජාතකකථායෙහි වස්තුබීජය පමණි. මතු මතු නිපාතයන්හි අනුක්‍රමයෙන් කථා පුවත වර්ධනය වෙමින් අනාවරණ වෙයි. එහි කථාව අටුවා බලා මැ දතයුතු වෙයි. අටුවා කථා ද බුදුන් හිමියෙහි මැ වාචනාවට නැඹී ඇදුරෙුල්හි පැවැතැ ආයේ යැ. එ 'බුදු කැලි අටුවා'යි පස්වැනි කසුප් මහරජ ධම්පියා අටුවා සන්නයෙහි ලා කියයි. දම්සෙනෙවි සැරියුත් මහරහත්තෙරණුවෝ චූළනිදෙසයෙහි ලා ''භගවා පඤ්ච **ජාතකසතානි භාසනෙනා** අත්තනො ච පරෙසං ච අතීතං ආදිසති'' බුදුහු පන්සියක් ජාතක වදරමින් තමන් වහන්සේගේ ද මෙරමාගේ ද අතීතය වදරති'යි දක්වති.

මහානිපාතපාළියෙහි කථාපුවත සපුරා දැක්දෙයි. අසීති නිපාතයෙහි එන කුණාල ජාතකය ගද්‍ය පද්‍ය මිශ්‍ර වෙයි. පද්‍යබණ්ඩ මැඩැගෙනැ ගද්‍යබණ්ඩ නැඹිසිටීම එහි දක්නා විශෙෂයෙකි. කවිතායෙන් අනූන වූ උත්කලිකාප්‍රාය රමණීය රචනාවක් වූ එහි ගද්‍යබණ්ඩයන්හි දෙසනා පාළියෙහි දක්නා සරල සුගමතාව නො පැනෙයි. සුධීන්ගේ විමර්ශනය යොමු විය යුතු තැනෙකි. කුණාල ජාතක වනවර්ණනායෙහි හා වෙස්සන්තර ජාතක හිමවත් වැනුමෙහි දක්නා විවිධ වෘත්තලතා හා පඤ්චකම්භු ත්‍රිපිටකයෙහි අන්තැනෙකැ හමු නො වෙති. සුධාභොජන කුණාල වැනි ජාතක කිහිපයක මිස සෙසු ජාතකයන්හි කථා සමොධානයෙක් ජාතකපාළියෙහි නැත.

කථාසාහිත්‍යය: පුද්ගල චරිත විවරණය මානවසමාජ සංස්කරණයට අත්‍යන්තොපකාරී වන බැවින් කථාසාහිත්‍යයට විශ්වසාහිත්‍යයෙහි උස් තැනෙක් හිමි වෙයි. මහර්ෂි වාල්මීකීන්ගේ 'රාමායණ' මහර්ෂි ව්‍යාසයන්ගේ 'මහාභාරත' ගුණාඪ්‍යයන්ගේ 'වෘහත්කථා' ඇසුරින් කළ ක්ෂෙමෙන්ද්‍රයන්ගේ 'කථාසරිත්සාගර' විෂ්ණුශර්මන්ගේ 'පඤ්චතන්ත්‍ර' 'ඊසොප්ගේ උපමා කථා' 'අරාබිනිසොල්ලාස' ආදි විශ්වකීර්තියට පත් කථාසංග්‍රහ ජාතකකථා

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

හමුයෙහි පසුබා සිටී. පුරුෂාර්ථ උපාදන සාමර්ථ්‍යයෙන් ආඛ්‍යාවූ ජාතක කථා එහැම පසුබා සනාතන සවරූපයෙන් ඉදිරියෙහි සිටී. වස්තු සංඛ්‍යා අතිනුදු ජාතක සංග්‍රහ පෙරට එයි. ජාතක සංඛ්‍යාව පන්සිය පනසක් වුව ද එකෙකි කථාවක් පිළිබඳ වර්තමාන නිදන කථාවකුදු ඇති බැවින් කථා සංඛ්‍යාව දෙගුණ වෙයි. උම්මග්ග-ජාතක, කුණාලජාතක ආදී අතුරු කථායෙන් සැදුණු ජාතක ද ඇති බැවින් අනන්තාත්ත කථා සංඛ්‍යාව තවද වැඩියයි. හැම කථාවක් මැ සමකාලීන සමාජයෙන් පැනැනැගුණු කරුණක් මුල් කොට දෙසන ලද වන බැවින් ජාතකකථා බුද්ධකාලීන භාරත සමාජයෙහි සැබෑ තතු පිළිබිඹු වන කැටපතක් බදු වෙයි. එයින් තත්කාලීන භාරත සමාජයෙහි සාමාජික, ආර්ථික, සාමයික, ආධ්‍යාත්මික හා දේශපාලන තතු මැනැවින් අනාවරණ වෙයි.

සිංහල සංස්කෘතිය හා ජාතක: සිංහල සංස්කෘතිය ජාතක කථායෙන් පෝෂණය වූවකි. දඹදිව බෞද්ධයනට වඩා හෙළදිව බෞද්ධයෝ ජාතක කථා කෙරෙහි ඉමහත් භක්ත්‍යාදරයක් දක්වූහ. සිංහල උවසු උවැසියන් චරිතවර්ධනයට ආදර්ශ කොට ගත්තේ ජාතක කථායෙහි එන බෝසත් සිරිත යැ, ඔහු කෙතෙහි කම්-හ්ලෙහි දවසේ කටයුතු නිමවා ගෙට පැමිණෑ විවෙක කාලයෙහි ජාතක කථාවක් ගීතවත් වැ කියවා හෝ කියවනු අසා ආස්වාද විඳැ වෙහෙස නිවාගෙනැ සිතකය සතපාගත්හ. 'පොතේ බණ පිරීම'යි ජනවහරෙහි පළට වූ විහාරස්ථානයෙහි දවරැයැ අඛණ්ඩ වැ පවත්වා ලන මාසික ත්‍රෛමාසික ජාතක දේශනාවට ලද අවසරයෙහි සවන් දෙමින් ආස්වාද විඳිමින් බෝසත් සිරිත් උගනිති. තුමූ ද එය අනුකරණය කෙරෙමින් සුවරිතයට නැමෙති. ඉල්ලීස සුධාභොජන ආදි ජාතක අසා මසුරුමල හැරපියති. දීඝිති කොසල වැනි ජාතක අසා වෛරය දුරු කෙරෙති. ක්ෂාන්තිවාද ආදි ජාතක අසා ඉවසීම පුරුදු කෙරෙති. මහාධම්මපාල ආදි ජාතක අසා ප්‍රාණඝාතයෙන් වළකිති. වෙසතුරුද අසා පරිත්‍යාගයට නැමෙති. දෙවධම්ම ජාතක අසා හිරිඔතප් වඩති. ලොහකුම්භි වැනි ජාතක අසා පරදර සමාගමයෙන් දුරු වෙති. සඳකිඳුරු ද අසා පතිවත රකිති. චෙතිය කක්කාර වැනි ජාතක අසා මුසවායෙන් වෙන් වෙති. භද්‍රඝට ආදි ජාතක අසා රහමෙරින් දුරු වෙති. නන්දිවිශාල ජාතක අසා පරුෂවචන හැරපියති. තිත්තර ජාතක අසා සම්ඵප්‍රලා-පයෙන් වළකිති. මාතඞ්ග ජාතක අසා කුලමාන දුරලති. මහිලාමුඛ ජාතක අසා අසත්සමාගමයෙන් දුරු වෙති. මාතුපොස්සක සාලිකෙදර ආදි ජාතක ශ්‍රවණයෙන් මාපිය උවටැනට නැමෙති. කුණාල නලිනී ආදි ජාතක අසා ස්ත්‍රී ලෞල්‍යය හැරපියති. චුල්ලසෙට්ඨි ජාතක අසා ධනොපායන ක්‍රමොපක්‍රම උගනිති. භූරිදත්ත ජාතක අසා සිල්පුරති. මුවදෙව්ද අසා පස්කම්හි ගිජුබව හැරපියති. අපණ්ණක ජාතක අසා විමසුම් නුවණ වඩති. වණ්ණුපථ ජාතක අසා විපතෙහි නො පසුබැස දිරිවඩා ඉන් මිදෙන සැටි උගනිති. වට්ටක ජාතක අසා සමගිබලය වටහති. දෙහස් වසරකට අධික

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

කාලයක් සිංහල ජාතිය අපරාධීන වැ පැවත්මට හේතු වූයේ ජාතක කථායෙන් නැඟුණු සිංහල සංස්කෘතියෙහි මහිමය මැ යි.

හෙළකලා: ජාතක කථායෙහි අගය වටහාගත් හෙළදිවි වැසියෝ ඒවා නොයෙක් අයුරින් ජනවහරට පත් කළහ. චිත්‍රයෙහි කැටය-මෙහි බෝසත් සිරිත් පිළිබිඹු කොට දක්වූහ. එමඟින් අකුරු නොදන්නෝ ද බෝසත් සිරිත් උගත්හ. දුටුගැමුණු මහරජු රුවන්මැලිසෑ ධාතුගර්භය ජාතක කථා චිත්‍රයෙන් සැරසූ සැටි මහාවංශයෙහි සඳහන් වෙයි. 5 වැනි සියවස්හි අනුරපුර දළඳ පෙරහැර ගමන් මඟ දෙපස සැරසූ ජාතක කථා පන්සියයකැ පමණ චිත්‍ර තමා දුටු බව චීන දේශාටක පාඛියන් තම දේශාටන වාර්තාවෙහි සඳහන් කරයි. පොළොන්නරු ත්‍රිවංක පිළිමගෙයි අඳින්නා ලද ජාතක චිත්‍ර දැනුදු දකියැහෙයි. පිළිමගේ බිත්ති ජාතක චිත්‍රයෙන් සැරසීමේ සිරිත අද දක්වා අඛණ්ඩ වැ පවතී. වන්දනාවට එන වැඩිහිටියෝ බිතුසිතුවම් බලා කුහුලින් ප්‍රශ්න නඟන කුඩා දරුවනට ජාතක කථා හඳුන්වා දෙති. ඛහතෝරන අවධියෙහි පටන් ඔහු ජාතක කථා උගනිති.

සිංහල සාහිත්‍ය පෝෂණය වූයේ ද ජාතක කථායෙනි. සංදෙශ කාව්‍ය හැර යෙසු සිංහල පද්‍යකාව්‍යයට වස්තු වූයේ ජාතක කථායෙකි. ''පෙදෙන් බුදුසිරිතැ'යි සේන මහරජ පද්‍යයෙන් බුදුසිරිත කියන්නට සියබස් ලකරෙහිලා උවදෙස් දෙයි. එ මතු නොවැ සිංහල පඬිවරුන් ගද්‍යකාව්‍යය සැරසීමට යොදගත්තෙ ද ජාතක කථා යි. විද්‍යා චක්‍රවර්තීන්ගේ 'දහමසරණ' ගුරුළුගෝමීන්ගේ 'අවිවතුර' බුද්ධපුත්‍ර තෙරණුවන්ගේ 'පූජාවලී' ජාතක කථායෙන් සරසන ලද ගද්‍යකාව්‍යයෝ යි. ප්‍රෞඪ ඉතිහාසයක් හිමි වූ අභිමානවත් සිංහල ජාතියක් බිහි වූයේ ජාතක කථායෙන් පරිපෝෂිත වූ සිංහල සංස්කෘතියෙනි.

පරිවාර ග්‍රන්ථ:

බුදුකැලි අටුවා: පාළි ගාථායෙහි අරුත් වටහාගැනීම පිණිස එයට නිදන වූ වර්තමාන කථාවත් සවිස්තර ජාතක කථාවත් ගාථායෙහි ගැබ් වූ ධර්මාර්ථත් බුදුරදුන් වෙතින් මැ අසා ධරාගත් ජාතක භාණකයෝ 'ජාතකට්ඨ කථා' නමින් වාචනාවට නභා ඇදුරු පරපුරෙහි පවත්වා ගෙනැ ආහ. ඒ යැ 'බුදුකැලි අටුවා' නම්.

ලක්බුදු සසුන් පිහිටුවීමෙන් පසු අනුබුදු මිහිදු මහරහතුන් වහන්සේ විසින් ඇදුරොල්හි ආ පාළි අට්ඨකථා සිංහල භික්ෂූන් ලවා හෙළබසට අරවන ලදු වැ 'මහ අටුවා' නමින් පළට වූ හෙළටුවායෙහි ඇතුළු වැ මහාවිහාරවංශයෙහි පවත්වන ලද්දේ යැ. වළගම් අබා මහරජු දවසැ ආලොක විහාරයේදී එතෙක් වාචනා-මාර්ගයෙහි පැවැති අටුවා ග්‍රන්ථාරූඪ කරන ලද්දේ යැ. යළි

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

මහානාම රජු දවසැ දඹදිවැ මහාබෝධි විහාරයෙන් පැමිණි මදුගොස් තෙරණුවන් විසින් සිංහල නො දත් විදේශීය බෞද්ධයන්ගේ ප්‍රයෝජනය සඳහා මගධභාෂාවට නඟන ලදී.

ගැටපද: ජාතකපාළියෙහි ගණ්ඨීපද ලිහිල් කෙරෙමින් පෙළබසිනුදු මෙළ බසිනුදු ගැටපද ලියන ලදී. පාළි ගණ්ඨීපද හුදෙක් 'ගණ්ඨීපද' නමින් මැ ව්‍යවහාර කරන ලදී. සිංහල ගණ්ඨීපද තුනෙක් වීය. 'චූළගණ්ඨීපද' 'මජ්ඣිම ගණ්ඨීපද' 'මහාගණ්ඨීපද කියා යි. දෙමළ බසින් ලියන ලද ජාතක ගැට පදයෙක් ද තුබූ බව පෙනෙ යි. 'දෙමළ ජාතක ගැටපදයෙහි 'දෙණ්ඩිමා' 'පටහම්' යි කීහු යනු වෙන් සිරිරහල් මාහිම්මයෝ පඤ්චිකාප්‍රදීපයෙහි කියති.

ජාතක අටුවා ගැටපද: හෙළටුවා නැසීමෙන් පසු ජාතක කථා බලාගතයුතු වූයේ පාළි ජාතකට්ඨකථායෙනි. එහි අරුත් වටහා ගැනීමට ද උපකාරයක් අවශ්‍ය වීය. එය සඳහා පොළොන්නරු අවධියෙහි විසූ කිසියම් පඬිවරයකු විසින් ලියන ලද ජාතක අටුවා ගැටපදයක් පළ වැ ඇත.

සන්නය: ගැටපද ලියන ලද්දේ පාළියෙහි අතුරතුරෙහි එන දුර්බෝධ වචන විවරණ කිරීම සඳහා පමණි. පසු කල්හි අරුත් වටහා ගැනීමේ පහසුව සඳහා ජාතක පෙළට සන්න ලියන ලදී. පොළොන්නරු අවධියෙහි විසූ කිසියම් පඬිවරයකු විසින් වෙස්සන්තර ජාතකය ගෙනැ 'වෙසතුරුදු සන්න' ලියන ලදී. දඹදෙණි අවධියේ දී 'රාජමුරාරි' නම් පඬිවරයකු විසින් මුල පටන් දසක නිපාතය අවසනට සන්නයක් ලියන ලදී. එ මෙකල 'රාජමුරාරි සන්න' නමින් පළ වැ ඇත. තවද කිසිවකු විසින් මහානිපාතයෙහි පළමු ජාතක අට සඳහා ලියන ලද සන්නයක් 'අටදසන්න' නමින් පළ වැ ඇත.

සිංහල අනුවාද: ජාතක කථා ශ්‍රවණයට සිංහල බෞද්ධයා මහත් අභිරුචියක් දක්වීය. හෙළටුවා නැසී යෑම නිසා මගධ භාෂාව නොදත් සිංහල බෞද්ධයාට ජාතක කථා දැනගැනීමට පහසු මහක් අවශ්‍ය වීය. මේ සඳහා ජාතක කථා අනුක්‍රමයෙන් සියබසට නඟන ලද බව පෙනෙයි. එහි ලා උවසු උවැසියන් ඉමහත් බැතියෙන් කඳුළු සලමින් කන් දෙන වෙස්සන්තර ජාතකය විද්‍යා චක්‍රවර්තීන් අතින් සියබසට නැඟී බුත්සරණට එක් වීය. අනතුරු වැ හාස්‍යයෙන් ඔපලා ප්‍රඥාමහිමය හෙළි කොට වීර රසය කුළුගැන්වී ඇති උම්මඟ්ගජාතකය 'උමංදා' නමින් කිසියම් පඬිවරයකු විසින් සියබසට නඟන ලද්දේ යැ. ඉක්බිති අනුක්‍රමයෙන් සියබසට නැගුණු ජාතක වෙන්කොට දැක්වීම අපහසු වුවද ජාතක අනුවාද කරණය සම්පූර්ණ කළ කුරුනාගල සතරවන පැරකුම්බා අවධිය වන විට තවද ජාතක බොහෝ ගණනක් සියබසට නැඟී තිබූ බවනම් සිතියැහැකියැ. පැරකුම්බා රජු දවසැ වොළිය තෙරණුවන්ගේ පුරොගාමිත්වයෙන් සම්පූර්ණ වූ 'පන්සිය

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

පනස් ජාතක පොත' විමසා බලන් මෑ ඒ ඒ කථාවන්හි භාෂා විෂමතාව කුරුනාගල අවධියට පළමු ජාතක කථා සැලැකියැයුතු සංඛ්‍යාවක් සියබසට නැඟී තුබූ බව පළ කරයි. අප රට විහාර පුස්තකාලයන්හි ඇති පුස්කොළ පොත් අතුරෙහි ඉතා වැඩි පිටපත් සංඛ්‍යාව ලැබෙනුයෙ ජාතක පොතිනි. එයින් ජාතක කථා ඇසීමට සිංහල බෞද්ධයා දක්වූ අභිරුචිය මැනැවින් හෙලිවේ.

විශේෂ ශබ්ද ප්‍රයොග: ත්‍රිපිටක ග්‍රන්ථ අතුරෙහි ථේරගාථා, ථේරීගාථා, සුත්තනිපාත වැනි ග්‍රන්ථ කිහිපයක මිස සෙසු ග්‍රන්ථයන්හි දක්නට නොලැබෙන විශේෂ ශබ්ද ප්‍රයොග ජාතක පොතෙහි දක්නා ලැබේ. මාගධ ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි නෛරුක්තික විධියෙහි ඇතුළුවන ප්‍රාකෘත ලක්ෂණයෙන් යුත් ශබ්ද ප්‍රයොග ජාතක භාෂායෙහි බහුල වැ හමු වෙයි. ඔවුනතුරෙහි ප්‍රයොග කිහිපයක් පහත දක්වනු ලැබෙයි.

වියග්ඝ: පාළියෙහි සුලභ වූ 'ව්‍යග්ඝ' ශබ්දයෙහි 'වියග්ඝ' යන රූපාන්තරය ජාතකපාළියෙහි ඇත. වියුක්ත වර්ණ මධ්‍යයෙහි 'ය' කාර පර නිමිත්තෙන් 'ඉ' කාරාගම වූ තැනි 'වියග්ඝරාජස්ස' 'වියන්තො' 'වියාකරොහි' යනු එබඳු ප්‍රයොග යි.

සුවාමි: සංස්කෘත 'ස්වාමී' ශබ්දය පාළියෙහි 'සාමී'යි සිටියි. ජාතකපාළියෙහි යථොක්ත ශබ්දයෙහි 'සුවාමී' යන රූපාන්තරයක් ලැබේ. වියුක්ත වර්ණ මැද 'ව' කාර නිමිත්තෙන් 'උ' කාරාගම වැ සිද්ධයි. 'සුවාමිනී' 'සුවාමිනො' යනු එහි ප්‍රයෝග යි.

'අයිර: සංස්කෘත 'ආර්‍ය්‍ය ශබ්දය පාළියෙහි අරිය' යි සිටී. එය ජාතකපාළියෙහි වර්ණ විපර්‍යාසයෙන් 'අයිර' කියා සිටී එසේ මෑ 'අරියො' යනු 'අයිරො'යි දක්නා ලබේ.

ව්‍යම්හිතො: සංස්කෘත 'විස්මිත' යනු පාළියෙහි 'විම්හිත යනුවෙන් සිටී. ජාතකයෙහි යථොක්ත ශබ්දයාගේ 'ව' කාරසථ 'ඉ' කාරයට 'ය' කාරාදෙග වැ 'ව්‍යම්හිතො' යි සිටී. 'ව්‍යම්භිත මානසො' 'ව්‍යම්භ' යනුඑබඳු තවත් ප්‍රයොග යි

මිහිත. සංස්කෘතයෙහි 'සමිත'යි තුබූ තැනැ වර්ණ විපර්‍යාස වැ 'ස' කාරයට 'මී' කාරාදෙශ වැ වියුක්ත වර්ණ මැද 'ඉ' කාරාගම වැ 'මිහිත'යි සිද්ධ යැ. 'මිහිතපුඛෙ' 'මිහිතපුඛො' යනු එහි ප්‍රයොග යි.

සුවිම්හිතා: සංස්කෘතයෙහි 'සුවිස්මිතා'යි සිටුනා තැනැ වර්ණ විපර්‍යාස වැ 'ස' කාරයට 'හ' කාරාදෙශයෙන් 'සුවිම්භිතා' කියා වෙයි. 'කාවම්භමයා' යනුද එබඳු ප්‍රයොගයෙකි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

අත්‍රජ: සංස්කෘතයෙහි 'ආත්මජ' යනු මාගධී භාෂායෙහි විෂමාක්ෂර සම වැ 'අත්තජ' කියා සිටී. එහි'ත්ත' හට 'ත්‍ර' කාරා දෙස වැ 'අත්‍රජ' කියා සිටී. 'අත්‍රිවිඡං' යනු ද මෙසේ මැ සිද්ධ යි.

ලාපූනි: 'අලාපූනි' යි තුබූ තැනැ ඡත්‍යෙහේතුයෙන් ආදිලොප වැ 'ලාපූනි' යි සිදු වූ සේ වියරණ ඇදුරෝ කියති. එසේ වතුදු 'අපිධාන' යනු 'පිධාන' යි ද 'අපිළන්ධන' යනු 'පිළන්ධන' යි ද සිටුනා සේ ඡත්‍යෙහෙතු රහිත වැ ද ආදිලොප වියැහැකි බව පෙනේ. 'නත් වරද' ආදීන් සිංහලයෙහි මේ ලක්‍ෂණය සුලභ වැ දක්නා ලැබේ.

විහරෙමු: ප්‍රාකෘත භාෂා විෂයෙහි උත්තම පුරුෂ 'මි,ම' දෙකට 'මු' කාර වෙයි. 'විහරාමි' විහරාම' යනු 'විහරෙමු' කියා වේ. ජාතක පාළියෙහි මේ ප්‍රයොග බහුල වැ දක්නා ලැබෙයි. පස්සෙමු, වසෙමු, උපාසෙමු දක්ඛමු. දදෙමු, දජ්ජමු, ජක්ඛමු, අනුසාසෙමු යනු එබඳු ප්‍රයොග යි.

කුම්මී: 'කර' ධාතුයෙහි වර්තමාන උත්තමපුරුෂ එකවචන ආඛ්‍යාතය කරොමි, කියා පාළියෙහි සිටී. ජාතකපාළියෙහි 'කුම්මි' යන රූපාන්තරයෙක් ද ඇත. එ වූකලී සංස්කෘත 'කුර්මී' යනු විෂමාක්ෂර සම වැ ප්‍රාකෘතයට නැඹිගිය සැටි යි.

මෙහි දක්වන ලද්දෙ ජාතකපාළියෙහි සුලභ වූ විශේෂ ශබ්ද ප්‍රයෝග අතුරින් කිහිප තැනෙකි. සෙස්ස ධීමතුන්ගේ විමර්ශනයට යොමු වේවා!

චිරං තිට්ඨතු සාසනං

කරහම්පිටිගොඩ සුමනසාර
හිඟුල, මාකඩවර, රේවත පරිවෙණාධිපති,
සතර කෝරළ මහදිසාවේ
ප්‍රධාන සංඝනායක ස්ථවිර

රේවත පිරිවෙන,
මාකඩවර,
හිඟුල.
86. 12. 26

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS

VOWELS

අ a ආ ā ඉ i ඊ ī උ u ඌ ū එ ē ඔ ō

CONSONANTS

කka	ඛkha	ගga	ඝgha	ඞṅa
චca	ඡcha	ජja	ඣjha	ඤña
ටṭa	ඨṭha	ඩḍa	ඪḍha	ණṇa
තta	ථtha	දda	ධdha	නna
පpa	ඵpha	බba	භbha	මma

යya	රra	ලla	වva	සsa	හha	ළḷa	අංṃ
කka	කාkā	කිki	කීkī	කුku	කූkū	කෙkē	කොkō
ඛkha	ඛාkhā	ඛිkhi	ඛීkhī	ඛුkhu	ඛූkhū	ඛෙkhē	ඛොkhō
ගga	ගාgā	ගිgi	ගීgī	ගුgu	ගූgū	ගෙgē	ගොgō

CONJUNCT-CONSONANTS

කකkka	ඤඤññа	ත්‍රtra	මඵmpha
කඛkkha	ණහṇha	ද්දdda	මබ, ඹ mba
ක්‍යkya	ඤ්චñca	ද්ධddha	මහmbha
ක්‍රkri	ඤ්ඡ ඡñcha	ද්‍රdra	මමmma
කවkva	ඤ්ජ ජñja	ද්ව, වdva	මහmha
ඛ්‍යkhya	ඤ්ඣñjha	ධ්වdhva	යය, ය්‍යyya
ඛවkhva	ට්ඨṭṭha	න්තnta	ය්හyha
ග්ගgga	ට්ඨ, ඨṭṭha	න්ථntha	ල්ලlla
ගඝggha	ඩ්ඩḍḍa	න්දnda	ල්‍යlya
ඞ්කṅka	ඩ්ඪḍḍha	න්ධndha	ල්හlha
ග්‍රgra	ණ්ණṇṇa	න්නnna	ව්හwha
ඞ්ඛṅkha	ණ්ටṇṭa	න්හnha	ස්සssa
ඞ්ගṅga	ණ්ඨṇṭha	ප්පppa	ස්මsma
ඞ්ඝṅgha	ණ්ඩ, ඩṇda	ප්ඵppha	ස්වsva
ච්චcca	ත්තtta	බ්බbba	හ්මhma
ච්ඡccha	ත්ථttha	බ්භbbha	ව්හvha
ජ්ජjja	ත්වtva	බ්‍රbra	ළ්හḷha
ජ්ඣjjha		ම්පmpa	

ා ā ි i ී ī ු u ූ ū ෙ ē

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

ජාතක පාළි

තතියෝ භාගෝ

විසයසූචි

මහානිපාතෝ

		පිටඅංකය
1.	මූගපක්ඛ ජාතකං	2-23
2.	මහාජනක ජාතකං	24-55
3.	සාම ජාතකං	56-79
4.	නිමි ජාතකං	78-115
	1. නිරයකණ්ඩා	99
	2. විමානකණ්ඩා	111
5.	ඛණ්ඩහාල ජාතකං	116-147
6.	භූරිදත්ත ජාතකං	148-189
	1. නගරකණ්ඩා	151
	2. වනපපවෙසකණ්ඩා ..	155
	3. කීළනකණ්ඩා	159
	4. නගරපවෙසනකණ්ඩා ..	167
	5. සුභගකණ්ඩා	171
	6. යක්ඛිහෙදවාදකණ්ඩා ..	187
7.	මහානාරදකස්සප ජාතකං . ..	188-225
8.	විධුර ජාතකං	226-293
	1. දෙහළකකණ්ඩා	241
	2. මණිකණ්ඩා	247
	3. අක්ඛකණ්ඩා	251
	4. රාජවසතිකණ්ඩා	263
	5. අන්තරපෙය්‍යාලෝ	269
	6. සාධුනරධම්මකණ්ඩා ..	275
	7. කාළාගිරිකණ්ඩා	277

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

විසය සූචි

		පිටඛ්‍යා
9.	උම්මග්ග ජාතකං	294–353
	1. සත්තදරකපඤ්හා	295
	2. ගද්‍රභපඤ්හා	,,
	3. කකණ්ටකපඤ්හා	,,
	4. සිරිකාලකණ්ණිපඤ්හා ..	2,
	5. මෙණ්ඩිකපඤ්හා	99,
	6. සිරිමන්දපඤ්හා	305
	7. ඡණ්ණපථපඤ්හා	305
	8. ඛජ්ජාතකපඤ්හා ..	307
	9. භූරිපඤ්හා	309
	10. දෙවතාපුච්ඡිතපඤ්හා ..	,,
	11. පණ්ඩිතපණ්ඩිතපඤ්හා ..	315
	12. මහාඋම්මග්ගකණ්ඩා ..	347
	13. දකරක්ඛසපඤ්හා	353
10.	මහාවෙස්සන්තර ජාතකං ..	354–487
	1. දසවරගාථා	357
	2. භීමවනාවණ්ණනා ..	369
	3. දනකණ්ඩා	391
	4. ජූජකපබ්බං	409
	5. චූළවනාවණ්ණනා	415
	6. මහාවනාවණ්ණනා	427
	7. කුමාරපබ්බං	443
	8. මද්දීපබ්බං	457
	9. සක්කපබ්බං	463
	10. මහාරාජපබ්බං	475
	11. ඡකාමනිගමපබ්බං ..	479

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සුත්තන්තපිටකෙ-ඛුද්දකනිකායෙ

ජාතකපාලි

තතියොභාගො

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සුත්තන්තපිටකෙ - ඛුද්දකනිකායෙ

ජාතකපාළි

(තතියො භාගො)

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

මහානිපාතො

1. මූගපක්ඛජාතකං

4320. මා පණ්ඩිතියං[1] විභාවය බාලමතො භව සබ්බපාණිනං,
සබ්බො ජනො[2] තං ඔවිනායතු එවං තව අත්ථො භවිස්සති.

4321. කරොමි තෙ තං වචනං යං මං භණසි දෙවතෙ,
අත්ථකාමාසි මෙ අම්ම හිතකාමාසි දෙවතෙ.

4322. කින්නුසන්තරමානොව කාසුං ඛණසි සාරථි,
පුට්ඨො මෙ සම්ම අක්ඛාහි කිං කාසුයා කරිස්සසි.

4323. රඤ්ඤෙ මූගො ච පක්ඛො ච පුත්තො ජාතො අචෙතසො,
සොම්හි රඤ්ඤෙ සමජ්ඣිට්ඨො[3] පුත්තං මෙ නිඛණං[4] වනෙ.

4324. න බධිරො න මූගොස්මි න පක්ඛො නපි පඞ්ගුලො,[5]
අධම්මං සාරථි කයිරා මඤ්ඤෙ ත්වං නිඛණං වනෙ.

4325. ඌරූ බාහූ ච මෙ පස්ස භාසිතඤ්ච සුණොහි මෙ,
අධම්මං සාරථි කයිරා මඤ්ඤෙ ත්වං නිඛණං වනෙ.

4326. දෙවතානුසි ගන්ධබ්බො ආදු[6] සක්කො පුරින්දදෙ,
කො වා ත්වං කස්ස වා පුත්තො කථං ජානෙමු තං මයං.

4327. නම්හි දෙවො න ගන්ධබ්බො නපි[7] සක්කො පුරින්දදෙ,
කාසිරඤ්ඤෙ අහං පුත්තො යං කාසුයා නිඝඤ්ඤසි.

---

1. පණ්ඩිච්චයං—මජසං, ස්‍යා, වි.
2. තඤ්ජනො—මජසං, ස්‍යා.
3. සමජ්ඣිත්ථො—මජසං, ස්‍යා.
4. නිකඛණං—මජසං, ස්‍යා.
5. චිකලො—ස්‍යා. පිඞ්ගලො—මජසං.
6. අදු—මජසං,
7. නාපි නම්හි—මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

සූත්‍රාන්තපිටකයේ – ඛුද්දකනිකායෙහි

ජාතකපාළි

(තෘතීය භාගය)

ඒ භගවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.

මහානිපාතය

1. මූගපක්ඛ ජාතකය

4320. පුත, තේමිය කුමාරය, නුවණැති බව පහළ නොකළ මැනැවැ. හැම සතුනට අඤ්ඤයෙකැ යි සම්මතවනු මැනැවැ. සියලු මහජන තෙමේ තොප කාලකණ්ණියෙකැ යි අවඥා කෙරේවා. මෙසේ ඇති කල තොපගේ අභිමතාර්ථය සිදුවන්නේ යැ යි සේසතේ අරක්ගත් දෙවිදු කීවා ය.

4321. එම්බා දේවතාවනි, මට යමක් කියහි ද ඔබගේ ඒ වචනය කෙරෙමි. මැණියෙනි, ඔබ මට වැඩ කැමැත්තාහු ය. දේවතාවනි, ඔබ මට හිත කැමැත්තාහු යි කුමාර තෙමේ කී ය.

4322. එම්බා සාරථිය, යුහුසුලු වැ කුමකට වළක් හාරන්නෙහි ද? යහළුව, පුළුවුස්නාලද්දෙහි මෙ කරුණ මට කියව. මේ වළින් කවර නම් වැඩක් කරන්නෙහි දැ යි කුමරු විචාළේ.

4323. අපගේ රජුට ගොළු වූ පිළු වූ සිතිවිලි නැති පුතෙක් උපන. ඒ මම රජු විසින් 'මාගේ පුතු වනයෙහි වළලව' කී අණ ලද්දෙමි කී.

4324. සාරථිය, මම ගොළු නොවෙමි, බිහිරි නොවෙමි, කොර නොවෙමි, පිළු ද නොවෙමි ඉදින් තෝ මා වනයෙහි වළලන්නෙහි නම් අධර්මයක් කෙරෙහි.

4325. මාගේ දෑත දෙකලවා බලව. මාගේ වචන ද අසව. ඉදින් තෝ මා වනයෙහි වළලන්නෙහි නම් අධර්මයක් කෙරෙහි.

4326. ඔබ දෙවියෙක් ද? ගන්ධර්වයෙක් ද? නොහොත් පුරින්දද නම් සක්දෙව් රජ ද? ඔබ කවර නම් කෙනෙක් ද? කවර නම් කෙනෙකුන්ගේ පුතෙක් දැ? යි සාරථි ඇසී.

4327. මම දෙවියෙක් ද නොවෙමි, ගන්ධර්වයෙක් ද නොවෙමි, පුරින්දද නම් සක්දෙව් රජ ද නොවෙමි. තෝ යමකු වළ නොලන්නෙහි නම් ඒ කසී රජුගේ පුත් ම වෙමි කී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4328. තස්ස රඤ්ඤෝ අහං පුත්තො යං ත්වං සමුපජීවසි,[1]
අධම්මං සාරථී කයිරා මං වෙ ත්වං නිඛණං වනෙ.

4329. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
න තස්ස සාඛං භඤ්ජෙය්‍ය මිත්තදූභො[2] හි පාපකො.

4330. යථා රුක්ඛො තථා රාජා යථා සාඛා තථා අහං,
යථා ඡායූපගො පොසො එවං ත්වමසි සාරථී;
අධම්මං සාරථී කයිරා මඤ්ඤෙ ත්වං නිඛණං[3] වනෙ.

4331. පහූතභක්ඛො[4] භවති විප්පවුත්ථො[5] සකාඝරා,[6]
බහූ නං උපජීවන්ති යො මිත්තානං න දූභති[7]

4332. යං යං ජනපදං යාති නිගමෙ රාජධානියො,[8]
සබ්බත්ථ පූජිතො හොති යො මිත්තානං න දූභති.

4333. නාස්ස චොරා පසහන්ති නාතිමඤ්ඤති[9] ඛත්තියො,
සබ්බෙ අමිත්තෙ තරති යො මිත්තානං න දූභති.

4334. අක්කුද්ධො[10] සඝරං එති සභාය[11] පටිනන්දිතො,
ඤාතීනං උත්තමො හොති යො මිත්තානං න දූභති.

4335. සක්කත්වා සක්කතො හොති ගරු හොති සගාරවො,[12]
වණ්ණකිත්තිභතො හොති යො මිත්තානං න දූභති.

4336. පූජකො ලභතෙ පූජං වන්දකො පටිවන්දනං,
යසො කිත්තිඤ්ච පප්පොති යො මිත්තානං න දූභති.

4337. අග්ගි යථා පජ්ජලති දෙවතාව විරොචති,
සිරියා අජහිතො හොති යො මිත්තානං න දූභති.

---

1. සම්මුපජීවසි–මජසං.
2. මිත්තදූභො–මජසං. වි.
3. නිකඛණං–මජසං.
4. බහූත්ථ – මජසං.
5. විප්පමුත්තො
6. සකඝරා – මජසං. ස්‍යා.
7. න දූභති – මජසං.
8. රාජට්ඨානියො – මජසං.
9. නාතිමඤ්ඤති – මජසං.
10. අකුඩො – මජසං.
11. සභායං – මජසං.
12. ගරුකො හොති ගාරවො – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4328. සාරථිය, තෝ යම් රජකු නිසා ජීවත් වෙහි ද මම ඒ රජුගේ පුතා වෙමි. ඉදින් තෝ මා වනයෙහි වළ ලන්නෙහි නම් අධර්මයක් කෙරෙහි.

4329. යමෙක් යම් රුක් සෙවණකැ හිඳුනේ හෝ සයනය කරන්නේ හෝ වේ ද ඔහු ඒ රුකෙහි අතු නො බිඳියයුතු ය. කවර හෙයින් ද යත්, මිත්‍රද්‍රෝහි තැනැත්තේ වනාහි පව්ටු අසත්-පුරුෂයෙකි.

4330. සාරථිය, වෘක්ෂය යමසේ නම් රජ තෙමේ ද එසේ වෙයි. ඒ රුකෙහි අත්තක් යමසේ ද මම එසේ වෙමි. රුක් සෙවනට පැමිණි පුරුෂ තෙමේ යමසේ ද තෝ එසේ වෙහි. සාරථිය, ඉදින් තෝ මා වනයෙහි වළ ලන්නෙහි නම් අධර්මයක් කරන්නෙහි යැ යි කී ය.

3331. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ ද හේ සිය නිවෙසින් නික්මැ බැහැර ගියේ බොහෝ ආහාර පාන ලබන්නෙක් වේ. ඔහු අතුව ජීවත් වන්නෝ ද බොහෝ වෙති.

4332. යමෙක් මිත්‍රද්‍රෝහ නො කෙරේ ද හේ යම් යම් ජනපදයකට නියම්ගමකට රාජධානියකට හෝ යේ ද සියලු තන්හි දී මැ පුදන ලද්දෙක් වේ.

4333. යමෙක් මිත්‍රයනට ද්‍රෝහ නො කෙරේ ද සොරකම් කිරීම වශයෙන් ඔහුට සොරු බලහත්කාරකම් නො කරති. රජ තෙමේ ඔහු ඉක්මවා නො සිතයි. හේ සියලු සතුරන් ජයගැනීමෙන් මැඩ පවත්වයි.

4334. යමෙක් මිත්‍රයනට ද්‍රෝහ නො කෙරේ ද බැහැර ගිය හේ නො කිපියේ සිය නිවෙසට පැමිණෙයි. සහාවෙහි සතුටු වූයේ නැයනට උතුමෙක් ද වෙයි.

4335. යමෙක් මිතුරනට ද්‍රෝහ නො කෙරේ ද අනුනට සත්කාර කිරීමෙන් හේ ද සත්කාර ලද්දෙක් වෙයි. අනුනට ගරු ඇත්තේ තෙමේ ද ගරු කළ යුත්තෙක් වෙයි. උසස් කොට වර්ණනා කරනලද ගුණැත්තේ පතළ කීර්තියෙන් ද යුත් වේ.

4336. යමෙක් මිතුරනට ද්‍රෝහ නො කෙරේ ද මිතුරන් පුදන හෙ පුද ලබන්නෙක් ද වෙයි. වැඳියයුත්තන් වඳින හෙ වැඳුම් ලබන්නෙක් ද වෙයි. කීර්තියෙන් හා පිරිවරින් ද යුතු වේ.

4337. යමෙක් මිතුරනට ද්‍රෝහ නො කෙරේ ද හේ ගිනි මෙන් දිලියෙයි. දෙවියකු මෙන් බබළයි. ශ්‍රීය විසින් නො හරනා ලද්දේ ද වේ.

4338. ගාවො තස්ස පජායන්ති ඛෙත්තෙ වුත්තං විරූහති,
වුත්තානං ඵලමස්නාති[1] යො මිත්තානං න දූහති.

4339. දරිතො පබ්බතාතො[2] වා රුක්ඛාතො[3] පතිතො නරො,
චුතො පතිට්ඨං ලභති යො මිත්තානං න දූහති.

4340. විරුළහමූලසන්තානං නිග්‍රොධම්ව මාලුතො,
අමිත්තා නප්පසහන්ති යො මිත්තානං න දූහති.

4341. එහි තං පටිනෙස්සාමි රාජපුත්ත සකං ඝරං,
රජ්ජං කාරෙහි භද්දන්තෙ කිං අරණ්ඤෙ කරිස්සසි.

4342. අලං මෙ තෙන රජ්ජෙන ඤාතකෙහි[4] ධනෙන වා,
යං මෙ අධම්මචරියාය රජ්ජං ලබ්භෙථ[5] සාරථි.

4343. පුණ්ණපත්තං පලබ්භෙහි[6] රාජපුත්ත ඉතො ගතො,
පිතා මාතා ච මෙ දජ්ජුං රාජපුත්ත තයී ගතෙ.

4344. ඔරොධා ච කුමාරා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
තෙපි අත්තමනා දජ්ජුං රාජපුත්ත තයී ගතෙ.

4345. හත්ථාරූහා[7] අණීකට්ඨා රථිකා පත්තිකාරකා,
තෙපි දජ්ජුං පතීතා මෙ රාජපුත්ත තයී ගතෙ.

4346. බහූ[8] ජානපද චණ්ඩෙ නෙගමා ච සමාගතා,
උපායනානි මෙ දජ්ජුං රාජපුත්ත තයී ගතෙ.

4347. පිතුමාතු චහං චත්තො රට්ඨස්ස නිගමස්ස ච,
අථො සක්‍යකුමාරානං නත්ථි මය්හං සකං ඝරං.

4348. අනුඤ්ඤාතො අහං මත්‍යා සඤ්චත්තො පිතරා අහං,
එකො අරණ්ඤෙ පබ්බජිතො න කාමෙ අභිපත්ථයෙ.

4349. අපි අතරමානානං ඵලාසාව සමිජ්ඣති,
විපක්කබ්‍රහ්මචරියොස්මි එවං ජානාහි සාරථි.

---

1. වුත්තාන ඵල – මජසං.
2. පබ්බතො – මජසං.
3. රුක්ඛතො – මජසං.
4. ඤාතකෙන – මජසං. ස්‍යා,
5. ලභෙථ – මජසං.
6. මං පලාභෙහි – ස්‍යා. මං ලාභෙහි
7. රොහා – මජසං, වි.
8. බහුත්තධඤ්ඤා – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4338. යමෙක් මිත්‍රද්‍රෝහී නො වේ ද ඔහුට ගෙරි සරක් බොහෝ වෙති. හෙවත් බෙහෙවින් උපදිති. කෙතෙහි වපුළ බිජුවට මනා වැ වැඩේ. ඒ ධාන්‍ය ඵල හෙවත් අස්වැන්න මැනැවින් අනුභව කෙරේ.

4339. යමෙක් මිතුරනට ද්‍රෝහ නො කෙරේ ද පර්වතයෙන් හෝ පර්වත විවරයෙන් හෝ රුකින් හෝ වැටුණු ඒ මිනිස් තෙමේ චුත වූයේ ද පිහිට ලබයි.

4340. යමෙක් මිත්‍රයනට ද්‍රෝහ නො කෙරේ ද හටගත් මුල් ඇටුවම් ඇති නුගරුක සැඩ සුළඟකින් නො සෙල්විය හැක්කා සේ සතුරෝ ඔහු මැඩ නො පවත්වති. හෙවත් නො සෙල්විය හැක්කාහු වෙති.

4341. රාජපුත්‍රයෙනි, එහු මැනවි, සකීය ගෘහයට නැවත ගෙන යමි. රජය කරවනු මැනැවි. මේ වනයෙහි හුදෙකලා ව කුමක් කරන්නෙහි ද?

4342. සාරථීය, අධර්මවය්‍යායෙන් මට යම් රාජ්‍යයක් ලැබේ ද ඒ රාජ්‍යයෙන් ද නැයන්ගෙන් ද ධනයෙන් ද වැඩෙක් නැති.

4343. රාජපුත්‍රයෙනි, මේ වනයෙන් බරණැස් නුවරට ගියහු නම් තුටුපඬුරු ලබන්නහු ය. ඔබ සිය නිවෙසට පැමිණි කල මවු පියෝ බොහෝ තුටු පඬුරු මට ද දෙන්නාහ.

4344. රාජපුත්‍රය, ඔබ ගිය කලැ සතුටු සිත් ඇති ඇතුළු නුවර වැසියෝ ද කුමරුවෝ ද වෛශ්‍යයෝ ද බ්‍රාහ්මණයෝ ද යන ඔවුහු මට බොහෝ තුටු පඬුරු දෙන්නාහ.

4345. රාජපුත්‍රය ඔබ ගිය කලැ ඇතරුවෝ ද අසරුවෝ ද රියෙහි නියුත්තෝ ද පාබල සෙනග ද යන සතුටු සිතැ'ති ඔවුහු මට බොහෝ තුටු පඬුරු දෙන්නාහ.

4346. රාජපුත්‍රය, ඔබ නුවරට ගිය කලැ රැස්වූ සෙසු බොහෝ දනවු වැසියෝ ද නියම්ගම් වැසියෝ ද මට තුටු පඬුරු දෙන්නාහ.

4347. මම මවිපියන් විසින් ද රටවැසියන් විසින් ද නියම් ගම් වැසියන් විසින් ද සියලු කුමරුවන් විසින් ද හැරදමන ලද්දෙක්මි. එ හෙයින් මට සිය නිවෙසක් නැත්තේ ය.

4348. මව විසින් අනුදන්නා ලද මම පියා විසින් හැර දමන ලද්දෙමි වෙමි. රජ සැප නො පතන්නෙමි. එකලා වැ පැවිදි වන්නෙමි.

4349. සාරථීය, යුහුසුළු නො වන්නවුන්ගේ හිත අදහස් හෙවත් අභිමතාර්ථය සමෘද්ධ වෙයි. නිෂ්ඨාප්‍රාප්ත බඹසර (මනොරථ) ඇත්තෙමි. මෙසේ අභිමතාර්ථය සිදුවන අයුරු දැනගනු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4350. අපි අතරමානානං සම්මදත්ථා විපච්චති,
විපක්කබ්‍රහ්මචරියොසමි නික්ඛන්තො අකුතොභයො.

4351. එවං වගගුකථො[1] සන්තො විස්සට්ඨවචනො චසි,[2]
කස්මා[3] පිතුච්ච මාතුච්ච සන්තිකෙ න භණි තද.

4352. නාහං අසත්ථිතා[4] පක්ඛො න බධිරො අසොතතා,
නාහං අජිව්හතා[5] මූගො මා මං මූගමධාරයි.

4353. පුරිමං සරාමහං ජාතිං යත්ථ රජ්ජමකාරයිං,
කාරයිත්වා තහිං රජ්ජං පාපත්ථං නිරයං භුසං

4354. වීසතිඤ්චෙව වස්සානි තහිං රජ්ජමකාරයිං,
අසීතිවස්සසහස්සානි නිරයම්හි අපච්චිසං.[6]

4355. තස්ස රජ්ජස්සහං භීතො මා මං රජ්ජාභිසෙචයුං,
තස්මා පිතුච්ච[7] මාතුච්ච සන්තිකෙ න භණිං තද.

4356. උච්ඡඞ්ගෙ මං නිසීදෙත්වා පිතා අත්ථානුසාසති,
එකං හනථ බන්ධථ එකං බාරාපතච්ඡිකං[8]
එකං සූලසමිං අපෙථ[9] ඉච්චස්සමනුසාසති.

4357. තස්සාහං[10] ඵරුසං සුත්වා වාචායො සමුදීරිතා,
අමූගො මූගවණ්ණෙන අපක්ඛො[11] පක්ඛසම්මතො
සකෙ මුත්තකරීසසමිං අච්ඡාහං සම්පරිපලුතො.

4358. කසිරඤ්ච පරිත්තඤ්ච තඤ්ච දුක්ඛෙන සංයුතං,
කො තං ජීවිතමාගම්ම වෙරං කයිරාථ කෙනචි.

4359. පඤ්ඤාය ච අලාභෙන ධම්මස්ස ච අදස්සනා,
කො තං ජීවිතමාගම්ම වෙරං කයිරාථ කෙනචි.

4360. අපි අතරමානානං ඵලාසාව සමිජ්ඣති,
විපක්කබ්‍රහ්මචරියොසමි එවං ජානාහි සාරථී.

---

1. වගගුකතො – මජසං.
2. වචනොච සො – මජසං. ස්‍යා.
3. තස්මා – වී.
4. අසත්ථිතා – මජසං. ස්‍යා.
5. අජිවතා – මජසං.
6. අපච්චසිං – ස්‍යා. අපච්චයිං – වී.
7. පිතුච මාතුච – මජසං. ස්‍යා.
8. බරා – මජසං, ස්‍යා.
9. උපෙපථ – මජසං. උපෙපථ – ස්‍යා.
10. තාසාහං – මජසං. ත්‍යාහං – ස්‍යා. අච්චෙථ – වී.
11. අපක්ඛෙ – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4350. යුහුසුළු නො වන්නවුන්ගේ යහපත් වූ අභිමතාර්ථ මුදුන්පත් වෙයි. මස්තකප්‍රාප්ත අදහස් ඇති කොයිතුත් බිය නැති මම නික්මැ වනයට පැමිණියෙමි.

4351. මෙසේ මනහර කථා ඇත්තහු නො පැකිළෙන තෙපුල් ඇත්තහු කවර හෙයින් මව්පියන් හමුයෙහි කථා නො කළහු ද යි ඇසී.

4352. මම කලවා නැති බැවින් පිළු වූයෙමි ද නො වෙමි. කන් නැති බැවින් බිහිරි වූයෙමි ද නො වෙමි. දිව නැති බැවින් ගොළු වූයෙමි ද නො වෙමි. මා (පිළු බිහිරි) ගොළුවෙකැ යි නොසලකනු යි පැවැසී.

4353. යම් ජාතියකැ රජය කැරැවීම් ද ඒ පූර්ව ජාතිය සිහි කරමි. එහි රජය කරවා දරුණු නරකයට පැමිණියෙමි.

4354. විසි වසක් මුළුල්ලෙහි එහි රජය කැරැවීමි. පසු වැ අසූදහසක් අවුරුදු නරකයෙහි පැසුණෙමි.

4355. ඒ රජයට බිය වූ මම මව්පියෝ මා රජයෙහි අභිසේක නො කෙරෙත්වා යි එද මව්පියන් සමීපයෙහි දී නො බිණිමි.

4356. දවසක් පියරජ තෙමේ මා ඇකයෙහි හිඳුවාගෙන අර්ථයෙන් අනුශාසනා කෙරේ. එකකු මරවු, එකකු දඟගෙහි ලවු, එකකුට බාරාපතාවජ්ජික නම් (ශරීරය පළා ලුණු ඇඹුල් ගැල්වීම) වධ දෙවු, එකකු උලැ තබව යි මෙසේ අනුශාසනා කරයි.

4357. ඒ මපියරජුගේ ක්‍රූර බස් අසා බියෙන් වෙවුළු මම නොගොළු වූයෙමි ගොළු වෙයින් නො පිළු වූයෙමි පිළු වෙයින් යුත් වැ සිය මලමූයෙහි ගැලී හුන්මි.

4358. සාරථිය, මේ මනුෂ්‍ය ජීවිතය ඉතා දුක් ය, සුවල්ප ය. එ ද සියලු සසරදුකින් යුතු වූයේ වෙයි. එ බඳු ජීවිත ලැබූ කවර නම් පුද්ගලයෙක් ප්‍රාණඝාතාදී පස්පව කරන්නේ ද නො කරන්නේ මැ යි.

4359. විදර්ශනා ප්‍රඥව නො ලැබීමෙන් ද සෝවන් මඟ නො දැක්මෙන් ද එබඳු ජීවිතයට පැමිණ කවර නම් පුද්ගලයෙක් ප්‍රාණඝාතාදී පව් කවර කාරණයෙකින් කරන්නේ ද.

4360. යුහුසුළු නො වන්නවුන්ගේ අභිමතාර්ථය සිදු වෙයි. මම මුදුන්පත් අදහස් ඇත්තෙමි. සාරථිය එය මෙසේ දනු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4361. අපි අතරමානානං සම්මදත්ථො විපච්චති,
විපක්කබ්‍රහ්මචරියොසම් නිකතෙත්තා අකුතොභයො.

4362. අහම්පි පබ්බජිස්සාමි රාජපුත්ත තවානුකෙ,
අච්චයසසු මං භද්දනෙත්ත පබ්බජ්ජා මම රුච්චති.

4363. රථං නීය්‍යාදයිත්වාන අනණො එහි සාරථී,
අනණස්ස හි පබ්බජ්ජා එතං ඉසිහි වණ්ණිතං.

4364. යදෙව තය්‍යාහං වචනං අකරං භද්දමත්ථු තෙ,
තදෙව මෙ තවං වචනං යාචිතො කාතුමරහසි.

4365. ඉධෙව තාව අච්චසසු යාව රාජානමානයෙ,
අපෙව තෙ පිතා දිස්වා පතීතො සුමනො සියා.

4366. කරොමි තෙ තං වචනං යං මං භණසි සාරථී,
අහම්පි දට්ඨුකාමොසම් පිතරං මෙ ඉධාගතං.

4367. එහි සම්ම නිවත්තසසු කුසලං වජ්ජාසි ඤාතිනං,
මාතරං පිතරං මය්හං වුත්තො වජ්ජාසි වන්දනං.

4368. තස්ස පාදෙ ගහෙත්වාන කත්වා ච නං පදක්ඛිණං,
සාරථී රථමාරුය්හ රාජද්වාරං උපාගමි.

4369. සුණිසිං මාතා රථං දිස්වා එකං සාරථිමාගතං,
අසසුපුණ්ණෙහි නෙත්තෙහි රොදනී නං උදික්ඛති.

4370. අයං සො සාරථී එති නිහන්ත්වාන මමත්‍රජං,
නිහතො නූන මෙ පුත්තො පථව්‍යා භූමිවද්ධනො.

4371. අමිත්තා නූන නන්දන්ති පතීතා නූන වෙරිනො,
ආගතං සාරථිං දිස්වා නීහන්ත්වාන[1] මමත්‍රජං.

4372. සුණිසිං මාතා රථං දිස්වා එකං සාරථිමාගතං,
අසසුපුණ්ණෙහි නෙත්තෙහි රොදනී පරිපුච්ඡති.[2]

---

1. නිහන්ත්වා මම අත්‍රජං – මජ්ඣ.
2. රොදන්තී නං පරිපුච්ඡි – මජ්ඣ.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4361. යුහුසුලු නො වන්නවුන්ගේ අදහස් සඵල වෙයි. එහෙයින් නිෂ්ඨාවට පත් අභිමතාර්ථ ඇති මම ගිහිගෙන් නික්ම ගියෙමි කවර අයුරකිනුදු බිය නැත්තෙමි යි කී ය.

4362. රාජ පුත්‍රය, තොපට වැඩක් වේවා! තෙපෙ සමීපයෙහි මම ද පැවිදි වෙමි. මහණ වෙව යි මා කැඳවනු මැනැවැ. පැවිද්ද මට රුචි යැ යි කී ය.

4363. සාරථිය, රථය පාවා දී ණය නැත්තෙක් වැ එව. පැවිද්ද වනාහි ණය නැත්තහුට ය. මෙසේ පැවිදිවීම බුඩාදි ඍෂිවරුන් විසින් වර්ණනා කරන ලද්දකි.

4364. සාරථිය, තොපට අභිවෘද්ධියක් වේවා! යම් හෙයෙකින් තොපගේ වචනය මම කෙළෙමි ද එහෙයින් මා විසින් ඉල්ලන වචනය ද කරන්නට තෙපි නිසියව.

4365. යම් පමණ කලෙකින් පිය රජුන් ගෙන එමි ද එතෙක් කල් මෙහි වසනු මැනැවැ. තොපගේ පිය රජ දැක සතුටු සොමනස් වන්නේ නම් ඉතා මැනැවි.

4366. සාරථිය, යමක් මට කියහි නම් නුඹගේ ඒ වචනය මම කරමි. මෙහි පැමිණි මා පිය රජුන් දක්නට මම ද කැමැත්තෙමි කීහ.

4367. සබඳ, බරණැසට ගොස් නැවත මෙහි එව. එ තැන් සිට මා සමීපයෙහි නවතිනු. මා සුව දුක් විවාළ බව නැයනට කියව. මා කියන ලද වැඳීම මාගේ මව්පියනට කියව යි ද කීහ.

4368. සුනන්ද නම් සාරථි තෙමේ තේමිය කුමරුන්ගේ දෙපා වැඳ පැදකුණු කොට රථයට නැඟ රජ ගෙදරට පැමිණියේ ය.

4369. (තේමිය කුමරුවන්ගේ චන්ද්‍රාදේවී නැමැති) මැණියෝ හිස් රථය, එකලා වැ පැමිණි රියැදුරු දැක කඳුළු පිරුණු නෙතින් යුතුවැ හඬ හඬා රියැදුරා මෙස බලති.

4370. ඒ මේ රියදුරු තෙමේ මාගේ පුතු මරා දමා එයි. භූමි වර්ධනය කරන මාගේ පුත්‍ර තෙමේ පොළොවෙහි වළ දමන ලද්දේ මැ යැ යි සිතමි.

4371. මාගේ පුතු මරා දමා ආ රියදුරු දැකැ සතුරෝ එකාන්තයෙන් සතුටු වෙති. වෛර කරන්නෝ එකාන්තයෙන් ප්‍රීත වෙති.

4372. හුදෙකලා වැ පැමිණි රියැදුරු හිස් රථය දැකීමින් හඬන මැණියෝ කඳුළු පිරුණු නෙතින් යුතු ව, හඬමින් (මෙසේ) විචාරති:

4373. කින්නු මූගො කින්නු පක්ඛො කින්නු සො විලපි තද,
නිහඤ්ඤමානො භූමියා තං මෙ අක්ඛාහි සාරථි.

4374. කථං හත්ථෙහි පාදෙහි මූගො පක්ඛො විවජ්ජයි,
නිහඤ්ඤමානො භූමියා තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

4375. අක්ඛීස්සං තෙ[1] අහං අය්‍යෙ දජ්ජාසි අභයං මම,
යං මෙ සුතං වා දිට්ඨං වා රාජපුත්තස්ස සන්තිකෙ.

4376. අභයං සම්ම තෙ දම්ම අභීතො භණ සාරථි,
යං තෙ සුතං වා දිට්ඨං වා රාජපුත්තස්ස සන්තිකෙ.

4377. න සො මූගො න සො පක්ඛො විස්සට්ඨ[2]වචනොව සො
රජ්ජස්ස කිර සො භීතො අකරී[3] ආලයෙ බහු.

4378. පුරිමං සරති සො ජාතිං යත්ථ රජ්ජමකාරයි,
කාරයිත්වා තහිං රජ්ජං පාපත්ථ නිරයං භුසං.

4379. වීසතිඤ්චෙ ව වස්සානි තහිං රජ්ජමකාරයි,
අසීති වස්ස සහස්සානි නිරයම්හි අපච්චි සො.[4]

4380. තස්ස රජ්ජස්ස සො භීතො මා මං රජ්ජාභිසෙචයුං,[5]
තස්මා පිතුච්ච මාතුච්ච[6] සන්තිකෙ න භණී[7] තද.

4381. අඩ්ගපච්චඩ්ග සම්පන්නො ආරොහපරිණාහවා,
විස්සට්ඨවචනො පඤ්ඤෙ මග්ගෙ සග්ගස්ස තිට්ඨති.

4382. සචෙ ත්වං දට්ඨුකාමාසි[8] රාජපුත්ත[9] තවත්‍රජං,
එහි තං පාපයිස්සාමි යත්ථ සම්මති තෙමියො.

4383. යොජයන්තු රථෙ අස්සෙ කච්ඡං නාගාන[10] බන්ධථ,
උදීරයන්තු සඞ්ඛපණවා වදන්තු[11] එකපොක්ඛරා.

4384. නදන්තු භෙරි සන්නද්ධා වග්ගුං වදතු දුන්දුභී,
නෙගමා ච මං අන්වෙන්තු ගච්ඡං පුත්තනිවෙදකො.[12]

---

1. අක්ඛෙය්‍යන්නො – මජ්ජසං. ස්‍යා.
2. විසට්ඨ – මජ්ජසං.
3. අකරා – මජ්ජසං. ස්‍යා.
4. අපච්චිස – මජ්ජසං.
5. රජ්ජෙභිසෙචයුං – මජ්ජසං.
6. පිතුච මාතුච.
7. නභණෙ – මජ්ජසං.
8. කාමොසි – මජ්ජසං.
9. රාජපුත්තං – මජ්ජසං. ස්‍යා.
10. නාගානි – මජ්ජසං, ස්‍යා.
11. වග්ගුවාදන්තු – මජ්ජසං.
12. නිවාදකො – මජ්ජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4373. මාගේ පුත් කිම ගොළුවෙක් ද පිළෙක් ද භූමියෙහි වළලනු ලබන්නේ වැලැපුණේ ද සාරථිය එය මට කියව.

4374. ගොළු පිළු වූ හේ බිමැ වළ දමන ලද්දේ කෙසේ නම් අත් පාවලින් දුරු කෙළේ දැ යි අසනලද මට කියව යි මැණියෝ කීහ.

4375. **ආයුෂ්මාවෙනි, ඔබ මට අභය දෙන්නාහු නම් රාජපුත්‍රයා සමීපයෙහි දී මා ඇසූ දුටු යමක් ඇද්ද එය මම ඔබට කියමි යි කී ය.**

4376. සබඳ සාරථිය, තට අභය දෙමි. රාජපුත්‍රයාගේ සමීපයෙහි දී ඇසූ දුටු යමක් ඇද්ද එය මට නිර්භය වැ කියව යි කීහ.

4377. ආයුෂ්මාවෙනි, ඒ තේමිය කුමාරයා ගොළුවෙක් හෝ පිළෙක් නො වේ. මනෝඥ වූ කථා ඇත්තෙක් ද වේ. රාජ්‍යාභිෂේකයට බිය වූ හේ ඔබගේ වචන නො කෙළේ ල.

4378. හේ යම් නගරයකැ රජය කැරැවී ද ඒ පූර්වජාතිය සිහි කරයි. එහි රජය කරවා දරුණු නිරයට පැමිණියේ ය.

4379. ඒ නුවරැ විසි වසක් රජය කරවූ හේ ඉන්පසු අසූ දහසක් අවුරුදු මුළුල්ලෙහි නිරයෙහි පැසුණේ ය.

4380. ඒ රජයට බිය වූ හේ මා අභිෂේක නො කෙරෙත්වා යි මවුපියන් වෙතැ එකලැ කථා නො කෙළේ ය.

4381. අඟපසඟින් සමෘද්ධ වූ උස මහත ඇති මනෝඥ කථා ඇති ප්‍රඥාසම්පන්න වූ හේ දෙව්ලොවට යන මහැ සිටී.

4382. රාජපුත්‍රිය, ඉදින් තෙපි පුතු දකිනු කැමැත්තහු නම් එනු මැනවි. යම් තැනකැ තේමිය කුමර වෙසේ ද එතැනට පමුණුවන්නෙමි යි කීය.

4383. රථයෙහි අශ්වයන් යොදත්වා. ඇතුනට පොරොදු හෙවත් හස්ත්‍යාභරණ පළඳවත්වා. ජයසක් පනාබෙර නාද කෙරෙත්වා. එකැස් බෙර වයත්වා.

4384. දෙඇස් බෙර වයත්වා. මිහිඟු බෙර මනාසේ වයත්වා. නියමගම වැසියෝ ද මා අනුව එත්වා. පුතුට කරුණු පවසන මම ඔහු අභිෂේක කොටැ රැගෙන එන්නට යමි.

4385. ඔරොධා ච කුමාරා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
බිපං යානානි යොජෙන්තු ගච්ඡං පුත්තනිවෙදකා.

4386. හත්ථාරොහා අණිකට්ඨා රථිකා පත්තිකාරකා,
බිපං යානානි යොජෙනතු ගච්ඡං පුත්තනිවෙදකෝ.

4387. සමාගතා ජානපදා නෙගමා ච සමාගතා,
බිපං යානානි යොජෙනතු ගච්ඡං පුත්තනිවෙදකෝ.

4388. අසෙසා ච සාරථී යුත්තා සින්ධවෙ සීඝවාහනෙ,
රාජද්වාරං උපාගඤ්ඡුං යුත්තා දෙව ඉමෙ භයා.

4389. ථූලා ජවෙන භායන්ති කිසා භායන්ති ථාමුනා,[1]
කිසෙ ථූලෙ විවජ්ජෙත්වා සංසට්ඨා යොජිතා භයා.

4390. තතො රාජා තරමානො යුත්තමාරුය්හ සන්දනං,
ඉත්ථාගාරං අජ්ඣභාසි[2] සබ්බාව අනුයාථ මං.

4391. වාළවීජනිමුණ්හීසං බග්ඝං ඡත්තං ච පණ්ඩරං,
උපාදිරථමාරුය්හ සුවණ්ණෙන[3] අලඞ්කතෝ.[4]

4392. තතො ච රාජා පායාසි පුරක්ඛත්වාන[5] සාරථිං,
බිපමෙව උපාගඤ්ඡි යත්ථ සම්මති තෙමියෝ.

4393. තඤ්ච දිස්වාන ආයන්තං ජලන්තමිව තෙජසා,
බත්තසඞ්ඝපරිබ්බූළ්හං[6] තෙමියෝ එතදබ්‍රවි.

4394. කච්චිනනු[7] තාත කුසලං කච්චි තාත අනාමයං,
කච්චිනනු රාජකඤ්ඤායො අරොගා මයහ මාතරෝ.

4395. කුසලඤ්චෙව මෙ පුත්ත අථො පුත්ත අනාමයං,
සබ්බාව[8] රාජකඤ්ඤායො අරොගා තුයහ මාතරෝ.

4396. කච්චිඝස මජ්ජපෝ[9] තාත කච්චි තෙ සුරමප්පියං,
කච්චි සවෙව ච ධම්මෙ ච දනෙ තෙ රමතී මනෝ.

---

1. ථාමසා – සය්හ. කාමුනා – මජ්ඣං.
2. අභාසථ – මජ්ඣං. අජ්ඣභාසිත්ථ – ච්.
3. සුවණ්ණඤ්ච – මජ්ඣං.
4. අලඞ්කතා – මජ්ඣං. සය්හ.
5. පුරක්ඛිත්වාන – මජ්ඣං. සය්හ.
6. පරිබූළ්හං – මජ්ඣං.
7. කච්චිනු – මජ්ඣං.
8. සබ්බා ච – මජ්ඣං.
9. කච්චි අමජ්ජපෝ – මජ්ඣං, සය්හ.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4385. ඇතුළු නුවර වැස්සෝ ද කුමරුවෝ ද වෛශ්‍යයෝ ද බමුණෝ ද වහා යානාවන් යොදත්වා. පුතුට කරුණු පවසන මම (ඔහු අභිෂේක කොටැ රැගෙන එන්නට) යමි.

4386. ඇතැරුවෝ ද අසරුවෝ ද රිය නැහෙන්නෝ ද පාබළ සෙනහ ද වහා යානාවන් යොදත්වා.

4387. රැස් වූ දනව් වැසියෝ ද නියම්ගම් වැසියෝ ද ඉක්මනින් යානාවන් යොදත්වා.

4388. රියැදුරෝ ඉක්මන් ගමන් ඇති සෛන්ධව නමැති අසුන් යෙදූ රථ ගෙන රජගෙදරට පැමිණියාහ. දේවයන් වහන්ස, අශ්වයෝ රථවල යොදනලදහ යි පැවැසූහ.

4389. දේවයන් වහන්ස, තර අශ්වයෝ වේගයෙන් පිරිහෙති. කෙට්ටු අශ්වයෝ කාය ශක්තියෙන් පිරිහෙති. මෙ වැනි අසුන් නො ගනිත්ව යි තර කෙට්ටු අශ්වයන් හැරදමා ජවබල සම අශ්වයන් යොදන ලදහ යි දැන්වූහ.

4390. ඉන්පසු රජ තෙමේ සුදුසු වාහනයක නැඟ සියල්ලෝ මා අනුව එත්ව යි අන්තඃපුරයට කී ය.

4391. වල්විදුනාව, නළල්පට, කඩුව, සේසත සහ රන්මිරිවැඩි සහළ ද රියට නංව යි කියා සුවර්ණාභරණයෙන් සැරසුණේ.

4392. රජ තෙමේ ඉන්පසු රියදුරා අභිමුඛ කොටැ තේමිය කුමරු යම් තැනෙකැ ද එතැනට වහාම පැමිණියේ ය.

4393. තේජසින් දිලියෙමින් මෙන් එන ක්ෂත්‍රිය සමූහයා විසින් පිරිවැරූ ඒ පියරජුන් දැක තේමිය කුමර මෙය පැවැසී ය.

4394. පියාණෙනි, ඔබ සුවසේ ද කිම රෝග පීඩා නැත්තාහු ද මාගේ මැණිවරු රාජකන්‍යාවෝ අරොග වූවාහු ද යි ඇසී ය.

4395. පුත මට දුකෙක් නැත. පුත්‍රය එහෙයින් නීරොග ද වෙමි. ඔබගේ සියලු මව්වරු නීරොග ද වෙති.

4396. පියාණෙනි, කිම මත්පැන් නො බොන්නහු ද? කිම ඔබට මත්පැන් අප්‍රිය ද? කිම වාක්සත්‍යයෙහි ද දශරාජධර්මයෙහි ද දීඃමහි ද ඔබගේ සිත ඇලේ ද යි ඇසී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4397. අවජ්ඣපෝ අහං පුත්ත අථෝ මේ සුරමප්පියං,
අථෝ සවේව ච ධඤ්ඤ ච දනෙ මේ රමතී මනෝ.

4398. කච්චි අරොගං යොඤ්ඤං තෙ කච්චි වහති[1] වාහනං,
කච්චි තෙ ව්‍යාධයෝ නත්ථි සරීරසුපතාපනා.

4399. අථෝ අරොගං යොඤ්ඤං මේ අථෝ වහති වාහනං,
අථෝ මේ ව්‍යාධයෝ නත්ථි සරීරසුපතාපනා.[2]

4400. කච්චි අන්නා ච තෙ පීතා මජ්ඣෙඩ්ඩ ච බහලා තව,
කොට්ඨාගාරඤ්ච කොසඤ්ච කච්චි තෙ පටිසණ්ඨිතං.[3]

4401. අථෝ අන්නා ච මේ පීතා මජ්ඣෙඩ්ඩ ච බහලා මම,
කොට්ඨාගාරඤ්ච කොසඤ්ච සබ්බං මේ පටිසණ්ඨිතං.

4402. සුආගතං තෙ මහාරාජ අථෝ තෙ අදුරාගතං,
පතිට්ඨාපෙන්තු පල්ලඞ්කං යත්ථ රාජා නිසඤ්ඤති.

4403. ඉධෙව තෙ නිසින්නස්ස නියතෙ පණ්ණසණ්ථතෙ,[4]
එළෙනා උදකමාදාය පාදෙ ඔක්කාලයන්තු තෙ.

4404. ඉදම්පි පණ්ණකං මය්හං රත්ඩං රාජ අලොණකං,
පරිභුඤ්ජ මහාරාජ පාහුනෝ මෙසි ආගතෝ.

4405. න වාහං[5] පණ්ණං භුඤ්ජාමි න හෙතං මය්හ භොජනං,
සාලීනං ඔදනං භුඤ්ජෙ සුචිං[6] මංසූපසෙවනං.

4406. අවෙජරකං මං පටිභාති එකකම්පි රහොගතං,
එදිසං භුඤ්ජමානානං කෙන වණ්ණෝ පසීදති.

4407. එකෝ රාජ නිපජ්ජාමි නීයතෙ පණ්ණසණ්ථතෙ,
තාය මේ එකසෙය්‍යාය රාජ වණ්ණෝ පසීදති.

4408. න වෙ[7] නෙත්තිංසබද්ධා මේ රාජරක්ඛා උපට්ඨිතා,
තාය මේ සුඛසෙය්‍යාය රාජ වණ්ණෝ පසීදති.

---

1. වාහති – මජ්ඣං. සය්හ. වී.
2. කාපියා – මජ්ඣං. සය්හ.
3. සන්ධතං – මජ්ඣං.
4. යන්ථරෙ – මජ්ඣං. වී.
5. නවාහං – මජ්ඣං.
6. සුචි – මජ්ඣං. සය්හ.
7. නව – මජ්ඣං

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4397. පුත, මම මත්පැන් නො බොන්නෙමි. එහෙයින් මට මත්පැන් අප්‍රිය ය. තවද සත්‍යයෙහි ද දශරාජධර්මයෙහි ද දීමෙහි ද මා සිත් ඇලෙයි.

4398. ඔබගේ හස්ත්‍යාදි වාහන නීරොග ද? හස්ත්‍යාදි වාහන ඔබ උසුලයි ද? කිම ඔබට ශරීර තවන රෝගයෝ නැද්ද?

4399. තවද පුත්‍රය, මාගේ සියලු වාහන නීරොගය. වාහන මා උසුලයි. ශරීර පෙළන රොගපීඩා මට නැත.

4400. පියාණෙනි, ඔබගේ ප්‍රත්‍යන්ත ජනපදවාසීහු සමෘද්ධ වූවෝ ද? ඔබගේ ගමනියම්ගම් වැසියෝ බොහෝ වූහු ද? කිම ඔබගේ කොටුගුළු භාණ්ඩාගාර පිරී තිබේ ද?

4401. පුත, මාගේ ප්‍රත්‍යන්ත ජනපද සමෘද්ධ ය. ගමනියම්ගම් බොහෝ වූ ජනාවාස ඇත්තාහ. මාගේ සියලු කොටුගුළු ධාන්‍යයෙන් ද සියලු කොෂ්ඨාගාර ධනයෙන් ද පිරුණේ ය.

4402. මහරජ, ඔබගේ යහපත් පැමිණීමෙකි. අයහපත් පැමිණීමෙක් නො වේ. රජ තෙමේ යම් තැනක හිඳී ද එ බඳු රාජාසනයක් පනවත්වා යි තේමිය කුමාර තෙමේ පැවැසී ය.

4403. මොනවට පැනැවුණු මේ කොළ ඇතිරියෙහි හුන් ඔබ මෙයින් දිය ගෙන පා සේදුව මැනැවැ යි තේමිය කුමාර තෙමේ කී ය.

4404. මහරජ, ලුණු නැති වැ තැම්බූ මේ කරකොළ මාගේ ආහාර වෙයි. මහරජ, අනුභව කළ මැනැවි. මෙහි පැමිණි තැනැත්තේ වනාහි මාගේ සත්කාරයට නිසි වෙයි.

4405. පුත, මම කොළ අනුභව කරන්නෙක් නො වෙමි. මේ මාගේ භොජනය නො වේ ම ය. මම පවිත්‍ර වූ මාංසයෙන් යුක්ත වූ ඇල් සහලේ බත් අනුභව කරන්නෙක් වෙමි.

4406. පුත, එකලා වැ රහසිගත වැ මේබඳු ආහාර අනුභව කරන්නත් ශරීරවර්ණය කවර කරුණෙකින් ප්‍රසන්න වේ දැ යි මට ආශ්චර්‍යයක් සේ වැටහේ.

4407. මහරජ, මනා වැ අතුරන ලද ඇතිරියෙහි එකලා වැ වැදහැමි. මහරජ, ඒ එකලා වැ වැදහෙවීමෙන් මාගේ වර්ණය ප්‍රසන්න වේ.

4408. මහරජ, කඩු බැඳැගෙන වටකැර ගත් රාජාරක්ෂකයෝ මට නැත. ඒ සුඛසයනය නිසා මාගේ වර්ණය ප්‍රසන්න වේ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4409. අතීතං නානුසොවාමි නප්පජ්ප්පමනාගතං,
පච්චුප්පන්නෙන යාපෙමි තෙන වණ්ණො පසීදති.

4410. අනාගතප්පජ්ප්පාය අතීතස්සානුසොවනා,
එතෙන බාලා සුස්සන්ති නළොව හරිතො ලුතො.

4411. හත්ථාණිකං රථාණිකං අස්සෙ පත්ති ච වම්මිනො,
නිවෙසනානි රම්මානි අහං පුත්ත දදාමි තෙ.

4412. ඉත්ථාගාරම්පි තෙ දම්මි සබ්බාලඞ්කරා භූසිතං,
තා පුත්ත පටිපජ්ජස්සු ත්වං නො රාජා භවිස්සසි.

4413. කුසලා නච්චගීතස්ස සික්ඛිතා චතුරිත්ථියො,
කාමෙ තං රමයිස්සන්ති කිං අරඤ්ඤෙ කරිස්සසි.

4414. පටිරාජූහි තෙ කඤ්ඤා ආනයිස්සං අලඞ්කතා,
තාසු පුත්තෙ ජනෙත්වාන අථ පච්ඡා පබ්බජිස්සසි.

4415. යුවා ච දහරො චාසි පඨමුප්පත්තිතො සුසු,
රජ්ජං කාරෙහි භද්දන්තෙ කිං අරඤ්ඤෙ කරිස්සසි.

4416. යුවා චරෙ බ්‍රහ්මචරියං බ්‍රහ්මචාරී යුවා සියා,
දහරස්ස හි පබ්බජ්ජා එතං ඉසීහි වණ්ණිතං.

4417. යුවා චරෙ බ්‍රහ්මචරියං බ්‍රහ්මචාරී යුවා සියා,
බ්‍රහ්මචරියං චරිස්සාමි නාහං රජ්ජෙනමත්ථිකො.

4418. පස්සාමි වොහං දහරං අම්ම තාත වදං නරං,[1]
කිච්ඡා ලද්ධං පියං පුත්තං අප්පත්වාව ජරං මතං.

4419. පස්සාමි වොහං දහරිං කුමාරිං චාරු දස්සනං,
නළවංසකළීරංව පලුග්ගං ජීවිතක්ඛයෙ.

1. වදන්තරං – ඔජසං, ස්‍යා. වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4409. ඉකුත් දෑ ගැන ශෝක නො කෙරෙමි. නොලත් දෑ නො පතමි. මෙකලැ ලැබුණු දෑයින් යැපෙමි. එයින් වර්ණය ප්‍රසන්න වේ.

4410. නො ලත් දෑ පැතීම යැ ඉකුත් දෑ ගැන ශෝක කිරීම යැ යන මෙයින් බාලයෝ සිඳින ලද කිල්වන් වූ බටදඬක් සෙයින් වියළෙත්.

4411. පුත, මම තොපට ඇත් ඇණියක් ද රිය ඇණියක් ද අසුන් ද සන්නද්ධ වූ පාබළ සෙනඟක් ද රම්‍ය වූ වාසාගාර ද දෙමි.

4412. පුත, සර්වාලංකාරයෙන් සැරසුණු අන්තඃපුරයක් ද තොපට දෙමි. ඔවුන් පිළිපදුව (පරිභොග කරව). තෙපි අපගේ රජ වෙව.

4413. පුත, නෘත්‍යගීතයෙහි දක්ෂ වූ භික්මුණා වූ චතුර වූ (දක්ෂ වූ) ස්ත්‍රීහු තොප කාමයෙහි යිත් අලවන්නාහු ය. මේ අරණ්‍යයෙහි කුමක් කරන්නහු ය.

4414. අන් රජුන්ගෙන් අලංකෘත කන්‍යාවන් තොපට ගෙන එන්නෙමි. ඔවුන් සමඟ වාසය කොට පුත්‍රයන් උපදවා පසුව පැවිදි වන්නහු ය.

4415. පුත, තෙපි යොවුන් වව, තුරුණු වව, උපතින් පළමු වියෙහි සිටින තරුණයෙක, පින්වත රාජ්‍යය කරව. අරණ්‍යයෙහි කුමක් කරන්නහු දැ යි පියරජ ඇසී ය.

4416. මහරජ, තරුණ වූයේ බ්‍රහ්මචර්‍යාවෙහි හැසිරෙන්නේ ය. (යෙදෙන්නේ ය) බ්‍රහ්මචර්‍යා ඇත්තේ ම තරුණ වන්නේ ය. තරුණ වූවහුට ම පැවිද්ද සුදුසු වේ. මෙය බුඩාදි ඍෂීන් විසින් වර්ණනා කරන ලද්දෙකි.

4417. තරුණ වූයේ බ්‍රහ්මචර්‍යාවෙහි හැසිරෙන්නේ ය. බ්‍රහ්ම-චර්‍යා ඇත්තේ ම තරුණ වන්නේ ය. මම බ්‍රහ්මචර්‍යාවෙහි හැසිරෙන්නෙමි. මම රාජ්‍යයෙන් අර්ථ ඇත්තෙමි නො වෙමි.

4418. මැණියෙනි, පියාණෙනි යි ප්‍රිය තෙපුල් කියන්නා වූ දුකසේ ලබා ගත්තා වූ දහර වූ ප්‍රිය වූ පුතුන් ජරාවට නො පැමිණෑ මැ මැරෙනු දැක ඇත්තෙමි.

4419. තරුණ වූ මනොඥ දර්ශන ඇත්කා වූ කුමරියන් කඩා දමන ලද උණකිළිල් සේ මාරයා විසින් ජීවිතයෙහි සිඳලන ලදුවන් දකිමි.

4420. දහරාපි හි මියන්ති නරා ච අථ නාරියො,
තත්ථ කො විස්සසෙ පොසො දහරොම්හීති ජීවිතෙ.

4421. යස්ස රත්‍යා විවසනෙ ආයුං අප්පතරං සියා,
අප්පොදකෙව මච්ඡානං කින්නු කොමාරකං තහිං.

4422. නිච්චමබ්භාහතො ලොකො නිච්චඤ්ච පරිවාරිතො,
අමොඝාසු වජන්තීසු කිං මං රජ්ජෙන සිඤ්චසි.

4423. කෙනමබ්භාහතො ලොකො කෙන ච පරිවාරිතො,
කායො අමොඝා ගච්ඡන්ති තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

4424. මච්චුනාබ්භාහතො ලොකො ජරාය පරිවාරිතො,
රත්‍යො අමොඝා ගච්ඡන්ති එවං ජානාහි ඛත්තිය.

4425. යථාපි තන්නෙ විතතෙ[1] යං යදෙවූපවීයති,
අප්පකං හොති වෙතබ්බං එවං මච්චාන ජීවිතං.

4426. යථා වාරිවහො පූරො ගච්ඡන්නුපනිවත්තති,[2]
එවමායු මනුස්සානං ගච්ඡන්නුපනිවත්තති.

4427. යථා වාරිවහො පූරො වහෙ රුක්ඛූපකූලජෙ,[3]
එවං ජරාය මරණෙන වුය්හන්නෙ වත පාණිනො.[4]

4428. හත්ථාණිකං රථාණිකං අස්සෙ පත්ති ච වම්මිනො,
නිවෙසනානි රම්මානි අහං පුත්ත දදාමි තෙ.

4429. ඉත්ථාගාරම්පි තෙ දම්මි සබ්බාලඞ්කාරභූසිතං,
තා පුත්ත පටිපජ්ජස්සු ත්වං නො රාජා භවිස්සසි.

4430. කුසලා නච්චගීතස්ස සික්ඛිතා චතුරිත්ථියො,
කාමෙ තං රමයිස්සන්ති කිං අරඤ්ඤෙ කරිස්සසි.

---

1. විතනෙත – මජ්ඣං, ස්‍යා.
2. ගච්ඡං නුපරිවත්තති – මජ්ඣං. ගච්ඡං න පරිවත්තති – ස්‍යා.
3. රුඞ්හපකූලජෙ.
4. සබ්බපාණිනො – මජ්ඣං, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4420. තරුණ වූ ස්ත්‍රීහු ද පුරුෂයෝ ද මරණයට පැමිණෙන්නාහු ම ය. එබඳු ජීවිතයෙහි කවර නම් (නුවණැති) පුරුෂයෙක් මම තරුණ වෙමියි විශ්වාස කරන්නේ ද?

4421. වළ දිය සිඳී යෑමෙන් මත්ස්‍යයන්ගේ විනාශය මෙන් රාත්‍රී (හා දවල්) ඉක්ම යෑමෙන් යමෙකුගේ ආයුෂ අල්පතර (අඩු) වන්නේ නම් එහි කවර නම් කුමාරභාවයක් ද?

4422. ලෝවැසි තෙමේ නිරන්තරයෙන් පහරන ලද්දේ වෙයි. නිරන්තරයෙන් පිරිවරන ලද්දේ වෙයි. ආයුෂ දිවා රෑ නොසිස් වැ (අතරක් නැති වැ) අත්හරින කල්හි මා රාජ්‍යාභිෂෙක කරන්නේ කුමට ද?

4423. ලෝවැසි තෙමේ කවරකු විසින් පහරන ලද්දේ වේ ද කවරකු විසින් පිරිවරන ලද්දේ වේ ද කවරහු නොසිස් වැ යෙද්ද, පුත්‍රය, මා විසින් විචාරන ලද්දේ එය මට කියව.

4424. ලෝවැසි තෙමේ මරහු විසින් පහරන ලද්දේ ය. ජරාව විසින් පිරිවරන ලද්දේ ය. රාත්‍රීහු නොසිස් වැ (නො නැවතී) යෙති. මහරජ මෙසේ දනුව.

4425. යම්සේ (රෙදි වියන යන්ත්‍රයෙහි) නූල් බැඳි කල්හි යම් යම් කොටස් වියනු ලැබේ ද ඉතිරිය ස්වල්ප වන්නේ ද මෙසේ සත්ත්වයන්ගේ ජීවිත ද (දවසින් දවස) ස්වල්ප වන්නේ ය.

4426. යම්සේ පිරුණා වූ දියපහර බැස යන්නේ ආපසු නො හැරේ ද මෙසේ මනුෂ්‍යයන්ගේ ආයුෂ ද ගෙවී යන්නේ ආපසු නො හැරේ.

4427. යම්සේ පිරුණු දියපහර බැස යනුයේ දෙගං ඉවුරෙහි වූ වෘක්ෂයන් මුල් සෝද හෙළාගෙන යන්නේ ද එසේ සත්ත්වයෝ ද ජරාවෙන් හා මරණයෙන් ඒකාන්තයෙන් ගසාගෙන යනු ලැබෙන් යයි පැවසී ය.

4428. පුත, හස්තිසේනාවක් ද රථ සේනාවක් ද සරසන ලද අශ්ව සේනාවක් ද පාබළ සේනාවක් ද මනරම් නිවෙසක් ද මම නොපට දෙමි.

4429. පුත, සර්වාලංකාරයෙන් සැරහුණු අන්තඃපුරයක් ද නොපට දෙමි. ඔවුන් පිළිපදුව, (පරිභොග කරව.) තෙපි අපගේ රජ වෙව.

4430. නෘත්‍යාගීතයෙහි දක්ෂ වූ හික්මුණා වූ චතුර වූ (දක්ෂ වූ) ස්ත්‍රීහු නොපම කාමයෙහි සිත් අලවන්නාහු ය. මේ අරණ්‍යයෙහි කුමක් කරන්නහු ද?.

4431. පවීරාජූහි තෙ කඤ්ඤා ආනයිස්සං අලඞ්කතා,
තාසු පුත්තෙ ජනෙත්වාන අථ පච්ඡා පබ්බජිස්සසි.

4432. යුවා ච දහරෝ වාසි පඨමුප්පත්තිතෝ සුසූ,
රජ්ජං කාරෙහි හද්දන්තෙ කිං අරඤ්ඤෙ කරිස්සසි.

4433. කොට්ඨාගාරඤ්ච කොසඤ්ච වාහනානි බලානි ච,
නිවෙසනානි රම්මානි අහං පුත්ත දදාමි තෙ.

4434. ගොමණ්ඩලපරිබ්බූළ්හා දයිසඞ්ඝපුරක්ඛතෝ,
රජ්ජං කාරෙහි හද්දන්ත කිං අරඤ්ඤෙ කරිස්සසි.

4435. කිං ධනෙන යං ජීයෙථ කිං භරියාය මරිස්සති,
කිං යොබ්බනෙන විණ්ණෙන යං ජරා අභිහෙඨයති.[1]

4436. කත්ථ කා නන්දි කා ඛිඩ්ඩා කා රතී කා ධනෙසනා,[2]
කිං මෙ පුත්තෙහි දරෙහි රාජ මුත්තොසමී බන්ධනා.

4437. සාහං එවං පජානාමි මඤ්ඤ මෙ නප්පමජ්ජති,
අන්තකෙනාධිපන්නස්ස කා රතී කා ධනෙසනා.

4438. එලානමිව පක්කානං නිච්චං පතනතෝ භයං,
එවං ජාතානමච්චානං නිච්චං මරණතෝ භයං.

4439. සායමෙකෙ න දිස්සන්ති[3] පාතො දිට්ඨා බහුජ්ජනා,
පාතො එකෙ න දිස්සන්ති සායං දිට්ඨා බහුජ්ජනා.

4440. අජ්ජෙව කිච්චං ආතප්පං[4] කො ජඤ්ඤා මරණං සුවෙ,
නහි නො සඞ්ගරං තෙන මහාසෙනෙන මච්චුනා.

4441. චොරා ධනස්ස පත්ථෙන්ති රාජ මුත්තොසමී බන්ධනා,
එහි රාජ නිවත්තස්සු නාහං රඤ්ඤමපත්ථයිං.

මූගපක්ඛජාතකං පඨමං.

---

1. යං ජරායාභිභුය්‍යති – මජ්ඣං. සය.
2. ධනෙසිනා – මජ්ඣං. සය්‍ා.
3. පස්සන්ති – චී.
4. ආතප – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4431. අන් රජුන්ගේ අලඞ්කෘත (සරසන ලද) කන්‍යාවන් ඔබට ගෙන දෙන්නෙමි. ඔවුන් සමඟ වාසය කොට පුත්‍රයන් උපදවා පසුව පැවිදි වන්නෙහි ය.

4432. පුත, ඔබ යොවුන් ය, තුරුණු වියෙහි ය, උපකින් පළමු වියෙහි සිටින තරුණයෙක, පින්වත රාජ්‍යය කරව. අරණ්‍යයෙහි කුමක් කරන්නෙහි දැයි පියරජ ඇසී ය.

4433. පුත, (ධාන්‍යයෙන් පිරුණු) කොටුගුළු ද (මුතු මැණික් ආදියෙන් පිරුණු) ගබඩා ද වාහන ද බළකාය ද මනරම් නිවෙස් ද යන සියල්ල මම ඔබට දෙමි.

4434. පින්වත, මිහිරි කතා ඇති රාජකන්‍යා සමූහයා විසින් වට කරන ලද්දේ දසි සමූහයා විසින් පිරිවරන ලද්දේ රාජ්‍යය කරව. මේ අරණ්‍යයෙහි කුමක් කරන්නෙහි දැ යි පියරජ ඇසී ය.

4435. මහරජ, යම් ධනයක් විනාශ වෙයි ද එබඳු ධනයෙන් මට කවර ප්‍රයෝජනයෙක් ද, යම් භාය්‍යාවක් මරණයට පත්වෙයි ද එබඳු භාය්‍යාවකගෙන් කවර ප්‍රයෝජනයෙක් ද, චරිත පූහුණුවෙන් ඇති කැර ගත් යම් තුරුණුබවකට ජරාව විඳින් පහර දෙනු ලැබේ ද එබඳු යෞවනයෙන් කවර ප්‍රයෝජනයෙක් ද?

4436. ඒ ලෝකයෙහි කවර නම් සතුටෙක් ද කවර නම් ක්‍රීඩාවක් ද කවර නම් පස්කම්ගුණ ඇල්මෙක් ද කවර නම් ධන සෙවීමෙක් ද මට දරුවන්ගෙන් හා අඹුවන්ගෙන් කවර ප්‍රයෝජනයෙක් ද මහරජ, මම කාමබන්ධනයෙන් හා නෘෂ්ණාබන්ධනයෙන් මිදුණේ වෙමි.

4437. මට මාරයා (මරණය) ප්‍රමාද නො වෙති යි මම මෙසේ දනිමි. ඒ මරහු විසින් මඩනා ලද්ද වූ මට රාජ්‍යසම්පත්තියෙහි කවර ඇල්මෙක් ද කවර නම් ධන සෙවීමෙක් ද?

4438. පැසුණු ඵලයන් (ගෙඩි) වැටීම හේතුකොට ගෙන ඇති වන නිරන්තර භය යම්සේ ද එසේ ම උපන්නා වූ මනුෂ්‍යයාට මරණය හේතුකොට ගෙන නිතර බිය ඇති වේ.

4439. උදේ දුටු බොහෝ දෙනා සවස නොදක්නා ලැබෙත්. සවස දුටු බොහෝ දෙනා උදේ නොදක්නා ලැබෙත්.

4440. අද අද ම වියදී කටයුතු ය. හෙට මරණය වන්නේ යයි කවරෙක් දන්නේ ද? ඒ මහාසේනා ඇති මාරයා සමඟ අපේ පොරොන්දුවක් නැත්තේ මැ යි.

4441. සොරු ධනය ප්‍රාර්ථනා කෙරෙති. මහරජ, මම ඒ ධනබන්ධනයෙන් මිදුණෙමි. මහරජ, මෙහි එනු මැනැවි. මාගේ වචනයෙහි මනාකොට පවතිනු මැනැවි. මම රාජ්‍යයෙන් ප්‍රයෝජන ලබන්නෙක් නො වෙමි.

පළමුවන මූගපක්ඛ ජාතක යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

2. මහාජනකජාතකං

4442. කොයං මජ්ඣෙ සමුද්දස්මිං අපස්සං තීරමායුහෙ,
කං[1] ත්වං අත්ථවසං ඤත්වා එවං වායමසෙ භුසං.

4443. නිසම්ම වත්තං ලොකස්ස වායාමස්ස ච දෙවතෙ,
තස්මා මජ්ඣෙ සමුද්දස්මිං අපස්සං තීරමායුහෙ.

4444. ගම්භීරෙ අප්පමෙය්‍යස්මිං තීරං යස්ස න දිස්සති,
මොසො තෙ පුරිස වායාමො අප්පත්වාව මරිස්සසි.

4445. අනණො ඤාතීනං හොති දෙවානං පිතුනො[2] ච සො,
කරං පුරිසකිච්චානි න ච පච්ඡානුතප්පති.

4446. අපාරනෙය්‍යං යං කම්මං අඵලං කිලමථුද්දයං,
තත්ථ කො වායමෙනත්ථො මච්චු යස්සාභිනිප්පතං.[3]

4447. අපාරනෙය්‍යං අච්චන්තං යො විදිත්වාන දෙවතෙ,
න රක්ඛෙ අත්තනො පාණං ජඤ්ඤා සො යදි[4] භාපයෙ.

4448. අධිප්පාය ඵලං එකෙ අස්මිං ලොකස්මි දෙවතෙ,
පයොජයන්ති කම්මානි තානි ඉජ්ඣන්ති වා න වා.

4449. සන්දිට්ඨිකං කම්මඵලං නනු පස්සසි දෙවතෙ,
සන්නා අඤ්ඤෙ තරාමහං තඤ්ච පස්සාමි සන්තිකෙ.

4450. සො අහං වායමිස්සාමි යථාසත්තිං යථාබලං,
ගච්ඡං පාරං සමුද්දස්ස කාසං[5] පුරිසකාරියං.

4451. යො ත්වං එවං ගතෙ ඔසෙ අප්පමෙය්‍යෙ මහණ්ණවෙ,
ධම්මවායාමසම්පන්නො කම්මනා[6] නාවසීදසි,
සො ත්වං තත්ථෙව ගච්ඡාහි යත්ථ තෙ[7] නිරතො මනො.

---

1. කිං – මජ්ඣං. ස්‍යා.
2. පිතුනඤ්ච – මජ්ඣං. ස්‍යා.
3. නිපඵතං – ස්‍යා.
4. යති – මජ්ඣං.
5. කස්සං – මජ්ඣං, ස්‍යා.
6. කම්මුනා – මජ්ඣං. ස්‍යා,
7. කෙ – මජ්ඣං,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

2. මහාජනක ජාතකය

4442. පරතෙර නොපැනෙන මේ මුහුදු මැද කවරෙක් නම් පිනමින් වියඹ කරන්නේ ද? තෙපි කවර ප්‍රයෝජනයක් දැනැ මෙසේ මහත් සේ වැර වඩන්නහු දැ යි මණිමෙඛලා නම් දෙවිදු ඇසූ ය.

4443. එම්බා දෙවිදුව, මම ලෝවැසියා පිළිබඳ පවත්නා උත්සාහය ද කටයුතු ද එහි අනුසස් ද දනැ වසමි. එහෙයින් මේ මුහුදු මැද පරතෙර නො දක්නෙම් උත්සාහ කරමි යි මහාජනක කුමාර තෙමේ කී ය.

4344. ගැඹුරු පමණ නො කළහැකි මේ සාගරයෙහි පරතෙර යමකුට නො පෙනේ ද එම්බා පුරුෂය තොපගේ උත්සාහය හිස් යැ පරතෙරට නො පැමිණ මැ මැරෙන්නෙහි යි දෙවිදු පැවැසූ.

4445. එම්බා දෙවිදුව, වියඹ කරන යම් පුරුෂයෙක් වේ නම් හේ නැයනට ද දෙවබඹුනට ද ණය නැත්තෙකි නොහොත් ඔවුනතර නො ගැරහිය යුත්තෙකි. නො පසු තැවෙන්නකැ යි ද කුමාර තෙමේ කී ය.

4446. යම් කටයුත්තක් උත්සාහයෙන් මුදුන් පත් කළ නො හැකි ද ඵල නැත්තේ ද වෙහෙසම මැ උපදවා ද මරණය මැ එහි ලා වේ ද එ බඳු උත්සාහයෙන් කවර නම් වැඩෙක් දැ යි දෙවිදු ඇසූ.

4447. එම්බා දෙවිදුව, යමෙක් අත්‍යන්තයෙන් මුදුන්පත් නො කළ හැකි බව ද දනැ උත්සාහය අත්හරී නම් හේ වනාහි තමන්ගේ ජීවිතය නො රකී යැ යි දනු මැනැවි.

4448. එම්බා දෙවිදුව, මෙ ලොවැ සමහරු තම අදහස් පරිදි ප්‍රයෝජන පතා වෙළෙහෙළඳාම් ආදි කටයුතු කෙරෙති. ඒ කටයුතු ඔවුන්ගේ අදහස් සිඳ කරන්නේ ද නො කරන්නේ ද වෙයි. කායික චෛතසික වියඹ ඇත්තන්ට සමෘද්ධ වේ මැ යි.

4449. එම්බා දෙවිදුව, මා සමඟ ආ සෙසු වෙළෙන්දෝ වියඹ නො කොටැ මුහුදෙහි ගිලුණාහ. මම වනාහි උත්සාහයෙන් මෙතෙක් පිනමි. සමීපයෙහි සිටින තොප ද දකිමි. මේ ජාතියෙහි ගන්නා ලද උත්සාහය පිළිබඳ විපාක නො වේ දැ යි බලව.

4450. සමුද්‍රයාගේ පරතෙරට යන ඒ මම වනාහි උත්සාහ ගනිමි. ශක්ති පරිදි බල පරිදි පුරුෂයකුට අයත් ක්‍රියාව කරමි යි කුමාර තෙමේ කී ය.

4451. යම් බඳු තෙපි මෙවැනි ගැඹුරු පළල් සැඩ පහර ඇති පමණ නො කළැ'කි මහසයුරෙහි දැහැමි වූ උත්සාහයෙන් යුත් වූයෙහි පුරුෂ වියඹයෙන් නො ගිලෙහු. යම් තැනෙකැ තොපගේ සිත ඇලුණේ ද එ තැනට යන්නැ යි දෙවිදු පැවැසූ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4452. සුරියුග්ගමනෙ නිධි අථො ඔග්ගමනෙ නිධි,
අන්තො නිධි බහි නිධි න අන්තො න බහි නිධි.

4453. ආරොහනෙ මහානිධි අථො ඔරොහනෙ නිධි,
චතුරො ච මහාසාලා සමන්තා යොජනෙ නිධි.

4454. දන්තග්ගෙසු මහානිධි වාලග්ගෙසු ච කෙබුකෙ,
රුක්ඛග්ගෙසු මහානිධි සොළසෙතෙ මහානිධි
සහස්සත්ථාමො පලලඞ්කො සීවලාරාධනෙන ච.

4455. ආසිංසෙථෙව පුරිසො[1] න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං යථා ඉව්ජිං තථා අහු.

4456. ආසිංසෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං උදකා ථලමුබ්භතං.

4457. වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං යථා ඉව්ජිං තථා අහු.

4458. වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං උදකා ථලමුබ්භතං.

4459. දුක්ඛූපනීතොපි නරො සපඤ්ඤො,
ආසං න ජීන්දෙය්‍ය සුඛාගමාය,
බහූ හි ඵස්සා අහිතා හිතා ච
අචිතක්කිතා මච්චුමුපබ්බජන්ති.[2]

4460. අචින්තිතම්පි භවති චින්තිතම්පි චිනස්සති,
න හි චින්තාමයා භොගා ඉත්ථියා පුරිසස්ස වා.

4461. අපුරාණං[3] වත හො රාජා සබ්බභූමෙමා දිසම්පති,
නාජ්ජ නච්චෙ නිසාමෙති න ගීතෙ කුරුතෙ මනො.

4462. න මිගෙ නපි උය්‍යානෙ නපි හංසෙ උදික්ඛති,
මූගොව තුණ්හිමාසීනො න අත්ථමනුසාසති.

---

1. ආසිංසෙථො පුරිසො - මජසං.
2. මච්චුමුබ්බජන්ති - මජසං.
3. අපොරාණං - මජසං. ස්‍යා. වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4452. ඉර උදවන තැන නිධාන යැ බස්නා තැන නිධාන යැ ඇතුළත නිධාන යැ පිටත නිධාන යැ ඇතුළතැ ද පිටතැ ද නො වූ නිධාන යැ.

4453. නහින තැන නිධාන යැ බහින තැන නිධාන යැ මහ සල්ගස් සතර තිබෙන තැන නිධාන සතර යැ හාත්පසින් යොදනක් තැන නිධාන ය.

4454. දළ කෙළවරැ මහා නිධාන යැ වලග කෙළවරැ නිධාන යැ දිය ඇති තැන නිධාන යැ ගස් මුදුන නිධාන යැ යි යන මේ සොළොස් නිධානයෝ වෙති. සිවලි දේවිය සතුටු කිරීමෙන් යමෙක් සහස්‍රස්ථාම දුන්නෙහි දුනුදිය නහාලියහේ ද සිවුරැස් පය්‍යඞ්කයෙහි හිස් දෙර දනහේ ද ඔහුට රජය දියයුතු යැ යි පෝලජනක රජු විසින් මරණ මඤ්චකයේ දී පැවැසිණ.

4455. නුවණැති පුරුෂ තෙම ප්‍රාර්ථනා කරන්නේ මැ ය. උත්සාහ වැඩීමෙහි දී නො කලකිරෙන්නේ ය. යම්සේ කැමතිවීම් ද එසේ විය. මම (එබඳු) තමා දකිමි.

4456. නුවණැ'ති පුරුෂ තෙමේ ප්‍රාර්ථනා කරන්නේ මැ ය. උත්සාහ වැඩීමෙහි දී නො කලකිරෙන්නේ ය. මම දියෙන් ගොඩ ආ ඒ තමන් දකිමි.

4457. නුවණැති පුරුෂ තෙම වැයම් කරන්නේ මැ ය. නො කලකිරෙන්නේ ය. යම්සේ කැමතිවීම් ද එසේ විය. මම (එබඳු) තමා දකිමි.

4458. නුවණැති පුරුෂ තෙම වැයම් කරන්නේ මැ ය. නො කලකිරෙන්නේ ය. මම දියෙන් ගොඩ නගනලද (ඒ) තමා දකිමි.

4459. නුවණැ'ති මිනිස් තෙමේ දුකට පත් වූයේ ද සුවපත් වීමට ඇති කැමැත්ත සුන් නො කරන්නේ ය. පහස්හු හිත ද අහිත ද වෙති. එය නොසිතන්නෝ මරණයට පත් වෙති.

4460. නොසිතූ දේ වෙයි. සිතූ දේ වැනැසෙයි. ස්ත්‍රියකට හෝ පුරුෂයකුට සිතීමෙන් මැ සිදුවන සම්පත් නැතැ යි (මහාජනක රජතෙමේ උදන් ඇණි ය.)

4461. පින්වත්නි, සියලු පොළොවට හිමි දිසාවනට අධිපති රජ තෙමේ ඒකාන්තයෙන් මැ පෙර පරිදි නො වේ. අද නැටුම් නො බලයි. ගී ගැයීමෙහි සිත් ඇලුම් නො කෙරේ.

4462. මෘගයුද්ධ නො බලයි, උයන්කෙළි නො කෙරෙයි, හංසයන් ද නො බලයි, ගොළුවකු මෙන් නිහඬ වැ හුන්නේ අඥීයෙන් ධර්මයෙන් අනුශාසනා නො කෙරේ යයි ද මහාජන තෙමේ කී ය.

4463. සුඛකාමා රහොසීලා වධබන්ධා උපාරතා,[1]
කෙසන්නු[2] අජ්ජ ආරාමෙ දහරා වුද්ධා ච අච්ඡරෙ.

4464. අතික්කන්තවනථා ධීරා නමො තෙසං මහෙසිනං,
යෙ උසසුකම්හි ලොකම්හි විහරන්ති අනුසසුකා.

4465. තෙ ඡෙත්වා මච්චුනො ජාලං තං තං මායාවිනො දළහං,
ජින්නාලයත්තා[3] ගච්ඡන්ති කො තෙසං ගතිමාපයෙ.

4466. කදහං මිථිලං පීතං විසාලං සබ්බතොපහං,[4]
පහාය පබ්බජිස්සාමි තං කදසසු[5] භවිස්සති.

4467. කදහං මිථිලං පීතං විභත්තං භාගසො මිතං,
පහාය පබ්බජිස්සාමි තං කදසසු භවිස්සති.

4468. කදහං මිථිලං පීතං බහුපාකාරතොරණං,*
පහාය පබ්බජිස්සාමි තං කදසසු භවිස්සති.

4469. කදහං මිථිලං පීතං දළහමට්ටාලකොට්ඨකං,
පහාය පබ්බජිස්සාමි තං කදසසු භවිස්සති.

4470. කදහං මිථිලං පීතං සුවිභත්තං මහාපථං,
පහාය පබ්බජිස්සාමි තං කදසසු භවිස්සති.

4471. කදහං මිථිලං පීතං සුවිභත්තන්තරාපණං,
පහාය පබ්බජිස්සාමි තං කදසසු භවිස්සති.

4472. කදහං මිථිලං පීතං ගවාස්සරථපිළිතං,
පහාය පබ්බජිස්සාමි තං කදසසු භවිස්සති.

4473. කදහං මිථිලං පීතං ආරාමවනමාලිනිං,
පහාය පබ්බජිස්සාමි තං කදසසු භවිස්සති.

---

1. අපාරුතා – මජසං. ස්‍යා.
   උපාරුතා – සී. පු.
2. කස්සනු – මජසං. ස්‍යා.
3. සන්දලයන්තා – මජසං. ස්‍යා.
4. පබ්බතො පහං – මජසං.
5. කදසසු – මජසං
* බහලපාකාරතොරණං – සීහළ අට්ඨකථා (හේ. වි. 43 පිට 7 කාණ්ඩය)

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4463. නිවන්සුව කැමැති වැසුණු සිලාදි ගුණ ඇති වධ-බන්ධන නැති තරුණ මහලු පසේබුදුවරු කවර කෙනෙකුන්ගේ අරමෙහි අද වෙසෙත් ද?

4464. තෘෂ්ණා නැති නුවණැ'ති යම් කෙනෙක් රාගාදි කෙලෙසුන්ගෙන් උත්සන්න බවට පත් ලෝකයෙහි උත්සාහ නැත්තෝ වැ වෙසෙද්ද ඒ මහර්ෂි උතුමන්ට නමස්කාර වේවා.

4465. උන්වහන්සේ ඉතා මායාකාරී වූ මරුවාගේ ඒ දැඩි දැල සිඳ සුන් කළ කෙලෙස් ඇති බැවින් (සසරින් නික්ම) යෙති. ඒ උතුමන් වසන තැනට මා පමුණුවන්නේ කවරෙක් ද යි (මහාජනක රජ තෙමේ සතුට ප්‍රකාශ කෙළේ යැ.)

4466. කවර කලෙක මම සමෘද්ධ වූ විශාල වූ හාත්පසින් බබළන්නා වූ මියුලු නම් නුවර හැර දමා පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4467. කවර කලෙක මම බෙදූ කොටස් වශයෙන් ප්‍රමාණ කළ සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? ඒ පැවිද්ද කවරද සිදු වන්නේ ද?

4468. කවර කලෙක මම මහත් පවුරු* දෙරටු තොරණින් යුත් සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? කවරද එය සිදු වන්නේ ද?

4469. කවර කලෙක මම දැඩි අටලු දෙරකොටු යුත් සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4470. කවර කලෙක මම මැනැවින් කොටස් කළ මහවීදි ඇති සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4471. කවර කලෙක මම මැනැවින් විභාග කළ සල්පිල් ඇති සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4472. කවර කලෙක මම ගවයන් අසුන් යෙදූ රථ ගැවසී ගත් සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4473. කවර කලෙක මම පුෂ්පාරාම ඵලාරාම හා උයන්පෙළ ඇති සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

---

* "බහල පාකාර" (හේ. වී.) අටුවකථා 43 පිට.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4474. කදහං මිථිලං ගීතං උය්‍යානවනමාලිනිං,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු[1] භවිස්සති.

4475. කදහං මිථිලං ගීතං පාසාදවනමාලිනිං,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4476. කදහං මිථිලං ගීතං නිපුරං[2] රාජබන්ධුනිං,
මාපිතං සොමනස්සෙන වෙදෙහෙන යසස්සිනා
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4477. කදහං වෙදෙහෙ[3] ගීතෙ නිවිතෙ ධම්මරකඛිතෙ,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4478. කදහං වෙදෙහෙ ගීතෙ අජෙය්‍යෙ ධම්මරකඛිතෙ,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4479. කදහං අනොතපුරං රම්මං විහඞ්ගං භාගශෙසා ගීතං,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4480. කදහං අනොතපුරං රම්මං සුධාමත්තිකලෙපනං,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4481. කදහං අනොතපුරං රම්මං සුවිගඞ්ඩං මනොරමං,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4482. කදහං කූටාගාරෙ විහඞ්ගෙ භාගශෙසා ගීතෙ,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4483. කදහං කූටාගාරෙ ච සුධාමත්තිකලෙපනෙ,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4484. කදහං කූටාගාරෙ ච සුවිගඞ්ඩෙ මනොරමෙ,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4485. කදහං කූටාගාරෙ ච ලිඞ්ගෙ වඤ්ඣඵොසිතෙ,[4]
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

---

1. තං කුදස්සු – මජ්ඣං. තං කදසු – සය්හ.
2. තං පුරං – මජ්ඣං.
3. විදෙහෙ – මජ්ඣං.
4. භූසිතෙ – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4474. කවර කලෙක මම උයන් වතු ද වන පඬුකෑයි ද ඇති සමෘද්ධ වූ මියුලු නුවර හැර පියා පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4475. කවර කලෙක මම ප්‍රාසාද හා වන පඬුකෑයි ඇති සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4476. කවර කලෙක මම රජුගේ නෑයන්ගෙන් යුත් තුන්-පවුරකින් පිරිවර වූ සොමනස්ස නම් වේදේහ රජු විසින් මවන ලද සමෘද්ධ වූ මියුලු නුවර හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4477. කවර කලෙක මම දහැමින් රැකුණු රැස් කළ ධන ධාන්‍ය ඇති සමෘද්ධ වූ විදේහ වැසියන් හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4478. කවර කලෙක දහැමින් රැකුණු සතුරන් විසින් නොදිනිය හැකි සමෘද්ධ වූ විදෙහ වැසියන් හැර පැවිදි වන්නෙම් ද? එය කවද සිදු වන්නේ ද?

4479. කවර කලෙක විභාග කළ, කොටස් වශයෙන් ප්‍රමාණ කළ සිත්කලු අන්තඃපුරය හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4480. කවර කලෙක සුණු පිරියම් ද මැටි ආලේප ද කළ සිත්කලු අන්තඃපුරය හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4481. කවර කලෙක පිවිතුරු සුවඳින් යුත් මනරම් වූ අන්තඃපුරය හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4482. කවර කලෙක මම විභාග කළ, කොටස් වශයෙන් ප්‍රමාණ කළ, කූටාගාරයන් හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4483. කවර කලෙක මම සුණු පිරියමින් ද මැටි ආලේප-යෙන් ද යුත් කූටාගාරයන් හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4484. කවර කලෙක මම පිවිතුරු සුවඳ ඇති සිත් අලවන කූටාගාරයන් හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4485. කවර කලෙක මම ආලේප කළ, රත්සඳුන් ඉස්නාලද කූටාගාරයන් හැර පැවිදි වන්නෙම් ද? එය කවරද සිදු වන්නේ ද?

4486. කදහං සුවණ්ණපල්ලඞ්කා ගොණකෙ චිත්තසන්ථතෙ,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4487. කදහං මණිපල්ලඞ්කා ගොණකෙ චිත්තසන්ථතෙ,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4488. කදහං කපපාසකොසෙය්‍යං ඛොමකොටුම්බරානි ච,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4489. කදහං පොක්ඛරණියො රම්මා චක්කවාකූපකූජිතා,[1]
මන්දාලකෙහි සඤ්ඡන්නා පදුමුපපලකෙහි ච
පහාය පබ්බජිස්සාමි තං කදස්සු[2] භවිස්සති.

4490. කදහං හත්ථිගුම්බෙ සබ්බාලඞ්කාරභූසිතෙ,
සුවණ්ණකච්ඡෙ මාතඞ්ග හෙමකප්පනවාසසෙ.[3]

4491. ආරුළ්හෙ ගාමණිකෙහි තොමරඞ්කුසපාණිහි,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4492. කදහං අස්සගුම්බෙ සබ්බාලඞ්කාරභූසිතෙ,
ආජානියෙ ච ජාතියා සින්ධවෙ සීඝවාහනෙ.

4493. ආරුළ්හෙ ගාමණිකෙහි ඉලලියාචාපධාරිහි,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4494. කදහං රථසෙණියො සන්නද්ධෙ උස්සිතද්ධජෙ,
දීපෙ අට්ඨාපි වෙය්‍යග්ඝෙ සබ්බාලඞ්කාරභූසිතෙ.

4495. ආරුළ්හෙ ගාමණිකෙහි චාපහත්ථෙහි වම්මිහි,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4496. කදහං සොවණ්ණරථෙ සන්නද්ධෙ උස්සිතද්ධජෙ,
දීපෙ අට්ඨාපි වෙය්‍යග්ඝෙ සබ්බාලඞ්කාරභූසිතෙ.

4497. ආරුළ්හෙ ගාමණිකෙහි චාපහත්ථෙහි වම්මිහි,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4498. කදහං සජ්ඣුරථෙ සන්නද්ධෙ උස්සිතද්ධජෙ,
දීපෙ අට්ඨාපි වෙය්‍යග්ඝෙ සබ්බාලඞ්කාරභූසිතෙ.

4499. ආරුළ්හෙ ගාමණිකෙහි චාපහත්ථෙහි වම්මිහි,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

---

1. චක්කවක්කූපකූජිතා - මජ්ඣ.
2. තං කුදස්සු - මජ්ඣ. කදසු - සී.
3. හෙමකප්පනිවාසයෙ - මජ්ඣ.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4486. කවර කලෙක මම සතරඟුල් පමණ එළු ලොමින්කළ විසිතුරු පලස් අතුළ රන්මුවා පය්‍යඞ්කයන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4487. කවර කලෙක මම සතරඟුල් පමණ එළු ලොමින් කළ විසිතුරු පලස් අතුළ මිණිමුවා පය්‍යඞ්කයන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4488. කවර කලෙක මම කපුපිළි හා කොසෙය්‍ය වස්ත්‍ර ද කොමුපිළි ද කොටුම්බර දේශයෙහි නිපන් වස්ත්‍ර ද හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදුවන්නේ ද?

4489. කවර කලෙක මම සක්වාලිහිණියන් විසින් පැවැත්-වෙන නාද ඇති මඤ්ඤුලකයන්ගේ හා පියුම් උපුල් ආදි පස්පියුම්න් ගැවසී ගත් රමණීය පොකුණු හැර පියා පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4490-4491. කවර කලෙක සව්බරණින් සැරහුණු රන් පොරොදු හා රන් ශීර්ෂාභරණයෙන් හා රන් දූලින් ද යුත් තෝමර හා අකුසු ගත් අත් ඇති ඇතරුවන් නැගුණු ඇත්රජුන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4492-4493. කවර කලෙක උපතින් ම ආජානීය වූ සව්බරණින් සැරසුණු සෙන්ධව නම් ශීඝ්‍රවාහන වූ කරවාල දුනු දරන අසරුවන් නැගුණු අශ්ව සමූහයන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4494-4495. කවර කලෙක මැනැවින් යැදුණු එසවුණු ධජ ඇති අතුළ දිවිසම් ද ව්‍යාඝ්‍රසම් ද ඇති සියලු අලඞ්කාරයෙන් සැරසූ දුනු ගත් අත් ඇති යුද්ධ සැට්ටයෙන් සැරසුණු රියැදුරන් නැගුණු රථ පඞ්ක්ති ද හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4496-4497. කවර කලෙක මම සන්නද්ධ වූ එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සියලු අලඞ්කාරයෙන් සැරසූ යුද සැට්ටයෙන් සැරසුණු දුනු ගත් අත් ඇති රියැදුරන් නැගුණු සුවර්ණමය රථයන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4498-4499. කවර කලෙක මම සන්නද්ධ වූ එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සියලු අලඞ්කාරයෙන් සැරසූ යුද සැට්ටයෙන් සැරසුණු දුනු ගත් අත් ඇති රියැදුරන් නැගුණු රිදී රථයන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4500. කදහං අස්සරථෙ සන්නදෙධ උසසිතදධජෙ,
දීපෙ අථොපි වෙය්‍යගෙඝ සබබාලඞකාරභූසිතෙ.

4501. ආරුළෙහ ගාමණිියෙහි චාපහත්ථොහි වම්මිහි,
පහාය පබබජිස්සාමි තං කදස්ස භවිස්සති.

4502. කදහං ඔට්ඨරථෙ සන්නදෙධ උසසිතදධජෙ,
දීපෙ අථෙ පි වෙය්‍යගෙඝ සබබාලඞකාරභූසිතෙ.

4503. ආරුළෙහ ගාමණිියෙහි චාපහත්ථොහි වම්මිහි,
පහාය පබබජිස්සාමි තං කදස්ස භවිස්සති.

4504. කදහං ගොණරථෙ සන්නදෙධ උසසිතදධජෙ,
දීපෙ අථොපි වෙය්‍යගෙඝ සබබාලඞකාරභූසිතෙ.

4505. ආරුළෙහ ගාමණිියෙහි චාපහත්ථොහි වම්මිහි,
පහාය පබබජිස්සාමි තං කදස්ස භවිස්සති.

4506. කදහං අජරථෙ සන්නදෙධ උසසිතදධජෙ,
දීපෙ අථොපි වෙය්‍යගෙඝ සබබාලඞකාරභූසිතෙ.

4507. ආරුළෙහ ගාමණිියෙහි චාපහත්ථොහි වම්මිහි,
පහාය පබබජිස්සාමි තං කදස්ස භවිස්සති.

4508. කදහං මෙණ්ඩරථෙ සන්නදෙධ උසසිතදධජෙ,
දීපෙ අථොපි වෙය්‍යගෙඝ සබබාලඞකාරභූසිතෙ.

4509. ආරුළෙහ ගාමණිියෙහි චාපහත්ථොහි වම්මිහි,
පහාය පබබජිස්සාමි තං කදස්ස භවිස්සති.

4510. කදහං මිගරථෙ[1] සන්නදෙධ උසසිතදධජෙ,
දීපෙ අථොපි වෙය්‍යගෙඝ සබබාලඞකාරභූසිතෙ.

4511. ආරුළෙහ ගාමණිියෙහි චාපහත්ථොහි වම්මිහි,
පහාය පබබජිස්සාමි තං කදස්ස භවිස්සති.

4512. කදහං හත්ථාරුහෙ[2] සබබාලඞකාරභූසිතෙ,
නීලවම්මධරෙ[3] සූරෙ තොමරඞකුස පාණිනෙ;
පහාය පබබජිස්සාමි තං කදස්ස භවිස්සති.

---

1. මිගරථෙව – මජ්ඣං.
2. හත්ථාරොහෙව – මජ්ඣං.
3. නීලවම්මිධරෙව – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4500-4501. කවර කලෙක මම සන්නද්ධ වූ එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සියලු අලඬකාරයෙන් සැරසූ යුද සැටයෙන් සැරසුණු දුනු ගත් අත් ඇති රියැදුරන් නැගුණු අශ්වයන් යෙදූ රථ හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4502-4503. කවර කලෙක මම සන්නද්ධ වූ එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සියලු අලඬකාරයෙන් සැරසූ යුද සැටයෙන් සැරසුණු දුනු ගත් අත් ඇති රියැදුරන් නැගුණු ඔටුවන් යෙදූ රථ හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4504-4505. කවර කලෙක මම සන්නද්ධ වූ එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සියලු අලඬකාරයෙන් සැරසූ යුද සැටයෙන් සැරසුණු දුනු ගත් අත් ඇති රියැදුරන් නැගුණු ගවයන් යෙදූ රථ හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4506-4507. කවර කලෙක මම සන්නද්ධ වූ එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සියලු අලඬකාරයෙන් සැරසූ යුද සැටයෙන් සැරසුණු දුනු ගත් අත් ඇති රියැදුරන් නැගුණු එළුවන් යෙදූ රථ හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4508-4509. කවර කලෙක මම සන්නද්ධ වූ එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සියලු අලඬකාරයෙන් සැරසූ යුද සැටයෙන් සැරසුණු දුනුගත් අත් ඇති රියැදුරන් නැගුණු කිරළුවන් යෙදූ රථ හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4510-4511. කවර කලෙක මම සන්නද්ධ වූ එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සියලු අලඬකාරයෙන් සැරසූ යුද සැටයෙන් සැරසුණු දුනුගත් අත් ඇති රියැදුරන් නැගුණු මුවන් යෙදූ රථ හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4512. කවර කලෙක මම සියලු අලඬකාරයෙන් සැරසුණු නිල්වන් සැටට දරන තෝමර හා අකුසු ගත් අත් ඇති ශූර ඇතරුවන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4513. කදහං අස්සාරුහෙ[1] සබ්බාලඞ්කාරභූසිතෙ,
නීලවම්මධරෙ සූරෙ ඉල්ලියාවාපධාරිනෙ
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4514. කදහං රථාරුහෙ[2] සබ්බාලඞ්කාරභූසිතෙ.
නීලවම්මධරෙ සූරෙ වාපහත්ථෙ කලාපිනෙ[3]
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4515. කදහං ධනුග්ගහෙ සබ්බාලඞ්කාරභූසිතෙ,
නීලවම්මධරෙ සූරෙ වාපහත්ථෙ[4] කලාපිනෙ
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4516. කදහං රාජපුත්තෙන[5] සබ්බාලඞ්කාරභූසිතෙ,
විතතවම්මධරෙ සූරෙ කඤ්ඤනාවෙළධාරිනෙ;
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4517. කදහං අරියගණෙ වත්ථවනෙන[6] අලඞ්කතෙ,
හරිචන්දනලිත්තඞ්ගෙ කාසිකුත්තමධාරිනෙ;
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4518. කදහං අම්බවගණෙ සබ්බාලඞ්කාරභූසිතෙ,
පිතවම්මධරෙ සූරෙ පුරතො ගච්ඡමාලිනෙ;
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4519. කද සත්තසතා හරියා සබ්බාලඞ්කාරභූසිතා,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4520. කද සත්තසතා හරියා සුසඤ්ඤා තනුමජ්ඣිමා,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

4521. කද සත්තසතා හරියා අස්සවා පියභාණිනී,
පහාය පබ්බජිස්සාමී තං කදස්සු භවිස්සති.

4522. කද සතඵලං කංසං සොවණ්ණං සතරාජිකං,
පහාය පබ්බජිස්සාමි තං කදස්සු භවිස්සති.

---

1. අස්සාරොහෙව – මජ්ඣ. සය්හ.
2. රථාරොහෙව – මජ්ඣ. සය්හ.
3. කලාපිනො – සය්හ.
4. වාපහත්ථ – මජ්ඣ.
5. රාජපුත්තෙව – මජ්ඣ.
6. වතවත්තෙන – මජ්ඣ.

* මෙම පොත්තේ පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4513. කවර කලෙක මම සියලු අලඞ්කාරයෙන් සැරසුණු නිල්වන් සැටට දරන කරවාල හා දුනු දරන ශූර අසරුවන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4514. කවර කලෙක මම සියලු අලඞ්කාරයෙන් සැරසුණු නිල්වන් සැටට දරන දුනුගත් අත් ඇති භියවුරු දරන රියැදුරන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4515. කවර කලෙක මම සියලු අලඞ්කාරයෙන් සැරසුණු නිල්වන් සැටට ඇති භියවුරු දරන දුනු ගත් අත් ඇති ශූර ධනුර්ධරයන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4516. කවර කලෙක මම සියලු අලඞ්කාරයෙන් සැරසුණු විසිතුරු සැටට හා ස්වර්ණමය හිස් වෙළුම් ඇති ශූර වූ රාජ කුමාරයන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4517. කවර කලෙක මම වස්ත්‍ර යුත් සැරසුණු රන්වන් සඳුන් ගැල් වූ ශරීර ඇති උතුම් කසිසළු දරන බ්‍රාහ්මණ සමූහය හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4518. කවර කලෙක මම සියලු අලඞ්කාරයෙන් සැරසුණු කහපැහැ දරන ශූර වූ පෙරටුව යන ඇමති ගණයා හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4519. කවර කලෙක මම සියලු අලඞ්කාරයෙන් සැරසුණු සන්සියයක් භායන්‍හවන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4520. කවර කලෙක මම මැනැවින් හික්මුණු කෘශ වූ මැද පෙදෙස් ඇති සත්සියයක් භායන්‍හවන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4521. කවර කලෙක මම කීකරු පියවදන් ඇති සත්සියයක් භායන්‍හවන් හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4522. කවර කලෙක මම සියක් පලමකින් කළ සිය ගණන් ඉරි ඇති රන්මුවා තලිය හැර පැවිදි වන්නෙම් ද, එය කවරද සිදු වන්නේ ද?

4523. කදස්සු මං හත්ථිගුම්බා සඛ්ඛාලඛ්කාරභූසිතා,
සුවණ්ණකච්ඡා මාතඛ්හා හෙමකප්පනවාසසා.

4524. ආරුළ්හා ගාමණ්ඩියෙහි තොමරංකුසපාණිහි,
යන්තා මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4525. කදස්සු මං අස්සගුම්බා සඛ්ඛාලඛ්කාරභූසිතා,
ආජානීයා ච ජාතියා සින්ධවා සීසවාහනා.

4526. ආරුළ්හා ගාමණ්ඩියෙහි ඉලලියාචාපධාරිහි,
යන්තා මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4527. කදස්සු මං රථසෙණ්ඩියා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සඛ්ඛාලඛ්කාරභූසිතා.

4528. ආරුළ්හා ගාමණ්ඩියෙහි චාපහත්ථෙහි වම්මිහි.
යන්තා මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4529. කදස්සු මං සොණ්ණරථා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සඛ්ඛාලඛ්කාරභූසිතා

4530. ආරුළ්හා ගාමණ්ඩියෙහි චාපහත්ථෙහි වම්මිහි,
යන්තා මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4531. කදස්සු මං සජ්ජුරථා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සඛ්ඛාලඛ්කාරභූසිතා.

4532. ආරුළ්හා ගාමණ්ඩියෙහි චාපහත්ථෙහි වම්මිහි,
යන්තා මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4533. කදස්සු මං අස්සරථා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සඛ්ඛාලඛ්කාරභූසිතා.

4534. ආරුළ්හා ගාමණ්ඩියෙහි චාපහත්ථෙහි වම්මිහි,
යන්තා මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4535. කදස්සු මං ඔට්ඨරථා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සඛ්ඛාලඛ්කාරභූසිතා.

4536. ආරුළ්හා ගාමණ්ඩියෙහි චාපහත්ථෙහි වම්මිහි,
යන්තා මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4523-4524. කවර කලෙක සියලු අලඞ්කාරයෙන් සැරසුණු රන් පොරොවු ඇති රන්මුවා ශීර්ෂාභරණ ද සැරසුණු වස්ත්‍ර ද ඇති තෝමර හා අකුසු ගත් අත් ඇති ඇතරුවන් නැගුණු හස්ති-රාජයන්ගෙන් යුත් ඇත් සමූහයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එ බඳු පැවිද්ද කවරදෑ සිදු වන්නේ ද?

4525-4526. කවර කලෙක සව්බරණින් සැරසුණු උපතින් ම ශීඝ්‍ර ගමන් ඇති සෙන්ධව නම් වන කරවාලායුධ හා දුනු දරන අසරුවන් නැගුණු අශ්ව සමූහයෝ වනයට යන හුදෙකලා මා අනුව නො යන්නාහු ද, එ බඳු පැවිද්ද කවරදෑ සිදු වන්නේ ද?

4527-4528. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුද සැටට දරන රියැදුරන් නැගුණු රථ පංක්තීහු හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එ බඳු පැවිද්ද කවරදෑ සිදු වන්නේ ද?

4529-4530. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුද සැටට දරන රියැදුරන් නැගුණු රන්මුවා රථ සමූහයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද එ බඳු පැවිද්ද කවරදෑ සිදු වන්නේ ද?

4531-4532. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුද සැටට දරන රියැදුරන් නැගුණු රිදියෙන් කළ රථ සමූහයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එ බඳු පැවිද්ද කවරදෑ සිදු වන්නේ ද?

4533-4534. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුද සැටට දරන රියැදුරන් නැගුණු අසුන් යෙදූ රථයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එ බඳු පැවිද්ද කවරදෑ සිදු වන්නේ ද?

4535-4536. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුද සැටට දරන රියැදුරන් නැගුණු ඔටුවන් යෙදූ රථ සමූහයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එ බඳු පැවිද්ද කවරදෑ සිදු වන්නේ ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4537. කදස්සු මං ගොණරථා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සබ්බාලඞ්කාරභූසිතා.

4538. ආරුළ්හා ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4539. කදස්සු මං අජරථා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සබ්බාලඞ්කාරභූසිතා.

4540. ආරුළ්හා ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති,

4541. කදස්සු මං මෙණ්ඩරථා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සබ්බාලඞ්කාරභූසිතා.

4542. ආරුළ්හා ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4543. කදස්සු මං මිගරථා සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සබ්බාලඞ්කාරභූසිතා.

4544. ආරුළ්හා ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4545. කදස්සු මං හත්ථාරුහා සබ්බාලඞ්කාරභූසිතා,
නීලවම්මධරා සූරා තොමරඞ්කුසපාණිනො;
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4546. කදස්සු මං අස්සාරුහා සබ්බාලඞ්කාරභූසිතා,
නීලවම්මධරා සූරා ඉලලියා[1]චාපධාරිනො;
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4547. කදස්සු මං රථාරුහා සබ්බාලඞ්කාරභූසිතා,
නීලවම්මධරා සූරා චාපහත්ථා කලාපිනො;
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4548. කදස්සු මං ධනුග්ගහා සබ්බාලඞ්කාරභූසිතා,
නීලවම්මධරා සූරා චාපහත්ථා කලාපිනො;
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

1. ඉන්දියා – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4537-4538. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුදසැටට දරන රියැදුරන් නැගුණු ගවයන් යෙදූ රථ සමූහයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එ බඳු පැවිද්ද කවරදෝ සිදු වන්නේ ද?

4539-4540. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුදසැටට දරන රියැදුරන් නැගුණු එළුවන් යෙදූ රථ සමූහයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එ බඳු පැවිද්ද කවරදෝ සිදු වන්නේ ද?

4541-4542. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුදසැටට දරන රියැදුරන් නැගුණු තිරෙළුවන් යෙදූ රථ සමූහයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදෝ සිදු වන්නේ ද?

4543-4544. කවර කලෙක යුදයට සැරසුණු එසවූ ධජ ඇති අතුළ දිවිසම් හා ව්‍යාඝ්‍රසම් ඇති සව්බරණින් සැරසුණු දුනු ගත් අත් ඇති යුද සැටට දරන රියැදුරන් නැගුණු මුවන් යෙදූ රථ සමූගයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදෝ සිදු වන්නේ ද?

4545. කවර කලෙක සව්බරණින් සැරසුණු නිල්වන් සැටට දරන තෝමර හා අකුසු ගත් අත් ඇති ශූර ඇතරුවෝ වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදෝ සිදු වන්නේ ද?

4546. කවර කලෙක සියලු අලඬාරයෙන් සැරසුණු නිල් සැටට දරන කරවාලායුධ හා දුනු දරන ශූර අසරුවෝ වනයට හුදෙකලා යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදෝ සිදු වන්නේ ද?

4547. කවර කලෙක සව්බරණින් සැරසුණු නිල්වන් සැටට දරන දුනු ගත් අත් ඇති ශූර රථ සේනාවෝ වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදෝ වන්නේ ද?

4548. කවර කලෙක සව්බරණින් සැරසුණු නිල්වන් සැටට දරන දුනු භියවුරු ගත් අත් ඇති ශූර ධනුර්ධරයෝ වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදෝ සිදු වන්නේ ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4549. කදස්සු මං රාජපුත්තා සබ්බාලඞ්කාරභූසිතා,
චිත්තවම්මධරා සූරා කණ්ඨිනාවෙය්‍යධාරිනෝ;
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු[1] භවිස්සති.

4550. කදස්සු මං අරියගණා වත්ථවන්නා අලඞ්කතා,
හරිචන්දනලිත්තඞ්ගා කාසිකුත්තමධාරිනෝ;
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4551. කදස්සු මං අම්බවගණා සබ්බාලඞ්කාරභූසිතා,
පීතවම්මධරා සූරා පුරතෝ ගච්ඡමාලිනී;
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4552. කදස්සු මං සත්ත සතා හරියා සබ්බාලඞ්කාරභූසිතා,
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4553. කදස්සු මං සත්තසතා හරියා සුසඤ්ඤා තනුමජ්ඣිමා,
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4554. කදස්සු මං සත්තසතා හරියා අඤ්ඤවා පියභාණිනී,
යන්තං මං නානුයිස්සන්ති තං කදස්සු භවිස්සති.

4555. කදහං පත්තං ගහෙත්වාන මුණ්ඩා සඞ්ඝාටිපාරුතා,
පිණ්ඩිකාය චරිස්සාමි තං කදස්සු භවිස්සති.

4556. කදහං පංසුකූලානං උජ්ඣිතානං මහාපථෙ,
සඞ්ඝාටිං ධාරයිස්සාමි තං කදස්සු භවිස්සති.

4557. කද සත්තාහං මෙසෙ[2] ඔවට්ඨෝ[3] අලලවීවරෝ,
පිණ්ඩිකාය චරිස්සාමි තං කදස්සු භවිස්සති.

4558. කදහං සබ්බභං[4] යානං රුක්ඛා රුක්ඛං වනා වනං,
අනපෙක්ඛා විහරිස්සාමි[5] තං කදස්සු භවිස්සති.

4559. කදහං ගිරිදුග්ගෙසු පහීනභයභෙරවෝ,
අදුතියෝ විහරිස්සාමි[6] තං කදස්සු භවිස්සති.

---

1. තං කුදස්සු – මජ්ඣං. කදස්සු – සී්‍යා.
2. සත්තමසෙ – ච්. මජ්ඣං
3. ඔවට්ඨෝ – මජ්ඣං. ඔවට්ඨෙ – සී්‍යා.
4. සබ්බට්ඨානං ගන්ත්වා – මජ්ඣං. සබ්බඤ්ඤං – සී්‍යා.
5. ගමිස්සාමි – මජ්ඣං.
6. ගමිස්සාමි – මජ්ඣං. සී්‍යා.

* මෙම පොත්තේ පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4549. කවර කලෙක සවිබරණින් සැරසුණු නිල්වන් සැට්ට දරන රන් සැරයටි ගත් අත් ඇති ශූර රාජ පුත්‍රයෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදු සිදු වන්නේ ද?

4550. කවර කලෙක අලඬාර වස්ත්‍රයෙන් සැරසුණු රත්සඳුන් ගැල්වුණු ශරීරාවයව ඇති උතුම් කඝීසළු දරන බ්‍රාහ්මණ සමූහයෝ වනයට හුදෙකලා යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදු සිදු වන්නේ ද?

4551. කවර කලෙක සවිබරණින් සැරසුණු කහපැහැ ඇති පෙරටුව යන ශූර ඇමැතිගණයා හුදෙකලා වනයට යන මා අනුව නො යද්ද, එබඳු පැවිද්ද කවර කලෙක සිදු වන්නේ ද?

4552. කවර කලෙක සර්වාලඬාරයෙන් සැරසුණු සත්සියයක් ස්ත්‍රීහු හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදු සිදු වන්නේ ද?

4553. කවර කලෙක මනාකොට හික්මුණු කෘශ වූ සිරුරු මැද පෙදෙස් ඇති සත්සියයක් භාය්‍යාවෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවර කලෙක සිදු වන්නේ ද?

4554. කවර කලෙක ප්‍රිය තෙපුල් ඇති සත්සියයක් භාය්‍යාවෝ හුදෙකලා වනයට යන මා අනුව නො යන්නාහු ද, එබඳු පැවිද්ද කවරදු සිදු වන්නේ ද?

4555. කවර කලෙක හිස මුඩු කළ සහළ සිවුරක් පෙර වූ මම පාත්‍රයක් රැගෙන පිඬු සිහා හැසිරෙන්නෙමි ද, එබඳු පැවිද්ද කවර කලෙක සිදු වන්නේ ද?

4556. කවර කලෙක මහ මග හැර දැමූ පාංශුකූල වස්ත්‍රයෙන් සහළ සිවුරක් දරන්නෙමි ද, එබඳු පැවිද්ද කවර කලෙක සිදු වන්නේ ද?

4557. කවර කලෙක (බැඳගෙන වස්නා) සන්ද වැස්සෙන් තෙත් සිවුරු ඇති මම පිඬු පිණිස හැසිරෙමි ද, එබඳු පැවිද්ද කවර කලෙක සිදු වන්නේ ද?

4558. කවර කලෙක ගසින් ගසට වනයෙන් වනයට පැමිණ ඇලුම් නොකොට මුළු දවස ම වසන්නෙමි ද, එබඳු පැවිද්ද කවර කලෙක සිදු වන්නෙ ද?

4559. කවර කලෙක ගිරි දුර්ගමස්ථානයන්හි පහ වූ බිය ඇති වැ හුදෙකලා ව හැසිරෙන්නෙමි ද එබඳු පැවිද්ද කවර කලෙක සිදු වන්නේ ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4560. කදා වීණංව රුජකො සන්නතන්තිං මනොරමං,
චිත්තං උජුං කරිස්සාමි තං කදස්සු භවිස්සති.

4561. කදහං රථකාරොව පරිකන්තං උපාහනං,
කාමසංයොජනෙ ඡෙච්ඡං[1] යෙ දිබ්බෙ යෙ ච මානුසෙ.

4562. තා ච සන්නසතා භරියා සබ්බාලඞ්කාරභූසිතා,
බාහා පග්ගය්හ පක්කන්දුං කසමා නො විජහිස්සති.

4563. තා ච සන්නසතා භරියා සුසඤ්ඤා තනුමජ්ඣිමා,
බාහා පග්ගය්හ පක්කන්දුං කසමා නො විජහිස්සති.

4564. තා ච සන්නසතා භරියා අස්සවා පියභාණිනී,
බාහා පග්ගය්හ පක්කන්දුං කසමා නො විජහිස්සති.

4565. තා ච සන්නසතා භරියා සබ්බාලඞ්කාරභූසිතා,
හිත්වා සම්පදයී[2] රාජා පබ්බජ්ජාය පුරක්ඛතො.

4566. තා ච සන්නසතා භරියා සුසඤ්ඤා තනුමජ්ඣිමා,
හිත්වා සම්පදයී රාජා පබ්බජ්ජාය පුරක්ඛතො.

4567. තා ච සන්නසතා භරියා අස්සවා පියභාණිනී,
හිත්වා සම්පදයී රාජා පබ්බජ්ජාය පුරක්ඛතො.

4568. හිත්වා සතඵලං[3] කංසං සොවණ්ණං සතරාජිකං,
අග්ගහී මත්තිකාපත්තං[4] තං දුතියාභිසෙවනං.

4569. වෙසමා අභිසමා ජාලා කොසා[5] ඩය්හානනී භාගසො,
රජතං ජාතරූපඤ්ච මුත්තා වෙළුරියා බහූ.

4570. මණයො සඞ්ඛමුත්තා ච වත්ථීකං[6] හරිචන්දනං,
අජිනං දන්තභණ්ඩඤ්ච ලොහං කාළායසං බහූ;
එහි රාජ නිවත්තස්සු මා තෙ තං විනසා[7] ධනං

---

1. ඡෙත්වා – මජ්ඣං.
2. සම්පදද්වී – මජ්ඣං. සම්පදවී – ස්‍යා.
3. සතපලං – මජ්ඣං. ස්‍යා.
4. මත්තිකං – මජ්ඣං.
5. කොටයා – වී.
6. වත්ථකං – මජ්ඣං. ස්‍යා.
7. විනාසා – මජ්ඣං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4560. කවර කලෙක වීණා වාදකයෙකු සත් නතක් ඇති සිත්කලු වීණාව මෙන් සිත සෘජු කරන්නෙම් ද, එබඳු පැවිද්ද කවර කලෙක සිදු වන්නේ ද?

4561. කවර කලෙක මම පාවහන් සිඳුනා සොම්වරකු මෙන් දිව්‍ය වූ ද මානුසික වූ ද කාමසඤ්ඤාජනයන් සිඳින්නෙම් ද යි (මහාජනක රජ කී ය.)

4562. සියලු අලඞ්කාරයෙන් සැරසුණු ඒ සත්සියයක් භාර්‍යාවෝ කවර හෙයින් අප අත්හරින්නෙහි ද යි අත් ඔසවාගෙනැ හැඬූහ.

4563. මනාව හික්මුණු කෘශ වූ මධ්‍යභාග ඇති ඒ සත්සියයක් භාර්‍යාවෝ කවර හෙයින් අප හරනෙහි ද යි අත් ඔසවාගෙනැ හැඬූහ.

4564. කීකරු වූ ප්‍රිය තෙපුල් ඇති ඒ සත්සියයක් භාර්‍යාවෝ කවරහෙයින් අප හරනෙහි ද යි අත් ඔසවාගෙන හැඬූහ.

4565. සියලු අලඞ්කාරයෙන් සැරසුණු ඒ සත්සියයක් භාර්‍යාවන් ද හැර පැවිද්ද විසින් පෙරටු කළ රජ තෙම නික්මැ ගියේ ය.

4566. මනාකොට හික්මුණු කෘශ වූ ශරීර මධ්‍ය ප්‍රදෙශ ඇති ඒ සත්සියයක් භාර්‍යාවන් හැර පැවිද්ද විසින් පෙරටු කළ රජ තෙම නික්මැ ගියේ ය.

4567. කීකරුවූ ප්‍රිය තෙපුල් ඇති ඒ සත්සියයක් භාර්‍යාවන් හැර පැවිද්ද විසින් පෙරටු කළ රජ නික්මැ ගියේ ය.

4568. එ රජ තෙම සියක් පළමකින් කළ සියගණන් රේඛා ඇති රන්තලිය හැර දෙවැනි අභිෂෙකයක් මෙන් ඒ මැටි පාත්‍රය ගත්තේ ය.

4569. (මහරජ ඔබගේ නුවර පෙරමග) ගෙවල් ගින්නෙන් ඇවිල ගියේ ය. ගිනිදැලින් සම වැ දිලිසේ. බඩු ගබඩා කොටස් වශයෙන් දැවෙයි. එහි රිදී, රන්, මුතු, වෙරළුමිණි ද බොහෝ ය.

4570. මැණික් ද, සක්මුතු ද, පිළී කොඩි ද, රසඳුන් ද, අඳුන් දිවිසම් ද, දළමුවා බඩු ද, තඹ ආදී ලොහ භාණ්ඩ ද, කාළ ලොහ භාණ්ඩ ද බොහෝ වෙයි. මහරජ එනු මැනව. නවතිනු මැනව. ඔබ සතු ධනය නො නසනු මැනවැ යි (සිවලී බිසව කීවා ය.)

4571. සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං,
මිථිලාය[1] ඩය්හමානාය න මෙ කිඤ්චි අඩය්හථ.

4572. අටවියො සමුප්පන්නා රට්ඨං විද්ධංසයන්ති තං,
එහි රාජ නිවත්තස්සු මා රට්ඨං විනසා ඉදං.

4573. සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං,
රට්ඨෙ විලුම්පමානම්හි න මෙ කිඤ්චි අජීරථ.[2]

4574. සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං,
පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථා.

4575. කිම්හෙසො මහතො සොසො කා නු ගාමෙ කිලීලියා,
සමණඤ්ඤෙව[4] පුච්ඡාම කත්ථෙසො අභිසටො[5] ජනො.

4576. මමං ඔහාය ගච්ඡන්තං එත්ථෙසො අභිසටො ජනො,
සීමාතික්කමනං යන්තං මුනිමොනස්ස පත්තියා;
මිස්සං නන්දීහි ගච්ඡන්තං කිං ජානමනුපුච්ඡසි.

4577. මාස්සු තිණ්ණෙණ අමඤ්ඤිත්ථො[6] සරීරං ධාරයං ඉමං,
අතීරණෙය්‍යමිදං[7] කම්මං බහූ හි පරිපන්ථයො.

4578. කො නු මෙ පරිපන්ථස්ස මම එවං විහාරිනො,
යො නෙවදිට්ඨෙ නාදිට්ඨෙ කාමානමභිපත්ථයෙ.

4579. නිඤ්ඤ තන්දී විජම්භිකා අරතී භත්තසම්මදෙ,
ආවසන්ති සරීරට්ඨා බහූහි පරිපන්ථයො[8].

4580. කල්‍යාණං වත මං භවං බ්‍රාහ්මණමනුසාසසි,
බ්‍රාහ්මණං යෙව[9] පුච්ඡාමි කොනු ත්වමසි මාරිස.

---

1. මිථිලං – මජ්ඣං.
2. අහාරථ – මජ්ඣං. අඩය්හථ මාමෙ කිචි අහාරථ – ස්‍යා.
3. ගාමෙව කිලියා – මජ්ඣං. කීලියා – ස්‍යා.
4. සමණං තෙව – මජ්ඣං, ස්‍යා.
5. අභිසතො – මජ්ඣං.
6. අමුඤ්ඤිත්ථ – මජ්ඣං.
7. අතීරණෙය්‍ය යමිදං බහූහි පරිබන්ධයො – මජ්ඣං.
8. පරිබන්ධයො – මජ්ඣං.
9. ත්වෙව – වී. මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4571. යම්බඳු අපට කිසිවක් නැත්තේ ද ඒ අපි ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වම්හ. මියුලු නුවර දැවෙන කල්හි මා සතු කිසිවක් නො දැවෙන්නේ ය යි (රජ තෙම කීය.)

4572. මහරජ, වනගත සොරු පැමිණියහ. ඔබ සතු ඒ රට වනසති. මහරජ, එනු මැනව. නවතිනු මැනව. මේ රට නොනසනු මැනවැ යි (සිවලි බිසව කීවා ය.)

4573. යම්බඳු අපට කිසිවක් නැත්තේ ද ඒ අපි ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වම්හ. රට පහරන කලැ මාගේ කිසිවක් නො නැසේ.

4574. යම්බඳු අපට අයත් කිසිවක් නැද්ද අපි ඒකාන්තයෙන් සුවසේ ජීවත් වම්හ. ආහස්සර නම් බඹලෝ වැසි දෙවියන් මෙන් ප්‍රීතිය ආහාර කොට ඇත්තෝ වන්නෙමු යි (රජ තෙම කී ය.)

4575. මේ මහාජන ඝෝෂය කවර හෙයින් ද? ගමෙහි මෙන් මේ කිලිකිලි යන ශබ්දය කුමක් ද? ශ්‍රමණ වූ ඔබ මැ විචාරමු. කවර හෙයින් මේ මහජනයා රැස්වේ ද යි (නාරද නම් තාපස තෙම ඇසී ය.)

4576. ඔවුන් හැර යන මා නිසා මේ මහාජනයා මෙහි රැස් වූයේ ය. කෙලෙස් සීමාව ඉක්මවා යන අනගාරිය මුනි සංඛ්‍යාත තපසට පැමිණීම් පිණිස සතුටින් යන මා දැන ගෙන කුමට විචාරන්නෙහි ද යි (රජ තෙම ඇසී ය.)

4577. මේ පැවිදි සිරුර දරන්නේ කෙලෙස් නැසුවේ යැ යි නො සිතව. මේ කෙලෙස් සමූහය මෙපමණකින් තරණය කළහැකි ද නො වේ. උපද්‍රවයෝ බොහෝ යැ යි (තාපස තෙම කී ය.)

4578. යමෙක් මෙ ලොවහි ද පරලොවහි ද කාමසම්පත් නො පතන්නේ නම් එසේ වෙසෙන මට කවර උවදුරෙක් වන්නේ ද යි (බෝසත් තෙම කී ය.)

4579. නින්ද ය අලසබව ය ඇතුම් ඇරීම ය නො ඇල්ම ය බත්මත ය යන බොහෝ උවදුරු තොපගේ සිරුරෙහි පිහිටා වෙසෙනැ යි (නාරද තාපස තෙම කී ය.)

4580. පින්වත් බ්‍රාහ්මණය, මට යහපත් අනුශාසනා කෙරෙහි. නිදුකාණෙනි, ඔබ කවරෙක් ද යි බ්‍රාහ්මණ වූ ඔබ මැ විචාරමි යි (බෝසත් තෙම කී ය.)

4581. නාරදෙ ඉති මෙ නාමං[1] කස්සපො ඉති මං විදූ,
භොතො සකාසෙ ආගඤ්ඡිං සාධු සබ්ඝි සමාගමො.

4582. තස්ස තෙ සබ්බො ආනන්දෙ විහාරො උපවත්තතු,
යදූනං තං පරිපූරෙහි ඛන්තියා උපසමෙන ච.

4583. පසාරය සන්නත්තඤ්ච උන්නත්තඤ්ච පසාරය,
කම්මං විජ්ජඤ්ච ධම්මඤ්ච සක්කත්වාන පරිබ්බජ.

4584. බහූහත්ථී ච අස්සෙ ච නගරෙ ජනපදනි ච,
හිත්වා ජනක පබ්බජිතො කපලෙල රතිමජ්ඣගා.

4585. කච්චින්නු තෙ ජානපද[2] මිත්තා මම්වා ච ඤාතකමා,
දුභිං අකංසු[3] ජනක කස්මා චෙතං[4] අරුච්චථ.

4586. න මිගාජින ජාතුච්ච[5] අහං කඤ්චි කුදාචනං,
අධම්මෙන ජිනෙ ඤාතිං න චාපි ඤාතයො මමං.

4587. දිසවාන ලොකවත්තන්තං ඛජ්ජන්තං කද්දමීකතං,
හඤ්ඤරෙ බජ්ඣරෙ චෙත්ථ යත්ථ සත්තො පුථුජ්ජනො;
එතාහං උපමං කත්වා භික්ඛකොස්මි මිගාජින.

4588. කොනු තෙ භගවා සත්ථා කස්සෙතං වචනං සුචි
නහි කප්පං වා විජ්ජං වා පච්චක්ඛාය රථෙසභ:
සමණං ආහු වත්තන්තං යථා දුක්ඛස්සතික්කමො.

4589. න මිගාජින ජාතුච්ච අහං කඤ්චි කුදාචනං,
සමණං බ්‍රාහ්මණං වාපි සක්කත්වා අනුපාවිසිං.

---

1. නාමෙන – මජසං. ස්‍යා.
2. ජනපද – මජසං;
3. දුබ්බිමකංසු – මජසං.
4. තෙ තං
5. ජාතුච්ච – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4581. නාරද යනු මාගේ නම යි, ගොත්‍ර වශයෙන් කාශ්‍යප යැ යි මා දනිති. පින්වත් තොප සමීපයට පැමිණියෙමි. සත්පුරුෂයන් හා සමාගමය යහපති.

4582. ඒ තොපට සියලු සතුටු විහරණ වේවා, සිවු බඹවිහරණය පවතීවා, යමක් අඩු වෙයි නම් එය ඉවසීමෙන් හා සන්හිඳීමෙන් සම්පූර්ණ කළ මැනවි.

4583. අවමානය ද දුරු කළ මැනවි. අතිමානය ද දුරු කළ මැනවි. දශ කුසලකර්ම ද පඤ්ඤාභිඤ්ඤ අෂ්ටසමාපත්ති ද මහණදම් ද සකස් කොට පවතිනු මැනවැ යි (නාරද තාපස තෙම අවවාද කොට ගියේ ය.)

4584. එම්බා මහාජනක රජතුමනි, බොහෝ ඇතුන් ද අසුන් ද නගරයන් හා ජනපදයන් ද හැර පැවිදි වූ ඔබ මැටි පාත්‍රයෙහි ඇලුණහු ය.

4585. එම්බා මහාජනක රජතුමනි, කිම එ දනව් වැස්සෝ ද මිත්‍රාමාත්‍යයෝ ද, නැයෝ ද ඔබට කිසි අපරාධයක් කළාහු ද කවර හෙයින් මේ මැටි පාත්‍රය කැමති වූහු ද යි (මිගාජින නම් තාපස තෙම ඇසී ය.)

4586. එම්බා මිගාජින තවුසනි, ඒකාන්තයෙන් ම මම කවර කලෙකවත් අධර්මයෙන් කිසි නැයකු නො දිනුවෙමි. නැයෝ ද මා නො දිනූහ යි බෝසත් තෙමේ කී ය.

4587. එම්බා මිගාජින තවුසනි, යම් ක්ලේශවස්තුවක ඇලුණු පෘථග්ජනයෙක් නැසේ ද බැඳේ ද මෙහි කෙලෙසුන් විසින් අනුභව කරන කෙලෙසුන් විසින් ම මඩ ගොහුරුවක් කරන ලද ලෝකයාගේ පැවැත් ම දුටු මම මේ කාරණය ම උපමා කොට පිඬු සිහන්නෙක් වීමි යි බෝසත් තෙමේ කීය.

4588. මහරජ, ඔබගේ පින්වත් අනුශාසක තෙමේ කවරෙක් ද? ඔබ කියන පිරිසුදු බස කවරකුගේ වචනයක් ද? ශ්‍රමණ වේශය හෝ ශ්‍රමණ විද්‍යාව හෝ හැර යමසේ දුක් ඉක්මවා ද එසේ පවත්නා ශ්‍රමණයකු නො ම කියද්ද එහෙයිනැ යි මිගාජින තෙමේ කී ය.

4589. පින්වත් මිගාජින තවුසනි, ඒකාන්තයෙන් මම කිසි කලෙක කිසියම් ශ්‍රමණයකුට හෝ කිසියම් බ්‍රාහ්මණයෙකුට හෝ සත්කාර කොට ඇසීමට නො පැමිණියෙමියි බෝසත් තෙමේ කී ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4590. මහතා චානුභාවෙන ගච්ඡන්තො සිරියාජලං,
ගීයමානෙසු ගීතෙසු වජ්ජමානෙසු වග්ගුසු;
තුරියතාළිතසංසුට්ඨෙ සම්මතාලසමාහිතෙ.

4591. සමිගාජින මද්දක්ඛිං ඵලං[1] අම්බං තිරොච්ඡදං,
තුජ්ජමානං[2] මනුස්සෙහි ඵලකාමෙහි[3] ජන්තුහි.

4592. සො ඛො හන්තං සිරිං හිත්වා ඔරොහිත්වා මිගාජින,
මූලං අම්බස්සුපාගඤ්ජිං ඵලිනො නිපඵලිතස්ස ච.

4593. ඵලං අම්බං හතං දිස්වා විද්ධස්තං[4] විනලීකතං,
අථෙතං ඉතරං අම්බං නීලොභාසං මනොරමං.

4594. එවමෙව නූනම්හෙපි ඉස්සරෙ බහුකණ්ටකෙ,
අමිත්තා නො වධිස්සන්ති යථා අම්බො ඵලී හතො.

4595. අජිනම්හි හඤ්ඤතෙ දීපි නාගො දන්තෙහි හඤ්ඤතෙ,
ධනම්හි ධනිනො හන්ති අනිකෙතමසන්ථවං;
ඵලී අම්බො අඵලො ච තෙ සත්ථාරො උභො මම.

4596. සබ්බො ජනො පව්‍යධිතො රාජා පබ්බජිතො ඉති,
හත්ථාරොහා අණිකට්ඨා රථිකා පත්තිකාරිකා.

4597. අස්සාසයිත්වා ජනතං ඨපයිත්වා පටිච්ඡදං,
පුත්තං රජ්ජෙ ඨපෙත්වාන අථ පච්ඡා පබ්බජිස්සසි.

4598. වත්තා මයා ජානපද මිත්තාමච්චා ච ඤාතකා,
සන්ති පුත්තා විදෙහානං දිසාවු රට්ඨවඩ්ඪනො;
තෙ රජ්ජං කාරයිස්සන්ති මිථිලායං පජාපති.

4599. එහි තං අනුසික්ඛාමි යං වාක්‍යං මම රුච්චති,
රජ්ජං තුවං කාරයන්ති පාපං දුච්චරිතං බහුං:
කායෙන වාචා මනසා යෙන ගඤ්ජිසි දුග්ගතිං.

---

1. බලං අම්බ – මජසං.
2. හතමානං – මජසං. තුදමානං – ස්‍යා.
3. බලකාමෙහි – මජසං.
4. විදස්තං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4590-4591. පින්වත් මිගාජින තවුසනි, මනහර ගී ගයන කල මිහිරි නද ඇති වාද්‍ය වයන කල වයන තූර්‍ය ඝෝෂ ඇති කල කුලුනාලම් ශබ්ද ඇති කල මහත් රාජානුභාවයෙන් ද ශෝභාවෙන් ද දිලියෙමින් යන ඒ මම එල කැමැති මිනිසුන් විසින් විනාශ කළ එම එල දරන අඹ රුකක් ප්‍රාකාරයෙන් වටකළ උයනෙහි දිටිමි.

4592. මිගාජින නම් තවුසාණෙනි, ඒ මම ද වනාහි උයන් සිරි බලා ඇතු පිටින් බැස එල දරන වැනැසුණු අඹරුක මුලට පැමිණියෙමි.

4593. විනාශ කළ කොළ අතු පවා වැනැසූ එල විනාශ කළ අඹරුක දැක ඉක්බිති සිත්කලු නීලවර්ණයෙන් බබළන මේ අනික් එල නැති අඹරුක දිටිමි.

4594. යම්සේ එල ඇති අඹරුක වනඝන ලද ද එසේ ම බොහෝ කරදර ඇති ඉසුරුමත් අපට ද සතුරෝ හිංසා නො කරන්නාහු ද?

4595. සම හේතු කොටගෙන අඳුන් දිවියා නසනු ලැබේ. දළ හේතු කොටගෙන ඇතා නසනු ලැබේ. ධනය හේතු කොට ගෙන ධනවතා නසනු ලැබේ. වාසස්ථානයක් නැති බැඳුමක් නැති පැවිද්දහු කවරෙක් නසා ද ගෙඩි ඇති අඹරුක ද ගෙඩි නැති අඹරුක ද යන ඒ දෙරුක මාගේ ශාස්තෘවරයෝ වූවහ යි බෝසත් තෙමේ කී ය.

4596. මහරජ, ඔබ පැවිදි වූහ යි ඇතරුවෝ ද සේනාවන්හි නතු වූවෝ ද රථ සේනාවෝ ද පාබල සේනාවෝ ද යන සියලු මහජන තෙමේ බියෙන් තැති ගති.

4597. මහජනයා අස්වසා නුවරට ආරක්ෂා සලසා දීඝාවුකුමාර නමැති පුතා රජයෙහි පිහිටුවා ඉන්පසු පැවිදි වන්නහු නම් මැනවැ යි සීවලී දේවි පැවැසූ.

4598. එම්බා දේවිය, මවිසින් දනවුවැස්සෝ හරන ලදහ. මිත්‍රයෝ ද නෑයෝ ද හැරදමන ලදහ. විදෙහවාසීන්ගේ රට වර්ධනය කරන දීඝාවු නම් පුත්‍රයෝ ඇත, ඔව්හු මියුලු නුවර රජය කරවන්නාහ යි රජ තෙමේ කීය.

4599. එම්බා දේවිය, මාගේ යම් වචනයකට කැමැති ද එසේ නම් එව, එයින් තිට අනුශාසනා කරමි. රජය කරවන නීකය, වචන, සිත යන යමකින් දුගතියට යන්නෙහි ද එබඳු දුසිරිත් බොහෝ පව් කරන්නෙහි ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4600. පරදින්නකෙන පරනිට්ඨිතෙන,
පිණ්ඩෙන යාපෙහි සධීරධම්මො.

4601. යොපි චතුත්ථෙ භත්තකාලෙ න භුඤ්ජෙ
අජ්ඣුමාරිව[1] බුදය මීයෙ,
න ත්වෙව පිණ්ඩං ලුලිතං අනරියං
කුලපුත්තරූපො සප්පුරිසො න සෙවෙ
තයිදං න සාධු තයිදං න සුට්ඨු
සුනඛුච්ඡිට්ඨකං භුඤ්ජසෙ ත්වං.

4602. න චා පි මෙ සීවලී සො අභක්ඛො
යං හොති චත්තං ගිහිනො සුනඛස්ස වා,
යෙ කෙචි භොගා ඉධ ධම්මලද්ධා
සබ්බො සො භක්ඛො අනවජ්ජාති[2] වුත්තො.

4603. කුමාරිකෙ[3] උපසෙනියෙ නිච්චං නිගළ[4] මණ්ඩිතෙ,
කස්මා තෙ එකො භුජො ජනති එකො තෙ න ජනති භුජො,

4604. ඉමස්මිං මෙ සමණ හත්ථෙ පටිමුක්කා දුනීධුරා,[5]
සඞ්ඝාතා ජායතෙ සඤ්ඤෙ දුතියස්සෙව සා ගති.

4605. ඉමස්මිං මෙ සමණ හත්ථෙ පටිමුක්කො එකනීධුරො,[6]
සො අදුතියො න ජනති මුනිභූතොව තිට්ඨති.

4606. විවාදප්පත්තො දුතියො කෙනෙකො විවදිස්සති,
තස්ස තෙ සග්ගකාමස්ස එකත්තමුපරොචතං.

4607. සුණසි[7] සීවලී ගාථා කුමාරියා පවෙදිතා,
පෙස්සියා මං ගරහිත්ථො දුතියස්සෙව සා ගති.

4608. අයං දෙවධා පථො භද්දෙ අනුවිණ්ණො පථාවිහි,
තෙසං ත්වං එකං ගණ්හාහි අහමෙකං පුනාපරං.

4609. නෙව මං ත්වං "පතී මෙ" ති මාහං "භරියා" ති වා පුන,
ඉමමෙව කථං කථයන්තා ථූණං නගරුපාගමුං.

---

1. අජුත්තමාරිව – මජසං. අජජක්ඛටඨමාරිව – ස්‍යා. අක්ඛජුට්ඨුමරිව – වි.
2. අනවයෙ – මජසං
3. කුමාරියෙ – මජසං. වි
4. තිකල – මජසං.
5. දුනීවරා – මජසං. ස්‍යා.
6. එකනීවරො – මජසං.
7. සුණාසු – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4600. අතුන් විසින් නිමැවුණු දෙන ලද ආහාරයකින් යැපෙව, මේ පිඩු සිහා යැපීම නම් නුවණැත්තන්ගේ සවභාව ධර්මයකැ යි බිසොවට අවවාද කෙළේ ය.

4601. ඉදින් යමකු සතරවැනි බත් අනුභව කරන කලැ අනුභව නො කරන්නේ ද අනාථ මරණ ඇත්තේ ම ක්ෂුධාවෙන් මිය යන්නේ ද, වැලි තැවරුණු අයහපත් අහර අනුභව කරන්නේ ද කුලපුත්‍ර සවභාව ඇති සත්පුරුෂ තෙමේ මෙ බඳු අහර අනුභව නො කරන්නේ ය. මහරජ, යම් බල්ලකු ඉඳුල් කළ අහරක් ඔබ වළඳන්නහු නම් ඒ වැළඳීම යහපත් නො වේ. ශොභන නො වේ ය යි බිසොව කීවා.

4602. එම්බා සිවලි දේවිය, ගිහියකු විසින් ද සුනඛයකු විසින් ද හැර දැමූ යමක් වේ නම් ඒ පිණ්ඩපාතය මා නො කැ යුත්තක් නො වේ. මෙ ලෙව්හි දැහැමින් ලද යම්කිසි භෝගයෝ වෙත් නම් ඒ සියල්ල අනුභව කටයුතු ය. නිවැරැදි ය යි පැවැසුණු බව රජ තෙමේ කී ය.

4603. නිතර මව ළඟ සයනය කරන සවභාව ඇති එම්බල දරිය කවර හෙයින් තීගේ එක් අතක් ශබ්ද කෙරේ ද එක් අතක් ශබ්ද නො කෙරේ ද යි රජ තෙමේ ළදරිය ගෙන් ඇසී ය.

4604. ශ්‍රමණයන් වහන්ස, මාගේ මේ අත්හි පැළඳි වළලු දෙකකි. ශබ්දය හටගන්නේ එකට හැපීමෙන් ය. දෙවැන්නක් ඇත්තහුගේ ම මේ ස්වභාවය වෙයි.

4605. ශ්‍රමණයන් වහන්ස, මාගේ මේ අතෙහි එක් වළල්ලක් දමන ලදී. දෙවැන්නක් නැති බැවින් එය නිශ්ශබ්ද ය. කෙලෙස් පහ කළ මුනිවරයකු මෙන් එය නිහඬ වැ සිටී.

4606. දෙවැන්නක ඇත්තේ විවාදයට පත් වූයේ වෙයි. හුදෙකලා වූයේ කවුරුන් සමග විවාද කරන්නේ ද? එහෙයින් සග සැප කැමැති ඒ ඔබට හුදෙකලා බව කැමති වේව යි ළදරිය කීවා ය.

4607. එම්බා සිවලි දේවිය, ළදරිය කියූ ගාථා ඇසුවෙහි ය. වැඩකාරියක් වන ඕ තොමෝ දෙවැන්නක් ඇත්තහුගේ මැ මේ සවභාවය වෙය යි මට නිදහස් කළා ය.

4608-4609. සොඳුර, මඟින් යන එන මෙ දෙමං සන්ධියෙකි. මෙයින් තී කැමති මහක් ගනුව. නැවත මම අනික් මග ගනිමි. සිවලි දේවිය, මාගේ සවාමියා ය යි තී නො කියව. මම ද මාගේ භාර්‍යාව ය යි නො කියමි රජ තෙම කී ය. මෙ බස කියන්නෝ මැ ථූණ නම් නුවරට පැමිණියහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4610. කොට්ඨකෙ උසුකාරස්ස හත්ථකාලෙ උපට්ඨිතෙ,
තත්‍ර ච සො උසුකාරො (එකං දණ්ඩං උජුං කතං;)
එකක්ඛි චක්ඛුං නිග්ගය්හ පීඨමෙකෙන පෙක්ඛති.

4611. එවං නො සාධු පස්සසි උසුකාර සුණොහි මෙ,
යදෙකං චක්ඛුං නිග්ගය්හ පීඨමෙකෙන පෙක්ඛසි.

4612. වීහි සමණ චක්ඛූහි විසාලං විය ඛායති,
අසම්පත්වා පරං[1] ලිඛං නුජ්ජුභාවාය කප්පති.

4613. එකක්ඛි චක්ඛුං නිග්ගය්හ පීඨමෙකෙන පෙක්ඛතො,
සම්පත්වා පරමං ලිඛං උජුභාවාය කප්පති.

4614. විවාදප්පත්තො දුතියො කෙනෙකො විවදිස්සති,
තස්ස තෙ සග්ගකාමස්ස එකත්තමුපරොචතං.

4615. සුණාසි සීවලී ගාථා උසුකාරෙණ පවෙදිතා,
පෙසිසියා[2] මං ගරහිත්වා දුතියස්සෙව සා ගති.

4616. අයං දෙවධා පථවී හදෙ අනුවිණතා පථාවිහි,
තෙසං ත්වං එකං ගණ්හාහි අහමෙතං පුනාපරං.

4617. නෙව මං ත්වං ''පති මෙ'' ති මාහං ''භරියා'' ති වා පුන,
මුඤ්ජාවිසිකා[3] පවාළනා එකා විහර සීවලී ති.

මහාජනකජාතකං දුතියං.

---

1. පරමං – මජ්ඣං.
2. පෙසියා – මජ්ඣං.
3. මුඤ්ජවෙසිකා – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4610 එහි රජ තෙමේ තමන් අනුභව කරන වේලාව පැමිණි කල හී වඩුවාගේ කොටුව වෙත පැමිණ සිටියේ ය. එහි ද ඒ හී වඩුවා එක් ඇසක් වසා එක් ඇසින් ඇදය බලයි.

4611. යහළු හී වඩුව, මෙසේ මැනැවින් බලන්නෙහි නම් මාගේ බස් අසව. එක් ඇසක් පියා එක් ඇසකින් බලව යන යමක් ඇත්නම් එය යි.

4612. පින්වත් ශ්‍රමණයන් වහන්ස, දැසින් බලන කල විශාල වූවාක් මෙන් වැටහෙයි. ඇද තැනට නො පැමිණ ඇද නැති කරන්නට සුදුසු නො වේ.

4613. එක් ඇසක් පියාගෙන එක් ඇසකින් ඇද බලන්නහුට ඇද තැන බලා සෘජු කිරීම සුදුසු වේ.

4614. දෙවැන්නක ඇත්තේ විවාදයට පැමිණියේ වෙයි. හුදෙකලා වූයේ කවරකු සමග විවාද කරන්නේ ද? සවර්ගයට යනු කැමති ඒ ඔබට හුදෙකලා වීම කැමති වේව යි හී වඩු තෙමේ අවවාද කෙළේ ය.

4615. එම්බා සිවලි දේවිය, හී වඩුවා කියූ ගාථා ඇසුවෙහි ද? දෙවැන්නක ඇත්තහුගේ මේ සවභාවය යි කියා හී වඩුවා මට අපහාස කෙළේ ය.

4616-4617. සොඳුර මහින් යන එන මේ දෙමං සන්ධියෙකි. මෙයින් තී කැමති මහක් ගනු. ඉක්බිති මේ අනික් මහ මම ගනිමි. මගේ සැමියා යැ යි නී මට නො කියව. මම ද මගේ භාය්‍යාව ය යි නැවත නො කියමී රජ තෙමේ කී ය. එම්බා සිවලි දේවිය, වෙන් කොට ගත් මුදු තණ ගොබය මෙන් තී හා නැවත එක් නොවී මම තනි වැ වසන්නෙමි. තී ද තනි වැ වසව යි ඇයට අවවාද කෙළේ යැ යි වදළහ.

දෙවන මහාජනක ජාතක යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

3. සාමජාතකං

4618. කො නු මං උසුනා විජ්ඣි පමත්තං උදහාරකං,[1]
ඛත්තියො බ්‍රාහ්මණො වෙස්සො කො මං විද්ධා නිලීයසි.[2]

4619. න මෙ මංසානි ඛජ්ජානි චම්මෙනත්ථො න විජ්ජති,
අථ කෙන නු වණ්ණෙන විද්ධෙය්‍යං මං අමඤ්ඤථ.

4620. කො වා ත්වං කස්ස වා පුත්තො කථං ජානෙමු තං මයං,
පුට්ඨො මෙ සම්ම අක්ඛාහි කිං මං විද්ධා නිලීයසි.

4621. රාජාහමස්මි කාසීනං පිලියක්ඛොති මං විදූ,
ලොභා රට්ඨං පහත්වාන[3] මිගමෙසං[4] චරාමහං.

4622. ඉස්සත්ථෙවස්මි කුසලො දළ්හධම්මොති විස්සුතො,
නාගොපි මෙ න මුඤ්චෙය්‍ය ආගතො උසුපාතනං.

4623. ත්වඤ්ච කස්ස වා පුත්තොසි කථං ජානෙමු තං මයං,
පිතුනො අත්තනො චාපි නාමගොත්තං පවෙදය.

4624. නෙසාදපුත්තො භද්දන්තෙ සාමො ඉති මං ඤාතයො,
ආමන්තයිංසු ජීවන්තං ස්වාජ්ජෙවාහං[5] ගතො සයෙ.

4625. විද්ධොස්මි පුථුසලෙලන සවිසෙන යථා මිගො,
සකම්හි ලොහිතෙ රාජ පස්ස සෙමි පරිපලුතො.

4626. පටිවම්ම[6]ගතං සලලං පස්ස විහාමි[7] ලොහිතං,
ආතුරො ත්‍යානු පුච්ඡාමි කිං මං විද්ධා නිලීයසි.

---

1. උදහාරයං – මජසං.
2. නිලිය්‍යසි – මජසං.
3. පහිත්වාන – මජසං. ස්‍යා.
4. මිගමෙසො – මජසං.
5. ස්වජ්ජෙවවං – මජසං.
6. පටිවා – මජසං. ස්‍යා.
7. මිම්හාමි – මජසං. ඊම්හාමි – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

3. සාම ජාතකය

4618. දිය ගෙන යන්නට ප්‍රමාද වූ මට ඊයෙන් විද්දේ කවරෙක් ද? රජ, බමුණු, වෙළෙඳ යන ආදි සිවු පිරිසෙන් කවරෙක් මට විදූ සැහැවුණේ ද යි සාම කුමාර තෙමේ ඇසී ය.

4619. මාගේ මස් කෑ යුතු නො වේ. සමින් ද වැඩෙක් නැත. එසේ ඇති කල මට කවර කරුණෙකින් විදියයුතු ය යි සිතුහු ද යි කී ය.

4620. නුඹ කවරෙක් හෝ වෙහි ද? කවරකුගේ පුතෙක් හෝ වෙහි ද යි අපි කෙසේ තා දනිමු ද? යහළුව, මා විචාරන ලද්දේ කියව. කවර හෙයින් මා විදූ සැහැවුණෙහි ද යි සාම කුමාර තෙමේ ඇසී ය.

4621. කසිරට රජ නම් මම වෙමි. පිළියක් නමින් මා දනිති. මස් ලොබින් රට හැර මුවන් සොයමින් හැසිරෙමි.

4622. දුනු සිප්හි ද දක්ෂ වෙමි. සහස්සත්ථාම නම් දුන්න නහන්නට පිළිවන් බැවින් දළ්හධම්ම ය යි ප්‍රකට ය. මාගේ ඊ පහරට පැමිණි ඇතා ද නො මිදේ ය යි පිළියක් රජ කී ය.

4623. තෙපි ද කවරකුගේ පුතෙක් දූ යි අපි තොප කෙසේ දනිමු ද? පියාණන්ගේ හෝ තමන්ගේ නාමගොත්‍ර කියන්නැ යි රජ තෙමේ කී ය.

4624. මහරජ, තොපට යහපතක් වේවා! මම වනාහි වැදි පුතෙක් වෙමි. ජීවත්වන මාගේ නැයෝ 'සාම' කියා මා ඇමැතූහ. අද ඒ මම මෙසේ මරුමුවට පැමිණියෙමි සයනය කරමි.

4625. මහරජ, විස සහිත මහත් ඊයකින් මුවකු මෙන් විදින ලද්දෙමි වෙමි. බලනු මැනැවැ. තම ලේ විලෙහි ගැලුණේ හොවිමි.

4626. ඊතලය වම් පසින් ඇතුළු වී දකුණැ'ලයෙන් නික්මිණි. ලේ වමාරමි. මා කවර හෙයින් විදූ සැහැවුණෙහි ද යි තොප විචාරමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4627. අපිනමඤ්ඤතෙ දීපි නාගො දනෙනහි හඤ්ඤතෙ,
අථ කෙන නු වණ්ණෙන විදධෙය්‍යං මං අමඤ්ඤථ.

4628. මිගො උපට්ඨිතො ආසි ආගතො උසුපාතනං,
තං දිසවා උබ්බිජ්ජ සාම[1] තෙන කොධො මමාවිසි.

4629. යථො සරාමි අත්තානං යතො පත්තොස්මි විඤ්ඤුතං,
න මං මිගා උත්තසනති[2] අරඤ්ඤෙ සාපදනිපි.

4630. යතො නිධිං පරිහරිං යතො පත්තොස්මි යොබ්බනං,
න මං මිගා උත්තසනති අරඤ්ඤෙ සාපදනිපි.

4631. භීරූ කිම්පුරිසා රාජ පබ්බතෙ ගන්ධමාදනෙ,
සමෙමාදමානා ගවජාම පබ්බතානි වනානි ච;
අථ කෙන නු වණ්ණෙන උත්ත්‍රසෙ සො මිගො මමං.

4632. න තදදසා[3] මිගො යාම කිනනාහං අලිකං[4] භණෙ,
කොධලොභාභිභූතොහං උසුං තෙ තං අවස්සජිං.

4633. කුතො නු සම්ම ආගම්ම කස්ස වා පහිතො තුවං,
උදහාරො නදිං ගවජ ආගතො මිගයම්මතං.

4634. අන්ධා මාතා පිතා මයහං තෙ හරාමි බ්‍රහාවනෙ,
තෙසාහං උදහාරකො[1] ආගතො මිගසම්මතං.

4635. අජ්ජි නෙසං උසාමතතං අථ සාහස්ස ජීවිතං,
උදකස්ස ච අලාභෙන මඤ්ඤෙ අන්ධා මරිස්සරෙ.

---

1. උබ්බිජජිස්සාමි – මජ්ඣං.
2. උත්තසනති – මජ්ඣං. ස්‍යා.
3. න තං තස – මජ්ඣං. ස්‍යා.
4. අලිකො – මජ්ඣං,
5. උදකං හාණ – ජෙට්ඨං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4627. සම නිමිති කොට අඳුන් දිවියා නසනු ලැබෙයි, දළ නිමිති කොට ඇතා නසනු ලැබෙයි. එසේ නම් මා විදියයුත්තකු මෙන් කවර හෙයින් සිතී දැ යි සාම කුමාරයා ඇසී ය.

4628. පින්වත, ඊ පහරට පැමිණි මුවෙක් ඉදිරියෙහි සිටියේ ය. තොප දැක්මෙන් මුවා භය වී ගියේ ය. එයින් මට තරහ උපනැ යි රජ තෙමේ කී ය.

4629. යම් කලෙක සිට තමන් සිහි කෙරෙමි ද යම් කලෙක සිට නුවණැති බවට පැමිණියෙමි ද, මේ තාක් වනයෙහි වණ්ඩ වූ වන මුවෝ ද මා දැක බිය නො වෙති.

4630. යම් කලෙක පටන් වැහැරි සිවුරු පරිහරණය කෙරෙමි ද යම් කලෙක පටන් තරුණ බවට පැමිණියෙමි ද මෙතාක් වණ්ඩ මෘගයෝ ද මා දැක භය නො වෙති.

4631. මහරජ, ගන්ධමාධන පර්වතයෙහි භය ජනක කිම්පුරිසයෝ ද වෙති. පර්වතයන්හි ද වනාන්තරයන්හි ද ඔවුන් සමග සතුටින් ගමන් කරමි. එසේ ඇති කල කවර හෙයින් ඒ මුවා මා දැක බිය වන්නේ දැ යි සාම කුමර ඇසී ය.

4632. එම්බා සාම කුමරුනි, මුවා තොප නො දැක්කේ ය. මම ඔබට කවර හෙයින් බොරු කියම් ද? ක්‍රෝධයෙන් ද ලොභයෙන් ද මඩනා ලද සිත් ඇති මම ඒ ඊය තොපට විද්දෙමි රජ තෙමේ කී ය.

4633. යහළුව, කවර තැනෙකින් හෝ අවුත් දිය ගෙනෙන්නට ගහට යව යි කවරකු විසින් හෝ එවූ තෙපි මුවන්ගේ ය යි යම්මත මේ විලට ආවහු දැ යි ඇසී ය.

4634. මහරජ, මාගේ මව්පියෝ අන්ධයෝ ය. මේ මහා වනයෙහි සිට මම ඔවුන් පොෂණය කරමි. ඔවුන්ට දිය ගෙන යන මම මේ මිගසම්මත නම් විලට ආයෙමි යි සාම කුමාරයා කී ය.

4635. ඒ මාගේ මව්පියන්ට භොජන පමණක් ඇත. එකල්හි සදවසක් දිවි පවත්නේ ය. ඒ අද මව්පියෝ දිය නො ලැබීමෙන් මැරෙන්නාහු යැ යි සිතමි.

4636. න මෙ ඉදං තථා දුක්ඛං ලබ්භාහි පුමුනා ඉදං,
යඤ්ච අම්මං න පස්සාමි තං මෙ දුක්ඛතරං ඉතො.

4637. න මෙ ඉදං තථා දුක්ඛං ලබ්භාහි පුමුනා ඉදං,
යඤ්ච තාතං න පස්සාමි තං මෙ දුක්ඛතරං ඉතො.

4638. සා නූන කපණා අම්මා චිරරත්තාය රුච්ඡති,[1]
අඩ්ඪරත්තෙ ච රත්තෙ වා නදීව අවසුච්ඡති.

4639. සො නූන කපණො තාතො චිරරත්තාය රුච්ඡති,
අඩ්ඪරත්තෙ ච රත්තෙ වා නදීව අවසුච්ඡති.

4640. උට්ඨානපාරිචරියාය පාදං[2] සම්බාහනස්ස ච,
''සාම තාතා'' ති විලපන්තා හිණ්ඩිස්සන්ති[3] බ්‍රහාවනෙ.

4641. ඉදම්පි දුතියං සල්ලං කම්පෙති හදයං මම,
යඤ්ච අන්ධෙ න පස්සාමි මඤ්ඤෙ හෙස්සාමි[4] ජීවිතං.

4642. මා බාළ්හං පරිදෙවෙසි සාම කල්‍යාණදස්සන,
අහං කම්මකරො හුත්වා භරිස්සං තෙ බ්‍රහාවනෙ.

4643. ඉස්සත්ථෙ චස්මි කුසලො දළ්හධම්මොති විස්සුතො,
අහං කම්මකරො හුත්වා භරිස්සං තෙ බ්‍රහාවනෙ.

4644. මිගානං විසාසමන්වෙසං වනමූල ඵලානි ච,
අහං කම්මකරො හුත්වා භරිස්සං තෙ බ්‍රහාවනෙ.

---

1. රුච්චති – මජ්ඣං.ස්‍යා. වි.
2. රාජ – මජ්ඣං.
3. හිත්දිස්සන්ති – මජ්ඣං.
4. න මෙ හිස්සාමි – මජ්ඣං,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4636. මට මේ දුක එබඳු දුකක් නම් නො වේ. පුරුෂයකු විසින් මෙය ලැබියයුතු ය, මැණියන් නො දකිමි යන යම් දුකෙක් වේ ද එය මට මෙයට වැඩි දුකෙකි.

4637. මෙය මට එවැනි දුකක් නො වේ. පුරුෂයකු විසින් මෙය ලැබියයුතු ය. පියාණන් නො දකිමි යන මේ දුකෙක් වේ ද එය මට මෙයට වැඩි දුකෙකි.

4638. ඒ මාගේ බැගෑපත් මැණියෝ ඒකාන්තයෙන් මැදියම් රෑයෙහි ද පැසුළු රෑයෙහි ද බොහෝ කලක් හඬන්නාහ. කුඩා විලක් මෙන් වියැළෙන්නාහ.

4639. ඒ මාගේ බැගෑපත් පියාණෝ ඒකාන්තයෙන් මැදියම් රෑයෙහි ද පැසුළු රෑයෙහි ද බොහෝ කලක් හඬන්නාහ. කුඩා විලක් මෙන් වියැළෙන්නාහ.

4640. මහරජ, දිවා රෑ නැඟී සිටි වීර්‍යයෙන් ඔවුන්ට මෙහෙ කිරීමෙන් ද අත් පා මිරිකීමෙන් ද උවටැන් කෙළෙමි. ඔහු පුත සාම යැ යි වැළැපෙමින් මේ වනයෙහි ඇවිදිනාහු ය.

4641. ජීවිතය හැර දමන්නෙම යන යමෙක් වේ ද අඳ මව්පියන් නො දකිමි යි යන යමක් ඇද්ද මේ දෙවැනි ශෝක උලමා හද කම්පා කෙරේ යි සාම කුමාරයා කී ය.

4642. සාම නම් කල්‍යාණ දර්ශනය දැඩි කොට නො වැලැපෙව මම කටයුතු කරන්නෙක් වැ මේ මහවෙනෙහි තොප මව්පියනට උපස්ථාන කළාක් මෙන් නුඹගේ ඒ මව්පියන් පෝෂණය කොට රැක බලාගන්නෙමි.

4643. ධනුශ්ශිල්පයෙහි ද මම දක්ෂයෙක්මි. දළ්හධර්මය යි ප්‍රකට වූ මම කටයුතු කරන්නෙක් වැ මේ මහවන මැද නුඹ මෙන් නුඹගේ ඒ මව්පියන් පොෂණය කිරීමෙන් රැක බලාගන්නෙමි.

4644. සිංහාදි වන මෘගයන් කා ඉතිරි කළ මස් ද වනයෙහි අල මුල් ද පලවැල් ද සොයා මම කටයුතු කිරීමෙන් මහවන මැද නුඹ මෙන් නුඹගේ මව්පියන් රැක බලා පොෂණය කරන්නෙමි.

4645. කතමං තං වනං සාම යත්ථ මාතා පිතා කව,
අහං තෙ තථා භරිස්සං යථා තෙ අහරී තුවං.

4646. අයං එකපදී රාජ යො යං උස්සීසකෙ මම,
ඉතො ගන්ත්වා අඩ්ඪකොසං තත්ථ[1] තෙසං අගාරකං;
තත්ථ මාතා පිතා මය්හං තෙ භරස්සු ඉතො ගතො.

4647. නමො තෙ කාසිරාජත්ථු නමො තෙ කාසිවඩ්ඪන,
අන්ධා මාතා පිතා මය්හං තෙ භරස්සු බ්‍රහාවනෙ.

4648. අඤ්ජලිං තෙ පග්ගණ්හාමි කාසිරාජ නමත්ථු තෙ,
මාතරං පිතරං මය්හං වුත්තො වජ්ජාසි වන්දනං.

4649. ඉදං වත්වාන සො සාමො යුවා කල්‍යාණදස්සනො,
මුච්ඡිතො විසවෙගෙන විසඤ්ඤී සමපජ්ජථ.

4650. ස රාජා පරිදෙවෙසි බහුං කාරුඤ්ඤසංහිතං,
අජ්‍රාමරො වහං ආසිං අජ්ජෙතං[2] ඤ්ඤසි නො පුරෙ;
සාමං කාලකතං දිස්වා "නත්ථි මච්චුස්ස නාගමො".

4651. යස්සු මං පතිමන්තෙති සවිසෙන සමප්පිතො,
සවාජ්ජෙවං ගතෙ කාලෙ න කිඤ්චි මභිභාසති.

4652. නිරයං නූන ගච්ඡාමි එත්ථ මෙ නත්ථි සංසයො,
තදහි පකතං පාපං චිරරත්තාය කිබ්බිසං.

4653. භවන්ති තස්ස වත්තාරො ගාමෙ කිබ්බිසකාරකො,
අරඤ්ඤෙ නිම්මනුස්සම්හි කො මං වත්තුමරහති.

---

1. යත්ථ – මජ්ජසං.
2. අජ්ජහඤ්ඤාමි – මජ්ජසං, අජ්ජෙතං ඤ්ඤමි – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4645. පින්වත් සාමය, නුඹගේ ඒ මව්පියෝ කවර තැනෙක වෙසෙත් ද ඒ කවර වනයක් ද? නුඹ මව්පියන් පොෂණය කෙළේ යම්සේ ද මම ද ඔවුන් එසේ පෝෂණය කරන්නෙමි යි රජ තෙමේ කී ය.

4646. මහරජ, මගේ හිස පැත්තෙන් යම් ඒක පදික මහෙක් වේ ද මේ මඟින් ගොස් ශබ්ද ඇසෙන දුර පමණින් බාගයක් හෙවත් අඩ හඬසනක් පමණ දුර යම් තැනක් වේ ද මව්පියන් වෙසෙන ගය එහි ය. මේ මඟින් එහි ගොස් ඔවුන් පෝෂණය කරන්නැ යි සාම කුමාරයා කී ය.

4647. කසී රජතුමනි, ඔබට මාගේ නමස්කාරය වේවා! කසීරට වර්ධනය කරන පින්වතුනි, ඔබට නමස්කාර වේවා! මාගේ මව්පියෝ අන්ධයෝ ය. මහවනයෙහි ඔවුන් පෝෂණය කරව.

4648. කසීරජතුමනි, ඔබට ඇඳිලි බඳිමි. ඔබට නමස්කාර වේවා! මා කියන ලදුයේ මව්පියනට මා වැන්ද බව කියනු මැනැවැ යි සාම කුමාරයා කී ය.

4649. තරුණ කල්‍යාණ දර්ශන ඇති ඒ සාම කුමාර තෙමේ මෙ බස කියා විෂවේගයෙන් සිහිමුළා වූයේ විසංඥ බවට පැමිණියේ ය.

4650. එ රජ තෙමේ මම මෙපමණ කල් ජරා මරණ නැත්තෙක් යැ යි සිතිමි. අද කලුරිය කළ සාම කුමරු දැක කිසිවකුටත් මරුගේ නො පැමිණීමක් නැතැ යි දැනගතිමි. මින් පෙර එසේ නො දක්කෙමි. කරුණා සහගත වැ බෙහෙවින් වැලැපුණේ ය.

4651. විෂ සහිත ඊයෙන් විදිනු ලැබූ යමෙක් මා සමඟ දැන් කථා කෙළේ ද හේ තෙමේ මෙබඳු මරණයකට පැමිණි කල කිසිවකුදු කථා නො කෙරේ.

4652. එකල මා කළ පාපය බොහෝ කල් දුක් විඳීමට සමර්ථ දරුණු වූ කර්මයෙකි. ඒකාන්තයෙන් මම නරකයට යමි, මෙහි මට සැකයෙක් නැත.

4653. පව් කරන තැනැත්තාහට අපරාධ කරුවෙකැ යි ගමෙහි නින්ද කරන්නෝ වෙති. මිනිසුන් නැති මේ වනයෙහි මට නින්ද කරන්නට කවරෙක් සුදුසු වේ ද?

4654. සාරයන්ති හි කම්මානි ගාමෙ සංගම්ම මානවා,
අරඤ්ඤෙ නිම්මනුස්සම්හි කො නු මං සාරයිස්සති.

4655. යා දෙවතා අනාහාරහිතා පබ්බතෙ ගන්ධමාදනෙ,
රඤ්ඤෙව අනුකම්පාය ඉමා ගාථා අභාසථ.

4656. ආගුං කරි මහාරාජ අකරා[1] කම්මදූසකං,
අදූසකා පිතා පුත්තා තයො එකුසුනා හතා.

4657. එහි තං අනුසික්ඛාමි යථා තෙ සුගතී සියා,
ධම්මෙනඤ්ඤෙ[2] වනෙ පොස මඤ්ඤිහං සුගතී තයා.

4658. ස රාජා පරිදෙවිත්වා බහුං කාරුඤ්ඤසංහිතං,
උදකකුම්භමාදාය පක්කාමි දකවීණාමුඛො.

4659. කස්ස නු එසො පදසඤ්ඤී මනුස්සස්සෙව ආගතො,
නෙසො[3] සාමස්ස නිගෙසාසො කො නු ත්වමසි මාරිස.

4660. සන්තං හි සාමො වජති සන්තං පාදනි ඤත්තනි,[4]
නෙසො සාමස්ස නිගෙසාසො කො නු ත්වමසි මාරිස.

4661. රාජාහමස්මි කාසීනං පිළියක්ඛානි[5] මං විදූ,
ලොභා රට්ඨං පහාතාන[6] මිගමෙසං[6] චරාමහං.

4662. ඉස්සසෙ වසමි කුසලො දළහධම්මොති විස්සුතො,
නාගොපි මෙ න මුඤ්චෙය්‍ය ආගතො උසුපාතනං.

4663. සාගතන්තා මහාරාජ අථො තෙ අදුරාගතං,
ඉස්සරොසි අනුපපන්නා යං ඉධත්‍ථී පවෙදය.

4664. තින්දුකානි පියාලානි මධුකෙ කාසුමාරියො,
එලානි බුද්ධකප්පානි භුඤ්ජ රාජ වරං වරං.

---

1. අකරි – මජ්ඣං. සයා. වී. අකාර - සීමූ.
2. ධම්මෙන තෙ – මජ්ඣං.
3. නො – මජ්ඣං.
4. නෙයති – මජ්ඣං.
5. පතිඤ්ඤාන – මජ්ඣං.
6. මිගමෙසො – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4654. ගමෙහි මිනිස්සු එක් වැ කළ කම් සිහි කරවති නොහොත් චෝදනා කරති. මිනිසුන් නැති මේ වනයෙහි මට කවරෙක් චෝදනා කරන්නේ ද යි පිළියක් රජ වැලෑපුණේ ය.

4655. එකලැ 'බහුසෝදරී' නමැති දේවතා තොමෝ ගන්ධමාදන පර්වතයෙහි අතුරුදහන් වූවා රජහට ම අනුකම්පාවෙන් මේ ගාථා කියූ.

4656. මහරජ, රජතෙම මහත් අපරාධයක් කෙළේ ය. කෙළේ ඉතා ලාමක-පහත් ක්‍රියාවකි. නිදෙස් මව්පිය දෙදෙනා ද පුතා ද යන මේ තිදෙන එක හී පහරින් නසන ලදහ.

4657. මහරජ, මෙහි එනු මැනැවි. යමසේ ඔබට සුගතියක් වන්නේ නම් එසේ ඔබට අනුශාසනා කරමි. මහවනයෙහි ඒ අඳ මව්පියන් සාම කුමරු මෙන් දැහැමින් පෝෂණය කිරීමෙන් රැක බලාගනු. ඔබ මෙසේ කළ කල සුගතියට යන්නහු ය යි මම සිතමි යි දෙව්දූ කියූ.

4658. ඒ පිළියක් රජ තෙමේ කරුණා සහගත වැ (සොවින්) බොහෝ වැලැපැ දිය කළය රැගෙන දකුණු දිග බලා නික්මැ ගියේ ය.

4659. මෙහි ආ මිනිසකුගේ වැනි මේ පියවර ශබ්දය කවරකුගේ ද මේ පා ශබ්දය සාම කුමාරයාගේ ද? ඒ ශබ්දය නම් නො වේ. පින්වත, මෙහි ආ තෙපි කවරහු ද?

4660. සාම කුමරු සන්හුන් ලෙස එයි. සන්හුන් වැ පා තබයි. මේ ශබ්දය නම් සාම කුමරුගේ නො වේ. පින්වත, මෙහි ආ තෙපි කවරහු දැ යි දුකුල පණ්ඩිත නම් වන සාම කුමරුගේ අඳ පියා ඇසි ය.

4661. පින්වත, මම කසීරට වැසියන්ගේ රජ වෙමි. පිළියක් රජ නමින් මා දනිති. මස් ලොබින් රට හැර අවුත් මම මුවන් සොයමින් හැසිරෙමි.

4662. ධනුශ්ශිල්පයෙහි ද දක්ෂ වෙමි. දළ්හධර්ම ය යි ද ප්‍රසිද්ධ ය. මාගේ ඊ පහරට පැමිණි ඇතෙක් ද එයින් නො මිදේ ය යි රජ තෙමේ කී ය.

4663. මහරජ, ඔබට යහපත් පැමිණීමක් වේවා. තවද ඔබට අයහපත් පැමිණීමක් නො වේවා. මෙහි පැමිණියේ අපට අධිපති වෙහි ය. මෙහි කැමති යමක් ඇත් නම් එය පිළිගනු මැනැවි.

4664. විලිකුන් තිණිරි ද මොර ද මී ද මිහිරි එරමිණිය ද යන කුඩා ඵල වර්ග මෙහි බොහෝ ය. මහරජ, හොඳ හොඳ ඵල අනුභව කළ මැනැවි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4665. ඉදම්පි පානීයං සීතං ආහතං ගිරිගබ්භරා,
තතෝ පිව මහාරාජ සචේ කඞ්ඛසි.

4666. නාලං අන්ධා වනෙ දට්ඨුං කෝ නු මෝ[1] එලමාහරි,
අනන්ධසෙසවයං සම්මා නිවාපෝ[2] මයහ බායති.

4667. දහරෝ යුවා නාතිබ්‍රහා සාමෝ කල්‍යාණදස්සනෝ,
දීඝස්ස කෙසා අසිතා අථෝ සූනඝවෙලලිතා.

4668. සෝ හවෙ එලමාහඤ්ඡා ඉතෝ ආද කමණ්ඩලුං,
නදිං ගතෝ උදහාරෝ මඤ්ඤසි න දූරමාගතෝ.

4669. අහං තං අවධිං සාමං යෝ තුයහං පරිචාරකෝ,
යං කුමාරං පවෙදෙථ සාමං කල්‍යාණදස්සනං.

4670. දීඝස්ස කෙසා අසිතා අථෝ සූනඝවෙලලිතා,
තෙසු ලොහිතලිත්තෙසු සෙති සාමෝ මයා හතෝ.

4671. කෙන දුකූලමනෙනසි ''හතෝ සාමෝ''ති වාදිනා,
''හතෝ සාමෝ'' ති සුත්වාන හදයං මෙ පවෙධති.

4672. අඝසත්තස්සව තරුණං පවාලං මාලුතෙරිතං,
''හතෝ සාමෝ'' ති සුත්වාන හදයං මෙ පවෙධති.

4673. පාරිත්තෙ කාසිරාජායං සෝ සාමං මිගසම්මතෙ,
කොධසා උසුනා විජ්ඣී තස්ස මා පාපමිවජ්ඣමහා.

4674. කිච්ඡා ලද්ධා පියා පුත්තා යෝ අන්ධෙ අහරී වනෙ,
තං එකපුත්තං සාතිමඤ්ඤ කථං චිත්තං න කොපයෙ.

4675. කිච්ඡා ලද්ධා පියා පුත්තා යෝ අන්ධෝ අහරී වනෙ,
තං එකපුත්තං සාතිමඤ්ඤ අත්තෙසාධං ආහු පණ්ඩිතා.

---

1. වෝ – මජ්ඣං, ස්‍යා.
2. නිවාතෝ – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4665. පර්වත ගුහාවෙන් ගෙනා මේ සිහිල් පැන් වෙයි. ඉදින් මහරජ, තෙපි කැමැත්තහු නම් බොහු මැනැවැ යි පිළිසඳර කථා වශයෙන් පැවසී ය.

4666. අඬයෝ වනයෙහි මේ ඵලවර්ග දක්නට නො හැක්කෝ වෙති. මෙය ගෙනාවේ කවරෙක් ද? මේ යහපත් පළතුරු රැස්-කිරීම අඳ නො වූවකුගේ කටයුත්තක් මෙන් මට වැටහේ ය යි රජ තෙමේ කී ය.

4667. තරුණ යෞවන ඉතා නො මහත් සාම කුමාරයා යහපත් දැකුම් ඇත්තෙකි. තවද ඔහුගේ දිගු කාලවර්ණ කෙස් මස් කොටන කැති අග මෙන් නැමුණේ ය.

4668. ඒ සාම කුමාරයා පලවැල ගෙනවුත් තබා මෙයින් කමඩලාව රැගෙන දිය ගෙනෙන්නට මිගසම්මත ගඟට ගියේ දැන් ළඟ මැ ඇතැ යි හඟිමි යි පණ්ඩිත තෙමේ කී ය.

4669. නොප මෙහෙ කරන යමෙක් වේ ද යහපත් දැකුම් ඇති සාම යැ යි යම් කුමාරයකුහට කියන්නහු ද ඒ කුමරු මුවෙකැ යි සිතා මම විඳ මැරීමි.

4670. ඔහුගේ දික් වූ කෙශ කලාපය කාළවර්ණ ය. සුන නම් මස් කොටන කැති අග මෙන් වක් වූ කෙසඟ ඇත. ලේ තැවරුණු ඒ දිගු නිල් කෙශකලාපයෙහි වැතිර මා විසින් මැරූ සාම කුමාර තෙමේ වැලිතලාවෙහි හොත්තේ ය යි පිළියක් රජ තෙමේ කී ය

4671. එම්බා දුකූල පණ්ඩිතයෙනි, සාම කුමාරයා නැසුවේ ය යි කියන කවරකු හා කථා කරන්නහු ද? සාම කුමාරයා නසන ලද යි අසා මාගේ හෘදය කම්පා වේ.

4672. සුළඟින් කම්පා වන ඇසතු ළපල්ලක් මෙන් සාම කුමාරයා නසන ලද යි අසා මා හද වෙවුල යී පාරිකා නම් අඬ මවු කී ය.

4673. එම්බා පාරිකාවනි, ඒ මේ කසිරජ මිගසම්මත නම් ගං ඉවුරෙහි දී මුවා මරමි යි ක්‍රොධ සිතින් සාම කුමාරයාට ඊයකින් විද්දේ ය. රජුට අපි පව් සිතිවිලි නො කැමැත්තෝ වෙමු යි පණ්ඩිත තෙමේ කී ය.

4674. දුකසේ ලැබූ යම් ප්‍රිය පුතෙක් අඬ අප වනයෙහි දී රැක බලා පොෂණය කෙළේ ද ඒ එක මැ පිය පුතු මැරූ ඔහු කෙරෙහි කෙසේ නම් සිත කෝප නො කෙරෙම් ද යි මවු ඇසූ ය.

4675. දුකින් ලැබූ ප්‍රිය පුත්‍ර යම් කුමාරයෙක් මහවනයෙහි අඳ මවුපියන් පොෂණය කෙළේ නම් ඒ එක මැ පුතු නැසූ කලැ ද ක්‍රොධ නො කිරීම මැනවැ යි දුකූල පණ්ඩිත තෙමේ කී ය.

4676. මා බාළහං පරිදෙවෙථ ''හතො සාමා'' ති වාදිනා,
අහං කම්මකරො හුත්වා භරිස්සාමි බ්‍රහාවනෙ.

4677. ඉස්සත්‍ථෙ වස්මි කුසලො දළහධම්මොති විස්සුතො,
අහං කම්මකරො හුත්වා භරිස්සාමි බ්‍රහාවනෙ.

4678. මිගානං[1] විසාසමන්වෙසං වන්මූල ඵලානි ච,
අහං කම්මකරො හුත්වා භරිස්සාමි බ්‍රහාවනෙ.

4679. නෙස ධම්මො මහාරාජ නෙතං අම්හෙසු කප්පති,
රාජා ත්වමසි අම්හාකං පාදෙ වන්දාම තෙ මයං.

4680. ධම්මං නෙසාද භණ්ථ කතා අපචිතී තයා,
පිතා ත්වමසි අම්හාකං මාතා ත්වමසි පාරිකෙ.

4681. නමො තෙ කාසිරාජත්‍ථු නමො තෙ කාසිවඩ්ඪන,
අඤ්ජලිං තෙ පගණ්හාම යාව සාමානුපාපය.

4682. තස්ස පාදෙ පමජ්ජන්තා[2] මුඛඤ්ච භුජදස්සනං,
සංසුම්භමානා අත්තානං කාලමාගමයාමසෙ.

4683. බ්‍රහා වාළමිගාකිණ්ණං ආකාසන්තං පදිස්සති,
යත්‍ථ සාමො හතො සෙති චන්දෙව පතිතො ජමා.

4684. බ්‍රහා වාළමිගාකිණ්ණං ආකාසන්තං පදිස්සති,
යත්‍ථ සාමො හතො සෙති සුරියොව පතිතො ජමා.

4685. බ්‍රහා වාළමිගාකිණ්ණං ආකාසන්තං පදිස්සති,
යත්‍ථ සාමො හතො සෙති පංසුනා පතිකුණ්ඨිතො.

4686. බ්‍රහා වාළමිගාකිණ්ණං ආකාසන්තං පදිස්සති,
යත්‍ථ සාමො හතො සෙති ඉධෙව වසථ අස්සමෙ.

4687. යදි තත්‍ථ සහස්සානි සතානි නහුතානි ච,
නෙවම්භකාං භයං කොචි වනෙ වාළෙසු විජ්ජති,

---

1. මගානං – මජ්ජ.
2. පවට්ටන්තා – වි. සමජ්ජන්තා – මජ්ජ. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4676. පින්වත්නි, සාම කුමරු නැසිනැ යි කීමෙන් දැඩි කොට නො වැලපුණ මැනැවි. මම උපස්ථායකයෙක් වැ මේ මහවනයෙහි තොප පෝෂණය කරන්නෙමි.

4677. මම ධනුශ්ශිල්පයෙහි ද දක්ෂ වෙමි. දළහධර්ම ය යි ප්‍රසිද්ධ මම උවටැන් කරන්නෙක් වැ මේ මහවනයෙහි තොප පෝෂණය කොට රැක බලා ගන්නෙමි යි රජ තෙමේ කී ය.

4678. සිංහාදි වන මෘගයන් කා දැමූ මස් ද අල මුල් පල-වැල ද සොයමින් මම උපස්ථායකයෙක් වැ මහවනයෙහි තොප දෙදෙනා පෝෂණය කොට රැක බලාගන්නෙමි යි රජ තෙමේ කී ය.

4679. මහරජ, මේ සඛභාව ධර්මයක් නො වේ. මෙය අපට නො හොබී. ඔබ අප රජතුමා ය. අපි ඔබ පා වඳිමු යි කීහ.

4680. පින්වත් වැදි පුතුනි, ඔබ දහම් දෙසන්නහු ය. සත්කාර ද කරන ලදී. දුකුල පණ්ඩිතයෙනි අද පටන් ඔබ මාගේ පියාණෝ ය. එම්බා පාරිකාවනි, ඔබ ද මාගේ මැණියෝ ය යි රජ තෙමේ කී ය.

4681. කසී රජතුමනි, ඔබට නමස්කාර වේවා! කසීරට වර්-ධනය කරන පින්වතුනි, ඔබතුමන්ට නමස්කාර වේවා! ඔබට ඇඳිලි බඳිමි. සාම කුමාරයා යම් තැනෙක වේ ද එතැනට අප පමුණුවනු මැනැවි.

4682. ඔහුගේ පා පිරිමදිමින් දැකුම්කලු මුහුණු පිරිමැද බලා ළං කොට ඔහු සමඟ මරණයට පත්වන්නෙමු යි ඒ අඳ මව්පියෝ කීහ.

4683. නැසුණු සාම කුමාරයා යම් තැනෙක බිම වැටුණු චන්ද්‍රයා මෙන් සයනය කරයි ද එ පෙදෙස චණ්ඩමෘගයන් ගැවැසී ගත් ඉතා උස් භූමියකි. එය අහසේ කෙළවර සේ පෙනෙයි.

4684. නැසුණු සාම කුමාරයා යම් තැනෙක බිම වැටුණු සූර්‍ය්‍ය දිව්‍ය පුත්‍රයා මෙන් හොත්තේ ද එ පෙදෙස චණ්ඩ වනමෘගයන් ගැවසීගත් ඉතා උස් බිමකි. එ පෙදෙස අහස් කෙළවර මෙන් පෙනේ.

4685. යම් තැනක නැසුණු සාම කුමාරයා පසින් වැකුණේ හො වී ද එ පෙදෙස වල් මෘගයන්ගෙන් ගැවසීගත් උස් භූමියකි. අහස් කෙළවර මෙන් පෙනේ.

4686. සාම කුමාරයා යම් තැනක නැසුණේ ද එතැන වන මෘගයන් ගැවැසීගත් ඉතා උස් ප්‍රදේශයකි. එය අහස් කෙළවර මෙන් පෙනේ. එහෙයින් මේ අසපුවෙහි මැ වාසය කරන්නැ යි රජ තෙමේ කී ය.

4687. මහරජ, සියක්, දහක්, දසදහක් ද වනමෘගයෝ ඇත්තාහු මේ වනයෙහි අපට මෙතෙක් සිදුවන භයක් ඔවුන්ගෙන් නැතැ යි ඔහු කීහ.

4688. තතො අඞ්ගානමාදය කාසිරාජා බ්‍රහාවනෙ,
හත්ථෙ ගහෙත්වා පක්කාමි යත්ථ සාමො හතො අහු.

4689. දිස්වාන පතිතං සාමං පුත්තකං පංසුකුණ්ඨිතං,
අපවිද්ධං බ්‍රහාරඤ්ඤෙ චන්දංව පතිතං ඡමා.

4690. දිස්වාන පතිතං සාමං පුත්තකං පංසුකුණ්ඨිතං,
අපවිද්ධං බ්‍රහාරඤ්ඤෙ සුරියංව පතිතං ඡමා.

4691. දිස්වාන පතිතං සාමං පුත්තකං පංසුකුණ්ඨිතං,
අපවිද්ධං බ්‍රහාරඤ්ඤෙ කරුණං පරිදෙවයුං.

4692. දිස්වාන පතිතං සාමං පුත්තකං පංසුකුණ්ඨිතං,
බාහා පග්ගය්හ පක්කන්දුං "අධම්මො කිර හො" ඉති.

4693. බාළ්හං බොසි තුවං සුත්තා සාමකල්‍යාණදස්සන,
යො අජ්ජවං ගතෙ කාලෙ න කිඤ්චි මභිභාසසි.

4694. බාළ්හං බොසි තුවං මත්තො සාමකල්‍යාණදස්සන,
යො අජ්ජවං ගතෙ කාලෙ න කිඤ්චි මභිභාසසි.

4695. බාළ්හං බොසි තුවං පමත්තොසි[1] සාම කල්‍යාණදස්සන,
යො අජ්ජවං ගතෙ කාලෙ න කිඤ්චි මභිභාසසි.

4696. බාළ්හං බොසි තුවං කුද්ධා[2] සාමකල්‍යාණදස්සන,
යො අජ්ජවං ගතෙ කාලෙ න කිඤ්චි මභිභාසසි.

4697. බාළ්හං බොසි තුවං දිත්තො[3] සාමකල්‍යාණදස්සන,
යො අජ්ජවං ගතෙ කාලෙ න කිඤ්චි මභිභාසසි.

4698. බාළ්හං බොසි තුවංසි වීමත්තොසි සාමකල්‍යාණදස්සන,
යො අජ්ජවං ගතෙ කාලෙ න කිඤ්චි මභිභාසති.

1. පසුත්තොසි – මජ්ඣං.
2. පකුද්ධොසි – ම්ජ්ඣං.
3. පදිත්තො – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4688. ඉක්බිති කසීරජ තෙමේ මිහවනයෙහි අඩ වූ ඔවුන්ගේ අත් අල්වා ගෙන සාම කුමරු නැසුණේ යම් තැනෙක නම් එ තැනට ගියේ ය.

4689. මහවනයෙහි හැරදැමූ මිහිමත වැටුණු සඳමඩල මෙන් චිත් කා ඇඳවැටුණු පස් වැකුණු සාම නම් පුත්‍රයා දැකැ,

1001 4690. වනයෙහි හැරදැමූ බිම හුණු හිරුමඩල මෙන් පසින් ගැවසුණු සාම නම් තම ප්‍රිය පුත්‍රා දැකැ

1001. මහවනයෙහි හැරදැමූ බිම් වැටුණු පස් වැකුණු සාම නම් තම ප්‍රිය පුත්‍රයා දැක හැඳින ගෙන දැඩි ශෝකයෙන් හැඬුහ.

4692. මහවනයෙහි වැටුණු පස් වැකුණු ශරීර ඇති තම ප්‍රිය සාම නම් පුත්‍රා දැකැ පින්වත, අධර්මය දැන් ලෝකයෙහි පවතී ය යි හිස අත් ගැදගෙන මව්පියෝ හැඬුහ.

4693. අද යමෙක් මෙසේ මරණයට පැමිණි කල කිසි කථා-වකුදු අප හා නො කෙරෙහි ද යහපත් දැකුම් ඇති පුත සාමය, බොහෝ කොටැ නිදියෙහි ද?

4694. අද යමෙක් මෙසේ මරණයට පැමිණි කල කිසි කථා-වකුදු අප හා නො කෙරෙහි ද යහපත් දැකුම් ඇති පුත සාමය, බලවත් වැ මත් වෙහි ද?

4695. අද යමෙක් මෙසේ මරණයට පැමිණි කල කිසි කථා-වකුදු අප හා නො කෙරෙහි ද යහපත් දැකුම් ඇති පුත සාමය, විශේෂයෙන් ප්‍රමාද වෙහි ද?

4696. අද යමෙක් මෙසේ මරණයට පැමිණි කල කිසි කථා-වකුදු අප හා නො කෙරෙහි ද යහපත් දැකුම් ඇති පුත සාමය, දැඩි වැ කිපුණෙහි ද?

4697. අද යමෙක් මෙසේ මරණයට පැමිණි කල්හි කිසි කථා-වකුදු අප හා නො කෙරෙහි ද යහපත් දැකුම් ඇති පුත සාමය, දැඩි එඩි ඇති වෙහි ද?

4698. යහපත් දැකුම් ඇති සාම නම් පුත, නුඹ බෙහෙවින් අපගත සිත් ඇත්තෙහි ය. යමෙක් අද මෙසේ කලුරිය කල කල්හි කතාබස් නො කෙරෙයි ද එමෙනි.

4699. ජටං වලිතං පඞ්කගතං[1] කොදනී සඤ්ඣපෙස්සති,
සාමෝ අයං කාලකතෝ[2] අන්ධානං පරිවාරකෝ.

4700. කෝ වෙ සම්මජ්ජනාදය[3] සම්මජ්ජිස්සති අස්සමං,
සාමෝ අයං කාලකතෝ අන්ධානං පරිවාරකෝ.

4701. කොදනී නහාපයිස්සති සීතෙනුණ්හොදකෙන ච,
සාමෝ අයං කාලකතෝ අන්ධානං පරිවාරකෝ.

4702. කොදනී භොජයිස්සති වනමූලඵලානි ච,
සාමෝ අයං කාලකතෝ අන්ධානං පරිවාරකෝ.

4703. දිස්වාන පතිතං සාමං පුත්තකං පංසුකුණ්ඨිතං,
අට්ටිතා පුත්තසොකෙන මාතා සච්චමභාසථ:

4704. යෙන සච්චෙනයං සාමෝ ධම්මචාරී පුරෙ අහූ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4705. යෙන සච්චෙනයං සාමෝ බ්‍රහ්මචාරී පුරෙ අහූ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4706. යෙන සච්චෙනයං සාමෝ සච්චවාදී පුරෙ අහූ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4707. යෙන සච්චෙනයං සාමෝ මාතා පෙත්තිහරෝ අහූ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4708. යෙන සච්චෙනයං සාමෝ කුලෙ ජෙට්ඨාපචායිකෝ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4709. යෙන සච්චෙනයං සාමෝ පාණා පියතරෝ මම,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4710. යං කිඤ්චාපී කතං පුඤ්ඤං මයහං වෙව පිතුස්ච තෙ,
සච්චෙන[5] තෙන කුසලෙන විසං සාමස්ස හඤ්ඤතු.

4711. දිස්වාන පතිතං සාමං පුත්තකං පංසුකුණ්ඨිතං,
අට්ටිතෝ පුත්තසොකෙන පිතා සච්චමභාසථ:

---

1. පංසු – මජ්ඣ.
2. කාලඞ්කතෝ – මජ්ඣ.
3. සම්මජ්ජමාදය – මජ්ඣ,
4. පිතති – මජ්ඣ.
5. සච්චබන්ධ – මජ්ඣ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4699. අඳ මව්පියන්ට අත් පා මෙහෙවර කරන මේ සාම කුමාරයා කලුරිය කෙළේ ය. දැන් ඉතින් කවරෙක් නම් අවුල් වූ මඩ තැවැරුණු දළමඩුලු සෝදා පිළියෙල කරන්නේ ද?

4700. අඳ මව්පියන්ට අත් පා මෙහෙවර කරන මේ සාම කුමාරයා කලුරිය කෙළේ ය. අද කවරෙක් නම් හමදනා මුස්න රැගෙන ආශ්‍රමය හමදී ද?

4701. අඳ මව්පියන්ට අත් පා මෙහෙවර කරන මේ සාම කුමාරයා කලුරිය කෙළේ ය. සිහිල් වූ උණු වූ ජලයෙන් දැන් කවරෙක් නම් නහවන්නේ ද?

4702. අඳ මව්පියන්ට අත් පා මෙහෙවර කරන මේ සාම කුමාරයා කලුරිය කෙළේ ය. දැන් ඉතින් කවරෙක් නම් වනමුල් පලවැළ අනුභව කරවන්නේ ද යි (අඳ මව්පියෝ වැළපුණහ.)

4703. මිගසම්මත නම් ගං වෙරළෙහි වැටුණු මැටි තැවරුණු ශරීර ඇති සාම නමැති ප්‍රිය පුත්‍රයා දැක පුත්‍ර ශෝකයෙන් බලවත් පීඩාවට පත් මව් තොමෝ සත්‍යක්‍රියා කළා ය:

4704. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා පෙර ධර්මයෙහි හැසුරුණේ වී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා.

4705. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා පෙර බ්‍රහ්මචාරී වී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා.

4706. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා සත්‍ය වචන ඇත්තෙක් වී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා.

4707. යම් සත්‍යයෙකින් සාම කුමාරයා මව්පියන්ට උපස්ථාන කෙළේ ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා.

4708. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා කුලදෙටුවන් පිදී ද ඒ සත්‍යවචනයෙන් සාම කුමරුගේ විෂ නැසේවා.

4709. යම් සත්‍යයෙකින් සාම කුමාරයා පණටත් වඩා මට ප්‍රිය වී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමරුගේ විෂ නැසේවා.

4710. මා විසින් ද තොපගේ පියාණන් විසින් ද යම්කිසි පිනක් කරන ලද ද ඒ කුශල නම් වූ සත්‍යය හේතු කොටගෙන සාම කුමාරයාගේ විෂ නැසේවා.

4711. මිගසම්මත ගං වෙරළෙහි වැටුණු පස් තැවැරුණු සාම නම් පුතු දැකැ පුත්‍ර ශෝකයෙන් අතිශයින් පෙළුණු පිය තෙමේ ද මෙසේ සත්‍යක්‍රියා කෙළේ ය:

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4712. යෙන සවෙචනයං සාමෝ ධම්මචාරී පුරෙ අහූ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4713. යෙන සවෙචනයං සාමෝ බ්‍රහ්මචාරී පුරෙ අහූ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4714. යෙන සවෙචනයං සාමෝ සච්චවාදී පුරෙ අහූ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4715. යෙන සවෙචනයං සාමෝ මාතාපෙත්තිභරෝ අහූ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4716. යෙන සවෙචනයං සාමෝ කුලෙ ජෙට්ඨාපචායිකෝ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4717. යෙන සවෙචනයං සාමෝ පාණා පියතරෝ මම,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4718. යං කිඤ්චාපී කතං පුඤ්ඤං මයහං ව මාතුයා ව තෙ,
සවෙචන තෙන කුසලෙන විසං සාමස්ස හඤ්ඤතු.

4719. සා දෙවතා අනන්තරහිතා පඛතෙ ගන්ධමාදනෙ,
සාමස්ස අනුකම්පාය ඉමං සච්චමභාසථ.

4720. පඛතාහං ගන්ධමාදනෙ විරරඤ්ඤනිවාසිනී,
න මෙ පියතරෝ කොචි අඤ්ඤත්‍ර සාමා[1] න විජ්ජති.
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4721. සඛෙ වනා ගන්ධමයා පඛතෙ ගන්ධමාදනෙ,
එතෙන සච්චවජ්ජන විසං සාමස්ස හඤ්ඤතු.

4722. තෙසං ලාලපමානානං බහුං කාරුඤ්ඤසංහිතං,
විපපං සාමෝ සමුට්ඨාසි යුවා කල්‍යාණදස්සනො.

4723. සාමෝ හමස්මි භද්දං වො සොත්ථිනාමහි සමුට්ඨිතො,
මා බාළ්හං පරිදෙවෙථ මඤ්ජුනාභිවදෙථ මං.

4724. සවාගතන්තෙ මහාරාජ අථො තෙ අදුරාගතං,
ඉස්සරොසි අනුපපත්තෙ යං ඉධත්‍ථී පවෙදය.

---

1. සාමෝ - මජ්ඣං, සාමෙන - සය්‍ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4712. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා පෙර ධර්මයෙහි හැසුරුණේ වී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා.

4713. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා පෙර බ්‍රහ්මචාරී වී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා.

4714. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා සත්‍ය වචන ඇත්තෙක් වී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා.

4715. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා මව්පියන්ට උපස්ථාන කෙළේ ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා.

4716. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා කුලදෙටුවන් පිදී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමරුගේ විෂ නැසේවා.

4717. යම් සත්‍යයෙකින් මේ සාම කුමාරයා පණටත් වඩා මට ප්‍රිය වී ද ඒ සත්‍ය වචනයෙන් සාම කුමරුගේ විෂ නැසේවා.

4718. තොපගේ මව විසින් ද මා විසින් ද කළ යම් පිනක් ඇද්ද ඒ කුශල සත්‍ය බලයෙන් සාම කුමාරයාගේ විෂ නැසේවා යි සත්‍යක්‍රියා කෙළේ ය.

4719. ගන්ධමාදන පර්වතයෙහි අන්තර්ධාන වූ දේවතා තොමෝ සාම කුමාරයාට අනුකම්පාවෙන් මේ සත්‍යක්‍රියා කළා ය:

4720. ගන්ධමාදන පර්වතයෙහි මම බොහෝ කල් මුළුල්ලෙහි සිට වසන්නී වෙමි. සාම කුමරුට වඩා අතිශයින් ප්‍රියවන අන් කිසිවෙක් මට නැත. මේ සත්‍ය වචනය හෙතු කොටගෙන සාම කුමාරයාගේ විෂ නැසේවා.

4721. ගන්ධමාදන පර්වතයෙහි සියලු මැ වෘක්ෂයෝ සුවඳින් යුත් වෙති. ඒ සත්‍ය වචනය හෙතු කොටගෙන සාම කුමාරයාගේ විෂ නැසේවා.

4722. ඔවුන් දුකින් වැලැපෙමින් හඬද්දී යහපත් දැකුම් ඇති තරුණ සාම කුමාරයා වහා මැ නැගී සිටියේ ය.

4723. සාම නම් මම වෙමි. ඔබට යහපතක් වේවා! විෂ බැස ගියෙන් මම සුවසේ නැගී සිටිමි. බලවත් සේ නො වැළපෙනු මැනැවි මිහිරි බස් තෙපලනු මැනැවැ යි සාම කුමාරයා කී ය.

4724. මහරජ, ඔබට මෙහි යහපත් පැමිණීමක් වේවා! ඔබගේ අයහපත් පැමිණීමක් නො වේවා! මෙහි පැමිණි ඔබ අපට අධිපති ය. මෙහි ඔබ කැමති යමක් ඇත් නම් අනුභව කළ මැනැවි.

4725. තිණ්ඩුකානි[1] පියාලානි මධුකෙ කාසුමාරියො,
එලානි ඛුද්දකපඤානි භුඤ්ජ රාජ වරං වරං.

4726. අත්ථි මෙ පාණියං සීතං ආහතං ගිරිගබ්භරා,
තතො පිව මහාරාජ සචෙ ත්වං අභිකඞ්ඛසි.

4727. සම්මුයහාමි පමුයහාමි සඛා මුයහතෙ මෙ දිසා,
පෙතං තං සාම අද්දක්ඛිං[2] කොනු ත්වං සාම ජීවසි.

4728. අපි ජීවං මහාරාජ පුරිසං ගාළ්හවෙදනං,
උපනීතමනසඞ්කප්පං ජීවන්තං මඤ්ඤතෙ මතං.

4729. අපි ජීවං මහාරාජ පුරිසං ගාළ්හවෙදනං,
තං නිරොධගතං සන්තං ජීවන්තං මඤ්ඤතෙ මතං.

4730. යො මාතරං වා පිතරං වා මචෙවා ධම්මෙන පොසති,
දෙවාපි නං තිකිච්ඡන්ති මාතාපෙත්ති භරං ජනං[3]

4731. යො මාතරං වා පිතරං වා මචෙවා ධම්මෙන පොසති,
ඉධ වෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති.

4732. එස භියේ‍යා පමුයහාමි සඛා මුයහන්ති මෙදිසා,
සරණං තං සාම ගච්ඡාමි ත්වඤ්ඤ මෙ සරණං භව.

4733. ධම්මං වර මහාරාජ මාතාපිතූසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

4734. ධම්මං වර මහාරාජ පුත්තදාරෙසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

4735. ධම්මං වර මහාරාජ මිත්තාමච්චෙසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

4736. ධම්මං වර මහාරාජ වාහනෙසු බලෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

---

1. තිණ්ඩුකානීතිපි පාඨො
2. මමද්දක්ඛි – මජ්ඣං.
3. නරං – මජ්ඣං, සී්‍යා.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4725. විලිඤුන් මිහිරි තිඹිරි හා මොර ද මිහි ද එරමිණියය ද යන එල බොහෝ ය. මහරජ, හොඳ හොඳ එල අනුභව කළ මැනැවි.

4726. කඳුරැලියෙන් ගෙනා සිහිල් පැන් ඇත. ඉදින් මහරජ, ඔබ කැමැත්තහු නම් බොනු මැනැවි. බෝසත් තෙමේ රජු සමග පිළිසඳර කථා වශයෙන් පැවසී ය.

4727. සාම කුමාරයිනි, මම මුළා වෙමි. බෙහෙවින් මුළා වෙමි. මට සියලු දිශා මුළා වී වැටහෙති. පරලොව පත් ඔබ දිටිමි. දැන් ජීවත් වෙහි. කෙසේ දිවි ලදුයෙහි ද යි රජ තෙමේ ඇසී ය.

4728. මහරජ, දිවි ඇති නමුදු දැඩි දුඃඛ වෙදනා ඇති හවාඛයට පැමිණි සිත් හසර ඇති පුරුෂයා ජීවත් වන්නහු මළහ යි ලෝවැසි තෙමේ දනිති.

4729. මහරජ, දිවි ඇති නමුදු දැඩි දුඃඛ වෙදනා ඇති නිරුද්ධ වූ ආශ්වාස ප්‍රාශ්වාස ඇති පුරුෂයා ජීවත් වන්නාහු මළහ යි ලෝවැසියා දනිති.

4730. යම් මනුෂ්‍යයෙක් මව්පියන් දැහැමින් පෝෂණය කෙරේ ද මව්පියන් පෝෂණය කරන ඒ ඒ ජනයාට දෙවියෝ ද පිළියම් කරති.

4731. යම් මනුෂ්‍යයෙක් මව්පියන් දැහැමින් පෝෂණය කෙරේ ද මෙලොවහි ද ඔහු පසසත් පරලොවහි සවර්ගයෙහි සතුටු වන්නේ ය යි සාම කුමාරයා කී ය.

4732. ඒ මම බොහෝ සෙයින් මුළාවෙමි. සියලු දිශා මට නො වැටහෙති. සාම කුමාරයිනි, තොප සරණ යෙමි තෙපි ද මට පිහිට වව.

4733. මහරජ, මව්පියන් පෝෂණය කිරීමෙහි ධර්මයෙහි හැසිරුණ මැනැවි. මහරජ, මේ ලෝකයෙහි දී ගුණධර්මයෙහි හැසිරෙ පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4734. මහරජ, අඹුදරුවන් කෙරේ ද දැහැමින් වසනු මැනැවි. මහරජ, මේ ලෝකයෙහි දී ගුණධර්මයෙහි හැසිරෙ පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4735. මහරජ, මිත්‍රාමාත්‍යයන් කෙරෙහි දැහැමින් හැසිරෙනු මැනැවි. මහරජ, මේ ලෝකයෙහි දී ගුණධර්මයෙහි හැසිරෙ පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4736. මහරජ, රථවාහන කෙරෙහි ද සේනා කෙරෙහි ද දැහැමින් හැසිරෙනු මැනැවි. මහරජ, මේ ලෝකයෙහි දී ගුණධර්මයෙහි හැසිරෙ පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4737. ධම්මං චර මහාරාජ ගාමෙසු නිගමෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

4738. ධම්මං චර මහාරාජ රට්ඨෙසු ජනපදෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

4739. ධම්මං චර මහාරාජ සමණබ්‍රාහ්මණෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

4740. ධම්මං චර මහාරාජ මිගපක්ඛීසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

4741. ධම්මං චර මහාරාජ ධම්මො චිණ්ණො සුඛාවහො,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

4742. ධම්මං චර මහාරාජ ධම්මො චිණ්ණො සුඛාවහො,
ඉධ ධම්මං චරිත්වාන ස ඉන්ද දෙවා සබ්‍රහ්මකා;
සුචිණ්ණෙන දිවං පත්තා මා ධම්මං රාජ පමාදෙති.

සාමජාතකං තතියං.

4. නිමිජාතකං

4743. අච්ඡෙරං වත ලොකස්මිං උප්පජ්ජන්ති විචක්ඛණා,
යද අහූ නිමිරාජා පණ්ඩිතො කුසලත්ථිකො.

4744. රාජා සබ්බවිදෙහානං අද දනං අරින්දමො,
තස්ස තං දදතො දනං සඞ්කප්පා උදපජ්ජථ.
දනං වා බ්‍රහ්මචරියං වා කතමංසු මහප්ඵලං.

4745. තස්ස සඞ්කප්පමඤ්ඤාය මඝවා දෙවකුඤ්ජරො,
සහස්සනෙත්තො පාතුරහූ චණ්ණෙන නිහතං තමං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4737. මහරජ, ගම් නියම්ගම් කෙරෙහි දැහැමින් හැසිරෙනු මැනැවි. මහරජ, මේ ලෝකයෙහි දී ගුණධර්මයෙහි හැසිරී පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4738. මහරජ, රටෙහි ද ජනපදයන්හි ද දැහැමින් හැසිරෙනු මැනැවි. මහරජ, මේ ලෝකයෙහි දී ගුණධර්මයෙහි හැසිරී පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4739. මහරජ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි දැහැමින් හැසිරෙනු මැනැවි. මහරජ, මේ ලෝකයෙහි දී ගුණධර්මයෙහි හැසිරී පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4740. මහරජ, සිවුපාවුන් කෙරෙහි ද පක්ෂීන් කෙරෙහි ද දැහැමින් හැසිරෙනු මැනැවි. මහරජ, මේ ලෝකයෙහි දී ගුණධර්මයෙහි හැසිරී පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4741. මහරජ, ධර්මයෙහි හැසුරුණු මැනැවි. පුරුදු කළ ධර්මය සැප ගෙනදෙන්නේ වේ. මේ ලොකයෙහි දී ගුණධර්මයෙහි හැසිරී පරලොව දී සවර්ගයට යන්නේ මැනැවි.

4742. මහරජ, ධර්මයෙහි හැසුරුණු මැනැවි. පුරුදු පුහුණු කළ ධර්මය සැප ගෙනදෙන්නේ වේ. ශක්‍රයා සහිත වූ දෙවියෝ ද බ්‍රහ්මයා සහිත වූ බ්‍රහ්මයෝ ද මැනැවින් පුරුදු කළ ධර්මය හේතු කොටගෙන දෙව්ලොවට පැමිණියහ. මහරජ, ධර්මයෙහි නො පමා වනු මැනැවැ යි සාම කුමාරයා පිළියක් රජුට දශරාජ ධර්ම දේශනා කෙළේ ය.

තෙවන සාම ජාතක යි.

4. නිමි ජාතකය

4743. යම් කලෙකැ නුවණැ'ති කුසල් කැමැති නිමි නම් රජෙක් වී ද එ කලැ මෙ බඳු දක්ෂ පණ්ඩිතයෝ ලොවැ උපදිද්දැ යි කියා දෙවිමිනිස්සු අපට ඒකාන්තයෙන් ආශ්චර්යයෙකැ යි ගුණ කීහ.

4744. සතුරන් දමනය කරන සියලු විදෙහ රට වැසියන්ගේ රජ තෙමේ දන් දුනි. ඒ දන් දෙන රජහට මෙ බඳු අදහසක් පහළ විය. එනම් දනය හෝ බඹසර හෝ යන මෙයින් කවර නම් පිනක් මහත් විපාක ඇත්තේ ද යනු යි.

4745. දෙවියනට අධිපති වූ නුවණැස් දහසක් ඇති සක්දෙව් රජ තෙමේ එ රජුගේ අදහස් දැනැ තමන්ගේ ශරීරාලෝකයෙන් අඳුරු දුරු කරමින් ඔහු හමුවෙහි පහළ විය.

4746. ස ලොමහට්ඨො මනුජින්දෙ වාසවං අවචා නිමි,
දෙවතානුසි ගන්ධබ්බො ආදු සක්කො පුරින්දදෙ.

4747. න ච මෙ තාදිසො වණ්ණො දිට්ඨො වා යදි වා සුතො,
ආචික්ඛ මෙ ත්වං භද්දන්තෙ කථං ජානෙමු තං මයං.

4748. ස ලොමහට්ඨං ඤත්වාන වාසවො අවචා නිමිං,
සක්කොහමස්මි දෙවින්දෙ ආගතොස්මි තවන්තිකෙ.

4749. අලොමහට්ඨො මනුජින්ද පුච්ඡ පඤ්හං යදිච්ඡසි.[1]
සො ච තෙන කතොකාසො වාසවං අවචා නිමි.

4750. පුච්ඡාමි තං මහාබාහු සබ්බභූතානමිස්සර,
දනං වා බ්‍රහ්මචරියං වා කතමංසු මහප්ඵලං

4751. සො පුට්ඨො නරදෙවෙන වාසවො අවචා නිමිං,
විපාකං බ්‍රහ්මචරියස්ස ජානං අක්ඛාසජානතො.

4752. හීනෙන බ්‍රහ්මචරියෙන ඛත්තියෙ උපපජ්ජති,
මජ්ඣිමෙන ච දෙවත්තං උත්තමෙන විසුජ්ඣති.

4753. නහෙතෙ සුලභා කායා යාවයොගෙන කෙනචි,
යෙ කායෙ උපපජ්ජන්ති අනාගාරා තපස්සිනො.

4754. දුදීපො සාගරො සෙලො මුචලින්දෙ භගීරසො,
උසීනරො[2] අට්ඨකො ච අස්සකො ච පුථුජ්ජනො,

4755. එතෙ චඤ්ඤෙ ච රාජානො ඛත්තියා බ්‍රාහ්මණා බහූ,
පුථු යඤ්ඤං යජිත්වාන පෙතං තෙ නාතිවත්තිසුං.

4756. යෙ වෙ අදුතියා න රමන්ති එකිකා
විවෙකජං යෙ න ලභන්ති පීතිං,
කිඤ්චාපි තෙ ඉන්දසමානභොගා
තෙ වෙ පරාධීනසුඛා වරාකා.

---

1. යම්චජ්ඣි – මජ්ඣං.
2. උසින්දරො – මජ්ඣං. උසීනරො – වී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4746. ලොමුදහගත් ඒ නිමි රජ තෙමේ සක්දෙව් රජු දැකීමෙන් බිය පත් වැ මෙසේ කී ය: ඔබ දෙවියෙක් ද ගඳඹෙක් ද එසේ නැතහොත් පුරින්ද ද නම් වන සක්දෙව්රජ දැ යි.

4747. මෙ බඳු ශරීර වර්ණයෙක් මින් පෙරැ මා විසින් දක්නාලද හෝ අසනලද හෝ නො වෙයි. වහන්ස, තෙපි මට කියව. ඇපි තොප කෙසේ දනුමෝ ද?

4748. ඒ සක්දෙව් රජ තෙමේ ආලෝකයට බියෙන් ලොමු දහගත් නිමි රජු දැනැ මෙසේ කී. මම සක්දෙව් රජ වෙමි. ඔබ වෙත ආයෙමි.

4749. මිනිසුන්ට අධිපති මහරජ මාගෙන් යම් පැනයක් අසනු කැමැත්තෙහි නම් එය භය නැති වැ අසනු මැනැවැ යි කී ය.

4750. (සක්දෙව් රජු විසින් කළ අවකාශ ඇති නිමි රජ තෙමේ සක්දෙව් රජුට මෙසේ කී:) මහත් වූ බාහු ඇති සියලු දෙවියනට අධිපති එම්බා සක්දෙව් රජ, ඔබ විචාරමි. දනය ද බ්‍රහ්මචර්‍යය ද යන මේ දෙකින් කවර නම් ගුණ ධර්මයෙක් වෙසෙසින් මහත් විපාක ඇත්තේ ද?

4751. රජු විසින් ඇසූ බ්‍රහ්මචර්‍යා විපාක දන්නා සක්දෙව් රජ තෙමේ නො දන්නා නිමි රජුට මෙසේ කී ය.

4752. ලාමක බ්‍රහ්මචර්‍යාවෙන් රජකුලයෙහි උපදී, මධ්‍යම බ්‍රහ්ම චර්‍යාවෙන් දෙවිබවට පැමිණෙයි, උතුම් බ්‍රහ්මචර්‍යාවෙන් පිරිසුදු වේ.

4753. ගෙවල් නැති තපස් රක්නා යම් කෙනෙක් බ්‍රහ්මසමූහයෙහි උපදිද්ද දන් දෙන කිසිවකු විසින් ඒ බ්‍රහ්මසමූහයෝ නො ලබන්නාහු වෙති.

4754. මහරජ පෙරැ බරණැස් නුවර, දුදීප ය සාගර ය සේල ය මුවලින්ද ය භගීරස ය උසීර ය අට්ඨක ය අස්සක ය පුථුජ්ජන යැ යි යන,

4755. මේ රජවරු ද සෙසු බොහෝ ක්ෂත්‍රියබ්‍රාහ්මණයෝ ද නොයෙක් අයුරින් දන් දී කාමාවචර භූමි සඞ්ඛ්‍යාත දෙව්ලොව ඉක්මවා නො පැවැත්තාහ.

4756. හුදෙකලා වූ යම් කෙනෙක් නො ඇලෙද්ද යම් කෙනෙක් හුදෙකලා වැ විවේකයෙන් ඇති වූ සතුට නො ලබද්ද ඔහු ඉන්ද්‍රයා හට මෙන් සමාන සම්පත් ඇත්තාහු නමුදු ඒ පින්වත්හු අනුන් අයත් සුව ඇත්තාහු මැ වෙති.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4757. අද්ධා ඉමෙ[1] අවත්තිංසු අනාගරා තපස්සිනො,
සත්තිසයො යාමහනු සොමයාගො[2] මනොජවො,

4758. සමුඤ්ඤෙ මාසො හරතො ච[3] ඉසිකාලිකරක්ඛියො,[4]
අංගීරසො කස්සපො ච කිසවච්ඡො අකිත්ති ච.[5]

4759. උත්තරෙන නදී සීදා ගම්භීරා දුරතික්කමා,
නළඤ්ඤවණ්ණා ජොතන්ති සදා කඤ්චනපබ්බතා.

4760. පරූළ්හකච්ඡා තගරා රූළ්හකච්ඡා වනා නගා,
තත්‍රාසුං දසසහස්සානි පොරාණා ඉසයො පුරෙ.

4761. අහං සෙට්ඨොස්මි දානෙන සංයමෙන දමෙන ච,
අනුත්තරං වතං කත්වා පකිරචාරී සමාහිතෙ.

4762. ජාතිමන්තං අජච්චං ච අහමුජ්ජුගතං නරං,
අතිවෙලං නමස්සිස්සං කම්මබන්ධු හි මාතියා.[6]

4763. සබ්බෙ වණ්ණා අධම්මට්ඨා පතන්ති නිරයං අධො,
සබ්බෙ වණ්ණා නිරුජ්ඣන්ති[7] චරිත්වා ධම්මමුත්තමං.

4764. ඉදං වත්වාන මඝවා දෙවරාජා සුජම්පති,
වෙදෙහං අනුසාසිත්වා සග්ගකායං අපක්කමි.

4765. ඉමං හොන්තො නිසාමෙථ යාවන්තෙත්ථ සමාගතා,
ධම්මිකානං මනුස්සානං වණ්ණං උච්චාවචං බහුං.

4766. යථා අයං නිම්රාජා පණ්ඩිතො කුසලත්ථිකො.
රාජා සබ්බවිදෙහානං අද දානං අරින්දමො.

4767. තස්ස තං දදතො දානං සඞ්ඝපෙපා උදපජ්ජථ,
දානං වා බ්‍රහ්මචරියං වා කතමංසු මහප්ඵලං.

---

1. අථ ඉමෙ – මජසං.
2. සොමයාමො – මජසං.
3. හරදෙ ච. – මජසං.
4. ඉසිකාලපුරක්ඛතො – මජසං.
5. අකන්ති ච. – මජසං.
6. මාණවා – මජසං.
7. විසුජ්ඣන්ති – වි. මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4757–58. ගෙවල් නැති සීලයෙන් හා තපසින් ද සමාපත්තියෙන් ද යුත් යාමහනු ය සොමයාග ය මනොජවය ය සමුද්ද ය මාඝ ය භරත ය ඉසිකාලිරක්ඛි ය යන මේ සත් සෘෂීහු ද අඞ්ගීරස ය කස්සප ය කිසවච්ඡ ය අකිත්ති ය යන මේ සෘෂීහු සතර දෙන ද සමග වූ එකොළොස් සෘෂිවරු ඒකාන්තයෙන් කාමාවචර දෙව්ලොව ඉක්මැවූහ හෙවත් බ්‍රහ්මලොකයෙහි උපන්හ.

4759. හිමවතට උතුරු දිගින් ගැඹුරු වූ ඉක්මැවිය නො හැකි සීද නම් නදියක් විය. එහි දෙපස හැම කල්හි රන් පර්වතයෝ ඇවිළෙන ගිනි මෙන් දිලියෙති.

4760. ඒ ගඟෙහි වංක ස්ථානයන්හි නොහොත් ගඟ දෙපස තුවරලා ගස් ඇත. එහි දෙපස පර්වතයෝ මල්පල දරන වැඩුණු රුක්වලින් යුක්ත වූහ. ඒ මනහර දෙපසෙහි පෙරැ එක් කලෙක දස දහසක් පමණ පුරාණ සෘෂිවරයෝ වූහ.

4761. මම දනයෙන් උතුම් වීමි. සීලයෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද නිරුත්තර වූ උතුම් වූත සමාදනයෙන් හුදකලා වැ උපචාර අර්පණා සමාධි ඇති දහසක් සෘෂිවරුන්ට බොහෝ කාලයක් උපස්ථාන කෙළෙමි.

4762. ජාතියෙන් උසස් වූ ද උසස් නො වූ ද එක තාපසයකු කෙරෙහි වත් වෙනසන් නො කොටැ ඒ සෘජු භාවයට පැමිණි සිත් ඇති තාපස සමූහයන් නිතර වැන්දෙමි. සත්වයෝ වනාහි කර්ම-බන්ධු වූවෝ වෙති.

4763. අධර්මයෙහි පිහිටි ක්ෂත්‍රිය ය බ්‍රාහ්මණ ය වෛශ්‍ය ය ශුද්‍ර ය යන සිව්පිරිස නරකයෙහි හිස යට කොටැ වැටෙති. සියලු සිවුපිරිස උතුම් ධර්මයෙහි හැසිරැ පිරිසිදු වෙති හෙවත් නිවන් දකිති.

4764. සුජම්පතී නම් සක්දෙව් රජ තෙමේ මේ (උඩ සඳහන් පරිදි) කියා සැක ඇති වේදේහ රජුට අනුශාසනා කොටැ දෙව් ලොටට ගියේ ය.

4765. යම් පමණ දේවතාවෝ සුධර්මා නම් දෙව්සබයෙහි රැස් වූහු ද පින්වත් දේවතාවෙනි දන සීලාදි පින් කරන මිනිසුන්ගේ උස් පහත් විපාකයෝ බොහෝ ය. මා කියන ගුණ වර්ණනාව අසනු මැනැවි.

4766. කුසල් කැමැති මේ නිමිරජ තෙමේ ඉතා නුවණැත්තේ වේ. සතුරන් හික්මවන සියලු විදේහ රට වැසියනට රජ වූ හෙ තෙමේ දන් දුන්නේ ය.

4767. ඒ දන් දෙන එරජුහට මෙ බඳු අදහසක් පහළ විය. එනම් දන් දීම ය බ්‍රහ්මචර්‍ය ය යන මෙයින් කවර නම් ගුණ ධර්මයෙක් මහත් විපාක ඇත්තේ ද යනු යි. සක්දෙව් රජ තෙමේ කී ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4768. අඛුතො වත ලොකසමිං උපපජ්ජි ලොමහංසනො,
දිබ්බො රථො පාතුරහූ වෙදෙහස්ස යසස්සිනො.

4769. දෙවපුත්තො මහිද්ධිකො මාතලී දෙවසාරථී,
නිමන්තයිත්ථ රාජානං වෙදෙහං මිථිලග්ගහං.

4770. එහිමං රථමාරුය්හ රාජසෙට්ඨ දිසම්පති,
දෙවා දස්සනකාමා තෙ තාවතිංසා සඉන්දකා.
සරමානා හි තෙ දෙවා සුධම්මායං සමව්හරෙ.

4771. තතො ච රාජා තරමානො වෙදෙහො මිථිලග්ගහො,
ආසනා වුට්ඨහිත්වාන පමුඛො රථමාරුහි.

4772. අභිරුළ්හං රථං දිබ්බං මාතලී එතදබ්රවි'
කෙන තං නෙමි මඝොන රාජසෙට්ඨ දිසම්පති.
යෙන වා පාපකම්මන්තා පුණ්ණකම්මා ච යෙ නරා.

4773. උභයෙනෙව මං නෙහි මාතලී දෙවසාරථී,
යෙන වා පාපකම්මන්තා පුණ්ණකම්මා ච යෙ නරා.

4774. කෙන තං පඨමං නෙමි රාජසෙට්ඨ දිසම්පති,
යෙන වා පාපකම්මන්තා පුණ්ණකම්මා ච යෙ නරා.

4775. නිරයෙ[1] තාව පස්සාමි ආවාසෙ[2] පාපකම්මිනං,
යානානි ලුද්දකම්මානං දුස්සීලානං ච යා ගති.

4776. දස්සෙසි මාතලී රඤ්ඤො දුග්ගං වෙතරණිං නදිං,
කූටන්තිං[3] ඛාරසංයුත්තං තත්තං අග්ගිසිඛූපමං.

---

1. නිරයං – මජ්ඣං.
2. ආවාසං – මජ්ඣං.
3. කූටයීතං – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4768. ලෝකයෙහි ඒකාන්තයෙන් ලොමුදහගන්නා වූ දෙයක් පහළ විය. එනම් පිරිවර ඇති වේදේහ රජුට දිව්‍යරථයක් පහළ වී යයි මහාජනක තෙමේ කී ය.

4769. මහත් දෙවර්ධි ඇති දිව්‍ය රථාචාරී වූ මාතලී නම් දෙවිපුත් තෙමේ මීයුලු නුවර වාසස්ථාන කොට ඇති වෙදෙහ රජුට දෙවයන් වහන්ස රථයට නැංග මැනැවැ යි ආරාධනා කෙළේ ය.

4770. දිසාවනට අධිපති දෙවයන් වහන්ස, මේ රියට නැඟ එනු මැනැවි. සක්දෙව් රජ සහිත ඒ තව්තිසා වැසි දෙවියෝ ඔබ දක්නට කැමැත්තාහු වෙති ඔබ සිඟි කරමින් මැ ඒ දෙවියෝ සුධර්මා නම් දෙවසබයෙහි රැස් වැ සිටිති යි මාතලී දෙවිපුත් තෙමේ කී ය.

4771. ඉක්බිති මීයුලු නුවර වාසස්ථාන කොට ඇති වෙදෙහ රජ තෙමේ ඉක්මනින් හුනස්නෙන් නැගිට අභිමුඛ වැ දෙවරියට නැංගේ ය.

4772. දෙවරියට නැංග නිමි රජුට මාතලී දෙවිපුත් තෙමේ මෙය කී ය: දිසාවනට අධිපති දෙවයන් වහන්ස, යම් මහකින් ගොස් පව්කම් කළ සත්ත්වයෝ වෙසෙද්ද ඒ ස්ථානය දැක්ක හැකි ය. යම් මහකින් ගොස් පින්කම් කළ සත්ත්වයෝ වෙසෙද්ද ඒ ස්ථානය දැක්ක හැකි ය. ඒ දෙමහින් කවර මහෙකින් ඔබ ගෙනයම් ද යි මාතලී දෙවිපුත් තෙමේ ඇසී.

4773. මාතලී නමැති දිව්‍ය රථාචාර්‍යය, පව්කම් කළ සත්ත්වයෝ වෙත් නම් යම් මහෙකින් ගොස් ඒ ස්ථානය දැක්ක හැකි ද පින්කම් කළ සත්ත්වයෝ වෙත් නම් යම් මහෙකින් ගොස් ඒ ස්ථානය දැක්ක හැකි ද ඒ දෙමහින් මැ මා ගෙන යව යි නිමි රජ තෙමේ කී ය.

4774. දිසාවනට අධිපති දේවයන් වහන්ස, පව්කම් කළ සත්ත්වයෝ වෙත් නම් ඔවුන් යම් මහෙකින් ගොස් දැක්ක හැකි ද පින්කම් කළ සත්ත්වයෝ වෙත් නම් ඔවුන් යම් මහෙකින් ගොස් දැක්ක හැකි ද මේ දෙමහින් කවර මහෙකින් ඔබ පළමු කොට ගෙන යන්නෙම් ද යි මාතලී දෙවිපුත් ඇසී.

4775. නිරයෙහි පව්කම් කළ සත්ත්වයන් වෙසෙන තැන් ද දරුණු පව් කළ සතුන් උපදින තැන් ද දුස්සීලයන් අකුසල විපාකයෙන් උපන් තැන් ද ඇතහොත් ඒ නරකයන් පළමු කොට දක්නට කැමැත්තෙමි යි නිමි රජ තෙමේ කී ය.

4776. මාතලී දෙවිපුත් තෙමේ නිමි රජහට කැකැරෙමින් පැසෙන රත් වූ ගිනිසිළු බඳු පැහැ ඇති යා නො හැකි ලෝ දියෙන් යුත් වෙතරණී නම් නදිය දැක් වී.

4777. නිමි හවෙ මාතලිං අජ්ඣභාසථ
දිස්වා ජනං පතමානං විදුග්ගෙ,
භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි.
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා වෙතරණිං[1] පතන්ති.

4778. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථි,
විපාකං පාප කම්මානං ජානං අක්ඛාසජානතො.[2]

4779. යෙ දුබ්බලෙ බලවන්තො ජීවලොකෙ
හිංසෙන්ති රොසෙන්ති සුපාපධම්මා,
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තෙ වෙ ජනා වෙතරණිං පතන්ති.

4780. සාමා ච සොණා සබලා ච ගිජ්ඣා
කාකොළසඞ්ඝා ච අදෙන්ති භෙරවා;
භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යයිමං ජනං[3] කාකොළා අදෙන්ති.

4781. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථි,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4782. යෙ කෙචි මෙ මච්ඡරිනො කදරියා
පරිහාසකා සමණබ්‍රාහ්මණානං
හිංසෙන්ති රොසෙන්ති සුපාපධම්මා,
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තයිමං ජනං කාකොළා අදෙන්ති.

4783. සජොතිභූතා පඨවිං කමන්ති
තත්තෙහි ඛන්ධෙහි ච පොථයන්ති
භයං හි මං වින්දති සූත දිස්වා,
පුච්ඡාමි තං මාතලී දෙවසාරථි
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා ඛන්ධහතා සයන්ති.

4784. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථි,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

---

1. වෙත්තරණිං – මජ්ඣං.
2. අක්ඛාසි – මජ්ඣං. ස්‍යා.
3. යෙ මෙ ජනෙ – මජ්ඣං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4777. නිමි රජ තෙමේ ඒකාන්තයෙන් ඉතා යා නොහැකි නරකයෙහි වැටෙන ජනයා දැක මාතලි දෙවිපුත්හට මෙසේ කී: එම්බා මාතලී රථාචාර්‍යය, මට මෙය දැක්මෙන් භය උපදී. එම්බා මාතලිය තොප විචාරමි. යම් මේ මනුෂ්‍යයෝ වෙද්ද ඔහු කිනම් පව්කම් කළාහු වෙතරණී නරකයෙහි වැටෙද්දැ යි ඇසී.

4778. මෙසේ ඇසූ මාතලී දෙවිපුත් තෙමේ ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම පිළිබඳ විපාක දත් හෙ තෙමේ නො දන්නා නිමි රජුට මෙසේ කී:

4779. මිනිස් ලොව ඉතා පහත් සභාව ඇති බලවත් යම් කෙනෙක් දුබලයනට පීඩා කෙරෙද්ද නන් අයුරින් ආක්‍රෝෂ පරිභව කෙරෙද්ද දරුණු ක්‍රියා ඇති ඔහු පව් රැස් කොට නිරතුරු එකාන්තයෙන් ඒ මිනිස්සු වෙතරණී නම් නරකයට වැටෙති යි මාතලී දෙවිපුත් තෙමේ කී.

4780. රන් පැහැති බල්ලෝ ද කබර පැහැති බල්ලෝ ද ගිජු ලිහිණියෝ ද භයානක කපුටු සමූහයෝ ද මස් කඩ කඩා කති. මෙ දැක මට භය උපදී. එම්බා සාරථිය ඔබ විචාරමි, කවුඩන් කනු ලබන යම් මේ නිරිසත්තු කිනම් පාපකර්මයක් කළාහු ද යි ඇසී.

4781. මෙසේ ඇසූ මාතලී දෙවිපුත් තෙමේ ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙමේ නො දන්නා නිමි රජුට මෙසේ කී:

4782. මසුරු බැවින් අනුන්ට නොදෙන, අනුන්ට දෙන දේත් වළකන හෙයින් මසුරු වූ ඉතා පහත් සභාව ඇති යම් කිසි කෙනෙක් මහණ බමුණන්ට නින්ද පරිභව කෙරෙද්ද භිංසා ආක්‍රෝෂ කෙරෙද්ද දරුණු පාපකර්ම ඇති ඔහු පව් රැස් කොට නිරයට යෙත්. ඒ මේ නිරිසතුන්ගේ මස් කවුඩෝ අනුභව කරති යි මාතලී දෙවිපුත් කී.

4783. ගිනිදැල් සහිත වූ යපොළොව ආක්‍රමණය කෙරෙති, රත් වූ මුගුරුවලින් තැලෙති. සාරථිය, මට මෙය දැකීමෙන් භය උපදී. එම්බා මාතලී නම් දේවසාරථිය, ඔබගෙන් අසමි: යමුගුරුවලින් තැලෙන නිරිසත්තු සයනය කෙරෙද්ද? මේ සත්ත්වයෝ කිනම් පාප කර්මයක් කළාහු ද යි නිමි රජ ඇසී.

4784. මෙසේ ඇසූ මාතලී දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙමේ නො දන්නා නිමි රජුට මෙසේ කී:

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4785. යෙ ජීවලොකසමිං සුපාපධම්මිනො
නරාඤ්ච නාරිඤ්ච අපාපධම්මං;
හිංසෙනති රොසෙනති සුපාපධම්මා
තෙ ලුද්දකම්මා පසවෙත්වා[1] පාපං
තෙමෙ ජනා බන්ධහතා සයන්ති.

4786. අඛාරකාසුං අපරෙ ථුනන්ති
නරා රුදන්තා පරිදඩ්ඩගත්තා;
භයං හි මං විඳති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි,
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා අඛාරකාසුං ථුනන්ති.[2]

4787. තස්ස පුට්ඨො වියාකාසි මාතලි දෙවසාරථි,
විපාකං පාපකම්මානං ජානං අසක්කාසජානතො.

4788. යෙ කෙචි පූගායතනස්ස හෙතු
සක්ඛිං කරිත්වා ඉණං ජාපයන්ති;
තෙ ජාපයිත්වා ජනතං ජනින්ද
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තෙමෙ ජනා අඛාරකාසුං ථුනන්ති

4789. සජොතිභූතා ජලිතා පදිත්තා
පදිස්සති මහතී ලොහකුම්භී;
භයං හි මං විඳති සූත දිස්වා
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි
යෙමෙ ජනා අවංසිරා ලොහකුම්භිං පතන්ති.

4790. තස්ස පුට්ඨො වියාකාසි මාතලි දෙවසාරථි,
විපාකං පාපකම්මානං ජානං අසක්කාසජානතො.

4791. යෙ සීලවං සමණං බ්‍රාහ්මණං වා
හිංසෙනති රොසෙනති[3] සුපාපධම්මිනො;
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තෙමෙ ජනා (අවංසිරා) ලොහකුම්භිං පතන්ති.

---

1. පසවෙත්වාන – මජ්ඣං.
2. ථුනන්ති – මජ්ඣං.
3. හිංසන්ති රොසන්ති – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4785. මිනිස් ලොවැ ඉතා පහත් සුභාව ඇති යම් කෙනෙක් නිවැරදි පුරුෂයකුට හෝ ස්ත්‍රියකට හිංසා ආක්‍රෝෂ පරිභව කෙරෙද්ද භයානක පව්කම් ඇති ඔවුහු පව් රැස් කොට නිරයට යෙති. යමුගුරුවලින් තැළෙන යපොළොවෙහි සයනය කරන්නෝ ඒ මේ නිරිසත්තු ය යි මාතලි නම් දේවසාරථී කී.

4786. හාත්පසින් දැවෙන ශරීර ඇති හඬන අනික් කෙනෙක් ගිනි අඟුරු වළට වැටෙති; (ඔවුන්ගේ ඇඟට ගිනි අඟුරු දමති). සාරථීය, මෙය දැක්මෙන් භය උපදී. සාරථීය, ඔබ විචාරමි: යම් මේ නිරිසත්තු මේ අඟුරු වළට වැටෙත් ද මේ සත්ත්වයෝ කිනම් පාප කර්මයක් කළාහු ද යි ඇසී.

4787. මෙසේ ඇසූ මාතලි දෙවිපුත් තෙමේ ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙමේ නො දන්නා නිමි රජුට මෙසේ කී:

4788. යම් කිසි කෙනෙක් සමූහයා සතු ධනය හේතු කොට ගෙන බොරු සාක්ෂි කියා ධනය පිළිබඳ ණය නසා ලද්ද, මහරජ ඔවුහු ජනසමූහය පිළිබඳ ණය මෙසේ බොරුවෙන් විනාශ කොට භයානක පව්කම් කරන්නාහු පව් රැස් කොට නිරයට යෙති. ඔවුහු අඟුරුවළට වැටීමෙන් කම්පා වෙති යි කී.

4789. ඇවිල ගත් දිලියෙන ගිනිදැල් සහිත මහත් ලෝ සැළිය පෙනේ. රථාචාර්‍යය මෙය දැක්මෙන් භය උපදී. එම්බා සාරථීය, ඔබ විචාරමි: යටිකුරු වූ භිස් ඇති යම් මේ නිරිසත්තු ලෝ සැළියට වැටෙද්ද, මේ සත්ත්වයෝ කිනම් පව් කළාහු ද යි ඇසී.

4790. මෙසේ ඇසූ මාතලි දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී:

4791. මේ ලොව ඉතා අධම සුභාව ඇති යම් කෙනෙක් සිල්වත් මහණ බමුණන්ට හිංසා ආක්‍රෝෂ කෙරෙද්ද දරුණු පව්කම් ඇති ඔවුහු පව් රැස් කොට නරකයට යෙති. යටිකුරු භිස් ඇති මේ ජනයෝ ලෝකුඹු නිරයට වැටෙති යි දේවසාරථී තෙම කී.

4792. ලුඤ්චන්ති ගීවං අථ වෙඨයිත්වා[1]
උණ්ණොදකස්මිං පකිලෙදයිත්වා;
භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා ලුත්තසිරා[2] සයන්ති.

4793. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4794. යෙ ජීවලොකස්මිං සුපාපධම්මිනො
පක්ඛී ගහෙත්වාන විහෙඨයන්ති
තෙ හෙඨයිත්වා[3] සකුණං ජනින්ද
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තෙමෙ ජනා ලුත්තසිරා සයන්ති.

4795. පහුත[4] තොයා අනිඛාතකූලා[5]
නදී අයං සන්දති සූපතිත්ථා;
සම්මාභිතත්තා මනුජා පිවන්ති
පිවතඤ්ච[6] තෙසං භුසං හොති පානි.

4796. භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
පිවතඤ්ච[6] තෙසං භුසං හොති පානි.

4797. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4798. යෙ සුද්ධධඤ්ඤං පලාපෙන[7] මිස්සං
අසුද්ධකම්මා කයිනො දදන්ති,
සම්මාභිතත්තානං පිපාසිතානං
පිවතඤ්ච තෙසං භුසං හොති පානි.

---

1. අවිහෙඨයිත්වා – මජසං.
2. ලුඤ්චසිරා – මජසං.
3. විහෙඨයිත්වා – මජසං.
4. පහුත්ත – මජසං.
5. අනිගාධකූලා – මජසං.
6. පීතඤ්ච – මජසං.
7. පලාසෙන – මජසං ස්‍යා. වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4792. තවද ගිනිගෙන දිලියෙන යොතින් ගෙළ වෙළා උණු ලෝදියෙහි දමා තෙමා ගෙළ සිඳිති. මෙය දැක්මෙන් මට භය උපදී. එම්බා දේව සාරථිය ඔබ විචාරමි: යම් මේ නිරිසත්තු සිඳින ලද හිස් ඇත්තෝ හොවිත් ද මොවුහු කිනම් පවිකම් කළාහු දැ යි ඇසී.

4793. මෙසේ ඇසූ මාතලී දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය: පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී.

4794. සත්ත්වලෝකයෙහි ඉතා අධමසත්ත්වභාව ඇති යම් කෙනෙක් පක්ෂීන් අල්වා ගෙන පිහාටු ගලවා ගෙළ සිඳ මරත් ද මහරජ, එසේ කිරීමෙන් දරුණු පවිකම් කරන ඔවුහු පව් රැස් කොට නරකයට පැමිණෙති. සුන් වූ හිස් ඇති ඒ මේ නිරිසත්තු සයනය කරති යි කී ය.

4795. දිය බහුල වූ නො ගැඹුරු ඉවුරු ඇති මනා තොට ඇති මේ නදිය ගලා බසී. ග්‍රීෂ්මයෙන් තැවුණු සත්ත්වයෝ පැන් බොති. ඔවුන් පානය කළ ජලය බොල් බවට පත් වේ.

4796. සාරථිය මෙය දැක්මෙන් මට භය උපදී. එම්බා දේව සාරථිය, ඔබ විචාරමි: ඔවුන් බොන ඒ පැන් බොල් බවට පැමිණේ. මේ නිරිසත්තු කිනම් පවිකම් කළාහු දැ යි ඇසී.

4797. මෙසේ ඇසූ මාතලී දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙළ නො දන්නා නිමි රජුට මෙසේ කී:

4798. මේ ලොව අපිරිසුදු කර්මාන්ත ඇති හෙවත් පව් කරන යම් කෙනෙක් පිරිසුදු සප්තවිධ ධාන්‍යයෙන් යම් ධාන්‍යයක් බොල් හා මුසු කොට මිලයට ගන්නා තැනැත්තාහට දෙද්ද ග්‍රීෂ්මයෙන් තැවුණු පැන් බොනු කැමැති ඔවුන් බොන පැන් බොල් බවට පැමිණේ ය යි කී.

4799. උසූහි සත්තීහි ච තොමරෙහි
දුභයානි පඤ්ඤානි තුදන්ති කන්දතං,
භයං හි මං වින්දති සූත දිසවා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා සන්නිහතා සයන්ති.

4800. තස්ස පුට්ඨා වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4801. යෙ ජීවලොකස්මිං අසාධුකම්මිනො,
අදින්නමාදය කරොන්ති ජීවිකං,
ධඤ්ඤං ධනං රජතං ජාතරූපං
අජෙළකං වාපි පසුං මහීසං[1]
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තෙමෙ ජනා සන්නිහතා සයන්ති.

4802. ගීවාය බද්ධා කිඤ්ඤ ඉමෙ පුතෙකෙ
අඤ්ඤෙ විකත්තා[2] බිලකතා පුතෙකෙ
භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා බිලකතා සයන්ති.

4803. තස්ස පුට්ඨා වියාකාසි මාතලී දෙව සාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4804. ඔරබ්භිකා සූකරිකා ච මච්ඡිකා
පසුං මහීසඤ්ච අජෙළකඤ්ච
හන්ත්වාන සූනසු පසාරයිංසු
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං.
තෙමෙ ජනා බිලකතා සයන්ති.

4805. රහදෙ අයං මුත්තකරීසපූරෙ
දුග්ගන්ධරූපෙ අසුචී පූති වායති
බුද්[3] පරෙතා මනුජා අදෙන්ති[4]
භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී.
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා මුත්තකරීසභක්ඛා.

---

1. මහීසං - මජ්ඣං.
2. විකන්තා - මජ්ඣං.
3. බුද්ද - මජ්ඣං..
4. පිවන්ති - අට්ඨකථා

4799. ඊ අඩයටි තෝමර යන මෙයින් අඬන නිරිසතුන්ගේ උභය පාර්ශ්වය විදින්. සාරථිය, මට වනාහි මෙය දැක්මෙන් භය උපදී. එම්බා මාතලි නම් සාරථිය, ඔබ විචාරමි. යම් මේ නිරි සත්තු අඩයටි ආදි ආවුදවලින් නැසුණෝ හොවිද්ද, මේ නිරිසත්තු කිනම් පව් කළාහු ද යි ඇසී.

4800. මෙසේ ඇසූ මාතලි දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී:

4801. පාපකර්ම ඇති යම් කෙනෙක් සත්ත්වලොකයෙහි ධන ධාන්‍ය ය රන්රිදී ය එළබැටළය ගවමහිස ය යන මෙයින් හිමියන් විසින් නුදුන් යම් දෙයක් සොර සිතින් ගෙන දිවි පවත්වද්ද, දරුණු පවකම් ඇති ඔවුහු පව් රැස් කොට නිරයට යෙති. ඒ මේ නිරි යත්තු ආවුදවලින් නැසුණාහු හොවිත්.

4802. යළි මේ නිරිසතුන්ගෙන් ඇතැමෙක් බෙල්ලෙන් බඳනා ලදහ; සමහරු කඩ කඩ කොටැ කපා වෙන් කරන ලද; තවද සමහරු යපොළොවෙහි මස් ගොඩවල් බවට පත් කරන ලද. සාරථිය මෙය දැක්මෙන් මට භය උපදී. දේවසාරථිය, ඔබ විචාරමි: මේ නිරිසත්තු කිනම් පව් කළාහු ද, යම් මේ සත්ත්වයෝ මස් කරන ලද්දහු හොවිද්ද මොවුහු කිනම් පව් කළාහු ද යි ඇසී ය.

4803. මෙසේ ඇසූ මාතලි දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී:

4804. එළුවන් මරා ඌරන් මරා දිවි පවත්වන්නාවූ ද මසුන් මරා දිවි පවත්වන්නාවූ ද ඔවුහු ගව මහිස එළු බැටළුවන් මරා මස් කොට මස්ලොඹුවල විකිණීමට කොටස් වශයෙන් තැබූහු ද ඒ දරුණු පවකම් ඇත්තෝ පව් රැස් කොටැ නරකයට යෙති. කොටස් කළ මස් බවට පත් ඒ මේ නිරිසත්තු හොවිති.

4805. මල මූත්‍ර පිරුණු දුර්ගන්ධ වූ මේ විල දුගඳ හමයි. සාදුකින් පෙළෙන සත්ත්වයෝ එය අනුභව කරති. මාතලිය, මෙය දැක්මෙන් මට භය උපදී. එම්බා දේවසාරථිය, ඔබ විචාරමි: යම් මේ නිරිසත්තු මලමූත්‍ර අනුභව කෙරෙද්ද ඔවුහු කිනම් පවකම් කළාහු ද යි ඇසි.

4806. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4807. යෙ කෙචි මෙ කාරණිකා විරොසකා
පරෙසං හිංසාය සද නිවිට්ඨා
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
මිත්තද්දුනො මීළ්හමදෙන්ති බාලා
රහදෙ අයං ලොහිතපුබ්බපූරො
දුග්ගන්ධරූපො අසුචී පූති වායති.

4808. සම්මාහිතත්තා මනුජා පිවන්ති
භයං හි මං වින්දති සූත දිස්වා,
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා ලොහිතපුබ්බභක්ඛා.

4809. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4810. යෙ මාතරං වා පිතරං වා ජීවලොකෙ
පාරාජිකා අරහන්තෙ හනන්ති.
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තෙමෙ ජනා ලොහිතපුබ්බභක්ඛා.

4811. ජිවභක්ඛ පස්ස බලිසෙන විද්ධං
විහතං යථා සඞ්කුසතෙන චම්මං;
ඵන්දන්ති මච්ඡාව ථලම්හි බිත්තා
මුඤ්චන්ති ඛෙළං රුදමානා කිමෙතෙ.

4812. භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
ඉමේ නු මච්චා කිමකංසු පාපං
යෙමෙ ජනා වඩ්කසස්සා සයන්ති.

4813. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4814. යෙ කෙචි සන්ථානගතා මනුස්සා
අග්ගෙන අග්ගං කයං භාපයන්ති[1]
කූටෙන කූටං ධනලොභහෙතු,
ජන්නං යථා වාරිවරං වධාය.

---

1. කලං භාපයන්ති – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4806. මෙසේ ඇසූ මාතලි දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී.

4807. මේ යම්කිසි සත්ත්ව කෙනෙක් අත් පා කැපීම් ආදී වශයෙන් මිනිසුන්ගට දරුණු වද දෙද්ද යහළුවන් වෙහෙසන අනුන්ගට හිංසා පීඩා කිරීමෙහි නියුතු දරුණු පව් කරන්නාවූ මිතුරන්ගට ද්‍රෝහ කරන අඥාන වූ ඔවුහු පව් රැස් කොට නරකයට පැමිණ අශුචි අනුභව කෙරෙති කී.

4808. ලේ සැරව පිරුණු දුගඳ වූ මේ විල අපවිත්‍ර වූ දුර්ගන්ධ ය පතුරුවයි. ග්‍රීෂ්මයෙන් තැවුණු සත්ත්වයෝ එය බොති. සාරථිය, මෙය දැකීමෙන් මට භය උපදී. එම්බා දෙවසාරථිය, ඔබ විචාරමි. යම් මේ නිරිසත්තු ලේ සැරව අහර කොට ඇත්තාහු ද ඔවුහු කිනම් පව් කළාහු දැ යි ඇසි ය.

4809. මෙසේ ඇසූ මාතලි දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී:

4810. යම් කෙනෙක් මේ සත්ත්වලෝකයෙහි ගිහි වැ සිට මව හෝ පියා හෝ රහතන් වහන්සේ මරත් ද දරුණු පව්කම් ඇති ඔවුහු නරකයට යෙති. ඒ මේ නිරිසත්තු ලේ සැරව අනුභව කරන්නෝ වෙති යි කී ය.

4811. සිය ගණන් උල් ගැසූ සමක් මෙන් බිලියෙන් විදින ලද දිව බලනු මැනවි. ගොඩ දැමූ මසුන් මෙන් මේ සත්ත්වයෝ කවර හෙයින් සැලෙත් ද, හඬමින් කෙළ වගුරුවද්ද?

4812. සාරථිය, මෙය දැක්මෙන් මට භය උපදී. එම්බා දෙව සාරථිය, ඔබ විචාරමි: යම් මේ නිරිසත්තු ගිලින ලද බිලි ඇත්තාහු හොඳින් ද මේ සත්තු කිනම් පව් කළාහු දැ යි ඇසී ය.

4813. මෙසේ ඇසූ මාතලි දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී:

4814. බඩු මිල නියම කරන සථානයෙහි නියුතු යම් කිසි මිනිස් කෙනෙක් ඒ ඒ දේ අගය කිරීම් වශයෙන් හෙවත් මිල ප්‍රමාණ කිරීම් වශයෙන් වෙළඳුන්ගේ ලාභයට හානි පමුණුවද්ද වස්තු ආශාවෙන් හොර කිරුම් මිනුම් ආදි කුට ක්‍රියායෙන් ඇමෙන් වැසූ බිලිය රැගෙන මසකු මරන්නට ළං වන්නා සේ තුලාකූට ආදිය කෙරෙද්ද,

4815. න හි කූටකාරිස්ස භවන්ති තාණා
සකෙහි කම්මෙහි පුරක්ඛතස්ස,[1]
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තෙ මෙ ජනා වඩ්ඪසස්තා සයන්ති.

4816. නරියො[2] ඉමා සම්පරිභින්නගත්තා
පග්ගය්ග කන්දන්ති භුජෙ දුජ්ච්චා,
සම්මක්ඛිතා ලොහිතපුබ්බලිත්තා
ගාවො යථා ආඝාතනෙ විකත්තා[3]
තා භූමිභාගස්මිං සදා නිඛාතා
ඛන්ධාතිවත්තන්ති සජොතිභූතා,

4817. භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි,
ඉමා නු නරියො කිමකංසු පාපං
යා භූමිභාගස්මිං සදා නිඛාතා
ඛන්ධාතිවත්තන්ති සජොතිභූතා.

4818. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථි,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4819. කොලිනියායො[4] ඉධ ජීවලොකෙ
අසුද්ධකම්මා අසතං අචාරුං[5]
තා දිත්තරූපා[6] පතිවිප්පහාය,
අඤ්ඤං අචාරුං රතිබ්ඩ්ඩහෙතු
තා ජීවලොකස්මිං රමාපයිත්වා
ඛන්ධාතිවත්තන්ති සජොතිභූතා.

4820. පාදෙ ගහෙත්වා කිස්ස ඉමෙ පුනෙකෙ
අවංසිරා නරකෙ පාතයන්ති.
භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි,
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙ මෙ ජනා අවංසිරා නරකෙ පාතයන්ති.

---

1. පුරක්ඛිතස්ස – මජසං.
2. නාරිනො – මජසං.
3. විකත්තා – මජසං.
4. කොලිත්ථියායො – මජසං. ස්‍යා.
5. අචරුං – මජසං
6 තිත්ථරූපා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4815. තමන්ගේ කර්මබලයෙන් ඉදිරිපත් කළ ඒ වැනි කුටකම් කරන්නාහට රැකෙන තැනක් නම් නැත. ඒ දරුණු පව්කම් ඇත්තාහු පව් රැස් කොට නරකයට යෙති. ඒ මේ නිරිසත්තු ගිලි බිලී ඇත්තෝ හොවිති යි කී.

4816. යමපල්ලන් විසින් කැපූ ශරීර ඇති පිළිකුල් මේ ස්ත්‍රීහු හිස අත් බැඳ ගෙන හඬති. ලේ සැරව තැවරුණු ශරීර ඇති වදබිමෙහි ගෙරින් මෙන් කැපූ ඔව්හු යපොළොවෙහි හැම කල්හි ඉගටිය පමණ ගැලුනාහු ගින්නෙන් දිලියෙන පර්වත වැනි යකඳන් ඉක්මවා පවතිත්.

4817. සාරථිය, මේ දැක්මෙන් මට භය උපදී. එම්බා දෙව සාරථිය, ඔබ විචාරමී. යපොළොවෙහි හැම කල්හි ඉහ තෙක් ගැලුණු ගිනිදැල් සහිත යම් ස්ත්‍රීහු යකඳන් ඉක්මැ පවත්නෝ ද මේ ස්ත්‍රීහු කිනම් පව්කම් කළාහු ද යි ඇසී.

4818. මෙසේ ඇසූ මාතලී දෙව්පුත් ඔහුට (නිමිරජුට) ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී.

4819. මේ මිනිස් ලොවැ අපිරිසුදු ක්‍රියා ඇති සමහර කුල ස්ත්‍රීහු අසංයත පරිදි ක්‍රියා කළහ. ධූර්ත සුවරූප ඇති ඔව්හු සිය සැමියා හැර පඤ්චකාම රති හා සෙසු ක්‍රීඩා පිණිස ද අන් සැමියන් හා සිත් පරිදි හැසුරුණාහ. ඔව්හු නිරයට පැමිණ ගිනිදැල් සහිත පර්වත වැනි යකඳන් ඉක්මවා පවතිත්.

4820. මේ සමහර කෙනකු පා අල්ලා හිස යටිකුරු කොට ගෙන නරකයෙහි හෙළන්නාහ. මාතලිය, මෙය දැක්මෙන් මට භය උපදී. එම්බා දේවසාරථිය, ඔබ විචාරමී. යම් මේ නිරිසත්තු හිස යටිකුරු කොට නරකයෙහි හෙළනු ලබද්ද ඒ මොව්හු මිනිස් වූවාහු කිනම් පාපකර්මයක් කළාහු ද යි ඇසී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4821. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4822. යෙ ජීවලොකස්මිං අසාධුකම්මිනො
පරස්ස දරානි අතික්කමන්ති,
තෙ තාදිසා උත්තමභණ්ඩථෙනා
තෙ මෙ ජනා අවංසිරා නරකෙ පාතයන්ති.

4123. තෙ වස්සපූගානි බහූනි තත්ථ
නිරයෙ දුක්ඛං වෙදනං වෙදයන්ති,
නහි පාපකාරිස්ස භවන්ති තාණා
සකෙහි කම්මෙහි පුරක්ඛතස්ස
තෙ ලුද්දකම්මා පසවෙත්වා පාපං.
තෙ මෙ ජනා අවංසිරා නරකෙ පාතයන්ති.

4824. උච්චාවචාමෙ විවිධා උපක්කමා
නිරයෙසු දිස්සන්ති සුසොරරූපා
භයං හි මං වින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලී දෙවසාරථී.
ඉමෙ නු මච්චා කිමකංසු පාපං
යෙ මෙ ජනා අධිමත්තා දුක්ඛා තිබ්බා
ඛරා කටුකා වෙදනා වෙදයන්ති.

4825. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පාපකම්මානං ජානං අක්ඛාසජානතො.

4826. යෙ ජීවලොකස්මිං සුපාපදිට්ඨිනො
විස්සාසකම්මානි කරොන්ති මොහා;
පරඤ්ච දිට්ඨිසු සමාදපෙන්ති
තෙ පාපදිට්ඨී පසවෙත්වා[1] පාපං
තෙ මෙ ජනා අධිමත්තා දුක්ඛා තිබ්බා
ඛරා කටුකා වෙදනා වෙදයන්ති.

4827. විදිතානි තෙ මහාරාජ ආවාසං පාපකම්මිනං,
ඨානානි ලුද්දකම්මානං දුස්සීලානඤ්ච යා ගති;
උය්‍යාහිදානි රාජිසි දෙවරාජස්ස සන්තිකෙ.

නිරයකණ්ඩං නිට්ඨිතං.

---

1. පසවෙත්වාන – ඉජ්ජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4821. මෙසේ ඇසූ මාතලී දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී:

4822. මිනිස් ලොවැ අයහපත් කර්ම ඇති යම් කෙනෙක් පරදාරාවන් කෙරෙහි ඉක්මවා හැසිරෙද්ද එවැන්නෝ උතුම් බුදු සොරකම් කරන්නෝ ය. නරකයට පැමිණි ඒ මේ නිරිසත්තු යටිකුරු හිස් දැත්තෝ වැ නරකයෙහි හෙළනු ලබති.

4823. ඒ නිරිසත්තු බොහෝ වර්ෂ සමූහයන් මුළුල්ලෙහි නරකයෙහි දුක් විඳිති. තමන්ගේ කර්ම බලයෙන් ඉදිරිපත් කළ පව්කරුවාට ආරක්ෂාවීමට ස්ථාන නැත. දරුණු පව්කම් කළ ඔවුහු පව් රැස් කොට නරකයට යති. ඒ මේ පව් කළ නිරිසත්තු හිස් යටිකුරු කොට නරකයට හෙළනු ලබත් ය යි කී.

4824. දරුණු සුළහාව ඇති කුඩා මහත් කුම්කටුලු නරකයෙහි පෙනේ. සාරථිය, මෙය දැක්මෙන් මට භය උපදී. එම්බා දේව සාරථිය, ඔබ විචාරම්. මේ නිරිසත්තු ඉතා තියුණු රළු කටුක වූ දුක් වේදනා විඳින්. මේ සත්ත්වයෝ කිනම් පව් කළාහු ද යි ඇසී.

4825. මෙසේ ඇසූ මාතලී දෙවිපුත් ඔහුට ප්‍රකාශ කෙළේ ය. පාපකර්ම විපාක දන්නා හෙ තෙම නො දන්නා නිමි රජුට මෙසේ කී:

4826. මේ මිනිස් ලොවැ ඉතා ලාමක දෘෂ්ටි ඇති මොහයෙන් විශ්වාසයට අනුව පව් කෙරෙද්ද අන්‍ය ජනයා ලවා ද මිථ්‍යාදෘෂ්ටිය සමාදන් කරවද්ද අධම දෘෂ්ටි ඇති ඔවුහු පව් රැස් කොට නරකයට යෙති. මේ නිරිසත්තු තියුණු රළු කටුක දුක් වේදනා විඳිති යි කී.

4827. මහරජ, පව්කම් කළ සතුන් වසන තැන් ද දරුණු පව්කම් කළ සතුන්ගේ උප්පත්තිස්ථානයෝ ද දුස්සීල සත්ත්වයන්ගේ උපදනා ස්ථානයෝ ද ඔබ විසින් දක්නා ලදහ. දේවයන් වහන්ස, දැන් (මේ නරකයෙහි දුක් දුටු ඉක්බිති) සක්දෙව් රජුහු ගේ දිව්‍යසම්පත් දක්නා පිණිස යනු මැනවි යි මාතලී කී.

නිරය කාණ්ඩය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4828. පඤ්චඞ්ගිකං දිස්සතිදං විමානං
මාලා පිළන්ධා සයනස්ස මත්ථකේ,
තත්ථච්ඡති නාරී මහානුභාවා
උච්චාවචං ඉද්ධිං විකුබ්බමානා.

4829. විත්තී හි මං විඳති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි,
අයං නු නාරී කිමකාසි සාධුං
යා මොදති සග්ගපත්තා විමානෙ.

4830. තස්ස පුට්ඨෝ වියාකාසි මාතලී දෙවසාරථි,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අකාසජානතෝ.

4831. යදි තෙ සුතා බීරණී ජීවලොකෙ
ආමාය දසී අහු බ්‍රාහ්මණස්ස,
සා පත්තකාලං අතිථිං විදිත්වා
මාතාව පුත්තං සකිමාභිනන්දි.
සඤ්ඤමා සංවිභාගා ච
සා විමානසමිං මොදති,

4832. දද්දල්ලමානා ආහෙනනි[1] විමානා සත්ත නිම්මිතා,
තත්ථ යකෙඛා මහිද්ධිකෝ සබ්බාභරණභූසිතෝ
සමන්තා අනුපරියාති නාරිගණපුරක්ඛතෝ.

4833. විත්තී හි මං විඳති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි,
අයං නු මච්චා කිමකාසි සාධුං
යො මොදති සග්ගපත්තෝ විමානෙ.

4834. තස්ස පුට්ඨෝ වියාකාසි මාතලී දෙවසාරථි,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අකාසජානතෝ.

4835. සොණුත්තරෝ ගහපති එස දානපති අහූ,
එස පබ්බජිතුද්දිස්ස විහාරෙ සත්ත කාරයි.

4836. සක්කච්චං තෙ උපට්ඨාසි භික්ඛවෝ තත්ථ වාසිකෙ,
අච්ඡාදනඤ්ච භත්තඤ්ච සෙනාසනපදීපියං;
අදාසි උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

4837. චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං[2]

---

1. ආහනති – මජ්ඣං.
2. අට්ඨඞ්ගං සුසමාහිතං – මජ්ඣං. සත්ත.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4828. කැරැලි පහක් ඇති මේ විමානය පෙනේ. එහි යහන මැද මාලා පැළඳ ගත් මහත් අනුභාසම්පන්න ස්ත්‍රියක් කුදුමහත් දිව්‍ය සෘද්ධීන් දක්වමින් හිඳී.

4829. සාරථිය, මෙය දැක්මෙන් මට සතුට උපදී. එම්බා දේව සාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණි යම් ස්ත්‍රියක් තුටු වෙයි ද මේ ස්ත්‍රී තොමෝ කිනම් යහපතක් කළා දැ යි ඇසී.

4830. නිමි රජු විසින් ඇසූ මාතලි දෙව්පුත් ඔහුට එය ප්‍රකාශ කෙළේ ය. පුණ්‍යකර්ම විපාක දත් හෙ තෙම නො දන්නා රජුට මෙසේ කී ය:

4831. ඉදින් මිනිස්ලොව බමුණකුගේ ගෘහදාසියක කුස උපන් සිරණී නමින් දාසියක් වූවා යැ යි ඔබ අසන ලද ද, ඕ ආගන්තුක සත්කාර දැන, දුර සිට ආ පුතු දැක්මෙන් එක්වර ම උපන් සතුටු ඇති මව මෙන් නිරතුරු සතුටින් උපස්ථාන කෙළේ ද සිල්වත් පරිත්‍යාග ගුණයෙන් යුත් ඕ තොමෝ මේ විමානයෙහි සතුටින් වෙසේ ය යි කී.

4832. මැවුණු දිලිසෙන විමාන සතක් බැබළෙති. එහි මහත් දෙව සෘඩි ඇති සියලු දෙව් අබරණින් සැරසුණු දිව්‍ය පුත්‍රයෙක් දිව්‍ය ස්ත්‍රී සමූහයා විසින් පිරිවරන ලද්දේ හාත්පසින් ඇවිදියි,

4833. සාරථිය, මෙය දැක්මෙන් මට සතුට උපදී. එම්බා දේවසාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණි යමෙක් මේ විමානයෙහි සතුටු වේ ද මේ සත්ත්ව තෙම කිනම් යහපතක් කෙළේ දැ යි ඇසී.

4834. නිමි රජු විසින් ඇසූ මාතලි දෙව්පුත් තෙමේ ඔහුට එය ප්‍රකාශ කෙළේ ය. පුණ්‍යකර්ම විපාක දත් හෙ තෙම නො දන්නා රජුට මෙසේ කී ය:

4835. මේ තෙමේ පෙර දානපති බැවිනි පිණිටා දන් දුන් සොණදින්න නම් ගහපති ය. මේ තෙම භික්ෂූන් ගේ ප්‍රයෝජනයට විහාර සතක් කැරැවී.

4836. එහි වැඩ වෙසෙන භික්ෂූන් වහන්සේට සකස් කොට උපස්ථාන කෙළේ ය. සෘජු වූ ගුණවත් භික්ෂූන් කෙරෙහි විශෙෂයෙන් පැහැදුණු සිතින් සිව්පස පිදුයේ ය.

4837. පක්ෂය සම්බන්ධ තුදුස්වක් පසළොස්වක් දිනයන්හි ද අටවක් දිනයෙහි ද පාටිහාරිය පක්ෂයෙහි ද අඛණ්ඩ අටකින් යුත් සිල් සමාදන් වැ,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4838. උපොසථං ච උපවසි සද සීලෙසු සංවුතො,
සංයමො සංවිභාගො ච සො විමානසමිං මොදති.

4839. පභාසති ඉදං ව්‍යමහං එළිකාසු සුනිම්මිතං.
නාරිවරගණාකිණ්ණං කූටාගාරවරොචිතං
උපෙතං අන්නපානෙහි නාවඝීතෙහි චූභයං.

4840. චිත්තී හි මං විඳති සූත දිසවා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
ඉමා නු නාරියො කිමකංසු සාධුං
යා මොදරෙ සග්ගපත්තා විමානෙ.

4841. තස්ස පුට්ඨා වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අකකාසජානතො.

4842. යා කාචී නාරියො ඉධ ජීවලොකෙ
සීලවතියෝ[1] උපාසිකා,
දනෙ රතා නිච්චපසන්නචිත්තා
සචෙච යීතා උපොසථෙ අපපමත්තා.
සංයමා සංවිභාගා ච තා විමානසමිං මොදරෙ.

4843. පභාසති ඉදං ව්‍යමහං වෙළුරියාසු නිම්මිතං,
උපෙතං භූම්භාගෙහි විහඤ්ඤං භාගසො මිතං.

4844. ආළම්බරා මුතිඞ්ගා ච නාවඝීතා සුවාදිතා,
දිබ්බා සද්දා නිච්චරන්ති සවණෙය්‍යා මනොරමා.

4845. නාහං එවං ගතං ජාතු එවං සුරුචිරං පුරෙ,
සද්දං සමභිජානාමි දිට්ඨං වා යදි වා සුතං.

4846. චිත්තී හි මං විඳති සූත දිසවා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
ඉමෙ නු මච්චා කිමකංසු සාධුං
යෙ මොදරෙ සග්ගපත්තා විමානෙ.

4847. තස්ස පුට්ඨා වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අකකාසජානතො.

4848. යෙ කෙචි මච්චා ඉධ ජීවලොකෙ සීලවන්තෙත්‍ථා උපායකා,
ආරාමෙ උදපානෙ ච පපා සඞ්ඝමනානි ච.
අරහන්තෙත්‍ථා සීතිභූතෙ[2] සඤ්ඤතෙ බ්‍රහ්මචාරිනෙ පටිපාදයුං.

---

1. සීලවන්තියෝ – මජ්ඣං.
2. භූතෙසු – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4838. හැම කල්හි සීල සංවරයෙන් යුත් වූයේ පෙහෙවස් ද විසූයේ ය. සිල් රැකි දන් දුන් හෙ තෙම මේ විමානයෙහි තුටු වේ.

4839. පළිහුවලින් මැනැවින් නිමැවුණු උතුම් ස්ත්‍රී සමූහයා ගැවසිගත් උතුම් කුළුගෙවලින් හෙබි ආහාරපානයෙන් ද නෘත්‍ය ගීතයෙන් ද යුත් මේ විමානය බබළයි.

4840. සාරථිය, මෙය දැක්මෙන් මට සතුට උපදී. එමබා දේවසාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණි යම් කෙනෙක් මේ විමානයෙහි සතුටු වෙද්ද මේ ස්ත්‍රීහු කිනම් යහපතක් කළාහු දැයි ඇසී ය.

4841. නිමි රජු විසින් ඇසූ මාතලි දෙවිපුත් තෙම ඔහුට එය ප්‍රකාශ කෙළේ ය. පුණ්‍යකර්ම විපාක දත් හෙ තෙම නො දන්නා රජුට මෙසේ කී ය:

4842. මේ මිනිස් ලොව යම්කිසි ස්ත්‍රී කෙනෙක් සිල්වත් උපාසිකාවෝ වූහු ද දීමෙහි ඇලුණු නිති පහන් සිතැති සත්‍යයෙහි පිහිටි පෙහෙවස් රැකීමෙහි නො පමා වූ ඔව්හු සිල් රක්කාහු ද දන සංවිභාගයෙහි ද ඇලුණු ඒ ස්ත්‍රීහු මේ විමානයෙහි සතුටු වෙත් යි කී ය.

4843. වෙරළුමිණි බිත්තිවලින් මනා කොට නිමැවුණු සිත්කලු භූමියෙන් යුත් ප්‍රමාණ වශයෙන් කොටස් කර බෙදූ මේ විමානය බබළයි.

4844. පණාබෙර ද (අළිහු බෙර) මීහිහු බෙර හා නෘත්‍යගීතයෝ ද මැනවින් වාදනය කැරුණු ඇසුමට සුදුසු සිත්කලු දිව්‍යශබ්ද නිකුත් කෙරෙති.

4845. මෙසේ ඉතා සිත්කලු බවට පැමිණි මනෝඥ වූ පෙනෙන ඇසෙන යම් රූපයක් හෝ ශබ්දයක් වේ නම් එබන්දක් මම කිසි කලෙක නුදුටු නැසූ විරිමි.

4846. සාරථිය, මෙය දැක මට සතුට උපදී. එමබා දේව සාරථි වූ මාතලි, තොප විචාරමි. සඞ්ගයට පැමිණි යම් කෙනෙක් මේ විමානයන්හි සතුටුවෙත් ද, මිනිස් වූ මොහු කවර නම් යහපතක් කළෝ ද?

4847. නිමි රජු විසින් ඇසූ මාතලි දේවසාරථි තෙම ඔහුට (මෙසේ) ප්‍රකාශ කෙළේ ය. පුණ්‍යකර්ම විපාක දත් හෙතෙම නොදන්නා රජුට මෙසේ කී ය.

4848. මේ මිනිස්ලොවැ යම් කිසි සිල්වත් උපාසක වූ මනුෂ්‍ය කෙනෙක් (කෙලෙස් ගිනි නිවීමෙන්) සිහිල් වූ රහතුන් උදෙසා අරම් ද ළින්පොකුණු ද පැන්හල් ද (දුර්ගමස්ථානයෙහි) සෙතුබඳ ද සකසා පිළියෙළ කොට දුන්නාහු ද,

4849. චීවරං පිණ්ඩපාතඤ්ච පඨචයං සයනාසනං,
අදංසු උජුභූතෙසු විපසන්නෙන චෙතසා.

4850. චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං,[1]

4851. උපොසථං උපවසුං සද සීලෙසු සංවුතා,
සඤ්ඤමා සංවිභාගා ච තෙ විමානස්මිං මොදරෙ.

4852. පභාසති ඉදං ව්‍යම්හං එළිකාසු සුනිම්මිතං,
නාරීවරගණාකිණ්ණං කූටාගාරවිරොචිතං.

4853. උපෙතං අන්නපානෙහි නච්චගීතෙහි වූභයං,
නජ්ජා ච අනුපරියාති නානාපුප්ඵූමායුතා.

4854. විත්ති හි මං විඳති සූත දිසවා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථි,
අයං නු මවෙවා කිමකාසි සාධුං
යො මොදති සග්ගපත්තො විමානෙ.

4855. තඤ්ච පුට්ඨා වියාකාසි මාතලි දෙවසාරථි,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අකඛාසජානතො.[2]

4856. කිම්බිලායං ගහපති එස දානපති අහූ,
ආරාමෙ උදපානෙ ච පපා සඞ්කමනානි ච.

4857. අරහන්තා සීනිහුතෙ සක්කච්චං පටිපාදයි,
චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං,
අදාසි උජුභූතෙසු විපසන්නෙන චෙතසා.

4858. චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං,

4859. උපොසථං උපවසි සද සීලෙසු සංවුතා,
සඤ්ඤමෙමා සංවිභාගා ච සො විමානස්මිං මොදති.

4860. පභාසති ඉදං ව්‍යම්හං එළිකාසු සුනිම්මිතං,
නාරීවරගණාකිණ්ණං කූටාගාරවරොචිතං.

4861. උපෙතං අන්නපානෙහි නච්චගීතෙහි වූභයං,
නජ්ජා ච අනුපරියාති නානාපුප්ඵූමායුතා.

---

1. සුසමාහිතං - මජ්ඣං.
2. අක්ඛාසි - මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4849. සෘජුප්‍රතිපත්ති ඇති රහතුන් කෙරෙහි සිවුරු ද පිඬුවා ද ගිලන්පස ද සෙනසුන් ද පහන් සිතින් දුන්නාහු ද,

4850–51. පඤ්ඤය සම්බන්ධී වූ තුදුස්වක් පසළොස්වක් අටවක් පොහෝ දිනයෙහි ද (එයට පෙරගමන් පසුගමන් විසින්) ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද අෂ්ටාඞ්ග සමන්වාගත වූ පෙහෙවස් වුසූහු ද, හැම කල්හි සීලයෙහි සංවර වූ ද සංයත වූ ද බඳ වැළඳුවා වූ ද ඔහු විමානයෙහි තුටු වෙත්.

4852. පිළිමිණියෙන් නිමවනලද කුළුගෙයින් බබළන වරඟන සමූහයෙන් ගැවැසීගත් මේ විමන බබළයි.

4853. මේ විමන ආහාරපානයෙන් ද නෘත්‍යගීතයෙන් ද යුක්ත වූයෙ යැ. නදියක් ද සිසාරා යෙයි, නොයෙක් මල්රුකින් යුක්ත යැ.

4854. සාරථිය, මෙය දැක මට සතුටු උපදි. දේවසාරථී මාතලිය තොප විචාරමි. යමෙක් සවර්ගයට පැමිණියේ විමානයෙහි තුටු වේ ද මේ මනුෂ්‍ය තෙම මනුෂ්‍ය වැ කවර පිනක් කෙළේ ද?

4855. ඔහු විසින් පුළුවුස්නාලද දේවසාරථී මාතලී දෙවිපුත් ප්‍රකාශ කෙළේ යැ. පින්කමිහි විපාක දන්නා හෙතෙම නො දන්නා රජුට මෙසේ කී යැ.

4856. තෙල ගෘහපති කිම්බිලායෙහි දනපතියෙක් වී. ආරාම ද ළින් පොකුණු ද පැන්හල් ද දුර්ගයෙහි සේතුබන්ධ ද (කෙලෙස් ගිනි නිවීමෙන්) සිහිල් වූ රහතුන් උදෙසා සකසා පිළියෙළ කොට දින.

4857. සිවුරු ද පිඬුවා ද ගිලන්පස ද සෙනසුන් ද පහන් සිතින් (කායවඞ්කාදි නැතියෙන්) අවඤ්ඤ වූ රහතුන් කෙරෙහි දින.

4858-59. පඤ්ඤය සම්බන්ධී වූ තුදුස්වක් පසළොස්වක් අටවක් පොහෝ දිනයෙහි ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද අෂ්ටාඞ්ග සමන්වාගත වූ පෙහෙවස් විසි. හැම කල්හි සීලයෙහි සංවර වූ සංයම වූ දන් දුන් හෙ තෙම විමන්හි තුටු වේ.

4860. පිළිමිණියෙන් නිමවනලද කුළුගෙයින් හෙබි උත්තම ස්ත්‍රී සමූහයා විසින් ගැවැසිගත් මෙ විමන බබළ යි.

4861. මේ විමන ආහාරපානයෙන් ද නෘත්‍යගීතයෙන් ද යුක්ත වූයේ යැ. නොයෙක් මල්රුකින් යුත් නදියක් ද සිසාරා යයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4862. රාජායතනා කපිත්ථා අම්බා සාලා ච ජම්බුයො,
තින්දුකා[1] ච පියාලා ච දුමා නිච්චඵලා බහූ.

4863. විත්ති හි මං චින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලී දෙවසාරථී,
අයං නු මච්චො කිමකාසි සාධුං
යො මොදති සග්ගපත්තො විමානෙ.

4864. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අක්ඛාසජානතො.

4865. මිථිලායං ගහපති එස දානපතී අහූ,
ආරාමෙ උදපානෙ ච පපා සඞ්කමනානි ච.
අරහන්තෙ සීතිභූතෙ[2] සක්කච්චං පටිපාදයි.

4866. චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං,
අදාසි උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

4867. චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං,[3]

4868. උපොසථං ච උපවසි සද සීලෙසු සංවුතො,
සඤ්ඤමො සංවිභාගො ච සො විමානස්මිං මොදති.

4869. පභාසති ඉදං ව්‍යම්හං චෙළුරියාසු නිම්මිතං,
උපෙතං භූමිභාගෙහි විභත්තං භාගසො මිතං.

4870. ආළම්බරා මුතිඞ්ගා ච නච්චගීතා සුවාදිතා,
දිබ්බා[4] සද්දා නිච්ඡරන්ති සවණෙය්‍යා මනොරමා.

4871. නාහං එවං ගතං ජාතු[5] එවං සුරුචිරං[6] පුරෙ,
සද්දං සමභිජානාමි දිට්ඨං වා යදි වා සුතං.

4872. විත්ති හි මං චින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
අයං නු මච්චො කිමකාසි සාධුං
යො මොදති සග්ගපත්තො විමානෙ.

---

1. කිණ්ඩුකා ච - මජසං.
2. සීතිභූතෙසු - මජසං.
3. සුසමාහිතං - මජසං.
4. දිබ්‍ය - මජසං.
5. ජාතං - මජසං,
6. සුරුචියං - මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4862. කිරිපලු යැ ගිවුළු යැ අඹ යැ සල් යැ දඹ යැ තිඹිරි යැ පියල් යැ යන නිතිපලඟත් රුක් බොහෝ වෙති.

4863. සාරථිය මෙය දකැ මට සතුටු උපදී. දේවසාරථි මාතලිය තොප විචාරමි. යමෙක් සුවර්ගයට පැමිණියේ විමානයෙහි තුටු වේ ද මෙ තෙම මනුෂ්‍ය වැ කවර පිනක් කෙළේ ද?

4864. ඔහු විසින් පුළුවුස්නාලද දෙවසාරථි මාතලි දෙවපුත් පැවැසි. පින්කමිහි විපාක දන්නා හෙ තෙම නො දන්නා රජුට මෙසේ කී:

4865. කෙල ගැහැවි ඒයුලුතුවර දනපති වී. අරම ද ළින් පොකුණු ද පැන්හල් ද දුර්ගයෙහි ඒදඩු පාලම ද සිහිල් වූ රහතුන් උදෙසා සකසා පිළියෙළ කොට දින.

4866. සිවුරු ද පිඬුවා ද ගිලන්පස ද සෙනසුන් ද පහන් සිතින් අවඛය වූ රහතුන් කෙරෙහි දින.

4867-68. පඤ්ඤය සමඛන්ධි වූ තුදුස්වක් පසළොස්වක් අටවක් පොහෝ දිනයෙහි ද ප්‍රාතිහාය්‍යපඤ්ඤයෙහි ද අෂ්ටාඞ්ග සමන්වාගත වූ පෙහෙවස් විසී. හැම කල්හි සීලයෙහි සංවර වූ සංයම වූ දන් දුන් හෙ තෙම විමන්හි තුටු වේ.

4869. වෙරළුමිණියෙන් නිමවනලද කොටස් විසින් පමණ කොට බෙදනලද භූමිභාගයෙන් යුත් මේ විමන වෙසෙසින් බබළයි.

4870. මැනැවින් වයනලද අළිහුබෙර ද (පණාබෙර) මිහිඟුබෙර ද නෘත්‍ය ගීතයෝ ද කන්කලු වූ මනරම් වූ දිව්‍යශබ්දයෝ නිකුත් කෙරෙති.

4871. මම පෙර කිසිකලෙකත් මෙසේ මනහර ශබ්දයක් ප්‍රත්‍යක්ෂයෙන් හෝ ශ්‍රැතියෙන් හෝ අසනලද යි නො දනිමි.

4872. සාරථිය මෙය දකැ මට සතුටු උපදී. දේවසාරථි මාතලිය, තොප විචාරමි. යමෙක් දෙවලොවට පැමිණියේ විමන්හි තුටු වේ ද මේ තෙම මිනිස් වැ කවර පිනක් කෙළේ ද?

4873. තස්ස පුට්ඨා වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අකඛාසජානතො.

4874. බාරාණසියං ගහපති එස දානපතී අහූ,
ආරාමෙ උදපානෙ ච පපා සඞ්ඝාමනානි ච.
අරහන්තා සීතිභූතෙ[1] සක්කච්චං පටිපාදයි.

4875. චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං,
අදාසි උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

4876. චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං,

4877. උපොසථං උපවසි සද සීලෙසු සංවුතො,
සඤ්ඤමො සංවිභාගො ච සො විමානසමිං මොදති.

4878. යථා උදයමාදිච්චා හොති ලොහිතකො මහා,
තථූපමං ඉදං ව්‍යාමහං ජාතරූපස්ස නිම්මිතං.

4879. විත්තී හි මං විඳති සූත දිසවා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
අයං නු මච්චෙහි කිමකාසි සාධුං
යො මොදති සඟහපත්තෙහි විමානෙ.

4880. තස්ස පුට්ඨා වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අකඛාසජානතො.

4881. සාවත්ථියං ගහපති එස දානපතී අහූ,
ආරාමෙ උදපානෙ ච පපා සඞ්ඝාමනානි ච.
අරහන්තා සීතිභූතෙ සක්කච්චං පටිපාදයි,

4882. චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං,
අදාසි උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

4883. චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරිය පක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.[2]

4884. උපොසථං උපවසි සද සීලෙසු සංවුතො,
සංයමො සංවිභාගො ච සො විමානසමිං මොදති.

4885. වෙහාසයාමෙ බහුකා ජාතරූපස්ස නිම්මිතා,
දද්දල්ලමානා ආහෙනසි විජ්ජුවබ්භාඝනන්තරෙ.

1. සීතිභූතෙසු – මජ්ඣං.
2. පුසමාහිතං – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4873. ඔහු විසින් පුළුවුස්නාලද දේවසාරථී මාතලි දෙවිපුත් පැවැසි. පින්කම්හි විපාක දන්නා හෙ තෙම නො දන්නා රජුට මෙසේ කී.

4874. (මහරජ) මෙ තෙම පෙර බරණැස දනපති වූ ගෘහපතියෙක් විය. හෙ තෙම ආරාම ද පැන් පොකුණු හා පැන්හල් ද දුර්ගයෙහි ඒදඬුපාලම් ද, සිහිල් වූ රහතුන් උදෙසා සකසා පිළියෙළ කොට දින.

4875. සිවුරු ද පිඬුවා ද ගිලන්පස ද සෙනසුන් ද පහන් සිතින් අවඬහා වූ රහතුන් කෙරෙහි දින.

4876–77. පඤ්ඤය සම්බන්ධි වූ තුදුස්වක් පසළොස්වක් අටවක් පොහෝ දිනයෙහි ද ප්‍රාතිහාර්‍යපඤ්ඤයෙහි ද අෂ්ටාඞ්ග සමන්වාගත වූ පෙහෙවස් විසි. හැමකල්හි සීලයෙහි සංවර වූ සංයම වූ දන් දුන් හෙ තෙම එමන්හි තුටු වේ.

4878. ලේවන් වැ මහත් වැ උදවන හිරු යම්සේ ද රනින් නිම වුණු මේ විමානය ද එසේ ය.

4879. සාරථිය, මෙය දැක්මෙන් මට සතුටු උපදී. එම්බා මාතලි නම් වූ දේවසාරථිය, තොප විචාරම්. සුවර්ගයට පැමිණියමෙක් මේ විමානයෙහි සතුටු වෙයි ද (මනුෂ්‍ය වූ) මේ සත්ත්ව තෙම කිනම් යහපතක් කෙළේ ද?

4880. ඔහු විසින් පුළුවුස්නාලද දේවසාරථී මාතලි දෙවිපුත් පැවැසි. පින්කම්හි විපාක දන්නා හෙ තෙම නො දන්නා රජුට මෙසේ කී.

4881. තෙල ගැහැවි සැවැත්නුවර දනපති වී. අරම් ද ළිං පොකුණු ද පැන්හල් ද දුර්ගයෙහි ඒදඬුපාලම් ද සිහිල් වූ රහතුන් උදෙසා සකසා පිළියෙළ කොට දින.

4882. සිවුරු ද පිඬුවා ද ගිලන්පස ද සෙනසුන් ද පහන් සිතින් අවඬහා වූ රහතුන් කෙරෙහි දින.

4883–84. පඤ්ඤය සම්බන්ධි වූ තුදුස්වක් පසළොස්වක් අටවක් පොහෝ දිනයන්හි ද ප්‍රාතිහාර්‍යපඤ්ඤයෙහි ද අෂ්ටාඞ්ග සමන්වාගත වූ පෙහෙවස් විසි. හැමකල්හි සීලයෙහි සංවර වූ සංයම වූ දන් දුන් හෙ තෙම විමන්හි තුටු වේ.

4885. රනින් නිමැවුණු අහසෙහි පිහිටි මේ බොහෝ විමානයෝ සත වලාකුළු අතුරෙහි විදුලිය සමූහයක් මෙන් දිලියෙමින් බබළති.

4886. විත්ති හි මං විඳති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
ඉමෙ නු මච්චා කිමකංසු සාධුං
යෙ මොදරෙ සඟපත්තා විමානෙ.

4887. තස්ස පුට්ඨො වියාකාසි මාතලි දෙවසාරථී,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අක්ඛාසජානතො.

4888. සද්ධාය සුනිවිට්ඨාය සද්ධම්මෙ සුප්පවෙදිතෙ,
අකංසු සත්ථුවචනං සම්මාසම්බුද්ධසාසනං;[1]
තෙසං එතානි ඨානානි යානි ත්වං රාජ පස්සසි.

4889. විදිතානි තෙ මහාරාජ ආවාසං පාපකම්මිනං,
අථො කල්‍යාණකම්මානං ඨානානි විදිතානි තෙ;
උය්‍යාභිදානි රාජිසි දෙවරාජස්ස සන්තිකෙ.

විමානකණ්ඩං නිට්ඨිතං.

4890. සහස්සයුත්තං හයවාහිං දිබ්බං යානං අධිට්ඨිතො,
යායමානො මහාරාජා අඤ්ඤ සීදන්තරෙ නගෙ;
දිස්වානාමන්තයී සූතං ඉමෙ කෙ නාම පබ්බතා.

4891. සුදස්සනො කරවීකො ඊසඩරො යුගන්ධරො,
නෙමින්ධරො විනතකො අස්සකණ්ණො ගිරිබ්‍රහා.

4892. එතෙ සීදන්තරෙ නගා අනුපුබ්බසමුග්ගතා,
මහාරාජානමාවාසා යානි ත්වං රාජ පස්සසි.

4893. අනෙකරූපං රුචිරං නානාචිත්‍රං පකාසති,
ආකිණ්ණං ඉන්දසදිසෙහි ව්‍යග්ඝෙහෙව සුරක්ඛිතං.[2]

4894. විත්ති හි මං විඳති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී,
ඉමං නු ද්වාරං කිමභිඤ්ඤමාහු
(මනොරමං දිස්සති දූරතොව.)[3]

---

1. සාසනෙ – මජසං.
2. සුරක්ඛිතා – මජසං.
3. (අයං පාඨො ස්‍යාමපොත්ථකෙ යෙව දිස්සති)

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4886. සාරථිය මෙය දැක්මෙන් මට සතුටු උපදී. එම්බා දේවසාරථිය ඔබ විචාරම්. දෙව්ලොවට පැමිණි යම් කෙනෙක් මේ විමන්හි සතුටු වෙද්ද මේ සත්ත්වයෝ මිනිස් වූවාහු කිනම් යහපතක් කළාහු ද යි ඇසී.

4887. (ඔහු විසින්) පුළුවුස්නාලද දේවසාරථි වූ මාතලි දෙව් පුත් ඔහුට පැවැසී. පින්කම්හි විපාක දන්නා හෙ තෙම නො දන්නා රජුට මෙසේ කී:

4888. මැනැවින් අවබෝධ කළ සද්ධර්මයෙහි මාර්ගසම්ප්‍රයුක්ත ශ්‍රද්ධාවෙන් මනා කොට පිහිටි ඒ කුලපුත්‍රයෝ සම්බුදුන්ගේ අනුශාසනය බුද්ධාවවාදය එසේ මැ කළහ. මහරජ යම් විමානයන් දක්නෙහි නම් තෙල ඔවුන්ගේ විමානයෝ ය.

4889. මහරජ ඔබ විසින් පළමු කොට පව්කම් කළවුන් වසන තැන් ද ඉන්පසු පින් කළවුන් වසන තැන් ද දක්නා ලදී. මහරජ දැන් සක්දෙව් රජු සමීපයට යනු මැනැවැයි (මාතලී දෙව්පුත් කී.)

විමාන කාණ්ඩය.

4890. දහසක් අසුන් විසින් උසුලන දිව්‍ය යානාරූඪ වැ ගමන් කරන නිමිරජ තෙම සීදන්ත සාගරයෙහි පර්වත දුටුයේ යැ. මොහු කිනම් පර්වතයෝ ද යි මාතලිහු ඇමැතී.

4891. සුදස්සන යැ කරවීක යැ ඊසධර යැ යුගන්ධර යැ නෙමින්ධර යැ විනතක යැ අස්සකණ්ණ යැ යන මොහු සප්තකුල පර්වතයෝ ය.

4892. මහරජ ඔබ යම් පර්වතයන් දක්නාහු ද පිළිවෙළින් උස් වැ පිහිටි මෙය සතරවරම් දෙව් මහරජදරුවන්ගේ වාසස්ථාන වන්නාහු සීදන්ත සමුද්‍ර පර්වතයෝ වෙත්.

4893. සිත්කලු නොයෙක් රත්නයෙන් විසිතුරු වූ සිංහ ව්‍යාඝ්‍රයන් අරක් ගත් වනයක් මෙන් ශක්‍රයාට බදු ප්‍රතිමාවෙන් ගැවසෙන්නක් වැ මේ පෙනෙන්නෝ කිනම් කෙනෙක් ද?

4894. සාරථිය, මෙය දැක්මෙන් මට සතුටු උපදී. එම්බා දේවසාරථිය, ඔබ විචාරම්. මේ දෙරටුව කිනමැ යි කියක් ද?

4895. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අක්ඛාසජානතො.

4896. චිත්තකූටොති යං ආහු දෙවරාජපවෙසනං,
සුදස්සනස්ස ගිරිනො ද්වාරං හෙතං පකාසති.

4897. අනෙකරූපං රුචිරං නානාචිත්‍රං පකාසති,
ආකිණ්ණං ඉන්දසදිසෙහි ව්‍යග්ඝෙහෙව සුරක්ඛිතං.
පවිසෙතෙන රාජිසි අරජං භූමිමක්කම.

4898. සහස්සයුත්තං හයවාහිං දිබ්බං යානං අධිට්ඨිතො,
යායමානො මහාරාජා අඤ්ඤ දෙවසභං ඉදං.

4899. යථා සරදෙ ආකාසො නීලොව පතිදිස්සති,
තථූපමං ඉදං ව්‍යම්හං වෙළුරියාසු නිම්මිතං.

4900. චිත්තී හි මං චින්දති සූත දිස්වා
පුච්ඡාමි තං මාතලි දෙවසාරථී;
ඉමං නු ව්‍යම්හං කිමභිඤ්ඤමාහු.

4901. තස්ස පුට්ඨො වියාකාසි මාතලී දෙවසාරථී,
විපාකං පුඤ්ඤකම්මානං ජානං අක්ඛාසජානතො.

4902. සුධම්මං ඉති යමාහු පස්සෙසා දිස්සතෙ සභා,
වෙළුරියා රුචිරා චිත්‍රා ධාරයන්ති සුනිම්මිතා.

4903. අට්ඨංසා සුකතා ථම්භා සබ්බෙ වෙළුරියාමයා,
යත්ථ දෙවා තාවතිංසා සබ්බෙ ඉන්දපුරොහිතා.

4904. අත්ථං දෙවමනුස්සානං චින්තයන්තා සමච්ඡරෙ,
පවිසෙතෙන රාජිසි දෙවානං අනුමොදනං.

4905. තං දෙවා පටිනන්දිංසු දිස්වා රාජානමාගතං,
ස්වාගතං තෙ මහාරාජ අථො තෙ අදුරාගතං.

4906. නිසිදදානි රාජිසි දෙවරාජස්ස සන්තිකෙ,
සක්කොපි පටිනන්දිත්ථ වෙදෙහං මිථිලග්ගහං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4895. ඔහු විසින් පුළුවුස්නාලද දේවසාරථී වූ මාතලී දෙවපුත් ප්‍රකාශ කෙළේ යැ. පින්කමහි විපාක දන්නා හෙතෙම නොදන්නා රජුට මෙසේ කී යැ:

4896. සක්දෙව් රජුගේ ඇතුළුවීම පිටවීම ඇති යමක් චිත්‍රකූට ය යි කියද්ද, සුදස්සන නමැති පර්වතයා ගේ තෙල දෙරටුව පෙනෙයි.

4897. සිත්කලු නොයෙක් රුවනින් විසිතුරු නොයෙක් දේව රූප ඇති, සිංහ ව්‍යාඝ්‍රයන් අරක් ගත් වනයක් මෙන් ශක්‍රයාට බඳු ප්‍රතිමාවෙන් ගැවසී ගත් මේ දෙව් නුවර දෙරටුව ය. මහරජ මේ දෙරටුවෙන් ඇතුළු නුවරට පිවිසෙන්නේ මැනවි. රජස් නැති (රන් පිදී මැණික් යන මෙයින් හා මලින් ගැවැසී ගත්) භූමිය දිව්‍ය රථයෙන් ඉක්මවනු මැනවැ යි කීය.

4898. දහසක් අසුන් විසින් උසුලන දිව්‍ය රථාරූඪ වැ යන නිමි රජ තෙම සුධර්මා නම් දිව්‍ය සභාව දිටී.

4899. සරත් කාලයෙහි නීලවර්ණ අහස යම්සේ පෙනේ ද, එ මෙන් මේ විමන වෛදූර්‍යමාණික්‍යයෙන් නිමවන ලද යැ.

4900. සාරථිය මෙය දැක්මෙන් මට සතුටු උපදී. එම්බා දේවසාරථිය, තොප විචාරමි. මේ විමානය කිනමැයි කියත් ද?

4901. ඔහු විසින් පුළුවුස්නාලද දේවසාරථී මාතලී දෙවපුත් ප්‍රකාශ කෙළේ යැ. පින්කමහි විපාක දන්නා හෙතෙම නොදන්නා රජුට මෙසේ කී යැ.

4902. සුධර්මා දිව්‍ය සභාව යයි යමක් පැවැසූ ද මෙය බලනු මැනවි. වෛදූර්‍යයෙන් කරනලද නොයෙක් රත්නයෙන් විසිතුරු වූ මනාව නිමැවුණු මේ සභාව පෙනේ.

4903. අටැස් වූ මැනැවින් කැරුණු සියල්ල වෙරළුම්ණිමුවා ස්තම්භයෝ එය උසුලති. යම් සභාවක සක්දෙව් රජ ප්‍රධාන කොට ඇති තව්තිසා වැසි සියලු දෙවියෝ—

4904. දෙව්මිනිසුන්ගේ යහපත සිතන්නාහු එක් රැස් වැ හිඳිද්ද මහරජ මේ මගින් දෙවියන් ඔවුනොවුන් තුටුවන තැනට පිවිසෙනු මැනවැයි මාතලී දෙවපුත් කී.

4905. එහි පැමිණි ඒ නිමි රජු දැක දෙවියෝ සතුටු වූහ. මහරජ ඔබගේ පැමිණීම ඉතා යහපති. තවද අයහපත් පැමිණීමක් නම් නො වේ.

4906. මහරජ දැන් සක්දෙව් සමීපයෙහි හුන මැනවි. මියුලු නුවර වාසස්ථාන කොට ඇති වේදේහ රජු දැක සක්දෙව් රජ ද සතුටු විය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4907. නිමන්තයි ච[1] කාමෙහි ආසනෙන ච වාසවෝ,
සාධු බොසි අනුපපන්නෝ ආවාසං වසවත්තිනං.

4908. වස දෙවෙසු රාජිසි සබ්බකාමසමිද්ධිසු,
තාවතිංසෙසු දෙවෙසු භුඤ්ජ කාමෙ අමානුසෙ.

4909. යථා යාවතකං යානං යථා යාවතකං ධනං,
එවං සම්පදමෙවෙතං යං පරතෝ දානපච්චයා.

4910. නවාහමෙතං ඉච්ඡාමි යං පරතෝ දානපච්චයා,
සයං කතානි පුඤ්ඤානි තං මේ ආවෙණියං ධනං.

4911. සොහං ගන්ත්වා මනුස්සෙසු කාහාමි කුසලං බහුං,
දානෙන සමචරියාය සංයමෙන දමෙන ච;
යං කත්වා සුඛිතෝ හොති න ච පච්ඡානුතපති.

4912. බහූපකාරෝ නෝ භවං මාතලී දෙවසාරථී,
යෝ මෙ කල්‍යාණකම්මානං පාපානි[2] පටිදස්සයි.

4913. ඉදං වත්වා නිමිරාජා වෙදෙහෝ මිථිලග්ගහෝ,
පුථුයඤ්ඤං යජිත්වාන සඤ්ඤමං අජ්ඣුපාගමීති.

නිමිජාතකං චතුත්ථං.

1. නිමන්තයිත්ථ - මජ්ඣං.
2. පාපානං පච්චදස්සයි - මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4907. සක්දෙව් රජ කම්සැපකින් හා අස්නෙන් ද නිමිරජහු පැවැරී ය. දෙවියන් වෙසෙන තැනට ඔබගේ පැමිණීම ඉතා යහපත් ය.

4908. සියලු කම්සැපතින් සමෘද්ධ වූ දෙවලොවැ වාසය කළ මැනවි. තව්තිසා වැසි දෙවියන් කෙරෙහි වූ මිනිසුන් පිළිබඳ නොවූ කාමසම්පත් අනුභව කළ මැනවැ යි කී.

4909. අනුන්ගෙන් ඉල්වා ගත් යානාවක් යම්සේ ද අනුන් ගෙන් ඉල්වා ගත් ධනයක් යම්සේ ද මෙරමාගේ දනප්‍රත්‍යයෙන් ලද යමක් ඇත් නම් එද එසේ ම ය, හෙවත් පිරුවට වශයෙන් ලැබූ දෙය වැනි ය.

4910. මෙරමාගේ දනප්‍රත්‍යයෙන් ලද යමක් ඇද්ද එය මම නොකැමැත්තෙමි. මා කළ යම් පුණ්‍යකර්මයෝ ඇද්ද ඒ මාගේ ආවෙණික ධනය යි.

4911. ඒ මම ගොස් මිනිසුන් කෙරෙහි තුන්දෙරින් සම වැ හැසිරීමෙන් ද සිල් රැකීමෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද යමක් කොට සුවපත්වේ ද නොපසුතැවේ ද එබඳු බොහෝ කුසල් දහම් කරන්නෙමි.

4912. යමෙක් පින් කළ සත්ත්වයන් වසන තැන් ද පව් කළ සත්ත්වයන් වසන තැන් ද මට පෙන්වී ද ඒ පින්වත් මාතලි නමැති දේවසාරථි තෙම අපට බොහෝ උපකාර ඇත්තෙකැ යි නිමි රජ ඔහු පැසැසී ය.

4913. මියුලු තුවර වාසස්ථාන කොට ඇති විදේහ රටට අයිපති වූ නිමි රජ මෙය කියා (හෙවත් 'උත්තමඞ්ගරුහාමයහං' යන ආදි මේ ගාථාව කියා) බොහෝ දන් දී සීලසංයමයට පැමිණියේ ය යි වදළහ.

යතරවන නිමි ජාතකය නිමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5. ඛණ්ඩහාලජාතකං.

4914. රාජාසි ලුද්දකමෙමා[1] එකරාජාති පුච්ඡථියා,[2]
සෝ පුච්ඡි බ්‍රහ්මබන්ධුං ඛණ්ඩහාලං පුරොහිතං මූළ්හං.

4915. සග්ගානමග්ගමාචික්ඛ භවංසි බ්‍රාහ්මණ ධම්මවිනයකුසලෝ,
යථා ඉතෝ වජන්හි සුගතිං නරා පූසුඤ්ඤුනි කත්වාන.

4916. අනිදනං දදිත්වාන[3] අවජේකා දෙව සාතෙත්වා,
එවං වජන්හි සුගතිං නරා පූසුඤ්ඤුනි කත්වාන.

4917. කිං පන තං[4] අනිදනං කෙ ච අවජ්කා ඉමිසමිං ලොකසමිං,
එතඤ්ච ඛෝ තෙ අකකාහි යජිස්සාම දදම දනානි.

4918. පුත්තෙහි දෙව යජිතබ්බං මහෙසීහි නෙගමෙහි ච උසභෙහි,
ආජානීයෙහි වතූහි සබ්බවතුක්කෙන දෙව යජිතබ්බං.

4919. තං සුත්වා අනොතපුරෙ කුමාරා ච මහෙසියො ච භඤ්ඤුත්තු,
එකො අහොසි නිගෙයාසො හෙස්මා[5] අවබුග්ගතො සඬ්ඪ.

4920. ගච්ඡථ වදෙථ කුමාරෙ චන්දං සුරියං ච භද්දසෙනඤ්ච,
සූරඤ්ච වාමගොත්තං පසුරා[6] කිර හොථ යඤ්ඤත්ථාය.

4921. කුමාරියොපි වදෙථ උපසෙනිං[7] කොකිලඤ්ච මුදිතඤ්ච,
නන්දඤ්චාපි කුමාරිං පසුරා කිර හොථ යඤ්ඤිත්ථාය.

4922. විජයම්පි මයඤ්ච මහෙසිං එරාවතිං කෙසිනිං සුනන්දඤ්ච,
ලක්ඛණවරූපපන්නා පසුරා කිර හොථ යඤ්ඤිත්ථාය.

4923. ගහපතයොපි වදෙථ පුණ්ණමුඛං භද්දියං සිගාලඤ්ච,
වඩ්ඪඤ්චාපි ගහපතිං පසුරා කිර හොථ යඤ්ඤිත්ථාය.

---

1. ලුද්දකසොසි – මජ්ඣං.
2. පුපථවිනියායං – මජ්ඣං. සය්හ. ච්.
3. දදත්වාන – මජ්ඣං.
4. පනෙතං – මජ්ඣං. සය්හ. ච්.
5. හිංසා – මජ්ඣං.
6. පවූරා – මජ්ඣං.
7. උපසෙනං – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5. ඛණ්ඩහාල ජාතකය

4914. පෙරැ පුෂ්පවතී නම් නුවරැ රුදුරු පාපකර්ම ඇති ඒකරාජ ය යි ප්‍රසිද්ධ රජෙක් විය. හෙ තෙම ඛණ්ඩහාල නම් මූඪ වූ පෙරෙවි බමුණාගෙන් ඇසී ය.

4915. එම්බා බ්‍රාහ්මණය, නුඹ සුචරිත ධර්මයෙහි ද, ආචාර විනයෙහි ද දක්ෂ වෙහි. යම්සේ සත්ත්වයෝ කුසල් කිරීමෙන් මෙ ලොවින් චුත වැ සුගතියට පැමිණෙද්ද, එසේ යන සුගති මාර්ගය මට කියව යි රජ තෙම කීය.

4916. මහරජ, අතිදන නම් දන් දී නො නැසිය යුත්තන් නැසීමෙන් මෙසේ සත්ත්වයෝ සුගතියට යෙති යි පෙරෙවි බමුණා කීය.

4917. ඒ අතිදන නම් කිම? මෙ ලොවැ නො නැසිය යුත්තෝ කවුරු ද? මෙය ද අපට කියනු මැන. යාග කරම්හ දන් දෙම්හ යි රජ පැවැසී.

4918. මහරජ, පුත්‍රයෝ යැ, බිසෝවරු යැ, සිටුවරු යැ, වෘෂභයෝ යැ, ආජානීය අශ්වයෝ යැ යන මොවුන්ගෙන් සතර දෙනකු බැගින් ගෙන යාග කළ මැනවි. මහරජ, සබ්බචතුක්කය නමැති යාගය කළයුතු ය යි පෙරෙවි බමුණා කී ය.

4919. (රාජකුමාරවරු ද, බිසෝවරු ද නසනු ලබත්වා යන) ඒ හඬ ඇසීමෙන් අන්තඃපුරයෙහි උස් වැ නැගුණු බිහිසුණු හඬින් යුත් එක ම සෝෂාවක් විය.

4920. යව, වඤ්ඣ කුමාරයා ද, සූරිය කුමාරයා ද, හඤ්ඤසේන කුමාරයා ද, වාමගොත්‍ත කුමාරයා ද, සුර කුමාරයා ද යන රාජ කුමාරයන්ට යාගයට එක්තැන් වැ රැස් වන්නට කියව යි රජ අණ කෙළේ ය.

4921. උපසේනී යැ, කෝකිලා යැ, මුදිතා යැ, නන්දකුමාරි යැ යන රාජකුමාරිකාවන්ට ද යාගයට එක්තැන් වැ රැස්වන්නට කියව යි රජ අණ කෙළේ ය.

4922. මගේ විජයා නම් මෙහෙසිය ද, එරාවතී ද, කෙසිනී ද, සුනන්දා ද යන උතුම් ස්ත්‍රීලක්ෂණයෙන් යුත් වූ මෙහෙසිවරුන්ට ද යාගයට එක්තැන් වැ රැස්වන්නට කියව යි රජ අණ කෙළේ ය.

4923. පුණ්ණමුඛ යැ, භද්දිය යැ, සිගාල යැ, වඩ්ඪ නම් ගහපති යැ යන සිටුවරුන්ට ද යාගයට එක්තැන් වැ රැස්වන්නට කියව යි රජ අණ කෙළේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4924. තෙ තත්ථ ගහපතයො අවොචිංසු සමාගතා පුත්තදර පරිකිණ්ණා,
සබ්බසිබිනො දෙව කරොහි අථවා නො දසෙ සාවෙහි.

4925. අභයඩ්කරම්පි මෙ හත්ථිං නාලාගිරිං අච්චුතං වරුණදන්තං,
ආනෙථ ඛො නෙ ඛිප්පං යඤ්ඤත්ථාය භවිස්සන්ති.

4926. අස්සරතනම්පි කෙසිං සුරාමුඛං පුණ්ණකං විනතකඤ්ච,
ආනෙථ ඛො නෙ ඛිප්පං යඤ්ඤත්ථාය භවිස්සන්ති.

4927. උසභම්පි යූථපතිං අනොජං නිසභං ගවම්පතිං
තෙපි මය්හං ආනෙථ,
සමුපාකරොන්තු සබ්බං යජිස්සාම දදම දනානි.

4928. සබ්බං පටියාදෙථ යඤ්ඤං පන උග්ගතම්හි සුරියම්හි,
ආණාපෙථ ච කුමාරෙ[1] අභිරමන්තු ඉමං රත්තිං.

4929. සබ්බං උපට්ඨපෙථ යඤ්ඤං පන උග්ගතම්හි සුරියම්හි,
වදෙථදනි කුමාරෙ අජ්ජ වො පවජිමා රත්ති.

4930. තං තං මාතා අවචා රොදන්ති ආගතා[2] විමානතො,
යඤ්ඤෙ කිර තෙ පුත්ත භවිස්සති චතූහි පුත්තෙහි.

4931. සබ්බෙපි මය්හං පුත්තා චත්තා චන්දස්මිං හඤ්ඤමානස්මිං,
පුත්තෙහි යඤ්ඤං යජිත්වාන සුගතිං සග්ගං ගමිස්සාමි.

4932. මා[3] පුත්ත සද්දහෙසි සුගති කිර හොති පුත්තයඤ්ඤෙන,
නිරයානෙසො මග්ගො නෙසො මග්ගො හි සග්ගානං.

4933. දනානි දෙහි කොණ්ඩඤ්ඤ අහිංසා සබ්බභූතභව්‍යානං,
එසමග්ගො සුගතියා න ච මග්ගො පුත්තයඤ්ඤෙන.

4934. ආචරියානං වචනා සාතෙස්සං චන්දඤ්ච සුරියඤ්ච,
පුත්තෙහි යජිත්වාන දුච්චජෙහි සුගතිං සග්ගං ගමිස්සාමි.

---

1. අණාපෙථචන්දකුමාරෙ – මජසං.
2. ආගන්ත්වා – මජසං.
3. මා තං – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4924. එහි රැස්වූ අඹුදරුවන් පිරිවැරූ ගෘහපතියෝ රජුට මෙසේ කීහ: මහරජ, අප සියල්ලන් හිස්මුදුනෙහි සිළු තබා දස-භාවයට පත් කළ මැනවි නොහොත් මහ පිරිස් මැදූ අප දසයන් කොට අස්වනු මැනවි.

4925. අභයඩ්කර යැ, නාලාගිරි යැ, අච්චුත යැ වරුණදන්ත යැ යන ඇතුන් වහා ගෙනෙවු. ඔහු යාගය පිණිස වන්නාහ.

4926. කේසී යැ, සුරාමුඛ යැ, පුණ්ණක යැ, විනතක යැ යන අශ්වරත්නයන් ද වහා ගෙනෙවු. ඒ අශ්වයෝ යාගය පිණිස වන්නාහ.

4927. යූථපති යැ, අනොජ යැ, නිසභ යැ, ගවම්පති යැ යන මාගේ වෘෂභයන් ද ගෙනෙවු. මා කියූ මේ සියල්ල යාගයට රැස් කෙරෙත්වා. යාග කරන්නෙමු. දන් දෙන්නෙමු.

4928. සියල්ල පිළියෙළ කරවු. හිරු උදා වූ කල යාග කරන්නෙමු. මේ රාත්‍රිය අභිරමණය කරත්වා යි ද කුමාරයන්ට අණ කරවු.

4329. සියල්ල සපයවු, යාගය වනාහි හිරු උදා වූ කල උදයෙහි මැ කරන්නෙම් අද තොපගේ අවසන් රාත්‍රිය යි දැන් රජ කුමරුවන්ට කියවයි රජ තෙම කී.

4930. තමන් හුන් විමනින් ආ රජුගේ මෑණියෝ හඬමින් ඒ රජුට මෙසේ පැවැසූහ. එම්බා පුත, තොපගේ සිවුපුතුන් ගෙන කරන යාගයක් ඇද්දැ යි ඇසූ.

4931. චන්ද්‍ර කුමාරයා නසනු ලබන කල මාගේ සියලු මැ පුත්තු යාගයට හරන ලද්දහු වෙති. පුතුන්ගෙන් යාග කොට සුගති නම් වන දෙව්ලොවට යන්නෙමි යි රජ තෙම කීය.

4932. එම්බා පුත, දරුවන් මරා යාග කිරීමෙන් සුගති ලාභයක් වේ යැ යි නො අදහව. සතර අපායට මේ මඟ වේ. මේ සග මඟ නො වේ.

4933. කොණ්ඩඤ්ඤ නමැති ගෝත්‍ර යුත් පුත, දන් දෙව. ඉපැදුණා වූ ද, උපදින්නා වූ ද හැම සතුන්ට අහිංසා කරව. මෙය සග මඟ වේ. දරුවන් මැරීමෙන් කරන යාගයෙන් සගට යන මගක් නැත.

4934. මෑණියනි, පෙරෙවි බමුණාගේ වචනයෙන් චන්ද්‍ර කුමාරයා සහ සූරිය කුමාරයා ද නසන්නෙම්. හැරිය නො හැකි පුතුන්ගෙන් යාග කොටැ සුගති නමැති දෙව්ලොවට යන්නෙමි යි රජ තෙම කී ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4935. තං තං පිතාපි අවච වසවත්තී ඔරසං සකං පුත්තං,
යඤ්ඤං කිර තෙ පුත්ත භවිස්සති චතූහි පුත්තෙහි.

4936. සඛෙඛපි මඤ්ඤං පුත්තා වත්තා වදසමිං හඤ්ඤමානසමිං,
පුත්තෙහි යඤ්ඤං යජිත්වාන සුගතිං සගගං ගමිස්සාමි.

4937. මා පුත්ත සද්දහෙසි සුගතිං කිර හොති පුත්තයඤ්ඤෙන,
නිරයානෙසො මඤ්ඤා නෙසො මඤ්ඤා සඤ්ඤානං.

4938. දනානි දෙහි කොණ්ඩඤ්ඤ අහිංසා සබ්බභූතභව්‍යානං,
එසමඤ්ඤා සුගතියා න ච මඤ්ඤා පුත්තයඤ්ඤෙන.

4939. ආචරියානං වචනා සාතෙය්‍යං චඳං ච සූරියඤ්ච,
පුත්තෙහි යජිත්වා දුච්චජෙහි සුගතිං සඤ්ඤං ගමිස්සාමි.

4940. දනානි දෙහි කොණ්ඩඤ්ඤ අහිංසා සබ්බභූතභව්‍යානං,
පුත්තපරිවුතො කුවං රට්ඨං ජනපදඤ්ච පාලෙහි.

4941. මා නො දෙව අවධි දසෙ නො දෙහි බණ්ඩභාලස්ස,
අපි නිගළ[1]බන්ධකාපි හත්ථී අසෙස්ස ව පාලෙම.

4942. මා නො දෙව අවධි දසෙ නො දෙහි බණ්ඩභාලස්ස,
අපි නිගළබන්ධකාපි හත්ථිවජකණ්ණානි උපෙක්ඛම.

4943. මා නො දෙව අවධි දසෙ නො දෙහි බණ්ඩභාලස්ස,
අපි නිගළබන්ධකාපි අස්සවජකණ්ණානි උපෙක්ඛම.

4944. මා නො දෙව අවධි දසෙ නො දෙහි බණ්ඩභාලස්ස,
යස්ස හොනති තව කාමා අපි රට්ඨා පබ්බජිතා
භික්ඛාචරියං චරිස්සාම.

4945. දුක්ඛං බොමෙ ජනයථ විලපන්තා ජීවිතස්ස කාමා හි,
මුඤ්චථදනි කුමාරෙ අලම්පි මෙ හොතු පුත්තයඤ්ඤෙන.

---

1. නිගඝළ – මජ්ඣං.
1. නිගඝළ – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4935. ඉක්ඛිති රජුගේ වසවර්ති නම් පියරජ තෙමේ ද උරද පුත් ඒ මේ රජුට එම්බා පුත, දරුවන් සිව්දෙනා ඔරා කරන යාගයක් වේ දැ යි කී.

4936. චන්ද්‍ර කුමාරයා නසනු ලබන කල්හි මාගේ සියලු මැ පුත්තු හරන ලද්දහු වෙති. පුතුන්ගෙන් යාග කොට සුගති සඞ්ඛ්‍යාත දෙව්ලොවට යන්නෙමි යි රජතෙම කී.

4937. එම්බා පුතණුවනි, දරුවන් මරා යාග කිරීමෙන් සුගති ලාභයෙක් වේ යැ යි නො අදහව්. සතර අපායට මේ මහ වෙයි. මේ සවර්ගයට මහ නො වෙයි.

4938. කොණ්ඩඤ්ඤය, දන්දෙව. උපන්නා වූ ද මතු උපදනා වූ ද හැම සත්නට අහිංසා කරව. මේ සුගතියට මාර්ග යැ. පුත්‍ර යාගයෙන් සවර්ග මාර්ග නො වේ.

4939. ආචාර්‍යයන්ගේ වචනයෙන් චන්ද්‍ර කුමරු ද සූර්‍යකුමරු ද සාතන කරවන්නෙමි. හරනට දුෂ්කර වූ පුතුන්ගෙන් යාග කොට සුඳුර ගති ඇති සවර්ගයට යන්නෙමි.

4940. කොණ්ඩඤ්ඤ ගෝත්‍ර ඇති පුත, දන්දෙව, හැම සතුන්හට හිංසා නො කරනු. පුත්‍රයන් පිරිවැරූ නුඹ සියලු කසිරට ද, ජනපද ද, රඤ්ඤා කරන්නැ යි වසවර්ති නමැති පියරජ තෙම කී.

4941. දේවයන් වහන්ස, අප නො නැසුව මැනැවි. බණ්ඩහාල නම් පෙරෙවි බමුණාහට අප දසභාවයට පත්කොටැ දුන මැනවි. හැකිල්ලෙන් බැඳුණු අපි ඇතුන් ද, අසුන් ද රැක බලා ගනිමු.

4942. දේවයන් වහන්ස, අපි නො නැසුව මැනවි. බණ්ඩහාල නම් පෙරෙවි බමුණාහට අප දස භාවයට පත්කොටැ දුන මැනවි. හැකිල්ලෙන් බැඳුණු අපි ඇත් වසුරු බැහැර දමන්නෙමු.

4943. දේවයන් වහන්ස, අප නො නැසුව මැනවි. බණ්ඩහාල නම් පෙරෙවි බමුණාහට අප දස භාවයට පත්කොටැ දුන මැනවි. හැකිල්ලෙන් බැඳුණු අපි අස් වසුරු බැහැර දමන්නෙමු.

4944. දේවයන් වහන්ස, අප නො නැසුව මැනව. යමකුහට දෙන්නට ඔබ කැමැති වෙත් නම් ඔහුට අප දසභාවයට පත්කොට දෙනු මැනවි. ඉදින් අප දෙසක් වේ නම් රටින් පිටුවහල් කරන ලද අපි බැගෑ වැ පිඬු සිහා හැසිරීමෙන් ජීවත් වන්නෙමු.

4945. ජීවිතයට ආසාවෙන් වැලැපෙන්නාහු මට දුක් උපදවන්නාහුය. දන් කුමාරයන් මුදා හරිනු මැනවි. දරුවන් මරා කරන යාගයෙන් මට ප්‍රයෝජන නැතැ යි රජ කී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4946. පුබ්බෙව ඛොසි මෙ වුත්තො දුක්කරං දුරභිසම්භවං චෙතං,
අථ නො උපක්ඛටස්ස යඤ්ඤස්ස කස්මා කරොසි වික්ඛෙපං.

4947. සබ්බෙ වජන්ති සුගතිං[1] යෙ යජන්ති යෙපි චෙව යාජෙන්ති,
යෙචාපි අනුමොදන්ති යජන්තානං එදිසං මහායඤ්ඤං.

4948. අථ කිස්ස ච නො පුබ්බෙ සොත්ථානං බ්‍රාහ්මණො අවාචෙසි,[2]
අථ නො අකාරණස්මා යඤ්ඤත්ථාය දෙව ඝාතෙසි.

4949. පුබ්බෙව නො දහරකෙ සමානෙ න හනෙසි න ඝාතයෙසි,
දහරම්හා යොබ්බනං පත්තා අදූසකා තාත හඤ්ඤුම.

4950. හත්ථිගතෙ අස්සගතෙ සන්නද්ධෙ පස්ස නො මහාරාජ,
යුද්ධෙව යුජ්ඣමානෙ නහි මාදිසා සූරා හොන්ති යඤ්ඤත්ථාය.

4951. පච්චන්තෙ වාපි කුපිතෙ අටවීසු වා මාදිසෙ නියොජෙන්ති,
අථ නො අකාරණස්මා අභූමියං තාත හඤ්ඤුම.

4952. යාපි හි තා සකුණියො වසන්ති තිණසරානි කත්වාන;
තාසම්පි පියා පුත්තා අථ නො ත්වං දෙව ඝාතෙසි.

4953. මා තස්ස[3] සද්දහෙසි න මං ඛණ්ඩහාලො ඝාතයෙ,
මමං හි සො ඝාතෙත්වා අනන්තරං තම්පි දෙව ඝාතෙය්‍ය.

4954. ගාමවරං නිගමවරං දදන්ති භොගං පිස්ස මහාරාජ,
අථ අග්ගපිණ්ඩිකාපි කුලෙ කුලෙහෙතෙ භුඤ්ජන්ති.

4955. තෙසම්පි තාදිසානං ඉච්ඡන්ති දුබ්භිතුං මහාරාජ,
යෙභුය්‍යෙන එතෙ අකතඤ්ඤුනො බ්‍රාහ්මණා දෙව.

4956. මා නො දෙව අවධි දූසෙ නො දෙහි ඛණ්ඩහාලස්ස,
අපි නිගළබන්ධකාපි[4] හත්ථි අස්සෙ ච පාලෙම.

---

1. සුගගති – මජසං.
2. අථවාචෙසි – මජසං.
3. බවස්ස – මජසං.ස්‍යා.
4. නිගගළ – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4946. මහරජ, මේ යාගය කළ නො හැකි යැ යි ද දුකසේ ලැබිය හැක්කැ යි ද පළමු කොට කියන ලද්දෙහි. දැන් අප පිළියෙළ කළ යාගයට හානි කෙරෙහි.

4947. යම් කෙනෙක් යාග කෙරෙද්ද, කරවද්ද යාග කරන්නවුන්ගේ එ වැනි මහා යාගය යම් කෙනෙක් අනුමෝදන් වෙද්ද ඒ සියලු දෙනා ම සුගතියට යෙති යි පෙරෙව් බමුණා කීය.

4948. පියාණෙනි, මෙසේ නම් පෙරෙවි බමුණු තෙම කවර හෙයින් අපගේ සුවපත් බව කීයේ ද, එසේ ඇති කල්හි කවර හෙයින් යාගයට නිකරුණේ අප මරවන්නෙහි ද?

4949. අප බාල කාලයෙහි නො නැසුවෙහි ය, නො මැරවූවෙහි ය. අපි තරුණ වයසට පැමිණියෝ වෙමු. මේ දක්වා ද විරුද්ධ නො වූවෝ වෙමු. පියාණෙනි, එ වැනි අපි තොප විසින් කවර හෙයින් මරනු ලබන්නෝ වෙමු ද?

4950. මහරජ, ඇතුන් අසුන් පිට නැග කරන යුද්ධයක් පැමිණි කලැ යුද්ධයට සැරසුණු අප සතර දෙන කරන යුද්ධ බලනු මැනවි. අප වැනි ශූරයෝ යාගයට නුසුදුස්සෝ ය.

4951. පියාණෙනි, ප්‍රත්‍යන්ත ජනපදය කිපුණු කල හෝ පල් හොරුන් ඇති කල හෝ සතුරන් නසනු පිණිස අප වැන්නන් යොදවත්. එසේ නම් නිකරුණේ නො තැන්හි කවර හෙයින් අපි නසනු ලබන්නෝ වෙමු ද?

4952. මහරජ, යම් ඒ පක්ෂීහු තණකැදලි සාද එහි වෙසෙද්ද ඒ පක්ෂීන්ට පවා දරුපැටවු ප්‍රිය වෙති. දේවයන් වහන්ස, එසේ ඇති කල තෙපි අප මරවන්නහු ය.

4953. බණ්ඩභාල නමැති පෙරෙවි බමුණු මා නො මරවයි යන මේ බසක් ඇත් නම් ඔහුගේ ඒ වචනය විශ්වාස නො කළ මැනවි. දේවයන් වහන්ස, හෙතෙම මා මරවා ඉන්පසු ඔබ ද මරවන්නේ ය.

4954. මහරජ, ගම්වර නියම්ගම්වර හා උපභෝග පරිභෝග වස්තු ද රජවරු මේ බමුණන්ට දෙති. අග්‍ර වූ බත් පැන් ලබන මොහු ගෙයක් පාසා අනුභව කෙරෙති.

4955. මහරජ, එබඳු උපකාර ඇති රජවරුන්ටත් ද්‍රොහ කරන්නට මොහු කැමති වෙති. දේවයන් වහන්ස, මේ බමුණෝ නම් බොහෝ සෙයින් කෙළෙහිගුණ නො දන්නෝ වෙති.

4956. දේවයන් වහන්ස, අප නො නැසුව මැනැවි. බණ්ඩභාල නම් පෙරෙවි බමුණාහට අප දාසභාවයට පත් කොටැ දුන මැනවි. හැකිල්ලෙන් බැඳුණු අපි ඇතුන් ද, අසුන් ද රැක බලා ගනිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4957. මා නො දෙව අවධි දසෙ නො දෙහි බණ්ඩභාලස්ස,
අපි නිගළබන්ධකාපි හත්ථිවජකණ්ණානි උපෙක්ඛිම.

4958. මානො දෙව අවධි දසෙ නො දෙහි බණ්ඩභාලස්ස,
අපි නිගළබන්ධකාපි අස්සවජකණ්ණානි උපෙක්ඛිම.

4959. මා නො දෙව අවධි දසෙ නො දෙහි බණ්ඩභාලස්ස,
යස්ස හොනති තව කාමා අපි රට්ඨා පබ්බජිතා
භීයක්කාවරියං චරිස්සාම.

4960. දුක්කං බො මෙ ජනයථ විලපනතා ජීවිතස්ස කාමා හි.
මුඤ්චථදනි කුමාරෙ අලම්පි මෙ හොතු පුත්තයඤ්ඤෙන.

4961. පුබ්බෙව බොසි මෙ වුත්තො දුක්කරං දුරභිසම්භවං චෙතං,
අථ නො උපකඩ්ඪස්ස යඤ්ඤස්ස කරොසි විඝාතං.

4962. සබ්බෙ වජනති සුගතිං යෙ යජනති යෙපි වෙව යාජෙනති,
යෙ චාපි අනුමොදනති යජනතානං එදිසං මහායඤ්ඤං.

4963. යදි කිර යජිත්වා පුත්තෙහි දෙවලොකං ඉතො චුතා යනති,
බ්‍රාහ්මණා තාව යජතු පච්ඡාපි යජිස්සි තුවං රාජ.

4964. යදි කිර යජිත්වා පුත්තෙහි දෙවලොකං ඉතො චුතා යනති,
එසො ව බණ්ඩභාලො යජතු සකෙහි පුත්තෙහි.

4965. එවං ජානං[1] වො බණ්ඩභාලො කිං පුත්තකෙ න සාතෙසි,
සබ්බඤ්ච ඤාතිජනං අත්තානඤ්ච න සාතෙසි.

4966. සබ්බෙ වජනති නිරයං යෙ යජනති යෙපි වෙව යාජෙනති,
යෙ චාපි අනුමොදනති යජනතානං එදිසං මහායඤ්ඤං.

4967. කථඤ්ච කිර පුත්තකාමායො ගහපතයො සරණියො ච,
නගරම්හි න උපරවනති රාජානං මා සාතයි ඔරසං පුත්තං.

---

1. එවං ජානනෙතා - මජඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4957. දේවයන් වහන්ස, අප නො නැසුව මැනවි. බණ්ඩභාල නම් පෙරෙවි බමුණාහට අප දසභාවයට පත් කොටැ දුන මැනවි. හැකිල්ලෙන් බැඳුණු අපි ඇත් වසුරු බැහැර දමන්නෙමු.

4958. දේවයන් වහන්ස, අප නො නැසුව මැනවි. බණ්ඩභාල නම් පෙරෙවි බමුණාහට අප දසභාවයට පත්කොටැ දුන මැනවි. හැකිල්ලෙන් බැඳුණු අපි අස් වසුරු බැහැර දමන්නෙමු.

4959. දේවයන් වහන්ස, අප නො නැසුව මැනව. යමකුහට දෙන්නට ඔබ කැමති වෙත් නම් ඔහුට අප දසභාවයට පත් කොටැ දෙනු මැනවි. ඉදින් අප දෙයක් වේ නම් රටින් පිටුවහල් කරන ලද අපි බැගෑ වැ පිඬු සිහා හැසිරීමෙන් ජීවත් වන්නෙමු.

4960. ජීවිතයට ආසාවෙන් වැලැපෙන මොවුහු මට දුක් ඉපිද වූහ. දැන් කුමාරයන් මුදා හරිනු මැනවි. දරුවන් මරා කරන යාගයෙන් මට ප්‍රයොජන නැතැ යි රජ තෙම කීය.

4961. මහරජ, මේ යාගය කළ නො හැකි යැ යි ද දුකසේ ලැබිය හැක්කැ යි ද පළමු කොට කියන ලද්දෙහි ය. දැන් අප පිළියෙළ කළ යාගයට හානි කෙරෙහි.

4962. යම් කෙනෙක් යාග කෙරෙද්ද, කරවද්ද යාග කරන්නවුන්ගේ ඒ වැනි මහා යාගය යම් කෙනෙක් අනුමෝදන් වෙද්ද ඒ සියලු දෙනා ම සුගතියට යෙති යි පෙරෙවි බමුණා කීය.

4963. ඉදින් පුතුන් කරණ කොටගෙන යාග කොට මෙයින් චුත වූවාහු දෙව්ලොවට පැමිණෙත් නම් බ්‍රාහ්මණ තෙම පළමුවෙන් එසේ යාග කෙරේවා. මහරජ, ඉන්පසු තෙපි ද යාග කරනු මැනවි.

4964. ඉදින් දරුවන් කරණ කොටගෙන යාග කොට මෙයින් චුත වූවාහු දෙව්ලොවට පැමිණෙත් නම් මේ බණ්ඩභාල නම් පෙරෙවි බමුණු ද තමාගේ දරුවන් මරා එසේ යාග කෙරේවා.

4965. මෙසේ දන්නා බණ්ඩභාල නම් පෙරෙවි බමුණු කවර හෙයින් දරුවන් නො නැසුවේ ද? සියලු නැයන් ද, තමන් ද කවර හෙයින් නො නැසුවේ ද?

4966. යම් කෙනෙක් මෙබඳු මහායාග කෙරෙද් ද, කරවද් ද, අනුමෝදන් වෙද් ද ඒ සියල්ලෝ නරකයට යෙති යි චන්ද්‍ර කුමාර තෙම කීය.

4967. කෙසේ නම් නුවර දරුවන් කැමැති ගෘහපතියෝ ද ඔවුන්ගේ භාර්‍යාවරු ද තමන්ගේ ඖරස පුත්‍රයා නො මරනු මැනවැ යි රජුට දෙස් නො පවරද් ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4968. කථඤ්ච කිර පුත්තකාමායො ගහපතයො සරණියො ච,
නගරම්හි න උපරවන්ති රාජානං මා සාතයි අත්‍රජං පුත්තං.

4969. රඤ්ඤෙමහි අත්ථකාමො හිතො ච සබ්බද ජනපදස්ස,
න කොචි අස්ස පටිසං මයා ජනපදෙ න පවෙදෙති.

4970. ගච්ඡථ වො සරණියො තාතඤ්ච වදෙථ ඛණ්ඩහාලඤ්ච,
මා සාතෙථ කුමාරෙ අදූසකෙ සීහසඞ්කාසෙ.

4971. ගච්ඡථ වො සරණියො තාතඤ්ච වදෙථ ඛණ්ඩහාලඤ්ච,
මා සාතෙථ කුමාරෙ අපෙක්ඛිතෙ සබ්බලොකස්ස.

4972. යන්නූනාහං ජායෙය්‍යං රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා,
වෙණෙසු වා ජායෙය්‍යං නහජ්ජ මං රාජා
යඤ්ඤත්ථාය සාතෙය්‍ය.

4973. සබ්බා සීමන්තිනියො ගච්ඡථ අය්‍යස්ස ඛණ්ඩහාලස්ස,
පාදෙසු නිපතථ අපරාධාහං න පස්සාමි.

4974. සබ්බා සීමන්තිනියො ගච්ඡථ අය්‍යස්ස ඛණ්ඩහාලස්ස,
පාදෙසු නිපතථ කිං තෙ භන්තෙ මයං අදූසෙම.

4975. කපණං විලපති සෙලා දිස්වාන භාතරො උපනීතත්තෙ,
යඤ්ඤෙ කිර මෙ උක්ඛිපිතො තාතෙන සග්ගකාමෙන.

4976. ආවත්තී ච පරිවත්තී ච වාසුලො සම්මුඛා රඤ්ඤෙ,
මා නො පිතරං අවධි දහරම්හා අයොබ්බනං පත්තා.

4977. එසො තෙ වාසුල පිතා සමෙහි[1] පිතරං,
දුක්ඛං ඛො මෙ ජනයසි විලපන්තො අන්තරපුරස්මිං.
මුඤ්චථ දනි කුමාරෙ අලම්පි මෙ හොතු පුත්තයඤ්ඤෙන.

4978. පුබ්බෙව ඛොසි වුත්තො දුක්කරං දුරභිසම්භවං චෙතං,
අථ නො උපක්ඛටස්ස යඤ්ඤස්ස කරොසි[2] වික්ඛෙපං.

---

1. සම - මජසං.
2. කස්මා කරොසි - මජසං,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4968. කෙසේ නම් නුවරැ දරුවන් කැමැති ගෘහපතියෝ ද ඔවුන්ගේ භාර්‍යාවෝ ද ආත්මජ පුත්‍රයා නො මරව යි රජුට උපක්‍රොශ නො කරත් ද?

4969. (මම) රජහට වැඩ කැමැත්තෙමි. හැම කල්හි දනවු වැසියනට හිත වූයෙමි ද වෙමි. කිසිවෙක් මා හා සමඟ ප්‍රතිස කරන්නෙ නො වෙයි. (එසේ වතුදු) දනවුවැසියා (තොපගේ පුත් ගුණවත යැ යි) රජහට නො දන්වයි.

4970. එම්බා ගෘහණියනි, තෙපි යව, 'සිංහයන් බඳු නිවරද කුමරුන් නො මරව' යි පියරජුටත්, ඛණ්ඩහාල බමුණුටත් කියව.

4971. එම්බා ගෘහිණියනි, තෙපි යව, සියලු ලෝවැසියා විසින් අපේක්‍ෂා කරනලද කුමරුන් නො මරව යි පියරජුටත් ඛණ්ඩහාල-බමුණුටත් කියව.

4972. මම සොම්මර හෝ පුප්සඩු කුලයක උපනි නම් යෙහෙකි. කුලුපොතු කුලයෙහි හෝ උපනි නම් පියරජ තෙම අද මා යාගය පිණිස නො මරවයි.

4973. සියලු ස්ත්‍රීවරුනි, යව, ආර්‍ය්‍ය වූ ඛණ්ඩහාල නමැති පෙරෙවි බමුණහුගේ පාමුල හඬා වැටෙන්න. මා කළ කිසි අපරාධයක් නො දකිමි.

4974. සියලු ස්ත්‍රීවරුනි, යන්න, ආචාර්‍ය්‍ය වූ ඛණ්ඩහාල නමැති පෙරෙවි බමුණහුගේ පාමුල හඬා වැටෙන්න. සවාමීනි, ඔබට අපි කවර නම් ද්‍රොහයක් කෙළෙමු ද? (ඉදින් චන්ද්‍ර කුමාරයා කළ වරදක් ඇතහොත් එය කමා කළ මැනවැ යි කියා හඬා වැටෙවි කියා යැවූ.)

4975. සේලා නම් සොහොයුරිය සොහොවුරන් වෙත පැමිණි සඳහාව දැකැ දෙවිලොව යනු කැමති මපියාණනි, මේ ඔබ විසින් නැංවුණු යාගයක් දැ යි බැගෑපත් වැ වැලැපුණා ය.

4976. චන්ද්‍ර කුමාරයාගේ වාසුල නමැති පුත්‍ර කුමාර තෙම අපි තරුණ බවට නො පැමිණි ළදරුවෝ වෙමු. අප පියා නො මැරුව මැනවැ යි රජුගේ පාමුල හඬා වැටුණි.

4977. වාසුල නම් කුමාරය, මේ තෙම තොපගේ පියා ය. පියා සනසව. අන්තඃපුරයෙහි මේ කුමාර තෙම හඬමින් මට බොහෝ දුක් ඉපද විය. දැන් මේ කුමාරවරුන් මුද හරිවු. පුතුන් මරා කරන යාගයෙන් මට කම් නැති වේවා යි රජ කීය.

4978. (මහරජතුමනි), තෙල යාගය දුෂ්කර යැ, දුර්ලභ යැ යි කැලැ මැ කියන ලද්දෙහි. එසේ ඇති කල්හිදු එළවන ලද අපගේ යාගයට ආකුල කෙරෙහි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4979. සබ්බෙ වජන්ති සුගතිං යෙ යජන්ති යෙපි චෙව යාජෙන්ති,
යෙ වාපි අනුමොදන්ති යජන්තානං එදිසං මහායඤ්ඤං.

4980. සබ්බරතනස්ස යඤ්ඤෙ[1] උපක්ඛටො එකරාජ
තව පටියත්තො.
අභිනික්ඛමස්සු දෙව සග්ගං ගතො ත්වං පමොදිස්සසි.

4981. දහරා සත්තසතා එතා පන චන්දකස්ස භරියායො,
කෙසෙ පරිකිරිත්වාන[2] රොදන්තියො මග්ගමනුයන්ති.[3]

4982. අපරා පන සොකෙන නික්ඛන්තා නන්දනෙ විය දෙව,
කෙසෙ පරිකිරිත්වාන රොදන්තියො මග්ගමනුයන්ති.

4983. කාසිකසුවිවත්ථධරා කුණ්ඩලිනො අගලුචන්දනවිලිත්තා,
නීයන්ති චන්දසුරියා යඤ්ඤත්ථාය එකරාජස්ස.

4984. කාසිකසුවිවත්ථධරා කුණ්ඩලිනො අගලු[4]චන්දනවිලිත්තා,
නීයන්ති චන්දසුරියා මාතු කත්වා හදයසොකං.

4985. කාසිකසුවිවත්ථධරා කුණ්ඩලිනො අගලුචන්දනවිලිත්තා,
නීයන්ති චන්දසුරියා ජනස්ස කත්වා හදයසොකං.

4986. මංසරසභොජිනො නහාපකසුනහාපිතා,
කුණ්ඩලිනො අගලුචන්දනවිලිත්තා;
නීයන්ති චන්දසුරියා යඤ්ඤත්ථාය එකරාජස්ස.

4987. මංසරසභොජිනො නහාපකසුනහාපිතා
කුණ්ඩලිනො අගලුචන්දනවිලිත්තා,
නීයන්ති චන්දසුරියා මාතු කත්වා හදයසොකං.

4988. ම සරසභොජිනො නහාපකසුනහාපිතා
කුණ්ඩලිනො අගලුචන්දනවිලිත්තා,
නීයන්ති චන්දසුරියා ජනස්ස කත්වා හදයසොකං.

4989. යස්සු පුබ්බෙ හත්ථිවරධුරගතෙ හත්ථිහි අනුවජන්ති,
ත්‍යාජ්ජ චන්දසුරියා උභොව පත්තිකා යන්ති.

---

1. මහායඤ්ඤො – මජ්ස.
2. පකරිත්වාන – සීමු.
3. මග්ගමනුයායන්ති – මජ්ස.
4. අග්ගලු – මජ්ස.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4979. යම් කෙනෙක් මෙවන් මහායාග කරත් ද යම් කෙනෙකුත් මෙවන් යාග කරවත් ද, යම් කෙනෙකුත් යාග කරන්නවුන්ගේ මෙවන් යාග අනුමෝදන් වෙත් ද, ඒ හැම දෙන සුගතියට යෙති.

4980. ඒකරාජය, සර්වරත්නයෙන් එළවන ලද තොපගේ යාගය පිළියෙල කරනලද යැ. දේවයිනි, යාගයට නික්මෙව. තෙපි සවර්ගයට ගියහු කුටු වන්නහු යැ.

4981. චන්ද්‍ර කුමාරයාගේ තෙල සත්සියයක් පමණ වූ තරුණ භාර්‍යාවෝ කෙහෙවලු මුදගෙන හඬමින් මහමහ ඔහු අනුව යෙති.

4982. සොවින් නික්මුණු අන්‍ය ස්ත්‍රීහු නදුනුයන්හි චුතවන දෙව්පුතකු පිරිවරනලද දෙවඟනන් මෙන් කෙහෙ මුදගෙන හඬමින් මහමහ ඔහු අනුව යෙති.

4983. පිරිසුදු කසිසළු ධරන කුණ්ඩලාභරණ පැළඳි අගිල් සඳුන් තවර කළ චන්ද්‍ර, සූර්‍ය කුමරුවෝ එකරාජ රජුගේ යාගයට යෙත්.

4984. පිරිසුදු කසිසළු ධරන කුණ්ඩලාභරණ පැළඳි අගිල් සඳුන් විලෙවුන් දුන් චන්ද්‍ර, සූර්‍ය කුමරුවෝ මවගේ ළෙහි ශොක ඇති කොට ගෙන යනු ලැබෙති.

4985. පිරිසුදු කසිසළු ධරන කුණ්ඩලාභරණ පැළඳි අගිල් සඳුන් තවර කළ චන්ද්‍ර, සූර්‍ය කුමාරයෝ දෙදෙන ජනයාගේ ළෙහි ශොක ඇති කොට ගෙන යනු ලැබෙති.

4986. මස්රස සහිත සුවඳ හැල් බත් බුදින, නැහැවියන් විසින් මොනොවට නහවන ලද, පළන් කුණ්ඩලාභරණ ඇති, අගිල් සඳුන් තවර කළ චන්ද්‍ර, සූර්‍ය කුමරුවෝ දෙදෙන එකරාජ රජහුගේ යාගයට ගෙන යනු ලැබෙති.

4987. මස්රස සහිත සුවඳ හැල් බත් බුදින, නැහැවියන් විසින් මොනොවට නහවන ලද, පළන් කුණ්ඩලාභරණ ඇති, අගිල් සඳුන් තවර කළ චන්ද්‍ර, සූර්‍ය කුමාරයෝ දෙදෙන මවගේ ළෙහි ශෝක ඇති කොට ගෙන යනු ලැබෙති.

4988. මස්රස සහිත සුවඳ හැල් බත් බුදින, නැහැවියන් විසින් මනාකොට නහවන ලද, පළන් කොඩොල් ඇති අගිල් සඳුන් තවර කළ චන්ද්‍ර, සූර්‍ය කුමාරයෝ දෙදෙන ජනයාගේ ළෙහි ශෝක ඇති කොට ගෙන යනු ලැබෙත්.

4989. පෙර, උතුම් ඇත්කඳෙහි හුන් යම් කුමර කෙනෙකුන් ඇත් සෙනඟින් යුතු වැ පිරිවර ජනයා පසුගමන් කෙරෙත් ද අද ඒ සද-ගිරු කුමරහු දෙදෙන මැ පාගමනින් යෙති.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4990. යස්සු පුබ්බෙ අස්සවරධුරගතෙ අස්සෙ හි අනුවජන්ති,
ත්‍යජ්ජ චන්දසුරියා උභොව පත්තිකා යන්ති.

4991. යස්සු පුබ්බෙ රථවරධුරගතෙ රථෙහි අනුවජන්ති,
ත්‍යජ්ජ චන්දසුරියා උභොව පත්තිකා යන්ති.

4992. යෙ හිස්සු පුබ්බෙ නිය්‍යංසු[1] තපනීයකප්පනෙහි[2] තුරඩෙගහි,
ත්‍යජ්ජ චන්දසුරියා උභොව පත්තිකා යන්ති.

4993. යදි සකුණි මංසම්ච්ඡසි දයාස්සු[3] පුබ්බෙන පුප්ඵවතියා,
යජතෙත්ථ එකරාජා සම්මූළ්හා චතුහි පුත්තෙහි.

4994. යදි සකුණි මංසම්ච්ඡසි දයාස්සු පුබ්බෙන පුප්ඵවතියා,[4]
යජතෙත්ථ එකරාජා සම්මූළ්හා චතුහි කඤ්ඤාහි.

4995. යදි සකුණි මංසම්ච්ඡසි දයාස්සු පුබ්බෙන පුප්ඵවතියා,
යජතෙත්ථ එකරාජා සම්මූළ්හා චතුහි මහෙසීහි,

4996. යදි සකුණි මංසම්ච්ඡසි දයාස්සු පුබ්බෙන පුප්ඵවතියා,
යජතෙත්ථ එකරාජා සම්මූළ්හා චතුහි ගහපතීහි.

4997. යදි සකුණි මංසම්ච්ඡසි දයාස්සු පුබ්බෙන පුප්ඵවතියා,
යජතෙත්ථ එකරාජා සම්මූළ්හා චතුහි හත්ථීහි.

4998. යදි සකුණි මංසම්ච්ඡසි දයාස්සු පුබ්බෙන පුප්ඵවතියා,
යජතෙත්ථ එකරාජා සම්මූළ්හා චතුහි අස්සෙහි.

4999. යදි සකුණි මංසම්ච්ඡසි දයාස්සු පුබ්බෙන පුප්ඵවතියා,
යජතෙත්ථ එකරාජා සම්මූළ්හා චතුහි උසභෙහි.

---

1. නයිංසු – මජ්ඣං.
2. තපනීයම්පනෙහි – මජ්ඣං.
3. උය්‍යස්සු – මජ්ඣං. ස්‍යා, දයස්සු - අය්ටකථා
4. පුප්ඵවතියායං – මජ්ඣං. ස්‍යා. වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

4990. පෙර, උතුම් අස්වාහනයට ගිය යම් කුමර ඉකනකුන් අස්සෙනහින් යුතු වැ පිරිවර ජනයා පසුගමන් කෙරෙත් ද, අද ඒ සඳහිරු කුමරහු දෙදෙන මැ පාගමනින් යෙති.

4991. පෙර, උතුම් රියට ගිය යම් කුමර කෙනකුන් රිය සෙනහින් යුතු වැ පිරිවර ජනයා පසුගමන් කෙරෙත් ද, අද ඒ සඳහිරු කුමරහු දෙදෙන මැ පාගමනින් යෙති.

4992. පෙර යම් කුමර කෙනෙක් රන් අබරණින් සරසනලද අස් සෙනහින් යුතු වැ නික්මැ ගියාහු ද, අද ඒ සඳහිරු කුමරහු දෙදෙන මැ පාගමනින් යෙත්.

4993. කොස්ලිහිණියනි, ඉදින් මස් කැමැත්තෙහි නම් යව, පුෂ්පවතී නුවරට පූර්ව දිශාවෙහි (යාගාවාටයෙක් ඇත.) මෙහි ඒකරාජ නම් රජ (පෙරෙවි බමුණුහට) මුළාවූයේ පුතුන් සතර දෙනාගෙන් යුතු වැ යාග කෙරෙයි.

4994. කොස්ලිහිණියනි, ඉදින් මස් කැමැත්තෙහි නම් යව, පුෂ්පවතී නම් නුවරට පූර්ව දිශාවෙහි (යාගාවාටයෙක් ඇත.) මෙහි ඒකරාජ නම් රජ දුහිතෘ කන්‍යාවන් සතර දෙනාගෙන් යුතු වැ යාග කෙරෙයි.

4995. කොස්ලිහිණියනි, ඉදින් මස් කැමැත්තෙහි නම් යව පුෂ්පවතී නුවරට පූර්ව දිශායෙහි (යාගාවාටයෙක් ඇත.) මෙහි ඒකරාජ නම් රජ පෙරෙවි බමුණු බසට මුළාවූයේ මෙහෙසියන් සතර දෙනාගෙන් යාග කෙරෙයි.

4996. කොස්ලිහිණියනි, ඉදින් මස් කැමැත්තෙහි නම් යව. පුෂ්පවතී නුවරට පූර්ව දිශායෙහි (යාගාවාටයෙක් ඇත.) මෙහි ඒකරාජ නම් රජ (පෙරෙවි බමුණු බසට) මුළාවූයේ ගැහැවියන් සතර දෙනකුන්ගෙන් යාග කෙරෙයි.

4997. කොස්ලිහිණියනි, ඉදින් මස් කැමැත්තෙහි නම් යව. පුෂ්පවතී නුවරට පූර්වදිශායෙහි (යාගාවාටයෙක් ඇත.) මෙහි එකරාජ නම් රජ පෙරෙවිබමුණු බසට මුළා වූයේ ඇතුන් සතර දෙනකුන්ගෙන් යාග කෙරෙයි.

4998. කොස්ලිහිණියනි, ඉදින් මස් කැමැත්තෙහි නම් යව. පුෂ්පවතී නුවරට පූර්වදිශායෙහි (යාගාවාටයෙක් ඇත.) මෙහි එකරාජ නම් රජ පෙරෙවිබමුණු බසට මුළා වැ අසුන් සතර දෙනකුන්ගෙන් යාග කෙරෙයි.

4999. කොස්ලිහිණියනි, ඉදින් මස් කැමැත්තෙහි නම් යව. පුෂ්පවතී නුවරට පූර්වදිශායෙහි (යාගාවාටයෙක් ඇත.) මෙහි එකරාජ නම් රජ පෙරෙවි බමුණු බසට මුළා වැ වෘෂභයන් සතර දෙනකුන්ගෙන් යාග කෙරෙයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5000. යදි සකුණි මංසමිච්ඡසි දයාස්සු පුබ්බෙන පුප්ඵවතියා,
යජතෙත්ථ එකරාජා සම්මූළ්හො සබ්බවතුස්සෙන.

5001. අයමස්ස පාසාදෙ ඉදං අන්තෙපුරං සුරමණියං,
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5002. ඉදමස්ස කූටාගාරං සොවණ්ණං පුප්ඵමල්‍යවීතිණ්ණං,
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5003. ඉදමස්ස අසොකවනං[1] සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5004. ඉදමස්ස උය්‍යානං සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5005. ඉදමස්ස කණිකාරවනං සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5006. ඉදමස්ස පාටලීවනං සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5007. ඉදමස්ස අම්බවනං සුපුප්ඵිතං සබ්බකාලිකං රම්ම-,
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5008. අයමස්ස පොක්ඛරණී සඤ්ඡන්නා පදුමපුණ්ඩරීකෙහි,
නාවා ච සොවණ්ණවිකතා පුප්ඵාවලියා විචිත්තා සුරමණියා.
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5009. ඉදමස්ස හත්ථිරතනං එරාවණො ගජො වරුණදන්තී,[2]
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5010. ඉදමස්ස අස්සරතනං එකඛුරො අස්සො,
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

---

1. අසොකවනියා - මජසං
2. බලිදන්තී - මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5000. කොස්ලිහිණියනි, ඉදින් මස් කැමැත්තෙහි නම් යව. පුෂ්පවතී නුවරට පූර්වදිශායෙහි (යාගාවාටයෙක් ඇත.) මෙහි ඒකරාජ නම් රජ පෙරෙව් බමුණු බසට මුළා වැ සර්වචතුෂ්කයෙන් යුතු වැ යාග කෙරෙයි.

5001. මේ චන්ද්‍ර කුමරුගේ ප්‍රාසාදය යි. මෙ ඉතා සිත්කලු වූ අන්තඃපුරය යි. දැන් ඒ චන්ද්‍ර ප්‍රමුඛ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5002. මෙ චන්ද්‍ර කුමාරයාගේ කූටාගාරය රනින් කළ මල්දමින් ගැවැසිගත්තේ යැ. දැන් ඒ චන්ද්‍රකුමාරාදි ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5003. මෙ ඔබගේ උයන හැම කල්හි මොනොවට පිපියේ සිත්කලු වූයේ යැ. දැන් ඒ සඳකුමරු ප්‍රමුඛ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5004. මෙ ඔබගේ හෝපලු උයන හැම කල්හි මොනොවට පිපියේ සිත්කලු වූයේ යැ. දැන් ඒ සඳකුමරු ප්‍රමුඛ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5005. මෙ ඔබගේ කිණිහිරි උයන හැම කල්හි මොනොවට පිපියේ සිත්කලු වූයේ යැ. දැන් ඒ සඳකුමරු ප්‍රමුඛ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5006. මෙ ඔබගේ පළොල් උයන හැම කල්හි මොනොවට පිපියේ සිත්කලු වූයේ යැ. දැන් ඒ සඳකුමරු ප්‍රමුඛ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5007. මෙ ඔබගේ අඹ උයන හැම කල්හි මොනොවට පිපියේ සිත්කලු වූයේ යැ. දැන් ඒ සඳකුමරු ප්‍රමුඛ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5008. මෙ ඔබගේ පොකුණ පියුම් පඬෙරින් ගැවැසිගත්තේ යැ. රන්කම් කළ නැව ද මල්දමින් විසිතුරු යැ, ඉතා සිත්කලු යැ. දැන් ඒ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5009. මෙ 'ඓරාවණ' නම් වූ වරුණදන්ත ඇති මහල් ඇත් තෙම ඔබගේ හස්තිරත්න යැ. දැන් ඒ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5010. මෙ 'එකඛුර' නම් මහුලස් තෙම ඔබගේ අශ්වරත්න යැ. දැන් ඒ ආයුෂ්මත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5011. අයමස්ස අස්සරථො සාලියනිගෙසාසො සුභො රතනචිත්තො,
යත්ථස්සු අය්‍යපුත්තා සොභිංසු නන්දනෙ විය දෙවා;
තෙදනි අය්‍යපුත්තා චත්තාරො වධාය නින්නීතා.

5012. කථං නාම සාමසමසුන්දරෙහි චන්දනමරකතගත්තෙහි,[1]
රාජා යජිස්සතෙ යඤ්ඤං සම්මූළ්හො චතූහි පුත්තෙහි.

5013. කථං නාම සාමසමසුන්දරාහි චන්දනමරකතගත්තාහි,[2]
රාජා යජිස්සතෙ යඤ්ඤං සම්මූළ්හො චතූහි කඤ්ඤාහි.

5014. කථං නාම සාමසමසුන්දරාහි චන්දනමරකතගත්තාහි,
රාජා යජිස්සතෙ යඤ්ඤං සම්මූළ්හො චතූහි මහෙසීහි.

5015. කථං නාම සාමසමසුන්දරෙහි චන්දනමරකතගත්තෙහි,
රාජා යජිස්සතෙ යඤ්ඤං සම්මූළ්හො චතූහි ගහපතීහි.

5016. යථා හොන්ති ගාමනිගමා සුඤ්ඤා අමනුස්සකා බ්‍රහාරඤ්ඤා,
තථා හෙස්සති පුපඵවතියා යිට්ඨෙසු චන්දසුරියෙසු.

5017. උම්මත්තිකා භවිස්සාමි භූනහතා පංසුනා ච පරිකිණ්ණා,
සචෙ චන්දවරං හන්ති පාණා මෙ දෙව නිරුජ්ඣන්ති.[3]

5018. උම්මත්තිකා භවිස්සාමි භූනහතා පංසුනා ච පරිකිණ්ණා,
සචෙ සුරියවරං හන්ති පාණා මෙ දෙව නිරුජ්ඣන්ති.

5019. කිනනුමා න රමයෙය්‍යුං[4] අඤ්ඤමඤ්ඤං පියංවදා,
සටට්යා[5] ඔපරක්ඛී ච පොක්ඛරක්ඛී ච නායිකා;[6]
චන්දසුරියෙසු නච්චන්තියො සමො තාසං න විජ්ජති.

5020. ඉමං මය්හං හදයසොකං පටිමුච්චතු ඛණ්ඩහාල තව මාතා
යො මය්හං හදයසොකො චන්දස්මිං වධාය නින්නීතෙ.

5021. ඉමං මය්හං හදයසොකං පටිමුච්චතු ඛණ්ඩහාල තව මාතා,
යො මය්හං හදයසොකො සුරියස්මිං වධාය නින්නීතෙ.

---

1. මුදුක – මජසං.
2. මුදුක – මජසං. ස්‍යා.
3. රුජ්ඣති – මජසං.
4. පෙය්‍යුං – මජසං.
5. සටට්කා උපරක්ඛී – මජසං. ස්‍යා.
6. පොක්ඛරණී ච භාරිකා – මජසං. පොක්ඛරණී ච ගායිකා – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5011. මෙ ඔබගේ අශ්වරථය සැළලිහිණියකට බඳු හඬ ඇත්තෙ සුන්දර වූයේ යැ. රුවනින් විසිතුරු වූයේ යැ. යම් රථයෙකැ ආයුෂ්පුත්‍රයෝ නඳුනුයන්හි දෙවියන් මෙන් ශෝභමාන වූහුද ඒ රථය යි. දැන් ඒ ආයුෂ්පුත්‍රයෝ සතර දෙන වධයට ගෙනයන ලදහ.

5012. මුළා වූ රජතෙම කෙසේ නම් රන්වන් වූ ජාතියෙන් සම වූ සුන්දර වූ රත්සඳුන් අලෙව් දුන් සිරුරු ඇති පුතුන් සතර දෙනාගෙන් යාග කරන්නේ ද?

5013. මුළා වූ රජ තෙම කෙසේ නම් රන්වන් වූ ජාතියෙන් සම වූ සුන්දර වූ රත්සඳුන් අලෙව් දුන් සිරුරු ඇති කන්‍යාවන් සතර දෙනාගෙන් යාග කරන්නේ ද?

5014. මුළා වූ රජ තෙම කෙසේ නම් රන්වන් වූ ජාතියෙන් සම වූ සුන්දර වූ රත්සඳුන් අලෙව් දුන් සිරුරු ඇති මෙහෙසියන් සතර දෙනාගෙන් යාග කරන්නේ ද?

5015. මුළා වූ රජ තෙම කෙසේ නම් රන්වන් වූ ජාතියෙන් සම වූ සුන්දර වූ රත්සඳුන් අලෙව් දුන් සිරුරු ඇති ගැහැවියන් සතර දෙනකුන්ගෙන් යාග කරන්නේ ද?

5016. යම්සේ ග්‍රාමනිගමයෝ ශූන්‍ය වූවාහු මිනිසුන් නැත්තාහු මහවනයෝ වෙත් ද, චන්ද්‍ර සූර්‍ය කුමරුවන් යාග කළ කල්හි පුෂ්පවතී නගරය එසේ වන්නේ යි.

5017. දේවයිනි, ඉදින් උතුම් වූ සඳකුමරු නසා නම් වැඩ නැත්තී වූ මම පසින් ගැවැසුණු සිරුරු ඇත්තී උමතු වන්නමු. මාගේ ප්‍රාණයෝ නිරුද්ධ වෙති.

5018. දේවයිනි, ඉදින් උතුම් වූ හිරු කුමරු නසා නම් වැඩ නැත්තී වූ මම පසින් ගැවැසුණු සිරුරු ඇත්තී උමතු වන්නමු. මාගේ ප්‍රාණයෝ නිරුද්ධ වෙති.

5019. සවිටියා යැ ඔපරක්ඛී යැ පොක්ඛරක්ඛී යැ නායිකා යැ යන මොහු ඔවුනොවුන් ප්‍රිය තෙපුල් බණන්නාහු චන්ද්‍ර සූර්‍ය කුමරුන් හමුවෙහි නටන්නාහු කවර හෙයින් රමණය නො කරන්නාහු ද (නෘත්‍යගීතයෙහි) උන් හා සම වූ අන් ස්ත්‍රී කෙනෙක් නැත.

5020. ඛණ්ඩහාලය, චන්ද්‍ර කුමරු වධයට ගෙනගිය කල්හි මට යම් හෘදයශෝකයෙක් වේ ද මාගේ මේ හෘදයශෝකය තාගේ මවු තොමෝ ලබාවා.

5021. ඛණ්ඩහාලය, සූර්‍ය කුමරු වධයට ගෙනගිය කල්හි මට යම් හෘදයශෝකයෙක් වේ ද මාගේ මේ හෘදයශෝකය තාගේ මවු තොමෝ ලබාවා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5022. ඉමං මඤ්ඤං හදයසොකං පටිමුච්චතු ඛණ්ඩහාල තව ජායා,
යො මඤ්ඤං හදයසොකො වන්දසමිං වධාය නිනනීතෙ.

5023. ඉමං මඤ්ඤං හදයසොකං පටිමුච්චතු ඛණ්ඩහාල තව ජායා,
යො මඤ්ඤං හදයසොකො සුරියසමිං වධාය නිනනීතෙ.

5024. මා පුත්තෙ මා ච පතිං අද්දක්ඛි ඛණ්ඩහාල තව මාතා,
යො ඝාතෙසි කුමාරෙ අදූසකෙ සීහසඞ්ඝාසෙ.

5025. මා පුත්තෙ මා ච පතිං අද්දක්ඛි ඛණ්ඩහාල තව මාතා,
යො ඝාතෙසි කුමාරෙ අපෙක්ඛිතෙ සබ්බලොකස්ස.

5026. මා පුත්තෙ මා ච පතිං අද්දක්ඛි ඛණ්ඩහාල තව ජායා,
යො ඝාතෙසි කුමාරෙ අදූසකෙ සීහසඞ්ඝාසෙ.

5027. මා ච පුත්තෙ මා ච පතිං අද්දක්ඛි ඛණ්ඩහාල තව ජායා,
යො ඝාතෙසි කුමාරෙ අපෙක්ඛිතෙ සබ්බලොකස්ස.

5028. මා නො දෙව අවධි දසෙ නො දෙහි ඛණ්ඩහාලස්ස,
අපි නිගළබන්ධකාපි හත්ථී අස්සෙ ච පාලෙම.

5029. මා නො දෙව අවධි දසෙ නො දෙහි ඛණ්ඩහාලස්ස,
අපි නිගළබන්ධකාපි හත්ථීච්ඡකනානි උජ්ඣෙම.

5030. මා නො දෙව අවධි දසෙ නො දෙහි ඛණ්ඩහාලස්ස,
අපි නිගළබන්ධකාපි අස්සච්ඡකනානි උජ්ඣෙම.

5031. මා නො දෙව අවධි දසෙ නො දෙහි යස්ස හොන්ති
තව කාමා,
අපි රට්ඨා පබ්බජිතා භික්ඛාචරියං චරිස්සාම.

5032. දිව්‍යං[1] උපයාචන්ති පුත්තත්ථිකා දළිඤ්ඤපි[2] නාරියො,
පටිභාණානිපි හිත්වා පුත්තෙ නහි ලභන්ති එකච්චා.

---

1. දිබ්බ – මජ්ඣ.
2. දසිද්ද – මජ්ඣ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5022. ඛණ්ඩහාලය, චන්ද්‍රකුමරු වධයට ගෙනගිය කල්හි මට යම් පුත්‍රශෝකයෙක් වේ ද, මාගේ මේ හෘදයශෝකය තාගේ භාර්‍යා තොමෝ ලබාවා.

5023. ඛණ්ඩහාලය, සූර්‍යඃ කුමරු වධයට ගෙනගිය කල්හි මට යම් හෘදයශෝකයෙක් වේ ද, මාගේ මේ හෘදයශෝකය තාගේ භාර්‍යා තොමෝ ලබාවා.

5024. ඛණ්ඩහාලය, යමෙක් සිංහයන් බඳු වූ නිදෙස් කුමරුවන් ඝාතන කරවී ද, ඒ තාගේ මවු තොමෝ දරුවන් නහමක් දකීවා හිමියා ද නහමක් දකීවා.

5025. ඛණ්ඩහාලය, යමෙක් සියලු ලෝවැසියා විසින් අපේක්ෂා කරනලද කුමරුවන් ඝාතන කරවී ද, ඒ තාගේ මවු දරුවන් නො දකීවා හිමියා ද නො දකීවා.

5026. ඛණ්ඩහාලය, යමෙක් සිංහ සදෘශ වූ නිදෙස් කුමරුන් ඝාතන කරවී ද, ඒ තාගේ භාර්‍යා තොමෝ දරුවන් නහමක් දකීවා හිමියා ද නහමක් දකීවා.

5027. ඛණ්ඩහාලය, යමෙක් සියලු ලෝවැසියා විසින් අපේක්ෂා කරන ලද කුමරුන් ඝාතන කරවී ද, ඒ තාගේ භාර්‍යා තොමෝ දරුවන් නහමක් දකීවා, හිමියා ද නහමක් දකීවා. (මවුබිසෝ ආක්‍රොශ කළා.)

5028. දේවයිනි, අප නහමක් ඝාතන කෙරේවා. අප ඛණ්ඩහාල බමුණුහට දස් කොට දෙව. හැකිලිබැඳුම් ඇතියමෝ ද ඇතුන් අසුන් පාලනය කරමිහ.

5029. දේවයන් වහන්ස, අප ඝාතනය නො කරව. අප ඛණ්ඩහාල බමුණුහට දස් කොට දෙව. හැකිලිබැඳුම් ඇතියමෝ ද ඇන් ඉලත්ති (වසුරු) බැහැර ලමිහ.

5030. දේවයන් වහන්ස, අප ඝාතනය නො කරව. අප ඛණ්ඩහාල බමුණුහට දස් කොට දෙව. හැකිලිබැඳුම් ඇතියමෝ ද අස් ඉලත්ති බැහැර ලමිහ.

5031. දේවයන් වහන්ස, අප ඝාතනය නො කරව. අප මුඛ කැමැති යමක්ෂට දස් කොට දෙව. අපි රටින් නෙරන ලදුවමෝ ද පිඬුසිහා හැසිරෙමිහ. (සිහාකා ඇවිදුම්හ.)

5032. දරුවන් කැමැති දිළිඳු ස්ත්‍රීහු ද දෙවොල් ආරාධනා කරති. ඇතැම්හු අභිමත ආහාර (දෙළ) ද නො ලැබ දරුවන් නො ලබත් මැ යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5033. අසඤ්ඤකානි[1] කරොනති පුත්තා නො ජායන්තු තතො පපුත්තා,
අථ නො අකාරණඤ්ඤා යඤ්ඤත්ථාය දෙව සාතෙසි,

5034. උපයාචිතකෙන පුත්තං ලභන්ති මා තාත නො අසාතෙසි.
මා කිච්ඡා ලද්ධකෙහි පුත්තෙහි යජිත්ථො ඉමං යඤ්ඤං.

5035. උපයාචිතකෙන පුත්තං ලභන්ති මා තාත නො අසාතෙසි,[2]
මා කපණලද්ධකෙහි පුත්තෙහි අම්හාය නො විපවාසෙහි.

5036. බහුදුක්ඛපොසියා වන්දං අම්ම තුවං ජීය්‍යසෙ පුත්තං,
වන්දාමි බො තෙ පාදෙ ලභතං තාතො පරලොකං.

5037. හන්ද ච මං උපගූහ පාදෙ තෙ අම්ම වන්දිතුං දෙහි,
ගච්ඡාමිදානි පවාසං යඤ්ඤත්ථාය එකරාජස්ස.

5038. හන්ද ච මං උපගූහ පාදෙ තෙ අම්ම වන්දිතුං දෙහි,
ගච්ඡාමිදානි පවාසං මාතු කත්වා හදයසොකං.

5039. හන්ද ච මං උපගූහ පාදෙ තෙ අම්ම වන්දිතුං දෙහි,
ගච්ඡාමිදානි පවාසං ජනස්ස කත්වා හදයසොකං.

5040. හන්ද ච පදුමපත්තානං මොළිං බන්ධිස්සු ගොතමීපුත්ත,
චම්පකදලවීතිමිස්සායො[3] එසා තෙ පොරාණියා පකති.

5041. හන්ද ච විලෙපනෙත්ථ පඨමකං වන්දනං විලිම්පස්සු,
යෙහි ච සුවිලිත්තෙත්ථ සොභසි රාජපරිසාය.[4]

5042. හන්ද ච මුදුකානි වත්ථානි පඨමකං කාසිකං වාසෙහි,
යෙහි ච සුනිවත්ථො සොභසි රාජපරිසාය.

---

1. අසිසිකානි - මජ්ඣං.
2. සාතෙසි - මජ්ඣං.
3. චම්පකදලම්ඤ්ඤායො - සබ්බා චම්පකදලෙහි - මජ්ඣං.
4. පරිසාය - මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5033. අපට දරුවෝ උපදින් ව යි, එයින් මුනුබුරෝ උපදින් ව යි පැතුම් කෙරෙති. දේවයිනි, එසේ ඇති කල්හි නො කරුණෙන් අප යාග පිණිස සාතන කරව.

5034. පියාණෙනි, දෙවියන් යැදීමෙන් දරුවන් ලබති. පියාණෙනි, අප සාතනය නො කරව. දුකසේ ලද පුතුන්ගෙන් මේ යාගය නො කරව.

5035. දෙවියන් යැදීමෙන් දරුවන් ලබති. පියාණෙනි, අප සාතනය නො කරව. බැගෑපත් වැ ලද පුතුන් වන අප කෙරෙන් මව වෙන් නො කරව.

5036. මැණියනි, බොහෝ දුක්විඳ චන්ද කුමාරයා පොෂණය කළ තෙපි පුතු කෙරෙන් පිරිහෙවු. තොපගේ පාසහළ වඳිමි. මපියා හොග සහිත පරලොව ලබාවා.

5037. මැණියනි, ඔබගෙන් වියෝ වන බැවින් මා වැළැඳ ගනු මැනැවි. ඔබගේ පා වඳින්නට දුන මැනැවි. ඒකරාජ නමැති රජුගේ යාඥය පිණිස නැවැත නො එන පරිදි වෙන් වැ විසීමට යමි.

5038. මැණියනි, (වියෝ වන) මා වැළඳැ ගනු මැනැවි. නුඹගේ පා සහළ වඳනට අවසර දුන මැනැවි. දැන් මම මැණියන්ගේ හෘදයෙහි ශෝක උපදවා නැවත නො එන පරිදි වෙන් වැ විසීමට යමි.

5039. මැණියනි, මා වැළැඳැ ගනු මැනැවි නුඹගේ පාසහළ වඳනට අවසර දුන මැනැවි. දැන් මම මහාජනයාගේ හෘදයෙහි ශෝක උපදවා නැවැත නො එන පරිදි වෙන් වැ විසීමට යෙමි යි චන්ද කුමාරයා වැලැපුණේ ය.

5040. ගෝතමීපුත්‍රය, එසේනම් මේ අන්තිම දැක්ම බැවින් කේශ කලාපය පියුම්පත් වෙළුමෙන් සකස් කිරීමෙන් බැඳ ගන්න ඇතුළත සපුමල් පතින් මුසු මේ වෙළීම ඔබගේ පෙර සිට පැවති චාරිත්‍රයෙකි.

5041. යම් විලෙවුනෙකින් විලේපනය කරන ලද්දේ රජ පිරිසෙහි හොබනේ ද මේ අවසන් සැරසුම බැවින් රත්සඳුන් විලේපනය කරව.

5042. පුත, මනා කොටැ හඳනා ලද යම් බදු වස්ත්‍රයකින් රජපිරිසෙහි හොබනේ ද එබඳු මෘදු වස්ත්‍ර හැඳගනුව. (ලක්ෂයක් අගනා) අන්තිම කසීසළුව හැඳගනුව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5043. මුත්තාමණිකනකවීහූතානි ගණ්හන්තු හත්ථාහරණානි,
යෙහි ච හත්ථාහරණෙහි සොභසි රාජපරිසාය.

5044. නහනූනායං රට්ඨපාලො භූමිපති ජනපදස්ස දයාදෙ,
ලොකිස්සරො මහන්තා පුත්තෙසු සිනෙහං ජනයති.

5045. මයහං පියා පුත්තා අත්තාපි[1] පියො තුම්හෙ ච භරියායො.
සග්ගාණ්ඩ පත්ථයානො තෙනාහං යාතයිස්සාමි.

5046. මං[2] පඨමං යාතෙහි මා මෙ හදයං දුක්ඛං අඵාලෙසි,
අලඬ්ඩතො සුන්දරකො පුත්තො තව දෙව සුඛුමාලො,

5047. හන්දය්‍ය මං හනන්තු සලොකා වන්දියෙන හෙස්සාමි,
පුඤ්ඤං කරන්තු විපුලං විවරාම උභොව පරලොකෙ.

5048. මා ඛං වන්දෙ රුච්චි බහුකා තව දෙවරා විසාලක්ඛී,
තෙ තං රමයිස්සන්ති යිට්ඨස්මිං ගොතමිපුත්තෙ.

5049. එවං වුත්තෙ වත්තූ අන්නානං හනති හත්ථතලකෙහි,
අලමත්තූ[3] ජීවිතෙන පායාමි[4] විසං මරිස්සාමි.

5050. නහනූනිමස්ස රඤ්ඤො මිත්තාමච්චා ච විජ්ඣරෙ සුහද,
යෙ න වදන්ති රාජානං මා යාතයි ඔරසෙ පුත්තෙ.

5051. නහනූනිමස්ස රඤ්ඤො ඤාතිමිත්තා ච විජ්ඣරෙ සුහද,
යෙ න වදන්ති රාජානං මා යාතයි අත්‍රජෙ පුත්තෙ.

5052. ඉමෙ තෙපි මයහං පුත්තා ගුණිනො කායූරධාරිනො රාජ,
තෙහිපි යජස්සු යඤ්ඤං අථ මුඤ්චතු ගොතමීපුත්තෙ.

5053. බිලයතම්පි මං කත්වා යජස්සු සන්තධා මහාරාජ,
මා ජෙට්ඨපුත්තමවධි අදූසකං සීහසඬ්ඝාසං.

---

1. අථොපි – මජ්ඣං.
2. ම – මජ්ඣං
3. අලමෙත්ථ – මජ්ඣං.
4. පියාමි විසං – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5043. පුත, අතෙහි පළඳින ලද යම්බදු අබරණින් රජපිරිසෙහි හොබනේ ද එ බදු මුතු මැණික් රත්රන් යන මෙයින් සැරසුණු අත් අබරණ පළඳින්නැ යි (මැණියෝ කීහ.)

5044. දනන්හට ප්‍රධාන මහ පොළොවට අධිපති ජනපදයට හිමි වූ මේ රජ තෙමේ දරුවන් කෙරෙහි ඇති මහත් ආදරය නූපදව යි කියා සිතමි (යි වන්ද නම් අගබිසොව පැවැසූ.)

5045. මටත් දරුවෝ ප්‍රිය වෙති, ආත්මය ද ප්‍රිය ය, ලෙහෙළි වූ තෙපි ද අඹුවෝ ද මට ඉතා ප්‍රිය වෙති. දෙව්ලොව පතන මම එහෙයින් යාග පිණිස දරුවන් මරන්නෙමි (යි රජ තෙමේ කීය.)

5046. දේවයනි, එසේනම් පළමු කොටැ මා මරනු. සරසන ලද යහපත් සිවුමැලි වූ ඔබ ගේ පුතා මරණයට නො පැමිණේවා වන්ද්‍ර කුමාරයා ගේ මරණ දුක මා හදය නො පළාවා.

5047. දේවයිනි, එසේනම් මා පළමු කොටැ මරව. වන්දකුමාරයා හා සමාන දෙව්ලෝ ඇත්තක් වන්නෙමි. ඔබ ද පින් රැස් කළ මැනැවි. එකවර නැසුණු අපි දෙදෙනා සුව අනුභව කරමින් පරලොව හැසිරෙමු (යි වන්ද්‍රා දේවී පැවැසූ.)

5048. වන්ද්‍රාවනි, තීගේ මරණයට කැමැති නොවව. විශාල ඇස් ඇත්තිය, සැමියාගේ සොහොවුරෝ තව බොහෝය. ගොතමී පුතු වඤ්ඣකුමාරයා මරා යාග කළ කල ඔව්හු තී පංචකාමයෙන් ඇලුම් කරවන්නාහ (යි රජ තෙමේ කී.)

5049. මෙසේ පැවැසූ කල සඳබිසෝසඳ අතුල්බලින් හෙවත් අල්ලෙන් තමන්හට පහර දුනි. හෙවත් ගසා ගති. මගේ ජීවිතයෙන් ප්‍රයෝජන නැත, විස බොමි, මැරෙමි.

5050. දේවයිනි, ඔබරණ පුත්‍රයන් නො මරව යි යම් කෙනෙක් නො කියද්ද, එහෙයින් මේ රජහට මිත්‍රයෙ ද අමාත්‍යයෝ ද යහළුවෝ ද නැතැ යි සිතමි.

5051. දේවයිනි, තමහට මැ ද වැ උපන් දරුවන් නො මරව යි යම් කෙනෙක් නො කියද්ද, එහෙයින් මේ රජහට මිත්‍රයෝ ද නැයෝ ද යහළුවෝ ද නැතැ යි සිතමි.

5052. මහරජ, පැළැඳි මල්මාලා ඇති අභුපළඳනාවෙන් සැරසුණු ඒ මේ මාගේ පුත්‍රයෝ ද ඇත. ඔවුන්ගෙන් ද යාග කළ මැනැවි. එකල ගෝතමීපුත් සඳකුමරු මුදවා.

5053. මහරජ මා මරා කොටස් කොට සත් තැනෙක යාග කළ මැනැවි. නිදෙස් වූ සිංහයකු බදු මාගේ වැඩිමහලු පුතු නො මරනු මැනැවි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5054. බිලසතම්පි මං කත්වා යජස්සු සත්තධා මහාරාජ,
මා ජෙට්ඨපුත්තමවධී අපෙක්ඛිතං සබ්බලොකස්ස.

5055. බහූකා තව දින්නා ආභරණා උච්චාවචා සුභණිතම්හි,
මුත්තාමණිවෙළුරියා ඉදං තෙ පච්ඡිමකං දනං.

5056. යෙසං පුබ්බෙ ඛන්ධෙසු ඵුල්ලා මාලාගුණා විවත්තිංසු,
තෙසජ්ජපීතනිසිතො නෙත්තිංසො විවත්තිස්සති ඛන්ධෙසු.

5057. යෙසං පුබ්බෙ ඛන්ධෙසු චිත්‍රා මාලාගුණා විවත්තිංසු,
තෙසජ්ජ පීත නිසිතො[1] නෙත්තිංසො විවත්තිස්සති ඛන්ධෙසු.

5058. අචිරා[2]වත නෙත්තිංසො විවත්තිස්සති රාජපුත්තානං ඛන්ධෙසු,
අථ මම හදයං න ඵලති තාව දළ්හබන්ධනඤ්ච මෙ ආසි.

5059. කාසිකසුවිවත්ථධරා කුණ්ඩලිනො අගළුවන්දනවිලිත්තා,[3]
නිය්‍යාථ චන්දසුරියා යඤ්ඤත්ථාය එකරාජස්ස.

5060. කාසිකසුවිවත්ථධරා කුණ්ඩලිනො අගළුවන්දනවිලිත්තා,
නිය්‍යාථ චන්දසුරියා මාතු කත්වා හදයසොකං.

5061. කාසිකසුවිවත්ථධරා කුණ්ඩලිනො අගළුවන්දනවිලිත්තා,
නිය්‍යාථ චන්දසුරියා ජනස්ස කත්වා හදයසොකං.

5062. මංසරසභොජිනො නහාපකසුනහාතා කුණ්ඩලිනො
අගළුවන්දනවිලිත්තා,
නිය්‍යාථ චන්දසුරියා යඤ්ඤත්ථාය එකරාජස්ස.

5063. මංසරසභොජිනො නහාපකසුනහාතා කුණ්ඩලිනො
අගළුවන්දනවිලිත්තා,
නිය්‍යාථ චන්දසුරියා මාතු කත්වා හදයසොකං.

---

1. තෙසජ්ජපිසුනිසිතො – මජසං.
2. අචිරං – මජසං.
3. අගගලු – මජසං. අකලු – වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5054. මහරජ, මා මරා කොටස් කොටැ සත් තැනෙක යාග කළ මැනැවි. සියලු ලෝවැසියන්ගේ බලාපොරොත්තු ඇති දෙටු පුතු නො මරව (යි චන්ද්‍රාදේවී පැවැසූ.)

5055. එම්බා චන්ද්‍රාවනි, ප්‍රිය වචන පවසන කල්හි මුතු මැණික් වෛදූර්‍යමය වූ කුඩා වූ ද මහත් වූ ද බොහෝ අබරණ තිට ම විසින් දෙන ලදැයැ. ම විසින් තිට දෙන මේ අන්තිම දීම ය යි චන්ද්‍රකුමාරයා පැළැඳි අබරණ දුනි.

5056. මෙයින් පෙර යම් රාජ කුමාර කෙනකුන්ගේ ස්කන්ධයන්හි පිපුණු මල්දම පෙරළුනාහු ද අද ඒ මුවහත් කඩුව පවත්නේ ය

5057. මෙයින් පෙර යම් රාජ කුමාර කෙනකුන්ගේ ස්කන්ධයන්හි විසිතුරු මල්දම පෙරළුනාහු ද අද ඒ කුමාරයින්ගේ ස්කන්ධයන්හි විෂ පෙවූ තියුණු – මුවහත් කඩුව පවත්නේ ය.

5058. රාජ කුමාරයින්ගේ ශරීරයන්හි ඒකාන්තයෙන් ම නොබෝ කලකින් කඩුව හෙන්නේ ය. එසේ වූ නමුදු මහද නො පැළෙයි. මහද ඉතා දැඩි බැඳුමෙන් යුත් වූයේ විය.

5059. හැඳි පිරිසුදු කශීසළු ඇති පැළැඳි කුණ්ඩලාභරණ ඇති ගල්වන ලද අගිල් සඳුන් සුවඳ ඇති සඳහිරු කුමරුවෝ එකරාජ නම් රජහු ගේ යාගයට ගෙන යනු ලබන්නාහ.

5060. හැඳි පිරිසුදු කශීසළු ඇති පැළැඳි කුණ්ඩලාභරණ ඇති ගල්වන ලද අගිල් සඳුන් සුවඳ ඇති සඳහිරු කුමරුවෝ, මැණියන්ගේ හෘදයෙහි ශෝක උපදවා ඒකරාජ නම් රජහු ගේ යාගයට ගෙන යනු ලබන්නාහ.

5061. හැඳි පිරිසුදු කශීසළු ඇති පැළැඳි කුණ්ඩලාභරණ ඇති ගල්වන ලද අගිල් සඳුන් සුවඳ ඇති සඳහිරු කුමරුවෝ මහාජනයාගේ හෘදයෙහි ශෝක උපදවා ඒකරාජ නම් රජහුගේ යාගයට ගෙන යනු ලබන්නාහ.

5062. මස්රසයෙන් යුත් සුවඳ ඇල් සහල් බොජුන් අනුභව කළ නහවන්නවුන් රන්සුණු නහනුවෙන් උළා කළ නැහැවුම් ඇති පැළැඳි කුණ්ඩලාභරණ ඇති අගිල් සඳුන් සුවඳ ගල්වන ලද වන්දූ සූයාී දෙකුමරුවෝ ඒකරාජ නම් රජුගේ යාගයට ගෙන යනු ලබන්නාහ.

5063. මස්රසයෙන් යුත් සුවඳ ඇල් සහල් බොජුන් අනුභව කළ නහවන්නවුන් රන්සුණු නහනුවෙන් උළා කළ නැහැවුම් ඇති පැළැඳි කුණ්ඩලාභරණ ඇති අගිල් සඳුන් සුවඳ ගල්වන ලද වන්දූ සූයාී දෙකුමරුවෝ මැණියන්ගේ සිතෙහි ශෝක උපදවා එකරාජ නම් රජුගේ යාගයට ගෙන යනු ලබන්නාහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5064. මංසරසභොජිනෝ නහාපකසුනහාතා කුණ්ඩලිනෝ
අගළුවන්දනවිලිත්තා,
නිය්‍යාථ වන්දසුරියා ජනස්ස කත්වා හදයසොකං.

5065. සඛඛසභීං උපකඛටසභීං නිසීදිතෙ වන්දියසභීං[1] යසස්සිකාය,
පඤ්චාලරාජධීතා පඤ්චලිකා සඛඛපරිසමනුපරියායි.

5066. යෙන සවෙවන බණ්ඩභාලෝ පාපකම්මං කරොති දුම්මෙධො,
එතෙන සව්වවජ්ජන සමඞ්ගිනී සාමිකෙන හොමි.

5067. යෙධජ්ජී අමනුස්සා යානි ච යක්ඛභූතභව්‍යානි,
කරොන්තු මෙ වෙය්‍යාවටිකං සමඞ්ගිනී සාමිකෙන හොමි.

5068. යා දෙවතා ඉධාගතා යානි ච යක්ඛභූතභව්‍යානි,
සරණෙසිනිං අනාථං තායථ මං යාචාමහං පතිමාහං අදීය්‍යං.[2]

5069. තං සුත්වා අමනුස්සෙසා අයොකූටං පරිඛාමෙත්වාන,
භයමස්ස ජනයන්තෙසා රාජානං ඉදමවොච.

5070. බුජ්ඣස්සු බො රාජකලි මාතාහං මත්තකං නිතාළෙමි,
මා ජෙට්ඨපුත්තමවධි අදූසකං සීහසඞ්කාසං.

5071. කො තෙ දිට්ඨා රාජකලී පුත්තභරියායො හඤ්ඤමානා,[3]
සෙට්ඨී ච ගහපතයො අදූසකා සග්ගකාමා හි.

5072. තං සුත්වා බණ්ඩභාලෝ රාජා ච අබ්භුතම්දං දිස්වාන,
සඛෙඛසං බන්ධනානි මොචෙසුං යථා තං අපාපානං.[4]

5073. සඛෙඛසු විපමුත්තෙසු යෙ ච තස්ස සමාගතා තදා ආසුං,
සඛෙඛ එකෙකලෙඩ්ඩුකම්දංසු එස වධො බණ්ඩභාලස්ස.

---

1. වන්දකමනි – මජ්ඣං.
2. අජ්ජං – මජ්ඣං.
3. හඤ්ඤමානායෝ – මජ්ඣං. සය්‍හා.
4. අනුපසාතං – මජ්ඣං. සය්‍හා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5064. මස්රසයෙන් යුත් සුවඳ ඇල් බොජුන් අනුභව කළ නහවන්නවුන් රන්සුණු නහනුවෙන් උළා කළ නැහැවුම් ඇති පැළැඳි කුණ්ඩලාභරණ ඇති අගිල් සඳුන් සුවඳ ගල්වන ලද වන්දු සූයඃ දෙකුමරුවෝ මහාජනයාගේ හෘදයෙහි ශෝක උපදවා එකරාජ නම් රජුගේ යාගයට ගෙන යනු ලබන්නාහ යි (වන්ද්‍රා දේවී වැලැපුණාය.)

5065. යාගයට අවශ්‍ය සියල්ල පිළියෙල කළ කල්හි වන්ද කුමාරයා ඒ සඳහා හිඳ වූ හෙවත් කඩුවෙන් ගෙළ සිඳින්නට නිසි පරිදි හිඳ වූ අවස්ථාවෙහි පඤ්චාල රාජයිතෘ වූ වන්ද්‍රා දේවී ඇදිලි බැඳ ගෙන පිරිස් අතරෙහි හැසුරුණා ය.

5066. යම් සත්‍යයකින් මේ ඛණ්ඩහාල නම් නුවණ නැති පෙරෙවි බමුණා පාප කර්මයක් කෙරේ ද, ඒ සත්‍යයෙන් මා ගේ සැමියා සමඟ එක් වෙම්වා.

5067. මෙහි අමනුෂ්‍යයෝ ය, යක්ෂයෝ ය, භූතයෝ ය, භූත භාවයට පැමිණෙන්නෝ ය යන යම් කෙනෙක් ඇද්ද, ඒ සියලු දෙනා මට වත්‍රාවත් කෙරෙත්වා, මම සැමියා සමඟ එක් වූ තැනැත්තක් වෙම්වා.

5068. මෙහි පැමිණියා වූ දෙවියෝ ය, යක්ෂයෝ ය, භූතයෝ ය, භූත භාවයට පැමිණෙන්නෝ ය යන යම් කෙනෙක් ඇද්ද, ඒ සියලු දෙනා අසත්‍යාමික වූ පිහිට සොයන මා රකිවු. සැමියාගෙන් මම නො පිරිහෙම්වා යි තොපට මම යාඥා කරමි (යි වන්ද්‍රාදේවී තොමෝ වැලැපුණා ය.)

5069. ශක්‍ර දේවේන්ද්‍ර තෙම එ බස් අසා යකුළක් කරකවමින් එකරාජ නම් රජුට භය උපදවමින් මෙය කී ය:

5070. මෝඩ පව්ටු රජ, මම තාගේ හිස නො පළම්වා යි දැන ගනුව; සිංහයකු සමාන නිදෙස් වැඩිමහලු පුතු නො මරව.

5071. මෝඩ කාලකණ්ණි රජ, දෙව්ලොවැ උපදිනු කැමැති වැ මරනු ලබන්නා වූ නිදෙස් අඹුදරුවෝ ද සිටුවරු ද ගෘහපතියෝ ද තා විසින් කොතැන්හි දී දක්නා ලද්දහු ද?

5072. එ බස් අසා ඛණ්ඩහාල බමුණා ද රජ ද මේ අද්භූත දර්‍ශනය (ශක්‍රයා) දැකැ නො පව්ටුවන් ගේ යම් මිදුමක් වේ නම් එ පරිද්දෙන් සියල්ලන්ගේ බැමි මිදුහ.

5073. සියල්ලන් ගේ බැඳුම් මිදු කල්හි යම් පමණ ජනයා රැස්වූහු ද ඒ සියලු මිනිස්සු මැ මේ ඛණ්ඩහාල බමුණාගේ වධය යි කියා ඔහුට එක එක කැට පහර දුන්හ. (එහි මැ ඔහු මරණයට පැමිණ වූහ යනු යි.)

T – 10

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5074. සඛෙබ පතිංසු[1] නිරයං යථා තං පාපකං කරිත්වාන,
නඞ් පාපකම්මං කත්වා ලබ්භා සුගතිං ඉතො ගන්තුං.

5075. සඛෙබසු විපමුත්තෙසු යෙ ච තත්ථ සමාගතා තදා ආසුං,
චන්දං අභිසිඤ්චිංසු සමාගතා රාජපරිසා ච.

5076. සඛෙබසු විපමුත්තෙසු යෙ ච තත්ථ සමාගතා තදා ආසුං,
චන්දං අභිසිඤ්චිංසු සමාගතා රාජකඤ්ඤායො.

5077. සඛෙබසු විපමුත්තෙසු යෙ ච තත්ථ සමාගතා තදා ආසුං,
චන්දං අභිසිඤ්චිංසු සමාගතා දෙවපරිසා ච.

5078. සඛෙබසු විපමුත්තෙසු යෙ ච තත්ථ සමාගතා තදා ආසුං,
චන්දං අභිසිඤ්චිංසු සමාගතා දෙවකඤ්ඤායො.

5079. සඛෙබසු විපමුත්තෙසු යෙ ච තත්ථ සමාගතා තදා ආසුං,
වෙලුකෙඛපමකරුං සමාගතා රාජපරිසා ච.

5080. සඛෙබසු විපමුත්තෙසු යෙ ච තත්ථ සමාගතා තදා ආසුං,
වෙලුකෙඛපමකරුං සමාගතා රාජකඤ්ඤායො.

5081. සඛෙබසු විපමුත්තෙසු යෙ ච තත්ථ සමාගතා තදා ආසුං,
වෙලුකෙඛපමකරුං සමාගතා දෙවපරිසා ච.

5082. සඛෙබසු විපමුත්තෙසු යෙ ච තත්ථ සමාගතා තදා ආසුං,
වෙලුකෙඛපමකරුං සමාගතා දෙවකඤ්ඤායො.

5083. සඛෙබසු විපමුත්තෙසු බහූ ආනන්දනො අහු වංසො,
නන්දිපපවෙසි නගරං බන්ධනා මොක්ඛා අසොසිත්ථාති.

බණ්ඩාලජාතකං පඤ්චමං.

---

1. සඛෙබපරිච්චා පතිතා – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5074. ඒ පවිටු යාග කොටැ යමසේ සියල්ලෝ නරකයෙහි වැටුණාහු එසේ මැ පවිකම් කොටැ මෙලොවින් සුගතියට යන්නට ද නො ලැබිය හැකි ය යි වදළහ.

5075. හැමදෙනා බන්ධනමුක්ත වූ කලැ එ දවස එහි රැස් වූ යම් කෙනෙක් වූ නම් ඔහු ද රැස් වූ රජ පිරිස ද චන්ද කුමාරයා අභිෂේක කළහ.

5076. හැමදෙනා බන්ධනමුක්ත වූ කලැ එ දවස එහි රැස් වූ යම් කෙනෙක් වූ නම් ඔහු ද රැස් වූ රාජකන්‍යාවෝ ද චන්ද කුමාරයා අභිෂේක කළහ.

5077. හැමදෙනා බන්ධනමුක්ත වූ කලැ එ දවස එහි රැස් වූ යම් කෙනෙක් වූ නම් ඔහු ද රැස් වූ දෙව්පිරිස ද චන්දකුමාරයා අභිෂේක කළහ.

5078. හැමදෙනා බන්ධනමුක්ත වූ කල එ දවස එහි රැස් වූ යම් කෙනෙක් වූ නම් ඔහු ද රැස් වූ දිව්‍යකන්‍යාවෝ ද චන්ද කුමාරයා අභිෂේක කළහ.

5079. හැමදෙනා බන්ධනමුක්ත වූ කලැ එ දවස එහි රැස් වූ යම් කෙනෙක් වූ නම් ඔහු ද රැස් වූ රජ පිරිස ද පිළී හිස සිසැරුහ.

5080. හැමදෙනා බන්ධනමුක්ත වූ කලැ එ දවස එහි රැස් වූ යම් කෙනෙක් වූ නම් ඔහු ද රැස් වූ රාජකන්‍යාවෝ ද පිළී හිස සිසැරුහ.

5081. හැමදෙනා බන්ධනමුක්ත වූ කලැ එ දවස එහි රැස් වූ යම් කෙනෙක් වූ නම් ඔහු ද රැස් වූ දෙව්පිරිස ද පිළී හිස සිසැරුහ.

5082. හැමදෙනා බන්ධනමුක්ත වූ කලැ එ දවස එහි රැස් වූ යම් කෙනෙක් වූ නම් ඔහු ද රැස් වූ දිව්‍යකන්‍යාවෝ ද පිළී හිස සිසැරුහ.

5083. සියල්ලන් බන්ධනයෙන් මිදුණු කල බොහෝ ජනයෝ සතුටු සිතැ'ත්තෝ වූහ. නගරයෙහි කුටු බෙර හැසිරිනි. (අපගේ චන්දකුමාර තෙමේ යමසේ බන්ධනයෙන් මිදුණේ ද එසේ සියල්ලෝ මිදෙත්වා යි) බන්ධනයෙන් මිදීම පිළිබඳ ඝෝෂාව ද කරන ලද්දේය.

පස්වැනි ඛණ්ඩහාල ජාතක යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6. හුරිදත්තජාතකං

5084. යං කිඤ්චි රතනං අත්ථි ධතරට්ඨනිවෙසනෙ,
සබ්බානි තෙ උපායන්තු[1] ධීතරං දෙහි රාජිනො.

5085. න නො විවාහො නාගෙහි කතපුබ්බො කුදාචනං,
තං විවාහං අසංයුත්තං කථං අම්හෙ කරොමසෙ.

5086. ජීවිතං නූන තෙ චත්තං රට්ඨං වා මනුජාධිප,
න හි නාගෙ කුපිතම්හි චිරං ජීවන්ති තාදිසා.

5087. යො තවං දෙව මනුසෙසසු[2] ඉද්ධිමන්තං අනිද්ධිමා,
වරුණස්ස නියං පුත්තං යාමුනං අත්තමකාසි.

5088. නාතිමඤ්ඤාමි රාජානං ධතරට්ඨං යසස්සිනං,
ධතරට්ඨො හි නාගානං බහූනඤ්ඤමපි ඉස්සරො.

5089. අහි මහානුභාවොපි න මෙ ධීතරමාරභෙ,
ඛත්තියො ච විදෙහානං අභිජාතා සමුද්දජා.

5090. කම්බලස්සතරා උට්ඨෙන්තු සබ්බෙ නාගෙ නිවෙදය,
බාරාණසිං පවජ්ජන්තු මා ච කිඤ්චි විහෙඨයුං.

5091. නිවෙසනෙසු සොබ්භෙසු රථියා චච්චරෙසු ච,
රුක්ඛග්ගෙසු ච ලම්බන්තු[3] විතතා තොරණෙසු ච.

5092. අහඤ්ච සබ්බසෙතෙන මහතා සුමහං පුරං,
පරිකඩ්ඪිස්සං මහාගෙහි කාසීනං ජනයං[4] භයං.

5093. තස්ස තං වචනං සුත්වා උරගා තෙකවණ්ණිනො,
බාරාණසිං පවජ්ජිංසු න ච කිඤ්චිවිහෙඨයුං.[5]

5094. නිවෙසනෙසු සොබ්භෙසු රථියා චච්චරෙසු ච,
රුක්ඛග්ගෙසු ච ලම්බිංසු විතතා තොරණෙසු ච.

---

1. උපයන්තු – මජ්ඣ., ස්‍යා.
2. මනුසෙසයාසි – මජ්ඣ., ස්‍යා.
3. ලම්බන්තී – මජ්ඣ.
4. ජනතං – මජ්ඣ.
5. විහෙඨයුං – මජ්ඣ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6. භූරිදත්ත ජාතකය

5084. මහරජ, ධතරට්ඨ නමැති රජහුගේ මාලිගාවෙහි යම්කිසි රත්නයක් ඇද්ද ඒ සියලු රත්නයෝ ඔබගේ මාලිගාවට පැමිණෙත්වා, අප රජුට සමුද්දජා නමැති ඔබගේ දුකුමරිය දීම මැනැවැ'යි නාගයෝ පැවැසූහ.

5085. එම්බා නාගයිනි, කවර කලෙක්හි වත් නයින් සමග අපගේ විවාහයක් සිදු නො වූ විරූ ය. තිරිසනුන් සමග එක්වීම ඇති ඒ විවාහය නුසුදුසු ය. මනුෂ්‍ය වන අපි එය කෙසේ සිදු කරමු ද යි බරණැස් රජ තෙමේ පැවැසී ය.

5086. මහරජ, ඔබ ජීවිතය ද රට ද හැරැදමණලදැ යි සිතමි. නයින් කිපුණු කලැ ඔබ වැන්නෝ බොහෝ කල් ජීවත් නො වෙති.

5087. මහරජ, මිනිසුන් අතරෙහි සෘද්ධි නැති යම් බඳු ඔබ සෘද්ධි ඇති යමුනා ගඟෙහි යට භාගයෙහි උපන් වරුණ නමැති නාරජුගේ සඛකීය පුත් ධතරට්ඨ නාරජු ඉක්මවා සිතන්නාහ යි කීය.

5088. යස පිරිවර ඇති ධතරට්ඨ නමැති නාරජු ඉක්මවා නො සිතමි. ධතරට්ඨ නම් නා රජ තෙමේ වනාහි බොහෝ නයින් හට අධිපති වෙයි.

5089. නාරජ තෙමේ මහත් අනුභාව ඇත්තේ නමුදු මාගේ දුවට නුසුදුසු ය. ක්ෂත්‍රිය වූ සමුද්දජා නමැති මාගේ දුව විශිෂ්ට වූ ජාති ඇත්තී යැ යි බරණැස් රජ තෙමේ පැවැසී ය.

5090. කම්බලඅස්සතර නමැති (මවු පසෙහි වූ) නාගයෝ නැඟී සිටිත්වා, සියලු නාගයන්ට එහා රැස්වන්නට දන්වවු. සියලු නාගයෝ බරණැස් නුවරට පැමිණෙත්වා, තොප ගෙන් කිසි කෙනෙක් කිසිවකුට හිංසා නො කෙරෙත්වා.

5091. ගෙවල්, පොකුණු, වීථි, සන්ධි, ගස්මුදුන්, දෙරටු සහ තොරණ යන මේ තන්හි පැතිරූ එල්බෙත් වා.

5092. මමත් සවිසුදු වූ මහසිරුරකින් යුත් වැ ගොස් කසිරට වැසියනට මහත් බිය උපදවමින් මහනගරය දරණවැලින් වට කරන්නෙමි යි නාරජ තෙමේ කී ය.

5093. එ බස් අසා නන් වන් පැහැ'ති නාගයෝ බරණැස් නුවරට වැදුනාහ. කිසිවකුහට ද හිංසා නො කළාහු ය.

5094. ගෙවල්, පොකුණු, මං සන්ධි, ගස්මුදුන්, දෙරටු සහ තොරණ යන තන්හි පැතිරූ එල්බුණාහ.

5095. තෙ[1] දිසවාන ලම්බන්තෙ පුථු කඤ්චිංසු නාරියෝ,
නාගෙ සොණ්ඩිකතෙ දිසවා පඤ්ඤසන්තෙ මුහුං මුහුං.

5096. බාරාණසී පව්‍යාධිතා[2] ආතුරා සමපජ්ජථ,
බාහා පග්ගය්හ පක්කන්දුං යිතරං දෙහි රාජිනෝ.

නගරඛණ්ඩෝ.

5097. පුප්ඵාභිහාරස්ස වනස්ස මජ්ඣෙ
කෝ ලොහිතක්ඛෝ විහතන්තරංසෝ,[3]
කාඤ්චනඛුකායූරධරා සුවත්ථා
තිට්ඨන්ති නාරියෝ දස වන්දමානා.

5098. කෝ නු තං බ්‍රහාබාහු වනස්ස මජ්ඣෙ
විරොචසි සතසිඛන්තාව අග්ගි,
මහෙසක්ඛෝ අසුසිතරොසි යක්ඛෝ
උදාහු නාගොසි මහානුභාවෝ.

5099. නාගොහමස්මිං ඉද්ධිමා තෙජසී දුරතික්කමෝ,
ඩසෙය්‍යං තෙජසා කුද්ධෝ ජිතං ජනපදං අපි.

5100. සමුද්දජා හි මෙ මාතා ධනරට්ඨා ච මෙ පිතා,
සුදස්සනකනිට්ඨොස්මි හූරිදත්තොත්ති මං විදූ.

5101. යං ගම්භිරං සදවට්ටං රහදං හෙස්මං[4] අවෙක්ඛසි,
එස දිව්‍යා මමාවාසෝ අනෙකසතපොරිසෝ.

5102. මයූරකොඤ්චාභිරුදං නීලොදං වනමජ්ඣතෝ,
යමුනං පවිස මාභිතෝ බෙමං වත්තවනං සිවං.

5103. තත්ථ පත්තෝ සානුචරෝ සහපුත්තෙන බ්‍රාහ්මණ,
පූජිතෝ මයහං කාමෙහි සුඛං බ්‍රාහ්මණ වච්ඡසි.[6]

5104. සමා සමන්තා පරිතෝ බහූක[7] තගරා මහී,
ඉන්දගොපකසඤ්ඡන්නා සොභති හරිතූත්තමා.

---

1. චිතෙසු – මජ්ඣ.
2. සබ්‍යාධිතා – මජ්ඣ.
3. චිතතන්තරංසෝ – මජ්ඣ.
4. තා – මජ්ඣ.
5. ඝිස්මං – මජ්ඣ.
6. වෙච්ඡසි – මජ්ඣ.
7. බහුකාතගගරා – මජ්ඣ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5095. පෙණය කොට වරින් වර පිඹින එල්බෙන නාගයන් දැක්මෙන් බොහෝ ස්ත්‍රීහු හැඬූහ.

5096. බරණැස අතිශයින් පෙළිණ. පීඩාවට පත් ඔවහු රජු වෙත පැමිණියහ. රජුගේ දූ කුමරිය නාරජුහට දෙව යි ඉස අත් බැඳ ඇඬූහ.

නගර කාණ්ඩය.

5097. පුද පිණිස ගෙනෙන ලද මලින් යුතු මෙ වන මැද රතැ'ස් ඇති පිරුණු උරහිස් අතර ඇති ඔබ කවරහු ද, සුවර්ණමය ගෙල පළඳනා හා වළලු ඇති මනා වූ ඇඳුම්න් යුත් කවර නම් ස්ත්‍රීහු දස දෙනෙක් වඳිමින් සිටිත් ද?

5098. මහත් වූ අත් ඇති ගිතෙල් ඉසිණු ගින්නක් මෙන් වන මැද බැබැළෙන ඔබ කවර නම් කෙනෙක් ද? මහත් අනුභාව ඇති යකෙක් ද? නොහොත් අනුභාව සම්පන්න නාගයෙක් ද යි බමුණා ඇසී ය.

5099. මම සෘද්ධි ඇති විෂ ඇති තේජස් ඇති අනුන් විසින් මැඩ පැවැත්විය නො හැකි නාගයෙක්මි. ඉදින් මම කිපියෙම් නම් විෂ තේජසින් මුළු ජනපදය ද දඹට කොට දවා ලන්නෙමි.

5100. සමුද්දජා නම් බිසොව මාගේ මවු තොමෝ ය. ධතරඨ නම් නාරජ මාගේ පිය තෙමේ ය. මම වනාහී සුදස්සන නම් නාරජු ගේ මල් වෙමි. මා භූරිදත්ත යැ යි නාගභවනයෙහි දනිති යි නාරජ කී ය.

5101. හැම කල් පැවැති ගැඹුරු දියසුළි ඇති බිහිසුණු යම් විලක් දක්නෙහි ද? නොයෙක් සිය ගණන් පුරුෂ ප්‍රමාණ ඇති ඒ විල වනාහී මාගේ දිව්‍යමය වූ වාසස්ථානය යි.

5102. දෙ ඉවුරු වන පෙතැ වෙසෙන මොණරුන් විසින් ද කොස්වා ලිහිණියන් විසින් ද පැවැත්වෙන නද ඇති නිල්වන් ජලය ඇති ආවාර සම්පන්නයන් වාසය කරන ක්ෂේමභූමි වූ මේ යමුනා ගඟට භය නැති වැ පිවිසෙව යි නාරජ කී ය.

5103. අනුචරයන් හා එහි පැමිණි පුතු සහිත බමුණාට පිදුයේ බ්‍රාහ්මණය, මා සතු කම්සැපතින් සුවසේ වසන්නැ යි නාරජ කී ය.

5104. පින්වත් නාරජ, ඔබගේ භවන පිළිබඳ මේ පොළොව සියලු දිසා සමතලා ය. තුවරලා බොහෝ ඇති රන්වන් ඉදු ගොව්වන් ගෙන් ගැවසීගත් නිල්වන් කුසතණින් බැබැළෙයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5105. රම්මා වනවෙත්‍යානි රම්මා[1] හංසූපකූජිතා,
ඔපුප්ඵපදමා තිට්ඨන්ති පොක්ඛරඤ්ඤූ සුනිම්මිතා.

5106. අට්ඨංසා සුකතත්තම්හා සඛෙ වෙළුරියාමයා,
සහස්සථම්භා පාසාද පූරා කඤ්ඤූහි ජොතරෙ.

5107. විමානං උපපන්නොසි දිබ්බං පුඤ්ඤූහි අත්තනො,
අසම්බාධං සිවං රම්මං අවචන්නාසුඛසංහිතං.

5108. මඤ්ඤූ යහස්සනෙත්තස්ස විමානං නාභිකඞ්ඛසි,
ඉදඤී හි ත්‍යායං විපුලා යක්ඛසෙසව ජුතීමතො.

5109. මනසාපි න පත්ථෙබ්බා අනුභාවා ජුතීමතො,
පරිවාරයමානානං සඉන්දූනං වසවත්තිනං.

5110. තං විමානං අභිජ්ඣාය අමරානං සුඛෙසිනං,
උපොසථං උපවසන්නා සෙමි වම්මිකමුද්ධනී.

5111. අහඤ්ච මිගමෙසානො සපුත්තෙ පාවිසිං වනං,
තං මං මතං වා ජීවං වා නාභිවෙදෙනති ඤාතකා.

5112. ආමන්තයෙ භූරිදත්තං කාසිපුත්තං යසස්සිනං,
තයා වො සමනුඤ්ඤූතා අපි පස්සෙමු ඤාතකෙ.

5113. එසොහි වත මෙ ජඤ්ඤූ යං වසෙසි මමන්තිකෙ,
නහි එතාදිසා කාමා සුලභා හොනති මානුසෙ.

5114. සචෙ ත්වං න ඉච්ඡසෙ වත්තුං මම කාමෙහි පූජිතො,
මයා ත්වං සමනුඤ්ඤූතො සොත්ථිං පස්සාහි[2] ඤාතකෙ.

5115. ධාරයීමං මණිං දිව්‍යං පසුං පුත්තෙන ච විත්තති,
අරොගො සුඛිතො හොති ගවෙජවාදය බ්‍රාහ්මණ.

---

1. රමා – මජ්ඣ.
2. පස්සෙසි – මජ්ඣ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5105. වනපෙත සිත්කලු ය. හංසයන් පවත්වන නාද ඇති පිපී වැටුණු පියුම් පෙති ඇති සිත්කලු පොකුණු ද මැනැවින් නිමවන ලද යැ

5106. අටැස් කොට මැනැවින් කැරුණු වෙරළු මිණිමුවා දහසක් ටැම් ඇති ප්‍රාසාදයෝ නාගකන්‍යාවන් ගෙන් පිරුණාහු බැබැළෙති.

5107. සිය පිනින් පහළ වූ කරදර නැති උවදුරු රහිත වූ සිත්කලු වූ ඒකාන්තයෙන් සැප ඇති මේ දිව්‍ය විමානයෙහි උපන්නෙහි ය.

5108. යම්හෙයකින් ඔබ පිළිබඳ වූ මේ සම්පත්තිය බැබැළෙන සක්දෙවිඳුන්ගේ මෙන් මහත් ද එසේ වුවත් සක්දෙවිඳුන්ගේ වෛජයන්තප්‍රාසාදය නො කැමැත්තෙහි යැ යි සිතමි.

5109. සැපතින් මහත් සක්දෙවිඳුන්ගේ අනුභාව (කොතරම් ද යි කිව හොත්) සක්දෙවිඳුන් සහිත දෙවියනට මෙහෙ කරන අපට සිතන්නට ද නො හැකි වේ යැ යි නාරජ කී ය.

5110. සුව කැමැති දෙවියන්ගේ ඒ විමන පතා මම තුඹස මතැ සයනය කෙරෙමි යි නාරජ කී ය.

5111. පින්වත් නාරජ, මම ද මුවන් සොයමින් පුතු සමඟ වනයට පිවිසියෙමි. ඒ මා මළ නො මළ බව අප නැයෝ නො දනිති.

5112. කසිරජහුගේ දුවගේ පුත් යස පිරිවර ඇති භූරිදත්ත නමැති තොප අමතමි. තොප විසින් අනුදන්නා ලද අපි ගොස් නැයන් දකිමු යි බමුණා කී ය.

5113. මා වෙත වසන්නෙහි යන යමක් වෙයි ද, මේ වනාහි ඒකාන්තයෙන් මගේ කැමැත්ත ය. මිනිස් ලොවැ මෙ බඳු කම් සැප නො සුලබ ය.

5114. ඉදින් මා සතු කම්සැපතින් පිදූ තෙපි මෙහි වාසයට නො කැමැත්තහු නම් මා විසින් දෙන ලද අවසර පරිදි සුවසේ ගොස් නැයන් දකින්නැ යි නාරජ කී ය.

5115. මේ දිව්‍යමය මැණික දරන තැනැත්තේ මෙහි අනුභාවයෙන් ගවයන් ද දරුවන් ද ලබයි. බමුණ මේ මැණික රැගෙන යන්න නිරොගි සැප ඇත්තෙක් වන්නෙහි කියා කැමැති සියලු සම්පත් දෙන මැණිකක් දුනි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5116. කුසලං පටිනන්දාමි භූරිදත්ත වචො තව,
පඛ්ඛජිස්සාමි ජිණ්ණොසමි න කාමෙ අභිපත්ථයෙ.

5117. බ්‍රහ්මචරියස්ස චෙ භඞ්ගො හොති භොගෙහි කාරියං,
අච්කම්පමානො එය්‍යාසි බහුං දස්සාමි තෙ ධනං.

5118. කුසලං පටිනන්දාමි භූරිදත්ත වචො තව,
පුනපි ආගමිස්සාමි සචෙ අත්ථො භවිස්සති.

5119. ඉදං වත්වා භූරිදත්තො පෙසෙසි චතුරො ජනෙ,
එථ ගච්ඡථ උට්ඨෙථ ඛිප්පං පාපෙථ බ්‍රාහ්මණං.

5120. තස්ස තං වචනං සුත්වා උට්ඨාය චතුරො ජනා,
පෙසිතා භූරිදත්තෙන ඛිප්පං පාපෙසුං බ්‍රාහ්මණං.

වනප්පවෙසකණ්ඩො.

5121. මණිං පග්ගය්හ මඞ්ගල්‍යං සාධු චිත්තං මනොරමං,
සෙලං ව්‍යඤ්ජනසම්පන්නං කො ඉමං මණිමජ්ඣගා.

5122. ලොහිතක්ඛසහස්සසාහි[1] සමන්තා පරිවාරිතං,
අජ්ජ කාලං පදං[2] ගච්ඡං අජ්ඣගාහං මණිං ඉමං.

5123. සුපච්ණ්ණො අයං සෙලො අච්චිතො මහිතො සදා,
සුධාරිතො සුනික්ඛිත්තො සඛ්ඛත්ථමභිසාධයෙ.

5124. උපචාරවිපන්නස්ස නික්ඛෙපෙ ධාරණාය වා,
අලං[3] සෙලො විනාසාය පරිච්ණ්ණො අයොනිසො.

5125. න ඉමං අකුසලො දිව්‍යං[4] මණිං ධාරෙතුමාරහො,
පටිපජ්ජ සතං නික්ඛං දෙහිමං රතනං මමං.

5126. න වා[5] ම්‍යායං මණි කෙය්‍යො ගොහි වා රතනෙන වා,[6]
සෙලො ව්‍යඤ්ජනසම්පන්නො නෙව කෙය්‍යො මණි මමං.

---

1. සහසෙසහි – මජසං.
2. පථං – මජසං
3. අයං – මජසං, ටී.
4. න ඉමං කුසලං දිබ්‍යං – මජසං.
5. නෙව – මජසං.
6. නික්ඛෙහි රතනෙහි වා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5116. පින්වත් භූරිදත්ත නාරජ, ඔබගේ නිදෙස් බස් අසා තුටුවෙමි. මම වනාහි දිරාපත් වීමි. එහෙයින් පැවිදි වන්නෙමි. කම් සැප නො පතන්නෙමි. මට මැණිකෙන් ප්‍රයෝජන කිමැ යි බමුණා කී ය.

5117. බ්‍රාහ්මණය, ඉදින් බඹසර බිඳුමක් වුණි නම් වස්තුවෙන් කටයුත්තක් ඇති වුණි නම් එ කලැ නිසැක වැ මා වෙත එනු තොපට බොහෝ ධන දෙන්නෙමි යි නාරජ කී ය.

5118. පින්වත් භූරිදත්ත නාරජ, ඔබගේ නිදෙස් බසට කැමැති වෙමි. ඉදින් මට ප්‍රයෝජනයක් වෙයි නම් නැවැත ද ඔබ වෙත එන්නෙමි යි බමුණා කී ය.

5119. භූරිදත්ත නාරජ තෙමේ මෙ බස් කියා නයින් සතර දෙනකුන් යැවී, වරෙවු, යවු, මොවුන් නැගිටුවවු, බ්‍රාහ්මණයා බරණැසට යන මගට වහා පමුණුවවු යි කී ය.

5120. ඔහුගේ එ බස් ඇසූ නාගයෝ සිවුදෙන භූරිදත්ත රජු විසින් මෙහෙයවන ලද්දහු නැගිට බ්‍රාහ්මණයා බරණැස් මගට වහා පැමිණවූහ.

වනප්‍රවෙශ කාණ්ඩය.

5121. මංගල සම්මත වූ සුඳුර වස්තුවක් වන සිත්කලු ලක්ෂණ සම්පන්න වූ මේ මැණික කොහි දී ලැබුවෙහි ද යි බමුණා ඇසී ය.

5122. අද උදැසන මහමග යන්නෙම් රතු ඇස් ඇති නාග-කන්‍යාවන් දහසක් විසින් හාත්පසින් පිරිවරනලද මේ මැණික ලදිමි යි ආලම්බන තෙමේ කී ය.

5123. හැම කල්හි මැනැවින් කැරුණු අදර ගරු බුහුමන් ඇති මේ මැණික මනා වැ දරන ලද්දේ මැනැවින් බහා තබන ලද්දේ සියලු අපි සිදු කර ලන්නේ ය.

5124. පැළැඳීමෙහි ද බහා තැබීමෙහි ද නුනුවණින් පරිහරණ කැරුණු මේ මැණික උපචාර විපන්නයාගේ විනාශයට හේතු වේ ය.

5125. උපචාරයෙහි අදක්ෂ වූ යේ මේ දිවාමාණික්‍ය දුරීමට නුසුදුසු ය. එහෙයින් රන්නීක සියයක් ගනුව, මේ මැණික මට දෙව යි බ්‍රාහ්මණයා කී ය.

5126. මාගේ මේ මැණික ගවයන් සඳහා හෝ රත්නයන් සඳහා හෝ නො විකිණියයුතු ය. සියලු ලකුණින් යුත් මේ මැණික නො විකිණියයුතු මැ යි ආලම්බන තෙමේ කී ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5127. නො වෙ තයා මණි කෙයේ‍යා ගොහි වා රතනෙන වා.
අථ කෙන මණි කෙයේ‍යා තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

5128. යො මෙ සංසෙ මහානාගං තෙජසිං දුරතික්කමං,
තස්ස දජ්ජං ඉමං සෙලං ජලතතරිව තෙජසා.

5129. කොනු බ්‍රාහ්මණවණ්ණෙන සුපණ්ණො[1] පතතං වරො,
නාගං ජිගිංසමන්වෙති අන්වෙසං භක්ඛමත්තනො.

5130. නාහං දිජාධිපො හොමි න දිට්ඨො ගරුළො මයා,
ආසීවිසෙන විත්තොති වෙජ්ජො[2] මං බ්‍රාහ්මණං විදූ.

5131. කින්නු තුය්හං බලං අත්ථි කිං සිප්පං විජ්ජතෙ තව,
කිස්මිං වා ත්වං පරත්ථද්ධො උරගං නාපචායසි.

5132. ආරණ්ණකස්ස ඉසිනො චිරරත්තතපස්සිනො,
සුපණ්ණො කොසියස්සක්ඛා විසවිජ්ජං අනුත්තරං.

5133. තං භාවිතත්තණ්ණතරං සම්මන්තං[3] පබ්බතන්තරෙ,
සක්කච්චං තං උපට්ඨාසිං රත්තින්දිවමතන්දිතො.

5134. සො තදා පරිචිණ්ණො මෙ වතවා[4] බ්‍රහ්මචරියවා,
දිබ්බං පාතුකරී මන්තං කාමසා භගවා මමං.

5135. ත්‍යාහං මන්තෙ පරත්ථද්ධො නාහං භායාමි භොගිනං,
ආචරියො විසඝාතානං අලම්බානොති මං විදූ.

5136. ගණ්හාමසෙ මණිං තාත සොමදත්ත විජානහි,
මා දණ්ඩෙන සිරිං පත්තං කාමසා පජහිම්හසෙ.

5137. සකං නිවෙසනං පත්තං සො තං බ්‍රාහ්මණ පූජයි,
එවං කල්‍යාණකාරිස්ස කිං මොහා දූහිමිච්ඡසි.

5138. සචෙ හි ධනකාමොසි භූරිදත්තො[5] පදස්සති,[6]
තමෙව ගන්ත්වා යාචස්සු බහුං දස්සති තෙ ධනං.

---

1. සුබණ්ණෙ - මජසං.
2. විජ්ජො - මජසං.
3. සමන්තං - මජසං.
4. වත්තං වා - මජසං. වත්වා - සීමු.
5. භූරිදත්තං - මජසං.
6. පදියසසි - මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5127. ඉදින් ගවයන් සඳහා හෝ රත්නයන් සඳහා හෝ මැණික නො විකිණියයුතු නම් කුමකට විකිණියයුතු දැ යි අසන ලද නුඹ මට එය කිය ව යි බමුණා කී.

5128. ඉක්මවිය නො හැකි තේජස් ඇති (භූරිදත්ත) නාගරාජයා ගැන යමෙක් මට කියා නම් ඔහුට ප්‍රභාවෙන් දිලියෙන්නාක් වැනි මේ මැණික දෙමි යි ආලම්බන තෙමේ කී ය.

5129. කිම? ඔබ බමුණු වෙසින් ආ පක්ෂින්ට උතුම් ගුරුළුරජ වෙයි ද, තමනට ගොදුරු වන නයකු අල්වා ගනු කැමැත්තෙන් සොයා ඇවිදිනේ ය යි සිතමි යි බ්‍රාහ්මණයා කී ය.

5130. මම ගුරුළෙක් නො වෙමි. මා විසින් ගුරුළෙක් නො දක්නා ලද්දේ ය. නාග විෂ බස්වන ආලම්බන නම් වෛද්‍ය බ්‍රාහ්මණයෑ යි මා දනිති යි ආලම්බන තෙමේ කී ය.

5131. ඔබට කිනම් බලයක් ඇත්තේ ද කිනම් ශිල්පයක් තිබේ ද කිනම් කරුණෙක්හි තදින් පිහිටි ඔබ නාගයාට අවමන් හෝ කරන්නෙහි දැ යි ඔහුගෙන් බ්‍රාහ්මණයා ඇසී ය.

5132. වනයෙහි වෙසෙන බොහෝ කල් දරන ලද තපස් ඇති කෝශීය ගෝත්‍ර ඍෂිවරයාට ගුරුළෙක් විෂ බස්වන උතුම් මන්ත්‍රයක් කීවේ ය.

5133. පර්වත අතර වෙසෙන උන්වහන්සේ වනාහි වැඩුණු සිත් ඇති තාපසයන්ගෙන් කෙනෙකි. දිවා රෑ අනලස් වූ මම උන් වහන්සේට සකසා උවැටැන් කෙළෙමි.

5134. එ සඳ මා විසින් බුහුමන් කැරැණු සිල්වත් බඹසර ඇති ඒ පින්වත් තවුස් තෙමේ සිය කැමැත්තෙන් මැ මට මේ දිව්‍යමන්ත්‍රය පැවැසී ය.

5135. මම ඒ මන්ත්‍රය ඇසුරු කෙළෙමි. එහෙයින් මම සර්පයන්ට බිය නැත්තේ වෙමි. විෂ බස්වන වෙදුන්ට ඇදුරු වූ ආලම්බන යැ යි මා දනිති යි කී ය.

5136. පුත සොමදත්ත, මේ මැණික ගනිමු. ඔබ ද එය දන්නේ මැනැවි. වෙත පැමිණි සිරිකතට දඬුයෙන් පහර දී දුරු නො කරමු යි බමුණා (සියපුත්) සොමදත්තට කී ය.

5137. එම්බා බ්‍රාහ්මණය, සිය නිවසට පැමිණි ඔබට හෙතෙමේ පූජා කෙළේ ය. මෙසේ යහපත කරන ඔහුට කවර හෙයින් මෝහයෙන් මිත්‍රද්‍රෝහ කරන්නට කැමැත්තෙහි ද?

5138. ඉදින් වස්තුව කැමැත්තෙහි නම් භූරිදත්ත නාරජ එය ඔබට දෙන්නේ ය. ඔහු වෙත පැමිණ ඉල්ලීම යෙහෙකි. බොහෝ ධන ඔබට දෙන්නේ යැ යි පුත් සෝමදත්ත තෙමේ කී ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5139. හත්ථගතං පත්තගතං නික්කිණ්ණං ඛාදිතුං වරං,
මා නො සන්දිට්ඨිකො අත්ථො සොමදත්ත උපච්චගා.

5140. පච්චති නිරයෙ ඝොරෙ මහිස්සමවදීයති,[1]
මිත්තදුභී[2] හිතච්චාගී ජීවරෙවාපි සුස්සරෙ.

5141. සචෙ හි ධනකාමොසි භූරිදත්තො පදස්සති,
මඤ්ඤෙ අත්තකතං වෙරං නච්රං වෙදයිස්සසි.

5142. මහායඤ්ඤං යජිත්වාන එවං සුජ්ඣනති බ්‍රාහ්මණා,
මහායඤ්ඤං යජිස්සාම එවං මොක්ඛාම පාපකා.

5143. හන්දදානි අපායාමි නාහං අජ්ජ තයා සහ,
පදමෙපකං නගච්ඡෙය්‍යං එවං කිබ්බිසකාරිනා.

5144. ඉදං වත්වාන පිතරං සොමදත්තො බහුස්සුතො,
උජ්ඣාපෙත්වාන භූතානි තම්හා ඨානා අපක්කමි.

5145. ගණ්හාහෙතං මහානාගං ආහරෙතං මණිං මම,
ඉන්දගොපකවණ්ණාභො යස්ස ලොහිතකො සිරො.

5146. කප්පාසපිචුරාසීව එසො කායස්ස දිස්සති,[3]
වම්මිකග්ගගතො සෙති තං ත්වං ගණ්හාහි බ්‍රාහ්මණ.

5147. අථොසධෙහි දිබ්බෙහි ජපං මන්තපදානි ච,
එවං තං අසක්ඛි සට්ඨුං[4] කත්වා පරිත්තමත්තනො.

කීළනඛණ්ඩො.

5148. මමං දිස්වාන ආයන්තං සබ්බකාමසමිද්ධිනං,
ඉන්ද්‍රියානි අහට්ඨානි සාවං ජාතං[5] මුඛං තව.

5149. පදුමං[6] යථා හත්ථගතං පාණිනා පරිමද්දිතං,
සාවං ජාතං මුඛං තුය්හං මමං දිස්වාන එදිසං

---

1. මහිස්සමවි ච්චරති – මජ්ජ. මහිමස්ස චින්ද්‍රියති – ස්‍යා.
2. මිත්තදුබ්බි – මජ්ජ., ස්‍යා.
3. කායො දිස්සති – මජ්ජ., ස්‍යා.
4. සත්ථුං – මජ්ජ. ඵුට්ඨුං – ස්‍යා.
5. ජාතිං – මජ්ජ.
6. පදම – මජ්ජ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5139. පුත සෝමදත්තය, අතට හෝ භාජනයට පැමිණි හෝ ඉදිරියෙහි තැබූ හෝ යමක් වේ නම් එය අනුභවයට උතුම් ය. තමන්ට පෙනෙන ලාභය ඉක්මැ නොයේවයි බ්‍රාහ්මණ තෙමේ කීය.

5140. පියාණෙනි, යමෙක් තමන්ගේ යහපත කැමැත්තවුන් හැර මිත්‍රද්‍රෝහී වේ ද හේ මරණින් මතු දරුණු නිරයෙහි පැසෙන්නේ ය. ජීවත් වුව ද මොහුට පොළොව විවර වෙයි. හේ ජීවත් වූයේ නමුදු වියැළේ.

5141. ඉදින් ධන කැමැත්තෙහි නම් හූරිදත්ත තෙමේ එය දෙන්නේ ය. තමා කළ පාපයෙහි විපාකය නොබෝ කලෙකින් විඳින්නෙහි යැ යි සිතමි යි සෝමදත්ත කී ය.

5142. සෝමදත්ත පුත, බමුණෝ වනාහි මෙසේ කළ පවින් මහත් යාග කොට පිරිසුදු වෙති. අපි මහායාගයක් කරමු. එසේ කිරීමෙන් එ පවින් මිදෙමු යි බමුණා කී ය.

5143. එසේ නම් මම දැන් ඉවත් වැ යෙමි. මෙසේ පටු කරන ඔබ සමග අද මම පියවරක්වත් නො යමි යි සෝමදත්ත කී ය:

5144. නුවණැති සෝමදත්ත තෙමේ පියාණන්ට මෙය කියා දෙවියනට ද උස්හඬින් පවසා එතැනින් ගියේ ය.

5145. යම් නාගයකුගේ රක්තවර්ණ හිස රතිඳුගොවු පැහැයට බඳු ප්‍රභා ඇත්තේ ද ඒ මේ මහනාගයා අල්ලා ගනුව. මේ මැණික මට දෙව.

5146. මොහුගේ සිරුර කපුපුළුන් රැසක් මෙන් පෙනේ. හෙ තෙමේ කුඔස මතු හොවී. බ්‍රාහ්මණය, ඒ නාගයා අල්ලා ගනුව යි කී ය.

5147. ඉක්බිති දිවඔසුවෙන් ද මන්ත්‍රයෙන් ද තමන්හට ආරක්ෂා කරමින් ඒ ආලම්බන තෙමේ හූරිදත්ත නාගරාජයා අල්ලන්නට හැකි වූයේ විය.

ක්‍රීඩා කාණ්ඩය.

5148. මැණියනි, සියලු කම්සැපතින් වැඩුණු මා දැක්මෙන් ඔබගේ ඉදුරෝ විප්‍රසන්න නො වූහ. රන්කැඩපතකට බඳු මුහුණ ද කළුවන් වී ය.

5149. මා දැක්මෙන් ඔබ මුහුණ, අතින් කඩා අත්ලෙන් පිරිමදින ලද පියුම මෙන් කළු වූයේ කවර හෙයින් ද යි සුදස්සන නම් නාරජ ඇසී ය.

5150. කච්චින්නු තෙ නාභිසයි කච්චි තෙ අත්ථි වෙදනා,
යෙන සාවං මුඛං තුඤ්ඤං මමං දිස්වාන ආගතං.

5151. සුපිනං තාත අද්දක්ඛිං ඉතො මාසං අධොගතං,
දක්ඛිණං විය මෙ බාහං[1] ඡෙත්වා රුහිරමක්ඛිතං;
පුරිසො ආදය පක්කාමි මමං රොදන්තියා සති.

5152. යතො තං[2] සුපිනමද්දක්ඛිං සුදස්සන විජානහි,
තතො දිවා වා රත්තිං වා සුඛං මෙ න උපලබ්භති.[3]

5153. යං පුබ්බෙ පරිචාරිංසු[4] කඤ්ඤා රුචිරවිග්ගහා,
හෙමජාලපටිච්ඡන්නා භූරිදත්තො න දිස්සති.

5154. යං පුබ්බෙ පරිචාරිංසු නෙත්තිංසවරධාරිනො,
කණිකාරා[5] විය සම්ඵුල්ලා භූරිදත්තො න දිස්සති.

5155. හන්දදානි ගමිස්සාම භූරිදත්තනිවෙසනං,
ධම්මට්ඨං සීලසම්පන්නං පස්සාම තව භාතරං.

5156. තඤ්ච දිස්වාන ආයන්තිං[6] භූරිදත්තස්ස මාතරං,
බාහා පග්ගය්හ පක්කන්දුං භූරිදත්තස්ස නාරියො.

5157. පුත්තං තෙය්‍යෙ න ජානාම ඉතො මාසං අධොගතං,
මතං වා යදි වා ජීවං භූරිදත්තං යසස්සිනං.

5158. සකුණී හතපුත්තාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
චිරං දුක්ඛෙන ඣායිස්සං භූරිදත්තං අපස්සති.

5159. සකුණී හතපුත්තාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
තෙන තෙන පධාවිස්සං පියපුත්තං අපස්සති.

5160. කුරරී හතඡාපාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
චිරං දුක්ඛෙන ඣායිස්සං භූරිදත්තං අපස්සති.

5161. සා නූන චක්කවාකීව පල්ලලස්මිං අනූදකෙ,
චිරං දුක්ඛෙන ඣායිස්සං භූරිදත්තං අපස්සති.

---

1. බාහුං - මජ්ඣං, ස්‍යා.
2. හං - මජ්ඣං. ස්‍යා.
3. නොපලබ්භ - මජ්ඣං. ස්‍යා.
4. පරිචාරිංසු - මජ්ඣං. ස්‍යා.
5. කණිකාරාව - මජ්ඣං., ස්‍යා
6. ආයන්තං - මජ්ඣං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5150. කිම, ඔබට කිසිවෙක් හිංසා කෙළේ ද? කිම, ඔබට කිසියම් වේදනා ඇද්ද? යම් කරුණකට මෙහි පැමිණි මා දැකැ ඔබ මුහුණ කළු වී ද? එ කරුණ මට පවසනු මැනැවැ යි කී ය.

5151. පුත, සිහිනයක් දිටිමි. එයට මසක් ඉක්මිණ. මාගේ දකුණු අත කැපුමෙන් ලේ වැගිරෙන්නාක් මෙන් විය, හඬමින් සිටින කලැ රතු ඇස් ඇති කළු පුරුෂයෙක් මා රැගෙන ගියේ ය.

5152. එම්බා සුදසඝන පුත, යම් දිනෙක මම ඒ සිහිනය දිටිමි ද එදා සිට දිවා රෑ මට සුවයක් නම් නැතැ යි දැන ගනුව යි කී ය.

5153. පෙරැ රන්දලින් වැසූ මනහර ශරීර ඇති නාග කන්‍යාවෝ යමකු පිරිවැරූ ද ඒ භූරිදත්ත නමැති නාරජ දැන් නො පෙනේ.

5154. මැනැවින් පිපුණු කිණිහිරි රුක් මෙන් කඩු දරන උතුම් නාගමානවකයෝ පෙරැ යමකු පිරිවැරූ ද ඒ භූරිදත්ත තෙමේ දැන් නො පෙනේ.

5155. එහෙයින් අපි දැන් භූරිදත්ත ගේ නිවෙසට යමු. දැහැමි සිල්වත් ඔබ ගේ සොහොවුරා දකිමු යි මැණියෝ පැවැසූ හ.

5156. භූරිදත්ත නාරජු ගේ ඒ එන මැණියන් දැක භූරිදත්ත නාරජු ගේ ස්ත්‍රීහු හිසැ අත් බැඳැ ගෙන (ඉහ අත් බඳගෙන) හැඬූහ.

5157. ආයස්මාවෙනි, යසස් ඇති භූරිදත්ත නමැති ඔබ පුතා මෙළේ ද? නැතහොත් ජීවත් වේ ද? මෙයින් මසක් පමණ කලක සිට නො දකිමු යි පැවැසූහ.

5158. හිස් වූ කැඳුල්ල දැකීමෙන් නැසුණු පැටව් ඇති ළිහිණියක මෙන් භූරිදත්ත නො දක්නා මම බොහෝ කල් සිට දුකින් තැවෙමි.

5159. හිස් වූ කැඳුල්ල දැක්මෙන් එහා මෙහා දුවන, නැසුණු පැටවුන් ඇති ළිහිණියක මෙන් ප්‍රිය පුතු නො දක්නා මම ඒ ඒ තැන දුවමි.

5160. හිස් වූ කැඳුල්ල දැක්මෙන් පැටවුන් නැසුණු බව දන් කබරුස්සක මෙන් භූරිදත්ත නමැති පුතු නො දක්නා මම බොහෝ කල් සිට දුකින් තැවෙමි.

5161. භූරිදත්ත නමැති පුතු නො දක්නා ඒ මම දිය සිඳුණු කුඩා විලෙකැ සක්වා ළිහිණියක මෙන් බොහෝ කල් මුළුල්ලෙහි දුකින් තැවෙමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5162. කම්මාරානං යථා උක්ඝා අන්තො ඣායති නො බහි,
එවං ඣායාමි සොකෙන භූරිදත්තං අපස්සති.

5163. සාලාව සම්පමථිතා[1] මාලුතෙන පමද්දිතා,
සෙන්ති පුත්තා ච දරා ච භූරිදත්තනිවෙසනෙ.

5164. ඉදං[2] සුත්වාන නිග්ඝොසං භූරිදත්තනිවෙසනෙ,
අරිට්ඨො ච සුභගො[3] ච උපධාවිංසු[4] අනන්තරා.

5165. අම්ම අස්සාස මා සොචි එවං ධම්මා හි පාණිනො,
චවන්ති උපපජ්ජන්ති එසස්ස පරිණාමිතා.[5]

5166. අහම්පි තාත ජානාමි එවං ධම්මා හි පාණිනො,
සොකෙන ච පරෙතස්මිං භූරිදත්තං අපස්සති.

5167. අජ්ජ වෙ මෙ ඉමං රත්තිං සුදස්සන විජානහි,
භූරිදත්තං අපස්සන්ති මඤ්ඤෙ හෙස්සාමි[6] ජීවිතං.

5168. අම්ම අස්සාස මා සොචි ආනයිස්සාම භාතරං,
දිසොදිසං ගමිස්සාම භාතුපරියෙසනං චරං.

5169. පබ්බතෙ ගිරිදුග්ගෙසු ගාමෙසු නිගමෙසු ච,
ඔරෙන දසරත්තස්ස[7] භාතරං පස්ස ආගතං.

5170. හත්ථා පමුත්තො උරගො පාදෙ තෙ නිපතී භුසං,
කච්චි[8] තං නු ඩසී තාත මා භායි සුඛිතො භව.[9]

5171. නෙව මස්ශං අයං නාගො අලං දුක්ඛාය කායචි,
යාවතත්ථි අහිග්ගාහා මයා භියේ‍යා න විජ්ජති.

5172. කොනු බ්‍රාහ්මණ වණ්ණෙන දත්තො පරිසමාගමා,
අවහයන්තු සුයුද්ධෙන සුණාතු පරිසා මමං.

---

1. සංපමද්දිතා – මජ්ස.
2. තෙසං – මජ්ස. ස්‍යා.
3. සුභොගොච – මජ්ස. ස්‍යා.
4. පධාවිංසු – මජ්ස. ස්‍යා.
5. පරිණාමතා – මජ්ස. ස්‍යා.
6. හිස්සාමි – මජ්ස. ස්‍යා.
7. රත්තරත්තස්ස – මජ්ස. ස්‍යා.
8. කච්චිතං ඩංසිතො – මජ්ස. කච්චි යිංනුඩතො – ස්‍යා.
9. තව – මජ්ස.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5162. කඹුරු උදුනැ යම්සේ ඇතුළත මැ ගිනි ඇවිළේ ද පිටත නො ඇවිළේ ද එ මෙන් භූරිදත්ත නො දක්නා මම සොවින් දැවෙමි යි මැණියෝ වැලැපුණාහ.

5163. භූරිදත්ත නාරජුගේ භවනයෙහි අඹුදරුවෝ යුගත් මාරුතයෙන් ඇලළීගිය සල්ගස් මෙන් ශෝකයෙන් වෙසෙති යි (බුදුහු වදළහ.)

5164. අරිට්ඨ යැ සුභග යැ යන නාරජහු දෙදෙන අනතුරු වැ භූරිදත්ත නමැති නාරජුගේ භවනයෙහි මේ ශබ්දය ඇසීමෙන් එහි දිවගියහ.

5165. මැණියනි, අස්වැසෙවු, ශෝක නො කරවු, සත්ත්වයෝ වනාහි මෙ බඳු සභාව ඇත්තෝ මැ වෙති. මැරෙති උපදිති යන මෙය ලෝකයේ පිරිනැමීම යැ යි කීහ.

5166. පුත, මම ද දනිමි. සත්ත්වයෝ මෙ බඳු සභාව ඇත්තෝ මැ යැ. එහෙත් භූරිදත්ත නො දක්නා මම සොවින් පෙළුනා වෙමි.

5167. පුත සුදස්සන, ඉදින් අද රෑ භූරිදත්ත නො දක්නී නම් මගේ ජීවිතය හරින්නෙමි යි සිතමි. එ දනුව යි මැණියෝ පැවැසූහ.

5168. මැණියෙනි, සැනසෙනු මැනැවි. ශෝක නො කළ මැනැවි. සොහොයුරා සොයා ඉගන එන්නෙමු. සොහොයුරා සොයමින් දිසානුදිසාවනට යන්නෙමු.

5169. පර්වත ගිරිදුර්ගයන්හි ද ගම්නියම්ගම්හි ද ඇවිදි සොයන්නෙමු. රෑ දසයකින් හෙවත් දස දවසකින් මොබ ආ සහෝදරයා බලනු මැනැවැ යි පුත්‍රයෝ පැවැසූහ.

5170. (මා) අතින් මිදුණු සර්පයා ඔබගේ භයෙහි බලවත් සේ පනිත විය. කිම, ඔබ දෂ්ට කෙළේ ද? බිය නො වෙව, සුවපත් වෙව යි ආලම්බායන කී ය.

5171. මේ නාගයා සුළු පමණින් වත් මට දුකක් ඉපැදවීමට නො පොහොසත් ය. යම් පමණ අහිතුණ්ඩිකයෝ වෙත් ද මට වැඩි සමතෙක් නැතැ යි (තාපස වේසයෙන් ආ සුදස්සන නමැති නාරජ කී ය.)

5172. බමුණු වෙසින් කවර නම් අඩ බාලයෙක් මා යුද්ධයට කැඳවමින් මෙ පිරිස වෙත පැමිණියේ ද? පිරිස මාගේ බස අසාවා යි ආලම්බායන කී ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5173. ත්වං මං නාගෙන ආලම්ඛ අහං මණ්ඩුකජාපියා,
හොතු නො අබහුතං තත්ථ ආසහස්සෙහි පඤ්චහි.

5174. අහං හි වසුමා අඩ්ඪො ත්වං දළිද්දෙසි මාණව,
කො නු තෙ පටිභොගත්ථි උපජුතඤ්ච[1] කිං සියා.

5175. උපජුතඤ්ච මෙ අස්ස පාටිභොගො ච තාදිසො,
හොතු[2] නො අබහුතං තත්ථ ආසහස්සෙහි පඤ්චහි.

5176. සුණොහි මෙ මහාරාජ වචනං හද්දමත්ථු තෙ,
පඤ්චන්නං මෙ සහස්සානං පාටිභොගොහි කිත්තිමා.

5177. පෙත්තිකං වා ඉණං හොති යං වා හොති සයං කතං,
කිං ත්වං එවං බහුං මඤ්ඤං ධනං යාචසි බ්‍රාහ්මණ.

5178. ආලම්බානො[3] හි නාගෙන මමං අභිජිගිංසති,[4]
අහං මණ්ඩුකජාපියා ඩංසයිස්සාමි බ්‍රාහ්මණං.

5179. තං ත්වං දට්ඨුං මහාරාජ අජ්ජ රට්ඨාභිවද්ධන,
ඛත්තසඞ්ඝපරිබ්බූළ්හො නිය්‍යාහි අභිදස්සනං.

5180. නෙව තං අතිමඤ්ඤාමි සිප්පවාදෙන මාණව,
අතිමන්නොසි සිප්පෙන උරගං නාපචායසි.

5181. මයම්පි නාතිමඤ්ඤාම සිප්පවාදෙන බ්‍රාහ්මණං,
අවිසෙන ච නාගෙන භුසං වඤ්චයසෙ ජනං.

5182. එවං චෙතං ජනො ජඤ්ඤා යථා ජානාමි තං අහං,
න ත්වං ලභසි[5] ආලම්ඛ සත්තුමුට්ඨිං[6] කුතො ධනං.

5183. ඛරාජිනො ජටී රුම්මී[7] දත්තො[8] පරිසමාගතො,
සො ත්වං එවං ගතං නාගං අවිසො අතිමඤ්ඤසි.

---

1. ඔපජුතඤ්ච – මජසං.
2. අස්සුතො – මජසං, අස්සනො – චි.
3. ආලම්බායනො ච ස්‍යා. අලම්බනො ච.
4. අභිජිගීසති – මජසං.
5. ලභෙසි – මජසං.
6. භුසමුට්ඨිං – මජසං, ස්‍යා.
7. දුම්මී – මජසං.
8. දිත්තා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5173. ආලම්බායන තෝ නාගයා මගින් මා සමඟ යුද කරව, මම මැඩි පැටවක මගින් තා සමඟ යුද කරන්නෙමි. අපගේ යුදයෙහි පන්දහසකින් පරදු තැබුම වේවයි සුදස්සන තෙමේ කී ය.

5174. එම්බා මාණවකය, මම වනාහී ධනය ඇති, වස්තුවෙන් පරිපූර්ණ වූවෙක්මි. තෝ වනාහි දිළින්දෙක් වෙහි ය. තට කවර ඇපයක් තිබේ ද මේ දූකෙළියෙහි තැබිය යුතු කවර නම් ධනයක් වේ ද?

5175. මේ දූකෙළිය සඳහා ධනය මට ඇත, තැබිය හැකි ඇප ද ඇත. එහෙයින් එහි දී පන්දහස දක්වා පරදු තැබුම වන්නේ නම් යෙහෙකැ යි අ ලම්බායන තෙමේ කී ය.

5176. මහරජ, ඔබට යහපතක් වේවා, ම බය ඇසුව මැනැවි. කීර්තිමත් රජතෙමේ මට පන්දහසකට ඇප වේවා යි සුදස්සන තෙමේ මයිල් රජුට කී ය.

5177. බ්‍රාහ්මණය, පියා විසින් ගත් ණයක් ඇද්ද නැතහොත් තමා වූ යම් ණයක් හෝ වේ ද? කුමකට මේ බදු බොහෝ ධන තෝ මාගෙන් ඉල්ලන්නෙහි ද යි රජ තෙමේ ඇසී ය.

5178. මහරජ, ආලම්බායන තෙමේ නාගයා කරණ ලෙකාට ගෙන යුදයෙහි දී මා දිනන්නට කැමැත්තේ වෙයි. මම මැඩිපැටවක ලවා බ්‍රාහ්මණයා දෂ්ට කරවමි.

5179. රට වර්ධනය කරවන මහරජ, අද ඔබ ඒ නයින්ගේ නැටුම් බලන්නට ක්ෂත්‍රිය සමූහයා පිරිවරන ලදු වැ වඩනේ මැනැවැ යි සුදස්සන තෙමේ කී ය.

5180. මාණවකය, ශිල්පවාදයෙන් ඔබ ඉක්මවා නො හඟිමි. ඔබ වනාහි ශිල්ප හේතු කොට ගෙන මත් වූවහු ය. එහෙයින් මේ නාගයාහට බුහුමන් නො කෙරෙහි යැ යි ආලම්බායන තෙමේ කී ය.

5181. අපි දු ශිල්පවාදයෙන් බ්‍රාහ්මණයා ඉක්මවා නො හඟිමු. ඔබ විෂ නැති මේ නයාගෙන් ද බොහෝ සේ ජනයා මුළා කරන්නෙහි ය.

5182. එය මම යම්සේ දනිමි ද, මහාජන තෙමේ එසේ දනී නම් ආලම්බායන, ඔබ අත්සුණු මිටකුදු නො ලබන්නෙහි ය. ධනය නම් කොහින් ලබන්නෙහි ද යි සුදස්සන තෙමේ ඇසී ය.

5183. රළු වූ අඳුන් දිවිසම් දරන ජටාධර අඳුන් නොලා නො සැරසුණු දත්ත පිරිසට ආයේයැ. තෙපි මෙ වැනි අනුභව-සම්පන්න නාගයා විෂ නැත්තෙකැ යි අවමන් කරව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5184. ආසජ්ජ ඛො තං[1] ජඤ්ඤසි පුණ්ණං උග්ගස්ස තෙජසා[2]
මඤ්ඤෙ තං භස්මරාසිංව ඛිප්පමෙසො කරිස්සති.

5185. සියා විසං සිළුත්තස්ස දෙඩ්ඩුභස්ස සිලාභුනො,
නෙව ලොහිතසීසස්ස විසං නාගස්ස විජ්ජති.

5186. සුතං මෙතං අරහතං සඤ්ඤතානං තපස්සිනං,
ඉධ දනානි දත්වාන සග්ගං ගච්ඡන්ති දයකා;
ජීවන්තො දෙහි දනානි යදි තෙ අත්ථි දතවෙ.

5187. අයං නාගො මහිද්ධිකො තෙජසී දුරතික්කමො,
තෙන තං ඩංසයිස්සාමි සො තං භස්මං කරිස්සති.

5188. මයාපෙතං සුතං සම්ම සඤ්ඤතානං තපස්සිනං,
ඉධ දනානි දත්වාන සග්ගං ගච්ඡන්ති දයකා;
ත්වමෙව දෙහි ජීවන්තො යදි තෙ අත්ථි දතවෙ.

5189. අයං අච්චිමුඛී නාම[3] පුණ්ණා උග්ගස්ස තෙජසා,
තාය නං ඩංසයිස්සාමි සා තං භස්මං කරිස්සති.

5190. යා ධීතා ධතරට්ඨස්ස වෙමාතා භගිනී මම,
සා දිස්සතු අච්චිමුඛී[4] පුණ්ණා උග්ගස්ස තෙජසා.

5191. ජමායං වෙ නිසිඤ්චිස්සං බ්‍රහ්මදත්ත විජානහි,
තිණලතානි ඔසධ්‍යො උසසුස්සෙය්‍යුං අසංසයං.

5192. අද්ධං[5] වෙ පාතයිස්සාමි බ්‍රහ්මදත්ත විජානහි,
සත්තවස්සානයං දෙවො න වස්සෙ න හිමං පතෙ.

5193. උදකඤ්චෙ නිසිඤ්චිස්සං බ්‍රහ්මදත්ත විජානහි,
යාවතා[6] ඔදකා පාණා මරෙය්‍යුං මච්ඡකච්ඡපා.

නගරප්පවෙසනකණ්ඩං නිට්ඨිතං.

---

1. නං – මජසං.
2. තෙජසො – මජසං.
3. අජ්මුඛී – මජසං.
4. තංඩංසත්වාජ්මුඛී – මජසං. ඩංසතු – ස්‍යා.
5. උදකෙ වෙ – මජසං,
6. යාවන්තො – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5184. උග්‍ර විෂ තෙදින් පරිපූර්ණ වූ ඒ නාරජුට ළං වැ එය දැන ගන්නෙහි ය. නා රජතෙමේ තොප වහාම අළු ගොඩක් කෙරේ යැ යි සිතමි යි ආලම්බායන තෙමේ කුපිත වැ කීය.

5185. තොපගේ මේ රතු හිසැ'නි සර්පයාගේ විෂ ඇත් නම් ගැරඬි යැ, දියබරි යැ, පණුවුළු යැ යන සතුන්ට ද විෂ ඇතැ යි සුදසුන තෙමේ කීය.

5186. මෙ ලොවැ දයකයෝ දන්දීම හේතු කොටගෙන දෙව්ලොවැ උපදිති යන මෙය සංයමයෙන් හා තපසින් යුත් රහතුන්ගෙන් මා විසින් අසන ලදී. ඉදින් දිය යුතු දෙයක් තොපට ඇතහොත් ජීවත් වෙමින් දන් දෙව.

5187. මේ නාගයා මහත් සෘද්ධි ඇති තේජස් ඇති කිසිවකු හට ඉක්මැ විය නො හැක්කකි. ඔහු ලවා තොප දෂ්ට කරවන්නෙමි. හේ තා අළු කරන්නේ යැ යි ආලම්බායන තෙමේ කීය.

5188. යහළු ආලම්බායනය, මෙ ලොවැ දන් දෙන දයකයෝ දෙව්ලොවැ උපදිතැ යි යන මෙය සංයම ඇති තපස්වීන්ගෙන් මා විසිනුදු අසන ලදයැ. ඉදින් දියයුතු දෙයක් ඇතහොත් එය ජීවත් වන හෙපි මැ දෙව.

5189. අච්චිමුඛී නමැති මේ මැඩි පැටී උග්‍ර විෂ තේජසින් පරිපූර්ණ වූවා ය. ඇය ලවා තා දෂ්ට කරවමි. ඕ තා හළු කරන්නී ය.

5190. ධ්‍රතරාෂ්ට නමැති නාරජුට යම් දූවක් වූ ද මාගේ අසමාන මවු දරු නැගණි වූ ද උග්‍ර විෂ තේජසින් පරිපූර්ණ ඒ මේ අච්චිමුඛී නමැති මැඩි පැටී දකිනු ලැබෙවා යි සුදසුන තෙමේ කීය.

5191. බ්‍රහ්මදත්ත මහරජ, යම් හෙයකින් මේ විෂ පොළොවෙහි ඉසින්නේ නම් තණකොළ ලිය වැල් ද ඖෂධවර්ගයෝ ද නිසැක වැ වියළෙන්නාහ යි දනු මැනවැ යි කීය.

5192. එම්බා බ්‍රහ්මදත්ත මහරජ, ඉදින් මේ විෂ අහසට දමන්නෙමි නම් සත්වයක් මුළුල්ලෙහි වැසි නො වස්නේ ය. පිනිබිඳුවකුදු නො වැටෙතී දනුව යි කීය.

5193. බ්‍රහ්මදත්ත මහරජ, ඉදින් මේ විෂ දියට (මුහුදට) ඉසින්නෙමි නම් දියෙහි උපදින මස්කැසුබු ආ යම් **පමණ සත්ත්වයෝ** වෙද්ද ඒ සියලු සත්ත්වයෝ මැරෙන්නාහ යි දැන ගන්නැ යි සුදසුන තෙමේ කීය.

නගර ප්‍රවෙශ කාණ්ඩය නිමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5194. ලොක්‍යං සජන්තං උදකං පයාගස්මිං පතිට්ඨිතං,
කො මං අජ්ඣොහරී භූතො ඔගාළ්හං යමුනං නදිං.

5195. යදෙසලොකාධිපතී යසස්සී
බාරාණසිම්පකිරහරී සමන්තතො,
තස්සාහං පුත්තො උරගූසභස්ස
සුභගොති මං බ්‍රාහ්මණ වෙදයන්ති.

5196. සවෙ හි පුත්තො උරගූසභස්ස
කංසස්ස රඤ්ඤෝ අමරාධිපස්ස
මහෙසක්ඛො අඤ්ඤතරො පිතා තෙ
මව්වෙසු මාතා පන තෙ අතුල්‍යා
න තාදිසො අරහතී බ්‍රාහ්මණස්ස
දසම්පි ඔහාරිතුං මහානුභාවො.

5197. රුක්ඛං නිස්සාය විජ්ඣිත්ථො එණෙය්‍යං පාතුමාගතං,
සො විද්ධො දූරමසරා[1] සරවෙගෙන සෙඛවා.[2]

5198. තං ත්වං පතිතමද්දක්ඛි අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
ස මංසකාජමාදය සායං නිග්‍රොධුපාගමි.

5199. සුවසාලිය[3] සඞ්සුට්ඨං පිංගියං[4] සන්ථතායුතං.
කොකිලාභිරුදං රම්මං ධුවං හරිතසද්දලං.

5200. තත්ථ තෙ සො පාතුරහූ[5] ඉද්ධියා යසසා ජලං,
මහානුභාවො භාතා මෙ කඤ්ඤාභි පරිවාරිතො.[6]

5201. සො තෙන පරිවිණ්ණො ත්වං සබ්බකාමෙහි තප්පිතො.
අදූහස්ස[7] තුවං දූහි තං තෙ වෙරං ඉධාගතං.

5202. ඛිප්පං ගීවං පසාරෙහි න තෙ දස්සාමි ජීවිතං,
භාතුපරිසරං වෙරං ඡෙදයිස්සාමි තෙ සිරං.

5203. අජ්ඣායකො යාචයොගො[8] ආහුතඤ්ඤි ච බ්‍රාහ්මණො,
එතෙහි තීහි ඨානෙහි අවජ්ඣො භවති[9] බ්‍රාහ්මණො.

---

1. දූරමචරි – මජ්ඣං. දූරමාචරි – ස්‍යා.
2. පෙක්ඛවා – මජ්ඣං, ස්‍යා.
3. සාලික – මජ්ඣං.
4. පිඞ්ගලං – මජ්ඣං.
5. පාත්වරහූ – මජ්ඣං.
6. පරිවාරිතො – මජ්ඣං
7. අදූට්ඨස්ස – මජ්ඣං. ස්‍යා.
8. යාචයොගී – මජ්ඣං, ස්‍යා.
9. හොති – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5194. පව් සේදීමට සුදුසු යැ යි ලෝවැස්සන් විසින් සම්මත කැරැණු පයාග නම් තොටැ පිහිටි මෙබඳු දිය නහන මා කවර නම් භූතයෙක් යමුනා ගහෙහි ගිල්වමින් ඇදගනි දෑ යි වැදිබමුණා ඇසි ය.

5195. ලොවට අධිපති යසපිරිවර ඇති යම් මේ ධෘතරාෂ්ට්‍ර නමැති නා රජෙක් හාත්පසින් බරණැස් නුවර පෙණයෙන් වැසුයේ ද මම ඒ නා රජුගේ පුත් වෙමි. බමුණ මා සුහග යැ යි දනිති යි සුහග නාරජ කීය.

5196. ඉදින් තෙපි වනාහී දිගාසිරි ඇති බැවින් අමර නම් නාගයනට අධිපති කංශ නමැති ධෘතරාෂ්ට්‍ර නාරජුගේ පුත් වවු නම් තොපගේ පිය තෙමේ මහෙශාක්‍ය නාරජෙකි. ඔබ මවු තොමෝ මිනිසුන් අතර අසමාන තැනැත්තක යැ. ඒ බන්දෙක් බ්‍රාහ්මණයකුගේ දසයකුවන් දියෙහි ගිල්වීමට නුසුදුසු යැ (මහානුභාව බමුණකු ගැන කවර කථායැ යි වැදි බමුණා කීය.)

5197. එම්බා බ්‍රාහ්මණය තෙපි රුකක් ඇසුරු කරමින් දිය බොන්නට ආ මුවකු විද්දහු ය. ඊතල වේගය නිසා තැති ගත් විදිනු ලැබූ මුවා ඇතට ගියේ ය.

5198. තෙපි මහ වනයෙහි (දුවගොස් මැරී වැටුණු) ඒ මුවා දැක්කහු ය. ඒ තෙපි මුවමස් කද රැගෙන යවය නුග රුකක් වෙත පැමිණියහු ය.

5199. ගිරා සැළලිහිණියන් විසින් පැවැත්වෙන නාද ඇති පැසුණු පල කරණකොටගෙන පිහුවන් ගැවැසී ගත් ඇටුවන් ඇති නුග රුකින් යුත් මේ භූමිය කොවුලන් විසින් පැවැත්වෙන නාද ඇති සින්කලු නිතර නිල් තෘණයෙන් ගැවැසි ගත්තකි.

5200. ඒ නුග රුකෙහි සිටි තොපට සෘද්ධියෙන් ද, යසසින් ද දිලියෙන මහත් අනුභාව ඇති නාගකන්‍යාවන් පිරිවැරූ මාගේ ඒ සොහොයුරු තෙමේ පෙනුණේ ය.

5201. ඒ තෙපි මගේ සොහොයුරු හුරිදත්ත නමැති ඒ නාරජු විසින් කැමැති සියලු සම්පත්තියෙන් සතුටු කැරුණේ බුහුමන් කැරුණේ ද වවු ය. ද්‍රෝහ නො කළයුතු ඔහුට තෙපි ද්‍රෝහ කළවු ය. තොපට ඒ පාපකර්මය දැන් මෙහි පැමිණියේ වෙයි.

5202. ගෙල වහා දිගු කරව. නා මරමි. සොහොයුරාහට කළ අපරාධය සිහිකරන මම නාගේ හිස සිඳිමි යි සුහග තෙමේ කීය.

5203. බමුණා මන්ත්‍ර හදරයි. ඉල්ලීමට සුදුසු වෙයි, පුදන ලද ගිනි ඇත්තේ ද වෙයි. මේ තෙ කරුණින් බමුණු තෙමේ වධ නො කොට යුත්තෙකැ යි වැදි බමුණා කීය.

5204. යං පුරං ධතරට්ඨස්ස ඔගාළ්හං[1] යමුනං නදිං,
ජොතතෙ[2] සබ්බසොවණ්ණං ගිරිං ආහච්ච යාමුනං.[3]

5205. තත්ථ තෙ පුරිසව්‍යග්ඝා සොදරියා මම භාතරො,
යථා තෙ තත්ථ වක්ඛන්ති තථා හෙස්සසි බ්‍රාහ්මණ.

සුභගබ්‍රණ්ඩා.

5206. අනිත්තරා ඉත්තරසම්පයුත්තා
යක්ඛූ ච වෙද[4] ච සුභොග ලොකෙ,
තදග්ගරග්ගං හි චිනින්දමානො
ජහාති චිත්තක්ඛ සතක්ඛ ධම්මං.

5207. අජ්ඣෙනමරියා පඨවිං ජනින්ද
වෙස්සා කසිං පරිචරියක්ඛ සුඤ්ඤ,
උපාගු පච්චෙකං යථා පදෙසං
කතාහු එතෙ වසිනාති ආහු.

5208. ධාතා විධාතා වරුණො කුවෙරො
සොමො යමො චන්දිමා වායු සුරියො,
එතෙ හි යක්ඛඤ්ඤං පුථුසො යජිත්වා
අජ්ඣායකානං අථ[5] සබ්බකාමෙ.

5209. විකාසිතා චාපසතානි පක්ඛ
යො අජ්ජුනො බලවා භීමසෙනො,[6]
සහස්සබාහු අසමො පඨව්‍යා
සොපි තද ආදහි ජාතවෙදං.

5210. යො බ්‍රාහ්මණො හොජයී දීඝරත්තං
අන්‍යෙන පාණෙන යථානුභාවං,
පසන්නචිත්තො අනුමොදමානො
සුභොග දෙවක්ඛඤ්ඤතරො අහොසි.

5211. මහාසනං දෙවමනොමවණ්ණං
යො සප්පිනා අසක්ඛි ජෙතුමග්ගිං,
සො යක්ඛඤ්ඤතන්තං වරතො යජිත්වා
දිබ්බං ගතිං මුවලින්දජ්ඣගක්ඛි.

---

1. ඔසාළ්හං - මජ්ඣං..
2. ජොතන්තං - මජ්ඣ.
3. යමුනං - මජ්ඣ.
4. බෙ - මජ්ඣං.
5. අථො - මජ්ඣං.
6. භීමසෙනො - මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5204. යමුනා නදී යට පෙදෙසෙහි ධෘතරාෂ්ට්‍ර නා රජුගේ රන්මුවා යම් නුවරක් යමුනා ගඟ අසබඩ හිමාලය පර්වතය දක්වා බැබළේ ද?

5205. එ නුවර පුරුෂ ශ්‍රේෂ්ඨ වූ සමාන මාතෘක මාගේ ඒ සොහොයුරෝ වෙසෙති. ඔහු යම් පරිදි කියද්ද බමුණ, තොප එහි දී එ පරිදි වන්නේ යැ යි සුහග තෙමේ කීය.

සුහග කාණ්ඩය නිමි.

5206. සුහග ය, ලොවැ යාගයෝ ය වේදයෝ ය යන මොහු අලාමක ය. ලාමක බමුණන් විසින් යොදන ලදහ. (බමුණෝ ද අලාමකහ.) එහෙයින් නො ගැරහියයුතු බමුණාට අවමන් කරන තැනැත්තේ වස්තුව ද සත්පුරුෂ ධර්මය ද දුරු කරයි කියා දෙරටුව අසල සිටි කාණාරිෂ්ට තෙමේ කීය.

(වැලිදු හේ කියයි)

5207. ආයුෂ්‍මා බමුණෝ වේදය ඉගෙනීමට ද ක්ෂත්‍රියයෝ පෘථිවි පාලනයට ද, වෛශ්‍යයෝ සි සාන්නට ද, ශූද්‍රයෝ මෙහෙවර කරන්නට ද පැමිණෙත්වා යි ඉහබඹ තෙමේ කීය. වෙන වෙන ම එසේ පැමිණෙන්නෝ තම තමන්ගේ කුලයට සුදුසු පරිදි පැමිණියහ. මෙසේ මොවුහු මහබඹු විසින් මවන ලදහ යි කියති.

5208. ධාතා යැ විධාතා යැ වරුණ යැ කුවෙර යැ සෝම යැ යම යැ චන්ද්‍රමා යැ වායු යැ සූරිය යැ යි යන මේ දෙව් රජවරු වනාහි නොයෙක් අයුරින් යාග කොට බමුණන්ට කැමැති සියලු සම්පත් දීමේ තනතුරුවලට පත්වූහ.

5209. පන්සීයක් පමණ අදහා ලද මහඳුන්න ඇති බලවත් බිහිසුණු මහසෙන් ඇති (දහසක් බාහුවෙන් ඇදෙන දුනු දිය අදින බැවින්) සහස්‍රබාහු නමැති, පොළොවෙහි අසමාන යම් අර්ජුන යැ යි රජෙක් වී ද හෙ ද එකලැ ගිනි දෙවියා පිදී යැ.

5210. යම් බරණැස් රජෙක් බොහෝ කල් මුළුල්ලෙහි සතුටු සිත් ඇත්තේ පහන් සිතින් බමුණන් වැළඳ වී ද සුහගය, හෙතෙමේ එක්තරා මහත් අනුභාව ඇති දෙව්රජෙක් වී යැ.

5211. යම් රජෙක් මහත් ආහාර ඇති අලාමක ප්‍රභාව ඇති ගිනි දෙවියා ගිතෙලින් තුටු කරන්නට හැකි වූයේ ද ඒ මුවලිඳු නමැති රජ තෙමේ උතුම් ගිනි දෙවියාට යාග කිරීමෙන් දෙවලොවට පැමිණියේ යැ.

5212. මහානුභාවෝ වසසහස්සජීවී
යෝ පබ්බජී[1] දසසනෙයෝ උළාරෝ,
හිත්වා අපරියන්තරථං[2] සසෙනං
රාජා දුදීපොපි ජගාමං[3] සඟ්ගං.

5213. යෝ සාගරෝ සාගරන්තං විජිත්වා
යූපං සුභං සොණ්ණමයං උළාරං,
උපෙසසි වෙසසාතරමාදහානෝ[4]
සුභොග දෙවසදිසතරෝ අහොසි.

5214. යසසානුභාවෙන සුභොග ගඞ්ගා
පවත්තථ[5] දසියන්නං සමුද්දං,
ස ලොමපාදෙ පරිවරියමඞ්ගං
අඞ්ගෝ සහස්සසබ්බපුරජ්ජිගසඞ්ගි.

5215. මහිද්ධිකෝ දෙවවරෝ යසසසී
සෙනාපති තිදිවෙ වාසවස්ස,
ස සොමයාගෙන මලං විහන්ත්වා
සුභොග දෙවසදිසතරෝ අහොසි.

5216. අකාරි[6] යෝ ලොකහිතං පරත්ථ
භාගීරථිං[7] හිමවන්තසඞ්ඝ ගිජ්ඣකූං,
යෝ ඉද්ධිමා දෙවවරෝ යසසසී
සොපි තද ආදහි ජාතවෙදං.

5217. මාලාගිරී හිමවා යෝ ච ගිජ්ඣකූ
සුදස්සනෝ[8] නිසභෝ කාකනෙරු,[9]
එතෙ ච අඤ්ඤෙ ච නගා මහන්තා
චිත්‍යා කතා යසසකරෙහි මාභූ.

5218. අජ්ඣායකං මන්තගුණූපපන්නං
තපස්සිනං යාචයොගොති වාහ,[10]
තීරෙ සමුද්දස්සුදකං සජන්තං
තං සාගරජ්ඣාහරි තෙනපෙයෝ.

---

1. පබ්බජි – මජ්ස.
2. රථං – මජ්ස. සය්‍ා.
3. වගාමි – මජ්ස.
4. වස්සාතර – මජ්ස.
5. පවත්තති – මජ්ස. සය්‍ා.
6. අකාසි යං – මජ්ස. අකාරසි – සය්‍ා.
7. භාගීරථං – සය්‍ා. භගීරසි – මජ්ස.
8. යුදයිතෝ – මජ්ස.
9. කුමවරු – මජ්ස. කාකවෙරු – සය්‍ා.
10. වෘහු – මජ්ස. ධාහු – සය්‍ා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5212. මහත් අනුභා ඇති දහසක් හවුරුදු ජීවත් වූ දැකුම් කලු වූ, උදර වූ යම් රජෙක් අපමණ රිය සෙනහ හැරදමා පැවිදි වූයේ ද ඒ දුදීප නමැති රජ තෙමේ ද දෙව්ලොවට පැමිණියේ යැ.

5213. සුභග, සාගර නමැති යම් රජෙක් සයුර හිමිකොට ඇති මහපොළොව ජයගෙන යහපත් සඩර්ණමය යාඥස්තම්භයක් එසවූයේ ද සුභග ය, ගිනිදෙව්යා පුදන ඒ රජ තෙමේ ද එක් මහෙශාක්‍ය දෙවියෙක් වී.

5214. එම්බා සුභග, යම් රජකුගේ අනුභාවයෙන් ගඟා පැවැත්නාහු ද සමුදුර හට ගත්තේ ද පාදයෙහි ලොම් ඇති ඒ අඟරජ තෙමේ ගිනිදෙව්යා පුදු ශක්‍රපුරයට පැමිණියේ යැ.

5215. එම්බා සුභග, දැන් යමෙක් දෙව්ලොවැ සක්දෙව් රජුගේ සේනාපති වැ මහත් සෘද්ධියෙන් හා යසපිරිවරින් යුත් උතුම් දෙවියෙක් වේ ද හෙ ද පෙර සෝමයාගයෙන් පව් සෝද හැරැ එක් මහෙශාක්‍ය දෙවියෙක් වූයේ යැ.

5216. සොහොවුරු සුභග, යම් සෘද්ධි ඇති යසස් ඇති මහබඹෙක් මෙ ලොව ද පරලොව ද හාගීරථී ගඟාව ද හිමවත් පව්ව ද ගිජ්ඣකූ පර්වතය ද යන මේ සියල්ල කෙළේ ද හෙ ද ගිනිදෙව්යා පිදී ය.

5217. මාලාගිරි යැ හිමවත් යැ ගිජ්ඣකූ යැ සුදස්සන යැ නිසභ යැ කාකනෙරු යැ යන මේ පර්වතයෝ වෙද්ද සෙසු මහත් පර්වතයෝ ද යාග කරන බමුණන් විසින් ගඩොලින් බැඳුණු ආසන සඳහා කරන ලද්දහු වෙතැ යි කීහු.

5218. හදරනලද වේද ඇති වෙදමන්ත්‍ර පරිවෙජද ඇති පිරූ තපස් ඇති බමුණා ඉල්ලීමට සුදුස්සෙකැ යි ද කී ය. සමුද්‍ර-තීරයෙහි දිය ස්නානය කරන එබඳු බමුණකු සාගරය තෙමේ ඇද-ගත්තේ ය. ඒ බැවින් සමුදුය පානය කළ නො හැකි ලුණුදිය ඇති බවට පත් කෙළේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5219. ආයාගවත්ථූනි පුථූ පථව්‍යා
සංවිජ්ජන්ති බ්‍රාහ්මණා වාසවස්ස,
පුරිමං දිසං පච්ඡිමං දක්ඛිණුත්තරං
සංවිජ්ජමානා ජනයන්ති වෙදං.

5220. කලිං[1] හි ධීරානං කටං මගානං
භවන්ති වෙදජ්ඣගතානරිට්ඨ,
මරිචිධම්මං අසමෙක්ඛිතත්තා
මායාගුණා නාති වහන්ති පඤ්ඤං.

5221. වෙදා න තාණාය භවන්තිරස්ස[2]
මිත්තද්දුනො භූනහුනො නරස්ස,
න තායතෙ පරිච්ණෙණා ච අග්ගි
දෙසන්තරං මච්චං අනරියකම්මං.

5222. සබ්බඤ්චෙ මච්චා සධනා[3] සභොගා[4]
ආදීපිතං දරුතිණෙන මිස්සං,
දහං න තප්පෙ අසමත්ථ[5]තෙජො
කො තං සුභික්ඛං දිරසඤ්ඤ කුරියා.[6]

5223. යථාපි ඛීරං විපරිනාමධම්මං
දධී භවිත්වා නවනීතම්පි හොති,
එවම්පි අග්ගි විපරිනාමධම්මො
තෙජො සමොරොහති යොගයුත්තො.

5224. න දිස්සතෙ අග්ගිමනුප්පවිට්ඨො
සුක්ඛෙසු කට්ඨෙසු නවෙසු චාපි,
නාමත්ථමානො අරණීනරෙන
නාකම්මනා ජායති ජාතවෙදො.

5225. සචෙ හි අග්ගි අන්තරතො වසෙය්‍ය
සුක්ඛෙසු කට්ඨෙසු නවෙසු චාපි,
සබ්බානි සුස්සෙය්‍යුං වනානි ලොකෙ
සුක්ඛානි කට්ඨානි ච පජ්ජලෙය්‍යුං.

---

1. කලීහි – මජසං. ස්‍යා.
2. භවන්තිදස්ස – මජසං,
3. සධනං – මජසං.
4. සභොගං – මජසං.
5. අග්ගි අසමත්ථ – මජසං.
6. කයිරා – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5219. සක්දෙවිඳුගේ යාගයනට සුදුසු බොහෝ බමුණෝ පොළොවෙහි ඇත. පෙරදිග යැ පැසුළුදිග යැ දකුණුදිග යැ උතුරු දිග යැ යන මේ දිසාවන්හි ඇති ඒ බමුණෝ දැනුදු සක්දෙවිඳුහට සතුටු උපදවති යි කාණාරිෂ්ට තෙමේ කී ය.

(ඒ අසා හූරිදත්ත මෙසේ කියයි:)

5220. එම්බා අරිෂ්ට, වේද ඉගෙනීම වනාහි නුවණැ ඇත්තන්ට පරාජය නම් අකුසල ග්‍රහණය ද නුවණ නැත්තන්ට ජය නම් කුසලග්‍රහණය ද වෙයි. වේදත්‍රය මිරිඟු සවහාව ඇතැ යි නො සිතන්නාහු එයට පැමිණෙති. මායා කොටස් ඇති මේ වේදයෝ නැණැත්තහු නො ඉක්මවති හෙවත් නො රවටති.

5221. දියුණුව නසන මිත්‍රද්‍රෝහී මිනිසා රැකීමට වේදයෝ සමත් නො වෙති. පිදූ ගිනි ද සදෙස් සිත් ඇති අකුසල් කරන මිනිසා ආරක්ෂා නො කෙරෙයි.

5222. ඉදින් ධන හා සම්පත් සහිත මිනිස්සු දර හා තෘණ ද මුසු කොට සියල්ල දල්වත්. අසමාන තේජස් ඇති ඒ ගින්න සියල්ල දවන්නේ සැඟීමට නො පැමිණෙයි. දෙ දිවකින් රස දැනුමට සමත් අරිෂ්ටය, කවරෙක් ඒ ගින්න සුලභ භික්ෂා ඇත්තක් කරන්නේ ද?

5223. යම්සේ පෙරළෙන සවහාව ඇති කිරි දී බවට පැමිණ යළි වෙඩරු බවටත් පැමිණේ ද ගිනි ද මෙසේ පෙරළෙන සවහාව ඇත්තේ වේ. ගිනිගාන දඩු හා යෙදීමෙන් ගිනි හටගනී.

5224. වියැළි නො වියැළි කාෂ්ඨයන්හි ඇවිළ ගත් හෙවත් ඇතුළට පිවිසි ගිනි නො දිස්වේ. ගිනිගාන දඩුගත් මිනිසකු විසින් අලළනු නො ලබන්නේ ක්‍රියා රහිත ව ගිනි නො හටගනී.

5225. ඉදින් ගිනි වියැළි නො වියැළි කාෂ්ඨයන්හි ඇතුළත වෙසේ නම් ලොව සියලු වනයෝ වියැළෙන්නාහ. වියැළි කාෂ්ඨයෝ ද ගිනි ඇවිළ ගන්නාහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5226. කරොති වෙ[1] දරුතිණෙන පුඤ්ඤං
හොජං[2] නරො ධූමසිඛිං පතාපවං,
අඛගාරිකා ලොණකරා ච සූද
සරිරදහාපි කරෙය්‍යුං පුඤ්ඤං.

5227. අථ වෙ හි එතෙ න කරොන්ති පුඤ්ඤං
අජ්ඣෙනමගගිං ඉධ තප්පයිත්වා,
න කොචි ලොකස්මිං කරොති පුඤ්ඤං
හොජං නරො ධූමසිඛිං පතාපවං.

5228. කථං හි ලොකාපචිතො සමානො
අමනුඤ්ඤගන්ධං බහුන්නං අකන්තං,
යදෙව මච්චා පරිවජ්ජයන්ති
තදප්පසත්ථං දිරසඤ්ඤ භුඤ්ජෙ.

5229. සිඛිං හි දෙවෙසු වදන්ති හෙකෙ
ආපං මිලක්ඛා පන දෙවමාහු,
සබ්බෙව එතෙ විතථං භණන්ති[3]
අග්ගී න දෙවඤ්ඤතරො න චාපො.

5230. නිරින්ද්‍රියං සන්තං අසඤ්ඤකායං[4]
වෙස්සානරං කම්මකරං පජානං,
පරිචරිය[5] මගගිං සුගතිං කථං වජෙ[6]
පාපානි කම්මානි පකුබ්බමානො.

5231. සබ්බාභිභූතාහුධ ජීවිකත්ථා
අග්ගිස්ස බ්‍රහ්මා පරිචාරකොති,
සබ්බානුභාවී ච වසී කිමත්ථං
අනීම්මිතො නිම්මිතං වන්දිතස්ස.

5232. හස්සං අනිජ්ඣානබමං අතච්ඡං
සක්කාරහෙතු පකිරිංසු[7] පුබ්බෙ,
තෙ ලාභසක්කාරෙ අපාතුභොන්තෙ
සත්ථමභිතා[8] ජන්තුහි සන්තිධම්මං.

5233. අජ්ඣෙනමරියා පඨවිං ජනින්ද
වෙස්සා කසිං පරිචරියඤ්ච සුඤ්ඤ,
උපාගු පච්චෙකං යථා[9] පදෙසං
කතාහු එතෙ වසිනාති ආහු.

---

1. වෙ – මජසං.
2. හොජනරො – මජසං.
3. ගණහන්ති – මජසං.
4. අනින්ද්‍රියබඩ මසඤ්ඤකායං – මජසං. අනින්ද්‍රියං – ස්‍යා.
5. පරිච්චරමගගිං සුගතිං කථං වජ්ජෙ – මජසං.
6. වජ්ජෙ – මජසං. ස්‍යා.
7. පක්කරිංසු – මජසං.
8. සන්තපිතා – මජසං. සන්ධාභිතා – ස්‍යා.
9. තථා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5226. ඉදින් යමෙක් දුම්සිළු ඇති මහත් තේජස් ඇති ගින්නට දර හා තෘණ අනුභව කරවමින් පින් කෙරෙයි නම් අහුරු දවන්නෝ ද, ලුණු සාදන්නෝ ද, අරක්කැමියෝ ද, මළ මිනී දවන්නෝ ද පින් කරන්නාහ.

5227. ඉදින් මොහු වනාහි පින් නො කෙරෙත් නම් මෙ ලොවැ මන්ත්‍ර හදරන බමුණෝ ගිනි තැප පින් කෙරෙද්ද? මෙ ලොවැ කිසි මිනිසෙක් දුම්සිළු ඇති මහත් තේජස් ඇති ගින්නට අනුභව කරවමින් පිනක් නම් නො කෙරේ.

5228. දෙදිව් ඇත්ත, ලෝවැසියන් පුදනලද්ද වූ ම ගින්න නො මනා ගඳ ඇති බොහෝ දෙනාට අප්‍රිය වූ යම් කුණපයක් මිනිස්සු දුරු කෙරෙත් ද, එබදු නො පසස්නාලද කුණපය කෙසේ නම් අනුභව කරන්නේ ද?

5229. සමහරු ගින්න දෙවියන් අතුරෙන් කෙනෙකැ යි කියති. නුවණ නැති මිලේච්ඡයෝ වනාහි ජලය දෙවියෙකැ යි කියති. මේ සියල්ලෝ ම බොරු කියති. ගින්න දෙවියන් අතරෙන් අයෙක් නො වේ. ජලය ද දෙවියෙක් නො වේ.

5230. පව් කරන්නෙක් ඉඳුරන් නැති සිත් නැති සත්ත්වයන්ගේ බත් පිසීම් ආදි කටයුතු කරන වෙස්සානර නමැති ගින්න පුද කෙසේ නම් සුගතියට යන්නේ ද?

5231. මෙලොවැ ජීවිකාව ප්‍රයෝජන කොට ඇත්තාහු (බමුණෝ) බ්‍රහ්මයා සියල්ලන් මැඩ පවත්වන්නෙකැයි ද ගිනි දෙවියා පූදන්නෙකැයි ද කියති. සියලු අනුභාව ඇති සියල්ලන් වසඟ කරන බ්‍රහ්මයා තෙමේ නො මවා ලද්දේ කවර හෙයින් මවනලද ගින්න වඳින්නෙක් වන්නේ ද?

5232. (එම්බා අරිෂ්ටය,) මේ බමුණෝ සිනාවට සුදුසු නුවණැතියන්ගේ සිතිමට නො හොබනා බොරුවක් ලාභසත්කාර හේතු කොට පෙර පැතිර වූහ. ඔව්හු ලාභසත්කාර නො ලැබෙන කල යතුන් හා සම්බන්ධකොට (ශාන්තිධර්ම නමැති යාගයක් නිපැදූවූහ. නොහොත් ශාන්තිධර්ම නමැති යාගසූත්‍රයක් ගෙතූහ.)

5233. ආයිවූ බමුණෝ මන්ත්‍ර ඉගෙනීමට ද, ක්ෂත්‍රියයෝ පොළොව පාලනයට ද, වෛශ්‍යයෝ සී සෑමට ද, ශූද්‍රයෝ ඔවුන්ගේ මෙහෙ කිරීමට ද වෙන් වෙන් වශයෙන් තම තමන්ගේ කුලප්‍රදේශයනට අනුව පැමිණියහ. මොවුහු මහබඹු විසින් මැවුණාහ යි කියති.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5234. එතඤ්ච සච්චං වචනං භවෙය්‍ය
යථා ඉදං භාසිතං බ්‍රාහ්මණෙහි,
නාඛත්තියෝ ජාතු ලභෙථ රජ්ජං
නාබ්‍රාහ්මණා මන්තපදානි සික්ඛෙ
නාඤ්ඤිත්‍ර වෙස්සෙහි කසිං කරෙය්‍ය
සුද්දෝ න මුච්චෙ පරපෙස්සිකාය.[1]

5235. යස්මා ච එතං වචනං අභූතං
මුසා විමෙ ඔදරියා භණන්ති,
තදප්පපඤ්ඤා අභිසද්දහන්ති
පස්සන්ති තං පණ්ඩිතා අත්තනාව.

5236. ඛත්තියා න වෙස්සා න බලිං හරන්ති
ආදය සත්ථානි චරන්ති බ්‍රාහ්මණා,
තං තාදිසං සංයුතිං විහිංසං[2]
කස්මා බ්‍රහ්මා නුජ්ජුකරොති ලොකං.

5237. සචෙ හි සො ඉස්සරො සබ්බලොකෙ
බ්‍රහ්මා බහූ භූතපතී පජානං,
කිං සබ්බලොකං විදහී අලක්ඛිං
කිං සබ්බලොකං න සුඛී අකාසි.

5238. සචෙ හි සො ඉස්සරො සබ්බලොකෙ
බ්‍රහ්මා බහූ භූතපතී පජානං,
මායා මුසාවජ්ජමදෙන චාපි
ලොකං අධම්මෙන කිමත්ථකාසි.

5239. සචෙ හි සො ඉස්සරො සබ්බලොකෙ
බ්‍රහ්මා බහූ භූතපතී පජානං,
අධම්මියෝ[3] භූතපතී අරිට්ඨ
ධම්මෙ සති සො විදහී අධම්මං.

5240. කීටා පටංගා උරගා ච හෙකා[4]
භක්ඛා කිමී සුජ්ඣන්ති මක්ඛිකා ච,
එතෙ හි ධම්මා අනරියරූපා
කමෙබ්‍රාජකානං විතථා බහූනං.

5241. සචෙ හි සො සුජ්ඣති යො හනාති
හතොපි සො සග්ගමුපෙති ඨානං,
හොවාදි හොවාදිනං මාරයෙය්‍යුං[5]
යෙ චාපි තෙසං අභිසද්දහෙය්‍යුං.

---

1. පරපෙස්සතාය – මජ්ඣං. පරපෙය්‍යතාය – ස්‍යා.
2. පඤ්ඤං – මජ්ඣං.
3. අධම්මිකෝ – මජ්ඣං. ස්‍යා.
4. භිඩා – මජ්ඣං. ස්‍යා.
5. මාරභෙය්‍යුං – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5234. යම්සේ බමුණන් විසින් මෙය කියන ලද්දේ ද, (ඉදින්) මෙය සැබෑ බසෙක් වේ නම් ක්ෂත්‍රිය නො වූවෙක් කිසි කලෙකත් රජය නො ලබන්නේ ය. බමුණු නො වූවෙක් මන්ත්‍ර නො හදරන්නේය. වෛශ්‍යයන් මිය අනෙකෙක් නො සී සාන්නේ ය. ශූද්‍ර තෙමේ අන්‍යයන්ගේ මෙහෙකරු බැවින් නො මිදෙන්නේ ය.

5235. යම් හෙයකින් මේ වචනය බොරු වේ ද, එහෙයින් බඩ වැඩීම හේතුකොටගෙන මේ බමුණෝ බොරු ද කියති. ඒ බොරුව මද නුවණැත්තෝ අදහති. ප්‍රාඥයෝ තුමූ මැ ඒ බොරුව සදෙස් ය යි දකිති.

5236. ක්ෂත්‍රියයෝ අයබදු නො ගනිති. වෛශ්‍යයෝ අයබදු නො දෙති. බමුණෝ ආයුධ රැගෙන හැසිරෙති. එසේ කැළැඹුණු වෙසෙසින් බිඳුණු ඒ ලෝකය කවර හෙයින් බඹ තෙම සෘජු නො කෙරෙයි ද?

5237. ඉදින් බොහෝ සත්වයනට සවාමී වූ ඒ බ්‍රහ්ම තෙම සියලු ලෝකයෙහි අධිපති වේ නම් කවරහෙයින් සියලු ලෝකය දුක් සහිතවූවක් කෙළේ ද? කවර හෙයින් සියලු ලොව සැපවත් නො කෙළේ ද?

5238. ඉදින් බොහෝ සත්වයනට සවාමී වූ ඒ බඹ තෙම සියලු ලොවැ අධිපති වේ නම් මායා ය, මුසා ය, මද ය යන මේ නො දහම්න් යුතු කොට ලොව කුමක් සඳහා මැවී ද.

5239. ඉදින් බොහෝ සත්වයනට සවාමී වූ ඒ බ්‍රහ්මයා සියලු ලොවැ අධිපති වූ වේ නම්, එම්බා අරීෂ්ට, කුසල් දහම් ඇති කලැ යම් බඹෙක් නො දහම් ඇති කෙළේ ද හේ නො දැහැමියෙකි.

5240. පණු ය, පළහැටි ය, සර්ප ය, මැඩි ය, කෘමි ය, මැසි ය යන මොවුන් නසා පිරිසුදු වෙයි යන මේ අනායර්‍ය සවරූප වූ ධර්මයෝ කාම්බෝජ රටවැසි (අනාර්‍යවූ) බොහෝ දෙනාගේ බොරු ය.

5241. ඉදින් යාගයෙහි දී යමෙක් නසා ද හේ පිරිසිදු වෙයි නම් ඒ නැසුණු තැනැත්තේ දෙව්ලොවට යේ නම් බමුණෝ බමුණකු ම මරන්නාහ. යම් කෙනෙක් ඔවුන්ගේ වදන් අදහන්නාහු නම් ඔවුන් ද මරවන්නාහු ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5242. නෙව මිගා නප්පසුනොපි ගාවො
ආයාවන්ති අත්තවධාය[1] කෙචි,
විප්ඵන්දමානං ඉධජීවිකත්ථා
යඤ්ඤෙසු පාණෙ පසුමාහරන්ති.

5243. යූපස්ස[2] තෙ පසුබන්ධෙ ච බාලා
චිත්තෙහි වණ්ණෙහි මුඛං නයන්ති,
අයං තෙ යූපො කාමදුහො පරත්ථ
භවිස්සති සස්සතො සම්පරායං.

5244. සචෙ ච යූපෙ මණිසඞ්ඛමුත්තං
ධඤ්ඤං ධනං රජතං ජාතරූපං,
සුක්ඛෙසු කට්ඨෙසු නවෙසු චාපි
සචෙ දුහෙ තිදිවෙ සබ්බකාමෙ
තෙවිජ්ජසඞ්ඝා ච පුථූ යජෙය්‍යුං
න බ්‍රාහ්මණා කඤ්චි තං[3] යාජයෙය්‍යුං.

5245. කුතො ච යූපෙ මණිසඞ්ඛමුත්තං
ධඤ්ඤං ධනං රජතං ජාතරූපං.
සුක්ඛෙසු කට්ඨෙසු නවෙසු චාපි
කුතො දුහෙ තිදිවෙ සබ්බකාමෙ.

5246. සඨා ච ලුඤ්ඤ උපලද්ධබාලා[4]
චිත්තෙහි වණ්ණෙහි මුඛං නයන්ති,
ආදය අග්ගිං මම දෙහි චිත්තං
තතො සුඛී හොහිසි සබ්බකාමෙ.

5247. තමග්ගිහුත්තං සරණං පවිස්ස
චිත්තෙහි වණ්ණෙහි මුඛං නයන්ති,
ඔරොපයිත්වා කෙසමස්සුං නඛඤ්ච
වෙදෙහි චිත්තං අතිගාළයන්ති.

5248. කාකා උලූකංව රහො ලභිත්වා
එකං සමානං බහුකා සමෙච්ච,
අන්නානි භුත්වා කුහකා කුහිත්වා
මුණ්ඩං කරිත්වා යඤ්ඤපථොස්සජන්ති.

5249. එවං හි සො වඤ්චිතො බ්‍රාහ්මණෙහි
එකො සමානො බහුහි[5] සමෙච්ච,
තෙ යොගයොගෙන විලුම්පමානා
දිට්ඨං අදිට්ඨෙන ධනං හරන්ති.

---

1. රත්තවධාය – මජසං.
2. යුපුසස නෙ – මජසං. ස්‍යා.
3. කිචි – මජසං. ස්‍යා.
4. පලුඩ – මජසං. ස්‍යා.
5. බහුකා – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5242. කිසි මෘග කෙනෙක් නම්‍ නසන්නට නො යදිති. සිවුපාවෝ ද නො යදිති. ගවයෝ ද නො යදිති. මෙ ලොව ජීවත්වීම ප්‍රයෝජන කොට ඇත්තෝ යාගයන්හි දී පණ ඇති සිවුපාවුන් සල්වමින් මරති.

5243. ඒ නුවණ නැති පසු ආදින් යාගස්තම්භයෙහි බඳිනු ලබනකල මේ යාගස්තම්භය තොපට පරලොව දී කැමති වස්තුව දෙන්නේ වෙයි පරලොව ශාස්වත වන්නේ ය යි විසිතුරු වර්ණනාවින්ගෙන් මුහුණ සතුටු කෙරෙති.

5244. ඉදින් යාගස්තම්භයෙහි මැණික් ය, සක් ය, මුතු ය, ධාන්‍ය ය, ධන ය, රිදී ය, රත්රන් ය යන මෙය වේ නම් ඉදින් වියැළි නො වියැළි කාෂ්ටයන්හි ද දෙව්ලොව කැමති සියලු වස්තුව දීම වේ නම් ත්‍රිවේද ය දන්නා බමුණෙනි ම බොහෝවින් යාග කරන්නාහු ය. බමුණෙනි අන් කිසිවකු ලවා යාග නො කරවන්නාහු වෙති.

5245. යාගස්තම්භයෙහි මැණික් ය, සක් ය, මුතු ය, ධාන්‍ය ය, ධන ය, රිදී ය, රත්රන් ය යන මෙය කොයින් ද, වියැළි නො වියැළි කාෂ්ටයන්හි දෙව්ලොව කැමති සියලු වස්තුව දීම කොයින් ලැබෙන්නේ ද?

5246. පෙළඹුණු අඥාන මිනිසුන් ඇති කපටි රුදුරු බමුණෙනි තෙපි ගිනි ගෙන පුද මට වස්තු දෙව, තෙපි කැමති සියලු සම්පත් ලැබෑ සුඛිත වෙව''යි විචිත්‍ර වර්ණනාවෙන් ඔවුන්ගේ මුහුණු සතුටු කෙරෙති.

5247. ඒ ගිනි පුද කරන හලට ඇතුළු වැ හිසකෙස් රැවුල් බාවා නිය ද කප්වා විචිත්‍ර වර්ණනාවෙන් මුහුණ තුටු කෙරෙති. වේද කථාවලින් ඔහුගේ සම්පත් විනාශයට පමුණුවති.

5248. හුදෙකලා වූ බකමූණකු ලැබූ කපුටන් මෙන් ඒ කුහක බමුණෙනි බොහෝ දෙන එක් වැ ඔහු වැඩා කොට ඔහුගේ රස බොජුන් අනුභවකොට හිස මුඩුකොට යාගස්ථානයෙහි පලෙසකට දමති.

5249. මෙසේ හුදෙකලා වූ හෙ තෙම බොහෝ බමුණන් විසින් රැස් වැ රවටන ලද්දේ වේ. ඒ බමුණෙනි නොයෙක් යුක්ති කරණකොට පැහැර ගන්නාහු නො පෙනෙන දෙව් සැපතින් පෙනෙන ධනය රැගෙන යති.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5250. අකාසියා රාජූහි චානු[1]සිට්ඨා
තදස්ස ආදය ධනං හරන්ති,
තෙ තාදිසා චොරසමා අසන්තා
වජ්ඣා න භඤ්ඤන්ති අරිට්ඨ ලොකෙ.

5251. ඉන්දස්ස බාහාරසි දක්ඛිණාති
යඤ්ඤෙසු ජින්දන්ති පලාසයට්ඨිං,
තං චෙපි සච්චං මඝවා ජින්නබාහු
කෙනස්ස ඉන්දෙ අසුරෙ ජිනාති.

5252. තඤ්චෙව තුච්ඡං මඝවා සමඛගී
හන්තා අවජ්ඣො පරමො ස දෙවො,
මන්තා[2] ඉමෙ බ්‍රාහ්මණා තුච්ඡරූපා
සන්දිට්ඨිකා වඤ්චනා එස ලොකෙ.

5253. මාලාගිරි හිමවා යො ච ගිජ්ඣො
සුදස්සනො නිසභො කාකනෙරු,[3]
එතෙ ච අඤ්ඤෙ ච නගා මහන්තා
චිත්‍යා කතා යඤ්ඤකරෙහි මාහු[4].

5254. යථ්ප්පකාරානි හි ඉට්ඨකානි
චිත්‍යා කතා යඤ්ඤකරෙහි මාහු,
න පබ්බතා හොන්ති තථ්ප්පකාරා
අඤ්ඤාදිසා අචලා තිට්ඨසෙලා.

5255. න ඉට්ඨකා හොන්ති සිලා චිරෙනපි
න තත්ථ සඤ්ජායති අයො න ලොහං,
යඤ්ඤෙ ච එතං පරිවණ්ණයන්තා
චිත්‍යා කතා යඤ්ඤකරෙහි මාහු.

5256. අජ්ඣායකං මන්තගුණූපපන්නං
තපස්සිනං යාචයොගොති මාහු,
තීරෙ සමුද්දස්සුදකං සජන්නං
තං සාගරජ්ඣොහරි තෙන, පෙය්‍යො.

5257. පරො සහස්සම්පි සමන්තවෙදෙ
මන්තූපපන්නෙ නදියො වහන්ති,
න තෙන ව්‍යාපන්නරසූදකානං[5]
කස්මා සමුද්දෙ අතුලො අපෙය්‍යො.

---

1. චානු – මජ්ඣං. ස්‍යා.
2. සත්තා – මජ්ඣං. ස්‍යා.
3. කාවෙරු – මජ්ඣං.
4. චානු – මජ්ඣං.
5. රසූදක නි – මජ්ඣං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5250. රජුන් විසින් අනුශාසනා කරන ලද අයබදු ගන්නා රාජපූරුෂයන් මෙන් ඔහුගේ එම ධනය රැගෙන යති. අරිෂ්ටය, ලොවැ සොරුන් හා සමාන අසත්පුරුෂ වධයට සුදුසු එබඳු වූ ඒ බමුණෝ කුමක් හෙයින් නො මරවනු ලබත් ද?

5251. ඔවුහු සක්දෙවිඳුගේ දකුණත ය යි යාගස්ථානයන්හිදී කැල ලීයක් සිඳිති. ඉදින් එය සැබෑ නම් ශක්‍ර දෙවෙන්ද්‍රයා කපනලද අත් ඇත්තෙකි. ඉන්ද්‍ර ඔහුගේ කවර නම් බලයකින් අසුරයන් දිනා ද?

5252. බමුණන්ගේ ඒ වචනය හිස්මැ ය. සක්දෙවිඳු අත් ඇත්තෙකි. ඒ උතුම් දෙවි තෙම සතුරන් නසන්නෙකි. කිසිවකු විසිනුදු නො නැසිය හැක්කේය. බමුණන්ගේ මේ වේද මන්ත්‍රයෝ තුච්ඡසභාව ඇත්තාහ. මෙය ලෝකයෙහි පෙනෙන රැවටීමකි.

5253. මාලාගිරි ය, හිමවත් ය, ගිජ්ඣ ය, සුදස්සන ය, නිසභ ය, කාකතේරු ය යන මේ පර්වතයෝ ද සෙසු මහත් පර්වතයෝ ද යාග කරන බමුණන් විසින් ආසන සඳහා ගඩොලින් කරන ලදහ යි කියති.

5254. යම් බදු ගඩොලකින් යාග කරන බමුණන් විසින් ආසන කරන ලදහ යි කියද්ද මේ පර්වතයෝ එ බදු අයුරු ඇත්තෝ නො වෙති. නො සෙල්වෙන පිහිටි ගල් ඇති අන් අයුරු ඇත්තෝ යි.

5255. ගඩොල් බොහෝ කලෙකිනුදු ගල් නො වෙයි. එහි යකඩ ද ලෝහ ද උපදනේ නො වේ. යාගයෙහි දී මෙය වර්ණනා කරන්නෝ යාග කරන බමුණන් විසින් කළ ආසන යැ යි කියත්.

5256. වෙද හදරන මන්ත්‍ර කොටස්වලින් යුත් තපස්වී වූ බමුණා ඉල්ලීමට සුදුස්සෙකැ යි ද කීහ. මුහුදු ඉවුරෙහි දිය නාන්නා වූ එ බදු බමුණකු සයුර ගිල ගත්තේ ය. එහෙයින් (මුහුදු) පානය නො කළ හැක්කක් (ලුණු දිය ඇත්තක්) කරන ලදී.

5257. නිම කොට උගත් වේද ඇති මන්ත්‍රයෙන් යුත් දහසකට වැඩි බමුණන් නදිහු ගිල්වකි. එහෙයින් නදී ජලයෙහි වෙනස් රසක් (ලුණු රසක්) නොවේ. කවර කරුණකින් අසම වූ සමුද්‍රය බ්‍රහ්මයා නො පිය යුත්තක් කෙළේ ද?

5258. යෙ කෙචි කූපා ඉධ ජීවලෝකෙ
ලොණුදකා කූපබලෙහි ඛාතා,
න බ්‍රාහ්මණජෙක්ඛාහරණෙන තෙසු
ආපො අපෙයෝ දිරසඤ්ඤරාහු.

5259. පුරෙ පුරඤ්ඤා කා කඤ්ඤ හරියා
මනො මනුඤ්ඤං අජනෙසි පුඛෙඛ,
තෙනාපි ධම්මෙන න කොචි හීනො
එවම්පි වොඤ්ඤඝඤ්ඤවිභාගමාහු.

5260. චණ්ඩාලපුත්තොපි අධිච්ච වෙදෙ
භාසෙය්‍ය මන්තෙ කුසලො මුනීමා,
න තස්ස මුද්ධා විඵලෙය්‍ය සත්තධා
මන්තා ඉමෙ අජ්ඣවධාය කත්තා.[1]

5261. වාචාකතා ගිද්ධිකතා[2] ගහීතා
දුම්මොචයා කව්‍යපථානුපත්තා,
බාලානවිත්තං විසමෙ නිවිට්ඨං
තදපපඤ්ඤා අභිසද්දහන්ති.

5262. සීහස්ස ව්‍යග්ඝස්ස ච දීපිනො ච
න විජ්ජති පොරිසියං බලෙන,
මනුඤ්ඤභාවො ච ගවංව පෙක්ඛා
ජානී හි තෙසං අසමා සමානා.[3]

5263. සචෙ ච රාජා පඨවිං විජිත්වා
සජීවවා අඤ්ඤවො පාරිසජ්ජා,
සයමෙව සො සත්තුසඞ්ඝං[4] විජෙය්‍ය
තස්ස පජා නිච්චසුඛී භවෙය්‍ය.

5264. ඛත්තියමන්තා ච තයො ච වෙද
අක්ඛෙන එතෙ සමකා භවන්ති,
තෙසඤ්ච අත්ථං අවිනිච්ඡිනිත්වා
න බුජ්ඣති ඔඝපථංව ජන්තු.

5265. ඛත්තියමන්තා ච තයො ච වෙද
අක්ඛෙන එතෙ සමකා භවන්ති,
ලාභො අලාභො අයසො යසො ච
සඛෙඛ තෙ සඛෙඛසං චතුන්නධම්මා.

---

1. කත්තා – මජ්ඣ.
2. ගිද්ධිගතා – මජ්ඣ., ස්‍යා.
3. සමානං – මජ්ඣ., ස්‍යා.
4. සංඝ – මජ්ඣ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5258. දෙදිව් ඇත්ත, මේ ජීව ලෝකයෙහි ළිං හාරන්නන් කැණූ කරදිය ඇති යම් කිසි කුපයෝ වෙත් ද, එහි ජලය බවුණන් ගිලීම නිසා නො පිය හැකි වීයයි නො කියත්.

5259. පෙර පළමු කප කවර නම් තැනැත්තක් කවරකුහට අඹු වූ ද? පෙර මනස ම මිනිසා ඉපැද්ද වීය. එකරුණෙන් කිසිවෙක් හීන නො වේ. මෙසේ ඇති කල තම තමන්ගේ ක්‍රියාවන් පිළිබඳ වෙනස වෙසෙසින් කියති.

5260. ප්‍රඥාවත් දණ්ඩ වණ්ඩාල පුත්‍රයෙක් ද වේදය ඉගෙන මන්ත්‍ර කියන්නේ නම් ඔහු ගේ මුදුන සත්කඩක් කොට නො පැළෙන්නේ ය. ඒ බැවින් මේ මන්ත්‍රයෝ තමහට වධ පිණිස කරන ලද්දෝ ය.

5261. බොරු බසින් කරනලද ලාභයෙහි ගිජුබැවින් බවුණන් විසින් ගනුලබන කාව්‍යකාරයින්ගේ බසට අනුව ගිය මේ වේද මන්ත්‍ර නො මුදුලිය හැක්කෝ ය. තුවණැත්තන්ගේ සිත මේ විෂම වේදයෙහි බැසගෙන සිටියේ ය. අඥානයෝ එය අදහති.

5262. බලයෙන් සිංහයකුගේ ද ව්‍යාඝ්‍රයකුගේ ද දිවියකුගේ ද පෞරුෂයට සමානවූවක් බවුණන්හට නැත. (ඔවුන්ගේ) මනුෂ්‍යත්වය ද ගවයන්ගේ සභාව මෙන් දක්කයුතු ය. අඥානභාවය හේතු කොට ගෙන ගවයන් හා සමවන ඒ බවුණන්ගේ ජාතිය වනාහි (ගවයන් හා) නො සම වෙයි.

5263. ඉදින් (මහබඹු දුන් හෙයින්) රජ ද පොළොව දිනා කීකරු පිරිස් ඇත්තේ සහජීවනය කරන්නන්ගෙන් යුත් වූයේ වේ ද, ඒ රජ, තෙමේම සතුරු සමූහය ජයගන්නේ නම් ඔහුගේ (රට වැසි) ප්‍රජාව නිබඳ සුවයට පැමිණෙන්නේ ය. (යුද්ධයක් අනවශ්‍ය හෙයිනි.)

5264. ක්ෂත්‍රිය මන්ත්‍ර ද ත්‍රිවේදය ද යන මොවුහු අර්ථයෙන් සමාන වෙති. ඔවුන් පිළිබඳ අර්ථ විනිශ්චය නො කොට (ආඥාවශයෙන් ගන්නා තෙනැත්තේ) සැඩ දිය පහරින් වැසුණු මග මෙන් (එහි අර්ථය) අවබෝධ නො කෙරෙයි.

5265. ක්ෂත්‍රිය මන්ත්‍ර ද ත්‍රිවේදය ද යන මොවුහු වචනාර්ථ වශයෙන් සම වෙති. ලාභය අලාභය අයසය යසය යන මොවුහු සියලු චතුර්වර්ණයන් පිළිබඳ සභාවධර්මයෝ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5266. යථාපි ඉබ්භා ධනධඤ්ඤ හෙතු
කම්මානි කාරෙන්ති[1] පුථූ පථව්‍යා,
තෙවිජ්ජසඞ්ඝාපි[2] තථෙව අජ්ජ
කම්මානි කාරෙන්ති පුථූ පථව්‍යා.

5267. ඉබ්භෙහි එතෙ සමකා භවන්ති.
නිව්වුස්සුකා[3] කාමගුණෙසු යුත්තා,
කම්මානි කාරෙන්ති පුථූ පථව්‍යා
තදප්පපඤ්ඤා දිරසඤ්ඤරා තෙ.

යඤ්ඤභෙදවාදකණ්ඩො.

5268. කස්ස භෙරී මුතිංගා ච සඞ්ඛාපණවදෙණ්ඩිමා,[4]
පුරතො පටිපන්නානි හාසයන්නා රථෙසභං.

5269. කස්ස කඤ්චනපබ්බෙන පුථුනා විජ්ජුවණ්ණිනා,
යුවා කලාපසන්නදෙඩා කො එති සිරියා ජලං.

5270. උක්කාමුඛෙ[5] පහට්ඨංච ඛදිරඞ්ගාරසන්නිභං,
මුඛං චාරුරිවාභාති[6] කො එති සිරියා ජලං.

5271. කස්ස ජම්බොනදං ජත්තං සසලාකං මනොරමං,
ආදිච්චරංසාවරණං කො එති සිරියා ජලං.

5272. කස්ස අඞ්ගං[7] පරිග්ගය්හ වාළවීජනිමුත්තමං,
චරතෙ[8] වරපඤ්ඤස්ස මුද්ධනි උපරූපරි.

5273. කස්ස පෙඛුණහත්ථානි විචිත්‍රානි මුදූනි ච,
තපඤ්ඤමණිදණ්ඩානි[9] චරන්ති උභතො මුඛං.

5274. ඛදිරඞ්ගාරවණ්ණාභා ඔක්කාමුඛෙ පහංසිතා,
කස්සෙතෙ කුණ්ඩලා වග්ගු සොභන්ති උභතො මුඛං.

5275. කස්ස වාතෙන ජුපිතා නිද්ධන්නා මුදුකාලකං,[10]
සොභයන්ති නලාටන්තං නභා විජ්ජුරිවුග්ගතා.

5276. කස්ස එතානි අක්ඛීනි ආයතානි පුථූනි ච,
කො සොභති විසාලක්ඛො කස්සෙතං උණ්ණජං මුඛං.

---

1. කරොන්ති – මජසං.
2. සඞ්ඝාව – මජසං.
3. නිව්වුස්සුක්කා – මජසං.
4. දින්දිමා – මජසං. ස්‍යා.
5. ඔක්කාමුඛ – අට්ඨකථා
6. චාරුදිවා – මජසං.
7. අඞ්ගං – මජසං. ස්‍යා.
8. උභතො – මජසං. ස්‍යා.
9. කඤ්චනමණිදණ්ඩානි – මජසං. සුවණ්ණ – ස්‍යා.
10. කාලකං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5266. යම් සේ ගෘහපතියෝ ධනධාන්‍ය හේතුවෙන් පොළොවෙහි බොහෝ කර්මාන්ත කරවද්ද, බමුණෝ ද එලෙසින් ම දැන් පොළොවෙහි බොහෝ කර්මාන්ත කරවති.

5267. නිතර උත්සාහ ඇති පස්කම් සැපතෙහි යෙදුණු පොළොවෙහි බොහෝ කර්මාන්ත කරවන මොවුහු ගෘහපතියන් හා සමාන වෙති. දෙදිව් ඇති අරිට්ඨය, මඳ නුවණැති ඒ බමුණෝ බමුණු දහමින් දුරුවූවෝය යි (භූරිදත්ත තාරජ කී ය.)

යක්ඛහෙදවාද කාණ්ඩය යි.

5268. වැයුම ඇත්තා වූ මහබෙර ද මිහිඟුබෙර ද සක් ද පනාබෙර සහ ගැට බෙර ද යන මේ තූර්‍යයෝ රජු සතුටු කෙරෙමින් කවරකුගේ අභිමුඛයෙන් පිළිපන්නාහු ද?

5269. මහත් වූ විදුලියට බදු පැහැ ඇති රන් මුවා නළල්පටින් කවරකුගේ මුහුණ බැබළේ ද? තරුණ වූ දුනුහියවුරින් සැරසුණු කවරෙක් සොභාවෙන් දිලියෙමින් එයි ද?

5270. කඹුරු උදුනෙහි ඔප දමන ලද්දක් මෙන් දිලියෙන කිහිර'ඟුරු මෙන් ප්‍රභා ඇති මනෝඥ වූ මුහුණ බැබළෙයි. එ බදු කවරෙක් සෝභාවෙන් දිලියෙමින් එයි ද?

5271. සිත්කලු සලාක සහිත හිරැස් වළකන රන්මුවා ඡත්‍රය කවරකුහට දරනු ලැබේ ද? සෝභාවෙන් දිලියෙමින් කවරෙක් එයි ද?

5272. සෙමෙර දරන්නන් කළවයෙන් රඳවන ලද උතුම් වල්විදුනාව උතුම් නුවණ ඇති කවරකුගේ හිස මත්තෙහි හැසිරේ ද?

5273. සත්රුවනින් විසිතුරු මෘදු වූ රන් හා මිණියෙන් කැරුණු දඬු (මිටි) ඇති මොණර පිල් කලඹහු කවරකුගේ මුව දෙපසින් හැසිරෙද් ද?

5274. දිලියෙන කිහිර'ඟුරු බදු පැහැ යුත් කඹුරු උදුනෙහි ඔප දුමූ මේ මනහර කුණ්ඩලාභරණයෝ කවරකුගේ මුව දෙපසැ බැබළෙත් ද?

5275. සුළඟින් සැලෙන සිනිඳු වූ අග් ඇති මෘදු වූ කේශයෝ අහසින් පැන නැඟුණු විදුලිය මෙන් කවරකුගේ නළල් කෙළවර හොබවද් ද?

5276. දිගු පුළුල් වූ මේ ඇස් කවරකුගේ ද? මහත් ඇස් ඇති මේ කවරෙක් බැබළේ ද? රන් කැඩපතක් බදු පිරිපුන් මේ මුහුණ කවරකුගේ ද?

5277. කස්සෙතෙ ලපනජා[1] සුද්ධා සුද්ධසඞ්ඛවරූපමා,
භාසමානස්ස සොභන්ති දන්තා කුප්පිලසාදිසා.

5278. කස්ස ලාඛාරසසමා හත්ථපාද සුබෙධිතා,
කො සො බිම්බොට්ඨ සම්පන්නො දිවා සුරියොව භාසති.

5279. හිමව්වයෙ හෙමවතො[2] බ්‍රහාසාලොව[3] පුප්ඵිතො,
කො සො ඔදතපාවාරො ජයං ඉන්දොව සොභති.

5280. සුවණ්ණපිළකාකිණ්ණං මණිදණ්ඩවිචිත්තිතං,[4]
කො සො පරිසමොගය්හ ඊසො[5] බ්‍රග්ගංව මුව්වති.

5281. සුවණ්ණ විකතා චිත්‍රා[6] සුකතා චිත්‍ර[7] සිබ්බනා,[8]
කො සො ඔමුඤ්චතෙ පාද නමො කත්වා මහෙසිනො.

5282. ධතරට්ඨා හි[9] තෙ නාගා ඉද්ධිමන්තො යසස්සිනො,
සමුද්දජාය උප්පන්නා එතෙ නාගා මහිද්ධිකාති.

භූරිදත්තජාතකං ෂට්ඨමං.

මහානාරදකස්සප ජාතකං සත්තමං

5283. අහු රාජා විදෙහානං අඞ්ගාති[10] නාම ඛත්තියො,
පහූතයොග්ගො ධනිමා අනන්තබලපොරිසො.

5284. සො ච පණ්ණරසිං[11] රත්තිං පුරිමෙ යාමෙ අනාගතෙ,
චාතුමස්ස[12] කොමුදියා අමවෙව සන්නිපාතයි.

5285. පණ්ඩිතෙ සුතසම්පන්නෙ මිහිතපුබ්බෙ[13] විවක්ඛණෙ,
විජයඤ්ච සුනාමඤ්ච සෙනාපතිමලාතකං.

5286. තමනුපුව්ජ වෙදෙහො පවෙචකං බ්‍රූථ සංරුචිං,
චාතුමස්ස[14] කොමුදජ්ජ ජුණ්ණගං ව්‍යපගතං තමං
කායජ්ජ රතියා රත්තිං විහරෙමු ඉමං උතුං.

---

1. ලපනාජාතා – මජසං.
2. හිමවතී – මජසං.
3. මහාසාලොව – මජසං.
4. රුචිත්තකං – මජසං. ස්‍යා.
5. ඊසං – මජසං. ඊසෙ – ස්‍යා.
6. රිත්තා – මජසං.
7. චිත්තකො – මජසං. ස්‍යා.
8. සිබ්බ සිබ්බනී – මජසං. ස්‍යා.
9. ධතරට්ඨස්ස – ස්‍යා.
10. අඞ්ගතී – මජසං. ස්‍යා.
11. පන්නරසෙ – මජසං. ස්‍යා.
12. චාතුමාසා – මජසං. චාතුමාස – වි.
13. මිත – මජසං ස්‍යා.
14. චාතුමාසා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5277. කථා කරන යමකු ගේ පිරිසුදු උතුම් සක්පෙති බඳු නොද කැකුළු සමාන වූ දත් බැබැළේ ද ඒ බඳු පිරිසුදු දත් කවරකු ගේ ද?

5278. ලාකඩ දියට බඳු පැහැ ඇති මේ සුව සේ වැඩුණු අත් පා කවරකු ගේ ද? බිඹුපල වැනි තොල් ඇති ඒ කවරෙක් දවල් හිරු මෙන් බැබැළේ ද?

5279. හිමසෘතුව ගේ අවසන්හි හිමාලයෙහි පිහිටි මහ සල් රුකක් මෙන් පෙරෙවි සුදු උතුරු සළු ඇති ඒ කවරෙක් නම් අසුරයන් දිනූ සක්දෙව් රජු මෙන් බැබැළේ ද?

5280. රන් බුබුලින් ගැවැසි ගත් මිණි මිටෙන් විසිතුරු කැරැණු කඩුව පිරිස් මැදට බැසගත් අධිපති කවරෙක් නම් මුද ද?

5281. රනින් කැරැණු විසිතුරු කොට මැනැවින් කැරැණු ගෙතුමෙන් යුත් මිරිවැඩි, මහර්ෂි වූ ඔබ හට නමස්කාර කොට ඒ කවරෙක් පාදයෙන් මුදයි ද? සාගර බ්‍රහ්මදත්ත රජ තෙමේ පිය රජ වූ තාපසයාණන්ගෙන් ඇසීය.

5282. සෘද්ධි ඇති යශ පිරිවර ඇති ඔව්හු ධෘතරාෂ්ට්‍ර නම් නාරජු ගේ පුත් වූ නාගයෝ වෙති. මහත් සෘද්ධි ඇති මේ නාගයෝ වනාහි සමුද්‍රජා නමැති මගේ දුවට උපන් පුත්තු වෙති යි පියරජ තෙමේ කී ය.

භූරිදත්ත ජාතකය නිමි.

7. මහානාරදකස්සප ජාතකය

5283. බොහෝ හස්ත්‍යශ්ව වාහනාදිය ඇති ධනවත් වූ අපමණ භට සේනා ඇති විදේහ රට වැසියන්ගේ අංගාති නම් ක්ෂත්‍රිය රජෙක් විය.

5284. ඒ අංගාති නමැති රජ තෙමේ වස්සාර මාසයාගේ අවසන් දවස වන පිපි කුමුදු මල් ඇති ඉල්මසැ පුරපසළොස්වක් රාත්‍රිය පිළිබඳ ප්‍රථම යාමය ඉක්මැ නොගිය කලැ ඇමතියන් රැස් කැරැ වී ය.

5285–5286 පණ්ඩිත වූ ඇසුපිරූ තැන් ඇති සිනා පෙරැදුරි වැ කථා කරන ස්වභාව ඇති දක්ෂ වූ විජය නමැති ඇමතියා ද සුනාම නමැති ඇමතියා ද අලාන නමැති සෙන්පතියා ද යන මොවුන් ගෙන් වේදේහ රජ තෙමේ වෙන් වෙන් වශයෙන් තම තමන් ගේ අදහස් වෙන වෙනම කියවූ, අද ඉල්මසැ පිපි කුමුදු ඇති මැදිපොහෝ දවස් වෙයි, පුන්සඳ උදව්විය, අඳුරු දුරු විය, අද මෙ බඳු රැයක් කවර නම් ඇල්මකින් වෙසෙමු දැයි විචාළේය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5287. තතො සෙනාපති රඤ්ඤෝ අලාතො එතදබ්‍රවි,
හටඨං[1] යොගගං බලං සබ්බං සෙනං සන්නාහයාමසෙ.

5288. නියාම දෙව යුද්ධාය අනන්තබලපොරිසා,[2]
යෙ තෙ වසං න ආයන්ති වසං උපනයාමසෙ;[3]
එසා මය්හං සකා දිට්ඨි අජිතං ඔජිනාමසෙ.[4]

5289. අලාතස්ස වචො සුත්වා සුනාමො එතදබ්‍රවි,
සබ්බෙ තුය්හං මහාරාජ අමිත්තා වසමාගතා.

5290. නික්ඛිත්තසත්ථා පච්චත්ථා නිවාතමනුවත්තරෙ,
උත්තමො උස්සවො අජ්ජ න යුද්ධං මම රුච්චති.

5291. අන්නං පානඤ්ච ඛජ්ජඤ්ච විපං අභිහරන්තු තෙ,
රමසසු දෙව කාමෙහි නච්චගීතෙ සුවාදිතෙ.

5292. සුනාමස්ස වචො සුත්වා විජයො එතදබ්‍රවි,
සබ්බෙ කාමා මහාරාජ නිච්චං තව උපට්ඨිතා.

5293. න හෙතෙ දුල්ලභා දෙව තව කාමෙහි මොදිතුං,
සදපි කාමා ලබ්භානි[5] නෙතං චිත්තමතං මම,

5294. සමණං බ්‍රාහ්මණං වාපි උපාසෙමු බහුස්සුතං,
යො නජ්ජ විනයෙ කඞ්ඛං අත්ථධම්මවිදූ ඉසෙ.

5295. විජයස්ස වචො සුත්වා රාජා අඩ්ඨාතිමබ්‍රවි,
යථා විජයො භණති මය්හමෙපතෙව රුච්චති.

5296. සමණං බ්‍රාහ්මණං වාපි උපාසෙමු බහුස්සුතං,
යො නජ්ජ විනයෙ කඞ්ඛං අත්ථධම්මවිදූ ඉසෙ.

5297. සබ්බෙව සන්තා කරොථ මතිං කං උපාසෙමු පණ්ඩිතං,
කො නජ්ජ විනයෙ කඞ්ඛං අත්ථධම්මවිදූ ඉසෙ.

5298. වෙදෙහස්ස වචො සුත්වා අලාතො එතදබ්‍රවි,
අත්ථායං මිගදයසම්මං අවෙලො ධීරසම්මතො.

---

1. හතං - මජ්ඣං.
2. පොරිසෙ - මජ්ඣං.
3. උපනීය්‍යාමසෙ - මජ්ඣං. සය්හ.
4. ඔජීයාමසෙ - මජ්ඣං. සය්හ.
5. සුලභා - මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5287. ඉක්බිති රජු ගේ අලාත නමැති සෙනෙවි තෙමේ මෙය කී ය: සතුටු වූ හස්ත්‍යශ්වාදි වාහන ඇති මහ බළ ඇණි යුත් සියලු සෙනහ යුද පිණිස සරසමිහ.

5288. දේවයන් වහන්ස, අපමණ බළ පිරිස ඇති අපි යුද පිණිස නික්මැ යමු. යම් ඒ සතුරු කෙනෙක් වසහ නො වෙත් නම් ඔවුන් වයහ කරමු. නො දිනූ යමෙක් වෙයි නම් ඔහු දිනමු. මේ මගේ අදහසය යි කීය.

5289. අලාත නමැති සෙනෙවිහු ගේ බස් අසා සුනාම ඇමැති තෙමේ මෙය කී ය: මහරජ ඔබ ගේ සියලු සතුරෝ ඔබට වසඟයහ.

5290. ඔහා තැබූ අවි ඇති සතුරෝ විරුද්ධ නො වෙති. අද උතුම් උත්සව දිනයකි. එහෙයින් මට යුද්ධය නො රිසි ය.

5291. ආහාර හා පාන වර්ග ද කෑ යුතු දෑ ද ඔබ වහන්සේට යුහු වැ එළවත්ව ඇ ද වාදනය කරන ලද නෘත්‍යගීතයන් යුහු වැ එළවත්ව යි ද දේවයන් වහන්ස, ඔබ වහන්සේ පස්කම් සැපතින් සිත් අලවනු යෙහෙකි යි කී ය.

5292. සුනාම නමැති ඇමතියා ගේ මේ කීම ඇසීමෙන් විජය නමැති ඇමැති තෙමේ මෙය කී ය: මහරජ ඔබ වහන්සේට රූප සද්දදි සියලු කාමයෝ නිරන්තරයෙන් එළඹ සිටියාහු වෙති.

5293. මහරජ, කම් සැපතින් සතුටුවීම ය යන මෙය ඔබ වහන්සේට පුලබය. හැම කල මැ කාමයෝ ලැබෙති. එහෙයින් මෙය මා සිතට රුචි නො වෙයි කී ය.

5294. අද අර්ථ ධර්ම දන්නා වූ යම් ඍෂිවරයෙක් අපට උපන් සැක දුරු කෙරේ ද? ඒ බඳු බොහෝ ඇසූ පිරුතැන් ඇති මහණකු වෙත හෝ බමුණකු වෙත හෝ එළඹෙමු යි (හේ) කී ය.

5295. විජය නමැති ඇමැතියා ගේ බස් අසා අංගාති රජ තෙමේ මෙසේ කී ය: විජය තෙමේ යම් සේ කියයි ද මට ද මෙ කරුණ රුචි වේ.

5296. අර්ථ ධර්ම දන්නා යම් ඍෂිවරයෙක් අද අපට උපන් සැක දුරු කෙරේ ද? ඒ බඳු ඇසූ පිරු තැන් ඇති මහණකු හෝ බමුණකු වෙත එළෙඹෙමු යි කී ය.

5297. අර්ථ ධර්ම දන්නා කවර නම් ඍෂිවරයෙක් අද අපට උපන් සැක දුරු කෙරේද, අපි කවර නම් පඬිවරයකු කරා එළඹෙමු ද යි මෙහි සිටිනා තෙපි හැම දෙනා ම අදහස් කියවු යි කී.

5298. වේදේහ නමැති රජු ගේ බස් අසා අලාත නම් සෙනෙවි තෙමේ මෙය කීය: මිගදය නමැති උයනෙහි පඬිවරයෙකැ යි සම්මත වූ නිගණ්ඨයෙක් ඇත.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5299. ගුණො කස්සපගොත්තායං සුතො චිත්‍රකථී ගණී,
තං දෙව පයිරුපාසය[1] සො නො කඞ්ඛං විනෙස්සති.

5300. අලාතස්ස වචො සුත්වා රාජා චොදෙසි සාරථිං,
මිගදයං ගමිස්සාම යුත්තං යානං ඉධානය.

5301. තස්ස යානං අයොජෙසුං දන්තං රූපියපක්ඛරං,
සුක්කමට්ඨපරිවාරං පණ්ඩරං දෙසිනාමුඛං.

5302. තත්‍රාසුං කුමුද යුත්තා චත්තාරො සින්ධවා හයා,
අනිලූපමසමුප්පාතා[2] සුදන්තා සොණ්ණමාලිනො.

5303. සෙතං ඡත්තං සෙතරථො සෙතස්සා සෙතවීජනී,
වෙදෙහො සහමච්චෙහි නීය්‍යං චන්දෙව සොභථ.[3]

5304. තමනුයායුං[4] බහවො ඉන්දබග්ගධරා බලී,
අස්සපිට්ඨිගතා ධීරා[5] නරා නරවරාධිපං.

5305. සො මුහුත්තං ව යායිත්වා යානා ඔරුය්හ ඛත්තියො,
වෙදෙහො සහමච්චෙහි පත්ති ගුණමුපාගමි.

5306. යෙපි තත්ථ තද ආසුං බ්‍රාහ්මණිබ්‍හා සමාගතා,
න තෙ අපනයි රාජා අකටං භූමිමාගතෙ.

5307. තතො සො මුදුකාභිසියා මුදුචිත්තකලන්දකෙ,
මුදුපච්චත්ථතෙ රාජා එකමන්තං උපාවිසි.

5308. නිසජ්ජ රාජා සම්මොදී කථං සාරාණියං තතො.
කච්චි යාපනීයං භන්තෙ වාතානමවිසග්ගතා.[7]

5309. කච්චි අකසිරා වුත්ති ලබ්භති පිණ්ඩයාපනං,
අප්පාබාධොවසී[8] කච්චි චක්ඛුං න පරිහායති.

5310. තං ගුණොපටිසම්මොදි වෙදෙහං විනයෙ රතං,
යාපනීයං මහාරාජ සබ්බමෙතං තදූභයං.

---

1. පයිරුපාසෙම – මජ්ඣං. ස්‍යා.
2. අකිලූපපසමුප්පාද – මජ්ඣං.
3. සොභති – මජ්ඣං. ස්‍යා.
4. තමනුයායිංසු – මජ්ඣං.
5. වීරා – මජ්ඣං.
6. මුදුචිත්තකසන්ථතෙ – මජ්ඣං.
7. වාතානමවියත්තතා – ස්‍යා.
8. අප්පාබාධො – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5299. කාශ්‍යප ගොත්‍රයෙහි වූ ගුණ නමැති මේ තෙමේ බොහෝ ඇසූ පිරුතැන් ඇත්තෙකි, විසිතුරු කථා ඇත්තෙකි, ගණාචාර්‍යයෙකි. දේවයන් වහන්ස, ඒ නිගණ්ඨයා ඇසුරු කරන්නේ මැනැවි. හේ අපට උපන් සැක දුරු කරන්නේ ය.

5300. අලාත නමැති සෙනෙවියා ගේ බස් අසා රජ තෙමේ මිගදය නම් උයනට යන්නෙමු යි සුදුසු වාහනයක් මෙහි ගෙනෙව යි රියදුරාට අණ කෙළේ ය.

5301. දන්තමය (දළමුවා) රජතමය (රිදීමුවා) වෙහෙලි ඇති සුදු මටසිලුටු රිය පිරිවර ඇති බැබළෙන සඳට බඳු රථයක් ඒ රජුට පිළියෙළ කළහ.

5302. කුමුදු පැහැ ඇති පවනට බඳු ගමන් ඇති මැනැවින් දැමුණු ගෙලැ පළැඳි ස්වර්ණමාලා ඇති සෛන්ධව අශ්වයෝ සතර දෙනෙක් ඒ රථයෙහි යොදන ලදහ.

5303. සේසත ද සුදු රිය ද සුදු අශ්වයෝ ද සුදු වල් විදුනා ද ඇති රජ තෙමේ ඇමතියන් සමඟ යන්නේ පුන්සඳ මෙන් බැබැළුණේ ය.

5304. ඉන්ද්‍රයා හට මෙන් කඩු දරන බලවත්වූ වැර ඇති අසුන් පිට නැගි බොහෝ මිනිස්සු එ රජු අනුව ගමන් කළහ.

5305. වෙදේහ නමැති ඒ ක්ෂත්‍රිය රජ තෙමේ අමාත්‍යයන් සමඟ සැණෙකින් උයනට ගොස් රියෙන් බැස පා ගමන් ඇත්තේ ගුණ නමැති නිගණ්ඨයා (නුවටා) වෙත පැමිණියේ ය.

5306. එකලැ එහි රැස් වූ බ්‍රාහ්මණ ගෘහපතියෝ වූ හු ද රජ තෙමේ ඔවුන් බැහැර නො කෙළේ ය. අවකාශ නො කළ භූමියෙහි එකත් පස්හි හිඳැ ගත්තේය.

5307. නැවත ඒ රජ තෙමේ මුදු පහස් ඇති විසිතුරු ඇතිරිලි ඇති මුදු පසතුරුණුයෙන් යුත් මොළොක් බිස්සෙක්හි එකත් පස් වැ හිඳැ ගත්තේය.

5308. රජ තෙමේ එහි හිඳීමෙන් පසු සතුටු විය. නැවැත සිහි කටයුතු කථා කෙළේ ය. හිමියනි, කිම, යැපෙන්නට පුළුවන් ද? ශරීරය පිළිබඳ වාතයන්ගේ විසම බවක් නැද්ද.?

5309. කිම, නිදුකින් ජීවත් විය හැකි ද, ආහාරයෙන් යැපෙණිද, ආබාධ නැත්තෙහි ද, ඇස් පිළිබඳ පීඩා නැත්තෙහි ද?

5310. ගුණ නැමැති නිගණ්ඨ තෙමේ විනයෙහි ඇලුණු ඒ වෙදේහ රජහට සතුටු විය යුතු බසින් පිළිවදන් දුනි. මහරජතුමනි,. යැපිය හැකි ය. මේ සියල්ල ඒ ලෙස ම ය. වාතාබාධ නැති බව ද ඇස් පිරිහීම් නැති බව ද යන දෙකරුණ ද එසේ ම ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5311. කච්චි තුය්හම්පි වෙදෙහ පච්චන්තා න බලීයරෙ,
කච්චි අරොගං යොග්ගනෙත්තා කච්චි වහති[1] වාහනං
කච්චි තෙ ව්‍යාධයො නත්ථි සරීරසුපතාපිකා.[2]

5312. පටිසමෙමොදිතො රාජා තතො පුච්ඡි අනන්තරා,
අත්ථං ධම්මඤ්ච සුයඤ්ච ධම්මකාමො රථෙසභො.

5313. කථං ධම්මං චරෙ මච්චො මාතාපිතූසු කස්සප,
කථං චරෙ ආචරියෙ පුත්තදාරෙ කථං චරෙ.

5314. කථං චරෙය්‍ය වුද්ධෙසු කථං සමණබ්‍රාහ්මණෙ,
කථඤ්ච බලකායස්මිං කථං ජානපදෙ චරෙ.

5315. කථං ධම්මං චරිත්වාන පෙච්ච ගච්ඡති[3] සුග්ගතිං,
කථඤ්හිකෙ අධම්මට්ඨා පතන්ති නිරයං අධො.

5316. වෙදෙහස්ස වචො සුත්වා කස්සපො එතදබ්‍රවි,
සුණොහි මෙ මහාරාජ සච්චං අවිතථං පදං.

5317. නත්ථි ධම්මස්ස විඤ්ඤත්ති[4] ඵලං කල්‍යාණපාපකං,
නත්ථි දෙව පරො ලොකො කො තතො හි ඉධාගතො.

5318. නත්ථි දෙව පිතරො වා කුතො මාතා කුතො පිතා,
නත්ථි ආචරියො නාම අදන්තං කො දමෙස්සති.

5319. සමතුල්‍යානි භූතානි නත්ථි ජෙට්ඨාපචායිනො,
නත්ථි බලං වා වීරියං වා කුතො උට්ඨානපොරිසං,[5]
නියතානි හි භූතානි යථා ගොටවිසො තථා.

5320. ලද්ධ්‍යං ලභතෙ මච්චො තත්ථ දානඵලං කුතො.
නත්ථි දානඵලං දෙව අවසො දෙව වීරියො.

5321. බාලෙහි දානං පණ්ඩිතෙහි පටිවිජිතං,
අවසා දෙන්ති ධීරානං බාලා පණ්ඩිතමානිනො.

---

1. වාහන්ති – මජ්ඣං.
2. තාපියා – මජ්ඣං: සබ්බා.
3. චවිත්වාගච්ඡන්ති – මජ්ඣං.
4. චරිතස්ස – මජ්ඣං, වී.
5. පොරිසො – මජ්ඣං. සබ්බා.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5311. වේදේහ මහරජුනි, කිම, ඔබ ගේ පසල්දනවු වැසියෝ බල පවත්වන්නෝ නො වෙද්ද (නොහොත් නො කිපෙද්ද) බළ සෙනඟ රථ-වාහන නීරෝග වෙත්ද ඔබ ගේ වාහනය ඔබ උසුලන්න හැකි වෙයි ද? කිම, ශරීරය තවත රෝගයෝ ඔබට නැද්ද?

5312. පිළිසඳර වදනින් තුටු පත් රාජොත්තම වූ ඒ වේදේහ රජ තෙමේ ඉන් පසු වැ අර්ත්ථය (පාලි අර්ත්ථ) ද, ධර්මය (පාලි ධර්ම) ද, න්‍යායය (කාරණ යුක්ති) ද විචාළේ ය.

5313. එම්බා කස්සපය, මනුෂ්‍ය තෙමේ මවුපියන් කෙරෙහි දැහැමින් කෙසේ හැසිරේ ද? ගුරුවරයා කෙරෙහි දැහැමින් කෙසේ හැසිරේද? අඹු දරුවන් කෙරෙහි දැහැමින් කෙසේ හැසිරේ ද?

5314. වැඩිමහල්ලන් කෙරෙහි දැහැමින් කෙසේ හැසිරේ ද? මහණ බමුණන් කෙරෙහි දැහැමින් කෙසේ හැසිරේ ද? බළසෙනඟ කෙරෙහි ද දැහැමින් කෙසේ හැසිරේ ද? දනවුවැසියන් කෙරෙහි දැහැමින් කෙසේ හැසිරේ ද?

5315. දහමින් කවර අයුරකින් හැසිරීම හේතු කොට ගෙන පරලොව සුගතියට යේද නො දැමිටු (අධම්මිට්ඨ) සමහරු යට දෙස නරකයට කෙසේ නම් වැටෙද්දැ යි විචාළේ ය.

5316. වේදේහ රජුගේ බස් අසා කස්සප නම් නිගණ්ඨ (තුවට) තෙමේ මෙය කී ය: මහරජ, සැබෑ වූ නිබොරු වූ ම බස් ශ්‍රවණය කර:

5317. **පුහුණු** කළ ධර්මය පිළිබඳ යහපත් නො යහපත් විපාක නැත. මහරජ පර ලොවක් නැත. එ ලොවින් කවරෙක් නම් මෙහි ආයේද?

5318. මහරජ, මුතුන්මිත්තැණියෝ ද නැත. එහෙයින් මෑණියෝ කොයින් ද පියාණෝ කොයින් ද ගුරුවරයෙක් නම් නැත. එහෙයින් නො හික්මුණු අයකු කවරෙක් නම් හික්මවන්නේ ද?

5319. සත්ත්වයෝ සම සම වූවෝ වෙති. වැඩිහිටියන් පුදන්-නෝ ද නැත. බල හෝ වීර්‍ය හෝ නැත. උට්ඨාන වීර්‍යයෙන් යුත් පෞරුෂයක් නම් කොයින් ද? නැව හැර නො යන ගල්වත මෙන් සත්ත්ව-යෝ නියමය අනුවැ යෙති.

5320. මිනිස් තෙමේ ලැබිය යුත්ත ලබයි. එහි දීමෙහි විපාක කොයින් ද, මහරජ දීමෙහි විපාක නැත. මෙසේ දනයෙහි විපාක නැති කලැ (යම්කිසි බාලයෙක් දෙයි නම්) දෙවයිනි, නො වසඟ වූයේ උත්සාහ නැත්තෙක් වැ දන් දෙයි.

5321. දනය පනවන ලද්දේ අඥානයන් විසිනි. පිළිගත්නා ලද්දේ නැණවතුන් විසිනි. දුබල නැණවත්යැ යි සිතන අඥානයෝ නැණවතුන් හට දෙතැ යි කී ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5322. සත්තිමෙ සස්සතා කායා අච්ඡෙජ්ජා අවිකොපිනො,
තෙජො පඨවිරාපො ච[1] වායො සුඛදුඛඤ්චිමෙ
ජීවෙ ච සත්තිමෙ කායා යෙසං ඡෙත්තා[2] න විජ්ජති.

5323. නත්ථි හන්තා වා ඡෙත්තා වා හඤ්ඤරෙ වාපි කොචි නං;
අන්තරෙනෙව[3] කායානං සත්ථානි වීතිවත්තරෙ.

5324. යොපායං[4] සිරමාදය පරෙසං නිසිතාසිනා,
න සො ඡින්දති තේ කායෙ තත්ථ පාපඵලං කුතො.

5325. චුල්ලාසීති මහාකප්පෙ සබ්බෙ සුජ්ඣන්ති සංසරං,
අනාගතෙ තම්හි කාලෙ සඤ්ඤතොපි න සුජ්ඣති.

5326. චරිත්වාපි බහුං භද්‍රං නෙව සුජ්ඣන්ති නාගතෙ,
පාපං චෙපි බහුං කත්වා තං ඛණං නාතිවත්තරෙ.

5327. අනුපුබ්බෙන නො සුද්ධි කප්පානං චුල්ලසීතියා,[5]
නියතිං නාතිවත්තාම වෙලන්තම්ව සාගරො.

5328. කස්සපස්ස වචො සුත්වා අලාතො එතදබ්‍රවි,
යථා භදන්තො[6] භණති මඤ්ඤාංපෙතෙව රුච්චති.

5329. අහංපි පුරිමං ජාතිං සරෙ සංසරිතත්තනො,
පිඞ්ගලො නාමහං ආසිං ලුඤ්ඤෙ ගොඝාතකො පුරෙ.

5330. බාරාණසියං ඵීතාය බහුං පාපං කතං මයා,
බහූ මඤ්ඤං[7] හතා පාණා මහිසා[8] සූකරා අජා.

5331. තතො චුතො ඉධ ජාතො ඉද්ධෙ සෙනාපතීකුලෙ,
නත්ථි නූන ඵලං පාපෙ[9] සොහං න නිරයං ගතො.

5332. අථෙත්ථ බීජකො නාම දසො ආසි පළච්චරී,[10]
උපොසථං උපවසන්තො ගුණසන්තිකුපාගමි.

---

1. ආපො – මජ්ජසං. ස්‍යා.
2. ඡෙතා
3. අන්තරෙයෙව – මජ්ජසං. ස්‍යා.
4. යොවායං – මජ්ජසං. ස්‍යා.
5. චුල්ලාසීතියා – මජ්ජසං. ස්‍යා.
6. යථා භණන්තො භණසි – මජ්ජසං. යථාභද්දන්තො – ස්‍යා.
7. මයා – මජ්ජසං. ස්‍යා.
8. මහිංසා – මජ්ජසං. වි.
9. පාපං – මජ්ජසං.
10. පටිච්ඡරී – මජ්ජසං. පටජ්ජරී – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5322. නො සිඳිය හැකි වෙනස්-කොපනය නො කට හැකි ශාශ්වත (හැම කල් පවත්නා) වූ මේ සමූහයෝ සතක් වෙති. එ නම් තේජස් ය, පෘථිවිය, ජලය, වාතය, සැපය, දුකය, ජීවය යන මේ සත යි. යමකුන් පිළිබඳ සිදින්නෙක් නැද්ද ඒ මේ සමූහ සත යි.

5323. නසන්නෙක් හෝ සිඳින්නෙක් හෝ නැත. නැසෙන්නෝ ද නැත. කිසිවෙක් කිසිවකු නසන්නේ ද නො වේ. සිදින සැක් මේ සත්වැදෑරුම් සමූහයන් අතරින් මැ ඉක්ම යත්.

5324. මේ යමෙක් අනුන්ගේ හිස අල්ලාගෙන මුවහත් කඩුවකින් කපා ද හේ ඒ සත්ත්ව කායයන් නො සිඳියි. එහි පාපකර්මයක් විපාකයක් නම් කොයින් ද?

5325. සුවාසූ මහා කල්පයක් මුළුල්ලෙහි සැරිසරන මේ සියල්ලෝ පිරිසිදු වෙති. ඒ පැවැසුණු කාලප්‍රමාණය නො පැමිණි කලැ සිලාදි සංයම ඇත්තේ ද පිරිසිදු බවට නො පැමිණෙයි. (සත්ත්වයන් පිරිසිදු කරන්නට සමතෙක් නම් නැත.)

5326. බොහෝ යහපත කිරීමෙනුදු ඒ පැවසූ කාලය නො පැමිණි කල පිරිසිදු නො වෙති. ඉදින් බොහෝ පව් කිරීමෙන් නමුදු (ශුද්ධිය පිණිස) ඒ කාලය නො ඉක්මවන්නාහ.

5327. කල්පයන් සම්බන්ධ සූ අසූවකින් අප ගේ සංසාර ශුද්ධිය පිළිවෙළින් පවත්නේ ය. වෙරළ නො ඉක්ම පවත්නා සයුර මෙන් අපි දු නියමය හෙවත් සූ අසූ මහකප ඉක්ම නො පවතිමු යි කී ය.

5328. කාශ්‍යප නමැති නුවටාගේ බස් අසා අලාත නම් සෙනෙවි තෙමේ මෙය කී ය: පින්වත් තෙමේ යම්සේ පවසයි ද මට ද එය ම රුචි ය.

5329. මම ද තමා සසර සැරිසැරූ පූර්වජාතිය සිහි කෙරෙමි. මම පූර්වජාතියෙහි පිංගල නමැති රුදුරු වූ ගෝඝාතකයෙක් වීමි.

5330. සමෘද්ධිමත් බරණැස් නුවර දී මා විසින් බොහෝ පව් කරන ලද්දේ ය. මීමෝ ය ඌරෝ ය එළුවෝ ය යන බොහෝ සත්ත්වයෝ මා විසින් මරනලදහ.

5331. එයින් චුත වූ මම මෙ නුවර සමෘද්ධිමත් සෙනෙවි කුලයක උපනිමි. ඒ මම නිරයට නො පැමිණියෙමි. එයින් පාපකර්ම විපාක නැතැ යි සිතමි යි කී ය

5332. ඉක්බිති මේ මියුලු නුවර උප්පන් වූ බීජක නමැති දසයෙක් විය. පෙහෙවස් වෙසෙන හේ තෙමේ ගුණ නම් නිවටයා වෙත එළැඹියේ ය.

5333. කණ්හසපස්ස වචො සුත්වා අලාතස්ස ච භාසිතං,
පස්සසනෙත්තා මුහුං උණ්හං රුදං අස්සූනි වත්තයි.

5334. තමනුපුච්ඡි වෙදෙහො කිමත්ථං සම්ම රොදසි,
කිනෙත්ථ සුතං වා දිට්ඨං වා කිං මං වෙදෙසි වෙදනං.

5335. වෙදෙහස්ස වචො සුත්වා බීජකො එතදබ්‍රවි,
නත්ථි මෙ වෙදනා දුක්ඛා මහාරාජ සුණොහි මෙ.

5336. අහම්පි පුරිමං ජාතිං සරාමි සුධමත්තනො,
සාකෙතාහං පුරෙ ආසිං භාවසෙට්ඨි ගුණෙ රතො.

5337. සම්මතො බ්‍රාහ්මණිබ්‍රාහ්මණානං සංවිභාගරතො සුචි,
න වාපි පාපකං කම්මං සරාමි කතමත්තනො.

5338. තතො චුතාහං වෙදෙහ ඉධ ජාතො දුරිත්තියා,
ගබ්භමණ්ඩි කුම්භදාසියා යතො ජාතො සුදුග්ගතො.

5339. එවම්පි දුග්ගතො සන්තො සමචරියං අධිට්ඨිතො,
උපඩ්ඪභාගං භත්තස්ස දදමි යො මෙ ඉච්ඡති.

5340. චාතුද්දසිං පඤ්චදසිං සද උපවසාමහං,[1]
න වාපි භූතෙ හිංසාමි ථෙය්‍යඤ්ඤාපි විවජ්ජයිං.

5341. සබ්බමෙව හි නූනෙතං සුචිණ්ණං හවති නිප්ඵලං,
නිරත්ථං මක්ඛසිදං සීලං අලාතො යථ භාසති.

5342. කලිමෙව නූන ගණ්හාමි අසිපො ධුත්තකො[2] යථා,
කටං අලාතො ගණ්හාති කිතවො සික්ඛිතො යථා.

5343. දාරං නපජ්ජිපස්සාමි යෙන ගච්ඡාමි සුග්ගතිං,
තඤ්ච රාජ පරොදමි සුත්වා කණ්හපභාසිතං.

5344. බීජකස්ස වචො සුත්වා රාජා අඤ්ඤාතිමබ්‍රවි,[3]
නත්ථි දාරං සුගතියා නියතිං කඞ්ඛ බීජක.

---

1. අහං – මජ්ඣං.
2. ධුත්තිකො – මජ්ඣං.
3. අඩ්ඪගති – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5333. කාශ්‍යපයාගේ බස් අසා අලාත නම් සෙන්පතියා ගේ ද බස් අසා වරින් වර උණුසුම් සුසුම් හෙළමින් කඳුළු වැගිර විය. හෙවත් හැඬීය.

5334. වේදේහ නමැති රජ තෙමේ යහළුව, කවර හෙයින් හඬා දෑ යි ඔහු ගෙන් විචාළේ ය. තොප විසින් අසන ලද්දේ හෝ දක්නා ලද්දේ හෝ කිමෙක් ද කිනම් වේදනාවක් දනවවුද? එය මට කියව යි කී ය.

5335. වේදේහ රජුගේ බස් අසා බීජක නම් දස තෙමේ මෙය කී ය. මහරජ, මට දුක් වේදනාවක් නැත. මාගේ බස් අසනු මැනැවි.

5336. මම මාගේ පූර්වජාතියෙහි සුව සිහි කරමි. මම සාකේත. නුවර ගුණයෙහි ඇලුණු භාවසෙට්ඨී නම් අසූකෙළක් ධන ඇති සිටුවරයෙක් වීමි.

5337. බ්‍රාහ්මණයන් හා ගහපතියන් විසින් ගරු කරන ලද දන් දීමෙහි ඇලුණු පිරිසිදු කර්මාන්ත ඇති මම තමන් කළ පව් කමක් සිහි නො කරමි.

5338. වේදේහ රජුනි, එයින් චුත වූ මම වනාහි මේ මියුලු නුවර දුප්පත් ස්ත්‍රියක වූ කළමිඩියක (කුම්භදාසියක) ගේ කුසැ උපන්මි. උපන් තැන් පටන් ඉතා දුප්පත් වීමි.

5339. මෙසේ ඉතා දුප්පත් වූයෙමි නමුදු සමවරියා සංඛ්‍යාත කුසල දහම් විෂයෙහි පිහිටියෙමි වෙමි. යමෙක් කැමති වී නම් ඔහුට මා අනුභව කරන බත දෙකට බෙදා කොටසක් දෙමි.

5340. මම තුදුස්වක් පසළොස්වක් හැම පොහෝ දවස්හි පෙහෙවස් වෙසෙමි. සත්ත්වහිංසා ද නොකරමි. සොරකම් ද දුරු කෙළෙමි.

5341. මැනැවින් පුරුදු කළ මේ හැම ඒකාන්තයෙන් නිෂ්ඵල ය. අලාත නමැති සෙනෙවි තෙමේ යම් අයුරකින් කියා ද එසේ මැ මේ සීලය වැඩක් නැතැයි සිතමි.

5342. අක්ෂ–පසැට ශිල්ප විෂයෙහි නො භික්මුණු දුකෙළින්නකු (ශූදු කාරයකු) මෙන් මම ඒකාන්තයෙන් පරාදය ගනිමි. ශිල්ප දැනගත් කපට දුකෙළින්නකු යම්සේ ද, අලාත නම් සෙනෙවි තෙමේ එමෙන් ජයගනී.

5343. මහරජ, යම් ද්වාරයකින් සුගතියට පැමිණෙමි ද ඒ දෙරටුව නො දක්මි. එහෙයින් කාශ්‍යප නිගණ්ඨයාගේ බස් අසා හඬමි යි කී ය.

5344. බීජකයාගේ බස් අසා අංගාති රජ මෙසේ කී ය: යහළු බීජකය, සුගතියට ද්වාරයක් හෙවත් පැමිණීමට මඟක් නැත. නියතිය හෙවත් චුල්ලාසීති මහාකල්පය මැ බලව.

5345. සුඛං වා යදිවා දුක්ඛං නියතියා[1] කිර ලබ්භති,
සංසාරසුද්ධි සබ්බෙසං මා තුරිත්‍ථො අනාගතෙ.

5346. අහම්පි පුබ්බෙ කල්‍යාණෙ බ්‍රාහ්මණිබ්භෙසු ව්‍යාවටො,[2]
වොහාරමනුසාසන්තො රතිහීනො තදන්තරා.

5347. පුනපි භන්තෙ දක්ඛෙමු සඞ්ගති වෙ භවිස්සති,
ඉදං වත්‍වාන වෙදෙහො පච්චගා සනිවෙසනං.

5348. තතො රත්‍යා විවසනෙ උපට්ඨානම්හි අඞ්ගති,
අමච්චෙ සන්නිපාතෙත්‍වා ඉදං වචනමබ්‍රවි:

5349. චන්දකෙ මෙ විමානස්මිං සදා කාමෙ විධෙන්තු මෙ,
මාමූපගච්ඡුං[3] අත්‍ථෙසු ගුය්හප්පාකාසියෙසු ච.

5350. විජයො ච සුනාමො ච සෙනාපති අලාතකො,
එතෙ අත්‍ථෙ නිසීදන්තු වොහාරකුසලා තයො.

5351. ඉදං වත්‍වාන වෙදෙහො කාමෙ ච බහුමඤ්ඤථ,
නචාපි බ්‍රාහ්මණිබ්භෙසු අත්‍ථෙ කිස්මිඤ්චි ව්‍යාවටො.

5352. තතො දෙව සත්තරත්තස්ස වෙදෙහස්සත්‍රජා පියා,
රාජකඤ්ඤා රුජා නාම ධාතිමාතරමබ්‍රවි:

5353. අලඞ්කරොථ මං ඛිප්පං සඛියො ච කරොන්තු මෙ,
සුවෙ පණ්ණරසො දිබ්බො ගච්ඡං ඉස්සරසන්තිකෙ.

5354. තස්සා මාල්‍යං අභිහරිංසු චන්දනඤ්ච මහාරහං,
මණිසඞ්ඛමුත්තරතනං නානාරත්තෙ ච අම්බරෙ.

5355. තඤ්ච සොවණ්ණයෙ පීඨෙ නිසින්නං බහුකිත්ථියො,
පරිකිරිය අසොභිංසු[5] රුජං රුචිරවණ්ණිනිං.

5356. සා ච සඛීමජ්ඣගතා සබ්බාභරණභූසිතා,
සතෙරතා[6] අබ්භම්ව චන්දකං පාවිසී රුජා.

---

1. නියති – මජ්ජසං. නියතං – ස්‍යා.
2. වාවටො – මජ්ජසං. පාවටො – ස්‍යා.
3. මාඋපගච්ඡ – මජ්ජසං.
4. අම්ම – මජ්ජසං. ස්‍යා.
5. පසොභිංසු – මජ්ජසං.
6. සතෙරිත – මජ්ජසං. සතෙරිතා – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5345. සුව හෝ ඉදින් දුක් හෝ කියනලද කාලනියමයෙහි දී ලැබෙ ල. බීජකය, අප සියල්ලන්ට මැ සංසාරයාගේ පිරිසුදු බව සිදු වන්නේ ය. ඒ කාලය නො පැමිණි කල යුහුසුලු-ඉක්මන් නො වව.

5346. මම ද පූර්වජාතියෙහි විනිශ්චය ස්ථානයෙහි බ්‍රාහ්මණ-ගෘහ පතියන් කෙරෙහි දානාදි කල්‍යාණ කර්මයෙහි ව්‍යාපෘත වීමි. රාජකෘත්‍යයෙහි යුක්ති අනුශාසනා කරමින් ඉක්බිති පඤ්චකාම රතියෙන් පිරිහිණිමි යි කී ය.

5347. හිමියනි, ඉදින් අපගේ එක්වීමක් වන්නේ නම් නැවත ද දකිමු යි මෙය කියා වේදේහ රජ තෙමේ තමන්ගේ මාලිගාවට පෙරළා ගියේ ය.

5348 ඉක්බිති අංගාති රජතෙමේ රය පහන් වූ කල තමන්ට උපස්ථාන කරන තන්හි හෙවත් රැස්වීම් ශාලාවෙහි ඇමතියන් රැස් කරවා මෙ බස් කී ය:

5349. වන්දක නමැති මාගේ මාලිගාවෙහි මට හැම කලහි පංචකාම සම්පත් පිළියෙළ කෙරෙත්වා! රහස්‍ය වූ ද ප්‍රකාශ කළයුතු වූ ද කටයුතු පැමිණි කල කිසි කෙනෙක් මා වෙත නො පැමිණෙත්වා!

5350. යුක්ති පසිඳීමෙහි සමර්ථ වූ විජය නම් ඇමැති ද සුනාම නම් ඇමැති ද අලාත නම් සෙනෙවි ද යන මේ තිදෙනා විනිශ්චය ශාලාවෙහි හිඳ ගනිත්වා!

5351. වේදේහ රජතෙමේ මෙය කියා පස්කම් සැප ම බෙහෙවින් වින්දේ ය. බ්‍රාහ්මණගෘහපතියන් පිළිබඳ වූ කිසි කටයුත්තක නො යෙදුණේ ය.

5352. එයින් (පස්කම් සැප විඳුමට බැස ගත් දවසින්) තුදුස් දිනකට පසු වේදේහ රජහට ප්‍රිය දුහිතෘ වූ 'රුජා' නමැති රාජ කන්‍යාව කිරිමවට මෙසේ කිවු:

5353. ඉක්මන් කොට මා සරසව, මාගේ යෙහෙළියන් ද සරසත්වා, හෙට (දෙවියන්ගේ රැස්වීමෙන් සැරසුණු) පසළොස්වක් පොහොය වේ. පිය මහරජු වෙත යමි යි කීවා ය.

5354. ඇට මල්දම් ය අගනා සඳුන් ය මැණික් ය සක් ය මුතු ය රුවන් ය යන දෑ ද නානා වර්ණ වස්ත්‍ර ද සරසනු පිණිස එළවූහ.

5355. රන්මුවා පුටුවෙහි හුන් යහපත් ශරීරවර්ණයෙන් යුත් රුජා නමැති රාජ කන්‍යාව පිරිවරා සිටි බොහෝ ස්ත්‍රීහු දෙවඟනන් මෙන් අතිශයින් බැබළුණාහ.

5356. යෙහෙළියන් මැදට පැමිණි සියලු අබරණින් සැරසුණු රුජා නමැති ඒ රාජකන්‍යා තොමෝ ද වළාකුලකට වදනා විදුලියක් මෙන් වන්දක නැමැති පහයට පිවිසියා ය.

5357. උපසඞ්කමිත්වා වෙදෙහං වන්දිත්වා විනයෙ රතා,
සුවණ්ණවිකතෙ[1] පීඨෙ එකමන්තං උපාවිසි.

5358. තණ්ඩ දිස්වාන වෙදෙහො අච්ඡරානංව සඞ්ගමං,
රුජං සබ්මජ්ඣගතං ඉදං වචනමබ්‍රවි:

5359. කච්චි රමසි පාසාදෙ අන්තො පොක්ඛරණිං පති,
කච්චි බහුවිධං බජ්ජං සදා අභිහරන්ති තෙ.

5360. කච්චි බහුවිධං මාල්‍යං ඔචිනිත්වා කුමාරියො,
සරකෙ කරොථ පච්චෙකං බ්ඩඪාරතිරතා මුහුං.[2]

5361. කෙන වා විකලං තුය්හං බ්පපං[3] අභිහරන්තු තෙ,
මනො කරස්සු කුඩ්ඩමුබ් අපි චන්දසමම්ඡපි.[4]

5362. වෙදෙහස්ස වචො සුත්වා රුජා පිතරමබ්‍රවි:
සබ්බමෙතං මහාරාජ ලබ්භතිස්සරසන්තිකෙ.

5363. සුවෙ පණ්ණරසො දිබ්බො සහස්සං ආහරන්තු මෙ,
යථාදින්නණ්ඩ දස්සාමි දානං සබ්බවණීසු'හං.

5364. රුජාය වචනං සුත්වා රාජා අඞ්ගාතිමබ්‍රවි:
බහුං විනාසිතං චිත්තං නිරත්ථං අඵලං තයා.

5365. උපොසථං වසං නිච්චං අන්නපානං න භුඤ්ජසි,
නියතෙතං අභුත්තබ්බං නත්ථි පුඤ්ඤං අභුඤ්ජතො.

5366. බීජකොපි හි සුත්වාන තදා කස්සපභාසිතං,
පස්සසන්තො[5] මුහුං උණ්හං රුදං අස්සූනි වත්තයි.

5367. යාව රුජෙ ජීවසි[6] නො මා භත්තමපනාමයි,
නත්ථි හද්දෙ පරො ලොකො කිං නීරත්ථං විහඤ්ඤසි.

5368. වෙදෙහස්ස වචො සුත්වා රුජා[7] රුචිරවණ්ණිනි,
ජානං පුබ්බාපරං ධම්මං පිතරං එතදබ්‍රවි:

---

1. බ්චිතෙ – මජසං. ස්‍යා.
2. අහු – මජසං. ස්‍යා.
3. කිං බ්පපං – මජසං. ස්‍යා.
4. තෙ – මජසං. ස්‍යා.
5. අස්සසන්තො – මජසං.
6. යාවරුජෙජීවමානා – මජසං. ස්‍යා.
7. රුචා – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5357. විනයෙහි ඇලුණු රුජා වේදේහ රජු වෙත පැමිණ වැඳ සත්-රුවනින් විසිතුරු රන් කම් කළ පුටුවෙක එකත් පස් වෑ හිඳගත්තා ය.

5358. වේදේහ රජ තෙමේ දෙවහනන් සමූහයකට බඳු ඒ පිරිස දැක යෙහෙළියන් මැදට පත් රුජා නම් රාජ කන්‍යාවට මේ වචනය කී ය:

5359. කිම දියණියනි, මා කරවා දුන් පහයෙහි සිත් අලවා වෙසෙහි ද? ගෘහෝද්‍යානයෙහි පිහිටි පොකුණෙහි (ජල ක්‍රීඩා කිරීම් වශයෙන්) සිත් අලවා වෙසෙහිද නන් වැදෑරුම් කන දෑ හැම දවස් තිට එළවත් ද?

5360. කිම කුමරියෙනි, තෙපි ක්‍රීඩාරතියෙහි ඇලුණහු නානාවිධ මල්දම් ගොතා එක්වන් මල්ගුළා කරවූ ද?

5361. කුමන වස්තුවකින් තිට අඩුවක් වෙයි ද, එය වහා ම එළවත්වා! අඹ, මැටි, තල කල්කයෙන් පැහැපත් කළ මුහුණු ඇත්තිය, සඳ වැනි දෙයෙහි පවා කැමැත්තෙහි නම් මට කියව සපයා දෙමි යි රජ තෙමේ කී ය.

5362. වේදේහ රජුගේ බස් අසා රුජා නම් රාජකන්‍යාව පියරජහට මෙය පැවැසූ ය: මහරජුනි, ජනාධිපති වන ඔබ වෙතින් මේ සියල්ල ලැබෙයි.

5363. පියාණෙනි, හෙට දිව්‍ය වූ පසළොස්වක් පොහෝ දවස ය. කහවණු දහසක් මට දෙනු මැනැවි. පෙරැ දුන් පරිදි සියලු යාචකයන් කෙරෙහි දෙන්නෙමි යි පැවැසූ ය.

5364. රුජා කුමරියගේ බස් අසා අංගාති රජ තෙමේ මෙසේ කී ය: නී විසින් අවැඩ වන ලෙස නිෂ්ඵල පරිදි බොහෝ වස්තුව විනාශ කරන ලදී.

5365. නිති පෙහෙවස් වෙසෙමින් ආහාරපාන අනුභව නො කෙරෙහි ය. නියති විසින් තෙල නො වැළඳියයුතු වෙයි. නො වළඳන්නාහට පින් නැතැ යි කී ය.

5366. බීජක තෙමේ ද එ කල කාශ්‍යප නුවටාගේ බස් අසා නැවත නැවතත් ප්‍රශ්වාස කරන්නේ හඬමින් උණු කඳුළු වැගිරවී ය.

5367. රුජා දියණියනි, යම් පමණ කල් ජීවත් වෙහි ද ඒ තාක් කල් අහර දුරු නො කරව. යහපත් දියණියනි, පරලොවක් නැත, නිකරුණේ කුමට වෙහෙසෙහි දැ යි ඇසී ය.

5368. යහපත් ශරීර වර්ණ සම්පන්න වූ රුජා රාජකන්‍යා තොමෝ වේදේහ නම් පියරජුගේ බස් අසා (අතීතයෙන් ජාති සතක් ද අනාගතයෙන් ජාති සතක් ද) පූර්වාපර දහම් දන්නී පියරජුට මෙ බස් පැවසූ:

5369. සුතමෙව මෙ පුරෙ ආසි සක්ක දිට්ඨමිදං[1] මයා,
බාලූපසෙවී යො හොති බාලොව සමපජ්ජථ.

5370. මූළ්හො හි මූළ්හමාගම්ම භීය්‍යො මොහං නිගච්ඡති,
පතිරූපං අලාතෙන බීජකෙන ච මුය්හිතුං.

5371. ත්වඤ්ච දෙව[2] සප්පඤ්ඤ ධීරො අත්ථස්ස කොවිදෙ,
කථං බාලෙහි සදිසං හීනං දිට්ඨිං[3] උපාගමී.

5372. සචෙ හි සංසාරපථෙන සුජ්ඣති
නිරත්ථියා පබ්බජ්ජා ගුණස්ස,
කීටොව අග්ගිං ජලිතං අපාපතං[4]
උපපජ්ජති මොමූහො නග්ගභාවං.

5373. සංසාරසුද්ධීති පුරෙ නිවිට්ඨා
කම්මං විදූසෙන්ති[5] බහූ අජානං,
පුබ්බෙ කලී දුග්ගහිතොව අත්ථා[6]
දුම්මොචයා බලිසා අම්බුජොව.

5374. උපමං තෙ කරිස්සාමි මහාරාජ තවත්ථියා,
උපමායපිධෙකච්චෙ අත්ථං ජානන්ති පණ්ඩිතා.

5375. වාණිජානං යථා නාවා අප්පමාණභරා ගරු,
අතිභාරං සමාදය අණණවෙ අවසීදති.

5376. එවමෙව නරො පාපං ථොක ථොකම්පි ආචිනං,
අතිභාරං සමාදය නිරයෙ අවසීදති.

5377. න තාව භාරො පරිපූරො[7] අලාතස්ස මහීපති,
ආචිනාති ච තං පාපං යෙන ගච්ඡති දුග්ගතිං.

5378. පුබ්බෙවස්ස කතං පුඤ්ඤං අලාතස්ස මහීපති,
තස්සෙස[8] දෙව නිස්සන්දෙ යඤ්චෙසො ලභතෙ සුඛං.

5379. බීයතෙවස්ස[9] තං පුඤ්ඤං තථාහි අගුණෙ රතො,
උපුමග්ගං අවාහාය[10] කුම්මග්ගමනුධාවති.

---

1. පච්චක්ඛං දිට්ඨං – මජ්ඣං. ස්‍යා.
2. දෙවාසි – මජ්ඣං. ස්‍යා.
3. හීනදිට්ඨං – ස්‍යා. හීනදිට්ඨී – මජ්ඣං.
4. අපාපිතං – මජ්ඣං.
5. විදූසන්ති බහූ පජා – මජ්ඣං.
6. අත්ථො – මජ්ඣං ස්‍යා.
7. පතිපූරො – මජ්ඣං.
8. තස්සෙව – මජ්ඣං. ස්‍යා.
9. චස්ස – මජ්ඣං. ස්‍යා.
10. අපිහාය – මජ්ඣං. අපාහාය – සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5369. යමෙක් අඥානයන් සෙවුනේ වෙයි ද හේ අඥාන භාවයට මැ පැමිණෙයි යනු මා විසින් පෙර අසන ලද්දේ ම ය. මෙය වනාහී දැන් ඇස් හමුවෙහි දක්නා ලදී.

5370. යම් පරිදි මංමුළා වූයෙක් මංමුළා වූවකු කරා එළැඹ අතිශයින් මුළා වේ ද එසෙයින් දෘෂ්ටිමුඪයා ද අතිශයින් මුළාවට පැමිණෙයි. (දෙවයන් වහන්ස,) අලාත සෙනෙවියා ද බීජක දාසයා ද (ගුණ නුවටා කරා එළැඹ,) මුළා වන්නට සුදුසු වෙත්.

5371. දේවයන් වහන්ස, නුඹ වහන්සේ වූකලි නුවණැතියහ, එහෙයින් ධීරයහ, අර්ත්ථානර්ත්ථ දැනුමෙහි සමර්ත්ථයහ. කිසෙයින් බාලයන් හා සදෘශ ව ලාමක දෘෂ්ටියට පැමිණියහු ද?

5372. ඉදින් සංසාරමාර්ගයෙන් ශුද්ධිය වේ නම් ගුණ නුවටාගේ පැවිද්ද නිරර්ත්ථක යැ. දිලියෙන ගින්නට පනන පළඟැටියකු සෙයින් අතිශයින් මුළා වූයේ නග්නභාවයට පැමිණියේ ය.

5373. සංසාරයෙන් ශුද්ධිය වේ ය යි පළමු මැ මිසදිටු ගත් බොහෝ ජනයෝ නො දන්නාහු කර්මය ද කර්මඵලය ද නසති. ඔවුන් විසින් පළමු මැ ගන්නා ලද පරාජයග්‍රාහය වරදවා ගන්නා ලද මැ වෙයි. ඔහු (බිලිය ගිලැ සිටි) මසකු බිලියෙන් (මුදවාලියැ නොහැක්කා) සේ අනර්ථයෙන් මුදවාලියැ නො හැකි වෙති.

5374. මහරජාණෙනි, ඔබට වැඩ පිණිස උපමාවක් කියමි. මෙලොවැ ඇතැම් පණ්ඩිත පුරුෂයෝ උපමායෙනුදු අර්ථය දැනගනිත්.

5375. යම් පරිදි වෙළඳුන්ගේ නැවක් අපමණ වූ බර ගෙනයන්නී අධික වූ වස්තුභාරය ඉන සයුරෙහි ගැලේ ද,

5376. එසෙයින් මැ මිනිසෙක් අකුශලය මඳින් මඳ රැස් කරනුයේ අධික වූ අකුශලභාරය ගෙන නිරයෙහි ගැලෙයි.

5377. මිහිපල්තුමනි, අලාත සෙනෙවියාගේ (ගොයාතක) අකුශලභාරය තව නො පිරුණේයැ. හේ යම් පාපයෙකින් දුගතියට යේ ද ඒ පාපකර්මය රැස්කරන්නේ ද වෙයි.

5378. මිහිපල්තුමනි, අලාත සෙනෙවියා විසින් පූර්වභවයෙහි ම කරනලද (පුෂ්පපූජා සංඛ්‍යාත) යම් පිනක් ඇද්ද දේවයිනි, මේ තෙමේ මෙකල යම් සුවයක් විඳී නම් මේ ඒ කුශලායාගේ විපාක යැ.

5379. ඔහුගේ ඒ පින ගෙවීයේ මැ ය. ඒ එසේ මැ යි. අකුශලයෙහි ඇලුණු හේ සෘජු වූ කුශලමාර්ගය හැරපියා අකුශලමාර්ගයෙහි යෙයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5380. තුලා යථා පග්ගහිතා ඔහිතෙ තුලමණ්ඩලෙ,
උන්නමෙති තුලාසීසං භාරෙ ඔරොපිතෙ සති.

5381. එවමෙව නරො පුඤ්ඤං ථොකථොකම්පි ආචිනං,
සග්ගාතිමානො දසොව බීජකො සාතවෙ[1] රතො.

5382. යඤ්චජ්ජ[2] බීජකො දසො දුක්ඛං පස්සති අත්තනි,
පුබ්බෙ තස්ස[3] කතං පාපං තමෙසො පටිසෙවති.

5383. ඛීයතෙවස්ස තං පාපං තථාහි විනයෙ රතො,
කස්සපඤ්ච සමාපජ්ජ මාහෙවුප්පථ[4] මාගමා.

5384. යං යං හි රාජ භජති සතං වා යදි වා අසං,
සීලවන්තං විසීලං වා වසං තස්සෙව ගච්ඡති.

5385. යාදිසං කුරුතෙ මිත්තං යාදිසඤ්චුපසෙවති,
සොපි තාදිසකො හොති සහවාසො හි තාදිසො.

5386. සෙවමානො සෙවමානං සම්ඵුට්ඨො සම්ඵුසං පරං,
සරො දිද්ධො[5] කලාපංව අලිත්තමුපලිම්පති
උපලෙපභයා[6] ධීරො නෙව පාපසඛා සියා.

5387. පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති,
කුසාපි පූති වායන්ති එවං බාලූපසෙවනා.

5388. තගරඤ්ච[7] පලාසෙන යො නරො උපනය්හති,
පත්තාපි සුරභි වායන්ති එවං ධීරූපසෙවනා.

5389. තස්මා පලපුටස්සෙව[8] ඤත්වා සම්පාක[9] මත්තනො,
අසන්තෙ නොපසෙවෙය්‍ය සන්තෙ සෙවෙය්‍ය පණ්ඩිතො
අසන්තො නිරයං නෙන්ති සන්තො පාපෙන්ති සුග්ගතිං.

5390. අහම්පි ජාතියො සත්ත සරෙ සංසරිතත්තනො,
අනාගතාපි සත්තෙව යා ගම්ස්සං ඉතො චුතා.

---

1. සාධවෙ – මජසං.
2. යමජ්ජ – මජසං. ස්‍යා. චි.
3. චස්ස – මජසං. වස්ස – ස්‍යා.
4. මහෙවුබ්බථ – මජසං.
5. දුට්ඨො – මජසං. ස්‍යා.
6. උපලිම්ප – මජසං.
7. තගගරඤ්ච – මජසං.
8. පත්තපුටස්සෙව – මජසං.
9. සපාක – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5380. යම්සේ දැඩිව ගත්නාලද තරාදිය හාණ්ඩ ගැනීම පිණිස තුලා තැටිය එල්වා තැබූ කලහි බඩු නගන ලදුයේ පහතට බසී ද බැහැර කළ කල්හි තුලාභිස උඩට නඟී ද,

5381. එසෙයින් ම මිනිසා කුශලය මඳින් මඳ රැස් කරනුයේ ස්වර්ගයට පමුණුවන කුශලයෙහි ඇලුණු බීජක දසයා මෙන් මධුර විපාක ඇති කුශලයෙහි මැ ඇලුණේ වෙයි.

5382. දැන් බීජක දසයා තමා කෙරෙහි යම් දුකක් දකී ද ඔහු විසින් පෙර කළ යම් (ආක්‍රොෂ) පාපයෙක් වී නම් මෙ තෙමේ ඒ පාපඵලය විඳී.

5383. ඔහුගේ ඒ පාපය ගෙවී යේ මැ ය. එතෙකුදුවත් ආචාරවිනයෙහි ඇලුණු නුඹ වහන්සේ කාශ්‍යප ගොත්‍ර ඇති ආජීවකයා කරා එළැඹ අකුශලමාර්ගයට නහමක් යේවා.

5384. මහරජාණෙනි, සත්පුරුෂ වූ හෝ අසත්පුරුෂ වූ හෝ සිල්වත් වූ හෝ දුශ්ශීල වූ හෝ යම් යම් එකකු සෙවුණේ ද හේ ඔහුගේ මැ වසෙයට පැමිණෙයි.

5385. යමෙක් යම් බදු (පුහුලකු) මිතුරු කෙරේ ද යම් බදු වූවකු සෙවුනේ ද හේ ඒකාන්තයෙන් එබඳු වූයේ වෙයි. සහවාසය එබඳු මැ යි.

5386. විස පෙවූ සරයෙක් භියවුරෙහි බහාලන ලද්දේ භියවුර විසයෙන් ආලිප්ත වන්නා සේ පාපමිත්‍රයා පාපයෙන් පහස්නා ලද්දේ තමා සේවනය කරන අන්‍යයා ද (පාපයෙන්) තවරයි. (තමා හා සම අදහස් ඇත්තකු කෙරෙයි සේ යි.) නුවණැති පුරුෂ පාපයෙන් තැවැරෙන බියෙන් පාපමිත්‍රයන් ඇත්තෙක් නො වන්නේ යැ.

5387. යම් මිනිසෙක් කුණු මස් කුසතණයෙන් බඳී ද (එයින්) කුස තණ ද කුණුගඳ හමයි. බාලයන් සේවනය ද එ බඳු යි.

5388. යම් මිනිසෙක් තුවරලා කොළපතෙකින් බඳී නම් ඒ කොළ පත ද සුවඳ විහිදුවයි. පණ්ඩිතජන සේවනය ද එ බඳු යි.

5389. එහෙයින් පත්‍රපුටයාගේ සුවඳ විහිදීම මෙන් (පණ්ඩිත සේවනයෙන්) තමාගේ ඥාන පරිපාකය දන පණ්ඩිත පුරුෂ අසත්පුරුෂයන් නො සෙවුනේ යැ. සත්පුරුෂයන් සේවනය කරන්නේ යැ. අසත්පුරුෂයෝ (තමා සෙවුනහු) නිරයට පමුණුවති. සත්පුරුෂයෝ සුගතියට පමුණුවත්.

5390. දේවයන් වහන්ස, මම ද තමා විසින් සැරිසරන ලද ජාති සතක් සිහිකරමි. මෙයින් සැවැ යායුතු වූ අනාගත වූ ද සත් ජාතියක් මැ සිහිකරමි.

5391. යා මෙ සා සත්තමී ජාති අහු පුබ්බෙ ජනාධිප,
කම්මාරපුත්තො මගධෙසු අහුං රාජගහෙ පුරෙ.

5392. පාපං සහායං ආගම්ම බහුං පාපං කතං මයා,
පරදාරස්ස හෙයෙනෙත්තා චරිමහ අමරා විය.

5393. තං කම්මං නිහිතං අට්ඨා හසමච්ඡතෙත්තාව පාවකො,
අථ අඤ්ඤෙහි කම්මෙහි අජායිං වංසභූමියං.

5394. කොසම්බියං සෙට්ඨිකුලෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ,
එකපුත්තො මහාරාජ නිවෙසං සඤ්ඤතපූජිතො.

5395. තත්ථ මිත්තං අසෙවිස්සං සහායං සාතවෙ[1] රතං,
පණ්ඩිතං සුතසම්පන්නං සො මං අත්ථෙ නිවෙසයි.

5396. චාතුද්දසිං පඤ්චදසිං බහුං රත්තිමුපාවසිං,[2]
තං කම්මං නිහිතං අට්ඨා නිධිව උදකන්තිකෙ.

5397. අථ පාපානං කම්මානං යමෙතං මගධෙ කතං
ඵලං පරියාග තං[3] පච්ඡා භූතා දුට්ඨව්විසං යථා.

5398. තතො චුතාහං වෙදෙහ රොරුවෙ නිරයෙ චිරං,
සකම්මනා[4] අපච්චිස්සං තං සරං න සුඛං ලහෙ,

5399. බහුවස්සගණෙ තත්ථ ඛෙපයිත්වා බහුං දුඛං,
හෙණ්ණාකටෙ[5] අහුං රාජ ඡකලො[6] උද්ධිතපථලො.

5400. සාතපුත්තා මයා වූළ්හා පිට්ඨියා ච රථෙන ච,
තස්ස කම්මස්ස නිස්සන්දෙ පරදාරගමනස්ස මෙ.

5401. තතො චුතාහං වෙදෙහ කපි ආසිං ඛ්‍රහාවනෙ,
නිලිච්ඡිත[7] එලොයෙව යූථපෙන පගබ්භිනා.
තස්ස කම්මස්ස නිස්සන්දෙ පරදාරගමනස්ස මෙ.

5402. තතො චුතාහං වෙදෙහ දසණ්ණූසු[8], පසූ අහුං,
නිලවච්ඡිතො ජවෙ හද්දො යොහං වූළ්හං චිරං මයා;
තස්ස කම්මස්ස නිස්සන්දෙ පරදාරගමනස්ස මෙ.

---

1. සාධවෙ – මජ්ඣං.
2. ඔපාගමිං – මජ්ඣං.
3. පරියාගමං – මජ්ඣං.
4. සකම්මුනා – මජ්ඣං, ස්‍යා.
5. ඡිඤ්ඤාගතො – මජ්ඣං, ස්‍යා.
6. ඡගලො – මජ්ඣං, ස්‍යා.
7. නිලුඤ්ඡිත – මජ්ඣං, ස්‍යා; නිලිඤ්ඡිත – ඵී. නිලිවඡිත – සීමු.
8. අස්සනෙසු – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5391. ජනාධිපති රජතුමනි, පෙර මාගේ යම් සත්වැනි ජාතියක් වූ ද, එකල මගධ රට රජගහ නුවර තරහල් පුත් වීමි.

5392. මා විසින් පවිටු මිතුරකු නිසා බොහෝ පව් කරන ලද, පරදරා-වන් වෙහෙසමින් අපි නො මැරෙනුවන් මෙන් හැසුරුනමිහ.

5393. රැස්කරනලද ඒ කර්මය හළුයෙන් වැසුණු ගිනිඅඟුරක් සෙයින් නිහිත වැ සිටියේ යැ. ඉක්බිති අන්‍ය කර්මයකින් වංසරට උපන්මි.

5394. මගරජාණෙනි, කොසඹැනුවර සමෘද්ධ වූ සම්පත්තියෙන් ආඪ්‍ය වූ මහත් ධන ඇති සිටු කුලයෙකැ නිතර පූජාසත්කාර ඇති එක මැ පුත් වීමි.

5395. එහි පණ්ඩිත වූ ඇසුපිරු තැන් ඇති යහපත් ක්‍රියාවන්හි ඇලුණු මිත්‍රයකු සහාය වශයෙන් ඇසුරු කෙළෙමි. හෙතෙම මා කුශලකර්මයෙහි පිහිටුවිය.

5396. බොහෝ තුදුස්වක් පසළොස්වක් දිනයන්හි පෙහෙවස් විසිමි. ඒ කර්මය ජලාන්තයක පිහිටි නිධානයක් මෙන් වැසී සිටියේ ය.

5397. වැළි, මා සතු පවිකම් අතුරෙන් මගධයෙහි දී කළ යම් මේ පරදරසේවන කර්මයක් වේ ද ඒ (කර්මයාගේ) විපාකය අනුභව කළ නපුරු විෂක් මෙන් මා වෙත එළැඹියේ ය.

5398. වෙදේහ (රජාණෙනි) මම එයින් සැවැ සිය පවිකම් හේතුයෙන් රෞරව නරකයෙහි බොහෝ කලක් පැසුණෙමි. එය සිහි කරන්නෙමි (සිතට) සැපක් නො ලබමි.

5399. මහරජාණෙනි, එහි බොහෝ වර්ෂ ගණනක් මුළුල්ලෙහි බොහෝ දුක් ගෙවා හෙණ්ඩාකට දේශයෙහි බීජෝද්ධරණය කරන ලද එළුවෙක් වීමි.

5400. මා විසින් පිටින් ද රියෙන් ද ඇමැතිපුත්තු උසුලනලදහ. (මේ සියල්ල) මාගේ ඒ පරදරගමන කර්මයාගේ විපාකය යි.

5401. වෙදේහයෙනි, එයින් චුත වූ මම මහවනයෙහි වදුරෙක් වීමි. (එහිදු) ප්‍රගල්භ වූ ප්‍රධාන වානරයා විසින් උපුටන ලද එල (බීජ) ඇත්තෙමි වීමි. එ ද මාගේ ඒ පරදරගමන කර්මයාගේ විපාකයෙකි.

5402. වෙදේහයෙනි, එයින් චුත වූ මම දසණ්ණ ජනපදයෙහි ගොනෙක් වීමි. (එහි ද,) උපුටන ලද බීජ ඇත්තෙමි ජවයෙහි යහපත් වීමි. මා විසින් (එහි) බොහෝ කලක් විය (බර) උසුලනලදී. (එ ද) මාගේ ඒ පරදරගමන කර්මයාගේ විපාකයෙකි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5403. තතො චුතාහං වෙදෙහ වජ්ජීසු කුලමාගමා,
නෙවිත්ථී න පුමා ආසිං මනුස්සත්තෙ සුදුල්ලභෙ,
තස්ස කම්මස්ස නිස්සන්දෙ පරදාරගමනස්ස මෙ.

5404. තතො චුතාහං වෙදෙහ අජායිං නන්දනෙ වනෙ,
භවනෙ තාවතිංසාහං අච්ඡරා කාමවණ්ණිනී.

5405. විචිත්තවත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා,
කුසලා නච්චගීතස්ස සක්කස්ස පරිචාරිකා.

5406. තත්ථ ඨිතාහං වෙදෙහ සරාමි ජාතියො ඉමා,
අනාගතෙපි සත්තෙව යා ගම්ස්සං ඉතො චුතා.

5407. පරියාගතන්නං කුසලං යං මෙ කොසම්බියං කතං,
දෙවෙ චෙව මනුස්සෙ ච සන්ධාවිස්සං ඉතො චුතා.

5408. සත්ත ජවෙවා[1] මහාරාජ නිච්චං සක්කතපූජිතා,
ඊභාවාපි[2] න මුච්චිස්සං ඡට්ඨානි ගතියො ඉමා.

5409. සත්තමී ච ගතී දෙව දෙවපුත්තො මහිද්ධිකො,
පුම දෙවො භවිස්සාමි දෙවකායස්මිමුත්තමො.[3]

5410. අජ්ජාපි සන්නානමයං මාලං ගන්ථෙන්ති නන්දනෙ,
දෙවපුත්තො ජවො නාම යො මෙ මාලං පටිච්ඡති.

5411. මුහුත්තො විය සො දිබ්බො ඉමානි වස්සානි සොළස,
රත්තින්දිවො ච සො දිබ්බො මානුසිං සරදෙසතං.

5412. ඉති කම්මානි අන්වෙන්ති අසඞ්ඛෙය්‍යාපි ජාතියො,
කල්‍යාණං යදි වා පාපං නහි කම්මං පනස්සති.

5413. යො ඉච්ඡෙ පුරිසො හොතුං ජාතිජාතිං පුනප්පුනං,
පරදාරං විවජ්ජය්‍යෙ ධොතපාදෙව කද්දමං.

5414. යා ඉච්ඡෙ පුරිසො හොතුං ජාතිජාතිං පුනප්පුනං,
සාමිකං අපචායෙය්‍ය ඉන්දංව පරිචාරිකා.

5415. යො ඉච්ඡෙ දිබ්බභොගඤ්ච දිබ්බං ආයුං යසං සුඛං,
පාපානි පරිවජ්ජෙත්වා තිවිධං ධම්මමාචරෙ.

---

1. ජවවා – මජසං, ස්‍යා.
2. ඉත්ථීභාවා – මජසං, ස්‍යා.
3. පුමාදෙවො – මජසං, ස්‍යා, වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5403. වේදේහයෙනි, එයින් චුත වූ මම වජ්ජි ජනපදයෙහි කුලයකට (උත්පත්ති වශයෙන්) පැමිණියෙමි. අතිශයින් දුර්ලභ වූ මනුෂ්‍යාත්මයෙහි ස්ත්‍රියක් ද නො වීමි. පුරුෂයෙක් ද නො වීමි. (නපුංසක වීමි. එය ද) මාගේ ඒ පරදරගමන කර්මයාගේ විපාකයෙකි.

5404. වේදේහයෙනි, එයින් චුත වූ මම තව්තිසා භවනයෙහි නන්දන වනයෙහි කැමැති කැමැති වෙස් ගැනීමට සමර්ථ වූ අප්සරාවක් වැ උපන්මි.

5405. විසිතුරු වස්ත්‍ර හා ආභරණ ඇත්තී පැළැඳි මිණි කොඩොල් ඇත්තී නෘත්‍යගීතයෙහි දක්ෂ වූවා ශක්‍රයාගේ භාර්‍යාවක් වීමි.

5406. වේදේහයෙනි, එහි සිටි මම මේ (යට කියන ලද) ජාතීන් සිහි කෙළෙමි. මෙයින් චුත වැ යම් තැනකට යන්නෙමි ද ඒ අනාගත ජාති සතක් ද සිහි කෙළෙමි.

5407. කොසඹැනුවර දී මා විසින් යම් කුශලයක් කරනලද ද එය තමාගේ වාරයෙන් විපාක දීමට එළැඹියේ ය. මෙයින් චුත වූ මම දෙව් ලොව ද මිනිස් ලොව ද සැරිසරන්නෙමි.

5408. මහරජ, මෙසේ සත්ජාතියෙක නිතර පූජා සත්කාර කරන ලද්දී වෙමි. (යට කී) ජාති සයෙහි ස්ත්‍රීභාවයෙන් නො මිදුණෙමි.

5409. දේවයන් වහන්ස. සත්වැනි ගතියෙහි දෙවියන් අතර උතුම් වූ මහත් ඍද්ධි ඇති පුරුෂදෙව වූ දිව්‍ය පුත්‍රයෙක් වන්නෙමි.

5410. අද ද නන්දන උයනෙහි (මාගේ පරිවාර දිව්‍යස්ත්‍රීහු) (එකතොවණට ආදි වශයෙන්) රැස් කළ මල් (මා සඳහා) ගොතන්නාහ. ජව නම් වූ දිව්‍යපුත්‍රයෙක් මා සඳහා (ගසින්) වැටෙන මල් පිළිගනී ද (හේ මාගේ සැමියා යි.)

5411. යම් මේ (ගත වූ) සොළොස් වසක් වේ ද එය දෙව්ලොව ඇසිල්ලක් මෙනි. මිනිස් ගණනින් සියක් වසක් (තව්තිසා) දෙව්ලොව එක් රෑ දවලෙකි. (එක් දවසෙකි.)

5412. මෙසේ නො ගිණිය හැකි ජාතියෙකැ පවා කර්මයෝ (සත්වයා) අනුව යෙති. කුශල වූ හෝ අකුශල වූ හෝ කර්මය (විපාක නොදී) නො නස්නේ ය. (මේ අපරාපරියවෙදනීය කර්මය යි.)

5413. යමෙක් මතු මතු ජාතීන්හි පුනපුනා පුරුෂයකු වීමට කැමැත්තේ නම් දෙවූ පා ඇත්තකු මඩ (දුරු කරන්නා සේ) පරදර කර්මය දුරු කරන්නේ ය.

5414. යම් ස්ත්‍රියක් මතු මතු ජාතීන්හි පුනපුනා පුරුෂයකු වන්නට රිසි වේ නම් පරිචාරිකාවන් ඉන්ද්‍රයාහට (අත් පා මෙහෙ කරන්නා) මෙන් සිය සැමියාට අත් පා මෙහෙ කරන්නේ ය.

5415. යමෙක් දිව්‍ය භොග ද දිව්‍ය ආයුෂ යසස හා සුව ද කැමැත්තේ නම් පව් දුරු කොට ත්‍රිවිධ සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5416. කායෙන වාචා මනසා අප්පමත්තො විචක්ඛණො,
අත්තනො හොති අත්ථාය ඉත්ථී වා යදි වා පුමා.

5417. යෙ කෙචිමෙ මනුජා ජීවලොකෙ
යසස්සිනො සබ්බසමන්තභොගා,
අසංසයං තෙහි පුරෙ සුචිණ්ණං,
කම්මස්සකාසෙ පුථු සබ්බසත්තා.

5418. ඉඞ්ඝානුචින්තෙසි සයම්පි දෙව
කුතො නිදානා තෙ ඉමා ජනින්ද,
යා තෙ ඉමා අච්ඡරාසන්නිකාසා
අලඞ්කතා කඤ්චනජාලජත්තා.

5419. ඉච්චෙවං පිතරං කඤ්ඤා රුජා තොසෙසි අඞ්ගතිං,
මූළ්හස්ස මග්ගමාචික්ඛි ධම්මමක්ඛාසි සුබ්බතා.

5420. අථාගමා බ්‍රහ්මලොකා නාරදෙ මානුසිං[1] පජං,
ජම්බුදීපං අවෙක්ඛන්තො අඤ්ඤ[2] රාජානමඞ්ගතිං.

5421. තතො පතිට්ඨා පාසාදෙ වෙදෙහස්ස පුරත්ථතො,[3]
තඤ්ච දිස්වා අනුප්පත්තං රුජා ඉසිමවන්දථ.

5422. අථාසනම්හා ඔරුය්හ රාජා ව්‍යම්හිතමානසො,
නාරදං පරිපුච්ඡන්තො ඉදං වචනමබ්‍රවි.

5423. කුතො නු ආගච්ඡසි දෙවවණ්ණි
ඔභාසයං සංවරිං චන්දිමාව,
අක්ඛාහි මෙ පුච්ඡිතො නාමගොත්තං
කථං තං ජානන්ති මනුස්සලොකෙ.

5424. අහං හි දෙවතො ඉදානි එමි
ඔභාසයං සංවරිං[4] චන්දිමාව,
අක්ඛාමි තෙ පුච්ඡිතො නාමගොත්තං
ජානන්ති මං නාරදෙ කස්සපො ච.[5]

5425. අච්ඡරියරූපං[6] වත[7] යාදිසඤ්ච
වෙහාසයං ගච්ඡසි තිට්ඨසි ච,
පුච්ඡාමි තං නාරද එතමත්ථං
අථ කෙන වණ්ණෙන තවායමිද්ධි.

---

1. මානුසං – මජසං.
2. අද්දසා – මජසං; අද්දස – ස්‍යා.
3. පුරක්ඛතො – මජසං, ස්‍යා, වි.
4. සබ්බදිසා – මජසං, ස්‍යා.
5. චාති – මජසං, ස්‍යා
6. අච්ඡරරූපං – මජසං.
7. තව – මජසං, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5416. නුවණැති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් කයින් වචසින් මනසින් නො පමා වී නම් (එය) තමහට වැඩ පිණිස වෙයි.

5417. මේ සත්වලෝකයෙහි යසස් ඇති පරිපූර්ණ සියලු භෝග ඇති යම් කිසි මිනිස් කෙනෙක් වෙත් ද ඔවුන් විසින් නිසැක ව ම පෙරපින් කරන ලද්දේ ය. නානා ප්‍රකාර වූ සියලු සත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ.

5418. දේවයන් වහන්ස, තමා ද සිතනු මැනැවැ. ජනෙන්ද්‍රය, (රජ්ජුරුවන් වහන්ස,) අප්සරාවන් හා සමාන වූ අලඬකෘත වූ රන්දැලින් වසන ලද්ද වූ ඔබගේ යම් මේ (සොළොස් දහසක්) ස්ත්‍රීහු කුමකින් හටගත්තාහු ද?

5419. සුන්දර වූත ඇති රූපා නම් කන්‍යා තොමෝ මෙ පරිද්දෙන් පිය වූ අඬගාති රජු තුටු කරවූ, මුළා වූ රජුට් (යහපත්) මග කිවූ, ධර්මය පැවැසූ.

5420. ඉක්බිති නාරද නම් බ්‍රහ්ම තෙම දඹදිව බලන්නේ අඬගාති රජු දිටී. (එහෙයින්) බ්‍රහ්මලෝකයෙන් මනුෂ්‍යප්‍රජාව වෙත එළැඹියේ ය.

5421. ඉක්බිති වේදේහ රජු ඉදිරියෙහි ප්‍රාසාදය සමීපයෙහි (අහසෙහි) සිටියේ ය. පැමිණි ඔහු දැක රූපා තොමෝ (ඒ) ඍෂිවරයා වැන්ද ය.

5422. වැළි රජ බිය වූ සිත් ඇත්තේ අසුනෙන් බැස නාරද (බ්‍රහ්මයා) විචාරන්නේ මෙ වදන් කී ය:

5423. දෙවියකු බදු ශරීරවර්ණ ඇති රාත්‍රිය හොබවන චන්ද්‍රයා වැනි වූ (තෙපි) කොහි සිට ආවහුද? මා විසින් විචාරන ලද්දේ නම්ගොත් කියව. මිනිස් ලොවැ තොප කෙසේ දනිත් ද?

5424. මම වනාහි දැන් දෙවලොවින් එමි. රාත්‍රිය හොබවන චන්ද්‍රයා මෙන් (මෙහි හැසිරෙන්නෙමි) තොප විසින් විචාරන ලද්දෙමි නම්ගොත් කියමි. නමින් නාරද යි ද ගොත්‍රයෙන් කාශ්‍යප යි ද මා දනිත්.

5425. (තොපගේ) යම්බඳු වූ ශරීරවර්ණයක් වේ නම් එය ද තෙපි අහසෙහි යන්නහු ය, සිටිනහු ය, (යන මෙ) කරුණ ද ඒකාන්තයෙන් ආශ්චර්‍යයෙකි. නාරද ඍෂිවරය, මෙ කරුණ තොප විචාරමි: කවර කරුණෙකින් තොපගේ මේ ඍද්ධිය වී ද?

5426. සච්චඤ්ච ධම්මො ච දමො ච චාගො
ගුණා මමෙතෙ පකතා පුරාණා,
තෙහෙව ධම්මෙහි සුසෙවිතෙහි
මනොජවො යෙනකාමං ගමොඤ්ඤි.[1]

5427. අච්ඡරිය[2]මාචික්ඛසි පුඤ්ඤසිද්ධිං
සවෙ හි එතෙ ත්වං යථා වදෙසි,
පුච්ඡාමි තං නාරද එතමත්ථං
පුට්ඨො ච මෙ සාධු වියාකරොහි.

5428. පුච්ඡස්සු මං රාජ තවෙස අත්ථො
යං සංසයං කුරුසෙ භූමිපාල,
අහං තං නිස්සංසයතං ගමෙමි.
නයෙහි ඤායෙහි ච හෙතුහි ච.

5429. පුච්ඡාමි තං නාරද එතමත්ථං
පුට්ඨො ච මෙ නාරද මා මුසා භණ,
අත්ථි නු දෙවා පිතරො නු අත්ථි
ලොකො පරො අත්ථි ජනො යමාහු.

5430. අත්ථෙව දෙවා පිතරො ච අත්ථි
ලොකො පරො අත්ථි ජනො යමාහු,
කාමෙසු ගිද්ධා ච නරා පමූළ්හා
ලොකං පරං න විදූ මොහයුත්තා.

5431. අත්ථීති චෙ නාරද සද්දහාසි
නිවෙසනං පරලොකෙ මතානං,
ඉධෙව මෙ පඤ්චසතානි දෙහි
දස්සාමි තෙ පරලොකෙ සහස්සං.

5432. දජ්ජෙමු ඛො පඤ්චසතානි හොතො
ජඤ්ඤුමු චෙ සීලවන්තං වදඤ්ඤුං,
ලුද්දං තං හොන්තං නිරයෙ වසන්තං
කො චොදයෙ පරලොකෙ සහස්සං.

5433. ඉධෙව යො හොති අධම්මසීලො
පාපාචාරො[3] අලසො ලුද්දකම්මො,
න පණ්ඩිතා තස්මිං ඉණං දදන්ති
නහි ආගමො හොති තථාවිධම්හා.

---

1. ගතොඤ්ඤි – මජසං, ස්‍යා.
2. අච්ඡෙර – මජසං.
3. පාපනරො – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5426. වාක්සත්‍යය, ත්‍රිවිධ සුචරිත ධර්මය හා ධ්‍යාන ධර්මය, ඉන්ද්‍රිය දමනය, ක්ලේශත්‍යාගය හා දේයධර්ම පරිත්‍යාගය යන මේ ගුණයෝ මා විසින් පෙර භවයෙහි මෙනොවට පුරුදු කරන ලදහ. මනාව සෙවුනාලද ඒ (ගුණ) ධර්ම හේතුවෙන් රිසි තැනකට යා හැකි මනොජව (ඉද්ධි බල) ඇත්තේ වෙමි.

5427. කුශලකර්මයන්ගේ ඵලදායක බව ආශ්චර්‍ය කොට කියන්නහු ය. ඉදින් තෙල කරුණු තොප කියන පරිදි වේ නම් නාරද තපස්වීනි, මෙ කරුණ තොප විචාරමි. විචාරන ලද්දේ මනා ලෙස මට ප්‍රකාශ කරව.

5428. භූමිපාලය, (යම් කරුණෙක්හි) යම් සැකයක් කෙරෙහි ද, මහරජ, තොපගේ ඒ කාරණය මා විචාරව. කාරණයෙන් ද, නුවණින් ද ප්‍රත්‍යයෙන් ද මම තොප නිසැක බවට පමුණුවමි.

5429. නාරද මුනිවරය, ඒ කරුණ තොප විචාරමි. නාරද මුනිවරය, මා විසින් විචාරනලද්දේ මුසා නො කියව. ජනයා යමක් කියාද (එබඳු) දෙවියෝ ඇත් ද? මව්පියෝ ඇත් ද? පරලොව ඇත් ද?

5430. (මහරජ,) ජනයා යමක් කියා ද? (එබඳු) දෙවියෝ ඇත් ම ය. මව්පියෝ ද ඇත් ම ය. පරලොව ද ඇත්තේ ම ය. කාමයන්හි ගිජු වූ මෝහයෙන් යුක්ත වූ අතිශයින් මුළා වූ දනෝ පරලොව නො දනිත්.

5431. නාරද තවුසාණෙනි, ඉදින් මළවුන් සඳහා පරලොව නිවෙසක් ඇතැයි හඳහවු නම් මට මෙලොව දී (කහවණු) පන්සියයක් දෙව. තොපට පරලොව දී (කහවණු) දහසක් දෙන්නෙමි.

5432. ඉදින් (තොප) සිල්වතෙක, (මහණ බමුණන්ගේ) අදහස දන්නෙකැයි දනුමෝ නම් භවක්ෂට (කහවණු) පන්සියයක් (පොලියට) දෙමිහ. රෞද්‍ර ක්‍රියා ඇත්තා වූ නිරයෙහි වසන්නා වූ තොප (කරා එළඹ) පරලොව දී කවරෙක් දහසක් ඉල්ලන්නේ ද?

5433. යමෙක් මෙලොව දී ම නො දැහැමි ස්වභාව ඇත්තේ ද පවිටු හැසිරීම් ඇත්තේ ද අලස වූයේ ද රෞද්‍රක්‍රියා ඇත්තේ ද නුවණැත්තෝ ඔහුට ණය නො දෙත්. එබඳු තැනැත්තාගෙන් ණය ආපසු ලැබීමක් නො වේ.

5434. දක්ඛඤ්ච පොසං මනුජා විදිත්වා
උට්ඨාහකං[1] සීලවන්තං වදඤ්ඤුං,
සයමෙව හොගෙහි නිමන්තයන්ති
කම්මං කරිත්වා පුනමාහරෙසි.

5435. ඉතො ගතො[2] දක්ඛසි තත්ථ රාජ
කාකොලසඞ්ඝෙහිපි කඩ්ඪමානං,[3]
තං ඛජ්ජමානං නිරයෙ වසන්තං
කාකෙහි ගිජ්ඣෙහි ච සෙණකෙහි
සඤ්ඡින්නගත්තං රුහිරං සවන්තං
කො චොදයෙ පරලොකෙ සහස්සං.

5436. අන්ධංතමං තත්ථ න චන්දසූරියා
නිරයො සදා තුමුලො සොරරූපො.
සා නෙව රත්ති න දිවා පඤ්ඤායති
තථාවිධෙ කො විචරෙ ධනත්ථිකො.

5437. සබලො ච සාමො ච දුවෙ සුපාණා[4]
පවද්ධකායා බලිනො මහන්තා,
ඛාදන්ති දන්තෙහි අයොමයෙහි
ඉතො පනුණ්ණං පරලොකපත්තං.[5]

5438. තං ඛජ්ජමානං නිරයෙ වසන්තං
ලුද්දෙහි වාළෙහි අසම්මගෙහි ච,
සංඡින්නගත්තං රුහිරං සවන්තං
කො චොදයෙ පරලොකෙ සහස්සං.

5439. උසූහි සත්තීහි සුනිස්සිතාහි
හනන්ති විජ්ඣන්ති ච පච්චමින්නා.
කාළූපකාළා නිරයම්හි සොරෙ
පුබ්බෙ නරං දුක්කතකම්මකාරිං.

5440. තං හඤ්ඤමානං නිරයෙ වජන්තං
කුවජ්ජස්මිං පස්සස්මිං විඵාලිතුදරං,
සංඡින්නගත්තං රුහිරං සවන්තං
කො චොදයෙ පරලොකෙ සහස්සං.

---

1. උට්ඨානකං – මජසං, ස්‍යා.
2. චුතො – මජසං, ස්‍යා.
3. විකස්සමානං – මජසං, ස්‍යා.
4. සුවාණ – මජසං, ස්‍යා.
5. පතන්තං – මජසං, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5434. (ධනය ඉපදවීමෙහි) දක්ෂ වූ උත්සාහවත් වූ සිල්වත් වූ සත්‍ය වචන ඇති පුරුෂයා දැන (ධනවත්හු), (තොපගේ) කර්මාන්ත කොට (අපගේ ධනය) පසුව ගෙනෙව'යි තුෂ්ණී ම ධනයෙන් පවරත්.

5435. මහරජ, මෙයින් චුත වූයේ එහි (නිරයෙහි) ලෝතුඩු ඇති කපුටු සමූහයා විසින් අදිනු ලබන්නේ දක්නෙ හිය. කවුඩන් ගිජුලිහිණියන් හා උකුස්සන් විසින් කනු ලබන සිඳින ලද සිරුරු ඇති ව නිරයෙහි වෙසෙන ලේ වැගිරෙන (තොපගෙන්) පරලොව දී කවරෙක් නම් කහවනු දහසක් ඉල්වන්නේ ද?

5436. එහි (ඒ ලොකාන්තරික නරකයෙහි චක්ඛුර්විඤ්ඤාණයාගේ උත්පත්තිය වළකන) අතිශය අන්ධකාරය ඇත්තේ ය. සඳහිරු නැත්තා හ. ඒ නිරය හැමකල්හි සන වූ අන්ධකාරයන් යුක්ත ය. භයානක ස්වරූප ඇත්තේ ය. (මෙහි යම් රාත්‍රියක් වේද) ඒ රාත්‍රිය ද නැත්තේ ය. දිවා කාලය ද නො පැනේ. එබඳු තැනෙක ධනය කැමති කවරෙක් හැසිරෙන්නේ ද?

5437. මහත් වූ ශක්තිමත් වූ ඉතා වැඩුණු කය ඇති කඹුරුවන් වූ ද ශ්‍යාම වර්ණ වූ ද සුනඛයෝ දෙදෙනෙක් මෙලොවින් චුත වැ පරලොව යන්නහු අයෝමය දක්වලින් කති.

5438. නිරයෙහි වෙසෙන දරුණු වූ දුෂ්ට වූ දුක් එළවන්නා වූ (ඒ) සුනඛයන් විසින් කනු ලබන සිඳුණ සිරුරු ඇති ලේ වැගිරෙන ඔහු ගෙන් පරලොව දී කවරෙක් දහසක් ඉල්වන්නේ ද?

5439. සොර වූ කාලූපකාල* නම් නිරයෙහි පසමිතුරු වූ එනම් ඇති නිරයපල්ලෝ පෙර (මීසිටුවූ ගැනුම නම් වූ) පවකම් කළ මිනිසාට මොනොවට තියුණු කළ හීයෙන් ද අඩයටියෙන් ද පහර දෙත්. විදීම දි කෙරෙත්.

5440. නිරයෙහි (ඔබමොබ) හැසිරෙන්නා වූ කුසෙහි ද ඇලයෙහි ද පහර දෙනු ලබන්නා වූ පළන ලද උදර ඇති සිදුණු සිරුරු ඇති ලේ වැගිරෙන තොපගෙන් පරලොව දී කවරෙක් දහසක් ඉල්වන්නේ ද?

---

* කාළූපකාළ - අට්ඨකථා, කාලාපකාල - සිංහල ජාතකපොත

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5441. සත්ති උසූ තොමරහෙණ්ඩිවාලා[1]
විවිධාවුධං වස්සති තත්ථ දෙවො,
පතන්ති අඞ්ගාරමිවවිමන්ෂා
සිලාසනී වස්සති ලුද්දකම්මෙ.

5442. උණ්හො ච වාතො නිරයම්හි දුස්සහො
න තහිං සුඛං ලබ්භති ඉත්තරම්පි,
තං තං විධාවන්තමලෙනමාතුරං
කො චොදයෙ පරලොකෙ සහස්සං.

5443. සන්ධාවමානං තං රථෙසු යුත්තං
සජොතිභූතං[2] පඨවිං කමන්තං,
පතොදලට්ඨිහි[3] සුචොදියන්තං[4]
කො චොදයෙ පරලොකෙ සහස්සං.

5444. තමාරුහන්තං බුරසඤ්ඤිතං ගිරිං
විහිංසනං පජ්ජලිතං භයානකං,
සඤ්ඡින්තගත්තං රුහිරං සවන්තං
කො චොදයෙ පරලොකෙ සහස්සං.

5445. තමාරුහන්තං පබ්බතසන්නිකාසං
අඞ්ගාරරාසිං ජලිතං භයානකං,
සංදඩ්ඪගත්තං[5] කපණං රුදන්තං
කො චොදයෙ පරලොකෙ සහස්සං.

5446. අබ්භකූටසමා උච්චා කණ්ටකාපචිතා[6] දුමා,
අයොමයෙහි තික්ඛෙහි නරලොහිතපායිහි.

5447. තමාරුහන්ති නාරියො නරා ච පරදාරගූ,
චොදිතාසත්ති හත්ථෙහි යමනිද්දෙසකාරිහි.

5448. තමාරුහන්තං නිරයං සිම්බලිං රුහිරමක්ඛිතං,
විදඩ්ඪකායං විතවං ආතුරං ගාළ්හවෙදනං.

5449. පස්සසන්තං මුහුං උණ්හං පුබ්බකම්මාපරාධිකං,[7]
දුමග්ගවිටපග්ගභතං[8] කො තං යාවෙය්‍ය තං ධනං.

---

1. ගිණ්ඩිවාලා – මජ්ස.
2. ජොතභූතං – මජ්ස.
3. පටොදලට්ඨිහි – මජ්ස.
4. සුචොදයන්තං – මජ්ස, ස්‍යා.
5. සුදඩ්ඪගත්තං
6. කණ්ටකානි චිතා – මජ්ස, ස්‍යා, වි.
7. පුබ්බකම්ම පරාධිතං – මජ්ස.
8. දුම්මග්ගෙ චිතවංගත්තං – මජ්ස, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5441. ඒ නිරයෙහි අඩයටි ඊ තෝමර හෙල්ල යන විවිධ ආයුධයුතු වැසි වසී, දිලියෙන අඟුරු මෙන් ගිනිදැල් සහිත ආයුධ පවිකරන්නන් මත වැටෙයි, හෙණ මෙන් ගිනි ගෙන දිලියෙන ගල් වැසි වසී.

5442. ඒ නිරයෙහි නො ඉසිලිය හැකි උණුසුම් වාතය ඇත්තේ ය. එහි අල්ප වූ ද සුවයෙක් නො ලැබේ. සැහවෙන තැන් නැති වැ පීඩාවට පත් වැ ඒ ඒ තැන දිවෙන තොප (තොපගෙන්) (ඒ) පරලොව දී කවරෙක් දහසක් ඉල්වන්නේ ද?

5443. රථයන්හි යොදන ලදුව දුවන්නා වූ ගින්නෙන් දිලියෙන පොළොවෙහි ඇවිදිනා වූ කෙවිටි දඬුවලින් මෙහෙයවනුලබන්නා වූ තොප (තොපගෙන්) (ඒ) පරලොව දී කවරෙක් දහසක් ඉල්වන්නේ ද?

5444. පරලොව දී කරමුවහකින් ගැවසීගත් දුටුවන් බිය උපදවන ගින්නෙන් දිලියෙන භයානක පර්වතයට නගින්නා වූ සිදුණු සිරුරු ඇති ලේ වැගිරෙන තොප (තොපගෙන්) කවරෙක් නම් (කහවණු) දහසක් ඉල්වන්නේ ද?

5445. පරලොව දී ගින්නෙන් දිලෙන භයානක පර්වතයක් වැනි අඟුරුරැසට නගින්නා වූ මොනොවට දැවුණු සිරුරු ඇති බැගෑපත් වැ හඬන්නා වූ තොප (තොපගෙන්) කවරෙක් (කහවණු) දහසක් ඉල්වන්නේ ද?

5446. නිරිසතුන්ගේ ලේ බොන්නා වූ අයොමය තියුණු කටුවලින් ගැවැසීගත් වෘක්ෂයෝ මෙකුළු මෙන් ඉතා උස් වෙති.

5447. පරදරගමන පාපකර්මයෙහි යෙදුණු ස්ත්‍රීහු ද පුරුෂයෝ ද අඩයටිගත් අත් ඇති යමගේ නියෝග ඉටුකරන්නන් (යම් පල්ලන්) විසින් මෙහෙයනලද්දහු ඒ රුකට නගිත්.

5448—49. නිරයෙහි ඇති ඒ ඉඹුල්රුකට නැගෙන්නා වූ ලේ වැකුණු සමින් තොර වූ කඩකඩ වූ කය ඇති පීඩිත වූ දැඩි වේදනා ඇති මොහොතක් පාසා උණුසුම් සුසුම් හෙළන පෙර කළ පව් කම් නැමැති අපරාධ ඇති රුක් අගින් හා වෙළෙප් අගින් පහරනලද තොප වෙත එළඹ කවරෙක් ඒ ධනය ඉල්වන්නේ ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5450. අඞ්ගකූටසමා උච්චා අසිපත්තාචිතා[1] දුමා,
අයොමයෙහි තිඛිණෙහි නරලොහිතපායිහි.

5451. තමාරුහන්තං[2] අසිපත්තපාදපං
අසීහි තිඛිණෙහි ච ඡිජ්ජමානං,[3]
යංජිණ්ණගත්තං රුහිරං සවන්තං
කො චොදයෙ පරලොකෙ සහස්සං.

5452. තතො නිකඛන්තමනන්තං[4] තං අසිපත්තනිරයා[5] දුඛා,[6]
සම්පකිතං වෙතරණිං[7] කො තං යාචෙය්‍ය තං ධනං.

5453. ඛරා ඛාරොදිකා[8] තත්තා දුග්ගහා වෙතරණී නදී,
අයොපොක්ඛරසඤ්ඡන්නා නිකඛපත්තෙහි සන්ථති.

5454. තත්ථ සඤ්ඡින්නගත්තං තං වුය්හන්තං රුහිරමක්ඛිතං,
වෙතරණෙඤ්ඤු[9] අනාලම්බෙ කො තං යාචෙය්‍ය තං ධනං.

5455. වෙධාමි රුක්ඛා විය ඡිජ්ජමානො
දිසං න ජානාමි පමීළාසඤ්ඤී,[10]
භයසාතුතපාමි මහා ච[11] මෙ භයං
සුත්වාන ගාථා[12] තව භාසිතා ඉසෙ.

5456. ආදිත්තෙ වාරිමජ්ඣම්හි දීපංවොසෙරිවණ්ණවෙ,
අන්ධකාරෙව පජ්ජොතො ත්වං නොසි සරණං ඉසෙ.

5457. අත්ථඤ්ච ධම්මඤ්ඤුසාස මං ඉසෙ
අතීතමද්ධා අපරාධිතං මයා,
ආචික්ඛ මෙ නාරද සුද්ධිමග්ගං
යථා අහං[13] නො නිරයෙ[14] පතෙය්‍යං.

5458. යථා අහූ ධතරට්ඨා වෙස්සාමිත්තෙ අථඤ්ඤා යාමතග්ගි[15]
උසීනරෝ[16] වාපි සිවී ච රාජා පරිවාරකා[17] සමණබ්‍රාහ්මණානං.

---

1. අසිපත්ත, අසිපත්තානි චිතා – මජ්ඣං, ස්‍යා, පී.
2. තමාරුහන්තං – මජ්ඣං, ස්‍යා.
3. පහිජ්ජ – මජ්ඣං.
4. නිකන්තනං පතන්තං – මජ්ඣං.
5. අසිපත්ත චිතා – මජ්ඣං.
6. දුඛා – මජ්ඣං.
7. වෙකරණිං - මජ්ඣං.
8. ඛරොදකා මජ්ඣං, ස්‍යා.
9. වෙත්තරණෙඤ්ඤු – මජ්ඣං, ස්‍යා, පී.
10. සඤ්ඤු – මජ්ඣං, ස්‍යා.
11. මහාව මෙහයා – මජ්ඣං, ස්‍යා.
12. කථා – මජ්ඣං.
13. අයං – මජ්ඣං.
14. නිරයං – මජ්ඣං.
15. යමදණ්ඩි – – ස්‍යා.
16. උසීනරෝ – මජ්ඣ්.
17. පරිවාරිකා – මජ්ඣං. ස්‍යා.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5450. නිරිසතුන්ගේ ලේ බොන්නා වූ තියුණු වූ අයොමය අසි-පත්‍රයන්ගෙන් ගැවසීගත් චක්ෂයෝ මේසකුට මෙන් ඉතා උස්වැ සිටුනාහ.

5451. පරලොවදී තියුණු අසිපත්වලින් සිඳිනු ලබන කැපුණු සිරුරු ඇතිවැ ලේ වගුරුවමින් ඒ අසිපත්රුක් වෙත එළඹෙන තොප (වෙත පැමිණ) කවරෙක් (කහවණු) දහසක් ඉල්වන්නේ ද?

5452. දුක් වූ ඒ අසිපත් නිරයෙන් නික්මුණු පමණකින් ම වෙතරණී නදියට වැටුණු තොප වෙත එළැඹ කවරෙක් ඒ ධනය ඉල්වන්නේ ද?

5453. පරුෂ වූ කරදියෙන් යුත් රත් වූ (එහෙයින් ම) දුදුළු වූ වෙතරණී නදිය අයොමය පොකුරු පතින් ගැවසුණී තියුණු පතින් යුතු ව ගලයි.

5454. එල්ඛෙන පිළිසරණක් නැති ඒ වේතරණී නදීජලයෙහි ඔසොවා ගෙනයනුලබන කැපුණු සිරුරු ඇති ලේ තැවැරුණු තොප වෙත එළඹ කවරෙක් ඒ ධනය ඉල්වන්නේ ද?

5455. මුනිවරය, තොප විසින් කියනලද ගාථා අසා සිඳිනුලබන ගසක් මෙන් සැලෙමි. වෙසෙසින් මුළා වූ සිහි ඇත්තෙමි දිසාවන් නො දනිමි. බියෙන් තැවෙමි. මාගේ බිය ඉතා මහත් ය.

5456. ස්වාමීන් වහන්ස, දැවුණු කය ඇති කල්හි දිය මැදට පැමිණීම මෙන් ද, සැඩ දියපහරෙහි හෝ සයුරෙහි හෝ දිවයිනක් මෙන් ද, අඳුරෙහි පහනක් මෙන් ද තෙපි ම අපට පිහිට වන්නහු ය.

5457. ස්වාමීන් වහන්ස, අර්ත්ථයෙන් ද ධර්මයෙන් ද මට අනුශාසනා කළ මැනව. ගියදවස ඔබ විසින් අපරාධ කරනලද. නාරද මුනිවරය, යම්සේ මම නිරයෙහි නො වැටෙමි ද එබදු ශුද්ධිමාර්ගය (යහපත්මඟ) මට කියනු මැනව.

5458. ධතරට්ඨ ය, වෙස්සාමිත්ත ය, අට්ඨක ය, යාමතග්ගි ය, උසින්නර ය, සිවි ය යන රජවරු යම්සේ මහණබමුණන්ට යුතුකම් ඉටු කරන්නෝ වූහු ද,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5459. එතෙ චඤ්ඤෙ ච රාජානො යෙ සක්කවීසයං[1] ගතා,
අධම්මං පරිවජ්ජෙත්වා ධම්මං චර මහීපති.

5460. අන්නහත්ථා ච තෙ ව්‍යම්හෙ සොසයන්තු පුරෙ තව,
කො ජාතො කො ච තසිතො කො මාලං කො විලෙපනං,
නානාරත්තානං වත්ථානං කො නග්ගො පරිදහෙස්සති.[2]

5461. කො පත්ථෙ ජත්තමාදෙති පාදුකා ච[3] මුදූ සුභා,
ඉති සායඤ්ච පාතො ච සොසයන්තු පුරෙ තව.

5462. ජිණ්ණං පොසං ගවාස්සඤ්ච මාස්සු යුඤ්ජි[4] යථා පුරෙ,
පරිහාරඤ්ච දජ්ජාසි අධිකාරකතො බලි.

5463. කායො තෙ රථසඤ්ඤතො මනොසාරථිකො ලහු,
අවිහිංසාසාරිතක්ඛො සංවිභාගපටිච්ඡදෙ.

5464. පාදසඤ්ඤමනෙමියො හත්ථසඤ්ඤමපක්ඛරො,
කුච්ඡිසඤ්ඤමනබ්භන්නො වාචාසඤ්ඤමකුජනො.[5]

5465. සච්චවාක්‍යසමත්තඩ්ඨො අපෙසුඤ්ඤසුසඤ්ඤතො,
ගිරාසබිලනෙලඩ්ඨො මිතභාණිසිලෙසිතො.

5466. සද්ධාලොභසුසඞ්ඛාරො නිවාතඤ්ජලිකුබ්බරො,
අත්ථද්ධතානතීසාඛො[6] සීලසංවරනත්ධනො.

5467. අක්කොධනමනුගසාතී ධම්මපණ්ඩරජත්තකො,
බාහුසච්චමපාලම්බො[7] ඨිතචිත්තමුපාධියො.

---

1. සග්ග – මජසං, ස්‍යා.
2. පරිදහිස්සති – මජසං, ස්‍යා.
3. කොපාහනා ච – වි.
4. යුඤ්ජ -මජසං, ස්‍යා.
5. මකුජ්ජරො – මජසං.
6. අථද්ධතානතිසාකො – මජසං.
7. සුපාලම්බො මුපාලම්බො – මජසං, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5459. (ධනරත්නාදි) මොහු ද (එබඳු) අන් යම් රජහු ද (ධර්මයෙහි හැසිර) ශක්‍රයාගේ විෂයට ගියාහු නම් මිහිපතිතුමනි, (එසෙයින් තෙපිදු) අධර්මය දුරුකොට ධර්මයෙහි හැසිරෙව.

5460. කවරෙක් බඩසා ඇත්තේ ද කවරෙක් පිපාසා ඇත්තේ ද කවරෙක් මල්දම් රුස්නේ ද කවරෙක් විලෙවුන් රිසි වේ ද නග්න වූ කවරෙක් නන් පැහැයෙන් රඳනාලද වස්ත්‍ර හඳින්නේ දැ යි (කියමින්) අහරගත්අත් ඇති පුරුෂයෝ තොපගේ බවනෙහි ද පුරෙහි ද සොඹා කෙරෙත්වා.

5461. කවරෙක් මහමඟ ඡත්‍ර දරන්නේ ද කවරෙක් මොළොක් වූ යහපත් පාවහන් කැමැත්තේ දැයි එමසේ තොපගේ පුරයෙහි උදේ සවස සොඹා කෙරෙත්වා.

5462. (යමෙක්) පෙර බලවත් වූයේ කළ අධිකාර ඇත්තේ ද (රාජ-කාර්‍යය ඉටුකිරීම් වශයෙන් කළ උපකාර ඇත්තේ වේද) ජරාවට පත් වූ (ඒ) අමාත්‍යාදීන් ද ගව-අශ්ව ආදීන් ද පෝෂණය කරන්නේ ඔවුන් පෙර මෙන් (කර්මාන්තයන්හි) නො යොදව. (ඔවුන්ට ඔත් වැටුප් ආදි) පෙරහර ද දෙව.

5463. (මහරජ,) තොපගේ කය රියක් වැන්න. (එහි) සැහැල්ලු වූ මනස ම රියැදුරු යැ. අවිහිංසා නමැති මනා කොට නිමවන ලද අකුරු ඇත්තේ ය. බෙද වැළඳීම ම රථපරිවාර වෙයි.

5464. පාදසංයමය එහි නිමිවළලු යැ. හස්ත සංයම නමැති වෙහෙලි පත් ඇත්තේ ය. පමණ දැන වැළඳීම නමැති තෙල් ගැල්වීම් ඇත්තේ ය. වාක්සංයම නමැති නිහඬබව වෙයි.

5465. සත්‍යවාක්‍ය නමැති පිරිපුන් අවයව ඇත්තේ ය. කේලාම් නො කීම නමැති මනා සටහන් ඇත්තේ ය. මටසිලුටු වචන නමැති නිදෙස් රථාඩඹ ඇත්තේ ය. පමණ දැන බිණීම නමැති බඳනා ලාටු ඇත්තේ ය.

5466. ශ්‍රද්ධාව හා අලොභය නමැති මනා අලඬකාරයෙන් යුක්ත ය. යටත් පැවතුම් හා ඇදිලිබැඳීම් සංඛ්‍යාත (රිය දෙපස) කිඹුල්තලු ඇත්තේ ය. නො දැඩිබව නමැති නැමුණු රියහිස ඇත්තේ ය. සීලසංවර නමැති රැහැණ ඇත්තේ ය.

5467. ක්‍රොධ නො කිරීම නමැති නො හැකිලීම් ඇත්තේ ය. දශ කුශලධර්ම නමැති සේසතින් යුක්ත ය. බොහෝ ඇසුපිරු තැන් ඇති බව නමැති ආධාරක පුවරු (පිටාටු) ඇත්තේ ය. (අටලෝ දහමින් නො සැලෙන බැවින්) මනාව පිහිටි සිත් නමැති සිහසුන් හෝ උඩ ඇතිරි ඇත්තේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5468. කාලඤ්ඤුතාචිත්තසාරො වෙසාරජ්ජතිදණ්ඩකො,
නිවාතවුත්ති යොත්තකො[1] අනතිමානයුගො ලහු.

5469. අලීනචිත්තසත්ථාරො[2] වද්ධසෙවිරජොහතො,[3]
සතිපතොදෙ ධීරස්ස ධිති යොගො ච රස්මියො.

5470. මනො දන්තපථත්වෙති[4] සමදන්තෙහි වාහිහි,[5]
ඉච්ඡා ලොභො ච කුම්මග්ගො උජුමග්ගො ච සඤ්ඤමො.

5471. රූපෙ සද්දෙ රසෙ ගන්ධෙ වාහනස්ස පධාවතො.
පඤ්ඤා ආකොටනී රාජ තත්ථ අත්තාව සාරථි.

5472. සවෙ එතෙන යානෙන සමචරියා දළ්හා ධිතී,
සබ්බකාමදුහො රාජ න ජාතු නිරයං වජෙ.

5473. අලාතො දෙවදත්තොසි සුනාමො ආසි භද්දජී,
විජයො සාරිපුත්තොසි මොග්ගල්ලානොසි බීජකො.

5474. සුනක්ඛත්තො ලිච්ඡවීපුත්තො ගුණෝ ආසි අවෙලකො,
ආනන්දො ච රුජා[6] ආසි යා රාජානං පසාදයි.

5475. උරුවෙලකස්සපො රාජා පාපදිට්ඨි තදා අහු,
මහාබ්‍රහ්මා බොධිසත්තො එවං ධාරෙථ ජාතකන්ති.

මහානාරදකස්සපජාතකං සත්තමං.

---

1. යොත්තඛ්ගො – මජසං.
2. සත්ධාරො – මජසං.
3. බුද්ධිසෙවී – මජසං.
4. දන්තං පථං නෙති – මජසං.
5. වාජිහි – මජසං.
6. සා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5468. කල්දැන කරනලද කුසලින් යුත් වූ සිත් නමැති සාරයෙන් යුක්තය, විසාරදබව (බුහුටිබව) නමැති ත්‍රිදණ්ඩයෙන් යුක්ත ය, යටත් පැවතුම් නමැති යොත් ඇත්තේ ය, අධිකමාන නො කිරීම නමැති සැහැල්ලු වියදඬු ඇත්තේ ය.

5469. නො පසුබස්නා සිත් නමැති ඇතිරි ඇත්තේ ය. නුවණැති වෘද්ධයන් සෙවීමෙන් නසනලද රජස් ඇත්තේ ය. පණ්ඩිත වූ තොපගේ සිහි නමැති කැවිටි ඇත්තේ ය, (නො සිඳි පවත්නා) වීර්‍යය ද (හිත ප්‍රතිපත්තියෙහි යෙදීම නම් වූ) යෝගය ද රැහැණ වෙයි.

5470. මොනොවට දැමුණු අසුන්ගෙන් යුත් (රියක් මෙන් තොප ගේ) දැමුණු සිත යහපත් මහ අනුව යෙයි. (නො ලද දැ පැතීම නම් වූ) ඉච්ඡාව ද (ලද දෙයෙහි) ලෝභය ද නො මග නම් වෙයි. සීලසංයමය ම සුමග වෙයි.

5471. රූප ගඛ්ද ගන්ධ රසයන් කරා දිවෙන (තොපගේ කය නමැති) වාහනයාගේ (ලොභාදි අකුසලධර්ම නමැති අශ්වයන් වැළකීම සඳහා) පහරදීම කරන්නී ප්‍රඥාවයි. මහරජ, එහි තෙමේ මැ රියැදුරු වෙයි.

5472. මහරජ, යම්හෙයකින් මේ යානය කැමැති සම්පත් දෙන්නේ ද (එහෙයින් යමකුගේ) සමචරියාව ත් නො පසුබස්නා වීර්‍යය ත් දැඩි වූයේ ද හෙතෙම මේ යානයෙන් ඒකාන්තයෙන් කිසිකලෙකත් නිරයට නො පැමිණෙන්නේ ය.

5473. (මෙකල) දේවදත්ත (එකල) අලාත විය. භද්දජි (භද්දිය තෙරුන් වහන්සේ) සුනාම නම් (ඇමති) විය. සැරියුත් තෙරණුවෝ විජය නම් ඇමති වූහ. මුගලන් තෙරණුවෝ බීජක නම් වූහ.

5474. සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර ගුණ නම් අවෙලක විය. යම් රජ දුවක් රජු පැහැද වූ ද ඒ රුජා නම් රජ දු ආනන්ද තෙරණුවෝ ය.

5475. උරුවෙලකස්සප තෙරුන් වහන්සේ එකල පාපදෘෂ්ටිගත් රජ වූහ. බොධිසත්වයෝ (නාරද නම්) මහාබ්‍රහ්ම වූහු. මෙසේ (මේ) ජාතකය දරවු.

යත්වැනි මහා නාරද කාශ්‍යප ජාතක යි

T - 15

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

8. විධුරජාතකං

5476. යො කොපනෙය්‍යෙ න කරොති කොපං
න කුජ්ඣති සප්පුරිසො කදාචි,
කුද්ධොපි යො නාවිකරොති කොපං
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

5477. ඌනූදරො යො සහතෙ ජිඝච්ඡං
දන්තො තපස්සී මිතපාණභොජනො,
ආහාරහෙතු න කරොති පාපං
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

5478. බිඩ්ඩං රතිං විප්පජහෙත්ව ඛ්ඛං
න චාලිකං භාසති කිඤ්චි ලොකෙ,
විභූසනට්ඨානා විරතො මෙථුනස්මා
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

5479. පරිග්ගහං ලොභධම්මඤ්ච සබ්බං
යෙ වෙ පරිඤ්ඤාය පරිච්චජන්ති,
දන්තං ඨිතත්තං අම්මං නිරාසං
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

5480. පුච්ඡාම කත්තාරං අනොමපඤ්ඤං
ගාථාසු නො විග්ගහො අත්ථි ජාතො,
ජින්දජ්ජ කඞ්ඛං විවිකිච්ඡිතානි
තයජ්ජ කඞ්ඛං විතරෙමු සබ්බෙ.

5481. යෙ පණ්ඩිතා අත්ථදස්සා භවන්ති
භාසන්ති තෙ යොනිසො තත්ථ කාලෙ,
කථන්නු ගාථානං අභාසිතානං
අත්ථං නයෙය්‍යුං කුසලා ජනින්ද.

5482. කථං භවෙ භාසති නාගරාජා
කථං පන ගරුළො වෙනතෙය්‍යො,
ගන්ධබ්බරාජා පන කිං වදෙති
කථං පන කුරූනං රාජසෙට්ඨො.

5483. ඛන්තිං භවෙ භාසති නාගරාජා
අප්පාහාරං ගරුළො වෙනතෙය්‍යො,
ගන්ධබ්බරාජා රතිවිප්පහානං
අකිඤ්චනං කුරූනං රාජසෙට්ඨො.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

8. විධුර ජාතකය

5476. (වරුණ නා රජ) සත්පුරුෂ වූ යමෙක් කිපියයුත්තහු කෙරෙහි නො කිපේ ද කිසිකලෙකත් කෝප නො කරන්නේ ද යමෙක් කිපියේ නමුදු කෝපය පහළ නො කෙරේ ද, ඒකාන්තයෙන් ඒ මනුෂ්‍යයා ශ්‍රමණයෙකැ යි ලොවැ පඬිවරු කියති.

5477. (ගුරුළු රජ) මද අහර ඇති යමෙක් සාගිනි ඉවසා ද, ඉන්ද්‍රිය දමනයෙන් හා තවුස් ගුණෙන් යුතුවූයේ පමණ දන ආහාර පාන වළඳා ද, සාගින්න හේතුකොට පාපක්‍රියා නො කෙරේ ද ඒ මිනිසා ඒකාන්තයෙන් ශ්‍රමණයෙකැ යි ලොවැ පඬිවරු කියති.

5478. (සක්දෙවු රජ) යමෙක් කායික වාචසික ක්‍රීඩා ද දිව්‍ය කාමසුඛයෙහි ඇල්ම ද හැරපියා සුළුපට වූ හෝ බොරු නො කියා කාය මණ්ඩනයෙන් හා මෙථුනයෙන් වැළකුණේ ද, ඒකාන්තයෙන් ඒ මනුෂ්‍යයා ශ්‍රමණයෙකැ යි ලොවැ පඬිවරු කියති.

5479. (ධනඤ්ජය රජ) තමන් සන්තක ලෝභ කටයුතු සියලු වස්තූන් හැරදමා ඉන්ද්‍රිය දමනයෙන් යුක්තව සිත එකඟ කොටැ ගත් මමත්වය නැති කර ගත් ඒ පුද්ගලයා ඒකාන්තයෙන් ශ්‍රමණයෙකැ යි ලෙව්හි පඬිවරු කියති.

5480. අලාමක නුවණැති, කළමනා දෙය කරන (තොප) විචාරමි. අප කී ගාථාවන් නිසා උපන් විවාදයෙක් ඇත. අපේ සැකය දුන් පසිඳුව. තොප නිසා අද (අපි) සියල්ලෝ සැක රහිත වෙමු. (සිවුදෙනම විධුර පණ්ඩිතයන් පුළුවුත්හ.)

5481. (කී දෙයෙහි) අරුත් දක්නට සමත් යම පණ්ඩිත කෙනෙක් වෙද්ද ඔහු ඒ විවාදය නුවණින් විමසා යථා කාලයෙහි පවසති. රජතුමනි, නො කී ගාථාවන්ගේ අර්ථය දැකීමෙන් ඇත්තෝ වුවත් කෙසේ පමුණුවත් ද? (ඉදිරිපත් කෙරෙත් ද?)

5482. නාගරාජයා කෙසේ කියා ද? වෙනතෙය්‍ය නමැති ගුරුළා කෙසේ කියා ද? ශක්‍රයා කුමක් කියා ද? කුරුරට වාසින්ගේ ධනඤ්ජය රජ කෙසේ කියා දැයි (විධුර පණ්ඩිත ඔවුන් විචාළේය.)

5483. ඒකාන්තයෙන් ඉවසීම උතුම්ය යි නාගරාජයා කිය යි. වෙනතෙය්‍ය නමැති ගුරුළා සුළුපට ආහාරය (ගැනීම) උතුම්ය යි කිය යි. පස්කම් සැපතෙහි ආශාව දුරු කිරීම උතුම්ය යි ශක්‍රයා කිය යි. කුරුරට වැස්සන්ගේ රජතෙම පළිබොධ රහිත බව උතුම්ය යි කිය යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5484. සබ්බානි එතානි සුභාසිතානි
න හෙත්ථ දුබ්භාසිතමත්ථි කිඤ්චි,
යස්මිඤ්ච එතානි පතිට්ඨිතානි
අරාව නාභ්‍යා සුසමොහිතානි,
චතුබ්ඝි ධම්මෙහි සමඞ්ගිභූතං
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

5485. තුවන්නු සෙට්ඨො ත්වමනුත්තරොසි.
ත්වං ධම්මගූ ධම්මවිදූ සුමෙධො
පඤ්ඤාය පඤ්ඤං සමධිග්ගහෙත්වා,
අච්ඡෙජ්ජි ධීරො විචිකිච්ඡිතානි
අච්ඡෙජ්ජි කඞ්ඛං විචිකිච්ඡිතානි
චුන්දෙ යථා නාගදන්තං බරෙන.

5486. නීලුප්පලාභං විමලං අනග්ඝං
වත්ථං ඉමං ධූමසමානවණ්ණං,
පඤ්ඤස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදාමි තෙ ධම්මපූජාය ධීර.

5487. සුවණ්ණමාලං සතපත්තඵුල්ලං
සකෙසරං රතනසහස්සමණ්ඩිතං,
පඤ්ඤස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදාමි තෙ ධම්මපූජාය ධීර.

5488. මණිං අනග්ඝං රුචිරං පභස්සරං
කණ්ඨාවසත්තං මණිභූසිතං මෙ,
පඤ්ඤස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදාමි තෙ ධම්මපූජාය ධීර.

5489. ගවං සහස්සං උසභඤ්ච නාගං
ආජඤ්ඤයුත්තෙ ච රථෙ දස ඉමෙ,
පඤ්ඤස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදාමි තෙ ගාමවරානි සොළසාති.

5490. පණ්ඩු කිසියාසි දුබ්බලා
වණ්ණරූපං න තවෙදිසං[1] පුරෙ,
විමලෙ අක්ඛාහි පුච්ඡිතා[2]
කීදිසී[3] තුය්හං සරීරවෙදනා.

5491. ධම්මො මනුජේසු මානිනං
දෙහළො නාම ජනින්ද වුච්චති,
ධම්මාහටං[4] නාගකුඤ්ජර
විධුරස්ස හදයාභිපත්ථයෙ.

---

1. තවෙදිසි – මජසං, වි.
2. පුච්ඡිතො – මජසං.
3. කීදිසා – වි.
4. ධම්මාහතං – මජසං, වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5484. (විධුර පණ්ඩිත) මේ සියල්ල සුභාෂිත යැ. දුබැසි කිසිත් මෙහි නැති. චක්‍රනාභියෙහි අර ලෙසින් මේ ගුණදම යමකු කෙරෙහි පිහිටා තිබේ ද, ඉවසීම ආදි (මේ) ගුණදම සතරින් හෙබි පුද්ගලයා ඒකාන්තයෙන් ශ්‍රමණය යි ලොවැ (පඬිවරු) කියතියි කීය.

5485. ඔබ ශ්‍රේෂ්ඨ වෙති, ඔබට වඩා උත්තමයෙක් නැති හෙයින් අනුත්තර වෙති. ඔබ ධර්මය රක්නාහ, ධර්මය දන්නාහ, මහා ප්‍රාඥය හ. සියනැණින් අපගේ පැනය මැනැවින් වටහා ගෙන අපගේ සැක පසිඳලූහ. ඇත්දළ කැටයම්, කරු කියතෙන් ඇත්දළය යම්සේ කපා ද එසේ අපේ සැක, ඒමති සිඳ දැමූහ.

5486. ප්‍රාඥය, නිලුපුල් පැහැයට සමාන වූ පවිත්‍ර වූ මහඟු වූ ධූමවර්ණ වූ මේ වස්ත්‍රය, ඔබගේ පැන විසඳුමෙන් තුටුපත් මම ධර්මපූජා පිණිස ඔබට දෙමි.

5487. ප්‍රාඥය, විකශිත පද්මයක් වැනි කෙසුරු සහිත රත්න සහස්‍රයකින් යුක්ත වූ රන් මාලය දහම් පඬුරු වීසින් පැන විසඳුමෙන් තුටුපත් මම ඔබට දෙමි.

5488. ප්‍රාඥය, මාගේ ගෙළැ පැළැඳි පැහැ විභාවන මනහර මේ මිණි දහම් පඬුරු වශයෙන්, මම පැන විසඳුමෙන් තුටුපත් වූයෙමි ඔබට දෙමි.

5489. පැන විසඳුමෙන් තුටුපත් මම දෙනුන් දහසක් ද වෘෂභයකු ද ඇතකු ද ආජානීය අශ්වයන් යෙදූ මේ රිය දසය ද ගම්වර සොළොසක් ද ඔබට දෙමි.

5490. (නාරජ) විමලාවෙනි, තිගේ සිරුර පඬුවන් ය, කෘශ ය, දුබල ය, පෙර තිබූ රුසිරි (දැන්) නැත. තිට කවර ශරීර වෙදනාවක් පවතී දැ යි මට කියව.

5491. මිනිසුන් අතරේ (වෙසෙන) ස්ත්‍රීන්ට දෙළ දුක් ඉපැදීම සවභාවයෙකි. නාරජකුමනි, දැහැමින් (බලාත්කාරයෙන් තොරව) ගෙනා විධුරපණ්ඩිතුමාගේ හදවත පතමියි (ඕ කීවාය.)

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5492. චන්දං ඛො ත්වං දෙහළායසි[1]
සුරියං වා අථවාපි මාලුතං,
දුල්ලභෙ[2] හි විධුරස්ස දස්සනෙ[3]
කො විධුරං ඉධමානයිස්සති.

5493. කින්නු තාත තුවං පජ්ඣායසි
පදුමං හත්ථගතංව තෙ මුඛං,
කිං දුම්මනරූපොසි ඉස්සර
මා ත්වං සොචි අමිත්තතාපනා.

5494. මාතා හි තව ඉරන්දති[4]
විධුරස්ස හදයං ධනීයති,
දුල්ලභෙ හි විධුරස්ස දස්සනෙ
කො විධුරං ඉධමානයිස්සති.

5495. භත්තුපරියෙසනං[5] චර
යො විධුරං ඉධමානයිස්සති,
පිතුනො ච සා සුත්වාන වාක්‍යං
රත්තිං නික්ඛම්ම අවස්සුතිං චරි.

5406. කෙ ගන්ධබ්බෙ ච රක්ඛසෙ
නාගෙ කිම්පුරිසෙ ච මානුසෙ,
කෙ පණ්ඩිතෙ සබ්බකාමදෙ
දීඝරත්තං භත්තා මෙ භවිස්සති.

5497. අස්සාස හෙස්සාමි තෙ පති
භත්තා හෙස්සාමි අනින්දලොචනෙ,
පඤ්ඤා හි මම[6] තථා විධා
අස්සාස හෙස්සසි භරියා මමං.[7]

5498. අථ නං අවචාසි[8] ඉරන්දති
පුබ්බපථානුගතෙන චෙතසා,
එහි ගච්ඡාම පිතු මමන්තිකෙ
එසොව තෙ එතමත්ථං පවක්ඛති.

5499. අලංකතා සුවසනා මාලිනී චන්දනුස්සද,
යක්ඛං භත්ථෙ ගහෙත්වාන පිතු සන්තිකමුපාගමි.

5500. නාගවර වචො සුණොහි මෙ
පතිරූපං පටිපජ්ජ සුඩ්කියං,
පත්ථෙමි අහං ඉරන්දතිං[9]
තාය සමඩ්ගී[10]කරොහි මෙ තුවං.[11]

---

1. චිමලෙ දෙහළායසි–මජසං.
2. දුල්ලභං – මජසං.
3. දස්සනං – මජසං.
4. ඉරන්ධති – මජ ං.
5. තං භත්තාරං – මජසං, ස්‍යා. වි.
6. මමං – මජසං.
7. මම – මජසං.
8. අවචාසි පුණ්ණකං – මජසං.
9. ඉරන්ධතිං – මජසං.
10. සමඩ්ගි – මජසං.
11. මං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5492. (නා රජ) දෙළ විසින් චන්ද්‍රයා ප්‍රාර්ථනා කරති සූයර්යා ප්‍රාර්ථනා කරති නොහොත් පවන ප්‍රාර්ථනා කරති. විධුරගේ දර්ශනය පවා දුර්ලභ වන කල්හි කවරෙක් විධුර මෙහි ගෙන එන්නේ ද?

5493. (ඉරන්දති) පියාණෙනි, තෙපි කුමට සිතිවිලි සිතන්නවු ද? තොප වහන්සේගේ මුව අතින් මැඩලූ පියුමක් වැන්න. ඊශ්වරයාණෙනි, කුමට දෙමනස්සැහැවි ඇතියවු ද? සතුරන් ගේ තාපනයෙන් තෙපි නහමක් ශොක කරව.

5494. (නාරජ) ඉරන්දතිය, තීගේ මව විධුරගේ භදම්ස පතයි. විධුරගේ දර්ශනය පවා දුර්ලභ යි. කවරෙක් විධුර මෙහි ගෙන එන්නේ ද?

5495. යමෙක් විධුර මෙහි ගෙන එන්නේ නම් එබඳු සවාමියකු සොයව යි කී පියාගේ වචනය අසා ඕ තොමෝ රාත්‍රියෙහි (රජගෙන්) නික්මැ ක්ලෙශයෙන් ආර්ද්‍ර වූ (සවාමියකු සොයා) හැසුරුණා යැ.

5496. කවර නම් ගඳඔෙක් රකුසෙක් නාගයෙක් කිඳුරෙක් මිනිසෙක් (ඔවුනතර) සියලු කාමසම්පත් දෙන කවර නම් පණ්ඩිතයෙක් (මාගේ මවගේ මනදෙළ සපුරා) දීර්ඝ කාලයක් මට සවාමී වන්නේ ද?

5497. ප්‍රශස්ත නයන ඇත්තිය, සැනැහෙව. තීගේ සවාමී වෙමි. භර්තෘ වන්නෙමි. මට එබඳු (විධුරගේ භදම්ස් ගෙනෙනු සමත්) ප්‍රඥයෙක් ඇති. සැනැහෙව, මට භාය්‍යා වව.

5498. ඉක්බිති ඉරන්දතී තොමෝ පූර්වභවය අනුවගිය සිතින් යුතු වැ ඔහට මෙසේ කීවා යැ. එව, මාගේ පියා වෙත යමිහ. තෙල පිය තෙමේ මෑ තොපට මෙ කරුණ කියන්නේ යැ.

5499. අලංකෘත වූවා හැඳගත් මනාවස්ත්‍ර ඇති පැළැඳි මාලා ඇති ගැල්වූ සඳුන්කල්ක ඇති ඉරන්දතී (පූර්ණක) යක්ෂයා අතින් ගෙන පියා වෙත පැමිණියා.

5500. (පූර්ණක) නාරජතුමනි, මාගේ වචනය අසනු මැනැවි. දුකුමරියට අනුරූප සුවත් (දයද්‍ය) පිළිගනු මැනැවි. මම ඉරන්දතිය පතමි. තෙපි ඇය හා මාගේ සහභාවය කරව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5501. සතං හත්‍ථී සතං අස්සා සතං අස්සතරීරථා,
සතං වළභියො පුණ්ණා නානාරතනස්ස කෙවලා;
තෙ නාග පටිපජ්ජස්සු ධීතරං දෙහි ඉරන්දතිං.

5502. යාව ආමන්තයෙ ඤාතී මිත්තෙ ච සුහදං ජනං,[1]
අනාමන්තකතං කම්මං තං පච්ඡාමනුතප්පති.

5503. තතො සො වරුණො නාගො පවිසිත්වා නිවෙසනං,
භරියං ආමන්තයිත්වාන ඉදං වචනමබ්‍රවි:

5504. අයං සො පුණ්ණකො යක්ඛො යාචතී මං ඉරන්දතිං.
බහුනා විත්තලාභෙන තස්ස දෙම පියං මමං.

5505. න ධනෙන න විත්තෙන ලබ්භා අම්හං ඉරන්දතී,
සචෙ හි වො[2] හදයං පණ්ඩිතස්ස
ධම්මෙන ලද්ධා ඉධමාහරෙය්‍ය;
එතෙන විත්තෙන කුමාරි ලබ්භා
නාඤ්ඤං ධනං උත්තරිං පත්‍ථයාම.

5506. තතො සො වරුණො නාගො නික්ඛමිත්වා නිවෙසනා,
පුණ්ණකාමන්තයිත්වාන ඉදං වචනමබ්‍රවි:

5507. න ධනෙන න විත්තෙන ලබ්භා අම්හං ඉරන්දති
සචෙ තුවං හදයං පණ්ඩිතස්ස
ධම්මෙන ලද්ධා ඉධමාහරෙසි.
එතෙන විත්තෙන කුමාරි ලබ්භා
නාඤ්ඤං ධනං උත්තරිං පත්‍ථයාම.

5508. යං පණ්ඩිතො ත්‍යෙකෙ වදන්ති ලොකෙ
තමෙව බාලොති පුනාහු අඤ්ඤෙ
අක්ඛාහි මෙ විප්පවදන්ති එත්‍ථ,
කං පණ්ඩිතං නාග තුවං වදෙසි.

5509. කොරව්‍යරාජස්ස ධනඤ්ජයස්ස
යදි තෙ සුතො විධුරො නාම කත්තා,
ආනෙහි තං පණ්ඩිතං ධම්මලද්ධා
ඉරන්දතී පද්ධචරා[3] තෙ හොතු.

5510. ඉදඤ්ච සුත්වා වරුණස්ස වාක්‍යං,
උට්ඨාය යක්ඛො පරමප්පතීතො,
තත්‍ථෙව සන්තො පුරිසං අසංසි
ආනෙහි ආජඤ්ඤමිධෙව යුත්තං.

---

1. සුහදජ්ජනෙ – මජ්ජසං.
2. සචෙ ච ඛො – මජ්ජසං, ස්‍යා.
3. පට්ඨචරා – මජ්ජසං, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5501. ඇත්තු සියයෙක, අශ්වයෝ සියයෙක, වෙළඹුන් යෙදූ රථ සියයෙක, නන්රුවනින් පිරිපුන් බඩුගැල් සියයෙකි. නාරජුනි, එහැම පිළිගනු මැනැවැ. ඉරන්දතී දියණියන් දෙව.

5502. (යක් සෙනෙවිය,) යම්තාක් නැයන් ද මිතුරන් ද සුහද ජනයා ද අමතම් ද ඒ තාක් බලව. නො අමතා කළ කම්යක් වේ නම් ඒ පසුතවායයි (නාරජ කී.)

5503. ඉක්බිති ඒ වරුණ නාරජ නිවෙස්නට පිවිසැ භාර්යාව අමතා මෙවදන් කී:

5504. මේ ඒ ප්‍රසිද්ධ පූර්ණක යක්ෂ තෙම මාගෙන් ඉරන්දතිය ඉල්වයි. බොහෝ වූ ධනලාභයෙන් ඔහට මාගේ ප්‍රිය වූ දියණිය දෙම්හ.

5505. (විමලා) ධනසම්පතින් අපගේ ඉරන්දතී නො ලැබීය හැක්ක. ඉදින් පණ්ඩිතයන්ගේ හදමස දැහැමින් ලැබැ මෙහි ගෙන එන්නේ නම් තෙල ධනයෙන් කුමරී ලැබියහෙයි. මත්තෙහි අන් ධනයක් නො පතම්හ.

5506. ඉක්බිති ඒ වරුණ නාරජ නිවෙසින් නික්මැ අවුත් පූර්ණක අමතා මෙවදන් කී:

5507. ධනසම්පතින් අපගේ ඉරන්දනී නො ලැබියහෙයි. ඉදින් පණ්ඩිතයන්ගේ හදමස දැහැමින් ලැබැ මෙහි ගෙන එන්නෙහි නම් තෙල ධනයෙන් කුමරී ලැබියහෙයි. මත්තෙහි අන් ධනයක් නො පතම්හ.

5508. (පූර්ණක) ලෝකයෙහි යමකු පණ්ඩිත යැ යි කෙනෙක් කියත් ද යළි ඔහු මැ බාලයෙකැ යි අන් කෙනෙක් කියති. මෙහිලා විවාද කෙරෙති. මට කියව, නාරජුනි, තෙපි කවර නම පණ්ඩිතයකු ගෙනැ කියවූ ද?

5509. ඉදින් තොප විසින් ධනාක්ෂය කොරව්‍ය රජුගේ විධුර නම් පණ්ඩිතයෙක් අසනලද වේ ද, ඒ පණ්ඩිතයා දැහැමින් ලැබැ ගෙනෙව. තොපට ඉරන්දතී පාදපරිචාරිකා වේවා.

5510. වරුණ නාරජුගේ මෙ වදන් අසා ප්‍රමුදිත වූ පූර්ණක යක්ෂ හුනස්නෙන් නැඟී, එහිම සිට, සැරසූ ආජානීය අසකු ගෙනෙවයි සේවකයකුට අණ කෙළේය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5511. ජාතරූපමයා කණ්ණා කාවම්භමයා[1] ඛුරා,
ජම්බොනදස්ස පාකස්ස සුවණ්ණස්ස උරච්ඡදෙ.

5512. දෙවවාහවහං යානං අස්සමාරුය්හ පුණ්ණකො
අලඞ්කතො කප්පිතකෙසමස්සු
පක්කාමි වෙහාසයමන්තලික්ඛෙ.

5513. ස පුණ්ණකො කාමවෙගෙන[2] ගිද්ධො
ඉරන්දතිං නාගකඤ්ඤං ජිගිංසං
ගන්ත්වාන තං භූතපතිං යසස්සිං
ඉච්චබ්‍රවි වෙස්සවණං කුවෙරං.

5514. භොගවතීනාමමන්දිරෙ
වාසා භිරඤ්ඤවතීති වුච්චති,
නගරෙ නිම්මිතෙ කඤ්චනමයෙ
මණ්ඩලස්ස උරගස්ස නිට්ඨිතං.

5515. අට්ටාලකා[3] ඔට්ඨගීවියො
ලොහිතඞ්කස්ස මසාරගලලිනො,
පාසාදෙත්ථ සිලාමයා
සොවණ්ණරතනෙන ඡාදිතා.

5516. අම්බා තිලකා ච ජම්බුයො
සත්තපණ්ණා මුචලින්දකෙතකා,[4]
පියකා[5] උඤ්ඤලකා සභා
උපරිභද්දකා සින්ධුවාරකා.[6]

5517. චම්පෙය්‍යකා නාගමාලිකා
භගිනිමාලා අථමෙත්ථ කොලියා,
එතෙ දුමා පරිනාමිතා
සොභයන්ති උරගස්ස මන්දිරං.[7]

5518. ඛජ්ජුරෙත්ථ සිලාමයා
සොවණ්ණධුවපුප්ඵිතා,
බහූ යත්ථ වසතොපපාතිකො
නාගරාජා වරුණො මහිද්ධිකො.

5519. තස්ස කොමාරිකා භරියා
විමලා කඤ්චනවෙලලිවිග්ගහා,
කාළා තරුණාව උග්ගතා
පුච්මන්දත්ථනී චාරුදස්සනා.

---

1. කාවම්භිව – මජ්ඣං. ස්‍යා.
2. කාමරාගෙන – මජ්ඣං, ස්‍යා.
3. අට්ටළහතා – මජ්ඣං
4. කෙටකා – මජ්ඣං.
5. පියඞ්ගු උද්දලකා සෙතා පියඞ්ගුකා – මජ්ඣං. ස්‍යා.
6. පාරිභද්දකා සින්ධවාරිතා – මජ්ඣං.
7. මන්දිරෙ – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5511. මනෝමය අශ්වයාට සුවර්ණමය කත් ඇත. රක්ත මාණික්‍යමය කුර ඇත. ජාම්බෝනද රනින් නිම වූ උරසැත්මාලා (පපුවැස්ම) ඇත.

5512. අලංකෘත වූයේ මනාගරයේ සැරහූ කෙස් රවුළු ඇති පූර්ණක යක්‍ෂයා දේවවාහවහ නමැති අසු අරා අහසින් ගියේය.

5513. කාමවෙගයෙන් ගිජු වූ ඒ පූර්ණකයා ඉරන්දනී නාමෙනෙවිය පතමින්, භූතාධිපති වූ පරිවාර සම්පත් ඇති වෛශ්‍රවණ වෙත ගොස් මෙසේ කීය:

5514. රනින් නිමහම් කළ නගරයෙහි මැදුරු භෝගවතී, වාසා, හිරණ්‍යවතී යන නම් ඇත්තේය යි කියනු ලැබේ. දරණයෙන් යුතු නාරජුගේ නගරයෙහි (මෙසේ) නිමහම් කරන ලද්දේය.

5515. ඔටුගෙලසේ දිගැති, රක්තමාණික්‍යයෙන් හා මයාරගල්ල නමැති මාණික්‍යයෙන් කළ අටලු (වේදිකා) ඇත්තේය. මෙම නාගභවනයෙහි මිණිමුවා ප්‍රාසාදයෝ රන්මුවා උළින් වසන ලද්දෝය.

5516-17. අඹ මදට දඹ රුක්අත්තන මිදෙල්ල වැටකේ පියල් එරහැදි මීඅඹ එරබදු සපු නා යොහොඹු කොබලිල යන මේ රුක්හු මල් පල ගත්තාහු අතුපතරින් ගැවිසුනාහු නාගමන්දිරය අලංකාර කෙරෙති.

5518. ඔපපාතිකව උපන් මහත් සෘඩි ඇති වරුණ නාරද යම් තැනෙක වෙසේ ද (එතැන) මෙම නාග භවනයෙහි නිතර පිපුණ රන්මුවා මල් ඇති, ඉඳුනිල්මිණිමුවා ඉදිගස් බොහෝ යැ.

5519. රුවන් රැසක් වැනි (බබළන) ශරීර ඇති, (මදපවනින් ලෙලෙන) කළුවැල් දල්ලක් මෙන් නැඟී සිටී, කොසඹපල බදු තනපුවු ඇති දර්ශනීය වූ ඔහුගේ තරුණ බිරිඳ විමලා නමැත්තීය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5520. ලාඛාරසරත්තසුවණ්ණී
කණිකාරොව නිවාතපුප්ඵිතෝ,
තිදිවොකචරාව අච්ඡරා
විජ්ජුතඛහාසනාව නිස්සටා.

5521. සා දෙහළිනී සුවිම්හිතා
විධුරස්ස හදයං ධනීයති,
තං තෙසං දදමි[1] ඉස්සර
තෙන තෙ දෙනති ඉරන්දකිං මමං.

5522. ස පුණ්ණකො භූතපතිං යසස්සිං
ආමන්තය[2] වෙස්සවණං කුවෙරං,
තඤ්ඤව සනෙත්තං පුරිසං අසංසි
ආනෙහි ආජඤ්ඤමිධෙව යුත්තං.

5523. ජාතරූපමයා කණ්ණා කාවමහමයා[3] ඛුරා,
ජම්බොනදස්ස පාකස්ස සුවණ්ණස්ස උරච්ඡදෙ.

5524. දෙවවාහවහං යානං අස්සමාරුය්හ පුණ්ණකො,
අලඞ්කතො කප්පිතකෙසමස්සු
පක්කාමි වෙහාසයමන්තලික්ඛෙ.

5525. සො ආගමා[4] රාජගහං සුරම්මං
අඞ්ගස්ස රඤ්ඤො නගරං දුරායුතං,[5]
පහූතහක්කං බහුඅන්නපානං
මසක්කසාරං විය වාසවස්ස.

5526. මයූරකොඤ්චාගණසම්පඝුට්ඨං
දිජාභිඝුට්ඨං දිජසඞ්ඝසෙවිතං,
නානාසකුන්තා[6]භිරුදං සුහඞ්ගනං
පූජාහිකිණ්ණං භිමවංව[7] පබ්බතං.

5527. ස පුණ්ණකො වෙපුල්ලමාභිරුහි[8]
සිලුච්චයං කිම්පුරිසානුවිණ්ණං,
අත්වෙසමානො මණිරතනං උළාරං
තමද්දසා පබ්බතකූටමජ්ඣෙ.

---

1. දෙමි – මජ්ඣං.
2. ආමන්තිය – මජ්ඣං.
3. කාවමහිව – මජ්ඣං.
4. අගමා – මජ්ඣං.
5. දුරායුත්තං – මජ්ඣං.
6. යකුන්තා – මජ්ඣං.
7. භිමවන්ත – මජ්ඣං.
8. මාභිරුයහි – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5520. ඕ ලතුදිය වන් රත්පැහැ (අතුල්පතුල්) ඔවි ඇත්තිය. නිවාතස්ථානයෙක පිපීගිය මල් ඇති කිණිහිරිරුකක් වැන්න. දිව්‍ය-භවනයෙහි හැසිරෙන දෙවඟනක් වැන්න. සන වලාපටලයකින් නික්මුණු විදුලියක් වැන්න.

5521. සුන්දර සිනා ඇති ඕ දෙළ ඇත්තී, විධුර පණ්ඩිත-යන්ගේ හදවත පතන්නීය. ඉසුරාණෙනි, එය මම ඔවුනට දෙමි. එම හේතුවෙන් ඔවුහු ඉරන්දතිය මට පාවා දෙන්නාහ.

5522. ඒ පූර්ණක යක්ෂසෙනාධිපති තෙම, යකුන්ගේ අධිපති වූ පරිවාරසම්පත් ඇති කුවේර නම් වූ වෙසවුණු රජු අමතා අවසර ගෙන එහි මැ සිටියේ සරසන ලද ආජානීය අසකු මෙතැනට ම ගෙනෙවයි සේවකයකු ඇණෑ වී.

5523. අසුගේ සවන් රනින් ද, කුර රතුකැටින් ද, පපුවැස්ම ජාමෙඛානද ස්වර්ණයෙන් ද කරන ලද්දේය.

5524. අලංකෘත වූයේ මනහර ලෙසින් සැරසූ කෙහෙ රවුළු ඇති පූර්ණක යක්ෂ දේවවාහවහ නම් අසු පිටැ නැඟැ අහසින් ගියේය.

5525. හෙතෙම ආහාරපාන බහුල, ශක්‍රයාගේ මසක්කසාර පුරය සදෘශ වූ සතුරන්ට ළංවිය නොහෙන අතිශය රම්‍ය වූ අහුරජුගේ රජගහපුරයට පැමිණියේය.

5526. මොනර කොස්ලිහිණි සමූහයා විසින් සොඹිත වූ, අන්‍ය පක්ෂීන් විසින් හඬනඟන ලද, පක්ෂි සමූහයා විසින් සෙවුනා ලද නොයෙක් සකුණන් විසින් කරනලද නාද ඇති සුන්දර අඬහන ඇති මල් විසුළ හිමවත් පව්ව බඳු,

5527. කිඳුරන් නිරතුරු හැසිරෙන වෙපුල්ල පර්වතයට ඒ පූර්ණක නැඟේය. උදර වූ මීඟුරුවන සොයන්නේ පර්වතකූට මධ්‍යඃයහි එය දුටුවේය.

5528. දිස්වා මණිං පභස්සරං ජාතිවන්තං
ධනාහරං[1] මණිරතනං උළාරං,
දද්දල්ලමානං යසසා යසස්සිනං
ඔභාසති විප්පුරිවන්තලිඛෙ.

5529. තමග්ගහී වෙළුරියං මහග්ඝං
මනොහරං නාම මහානුභාවං,
ආජඤ්ඤමාරුය්ග අනොමවණ්ණො
පක්කාමි වෙහාසයමන්තලිඛෙ.

5530. සො ආගමා නගරං ඉන්දපත්තං
ඔරුය්ග වාගඤ්ජි[2] සභං කුරූනං,
සමාගමෙ එකසතං සමග්ගෙ
අවෙහත්ථ යඛෙ අවිකම්පමානො.

5531. කො නීධ රඤ්ඤං වරමාභිජෙති
කමාභිජෙය්‍යාම වරංධනෙන,[3]
කමනුත්තරං රතනවරං ජිනාම
කො වාපි නො ජෙති වරංධනෙන.

5532. කුහිං නු රට්ඨෙ තව ජාතභූමි
න කොරව්‍යස්සෙව වචො තවෙදං,
අභිභොසි නො වණ්ණනිභාය සබ්බෙ
අක්ඛාහි මෙ නාමඤ්ච බන්ධවෙ ච.

5533. කච්චායනො මාණවකොස්මි රාජ
අනූනනාමො ඉති මව්හයන්ති,
අඞ්ගෙසු මෙ ඤාතයො බන්ධවා ච
අක්ඛෙන දෙවස්මි ඉධානුපත්තො.

5534. කිං මාණවස්ස රතනානි අත්ථි
යෙ තං ජිනන්තො හරෙ අක්ඛධුත්තො,
බහූනි රඤ්ඤෙ රතනානි අත්ථි
තෙ[4] ත්වං දළිඤ්ඤෙ කථමව්හයෙසි.[5]

5535. මනොහරො නාම මණී මමායං
ධනාහරො[6] මණිරතනං උළාරං,
ඉමඤ්ච ආජඤ්ඤං අමිත්තතාපනං
එතං මෙ ජෙත්වා හරෙ අක්ඛධුත්තො.

---

1. මනොහරං – මජසං.
2. ඔරුය්හුපාගව්ජි – මජසං, ස්‍යා.
3. වරඞ්නෙන – මජසං.
4. යො – මජසං.
5. මව්හයසි – මජසං.
6. මනොහරා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5528. පැහැ විහිදෙන්නා වූ මහඟු වූ රිසි සම්පත් දෙන්නාවූ (පරිවාර) මාණික්‍යයන් නිසා අධික දීප්තියෙන් යුක්ත වූ යසස් ඇත්තාවූ අහසේ බැබළෙන විදුලියක් වන් (ඒ) මිණිරුවන දැක,

5529. මහත් අනුභාව ඇති (සිතූ පැතූ සම්පත් දෙන බැවින්) මනෝහර නම් වූ මහාර්ඝ ඒ වෛදූර්ය මාණික්‍යය (හේ) ගත්තේය. අලාමක පැහැති පූර්ණක යක්ෂ තෙමේ (එය ගෙන) ආජානීය අසු අරා අහසින් ගියේය.

5530. ඒ යක්ෂතෙම ඉඳිපත් නුවරට පැමිණියේය. අසු පිටින් බැසැ කුරුරජුන්ගේ සභාවට පැමිණියේය. (ඒ) සභාවෙහි රැස්ව සිටි එක්සියක් රජුන් (දූකෙළියට) නො බියව කැඳවී.

5531. මෙහි සිටින රජුන්ගෙන් කවරෙක් උතුම් මිණිරුවන දිනා ද? අපි කවරක්හු උතුම් ධනයෙන් දිනමෝ ද? කවර නම් උතුම් රුවනක් දිනමෝ ද? කවරෙක් හෝ උතුම් ධනයෙන් අප දිනා ද?

5532. (ධනඤ්ජය රජ) තොපගේ ජාතභූමිය කවර රටෙක ද? තොපගේ මේ කථාව කුරුරට වැසියකුගේ මෙන් නො වේ. (තොපගේ) සිරුරු පැහැයෙන් අප හැම අභිභවනය කෙරෙහි. තොපගේ නම ද නැයන් ද මට කියව.

5533. (පූර්ණක) මහරජ, මම කාඤ්චායන නමැති මාණවක වෙමි. අනූන නමින් (සෙස්සෝ) මා අමතති. අඟුරටෙහි මාගේ නැයෝ ද බන්ධූහු ද වෙසෙති. දේවයෙනි දූකෙළි පිණිස මෙහි පැමිණියෙමි වෙමි.

5534. (රජ) අඤ්ඣර්තයෙක් තා දිනමින් යම් වස්තූන් ගෙන යා නම් කිම එබඳු රත්නයෝ මාණවකහට ඇද් ද? රජහට බොහෝ රත්න ඇත. තෙපි දිළිඳුව කෙසේ නම් ඒ රජුන් (දූකෙළියට) කැඳවහු ද?

5535. (පූර්ණක) මේ මාගේ 'මනොහර' නම් මාණික්‍යය ධන සම්පත් ගෙනෙන උතුම් මිණිරුවනෙකි. මේ ආජානීයයා ද සතුරන් තවන අස්රුවනෙකි. අඤ්ඣර්තයෙක් මා දිනා තෙල රුවන් ගෙන යන්නේ යැ.

5536. එකො මණී මාණව කිං කරිස්සති
ආජානීයෙකො පන කිං කරිස්සති,
බහූනි රඤ්ඤෙ මණිරතනානි අත්ථි
ආජානියා වාතජවා අනප්පකා.

දෙහළකණ්ඩො.

5537. ඉදඤ්ච මෙ මණිරතනං පස්ස ත්වං දිපදුත්තම,
ඉත්ථීනං විග්ගහා වෙත්ථ පුරිසානඤ්ච විග්ගහා.

5538. මිගානං විග්ගහා වෙත්ථ සකුණානඤ්ච විග්ගහා,
නාගරාජෙ සුපණ්ණෙ ච[1] මණිම්හි පස්ස නිම්මිතං.

5539. හත්ථානීකං රථානීකං අස්සෙ පත්ති ධජානි ච,[2]
චතුරඞ්ගිනිං ඉමං සෙනං මණිම්හි පස්ස නිම්මිතං.

5540. හත්ථාරුහෙ අනීකට්ඨෙ රථීකෙ පත්තිකාරිකෙ,
බලග්ගානි වියූළ්හානි මණිම්හි පස්ස නිම්මිතං.

5541. පුරං උඤ්ඤපසම්පන්නං[3] බහුපාකාරතොරණං,
සිඞ්ඝාටකෙසු භූමියො මණිම්හි පස්ස නිම්මිතං.

5542. එසිකා පරිඛායො ච පලිඝං අග්ගලානි ච,
අට්ටාලකෙ ච ද්වාරෙ ච මණිම්හි පස්ස නිම්මිතං.

5543. පස්ස තොරණමග්ගෙසු නානාදිජගණා බහූ,
හංසා කොඤ්චා මයූරා ච වක්කවාකා ච කුක්කුහා.

5544. කුණාලකා බහූ චිත්‍රා සිඛණ්ඩී ජීවඤ්ජීවකා,[4]
නානාදිජගණාකිණ්ණං මණිම්හි පස්ස නිම්මිතං.

5545. පස්ස නගරං සුපාකාරං අඛ්‍ඝුතං ලොමහංසනං,
සමුස්සිතධජං රම්මං සුවණ්ණවාලුකසන්ථතං.

5546. පස්ස[5] ත්වං පණ්ණසාලායො විහත්තා භාගසොමිතා,
නිවෙසනෙ නිවෙසෙ ච සන්ධිබ්‍යුහෙ පථද්ධියො.[6]

5547. පානාගාරෙ ච සොණ්ඩෙ ච සූණා[7] ඔදනියාසරා,
වෙසී ච ගණිකායො ච මණිම්හි පස්ස නිම්මිතං.

---

1. සුපණ්ණාව – මජ්ඣං.
2. වම්මිනෙ – මජ්ඣං, ස්‍යා.
3. උඞ්ඝාප – මජ්ඣං; අට්ටාල – ස්‍යා.
4. ජීවජීවකා – මජ්ඣං, ස්‍යා.
5. පසෙසත්ථ – මජ්ඣං, ස්‍යා.
6. පථත්ථියො – ස්‍යා; පථට්ඨියො – මජ්ඣං.,
7. සදඃ – ස්‍යා; පුවා – මජ්ඣං,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5536. (රජ) තරුණය, මේ එක මැණික කුමක් කරන්නේ ද? මේ එක ආජානීය අශ්වයා කුමක් කරන්නේ ද? රජහට බොහෝ මිණිරුවන් ඇත. වාතවේග ඇති ආජානීය අශ්වයෝ අනල්ප යැ.

දොහළ කාණ්ඩ යි.

5537. (පූර්ණක) නරදේවයනි තෙපි මාගේ මේ මිණි රුවන බලව. මෙහි ස්ත්‍රීන්ගේ රූප ද පුරුෂයන්ගේ රූප ද ඇත.

5538. මුවන්ගේ රූප ද පක්ෂීන්ගේ රූප ද පැනෙයි. නාග-යන් ද ගුරුළන් ද මැණිකෙහි නිමැවුණු (පැණෙන) අසිරි බලව.

5539. මිණිරුවනෙහි නිමැවුණු හස්ති සේනා, රථ සේනා, අශ්ව සේනා, ධජ වලින් යුත් (සැදුම් ලත්) පාබළ සේනා යන චතුරඞ්ගිනී සේනා බලව.

5540. ඇතරුවන්. අසරුවන්, රියැදුරන්, පාබළ සෙබළුන් යන සේනා සමූහය මැණිකෙහි නිමැවුණු අසිරි බලව.

5541. උස්වූ පදනම් ඇති බොහෝ පවුරු හා තොරණ ඇති පුරය ද සිවුමංසල හා ළඟන්නා භූමිභාග ද මිණිරුවනෙහි නිමැවුණු අසිරි බලව.

5542. ඉන්ද්‍රකීලය ද දිය අගල ද නුවර දෙර කවුළු ද අටලු ද දෙරකොටු ද මිණිරුවනෙහි නිමැවුණු අසිරි බලව.

5543—44. තොරණ'ගෙහි (තොරණ මුදුනැ) හංසයන් කොස් ළිහිණින් මොනරුන් සක්වාළිහිණින් ඇටිකුකුළන් කළුකොවුලන් විසිතුරු පියාපත් ඇති කොවුලන් හා ජීවංජීවක පක්ෂීන් යන බොහෝ පක්ෂීන්ගේ (රූ සටහන්) ඇත. නොයෙක් වර්ගයනට අයත් පක්ෂීන් ගැවසී ගත් අයුරු මිණිරුවනෙහි නිමැවුණු අසිරි බලව.

5545. මැනැවින් ගොඩ නැඟූ පවුරු ඇති අසිරිමත් වූ ලොමුදහගන්නා වූ නඟන ලද ධජ ඇති මනස්කාන්ත වූ රන්වැලි අතුළ නගරය බලව.

5546. (ඒ නගරයෙහි) කොටස් විසින් බෙදූ ආපන ශාලා ද නිවාස ද ගෙබිම් ද ගෘහසන්ධි ද කුඹමහත් වීථි ද බලව.

5547. සුරාසැල් ද සුරාසොඬුන් ද අඬහනි ද මුළුතැන් ගෙවල් ද වෙසඟනන් ද ගණිකාවන් ද යන මොවුන් මිණිරුවනෙහි නිමැවුණු අසිරි බලව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5548. මාලාකාරෙ ච රජකෙ ගන්ධිකෙ අථ දුස්සිකෙ,
සුවණ්ණකාරෙ මණිකාරෙ මණිම්හි පස්ස නිම්මිතං.

5549. ආළාරියෙ ච[1] සූදෙ ච නටනට්ටකගායකෙ,[2]
පාණිස්සරෙ කුම්භට්ඨිකෙ මණිම්හි පස්ස නිම්මිතං.

5550. පස්ස හෙරි මුතිඞ්ගා ච සඞ්ඛා පණවදෙණ්ඩිමා,[3]
සඛඛඤ්ච තාලාවචරං මණිම්හි පස්ස නිම්මිතං.

5551. සම්මතාලඤ්ච වීණඤ්ච නාවචගීතං සුවාදිතං,
තූරියතාළිතසංයුත්තං මණිම්හි පස්ස නිම්මිතං.

5552. ලඛිකා මුට්ඨිකා වෙස්සා මායාකාරා ච සොභියා,
වෙතාලිකෙ ච ජල්ලෙ ච මණිම්හි පස්ස නිම්මිතං.

5553. සමජ්ජා වෙස්සා වත්තන්ති ආකිණ්ණා නරනාරිහි,
මඤ්ඤාතිමඤ්ඤ භූමියො මණිම්හි පස්ස නිම්මිතං.

5554. පස්ස මල්ලෙ සමජ්ජසමිං පොථෙන්තා දිගුණං භුජං,
හීහතෙ හීහතමානෙ ච මණිම්හි පස්ස නිම්මිතං.

5555. පස්ස පබ්බතපාදෙසු නානාමිගගණා බහූ,
සීහව්‍යග්ඝචරාහා ච අවිදූරෙ කොකතරච්ඡයො.[4]

5556. පලසතා ච ගවජා ච මහිසා රොහිතා රුරූ,
එණෙය්‍යා ච වරාහා ච ගණිනො නිඩ්ඩාසූකරා.

5557. කදලිමිගා බහූ චිත්‍රා චීළාරා සසකණ්ණකා,
නානාමිගගණාකිණ්ණං මණිම්හි පස්ස නිම්මිතං.

5558. නජ්ජායො සුපතිට්ඨායො සොණ්ණවාලුකසන්ථතා,
අවිදූරා සවන්ති අම්බූනි මච්ඡගුම්බනිසෙවිතා.

5559. කුම්හීලා මකරා වෙස්සා සුංසුමාරා ච කච්ඡපා,
පාඨීනා පාවුසා මච්ඡා වලජා මුඤ්ජරොහිතා.

---

1. ආළාරිකෙ – මජ්ඣං, ස්‍යා.
2. ගායිනො – මජ්ඣං; ගායිනෙ – ස්‍යා.
3. දින්දිමා – මජ්ඣං.
4. නරච්ඡකෙ – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5548. මල්කරුවන් රජකයන් විලවුන් වෙළෙන්දන් රෙදි වෙළෙඳුන් රන්කරුවන් මැණික්කරුවන් යන මොවුන් මිණි රුවනෙහි නිමැවුණු අසිරි බලව.

5549. බත් පිසන්නවුන් ද මාළු පිසන්නවුන් ද නළුවන් හා ගායකයන් ද අත්තල ගසන්නන් හා කළබෙර වයන්නන් ද මිණිරුවනෙහි නිමැවුණු අසිරි බලව.

5550. මහබෙර මිහිඟුබෙර සක් ගැටබෙර පනාබෙර ද සියලු තූර්ය විශෙෂ ද මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5551. කුළුනාළම් ද, වීණා ද, නැටුම් ගැයුම් හා තූර්‍ය වාදන ද, තූර්‍යවාදන ප්‍රතිරාව ද මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5552. කරනම් ගසන්නෝ යැ, මුටසිමල්ලවයෝ යැ, ඉන්ද්‍රජාලිකයෝ ය, නගරය ශොබවන ස්ත්‍රී පුරුෂයෝ යැ යන මොවුන් ද සොහොන් ගොඩවන් හා කරනැවැමියන් මැණිකෙහි නිර්මිත ඇසිරිය බලව.

5553. ස්ත්‍රී පුරුෂයන්ගෙන් ගැවසුණා වූ මැසි පිට මැසි බඳින ලද කෙළිබිම් ද වෙයි. එහැම මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5554. මුෂ්ටිමල්ලයන්ගේ රහමඬලෙහි අධිකව අත්පොළසන් දෙන්නන් ද, ජයග්‍රාහකයන් ද, පරාජිතයන් ද මැණිකෙහි නිර්මිත අයුරු බැලුව මැනැවි.

5555. බලව, පර්වත පාමුලැ සිංහයෝ ද ව්‍යාඝ්‍රයෝ ද ඌරෝ ද වලස්සු ද වෘකයෝ ද කළුහිසැති වලස්සු ද බොහෝ වෙසෙති.

5556. කගවේණෝ ගවරු මීමෝ රෝහිත මුවෝ රුරුමුවෝ ඒනිමුවෝ ඌරෝ ගෝන්නු යන මෘගයෝ ද,

5557. කෙසෙල් මුවෝ ද, (තවත්) ඉතා විසිතුරු මෘගයෝ (ජාතිහු) ද වලබළල්ලු ද සාවෝ ද මීමින්නෝ ද මෙහි වෙති. නොයෙක් මෘගසමූහයාගෙන් ගැවසුණුයේ මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5558. මැනැවින් (සකස්කළ) තොටුපළ ඇති රන්වන් වැලි අතුළ මත්ස්‍ය සමූහයාගෙන් ගැවසීගත් පිවිතුරු ජලය ඇති ගංගාවෝ ගලා බසිත්.

5559. (ගඟෙහි) කිඹුල්ලු යැ මෝරු යැ ශිශුමාර යැ කැස්බෝයැ පෙටියෝ ය ලූල්ලු යැ වලයෝ යැ මොද මස්සු යැ රේමස්සු ය යන මේ සත්ත්වයෝ ද ඇත.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5560. නානාදූමගණාකිණ්ණා නානාදිජගණායුතා,
වෙළුරියඵලකරොදයො[1] මණිම්හි පස්ස නිම්මිතං.

5561. පස්සෙත්ථ පොක්ඛරණියො සුවිභත්තා චතුද්දිසා,
නානාදිජගණාකිණ්ණා පුථුලොමනිසෙවිතා.[2]

5562. සමන්තොදකසම්පන්නං මහිං සාගරකුණ්ඩලං,
උපෙතං වනරාජෙහි[3] මණිම්හි පස්ස නිම්මිතං.

5563. පුරතො විදෙහෙ පස්ස ගොයානියෙ ච පච්ඡතො,
කුරුයො ජම්බුදීපඤ්ච මණිම්හි පස්ස නිම්මිතං.

5564. පස්ස චන්දඤ්ච සුරියඤ්ච ඔභාසෙන්තෙ[4] චතුද්දිසා,
සිනෙරුං අනුපරියන්තෙ මණිම්හි පස්ස නිම්මිතං.

5565. සිනෙරුං හිමවන්තඤ්ච සාගරඤ්ච මහිද්ධිකං,[5]
චත්තාරො ච මහාරාජෙ මණිම්හි පස්ස නිම්මිතං.

5566. ආරාමෙ වනගුම්බෙ ච පාටියෙ ච[6] සිලුච්චයෙ,
රම්මෙ කිම්පුරිසාකිණ්ණෙ මණිම්හි පස්ස නිම්මිතං.

5567. ඵාරුසකං චිත්තලතං මිස්සකං නන්දනං වනං,
වෙජයන්තඤ්ච පාසාදං මණිම්හි පස්ස නිම්මිතං.

5568. සුධම්මං තාවතිංසඤ්ච පාරිච්ඡත්තඤ්ච පුප්ඵිතං,
ඵරාවණං නාගරාජං මණිම්හි පස්ස නිම්මිතං.

5569. පස්සෙත්ථ දෙවකඤ්ඤයො නභා විජ්ජුරිවුග්ගතා,
නන්දනෙ විචරන්තියො මණිම්හි පස්ස නිම්මිතං.

5570. පස්සෙත්ථ දෙවකඤ්ඤයො දෙවපුත්තපලොභිනී,
දෙවපුත්තෙ චරමානෙ මණිම්හි පස්ස නිම්මිතං.

5571. පරොසහස්සපාසාදෙ වෙළුරියඵලකත්ථතෙ,
පජ්ජලන්තෙන වණ්ණෙන මණිම්හි පස්ස නිම්මිතං.

---

1. වෙළුරියකරොදයො – මජ්ජසං.
2. පුථුලොමච්ඡසෙවිතා – මජ්ජසං.
3. රාජිහි – මජ්ජසං.
4. ඔභාසන්තෙ – මජ්ජසං.
5. මහිතලං – මජ්ජසං.
6. පිට්ඨියෙව – මජ්ජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5560. නානා වෘක්ෂ රාශියෙන් යුක්ත, නානාවිධ පක්ෂිගණයා ඇති, වෛඩූර්‍යය පාෂාණයන්හි හැපී භඩ නගන ගංගාවෝ (මෙහි) ඇතියහ. එ හැම මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5561. මෙහි (මාණික්‍යයෙහි) මනා ලෙස බෙදුණු සිව් දිගුන් ඇති, නොයෙක් පක්ෂි සමූහයා ගැවසීගත්, නොයෙක් මත්ස්‍ය වර්ගයා ද වෙසෙන තඩාගයෝ ද වෙත්. එය බලව.

5562. හාත්පස්හි ජලයෙන් වට වූ සාගරය කුණ්ඩලාහරණ කොට ඇති වනරොදින් යුතු මිහිතලය මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5563. පෙරදිග පූර්වවිදෙහය ද පැසුළුදිග අපරගෝයානය ද, (උතුරු දිගෙහි) උතුරුකුරු දිවයින ද, (දකුණෙහි) දඹදිව ද මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5564. සතර දිසා ආලෝක කරන මහමෙර සියාරා යන සඳ ද හිරු ද මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5565. මහමෙර ද, හිමාලය ද, සයුර ද මහත් අනුභාව ඇති සතරවරම් දෙවිරජවරුන් ද මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5566. ආරාම ද වනලැහැබි ද ගල්තලා ද කිඳුරන් ගැවසුන සිත් ගන්නා පර්වත ද මිණිරුවන්හි නිමැවුණු අසිරි බලව.

5567. එාරුසක චිත්‍රලතා මිස්සක නන්දන යන වනයන් (ඌයන්) ද, විජයොත්පහය ද මාණික්‍යයෙහි නිර්මිතව ඇති අයුරු බලව.

5568. සුධර්මා නමැති දෙව් සබය ද තව්තිසා දෙව්ලොව ද (මල්) පිපුණු පරසතු රුක ද එරාවණ ඇතු ද මාණික්‍යයෙහි නිර්මිතව ඇති අයුරු බලව.

5569. අහසින් මතු වූ විදුලිය වැනි දෙවඟනන් බලව. නන්දන වනයෙහි හැසිරෙන දෙවඟනන් මාණික්‍යයෙහි නිර්මිතව පෙණෙන අයුරු බලව.

5570. දිව්‍යපුත්‍රයන් පොළඹවන දිව්‍යාංගනාවන් බලව. හැසිරෙන දෙව්පුතුන් මැණිකෙහි නිර්මිතව පෙණෙන අයුරු බලව.

5571. වෙරළුමිණි මුවා පුවරු අතුළ දීප්තිමත් පැහැයෙන් යුක්ත වූ දහසකට අධික දිව්‍යප්‍රාසාද මාණික්‍යයෙහි නිර්මිත අයුරු බලව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5572. තාවතිංසෙ ච යාමෙ ච තුසිතෙ චාපි නිමමිතෙ,
පරනිමමිතාභිරතිනො[1] මණිම්හි පස්ස නිමමිතං.

5573. පස්සෙත්ථ පොක්ඛරණියො විප්පසන්නොදිකා[2] සුචි,
මන්දලකෙහි සංඡන්නා පදුමුප්පලකෙහි ච.

5574. දසෙත්ථ රාජියො සෙතා දස[3] නීලා මනොරමා,
ඡ පිඞ්ගලා පණ්ණරසා හළිඤ්ඤ ච චතුද්දසා.

5575. වීසතිං තත්ථ සොවණ්ණා වීසතිං රජතාමයා,
ඉන්දගොපකවණ්ණාභා තාව දිස්සන්ති තිංසති.

5576. දසෙත්ථ කාළියො ඡ ච මඤ්ජට්ඨා[4] පණ්ණවීසති,
මිස්සා බන්ධුකපුප්ඵෙහි නීලුප්පලවිචිත්තිතා.[5]

5577. එවං සබ්බඞ්ගසම්පන්නං අච්චිමන්තං පභස්සරං,
ඔධිසුඞ්ගං මහාරාජ පස්ස ත්වං දිපදුත්තම.

මණිකණ්ඩො.

5578. උපාගතං රාජ උපෙහි ලක්ඛං
නෙතාදිසං මණිරතනං තවත්ථි,
ධම්මෙන ජිය්‍යාම අසාහසෙන
ජිතො ච නො ඛිප්පමවාකරොහි.

5579. පඤ්චාල පච්චුග්ගත සූරසෙන
මච්ඡා ච මඤ්ඤ[6] සහකෙකකෙහි,
පස්සන්තු නො තෙ අසයෙන[7] යුද්ධං
න නො සහායං න කරොති කිඤ්චි.

5580. තෙ පාවිසුං අක්ඛමදෙන මත්තා
රාජා කුරූනං පුණ්ණකො චාපි යක්ඛො,
රාජා කලිං විචිනං අග්ගහෙසි
කටමග්ගහී පුණ්ණකො නාම යක්ඛො.

---

1. පරනිමමිතවත්තිනො – මජසං., ස්‍යා.
2. විප්පසන්නොදකා – මජසං, ස්‍යා.
3. දස්සනීයා – මජසං, ස්‍යා.
4. මඤ්ජට්ඨ – මජසං.
5. විචිත්තතං – මජසං.
6. මජ්ඣා – මජසං.
7. අස්සත්ථෙන – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5572. තව්තිසා යාම තුසිත නිර්මාණරති පරනිර්මිත වසවර්ති යන දෙව්ලෝහි දෙවියන් මාණික්‍යයෙහි මැවී ඇති අයුරු බැලුව මැනැවැ.

5573. අතිශයින් පවිත්‍ර ප්‍රසන්න ජලය ඇති හෙල්මැල්ලෙන් හා පියුම් උපුලින් ගැවැසි පොකුණු බැලුව මැනැවී.

5574. මාණික්‍යයෙහි සුදුහිරි දසයක් ද සිත්ගන්නා නිල්හිරි දසයක් ද, පිඟුවන්හිරි සයක් හා පසළොසක් ද, කසාවන්හිරි තුදුසක් ද වෙයි.

5575. රන්පැහැ හිරි විස්සක් ද රිදීපැහැ හිරි විස්සක් ද රත් ඉදුගොව්වන් පැහැ බදු හිරි තිසක් ද මාණික්‍යයෙහි ඇත.

5576. මාණික්‍යයෙහි කළු හිරි දසයක් හා සයක් ද මදටිය පැහැ හිරි විසිපහක් ද වේ. කළුපැහැ හා මදටියපැහැහිරි බඳුවදමලින් හා නිලුපුලින් මුසු වැඟියෙන් විචිත්‍රිත ය.

5577. දෙපා ඇතියනට උතුම් රජතුමනි, මේ හැම අංගයන්-ගෙන් හෙබි රැස් ඇති පැහැ විඹදෙන පරදුව බලව. (දූකෙළියෙහි යමෙක් දිනා ද ඔහුට අයත් වන්නේ ය.)

මණිකාණ්ඩ යි.

5578. පූර්ණක ක්‍රීඩා ශාලාව සාදු අවසන් ය. දුදුකෙළින තැනට එන්නේ මැනැවැ. මෙවැනි මාණික්‍යයක් ඔබට නැත. ක්‍රීඩාවෙහි යෙදෙන අපි සැහැසි ලෙස නොව දැහැමි ලෙස දිනන්නමු. දිනුවහුට කල් නොයවා ධනය දෙනු යෙහේ.

5579. සුප්‍රකට පඤ්චාල රජ ද, සූරසේන රජ ද, මච්ඡ රජ ද, කේකක දනව්වේ රජු සමඟ මදුරට රජ ද යන තුලුහු අපේ මේ සටන අසා වැ බලත්වා! සභායෙහි කිසි සාඤ්ඤායක් නො කරන්නේ නො වේ. (හැමදෙනා දකිති යි සේ යි.)

5580. කුරුරට වැසියන්ගේ රජතුමා ද පූර්ණක යක්ෂයා ද දුදු ක්‍රීඩායෙන් මත් වැ ක්‍රීඩාශාලාවට පිවිසියහ. රජ තෙම සූවිසි අයස්ථාන සොයමින් පරාජය (වන පිළ) තෝරා ගත්තේ ය. යක්ෂ තෙම දිනුම් පිළ තෝරා ගත්තේ ය.

5581. තෙ තත්ථ ජූතෙ උභයො සමාගතෙ
රඤ්ඤං සකාසෙ සබ්නඤ්ච මජ්ඣෙ,
අජෙසි යක්ඛො නරවිරියසෙට්ඨං
තත්ථප්පනාදෙ තුමුලො බභූව.

5582. ජයො මහාරාජ පරාජයො ච
ආයූහතං අඤ්ඤතරස්ස හොති,
ජනින්ද ජිනොසි වරං ධනෙන
ජිතො ච මෙ බ්‍රිප්පමවාකරොහි.

5583. හත්ථී ගවාස්සා මණිකුණ්ඩලා ච
යං චාපි මය්හං රතනං පථව්‍යා,
ගණ්හාහි කච්චාන වරං ධනානං
ආදය යෙනිච්ඡසි තෙන ගච්ඡ.

5584. හත්ථී ගවාස්සා මණිකුණ්ඩලා ච
යඤ්චාපි තුය්හං රතනං පථව්‍යා,
තෙසං වරො විධුරො නාම කත්තා
සො මෙ ජිතො තං මෙ අවාකරොහි.

5585. අත්තා ච මෙ සො සරණං ගතී ච
දීපො ච ලෙණො ච පරායනො ච,
අසන්තුලෙය්‍යො මම සො ධනෙන
පාණෙන මෙ සදිසො එස කත්තා.

5586. චිරං විවාදෙ මම තුය්හමස්ස[1]
කාමඤ්ච පුච්ඡාම තමෙව ගන්ත්වා,
එසොව නො විචරතු එතමත්ථං
යං වක්ඛතී හොතු කථා[2] උභින්නං.

5587. අද්ධා හි සච්චං භණසි න ච මාණව සාහසං,
තමෙව ගන්ත්වා පුච්ඡාම තෙන තුස්සාමුභො ජනා.

5588. සච්චන්නු දෙවා විදහූ කුරූනං
ධම්මෙ ඨිතං විධුරං නාමමච්චං,
දසොසි රඤ්ඤෙ උදවාසි ඤාතී
විධුරොති සඞ්ඛා කතමාසි ලොකෙ.

5589. ආමාය දසාපි භවන්ති හෙකෙ
ධනෙන කීතාපි භවන්ති දසා,
සයම්පි හෙකෙ උපයන්ති දසා
භයා පණුන්නාපි භවන්ති දසා
එතෙ නරානං චතුරොව දසා.

---

1. තුය්හඤ්චස්ස – මජ්ඣං, ස්‍යා.
2. තථා – මජ්ඣං, වි., ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5581. ඔව්හු දෙදෙන ක්‍රීඩා ශාලාවෙහි දූකෙළි කෙළියහ. රජුන් සමීපයෙහිත් මිතුරන් මැද්දෙහිත් නරවීර වූ ශ්‍රේෂ්ඨ වූ රජු පරදවා යඤ්ඤයා දිනුවේ ය. එහි සූදුවෙහි මම දිනිමි යි ඉමහත් සෝෂයක් විය. (නාදය පැතුරුණේ ය)

5582. (පූර්ණක) රජතුමනි, ජය හෝ පරාජය හෝ ව්‍යායාම කරනුවන් අතුරෙන් එක්තරයකුට වෙයි. නිරිඳුනි, උත්තම ධනයෙන් පිරිහී ගියහු. මා විසින් තෙපි දිනන ලදුව. වහා මට දිනුම දෙව.

5583. (රජ) ඇත්තු ද ගවයෝ ද අශ්වයෝ ද මිණිකොඩොල් ද, පොළොවෙහි මා සතු යම් රත්නසමූහයක් වේ ද කාත්‍යායනය, ඒ ධනය අතුරෙන් උතුම් ධනයක් ගනුව. ගෙන රිසි දිසාවෙකින් යව.

5584. (පූර්ණක) ඇත්තු ද ගවයෝ ද අශ්වයෝ ද මිණිකොඩොල් ද, මේ පොළොවෙහි තොප සතු රුවන් රැසක් වේ ද, ඒ ධනයෙන් විධුර නමැති ඇමති තෙම ඉතා උතුම්. හේ මා විසින් දිනන ලද. ඔහු මට පරදු කොට දෙව.

5585. (රජ) හේ මාගේ පණ ද පිහිට ද ගතිය ද ප්‍රතිෂ්ඨාස්ථානය ද ආරක්ෂාස්ථානය ද ඉතා උත්තම ප්‍රතිෂ්ඨාස්ථානය ද වෙයි. හේ මාගේ ධනයට සම කළ නොහැක්ක. තෙල, විධුර ඇමති මාගේ පණ හා සම වෙයි.

5586. (පූර්ණක) මාගේ ද තොපගේ ද විවාදය බොහෝ කල් පවත්නේ ය. එහෙයින් ඔබ වෙත ගොස් විචාරමු. තෙල තැනත්තේ ම මේ කරුණු අපට ප්‍රකාශ කෙරේවා! හේ යමක් කියා ද එය අප දෙදෙනාට ප්‍රමාණ වේවා!

5587. (රජ) මාණවකය, එකාන්තයෙන් නොප කියන්නේ සත්‍යයෙක. සැහැසි නොවෙයි. ඔහු වෙත ගොස් අසමු. ඔහුගේ ප්‍රකාශයෙන් අපි දෙදෙනා තුටු වෙමු.

හට්ඨෙන භාවෙන පතීතරූපො
ඉච්චබ්‍රවී කුරුනං කත්ත[1]සෙට්ඨං.

5778. භරියාය මං ත්වං අකරී සමඞ්ගිං[2]
අහඤ්ච තෙ විධුර කරොමි කිච්චං,
ඉමඤ්ච තෙ මණිරතනං දදමි
අජ්ජෙව තං කුරුයො පාපයාමි.

5779. අජෙය්‍යමෙසා තව හොතු මෙත්ති
භරියාය කච්චාන පියාය සද්ධිං.
ආනන්දි විත්තො සුමනො පතීතො.
දත්වා මණිං මඤ්ච නයින්දපත්තං.

5780. ස පුණ්ණකො කුරූනං කත්තසෙට්ඨං
නිසීදයී පුරතො ආසනස්මිං,
ආදය[3] කත්තාරං අනොමපඤ්ඤං[4]
උපානයී[5] නගරං ඉන්දපත්තං.

5781. මනො මනුස්සස්ස යථාපි ගච්ඡ
තතොපි සඞ්ඛිප්පතරං අහොසි,
ස පුණ්ණකො කුරුනං කත්තසෙට්ඨං
උපානයී නගරං ඉන්දපත්තං.

---

1. කතතු - මජසං.
2. සමඞ්ගි - මජසං.
3. ආජ්ඤ්ඤමාරුයහ - මජසං.
4. වණ්ණං - මජසං.
5. පක්කමීවෙහාස - මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5774. පණ්ඩිත තෙම, නාරජු හා නාමෙණෙවිය යන දෙදෙන ම සතුටු සිතැති බව දැන බිය රහිත වූයේ ලොමුදහගැනීම නැති ව වරුණ නාරජුට මෙලෙස කීය:

5775. නාරජතුමනි, මිත්‍රද්‍රෝහි ක්‍රියාවක් කරම් යි නහමක් පැකිළෙව. ඒ මම වෙමි. හඳවතින් හෝ මසින් හෝ යමකින් තොපට ප්‍රයෝජන ඇද්ද මේ සිරුර ඒ කිස කෙරෙයි. තොපගේ සිතැඟි පරිදි මම ක්‍රියා කරන්නෙමි.

5776. පණ්ඩිතයන්ගේ ප්‍රඥාව මැ හඳවත යි. ඒ අපි තොපගේ ප්‍රඥාවෙන් තුටුපහටු වූමහ. දැන් පූර්ණක ද බිරිය ලබයි. හෙතෙම, අද ම තොප කුරුරට වාසින් වෙතට පමුණුවාවා!

5777. පූර්ණක යක්ෂ තෙමේ ඉරන්දතිය ලදින් ඔද වැඩුණු සිතැත්තේ කුරුරටවාසින්ගේ ශ්‍රේෂ්ඨ ඇමැතිහට මෙසේ කීය:

5778. පඬිතුමනි, තෙපි මා හා බිරිඳ සමඟි කළහු ය. මමත් තොපට කළමනා දෑයක් කරමි. පඬිතුමනි, තොපට මේ මාණිකාය රත්නය දෙමි. අද ම තොප ඉඳිපත් නුවරට පමුණුවමි.

5779. කාත්‍යායන ය, තොපගේ ප්‍රිය භාර්‍යාව හා සමඟ තෙල ප්‍රියසංවාස සංවේතන මෛත්‍රීය අනෙකකු විසින් නොදිනිය හැකි වේවා තොප සතුට ම ධනය කොට ඇත්තෙක් වැ සොමනස් සිතැත්තේ ප්‍රීතිමත් වැ වෙසේවා! මිණිරුවන දී මා ඉඳිපත් නුවරට පමුණුවව.

5780. පූර්ණක යක්ෂයා කුරුරට වාසින්ගේ ඇමැති විධුරපඬි ඉදිරි අසුනෙහි හිඳුවා, ගත්තේය. අලාමක ප්‍රඥා ඇති විධුර පඬිතුමා රැගෙන ඉඳිපත් නගරයට පැමිණියේ.

5781. මිනිසාගේ සිත යම්සේ වහා ගමන් කරන්නේ ද එයට වඩා වෙගයෙන් මනොමය සෙඤ්ඣවයාගේ ගමන සිදුවිය. පූර්ණක-තෙමේ කුරුරට වැස්සන්ගේ ඇමැති ඉඳිපත් නුවරට පැමිණියේ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5782. එතින්දපත්තං නගරං පදිස්සති
රම්මානි ච අම්බවනානි භාගසො,
අහඤ්ච භරියාය සමඞ්ගිභූතො
තුවඤ්ච පත්තොසි සකං නිකෙතං.

5783. ස පුණ්ණකො කුරූනං කත්තසෙට්ඨං[1]
ඔරොපිය ධම්මසභාය මජ්ඣෙ,
ආජඤ්ඤමාරුය්හ අනොමවණ්ණො
පක්කාමි[2] වෙහාසයමන්තලික්ඛෙ*.

5784. තං දිස්වා රාජා පරමප්පතීතො
උට්ඨාය බාහාහි පලිස්සජිත්වා,
අවීකම්පයං ධම්මසභාය මජ්ඣෙ
නිසීදයි පමුඛං ආසනස්මිං.

5785. ත්වං නො විනෙතාසි[3] රථංව නද්ධං[4]
නන්දන්ති තං කුරුයො දස්සනෙන,
අක්ඛාහි මෙ පුච්ඡිතො එතමත්ථං
කථං පමොක්ඛො අහු මාණවස්ස.

5786. යං මාණවොත්‍යාභිවදී ජනින්ද
න සො මනුස්සො නරවීරියසෙට්ඨ[5]
යදි තෙ සුතො පුණ්ණකො නාම යක්ඛො
රඤ්ඤෝ කුවෙරස්ස හි සො සජීවො.

5787. භූමිත්ධරො වරුණො නාම නාගො
බ්‍රහා සුචි වණ්ණබලූපපන්නො,
තස්සානුජං ධීතරං කාමයානො
ඉරන්දතී නාම සා නාගකඤ්ඤා.

5788. තස්සා සුමජ්ඣාය පියාය හෙතු
පතාරයිත්ථ මරණාය මය්හං,
සො වෙව භරියාය සමඞ්ගිභූතො
අහඤ්චනුඤ්ඤාතො මණී ච ලද්ධො.

5789. රුක්ඛො හි මය්හං පද්වාරෙ[6] සුජාතො
පඤ්ඤාක්ඛන්ධො සීලමයස්ස සාඛා,[7]
අත්ථෙ ච ධම්මෙ ච ධීතො නිපාකො
ගවප්ඵලො[8] හත්ථිගවස්සජන්නො.

5790. නච්චගීතතුරියාභිනාදිතෙ
උච්ඡිජ්ජසෙනං පුරිසො අහාසි,
සො නො අයං ආගතො සන්තිකෙතං
රුක්ඛස්සිමස්සාපචිතිං කරොථ.

---

* ආජඤ්ඤ මාරුයහ අණොමවණ්ණංපක්කමි වෙහාස මන්තලික්ඛෙ – මජ්ඣං.

1. කත්තුසෙට්ඨං – මජ්ඣං.
2. පක්කමි – මජ්ඣං.
3. පුන නෙතාසි – මජ්ඣං.
4. රථංව රට්ඨං – මජ්ඣං, ස්‍යා.
5. නරවීරසෙට්ඨ – මජ්ඣං, ස්‍යා.
6. සරදවාරෙ – ස්‍යා, පන දවාරෙ – මජ්ඣං, වි.
7. සාඛො – මජ්ඣං.
8. ගවිප්ඵලො – ස්‍යා, ගවිප්පලො – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5782. පඬිතුමනි, තෙල ඉඳිපත් නගරය පෙනේ. සිත්කලු අඹ උයන්හි කොටස් ද පෙනේ. මම ද බිරිය හා එක් වීමි. තෙපිදු සිය නිවෙසට පැමිණියහු.

5783. පූර්ණක යක්ෂයා කුරුරට ඇමැතිවරයා ධර්මසභායෙහි බස්වා අලාමක පෙණුමැති හේ ආජානේය අසු පිට නැඟී අහසින් ගියේ ය.

5784. රජ තෙම පඬිතුමා දැකැ ඉතා ප්‍රමුදිත වැ (අස්නෙන්) නැගීසිට බුහුමන් පෙරදැරිව පිළිගෙන, අකම්පිත වූයේ ධර්මසභා මධ්‍යයෙහි සැරසූ ධර්මාසනයෙහි (තමා) අබිමුවෙහි (රජතුමාට මූණලා) හිඳුවී ය.

5785. රියැදුරු සැරහූ රිය (යුතු තැනට) පමුණුවන්නා සේ, තෙපි අප යහපත් කටයුත්තෙහි පමුණුවන්නහු, කුරුරට වාසීහු තොපගේ දැකුමෙන් ප්‍රීත වෙති. විතාරණ මේ කරුණ මට කියනු මැනැවි. ඒ මාණවකයාගෙන් තොපගේ මිදීම සිදුවූයේ කෙසේ ද?

5786. රජතුමනි. යමකුට මාණවකයා යයි කීවේ ද හේ මිනිසෙක් නොවේ. නරවිරුවාණෙනි, ඔබ පූර්ණක නමැති යකා (ගැන) අසා තිබේ ද හේ කුවේර රජුගේ ඇමැතියා යි.

5787. භූමිඤ්ඣර නාග භවනයෙහි වසන වරුණ නාගරාජයා විශාල ය, පවිත්‍ර ය, පැහැපත් ය, බලවත් ය. ඔහුගේ අනුජාත දුහිතෘ වූ ඉරන්දති නමැති නාගකන්‍යාව (ලබන්නට) පූර්ණක කැමැති විය.

5788. මනා මැද පෙදෙස ඇති ඒ ප්‍රියාව බලාපොරොත්තුවෙන් හේ මා මරන්නට වෑයම් කෙළේ ය. හේ බිරිඳ හා සමහන් විය. නාරදුගේ අනුමැතිය ලැබූ මම ද ආශයෙමි. මා මේ මැණික ලද්දේ ය. (රජ රටවැසියන්ට මෙසේ කියයි:)

5789. රජ මැදුර අබියස හටගත් රුකක් මා විසින් සීනෙන් දකිනලද ය. එම රුකැ නුවණ නමැති කඳ ඇත. සීලය නමැති අතු ඇත. උභයලෝකාථී සිඩිය ගෙන දෙන ඒ ප්‍රඥා නමැති රුක පස්ගෝරස නමැති එල දරන්නේ ය. ඇතුන් හා අසුන් ගවයන්ගෙන් යුක්ත ය.

5790. මහජනයා නැටුම් ගැයුම් වැයුම් (ඈ පුද විසින්) පවත්වද්දී එක්තරා පුරුෂයෙක් (මහාජනයා පලවාහැර) මේ ගස කපා ගෙන ගියේ ය. ඒ නැණ රුක අප වෙත යළි ආයේය. තෙපි මේ රුකට පුද සත්කාර කරව්.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5791. යෙ කෙචි චින්තා මම පච්චයෙන
සබ්බෙව තෙ පාතුකරොන්තු අජ්ජ,
තිබ්බානි කත්වාන උපායනානි
රුක්ඛස්සිමස්සාපචිතිං කරොථ.

5792. යෙ කෙචි බද්ධා මම අත්ථි රට්ඨෙ
සබ්බෙව තෙ බන්ධනා මොචයන්තු,
යථෙවයං බන්ධනස්මා පමුත්තො
ඉමෙව තෙ මුච්චරෙ බන්ධනස්මා.

5793. උන්නඞ්ගලා මාසමීමං කරොන්තු
මංසොදනං බ්‍රාහ්මණා භක්ඛයන්තු,
අමජ්ජපා මජ්ජරහො[1] පිපන්තු
පුණ්ණාහි ථාලාහි[2] පලිස්සුතාහි.

5794. මහාපථං නිච්ච සමච්භයන්තු
තිබ්බඤ්ච රක්ඛං විදහන්තු රට්ඨෙ,
යථඤ්ඤමඤ්ඤං න විහෙඨයෙය්‍යුං
රුක්ඛස්සිමස්සාපචිතිං කරොථ.

5795. ඔරොධා ච කුමාරා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සාභිහාරයුං.

5796. හත්ථාරුහා[3] අනීකට්ඨා රථිකා පත්තිකාරකා,[4]
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සාභිහාරයුං.

5797. සමාගතා ජානපද නෙගමා ච සමාගතා,
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සාභිහාරයුං.

5798. බහුජ්ජනො[5] පසන්නොසි දිස්වා පණ්ඩිතමාගතෙ,
පණ්ඩිතමහි අනුපපත්තෙ වෙලුක්ඛෙපො අවත්තථාති.[6]

විධුරපණ්ඩිතජාතකං අට්ඨමං.

---

1. රහා – මජ්ජසං, ස්‍යා.
2. තාලාහි – මජ්ජසං, වි.
3. හත්ථාරොහා – මජ්ජසං. වි. ස්‍යා.
4. පත්තිකාරිකා – වි.
5. බහුජ්ජනො – මජ්ජසං.
6. පවත්තථාති – මජ්ජසං, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5791. යම්කිසි කෙනෙක් මාගේ උපකාර ලැබ සතුටු වෙත් ද අද ඒ සියල්ලෝම සිය සතුට පහළ කෙරෙත්වා! මේ රුකට මහත් පූජා සත්කාර කොට බුහුමන් කරවු.

5792. මාගේ රාජ්‍යයෙහි බන්ධනගත යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඒ සියල්ලෝ බන්ධනයෙන් මුදත්වා! යම්සේ මේ පඬිතුමා මිදුණේ ද, එසේ හැම සත්හු ද බැදුම්වලින් මුදනු ලබත්වා!

5793. මේ මාසය මුළුල්ලෙහි නඟුල් (කුඹුරෙන් ගොඩ ගෙන) තැන්පත් කොට තබත්වා! බමුණෝ මස්රසැති ව බත බුදිත්වා! මත්පැන් බොන්නෝ පානාගාරයෙහි සිට පිරී උතුරායන ඔඩම් වලින් රිසිසේ මත්පැන් බොත්වා!

5794. මහමහැ අසල සිටින වෙසහනෝ නිතර සළෙලුන් කැඳවත්වා! යම්සේ මහජනයා ඔවුනොවුන් නො පෙළත් ද එසේ දැඩි ආරක්ෂා සංවිධාන කෙරෙත්වා! මේ අයුරින් මේ රුකට ගරු-බුහුමන් කරවු.

5795. ඇතොවුර ස්ත්‍රීහු ද කුමාරවරු ද වෛශ්‍යයෝ ද බමුණෝ ද බොහෝ ආහාරපාන පඬිතුමාට යැවූහ.

5796. ඇතරුවෝ යැ අසරුවෝ යැ රථිකයෝ යැ පාබල සේනා යැ යන මොහු පඬිතුමාට බොහෝ ආහාරපාන යැවූහ.

5797. රැස් වූ දනවුවැස්සෝ ද නියම්ගම්වැස්සෝ ද පඬිතුමාට ආහාරපාන යැවූහ.

5798. පැමිණි පඬිතුමා දැක බොහෝ දෙන සතුටු වූහ. පඬිතුමා යළි පැමිණි කල්හි පිළී හිසැ සිසාරා ඔකඳ වූහු.

අටවන විධුරපණ්ඩිත ජාතක යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

9. උම්මග්ගජාතකං

5799. සබ්බසංහාරකෝ නත්ථි සුද්ධං කඩ්ගු පවායති,
අලීකං භාසතයං ධුත්තී සච්චමාහු මහල්ලිකා.

සත්තදරකපඤ්හා.

5800. හංසි තුවං එවං මඤ්ඤසි සෙය්‍යා
පුත්තෙන පිතාති රාජසෙට්ඨ,
හන්දස්සතරස්ස ඉත අයං
අස්සතරස්ස හි ගද්‍රභෝ පිතා.

ගද්‍රභපඤ්හා.

එකූනවීසතිපඤ්හා නිට්ඨිතා.

5801. නායං පුරෙ උන්නමති තොරණග්ගෙ කකණ්ටකෝ,
මහොසධ විජානාහි කෙන ඒදිසා කකණ්ටකා.

5802. අලද්ධපුබ්බං ලද්ධාන අද්ධමාසං කකණ්ටකෝ,
අනිමඤ්ඤිනි රාජානං වෙදෙහං මිථිලග්ගහං.

කකණ්ටක පඤ්හා.

5803. ඉත්ථී සියා රූපවතී සා ච සීලවතී සියා
පුරිසෝ තං න ඉච්ඡය්‍ය සද්දහාසි මහොසධ.

5804. සද්දහාමි මහාරාජ පුරිසෝ දුබ්භගෝ[1] සියා,
සිරී ච කාලකණ්ණී ච න සමෙන්ති[2] කුදාචනං.

සිරිකාලකණ්ණි පඤ්හා.

5805. යෙසං න කදාචි ගුත්තපුබ්බං
සකතිං සත්තපදම්පි ඉමස්මිං ලොකෙ,
ජාතා අමිත්තා දුවෙ සහායා
පටිසන්ධාය චරන්ති කිස්ස හෙතු.

5806. යදි මෙ අජ්ජ පාතරාසකාලෙ
පඤ්හං න සඤ්ඤුණෙය්‍යාථ[3] වත්තුමෙතං,
රට්ඨා පබ්බාජයිස්සාමි[4] වො සබ්බෙ
න හි මත්ථො දුප්පඤ්ඤජාතිකෙහි.

---

1. දුභගෝ – මජ්ඣං, ඒ.
2. න සමන්නි – මජ්ඣං.
3. සඤ්ඤුණෙථ – සීමු. සඤ්ඤුණෙථ – ස්‍යා.
4. පබ්බාජයිස්සාමි – සීමු.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

9. උම්මග්ග ජාතකය.

5799. සර්වසංහාරක ගන්ධයෙක් නම් නැති. පිරිසුදු පුවඟ මල් සුවඳ හමයි. මේ ධූර්තස්ත්‍රී බොරු කියයි. මැහැල්ල සැබෑවක් කිවූ.

සත්දරු පැනය.

5800. රාජශ්‍රේෂ්ඨය, ඔබ පියා පුතුට වඩා උතුම් ය යි හඟින්නහු නම් ඔබගේ අශ්වතරයාට වඩා මේ කොටළුවා ම උතුම් වන්නේ ය. අශ්වතරයාගේ පියා කොටළුවා වන බැවිනි.

ගද්‍රභ පැනය.

එකුන්විසි පැන නිමි.

5801. මහෞෂධ පණ්ඩිතය, තොරණ අගැ වසන මේ කටුසු තෙමේ පෙරැ මෙසේ මාන ඇත්තේ නො වෙයි. කිනම් කරුණෙකින් කටුසු තෙමේ (මානයෙන්) තද වූයේ ද යි දනුව.

5802. පෙරැ නො ලද විරූ අඩ මස්සක් ලැබ මේ බොහොඩා විදේහයෙහි මිථිලාපුර අගරජු ඉක්මවා සිතයි.

කකණ්ටක පැනය.

5803. යම් ස්ත්‍රියක් අතිශය රූප සම්පත් ඇත්තී ද ආචාර ශීලයෙන් යුක්ත වන්නී ද වෙයි. එබඳු ස්ත්‍රියක යම් පුරුෂයෙක් නො පතයි නම් මහෞෂධය, මෙය තෙපි හඳහන්නහු ද?

5804. මහරජ, මම එය හඳහමි, පුරුෂයා භාග්‍ය නැත්තෙකි. ශ්‍රීකාන්තාවත් කාලකණ්ණියාත් කිසි කලෙකත් එක් නො වන්නාහ.

සිරිකාලකණ්ණි පැනය.

6805. මේ ලොවැ කිසි කලෙකත් සත් පියවරෙකුදු එක් වැ කළ ගමන් නැති පසමිතුරු දෙදෙනෙක් පෙරැ නො වූ විරූ ලෙසින් එක් වැ හැසිරෙත් නම් ඊට හේතු කවරේ ද?

5806. ඉදින්, අද පෙරබත් කාලයෙහි මේ පැනයට පිළිතුරු සපයන්නට අසමත් වන්නහු නම් තොප සියලු දෙන ම රටින් නෙරපන්නෙමි. නුවණ නැත්තන්ගෙන් මට ප්‍රයෝජනයක් නැත්තේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5807. මහාජනසමාගමම්හි සොරෙ
ජනකොලාහලසමාගමම්හි ජාතෙ,
විකඛිත්තමනා අනෙකචිත්තා
පඤ්ඤං න සක්කුණොම වත්තුමෙතං.

5808. එකග්ගචිත්තා එකමෙකා
රහසීගතා අත්ථං නිචින්තයිත්වා,[1]
පච්චෙකෙ සම්මසිත්වාන ධීරා
අථ වක්ඛන්ති ජනින්ද අත්ථමෙතං.

5809. උග්ගපුත්තරාජපුත්තියාන
උරබ්භමංසං පියං මනාපං,
න තෙ සුනඛස්ස අදෙන්ති මංසං
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්ස.

5810. චම්මං විහනන්ති එළකස්ස
අස්සපිට්ඨත්ථරණසුඛස්ස හෙතු,
න තෙ සුනඛස්ස අත්ථරන්ති
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්ස.

5811. ආවෙල්ලිතසිඞ්ගිකො හි මෙණ්ඩො
න සුනඛස්ස විසාණානි අත්ථි,
තිණභක්ඛො මංසභොජනො ච
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්ස.

5812. තිණමාසි පලාසමාසි මෙණ්ඩො
න සුනඛො තිණමාසි නො පලාසං,
ගණ්හෙය්‍ය සුණො සසං බිළාරං
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්ස.

5813. අඩ්ඪට්ඨපාදෙ[2] චතුප්පදස්ස
මෙණ්ඩො අට්ඨනඛො අදිස්සමානො,
ඡාදියං ආහරති අයං ඉමස්ස
මංසං ආහරති අයං අමුස්ස.

5814. පාසාදගතො විදෙහසෙට්ඨො
වීතිහාරං අඤ්ඤමඤ්ඤභොජනානං,
අද්දක්ඛි කිර සක්ඛි තං ජනින්දෙ
භොභුක්කස්ස[3] ච පුණ්ණමුඛස්ස චෙතං.

---

1. අත්ථානි චින්තයිත්වා – මජසං, ස්‍යා.
2. අට්ඨඩ්ඪ – මජසං, ස්‍යා.
3. ඛොභුක්කස්ස–සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5807. මහාජනයා රැස් වූ කල්හි මහත් වූ ජන කෝලාහල ඇති කලැ විසිරුණු සිත් ඇත්තමෝ නොයෙක් සිතිවිලි ඇත්තමෝ මේ පැනයට පිළිතුරු සපයන්නට නො පොහොසතුමහ.

5808. මහරජ, පණ්ඩිතයෝ එකාග්‍ර වූ චිත්තයෙන් යුක්ත වැ එකිනෙකා රහොගත වැ විවෙකයෙහි සිටියාහු අරුත් සලකා නිශ්චය කොට කියන්නට සමත් වන්නාහ.

5809. (සේනක) රජ ඇමති පුතුනට එළුමස ප්‍රිය මනාප වෙයි. ඔහු ශුනක මස් නො බුදිත්. එතෙකුදුවත් එළුවාගේත් ශුනඛයාගේත් මිත්‍රභාවය වන්නේ ය.

5810. (පුක්කුස) අසු පිටැ ඇතිරීමෙහි සුවය සලකා එළුවාගේ සම නහන්නාහ. ඛලු සම එසේ නො අතුරත්. එකලැ ශුනකයාගේ හා එළුවාගේ මිත්‍රත්වය වන්නේ ය.

5811. (කාච්ඡ) එළුවා ඇඹරිගිය අං ඇත්තෙකි. ශුනකයාට විපාණයෝ නැත්තාහ. එළුවා තණ කන්නේ ය. බල්ලා මස් බුදින්නේ ය. එතෙකුදුවත් එළුවාගේත් බල්ලාගේත් මිත්‍රභාවය වන්නේ ය.

5812. (දෙච්ඡ) එළුවා තණ හා කොළ කන්නේ ය. බල්ලා තණ හා කොළ නො කන්නේ ය. බල්ලා සාවුන් බළලුන් කයි. එතෙකුදුවත් එළුවාගේත් බල්ලාගේත් මිත්‍රභාවය වන්නේය.

5813. (මහෝෂධ) අඩඅටපා හෙවත් සිවුපා ඇති අට කුරින් යුත් එළුවා මස් ගෙනෙන වේලෙහි නො පෙනී සිට බල්ලාට මස් ගෙනෙයි. බල්ලා එළුවාට තණ ගෙනෙ යි.

5814. ප්‍රාසාදයෙහි මතුමහලැ සිටි වේදේහරජ ඔවුනොවුන්ගේ අහර හුවමාරුව දුටුයේ වන, නරේන්ද්‍ර තෙමේ බල්ලාගේත් එළුවා-ගේත් මිත්‍රභාවය -ප්‍රත්‍යක්ෂයෙන් දිටී.

5815. ලාභා වත මෙ අනප්පරූපා
යස්ස මෙ එදිසා පණ්ඩිතා කුලම්හි,
ගම්භීරගතං[1] නිපුණමත්ථං
පටිවිජ්ඣන්ති සුභාසිතෙන ධීරා.

5816. අස්සතරීරථක්ඛ එකමෙකං
ඵීතං ගාමවරක්ඛ එකමෙකං,
සබ්බං වො දම්මි පණ්ඩිතානං
පරමප්පතීතමනො සුභාසිතෙනාති.

(ද්වාදසනිපාතෙ) මෙණ්ඩකපඤ්හං.

5817. පඤ්ඤායුපෙතං සිරියා විහීනං
යසස්සිනඤ්චාපි අපෙතපඤ්ඤං,
පුච්ඡාමි තං සෙනක එතමත්ථං
කමෙත්ථ සෙය්‍යො කුසලා වදන්ති.

5818. ධීරා ච බාලා ච භවෙ ජනින්ද
සිප්පූපපන්නා ච අසිප්පිනො ච,
සුජාතිමන්තොපි අජාතිමස්ස
යසස්සිනො පෙස්සකරා භවන්ති:
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤෙ නිහීනො සිරිමාව සෙය්‍යො.

5819. තවම්පි පුච්ඡාමි අනොමපඤ්ඤ
මහොසධ කෙවලධම්මදස්සී,
බාලං යසස්සිං පණ්ඩිතං අප්පභොගං
කමෙත්ථ සෙය්‍යො කුසලා වදන්ති,

5820. පාපානි කම්මානි කරොති බාලො
ඉධමෙව සෙය්‍යො ඉති මඤ්ඤමානො,
ඉධලොකදස්සී පරලොකං අදස්සී
උභයත්ථ බාලො කලිමග්ගහෙසි;
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤෙව සෙය්‍යො න යසස්සී බාලො.

5821. න සිප්පමෙතං විදධාති භොගං
න බන්ධවා න සරීරාවකාසො
පස්සෙළමූගං සුඛමෙධමානං,
සිරී හි නං භජතෙ ගොරිමනදං
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤෙ නිහීනො සිරිමාව සෙය්‍යො.

---

1. පඤ්ඤාසස - මජ්ඣං, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5815. (වෙදෙහ රජ) නුවණැත්තෝ ගැඹුරු බවට ගිය සියුම් අරුත් දැනැ සුභාෂිතයෙන් පවසත් ද. මෙබදු පඬිවරයෝ යම්බදු වූ මාගේ කුලයෙහි වෙසෙත් ද මට ඒකාන්තයෙන් වූයේ මහත් ලාභයෙකි.

5816. සුභාෂිතයෙන් ඉතා සතුටු වූයෙම් පණ්ඩිතයන් වූ තොපට වෙළඹුන් යෙදූ රියක් ද සශ්‍රීක වූ ග්‍රාමයක් ද බැඟින් දෙමි.

ද්වාදශ නිපාතයෙහි මෙණ්ඩක ප්‍රශ්නය යි.

5817. සේනකය, "ප්‍රඥාවෙන් යුක්ත සම්පත්තියෙන් තොර වූයේ ද සම්පත්තියෙන් යුක්ත ප්‍රඥාවෙන් තොර වූයේ ද යන මොවුන් දෙදෙනා අතුරෙන් නුවණැත්තෝ කවරකු උතුම් කොට සලකන්නාහු ද" යි මෙහි අරුත් පුළුවුස්මි.

5818. (සෙනක) මහරජ, නුවණ ඇත්තෝ ද නුවණ නැත්තෝ ද සිප් හැදෑරුවෝ ද නො හැදෑරුවෝ ද සුජාතිමත්හු ද හීනජාති ඇති සම්පත් ඇත්තාගේ මෙහෙකරුවෝ වෙත්. මේ කරුණ දැක මම නුවණැත්තේ හීනය යි ද සම්පත්තියෙන් යුක්ත වූයේ ම උතුම් යයි ද කියමි.

5819. මහාප්‍රාඥ වූ සියලු ධර්ම දක්නා වූ මහෞෂධය, තොප පිළිවිසිමි. අඥාන වූ එහෙත් සම්පත් ඇත්තා වූ ද ප්‍රඥාවෙන් යුක්ත වූ එහෙත් අල්පභෝග ඇත්තා වූ ද දෙදෙන අතුරෙන් කවරෙක් වඩා උතුමැ යි නුවණැත්තෝ කියත් ද?

5820. (මහෞෂධ) මෙලෝ සම්පත් මැ උතුමැ යි සලකන බාලයා පව්කම් කරයි. මෙලොව දක්නා වූ පරලොව නො දක්නා වූ අඥානයා දෙලොවින් මැ පැරදෙයි. මේ කාරණය දැකැ නුවණැත්තේ ශ්‍රේෂ්ඨ යැයි ද යශසින් යුක්ත වූ ඥානයෙන් හීන වූයේ ශ්‍රේෂ්ඨ නො වේ යැ යි ද මම කියමි.

5821. (සේනක) මේ සිප්සතර භොගයන් නො එළවයි. (එයින්) ඥාතීහු ද නො වෙත්. ශරීරාවකාශයෙක් ද නො වේ. කෙළනොලු වැ සුව විඳිනා ගෝරිමන්ද සිටාණන් බැලුව මැනැව. ශ්‍රී තොමෝ ඔහු සේවනය කරයි. මේ දැකැ නුවණැත්තේ ශ්‍රේෂ්ඨ නො වේ. අඥාන වූ සම්පත් ඇත්තා මැ උතුමැ යි කියමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5822. ලද්ධා සුඛං මජ්ජති අප්පපඤ්ඤෝ
දුක්ඛෙන ඵුට්ඨොපි පමොහමෙති
ආගන්තුනා සුඛදුක්ඛෙන ඵුට්ඨො,
පවෙධති වාරිචරොව ඝම්මෙ
එතම්පි දිස්වාන අහං වදමි.
පඤ්ඤෝව සෙය්‍යො න යසස්සී බාලො.

5823. දූමං යථා සාදුඵලං[1] අරඤ්ඤෙ
සමන්තතො සමභිචරන්ති පක්ඛී,
එවම්පි අඩ්ඪං සධනං සභොගං
බහුජ්ජනො භජති අත්ථහෙතු;
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤෝ නිහීනො සිරිමාව සෙය්‍යො.

5824. න සාධු බලවා බාලො සාහසං වින්දතෙ ධනං,
කන්දන්තමෙව[2] දුම්මෙධං කඩ්ඪන්ති නිරයෙ භුසං.
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤෝව සෙය්‍යො න යසස්සී බාලො.

5825. යා කාචි නජ්ජො ගඞ්ගමභිස්සවන්ති
සබ්බාව තා නාමගොත්තං ජහන්ති
ගඞ්ගා සමුද්දං පටිපජ්ජමානා
න ඛායතෙ ඉද්ධිපරො[3] හි ලොකො
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤෝ නිහීනො සිරිමාව සෙය්‍යො.

5826. යමෙතමක්ඛා උදධිං මහන්තං
සවන්ති නජ්ජො සබ්බකාලං අසඞ්ඛං[4]
සො සාගරො නිච්චමුළාරවෙගො
වෙලං න අච්චෙති මහාසමුද්දෝ.

5827. එවම්පි බාලස්ස පජප්පිතානි
පඤ්ඤං න අච්චෙති සිරී කදාචි
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤෝව සෙය්‍යො න යසස්සී බාලො.

5828. අසඤ්ඤතො චෙපි පරෙසමත්ථං
භණාති සත්ථානගතො[5] යසස්සී
තස්සෙව තං රූහති ඤාතිමජ්ඣෙ
සිරි හි නං කාරයතෙ න පඤ්ඤෝ,
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤෝ නිහීනො සිරිමාව සෙය්‍යො.

---

1. ධුව ඵලං - මජසං.
2. කන්දන්තමෙතං - මජසං.
3. ඉදධි පඤ්ඤොපි - මජසං.
4. මසඞ්ඛ්‍යං - මජසං.
5. සණ්ඨානගතො - ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5822. (මහෞෂධ) අල්ප ප්‍රාඥයා ඉසුරු සුවය ලැබ එහි ඇලේ. දුඃඛ ස්පර්ශයෙන් අතිශය මුලාවට පැමිණේ. ආගන්තුක සුව දුකින් පහස්නා ලද්දේ අව්වෙහි ලූ මසකු සෙයින් සැලේ. මම මේ කරුණ දැක නුවණැත්තේ ම උතුම් වේ. ඉසුරුමත් බාලයා උතුම් නොවේ ය යි කියමි.

5823. (සේනක) වනයෙහි මිහිරි ඵලයන්ගෙන් යුක්ත වූ වෘක්ෂය හාත්පසැ යම්සේ පක්ෂීහු හැසිරෙත් ද එසේ මැ ආඪ්‍ය වූ ධනයෙන් හා භෝගයෙන් යුක්ත පුද්ගලයා ද ධනය නිසා බොහෝ දෙන සේවනය කරති. මේ කරුණ දැකැ මම ප්‍රඥා ඇත්තේ හීන ය. යශස් ඇත්තේ මැ උතුමැ යි කියමි.

5824. (මහෞෂධ) බලවත් වූ බාලයා යහපත් නොවේ. හේ සැහැසිකමින් ධනය ලබයි. වලප්නා වූ මැ ඒ මෝඩයා (නිරය පාලයෝ) මහානිරයට පමුණුවත්. මම මේ කරුණ දැකැ නුවණැත්තේ මැ උතුම් වෙයි. ඉසුරුමත් බාලයා උතුම් නොවේ ය යි කියමි.

7825. (සේනක) යම් කිසි කුඩා නදීහු මහගඟ කරා ගලා බසිද් ද ඒ සියල්ලෝ පෙර නම් ගොත් හැර දමත්. (ගඟ යන වහරටම යෙති) ගඟ මුහුදට වදනා කල ද පෙර නම නොපැනෙයි, (මුහුද යන නම ලබයි). ඒකාන්තයෙන් ලෝ වැස්සෝ සම්පත්තිය මැ පිහිට කොට ඇත්තාහ. මම මේ කරුණ දැකැ නුවණැත්තේ නිහීන ය. සම්පත් ඇත්තේ මැ උතුමැයි කියමි.

5826–5827. (මහෞෂධ) තෙපි යම් මේ මහාසාගරයක් ගැන කීහු ද එයට අප්‍රමාණ කාලයක් මුළුල්ලේ නදීහු ගලා බසිත්. ඒ සාගරය නිරතුරු මහත් වූ රළවේග ඇත්තේ ය. එහෙත් මහ සයුර වෙරළ නොඉක්මව යි. එබැවින් බාලයාගේ කථාවෝ ප්‍රාඥයා නොඉක්මවති. කිසි කලෙකත් සම්පත්තිය ප්‍රඥාව ඉක්මවා නොයයි. මම මේ කරුණ දැකැ ප්‍රාඥයා මැ උතුම් වෙයි. ඉසුරුමත් බාලයා උතුම් නොවේ ය යි කියමි.

5828. (සේනක) කායාදීන්හි සංයමයක් නැත්තේ ද ඉසුරුමත් නැනැත්තේ අධිකරණයෙහි සිටියේ මෙරමාගේ අසීය ප්‍රකාශ සකරෙයි, (ඒ විනිශ්චය මණ්ඩලයෙන්) භාකිමධ්‍යයෙහි ඔහුගේ මැ වචනය පිළිගැනෙයි. එය සම්පත්තිය මැ කරවයි. ප්‍රඥාව නොවේ. මම මේ කරුණ දැකැ නුවණැත්තේ හීන ය. යශස් ඇත්තේ මැ උතුම් වන්නේ ය යි කියමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5829. පරස්ස වා අත්තනෝ වාපි හෙතු
බාලෝ මුසා භාසතී අපපඤ්ඤෝ
සෝ නින්දිතෝ හොති සභාය මජ්ඣේ
පෙච්චාපි[1] සෝ දුග්ගතිගාමී හොති.
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤාව සෙය්යා න යසස්සී බාලෝ.

5830. අප්පම්පි චේ භාසති භූරිපඤ්ඤෝ
අනාළ්හියෝ[2] අපපධනෝ දළිද්දෝ
න තස්ස තං රුහති ඤාතිමජ්ඣේ
සිරී ච පඤ්ඤාණවතෝ න හොති,
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤා නිහීනෝ සිරිමාව සෙය්යා.

5831. පරස්ස වා අත්තනෝ වාපි හෙතු
න භාසති අලිකං භූරිපඤ්ඤෝ
සෝ පූජිතෝ හොති සභාය මජ්ඣේ
පෙච්චාපි[3] සෝ සුග්ගතිගාමී හොති
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤාව සෙය්යා න යසස්සී බාලෝ.

5832. හත්ථිගවස්සා මණිකුණ්ඩලා ච
නාරියෝ ච[4] ඉධූපසු කුලෙසු ජාතා
සබ්බාව තා උපභොගා භවන්ති;
ඉධත්ථස්ස පොසස්ස අනිත්ථිමනෙත්තා
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤාව සෙය්යා න යසස්සී බාලෝ.

5833. අසංවිහිතකම්මන්තං බාලං දුම්මන්තමන්තිනං,
සිරී ජහති දුම්මේධං ජිණ්ණඤ්ච උරගෝ තචං,
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤාව සෙය්යා න යසස්සී බාලෝ.

5834. පණ්ඩු පණ්ඩිතා මයං භදනෙත
සඛේ පඤ්ඣලිකා උපට්ඨිතා
භවං නෝ අභිභුය්‍ය ඉස්සරෝසි[5]
සක්කෝ භූතපතීව දෙවරාජා
එතම්පි දිස්වාන අහං වදාමි,
පඤ්ඤා නිහීනෝ සිරිමාව සෙය්යා.

---

1. පවජ්ජාපි – මජ්ඣං, සී්‍ය.
2. අනාළියෝ – මජ්ඣං, සී්‍ය.
3. පවජ්ජාපි – මජ්ඣං, සී්‍ය.
4. ථියෝ – මජ්ඣං.
5. දුම්මෙධ – මජ්ඣං,
6. ඉරියසි – ච්,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5829. (මහෞෂධ) මන්දප්‍රාඥ බාලයා තමා හෝ මෙරමා හෝ උදෙසා මුසවා කියයි. සබා මැද නින්ද ලබන හේ පරලොවැ දුගතිගාමී වෙයි. මම මේ කරුණ දැකැ නුවණැත්තේ මැ උතුම් වන්නේ ය. ඉසුරුමත් බාලයා උතුම් නො වන්නේ ය යි කියමි.

5830. (සේනක) සහල් නැළියක් පමණකුදු නැති නිර්ධන දිළිඳු මහනුවණැත්තේ ඉදින් යම් අර්ථයක් කියන්නවුන් ඔහුගේ ඒ වචනය නැයන් මැද නො නැහෙන්නේ ය. ශ්‍රිය ද නුවණැත්තාට නො වේ. මම මේ කරුණ දැකැ නුවණැත්තේ නිහීන ය. ඉසුරුමත් තැනැත්තේ මැ උතුම් වන්නේ ය යි කියමි.

5831. (මහෞෂධ) තමාගේ හෝ මෙරමාගේ හෝ ප්‍රයෝජනය උදෙසා නුවණැත්තේ බොරු නො කියයි. හේ සභාමධ්‍යයෙහි පූජිත වෙයි. පරලොවැ ද සුගතිගාමී වෙයි. මම මේ කරුණ දැකැ නුවණැත්තේ මැ උතුම් වන්නේ ය. ඉසුරුමත් බාලයා උතුම් නො වන්නේ ය යි කියමි.

5832. (සේනක) හස්තිගවාශ්වයෝ ද මාණික්‍ය කුණ්ඩලාභරණයෝ ද සමෘද්ධිමත් කුලයන්හි කාන්තාවෝ ද ඉසුරුමත් නොවූ සියල්ලෝ ද ඉසුරුමත් තැනැත්තාට ම උපභොග පිණිස පවත්නාහ. (නිර්ධන නුවණැත්තා පිණිස නො පවතිත්.) මම මේ කරුණ දැකැ ප්‍රාඥයා නිහීන ය. ඉසුරුමත් තැනැත්තේ මැ උතුම් වන්නේ යයි කියමි.

5833. (මහෞෂධ) අසංවිහිත කර්මාන්ත ඇති දුෂ්ටමන්ත්‍රණයෙන් යුත් මන්ත්‍රීන් ඇති දුෂ්ප්‍රාඥ බාලයා උරගයකු දිරුණු සැව හරනා සේ ශ්‍රී තොමෝ අත් හරින්නී ය. මම මේ කරුණ දැකැ නුවණැත්තේ ම උතුම් වන්නේ ය. ඉසුරුමත් බාලයා උතුම් නො වන්නේ ය යි කියමි,

5834. (සේනක) සඛාමිනි, පණ්ඩිත වූ අපි පස් දෙන සියල්ලෝ ම බදුදිලි වැ ඔබ වෙතැ එළැඹියෙමු. භූතයන්ට අධිපති වූ ශක්‍රදිව්‍යරාජයා සේ ඔබ අප මැඩැ ඉසුරුමත් වැ සිටින්නහු ය. මේ කරුණ දැකැ මම ප්‍රාඥයා හීන ය. ඉසුරුමත් තැනැත්තේ මැ උතුම් වන්නේ ය යි කියමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5835. දසොව පඤ්ඤස්ස යසස්සි බාලො
අත්ථෙසු ජාතෙසු තථාවිධෙසු,
යං පණ්ඩිතො නිපුණං සංවිධෙති
සමෙමාහමාපජ්ජති තත්ථ බාලො
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤෙව සෙය්‍යො න යසස්සි බාලො.

5836. අද්ධා හි පඤ්ඤෙව සතං පසත්ථා
කන්තා සිරී භොගරතා මනුස්සා,
ඤාණඤ්ච බුද්ධානමතුල්‍යරූපං
පඤ්ඤං න අච්චෙති සිරී කදාචි.

5837. යංතං අපුච්ඡිම්හ අකිත්තයී නො
මහොසධ කෙවලධම්මදස්සී
ගවං සහස්සං උසභඤ්ච නාගං;
ආජඤ්ඤයුත්තෙ ච රථෙ දස ඉමෙ
පඤ්ඤස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදමි තෙ ගාමවරානි සොළස.

විසතිනිපාතෙ සිරිමන්ද පඤ්ඤෝ

5838. යෙන සත්තුබිලඞ්ගා ච
ද්විගුණපලාසො ච පුප්ඵිතො,
යෙනාදමි තෙන වදමි
යෙන නාදමි න තෙන වදමි,
එස මග්ගො යවමජ්ඣකස්ස
එතං ජන්තපථං විජානහි.

ජන්තපථපඤ්ඤෝ

5839. හන්ති හත්ථෙහි පාදෙහි මුඛඤ්ච පරිසුම්භති,
සචෙ රාජ පියො හොති කං තෙනමහිපස්සති.[1]

5840. කො නු සන්තම්හි පජ්ජොතෙ අග්ගිපරියෙසනං චරං,
අද්දක්ඛි රත්තිං ඛජ්ජොතං ජාතවෙදං අමඤ්ඤථ.

5841. ස්වාස්ස ගොමයචුණ්ණානි අභිමන්ථං තිණානි ච,
විපරීතාය සඤ්ඤාය නාසක්ඛි සඤ්ජලෙතවෙ.[2]

5842. එවම්පි අනුපායෙන අත්ථං න ලභතෙ මගො,[3]
විසාණතො ගවං දෙහං යත්ථ ඛීරං න වීන්දති.

---

1. කනෙතන ත්වාහිපස්සති - මජ්ඣං.
2. පජ්ජලෙතවෙ නාරද පජ්ජලෙතවෙ - මජ්ඣං, ස්‍යා.
3. මූගො - ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5835. (මහෞෂධ) නුවණ ඇත්තන් විසින් කළයුතු යමක් උපන් කලැ ඉසුරුමත් බාල තෙමේ නුවණැත්තාගේ ගැත්තකු සේ වෙයි. නුවණැත්තේ දෂ්ඨ ලෙසින් යමක් සංවිධානය කෙරේ ද එහි ලා මුග්ධයා මහත් සේ මුළාවට පැමිණෙයි. මම මේ කරුණ දැකැ නුවණ ඇත්තේ මැ උතුම් වන්නේ ය. ඉසුරුමත් බාලයා උතුම් නො වන්නේ ය යි කියමි.

5836. ඒකාන්තයෙන් සත්පුරුෂයන් විසින් නුවණ මැ පසස්නා ලද්දේ ය. සම්පත්හි අන්ධබාල මනුෂ්‍යයෝ ඇලුණාහු වෙති. එහෙයින් ශ්‍රී තොමෝ ඔවුන් කැමැති වෙයි. බුද්ධිමතුන්ගේ ඥානය අසමාන වන්නේ ය. ශ්‍රී තොමෝ කවර කලෙකත් ප්‍රඥා ඇත්තහු ඉක්ම නො යයි.

5837. (වෙදෙහ රජ) නිවැරැදි සේ ධර්මය දක්නා වූ මහෞෂධ පණ්ඩිතය, අපි යමක් විචාළමෝ නම් ඒ අපට කීවහු ය. ප්‍රශ්න විසැඳීම පිළිබඳ තුටු වූ මම ගවයන් දහසක් ද හස්තිරාජයකු ද ආජානෙය අශ්වයන් යෙදූ මේ රිය දසය ද ගම්වර සොළසක් ද තොපට දෙමි.

විංශති නිපාතයෙහි සිරිමන්ත ප්‍රශ්නය යි.

5838. යම් තැනෙක අත්සුණු සල්පිලක් ඇද්ද ඉන් ඔබ්බෙහි කැඳ සල්පිලක් ඇද්ද ඉනුත් ඔබ්බෙ සුපිපි කොබෝලීල ගසෙක් ඇත්තේ ය. එතැන් සිට යම් අතෙකින් අනුභව කරම් ද ඒ අතැ මහ යන්නට කියමි. යම් අතෙකින් අනුභව නො කරම් ද එ මහැ යන්නට නො කියමි. මේ යවමැදුම්ගමැ අප ගෙට මහ ය. මේ සැහැවුණු මහ දැනගන්නෙහි ය.

ඡන්නපථප්‍රශ්නය යි.

5839. යමෙක් අත් පා වලින් ද ගසයි මුහුණට ද අනියි, එහෙත් මෙසේ කරන්නා වූ හේ ප්‍රියයෙක් ද වන්නේ ය. මහරජ, මෙයින් කවරකු දක්නෙහි ද?

5840. කවරෙක් නම් ඇවිළෙන ගිනි ඇති කල්හි ගිනි සොයමින් ඇවිදින්නේ රැයෙහි කණ මැදිරියකු දැකැ ගිනි ය යි සිතා ද.

5841. හෙතෙම වැරැදි හැඟීමෙන් ඒ කණමැදිරියා මතැ ගොම වැරටි හා තණකොළ රැස් කොට පිඹින්නේ නමුදු ගිනි දල්වන්නට අසමත් වන්නේ ද?

5842. එසෙයින් අඥානයා අනුපායයෙන් අර්ථය නො ලබන්නේ ය. ගවඇතින් කිරි දෙවන්නේ කිරි නො ලබන්නාක් මෙනි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5843. විවිධෙහි උපායෙහි අත්ථං පපොන්ති මාණවා,
නිග්ගහෙන අමිත්තානං මිත්තානං පග්ගහෙන ච.

5844. සෙණිමොක්ඛොපලාභෙන[1] වල්ලභානං නයෙන ච,
ජගතිං ජගතීපාලා අවසන්ති වසුන්ධරං.

ඛජ්ජොපණක පඤ්ඤො.

5845. සච්චං කිර ත්වම්පි භූරිපඤ්ඤෙ[2]
යා තාදිසී සිරි ධිතී මුතී ච,
න තායතෙ භාවවසූපනීතං
යො යාවකං භුඤ්ජසි[3] අප්පසූපං.

5846. සුඛං දුක්ඛෙන පරිපාචයන්තො
කාලාකාලං[4] විචිනං ඡන්දඡන්තො,[5]
අත්ථස්ස ද්වාරානි අවාපුරන්තො
තෙනාහං තුස්සාමි යවොදනෙන.

5847. කාලඤ්ච ඤත්වා අභිජීහනාය
මන්තෙහි අත්ථං පරිපාචයිත්වා,
විජම්භස්සං[6] සීහවිජම්භිතානි
තායිද්ධියා දක්ඛසි මං පුනාපි.

5848. සුඛී හි එකෙ[7] න කරොන්ති පාපං
අවණ්ණසංසග්ගභයා පුනෙකෙ,
පහූ සමානො විපුලත්ථචින්තී
කිං කාරණා මෙ න කරොසි දුක්ඛං.

5849. න පණ්ඩිතා අත්තසුඛස්ස හෙතු
පාපානි කම්මානි සමාචරන්ති,
දුක්ඛෙන පුට්ඨා ඛලිතත්තාපි[8] සන්තා
ඡන්දා ච දෙසා න ජහන්ති ධම්මං.

5850. යෙන කෙනච් වණ්ණෙන මුදුනා දරුනෙන වා,
උද්ධරෙ දීනමත්තානං පච්ඡා ධම්මං සමාචරෙ.

---

1. සෙනී මොක්ඛුපලාභෙන - මජසං. සෙනාමොක්ඛපලාභෙන - ස්‍යා.
2. අතිභූරිපඤ්ඤ – මජසං.
3. භුඤ්ජි - මජසං.
4. කාලානකාලං - මජසං.
5. ජනන – මජසං.
6. විජම්භිසං – මජසං, ස්‍යා.
7. සුඛීපිහෙතෙ – මජසං, ස්‍යා.
8. ඛලිතාපි – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5843. මනුෂ්‍යයෝ අමිත්‍රයනට නිග්‍රහයෙන් ද මිත්‍රයනට සංග්‍රහ-යෙන් ද විවිධොපක්‍රමයන්ගෙන් අර්ථ සිද්ධියට පැමිණෙත්.

5844. සේනා ප්‍රධානීන්ගේ සිත් ගැනීමෙන් ද හිතවතුන්ගේ උපක්‍රමයෙන් ද පෘථිවි පාලකයෝ මුළු පොළොව තමන් සතුකර ගනිත්.

ඛජ්ජොපණක ප්‍රශ්නය යි.

5845. (ඇමැති) සේනකයන් කීවේ සැබෑවක් මැ ය. මහත් වූ නුවණැති ඔබ මඳ ව්‍යඤ්ජනයෙන් යුක්ත යවබත අනුභව කරන්නාහු ය. ශ්‍රී තොමෝ එසේම යැ, (ශ්‍රෙෂ්ඨ වන්නී ය.) තොපගේ ධෛර්‍යයත් ස්මෘතියත් පරිහානියට පත් තොප නො රක්නේ ය.

5846. සැපත දුකින් මුහුකුරුවන්නා වූ කල් නොකල් විමසා අභිප්‍රාය සඟවන්නා වූ තැනැත්තා අර්ථයේ ද්වාරයන් විවෘත කරන්නේ ය. ඒනිසා මම යවබතින් තුස්නෙමි.

5847. (මහෞෂධ) වීර්‍යය කිරීමට සුදුසු කල් දැනැ නුවණින් අර්ථය මුහුකුරුවා සිංහ විජෘම්භණයෙන් විජෘම්භණය කරන්නෙමි. ඒ සමෘද්ධියෙන් යුක්ත වූ මා නැවැත දක්නෙහි ය.

5848. (වෙදෙහරජ) සැපයට පත්වූ අසමත් ඇතැම්හු පාපයන් නො කරත්. නුවණමඳ ඇතැම්හු පරොපවාද බියෙන් පව් නො කරත්. අතිශයින් දක්ෂ වූ විපුලාත්ථ චින්තී වූ තෙපි කවර හෙයින් මට දුක් ඇති නො කරන්නහු ද?

5849. (මහෞෂධ) ආත්ම සුඛ හේතුයෙන් නැණවත්හු පාපයන් නො කරත්. සාධුජනයෝ දුකින් පෙළුණෝ ද සැපතින් පිරිහුණෝ ද ඡන්දයෙන් හෝ ද්වේෂයෙන් හෝ ධර්මය අත් නො හරිත්.

5850. (වෙදෙහරජ) මෘදු වූ හෝ දරුණු වූ හෝ යම් උප-ක්‍රමයෙකින් දීන වූ තමා නහා සිටුවන්නේ ය. පසු වැ ධර්මයෙහි හැසිරෙන්නේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5851. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
න තස්ස සාඛං හනෙය්‍ය මිත්තදුබ්භා හි පාපකො.

5852. යස්සා[1] හි ධම්මං මනුජො විජඤ්ඤූ
යෙවස්ස කුඞ්කං විනයන්ති සන්තො,
තං හිංස්ස දීපඤ්ච පරායණඤ්ච
න තෙන මිත්තං ජරයෙථ[2] පණ්ඩිතෙසු.

5853. අලසො ගිහී කාමභොගී න සාධු
අසඤ්ඤතො පබ්බජිතො න සාධු,
රාජා න සාධු අනිසම්මකාරී
යො පණ්ඩිතො කොධනො තං න සාධු.

5854. නිසම්ම ඛත්තියො කයිරා නානිසම්ම දිසම්පති,
නිසම්මකාරිනං රාජ යසො කිත්ති ච වඩ්ඪති.

හූරිපඤ්හා.

5855. හන්ති හත්ථෙහි පාදෙහි මුඛඤ්ච පරිසුම්භති,
ස වෙ රාජ පියො හොති කං තෙන මභිපස්සසි.

5856. අක්කොසති යථාකාමං ආගමඤ්චස්ස න ඉච්ඡති,
ස වෙ රාජ පියො හොති කං තෙන මභිපස්සසි.

5857. අබ්භාකුඨාති අභූතෙන අලිකෙන මභිසාරයෙ,
ස වෙ රාජ පියො හොති කං තෙන මභිපස්සසි.

5858. හරං අන්නඤ්ච පානඤ්ච වත්ථසෙනාසනානි ච,
අඤ්ඤදත්ථු හරා සන්තා තෙ වෙ රාජ පියා හොන්ති
කං තෙනමභිපස්සසි.

දෙවකාපුවජිත පඤ්හා.

5859 පඤ්ච පණ්ඩිතා සමාගතා
පඤ්හා මෙ පටිභාන්ති තං සුණාථ,
නින්දියමක්ඛං පසංසියං වා
කස්සවාචිකරෙය්‍ය ගුය්හමක්ඛං.

---

1. යස්ස හි – මජ්ඣං.
2. මිත්ති ජියෙථ – මජ්ඣං. මෙත්තිං – සී්‍ය.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5851. (මහෞෂධ) යම් රුකෙක සෙවණැ හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේ ද එම ගසැ අත්තක් හෝ නො බිඳින්නේ ය. (බිඳින්නේ නම්) හේ මිත්‍රද්‍රොහී පවිටෙක් වන්නේ ය.

5852. යම් කෙනකුන් වෙතින් පුරුෂ තෙමේ ධර්මය දනගන්නේ ද යම් සත්පුරුෂ කෙනෙක් ඔහුගේ සැක දුරු කෙරෙත් ද එකාන්තයෙන් හේ ඔහුට පිහිට ද සරණ ද වන්නේ ය. නුවණැත්තේ ඔහු සමඟ පවත්නා මිත්‍රභාවය නො නසන්නේ ය.

5853. කම්සැප සෙවුනා වූ අලස ගිහියා යහපත් නො වේ. සංයමයෙන් තොර පැවිද්ද ද යහපත් නො වේ. නො විමසා ක්‍රියා කරන රජ යහපත් නො වේ. යම් පණ්ඩිතයෙක් ක්‍රොධ කරන සුලු නම් හෙ ද යහපත් නො වේ.

5854. මහරජ, ක්ෂත්‍රිය තෙමේ විමසා ක්‍රියා කරන්නේ ය. නො විමසා ක්‍රියා කිරීම යහපත් නො වේ. විමසා ක්‍රියා කරන්නාගේ යශස ද කීර්තිය ද වැඩේ.

හූරි ප්‍රශ්නය යි.

5855. යමෙක් අත් පා වලින් ගසයි ද, මුහුණටත් අනියි ද, මහරජ, හේ ඒකාන්තයෙන් ප්‍රියයෙක් ද වෙයි. ඒ කවරකු ලෙස දක්නෙහි ද?

5856. යමකුට රිසිසේ අක්‍රොශ කරයි ද, (එහෙත් ආක්‍රොශ වශයෙන් කියූ) ඒ කාරණයාගේ ඊම නො කැමැති වෙයි ද මහරජ, හේ ඒකාන්තයෙන් ප්‍රිය වන්නේ ය. ඒ කවරකු ලෙස දක්නෙහි ද?

5857. යමෙක් මුසායෙන් ගටා බෙණෙයි ද බොරුයෙන් වොදනා කෙරෙයි ද මහරජ, හේ ඒකාන්තයෙන් ප්‍රිය වන්නේ ය. ඒ කවරකු ලෙස දක්නෙහි ද?

5858. ඇතැමෙක් ආහාරපාන හා වස්ත්‍ර ශයනාසනයන් ද රැගෙන යත්. එහෙත් එසේ ගෙන යන්නා වූ ඔව්හු ඒකාන්තයෙන් ප්‍රිය වෙත්. මහරජ, ඒ කවරුන් ලෙස දක්නෙහි ද?

දෙවතා පුච්ඡිත ප්‍රශ්නයෝ යි.

5859. මෙහි පැමිණි පඤ්ච පණ්ඩිතවරුනි, මට වැටැහෙන එක් ප්‍රශ්නයෙක් ඇත. එය අසවු. නින්ද කටයුතු වූ හෝ ප්‍රශංසා කටයුතු වූ හෝ රහස කවරකුට හෙළි කළ යුත්තේද යි වෙදෙහ රජ පිළිවිසී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5860. ත්වං නො ආවිකරොහි[1] භූමිපාල
හත්තා භාරසහො තුවං වදෙතං,
තව ඡන්දඤ්ච රුචිඤ්ච[2] සම්මසිත්වා
අථ වක්ඛන්ති[3] ජනින්ද පඤ්ච ධීරා.

5861. යා සීලවතී අනඤ්ඤධෙය්‍යා[4]
භත්තුච්ඡන්දවසානුගා පියා මනාපා,
නින්දියමත්ථං පසංසියං වා
භරියායාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

5862. යො කිච්ඡගතසස ආතුරසස
සරණං හොති ගතී පරායණඤ්ච,
නින්දියමත්ථං පසංසියං වා
සඛිනොවාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

5863. ජෙට්ඨො අථ මජ්ඣිමො කණිට්ඨො
සො වෙ සීලසමාහිතො ධීතත්තො,
නින්දියමත්ථං පසංසියං වා
භාතුවාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

5864. යො වෙ පිතුහදයසස පද්ධගු[5]
අනුජාතො පිතරං අනොමපඤ්ඤෙ,
නින්දියමත්ථං පසංසියං වා
පුත්තස්සාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

5865. මාතා දිපද ජනින්දසෙට්ඨ
යො තං පොසෙති ඡන්දසා පියෙන,
නින්දියමත්ථං පසංසියං වා
මාතුයාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

5866. ගුය්හස්ස හි ගුය්හමෙව සාධු
න හි ගුය්හස්ස පසත්ථමාවිකම්මං,
අනිප්ඵාදය[6] සහෙය්‍ය ධීරො
නිප්ඵන්තත්ථො යථාසුඛං භණෙය්‍ය.

5867. කින්නු ත්වං විමනො රාජසෙට්ඨ
දිපදින්ද[7] වචනං සුණොම නෙතං,[8]
කිං චින්තයමානො දුම්මනොසි
නූන දෙව අපරාධො අත්ථි මය්හං.

---

1. ත්වං ආවිකරොහි – මජසං, ස්‍යා.
2. රුචිනි – මජසං. ස්‍යා.
3. වග්ගන්ති – මජසං.
4. අනඤ්ඤථෙය්‍යා – මජසං. ස්‍යා.
5. යා – මජසං. ස්‍යා.
6. අනිප්ඵන්තතාය – මජසං. ස්‍යා.
7. දවිපද ජනින්ද – මජසං.
8. මෙතං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5860. මහරජ, ඔබ මැ අපට එය ප්‍රකාශ කරනු මැනව. ඔබ අපගේ ස්වාමියා ද, බර උසුලන්නා ද වෙති. පඬිවරු පස්දෙන ඔබගේ අදහස හා කැමැත්ත විමසා පිළිතුරු කියන්නාහයි සේනක කීය.

5861. (වෙදෙහ රජ) යම් ස්ත්‍රියක් ආචාර ශීලයෙන් යුක්ත ද අනුන් වසඟයෙහි නො පවතී ද ස්වාමියාගේ කැමැත්ත අනුව වසන්න් ද, ප්‍රිය මනාප වන්නී ද එබඳු බිරිඳට නින්ද කටයුතු හෝ ප්‍රශංසා කටයුතු හෝ රහස කියැ යුත්තේ ය.

5862. (සේනක) යමෙක් දුකට පත් ආතුරයාට සරණ වැ පිහිට වැ උපකාරී වැ පවතී ද එ බඳු මිත්‍රයාට නින්ද කටයුතු හෝ ප්‍රශංසා කටයුතු හෝ රහස හෙළි කරන්නේ ය.

5863. (පුක්කුස) ඉදින් යමකුට ජ්‍යෙෂ්ඨ හෝ මධ්‍යම හෝ කණිෂ්ඨ හෝ සොහොයුරෙක් වේ ද හෙ ද ශීලයෙහි මනා වැ පිහිටියේ ස්ථිර සිතැත්තේ නම් එවැනි සොහොවුරාට නින්ද කටයුතු හෝ ප්‍රශංසා කටයුතු හෝ රහස හෙළි කරන්නේ ය.

5864. (කාවින්ද) ඉදින් යමෙක් පියා ගේ සිතට අනුව ක්‍රියා කරන්නේ ද මහත් ප්‍රඥායෙන් යුක්ත වූයේ පියාට අනුජාත වේ ද එ බඳු පුතුට නින්ද කටයුතු හෝ ප්‍රශංසා කටයුතු හෝ රහස හෙළි කරන්නේ ය.

5865. (දෙවින්ද) දෙපා ඇත්තනට නායක මහරජ, යම් මවක් ස්නෙහයෙන්, ප්‍රිය උපදවමින් සිය පුතු පෝෂණය කරන්නී ද එ බඳු මවට නින්ද කටයුතු හෝ ප්‍රශංසා කටයුතු හෝ රහස හෙළි කරන්නේ ය.

5866. (මහෞෂධ) සැඟැවියැ යුතු දේ සැඟැවීම මැ යහපත් වන්නේ ය. රහස හෙළි කිරීම පැසසිය යුතු නොවේ. නුවණැත්තේ කාර්‍ය්‍ය සිද්ධිය නොවී නම් (කාර්‍ය්‍ය සිද්ධිය තෙක්) රහස දරන්නේ ය. සිද්ධ වූ අර්ථ ඇත්තේ රිසි සේ කියන්නේ ය.

5867. මහරජ ඔබේ සිත් පෙරළියට හේතු කවරේ ද? කවර හෙයින් ඔබෙන් වචනයක් නො අසම් ද? කුමක් සිතමින් දෙම්නස් වූයෙහි ද? දේවයිනි. මාගෙන් වූ යම් අපරාධයෙක් හෝ ඇත් දැයි උදුම්බරාදේවි විචාළාය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5868. පඤ්ඤසූ වජ්ජිකා මහොසධොති
ආණත්තො මෙ වධාය භූරිපඤ්ඤ,
තං චින්තයන්තො[1] දුම්මනොසම්හි
න හි දෙවි අපරාධො අත්ථි තුයහං.

5869. අභිදෙසගතො ඉදනි එසි[2]
කිං සුත්වා කිමාසංකතේ[3] මනො තෙ,
කො තෙ කිමවොච භූරිපඤ්ඤ
ඉඩ්ඝ තං වචනං සුණොම බ්‍රූහි මෙතං.

5870. පඤ්ඤසූ වජ්ජිකා මහොසධොති
යදි තෙ මන්තයිතං ජනින්ද දෙසං,
හරියාය රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

5871. යං සාලවනස්මිං සෙනකො
පාපකම්මං අකාසි අසඛ්හිරූපං,
සබ්බොව රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

5872. පුන්නකුසපුරිසස්ස තෙ ජනින්ද
උපපන්නො රොගො අරාජයුත්තො,[4]
භාතුවච රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

5873. ආබාධොයං[5] අසඛ්හිරූපො
කාවින්දෙ නරදෙවෙන ඵුට්ඨො,
පුන්නස්ස රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

5874. අට්ඨවඩ්ඪං මණිරතනං උළාරං
සකෙතා තෙ අදද පිතාමහස්ස,
දෙවින්දස්ස ගතං තදජ්ජ හත්ථං
මාතුවච රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

5875. ගුය්හස්ස හි ගුය්හමෙව සාධු
න හි ගුය්හස්ස පසත්ථමාවිකම්මං,
අනිජ්ඣාදය[6] සහෙය්‍ය ධීරො
නිජ්ඣත්තකථා යථාසුඛං භණෙය්‍ය.

---

1. චින්තයමානො – මජ්ඣං. සය්හා. වී.
2. එහිසි – මජ්ඣං. සය්හා.
3. කිං සඞ්කතෙ – මජ්ඣං. සය්හා.
4. අරාජපත්තො – මජ්ඣං. සය්හා.
5. ආබාධායං – මජ්ඣං. සය්හා.
6. අනිජ්ඣායකාය – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5868. මහාප්‍රාඥ වූ මහෞෂධ පණ්ඩිත මැරිය යුතුය යි මා විසින් වධයට අණ කරන ලද්දේ ය. ඒ ගැන සිතමින් දෙමනස් වූයෙමි වෙමි. දේවීය, ඔබ කළ අපරාධයෙක් නැත යි රජතෙමේ කීය.

5869. මහාප්‍රාඥය, ඊයේ ගියා වූ තෙපි දැන් එන්නහු ය. කුමක් අසා තොපගේ සිත කුමකට සැක කෙරේ ද? කවරෙක් තොපට කුමක් කීයේ ද? එකාන්තයෙන් ඒ වචනය මට කියව, එය අසන්නෙමි යි වෙදෙහ රජ මහෞෂධ පඬිතුමාගෙන් පිළිවිසි.

5870. (මහෞෂධ) මහරජ, මහෞෂධ පණ්ඩිත මැරිය යුතු යැ යි ඉදින් ඔබ විසින් සේනකාදීන් සමඟ මන්ත්‍රණය කරන ලද ද. රැයෙහි හුදෙකලා වූයේ බිරිඳට එය කීහ. ඔබ විසින් හෙළිකළ ඒ රහස මා විසින් අසන ලද්දේ ය.

5871. සේනක තෙමේ සල් උයනැ සිටැ යම් ලාමක වූ පාප කර්මයක් කළේ ද, එය මිත්‍රයකුට කීයේ ය. ඒ හෙළි කළ රහස මා විසින් අසන ලදී.

5872. මහරජ, ඔබ ගේ පුක්කුස නම් වූ රාජපුරුෂයාට රජුන් විසින් නො ළං විය යුතු රෝගයෙක් උපන. හේ රහසිගත වැ සෝවුරාට කීයේ ය. එසේ රහස හෙළි කිරීම මා විසින් අසන ලදී.

5873. කාවින්දයා නරදේව නම් යකකු විසින් ස්පර්ශ කරන ලද්දේ ය. මේ ආබාධය නො සරුප් සබා ඇත්තේ ය. හේ එය රහසිගත වැ පුත්‍රයාට කීයේ ය. එසේ රහස හෙළි කිරීම මා විසින් අසන ලදී.

5874. සක්දෙව්රජ ඔබගේ මී මුත්තණුවනට මහඟු අෂ්ටවඩා නම් මාණික්‍ය රත්නයක් දුන්නේ ය. ඒ මිණි රුවන දැන් දෙව්දැයා අතට පත්වැ ඇත. හේ එය මවට රහසේ කීය. රහස හෙළි කිරීම මා විසින් අසන ලදී.

5875. සැහැවිය යුක්ත සැහැවීම මැ මැනැවි. රහස හෙළි කිරීම් ප්‍රශස්ත නොවේ. නුවණැත්තේ කාය්‍ය නිෂ්පත්තිය නොවූ රහස දරන්නේ ය. කාය්‍ය සංසිද්ධියෙන් ඉක්බිති වැ රිසිසේ කියන්නේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5876. න ගුය්හමත්ථං විවරෙය්‍ය රක්ඛෙය්‍ය නං යථා නීධිං,
න හි පාතුකතො සාධු ගුය්හො අත්ථො පජානතා.

5877. ථීයා ගුය්හං න සංසෙය්‍ය අමිත්තස්ස ච පණ්ඩිතො,
යො චාමිසෙන සංහීරො හදයත්ථෙනො ච යො නරො.

5878. ගුය්හමත්ථමසම්බුද්ධං සම්බොධයති යො නරො,
මන්තභෙදභයා තස්ස දාසභූතො තිතික්ඛති.

5879. යාවන්තො පුරිසස්සත්ථං ගුය්හං ජානන්ති මන්තිනං,
තාවන්තො තස්ස උබ්බෙගා තස්මා ගුය්හං න විස්සජෙ.

5880. විච්චව භාසෙය්‍ය දිවා රහස්සං
රත්තිං ගිරං නාතිවෙල පමුඤ්චෙ,
උපස්සුතිකා හි සුණන්ති මන්තං
තස්මා මන්තො ඛිප්පමුපෙති භෙදං.

වීසතිනිපාතෙ පඤ්චපණ්ඩිතපඤ්හො.

5881. පඤ්චාලො සබ්බසෙනාය බ්‍රහ්මදත්තො සමාගතො,
සායං පඤ්චාලියා සෙනා අප්පමෙය්‍යා මහොසධ.

5882. පිට්ඨිමතී පත්තිමතී සබ්බසඞ්ගාමකොවිදා,
ඔහාරිනී සද්දවතී භෙරිසඞ්ඛප්පබොධනා.

5883. ලොහවිජ්ජාලඞ්කාරාභා[1] ධජිනී[2] වාමරොහිණී
සිප්පියෙහි සුසම්පන්නා සූරෙහි සුප්පතිට්ඨිතා.

5884. දසෙත්ථ පණ්ඩිතා ආහු භූරිපඤ්ඤා රහොගමා,[3]
මාතා ඒකාදසී රඤ්ඤො පඤ්චාලියං පසාසති.

5885. අථෙත්ථෙකසතං ඛත්‍යා අනුයුත්තා යසස්සිනො,
අවජ්ඣන්නරට්ඨා ඛ්‍යථිතා පඤ්චාලීනං වසංගතා.

---

1. අලඞ්කාරා – මජසං. ස්‍යා.
2. විජිනී – මජසං.
3. රහොගතා – මජසං

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5876. සැහැවිය යුත්ත හෙළි නො කටයුත්තේ ය. එද නිධානයක් සේ ආරක්ෂා කළ යුතු ය. නුවණැත්තහු විසින් රහස් හෙළි කිරීම උචිත නොවේ.

5877. නුවණැත්තා ස්ත්‍රියට ද හතුරාට ද යමෙක් ආමිෂ හේතුයෙන් පෙළඹේ නම් ඔහුට ද කෙරාටික සිතැත්තාට ද (රහස් හෙළි නො කරන්නේ ය.)

5878. යම් මිනිසෙක් අනුන් විසින් නො දත යුතු රහසක් (යමකුට) කීයේ නම් රහස් හෙළිවේ ය යන බියෙන් හෝ ඔහුගේ දසයකු සෙයින් සියල්ල ඉවසයි.

5879. මන්ත්‍රණය කළවුන් අතර යම් තැක් දෙනා ඔහුගේ රහස් දනිත් ද, ඔහුට එපමණ තැති ගැනුම් ඇති වේ. එනිසා රහස නො හළ යුත්තේ ය. හෙළි නො කළ යුත්තේ ය.

5880. රහස දවල් කාලයෙහි විවේක වැ කියැ යුත්තේ ය. රෑයෙහි සීමාව ඉක්ම වූ වචන (හඬ නගා) නො කියන්නේ ය. අසලැ සිටින්නෝ ඒකාන්තයෙන් මන්ත්‍රණය ශ්‍රවණය කරන්නාහ. එයින් මන්ත්‍රණය භේදයට පැමිණෙයි.

පඤ්චපණ්ඩිත ප්‍රශ්නය යි.

5881. මහෞෂධ පණ්ඩිතය, පඤ්චාල දේශවාසී බ්‍රහ්මදත්ත රජ සියලු බළ සෙනහ සමග ආයේ ය. ඒ මේ පඤ්චාල රජු සතු සේනාව අපමණ ය.

5882. ඒ සේනා තොමෝ පිටින් ගෙනා දැව ඇති වඩු සේනාවෙන් යුක්ත ය, පාබළ සෙනඟින් යුක්තය, සකල සංග්‍රාමොපායයන්හි දක්ෂය. සතුරන් හිස් සිඳලීමෙහි දක්ෂය, දශවිධ ශබ්දයෙන් හා බෙර සක් හඬින් ද ප්‍රබෝධවත් ය.

5883. ලොහවිද්‍යාවෙන් නිර්මිත වූ කවච ආදියෙන් හා ආභරණයන්ගෙන් බබළන්නීය. ධජ පතාකයන්ගෙන් ද වමින් නැඟිය යුතු ඇතුන් හා අසුන්ගෙන් ද විවිධ ශිල්පින්ගෙන් ද යුක්ත වූවාය. අති දක්ෂ යෝධයන්ගෙන් මනාව පිහිටියා ය.

5884. මෙ මැ සේනාවෙහි මහාප්‍රාඥ වූ රහස් මන්ත්‍රණ ඇති දශ පණ්ඩිත කෙනෙක් වෙති. රජුගේ මව ද එකොළොස්වැන්නී වූවා පඤ්චාලසේනාවට අනුශාසනා කරයි.

5885. තව ද රටවල් පැහැර ගැන්මෙන් පෙළුණු පඤ්චාලීනට යටත් වූ යසස් ඇති එක්සියයක් රජදරුවෝ ද මෙහි බ්‍රහ්මදත්ත රජුට අනුගත වැ සිටිත්.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5886. යංවද තක්කරා රඤ්ඤෝ අකාමා පියභාණිනෝ,
පඤ්චාලමනුයායන්ති අකාමා වසිනෝ ගතා.

5887. තාය සේනාය මිථිලා නියන්ති පරිවාරිතා,
රාජධානී[1] විදේහානං සමන්තා පරිඛඤ්ඤති.

5888. උද්ධං තාරකජාතාව සමන්තා පරිවාරිතා,
මහොසධ විජානාහි කථං මොක්ඛා භවිස්සති.

5889. පාදේ දෙව පසාරෙහි භුඤ්ජ කාමේ රමස්සු ච,
හිත්වා පඤ්චාලියං සේනං බ්‍රහ්මදත්තෝ පලායති.[2]

5890. රාජා සඤ්චකාමෝ තෙ රතනානි පවච්ඡති,
ආගච්ඡන්තු තතෝ දූතා මඤ්ජුකා පියභාණිනෝ.

5891. භාසන්තු මුදුකා[3] වාචා යා වාචා පටිනන්දිතා,
පඤ්චාලා ච විදේහා ච උභෝ එකා භවන්තු තෙ.

5892. කථන්නු කෙවට්ට මහොසධේන
සමාගමෝ ආසි තදිඞ්ඝ බ්‍රූහි.
කච්චි තෙ පටිනිජ්ඣත්තෝ කච්චි තුට්ඨෝ මහොසධෝ.

5893. අනරියරූපෝ පුරිසෝ ජනින්ද,
අසඤ්ඤමාදකෝ ථද්ධෝ අසබ්භිරූපෝ.
යථා මූගෝ ච බධිරෝ ච න කිඤ්චිඤ්ඤං අභාසථ.

5894. අද්ධා ඉදං මන්තපදං සුදුද්දසං
අත්ථෝ සුද්ධෝ නරවීරියෙන[4] දිට්ඨෝ,
තථා හි කායෝ මම සම්පවේධති[5]
හිත්වා සයං කෝ පරහත්ථමේස්සති.

5895. ඤාණං හි එකාව මතී සමේති
යෙ පණ්ඩිතා උත්තමභූරිපඤ්ඤා,
යානං අයානං අථවාපි ඨානං
මහොසධ ත්වම්පි මතිං කරොහි.

5896. ජානාසි ඛෝ රාජ මහානුභාවෝ
මහබ්බලෝ චූළනිබ්‍රහ්මදත්තෝ.
රාජා ච තං ඉච්ඡති කාරණත්ථං
මිගං[6] යථා ඔකචරෙන[7] ලුද්ධෝ.

---

1. රාජධානිං – මජ්ඣං.
2. පලායිත්ථ – මජ්ඣං.
3. ථුදුතා – මජ්ඣං.
4. නරවීරෙන – මජ්ඣං. සී්‍ය.
5. වෙධතෙ – මජ්ඣං.
6. මගං – මජ්ඣං.
7. ඔකකචරෙන – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5886. යමක් කියන්නාහු නම් එය කරන්නා වූ රජුට නොකැමැත්තෙන් නමුදු ප්‍රිය වචන කියන්නා වූ නොකැමැත්තෙන් යටත්වූවෝ ද පඤ්චාලරජු අනුව යති.

5887. ඒ (සිවුරහ) සේනාවෙන් මිථිලා පුරය ත්‍රිසන්ධියෙකින් වටකරන ලද්දේ ය. විදේහයන්ගේ රාජධානිය හාත්පසින් කණිනු ලැබේ.

5888. මස්තකයෙහි තාරකා පහළ වූවාක් සෙයින් (දඩු වැට පහන් ගෙන) හාත්පසින් වටකරන ලදය. මහෞෂධයෙනි කෙසේ මිදීම වන්නේ දැයි දනුව. මෙසේ වේදෙහ රජ පිළිවිසි.

5889. දේවයන් වහන්ස, පා දිගු කළ මැනව. කාමයන් අනුභව කළ මැනව. සිත් අලවා වෙසෙනු මැනව. පඤ්චාලීය සේනාව හැර දමා බ්‍රහ්මදත්තරජ පලායන්නේ ය යි මහෞෂධ පණ්ඩිතයෝ කීය.

5890. (කේවට්ට) සමඟිය කැමැති (බ්‍රහ්මදත්ත) රජ තෙමේ ඔබ වහන්සේට රත්නයන් (පඩුරු කොටැ) එවන්නේ ය. පඤ්චාල නගරයේ සිට මිහිරි වූ ප්‍රියවචන ඇති දූතයෝ ද එත්වා.

5891. යම් බසක් සතුට ඇති කෙරේ ද එ බඳු මෘදු වචන මැ තෙපලත්වා. පඤ්චාලයෝ ද විදෙහයෝ ද යන දෙ පස එකමුකු වෙත්වා. (සමගි වෙත්වා.)

5892. (වෙදෙහරජ) කෙසේ ද කේවට්ටය, මහොසධයන් හා සමඟිය වී ද, කිම තෙපි කමා කරනු ලැබූහු ද, කිම මහොසධයෝ තුටු වූහු ද? (තොරතුරු) මට කියව.

5893. මහරජ, හේ අනායත්‍යසචරූප ඇති පුරුෂයෙකි. සතුටු කථා නැත්තෙකි. උඩඟු වූවෙකි. අපණ්ඩිතසවභාව ඇත්තේ ය. ගොළුවකු සේද බිහිරකු සේද කියිත් නොතෙපළේ ය යි කේවට්ට කීය.

5894. රජ මෙසේ සිතයි. ඒකාන්තයෙන් මේ මන්ත්‍රපදය දක්නට ඉතා අපහසුය. නරවීරයා (මහෞෂධ) විසින් මෙහි යථාර්ථය දක්නා ලද්දේ ය. ඒ එසේමැ යි. මා ගත වෙවුල යි. සියරට හැර කවරෙක් නම් තෙමේ මැ මෙරමා අතට පත්වන්නේ ද?

5895. (රජ) නුවණින් ඉතා උතුම් තැනට පත් යම් පණ්ඩිත කෙනෙක් වෙත් ද ඒ අප සදෙනාගේ ම අදහස සම වෙයි. මහෞෂධය, (පඤ්චාල නුවරට) යාම හෝ නොයාම හෝ මෙහි සිටීම හෝ පිළිබඳ වැ තෙපි දු අදහසක් ප්‍රකාශ කරව.

5896. (මහෞෂධ) මහරජ, චූළනීබ්‍රහ්මදත්ත රජ මහත් බල ඇත්තෙක, මහත් අනුභාව ඇත්තෙකැ යි දන්නෙහි. වැද්දකු දඩ මුවකු කරණ කොටගෙන අල්ලාගත් මුවකු මෙන් බ්‍රහ්මදත්තරජ ද ඔබ මරනු රිසි වෙයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5897. යථාපි මච්ඡො බළිසං වඩකං මංසෙන ඡාදිතං,
ආමගිද්ධො න ජානාති මච්ඡො මරණමත්තනො.

5898. එවමෙව තුවං රාජ චූළනීයස්ස[1] ධීතරං,
කාමගිද්ධො න ජානාසි මච්ඡොව මරණමත්තනො.

5899. සචෙ ගච්ඡසි පඤ්චාලං ඛිප්පමත්තං ජහිස්සසි,
මීගං පථානුපත්තංව[2] මහන්තං භයමෙස්සති.

5900. මයමෙව බාලම්හසෙ එළමූගා
යෙ උත්තමත්ථානි තයී ලපිම්හ,
කිමෙව ත්වං නඞ්ගලකොටිවද්ධො[3]
අත්ථානි ජානාසි යථාපි අඤ්ඤෙ.

5901. ඉමං ගලෙ ගහෙත්වාන නාසෙථ විජිතා මම,
යො මෙ රතනලාභස්ස අන්තරායාය භාසති.

5902. තතො ච සො අපක්කම්ම වෙදෙහස්ස උපන්තිකා,
අථ ආමන්තයී දූතං මාඪරං[4] සුවපණ්ඩිතං.

5903. එහි සම්ම හරීපක්ඛ[5] වෙය්‍යාවච්චං කරොහි මෙ,
අත්ථි පඤ්චාලරාජස්ස සාළිකා සයනපාලිකා.

5904. තං පත්ථරෙන[6] පුච්ඡස්සු සා හි සබ්බස්ස කොවිද,
සා තෙසං සබ්බං ජානාති රඤ්ඤෙ ච කොසියස්ස ච.

5905. ආමොති සො පටිස්සුත්වා මාඪරො සුවපණ්ඩිතො,
අගමාසි හරීපක්ඛො සාළිකාය උපන්තිකං.

5906. තතො, ච ඛො සො ගන්ත්වාන මාඪරො සුවපණ්ඩිතො,
අථ ආමන්තයී සුඝරං සාළිකං මඤ්ජුභාණිකං.

5907. කච්චි තෙ සුඝරෙ ඛමනීයං කච්චි වෙස්සෙ[7] අනාමයං,
කච්චි තෙ මධුනා ලාජා ලබ්භතෙ සුඝරෙ තව.

5908. කුසලඤ්චෙව මෙ සම්ම අථො සම්ම අනාමයං,
අථො මෙ මධුනා ලාජා ලබ්භතෙ සුවපණ්ඩිත.

---

1. චූළනෙය්‍යස්ස – මජ්ඣං.
2. පන්ථානු – මජ්ඣං. වි.
3. වඩ්ඪො – මජ්ඣං.
4. මාධරං – මජ්ඣං. මාධුරං – ස්‍යා.
5. හරිතපක්ඛ – මජ්ඣං. ස්‍යා.
6. බන්ධනෙන – මජ්ඣං. පත්ථරනෙ – ස්‍යා. සත්ථවෙන – ස්‍යා.
7. වෙසෙ – මජ්ඣං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5897. යම් සේ මත්ස්‍යයෙක් මසින් වැසුණු වක් වූ බිළිය ගිලිද, ඇමට ගිජු ඒ මත්ස්‍ය තෙමේ තමා ගේ මරණය නො දකීද,

5898. එසේ මැ මහරජ, කාමයෙහි ගිජු වූ ඔබ ද මත්ස්‍යයා තමා ගේ මරණය නො දන්නා සේ වූළනීරජුගේ දුව (පිළිබඳ කාරණය) නො දන්නාහු ය.

5899. ඉදින් ඔබ පඤ්චාල නුවරට යන්නහු නම් වහා සිය දිවි හරනහු ය. ගම්දෙර මගටවන් මුවකු සේ මහත් බියට පැමිණෙන්නහු ය.

5900. (රජ) යම් කෙනෙක් මඩගලාඥියන් පිළිබඳවැ තා සමඟ කථා කළෝ ද ඒ අපි මැ මෝඩ කෙළතොල්ලෝ වෙමු. නඟුල් කෙළවර ගෙනැ වැඩුනා වූ තෝ කෙසේ නම් අන්‍ය (කේවට්ටාදි) පණ්ඩිතයන් සේ උත්තමාඥියන් දන්නෙහි ද?

5901. යමෙක් මගේ රත්නලාභයට අන්තරාය පිණිස කථා කරයි ද ඒ මොහු ගෙලෙන් ගෙනැ මගේ රටින් නෙරවූ.

5902. ඉක්ඛිති හෙතෙම (මහෞෂධ පණ්ඩිත) වේදේහ රජු වෙතින් ඉවත් වැ ගොස් පණ්ඩුවඩකරු වූ මාඨර නම් ගිරා පණ්ඩිතයන් ඇමති ය:

5903. යහළු රන්වන් පියාපත් ඇත්ත, මෙහි එව. මට එක් මෙහෙවරක් කරන්නෙහි ය. පඤ්චාල රජුට යහන් බලන එක් සැළලිහිණියක් ඇත.

5904. ඕ තොමෝ සියල්ලෙහි දක්ෂ වන්නී ය. ඇය රහසින් විහරව. රජුත් කේවට්ටයාත් අතර (වන) සියලු මන්ත්‍රණ ඕ දන්නී ය.

5905. සුවර්ණවර්ණ පක්ෂ පත්‍ර ඇති මාඨර නම් ගිරා පණ්ඩිතයා ද එසේ ය යි පිළිගෙන ශාරිකාව වෙතැ ගියේ ය.

5906. ගිරා පණ්ඩිතයා ද එතැනින් පිටත් වැ ගොස් ඉක්බිති රන් මැදිරියේ වෙසෙන මිහිරි සේ බෙණෙන ශාරිකාව ඇමතී ය:

5907. රන් මැදිරියේ වෙසෙන්නිය, තිගේ සුව කෙසේ ද? වෛශ්‍ය කුලයෙහි උපන්න, කිම නිරොග වැ වෙසෙන්නී ද? රන් මැදිරියේ වෙසෙන ඒ මී මුසු විලඳ ලබන්නී ද?

5908. (සැළලිහිණිය) යහළු, මම සුවසේ ද නිරොග වැ ද වෙසෙමි. නවද, ගිරා පණ්ඩිතය, මට විලඳ හා මී ද ලැබේ.

5909. කුතෝ නු සම්ම ආගම්ම කඤ්ඤ වා පභිතෝ කුවං,
න ච මෙසි ඉතෝ පුබ්බෙ දිට්ඨා වා යදි වා සුතෝ.

5910. අහොසිං සිවිරාජඤ්ඤ පාසාදෙ සයනපාලකෝ,
තතෝ සෝ ධම්මිකෝ රාජා බ්‍රහ්මදත්ත[1] මොවෙසි බන්ධනා.

5911. තඤ්ඤ මෙකා දුතියාසි සාළිකා මඤ්ජුභාණිකා,
තං තත්‍රා අවධී සෙනෝ පෙක්ඛතෝ සුසරෙ මම.

5912. තඤ්ඤා කාමා හි සම්මත්තෝ ආගතොඤ්මී තවන්තිකෙ,
සචෙ කරෙය්‍යාසි ඔකාසං උභයොව වසාමසෙ.

5913. සුවොව සුවිං කාමෙය්‍ය සාළිකෝ පන සාළිකං,
සුවඤ්ඤ සාළිකාය ච[2] සංවාසෝ හොති කීදිසෝ.

5914. යං යං කාමී කාමයති[3] අපි චණ්ඩාලිකාමපි,
සබ්බෙහි සදිසෝ හොති නත්ථි කාමෙ අසාදිසෝ.

5915. අත්ථි ජම්බාවතී නාම මාතා සිවිඤ්ඤ[4] රාජිනෝ,
සා භරියා වාසුදෙවඤ්ඤ කණ්හඤ්ඤ මහෙසි පියා.

5916. රථාවතී කිම්පුරිසී සාපි වච්ඡං අකාමයි,
මනුඤ්ඤා මිගියා සද්ධිං නත්ථි කාමෙ අසාදිසෝ.

5917. හන්ද බොහං ගමිස්සාමි සාළිකෙ මංසුභාණිකෙ,
පච්චක්ඛානුපදං හෙතං අතිමඤ්ඤසි නූන මං.

5918. න සිරී තරමානඤ්ඤ මාඨර සුවපණ්ඩිත,
ඉධෙව තාව අච්ඡස්සු යාව රාජානං දක්ඛසි,
සොඤ්ඤසි[5] සද්දං මුනිඛ්‍යානං ආනුභාවඤ්ච රාජිනෝ.

5919. යො නු බොයං තිමක්ඛා සඤ්ඤ තිරොජනපදෙ සුතෝ,
යිතා පඤ්චාලරාජඤ්ඤ ඔසධී විය වණ්ණිනී;
තං දඤ්ඤති විදෙහානං සෝ විවාහෝ භවිඤ්ඤති.

5920. නෙදිසෝ[6] තෙ අම්හඤ්ඤානං විවාහෝ භොතු මාඨර,
යථා පඤ්චාලරාජඤ්ඤ වෙදෙහෙන භවිඤ්ඤති.

---

1. බ්‍රහ්මදත්ත – මජ්ඣං.
2. සාළිකායෙව – මජ්ඣං.
3. යොයං කාමෙ කාමයති – මජ්ඣං. ඤ්‍යා.
4. සිබ්බිඤ්ඤය – අට්ඨකථා
5. සොසි – මජ්ඣං. ඤ්‍යා.
6. එදිසෝ – මජ්ඣං. ඤ්‍යා. ව්.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5909. යහළු, තෙපි කොහි සිට පැමිණ සිටින්නහු ද, කවුරුන් විසින් එවන ලද්දහු ද, මින් පෙර තෙපි දක්නා ලද හෝ අසන ලද හෝ නො වෙමි.

5910. (ගිරාපණ්ඩිත) මම සිවිරජුගේ ප්‍රාසාදයෙහි ශයන පාලකයා වීමි. ඒ දැහැමි රජ බැලුමහි සිටියවුන් බැලුමින් මිදී ය.

5911. පියබස් බෙණෙන එක් සැළලිහිණියක් මට බිරිඳ වූවා ය. මා රන්මැදිරියේ බලා සිටිය දී ම ඕ උකුස්සකු විසින් මරණ ලද්දී ය.

5912. ඈ පිළිබඳ කාමයෙන් මත්වූයෙමි. තී සමීපයට ආයෙමි. ඉදින් අවසර ලබන්නෙමි නම් අපි දෙදෙන එක් වැ වසමු.

5913. (සැළලිහිණිය) ගිරවා ගිරවියක ද, සැළලිහිණියා සැළලිහිණියක ද කැමැති වන්නෝ ය. ගිරවකු හා සැළලිහිණියක අතර කෙබඳු සංවාසයෙක් ද?

5914. කාමියෙක් යමක කැමැත්තේ නම් ඇය සැඩොලක වුව ද කැමැති වන්නේ ය. තවද කාම සේවනයෙහිදී සියල්ලෝ මැසම වන්නෝ ය. අසමානයෝ නැත්තාහ යි ගිරා පණ්ඩිත කීය.

5915. සිවි රජු ගේ මවු තොමෝ ජඞ්ඝාවතී නම් සැඩොලක් වූවා ය. ඕ කෘෂ්ණගොත්‍රයේ උපන් වාසුදේව රජුගේ ප්‍රිය බිරිඳ ද අගමෙහෙසිය ද වූවා ය.

5916. පෙර රථාවතී නම් කිඳුරියක් වූවා ය. ඕ තොමෝ වඥ නම් තවුසකු කැමැති කරවාගත්තා ය. මනුෂ්‍යයෙක් තිරිසනක සමග වාසය කළේ ය. කාමයෙහි අසමානබවක් නැත.

5917. මිහිරිබස් ඇති ශාරිකාව, එසේ නම් මම යන්නෙමි. මේ සියල්ල තී හැර දැමීමට කරුණු ය. තෝ මා ඉක්මවා සිතන්නෙහි.

5918. (සැළලිහිණිය) ගිරා පණ්ඩිතය, ඉක්මන් නැනැත්තාට ශ්‍රී තොමෝ දුරු වන්නී ය. එ නිසා රජු දක්නා තෙක් මෙහි රැඳෙව. මිහිඟු බෙර හඬ අසන්නෙහි ය. රජුගේ අනුභාව දක්නෙහි ය.

5919. (ගිරාපණ්ඩිත) පඤ්චාලරජු ගේ, ඔසයිතාරකාව සේ රුසිරින් වොරදනා දුකුමරිය වේදේහරජුට දෙන්නේ ය යන මහත් සෝඹාවක් පසල්දනවුවල දී අසන ලද්දේය. ඒ විවාහය සිදුවන්නේ ද?

5920. (සැළලිහිණිය) මාඩරය, යම් සේ වෙදෙහ රජු හා පඤ්චාලරජුගේ මෙන් තොපගේ පසමිතුරන් අතර හෝ එබඳු විවාහයෙක් නො වේවා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5921. ආනයිත්වාන වෙදෙහං පඤ්චාලානං රථෙසභො,
තතො නං සාතයිස්සති නාස්ස සක්ඛි භවිස්සති.

5922. හන්ද ඛො මං අනුජානාහි රත්තියො සත්තමත්තියො,
යාවාහං සිව්රාජස්ස ආරොචෙමි මහෙසිනො,
ලද්ධො ච මෙ ආවසථො සාළිකාය උපනත්තිකං.

5923. හන්ද ඛො තං අනුජානාමි රත්තියො සත්තමත්තියො,
සචෙ ත්වං සත්තරත්තෙන නාගච්ඡසි මමන්තිකෙ;
මඤ්ඤෙ ඔක්කන්තසත්තං මං මතාය ආගමිස්සසි.

5924. තතො ච ඛො සො ගන්ත්වාන මාඨරො සුවපණ්ඩිතො,
මහොසධස්ස අක්ඛාසි සාළියා[1] වචනං ඉදං.

5925. යස්සෙව සරෙ භුඤ්ජෙය්‍ය භොගං,
තස්සෙව අත්ථං පුරිසො චරෙය්‍ය.

5926. හන්දහං ගච්ඡාමි පුරෙ ජනින්ද,
පඤ්චාලරාජස්ස පුරං සුරම්මං;
නිවෙසනානි මාපෙතුං වෙදෙහස්ස යසස්සිනො.

5927. නිවෙසනානි මාපෙත්වා වෙදෙහස්ස යසස්සිනො,
යද තෙ පහිණෙය්‍යාමි තද එය්‍යාසි ඛත්තිය.

5928. තතො ච පායාසි පුරෙ මහොසධො,
පඤ්චාලරාජස්ස පුරං සුරම්මං;
නිවෙසනානි මාපෙතුං වෙදෙහස්ස යසස්සිනො.

5929. නිවෙසනානි මාපෙත්වා වෙදෙහස්ස යසස්සිනො;
අථස්ස පහිණී දූතං (වෙදෙහං මිථිලග්ගහං.)
එහිදනි මහාරාජ මාපිතං තෙ නිවෙසනං.

5930. තතො ච රාජා පායාසි සෙනාය චතුරඞ්ගියා,
අනන්තවාහනං දට්ඨුං ඵීතං කම්පිල්ලියං පුරං.

5931. තතො ච ඛො සො ගන්ත්වාන බ්‍රහ්මදත්තස්ස පාහිණී,
ආගතොස්මි මහාරාජ තව පාදනි වන්දිතුං.

5932. දදහිදනි මෙ භරියං නාරිං සබ්බඞ්ගසොභිනිං,
සුවණ්ණෙන පටිච්ඡන්නං දසීගණපුරක්ඛතං.

5933. ස්වාගතං තෙ වෙදෙහ අථො තෙ අදුරාගතං,
නක්ඛත්තඤ්ඤෙව පරිපුච්ඡ අහං කඤ්ඤං දදමි තෙ;
සුවණ්ණෙන පටිච්ඡන්නං දසීගණපුරක්ඛතං.

---

1. සාළිකාය – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5921. පඤ්චාලරජ වේදේහ රජු මෙහි ගෙන්වා නසන්නේ ය. වේදේහරජු සමග මිතුරු බවක් නම් නො වන්නේ ය.

5922. (ගිරාපණ්ඩිත) ශාරිකා සමීපයෙහි විසීමට මා අවස්ථාව ලද යි සිව්රජුට හා මෙහෙසියට දන්වා එනතෙක් සත් රැයකට මට අවසර දෙව.

5923. එසේ නම් ම විසින් අනුමත කළ තොප සත් රැයකින් (ආපසු) මා වෙත නො පැමිණියහොත් මගේ මළගමට පැමිණෙන්නට ලැබෙන්නේ යැ යි සිතනු යි ශාරිකා කීය.

5924. ඉක්බිති මාඝර නම් ගිරා පණ්ඩිත තෙමේ එතැනින් පිටත් වැ ගොස් ශාරිකාවගේ වචනය මහෞෂධ පණ්ඩිතයනට කීයේ ය.

5925. යමකු ගේ ගෘහයෙහි සම්පත්තීන් අනුභව කරන්නේ නම් සත්පුරුෂතෙමේ ඔහු ගේ මැ අර්ථය උදෙසා ක්‍රියා කරන්නේ ය.

5926. මහරජ, එසේනම් මම පළමු කොට යශස් ඇති වේදේහ රජුට (ඔබට) නිවෙස් තැනීමට පඤ්චාලරජු ගේ රමණීය පුරවරයට යන්නෙමි.

5927. මහරජ, ඉසුරුමත් වේදේහයනට නිවෙස් මවා යම් දිනෙක ඔබට පණිවුඩයක් එවන්නෙම් ද එකලැ එහි පැමිණෙනු මැනැවි.

5928. ඉසුරුමත් වේදේහ රජුට නිවෙස් තැනීමට මහෞෂධ පඬිතුමා පළමුව පඤ්චාලරජුගේ රමණීය පුරවරයට ගියේ ය.

5929. වේදේහරජුට නිවෙස් සාදා ඉක්බිති වැ ''මහරජ ඔබට නිවෙස් මැවීමි. පැමිණෙනු මැනැවැ'' යි (මිථිලාධිපති වෙදෙහ රජුට) පණිවුඩකරුවකු යැවී ය.

5930. ඉක්බිති වේදේහ රජ තෙමේ සිවුරහ සෙනහ සමග අප්‍රමාණ වූ අශ්වාදී සේනාවන් ඇති සමෘද්ධිමත් කම්පිල්ලිය නගරය දක්නා පිණිස පිටත්විය.

5931. ඉක්බිති වේදේහරජ එහි ගොස් ''මහරජ ඔබ ගේ පා වැඳුමට ආයෙමි'' යි බඹදත්රජුට හසුන් යැවී ය.

5932. සකල ස්ත්‍රී ලක්ෂණයන්ගෙන් ශෝභමාන වූ කන්‍යාව (ඔබ දියණිය) රනින් සරසා දැසිදස් සමූහයා විසින් පෙරටු කරන ලදුවැ මගේ බිරිඳ ලෙස දැන් එවුව මැනැව.

5933. වේදේහය, ඔබේ පැමිණීම ශුභ සම්ප්‍රාප්තියෙකි. තව ද නපුරු කොටැ ඊමෙක් ද නොවේ. නැකැත් පමණක් විමසව. රනින් සැරසූ දියණිය දැසි දස් ගණයා පෙරටු කොටැ ඔබට දෙන්නෙමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5934. තතො ච රාජා වෙදෙහො නක්ඛත්තං පරිපුච්ඡථ,
නක්ඛත්තං පරිපුච්ඡිත්වා බ්‍රහ්මදත්තස්ස පාහිණි.

5935. දදාහිදානි මෙ භරියං නාරිං සබ්බඞ්ගසොභිනිං,
සුවණ්ණෙන පටිච්ඡන්නං දසීගණපුරක්ඛතං.

5936. දදාමිදානි තෙ භරියං නාරිං සබ්බඞ්ගසොභිනිං,
සුවණ්ණෙන පටිච්ඡන්නං දසීගණපුරක්ඛතං.

5937. හත්ථී අස්සා රථා පත්ති සෙනා තිට්ඨන්ති වම්මිතා[1],
උක්කා පදිත්තා ඣායන්ති කින්නු මඤ්ඤන්ති පණ්ඩිතා.

5938. හත්ථී අස්සා රථා පත්ති සෙනා තිට්ඨන්ති වම්මිතා,
උක්කා පදිත්තා ඣායන්ති කින්නු කාහන්ති පණ්ඩිතා.

5939. රක්ඛති තං මහාරාජ චූළනීයො මහබ්බලො,
පදුට්ඨො තෙ බ්‍රහ්මදත්තො පාතො තං ඝාතයිස්සති.

5940. උබ්බෙධතෙ[2] මෙ හදයං මුඛඤ්ච පරිසුස්සති,
නිබ්බුතිං නාධිගච්ඡාමි අග්ගිදඩ්ඪොව ආතපෙ.

5941. කම්මාරානං යථා උක්කා අන්තො ඣායති නො බහි,
එවම්පි හදයං මය්හං අන්තො ඣායති නො බහි.

5942. පමත්තො මන්තනාතීතො භින්නමන්තොසි ඛත්තිය,
ඉදානි ඛො තං තායන්තු පණ්ඩිතා මන්තිනො ජනා.

5943. අකත්වාමච්චස්ස වචනං අත්ථකාමහිතෙසිනො,
අත්තපීතිරතො රාජ මිගො කූටෙව ඔහිතො.

5944. යථාපි මච්ඡො බළිසං වඩ්කං මංසෙන ඡාදිතං,
ආමගිද්ධො න ජානාති මච්ඡො මරණමත්තනො.

5945. එවමෙව තුවං රාජ චූළනෙය්‍යස්ස ධීතරං,
කාමගිද්ධො න ජානාසි මච්ඡොව මරණමත්තනො.

5946. සචෙ ගච්ඡසි පඤ්චාලං බිප්පමත්තං[3] ජහෙස්සසි,[4]
මිගං පථානුපන්නංව[5] මහන්තං භයමෙස්සති.[6]

---

1. වම්මිකා – මජසං.
2. උබ්බෙධති – මජසං. වී.
3. බිප්පමත්ථං – මජසං.
4. ජහිස්සසි – මජසං. ස්‍යා.
5. පත්ථානු – මජසං. ස්‍යා.
6. භයමෙස්සසි – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5934. ඉක්බිති වේදේහ රජ නකත් විචාළේ ය. නකත් විචාරා බ්‍රහ්මදත්ත රජුට හසුන් යැවී ය.

5935. සකල ස්ත්‍රී ලක්ෂණයන්ගෙන් ශෝභමාන වූ කන්‍යාව රනින් සරසා දැසි දස්සන් පෙරටු කොටැ මගේ බිරිඳ ලෙසින් දුන් එවනු මැනැයි දූතයන් යැවී.

5936. සකල ස්ත්‍රී ලක්ෂණයන්ගෙන් ශෝභමාන වූ කන්‍යාව රනින් සරසා දැසි දස්සන් පෙරටු කොට ඔබට බිරිඳ ලෙසින් දෙන්නෙමි යි චූළනී රජ දුන්වී.

5937. (වෙදෙහරජ) ඇත් අස් රිය පාබළ සෙනාවෝ රැස්ව සිටිත්. දැල්වූ විලක්කු ද බැබළේ. පණ්ඩිතවරු මේ කිමෙකැ යි සිතන්නාහු ද?

5938. සන්නාහ සන්නද්ධ ඇත් අස් රිය පා බළ සේනාවෝ රැස් වැ සිටිත්. දැල් වූ විලක්කු ද බැබළේ. පණ්ඩිතවරු "මොහු කුමක් කරන්නාහු දෝ" යි දනිත් ද?

5939. (මහෞෂධ) මහරජ, මහත් බල ඇති චූළනී රජ තෙමේ ඔබ යා නොදී රකියි. ප්‍රකෝප වූ බ්‍රහ්මදත්තරජ උදසන ඔබ නසන්නේ ය.

5940. (වෙදෙහරජ) මා හද සැලෙයි. මුව ද වියැළෙන්නේ ය. ගිනි වැදුනකු අවුවේ ලූ සෙයින් නිවීමට නො පැමිණෙන්නෙමි.

5941. කඹුරන්ගේ උදුන යම් සේ ඇතුළ දවයි ද පිටත නො දවයි ද, එසේ මා ඇතුළහද දූවෙයි. පිටත නො දූවෙයි.

5942. (මහෞෂධ) මහරජ, ප්‍රමාදයට පැමිණ මගේ වචන ඉක්මැවූයේ හින්න මන්ත්‍ර ඇත්තෙහි ය. ඔබ හා මන්ත්‍රණය කළ පණ්ඩිත ජනයෝ ම ඔබ රකින්වා.

5943. අභිවෘද්ධිය කැමැති හිතවත් ඇමැතියාගේ වචන නො පිළිගෙන තමා පිණැවීමෙහි මැ ඇලුණු ඔබ මළපුඬුවැ වැටුණු මුවකු වැනිය.

5944. යම් සේ මත්ස්‍යයෙක් මසින් වැසුණු වක් වූ බිළිය නො දැක ඇමෙහි ගිජු වැ කමනට පැමිණෙන මරණය නො දක්නේ ද.

5945. මහරජ, එසේ මැ ඔබ ද චූළනී රජු ගේ දුව පිළිබඳ කාමයෙන් මුළා වූවාහු ඇම ගිලි මසු මෙන් තම මරණය නො දන්නාහ.

5946. ඉදින් පණ්ඩාල නුවරට යන්නෙහි නම් වහා සිය දිවි හරනෙහි ය. වීරියට පිළිපන් මෘගයකු සේ මහත් බියට පැමිණෙනනෙහි ය.

5947. අනරියරූපො පුරිසො ජනින්ද
අභීව උවජඩගතො ඩසෙය්‍ය,[1]
න තෙන මෙත්තිං කයිරාථ ධීරො
දුක්කා හවෙ කාපුරිසෙන[2] සඩගමො.

5948. යතොවව[3] ජඤ්ඤා පුරිසං[4] ජනින්ද
සීලවායං බහුස්සුතො,
තතොව මෙත්තිං කයිරාථ ධීරො
සුඛො හවෙ සප්පුරිසෙන සඩගමො.

5949. බාලො තුවං එළමූගොසි රාජ
යො උත්තමඤ්ඤානි මයී ලපිත්ථො,
කිමෙවාහං නඩගලකොටිවද්ධා
අඤ්ඤානි ජානිස්සං යථාපි අඤ්ඤෙ.

5950. ඉමං ගලෙ ගහෙත්වාන නාමසථ විජිතා මම,
යො මෙ රතනලාභස්ස අන්තරායාය භාසති.

5951. මහොසධ අතීතෙන නානුවිජ්ඣන්ති පණ්ඩිතා,
කිං මං අස්සං ව සම්බෙද්ධං[5] පතොදෙනෙව විජ්ඣසි.

5952. සචෙ පස්සසි මොක්ඛං මෙ[6] ඛෙමං වා පන පස්සසි,
තතොව මං අනුසාස කිං අතීතෙන විජ්ඣසි.

5953. අතීතං මානුසං කම්මං දුක්කරං දුරභිසම්භවං,
න තං සක්කොමි මොචෙතුං කම්මපි ජානස්සු ඛත්තිය.

5954. සන්ති වෙහාසයා[7] නාගා ඉද්ධිමන්තා යසස්සිනො,
තෙපි ආදය ගච්ඡෙය්‍යුං යස්ස හොන්ති තථාවිධා.

5955. සන්ති වෙහාසයා අස්සා ඉද්ධිමන්තා යසස්සිනො,
තෙපි ආදය ගච්ඡෙය්‍යුං යස්ස හොන්ති තථාවිධා.

5956. සන්ති වෙහාසයා පක්ඛී ඉද්ධිමන්තා යසස්සිනො,
තෙපි ආදය ගච්ඡෙය්‍යුං යස්ස හොන්ති තථාවිධා.

5957. සන්ති වෙහාසයා යක්ඛා ඉද්ධිමන්තා යසස්සිනො,
තෙපි ආදය ගච්ඡෙය්‍යුං යස්ස හොන්ති තථාවිධා.

---

1. ඩංසෙය්‍ය – මජ්ඣං. ස්‍යා.
2. කාපුරිසෙහි – මජ්ඣං.
3. යදෙව – මජ්ඣං.
4. පුරිසෙ– මජ්ඣං.
5. සම්බන්ධං – මජ්ඣං.
6. වා – මජ්ඣං.
7. වෙහායසා – මජ්ඣං. ස්‍යා. වෙහාසසා – ම.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5947. මහරජ, අනායම්සචරූප පුරුෂ තෙමේ ඇකයෙහි වූ සර්පයකු දෂ්ට කරන්නා සේ විපත් පමුණුවන්නේ ය. නුවණැත්තේ ඔහු හා මිත්‍රත්වයක් නො කරන්නේ ය. අසත්පුරුෂයා හා එක්වීම ඒකාන්තයෙන් දුකනි.

5948. මහරජ, යම් හෙයකින් මේ තෙමේ සිල්වතෙක උගතෙකැ යි දන්නේ ද, ඒ බඳු පුද්ගලයා සමග නුවණැත්තේ මිත්‍ර වන්නේ ය. සත්පුරුෂයා හා එක්වීම එකාන්තයෙන් සුව එළවන්නේ ය.

5949. මහරණ්, යම් උතුම් මඬහලාඤ්ඤයක් මා සමඟ කී ඔබ මැ කෙළ තොලු වෙති. නඟුල් කෙළවර ගත් මම කෙසේ සෙස්සන් සේ මඬහලාඤ්ඤයන් දන්නෙම් ද?

5950. යමෙක් මාගේ රත්නලාභයට අන්තරාය පිණිස කථා කරයි ද ඒ මොහු ගෙලෙන් ගෙනැ මාගේ විජිතයෙන් නෙරවූ.

5951. (වෙදෙහරජ) මහෞෂධ පණ්ඩිතය, නුවණැත්තෝ අතීතය නමැති තුලින් නො විදිත්. කිම, දැඩි වැ බැඳි අසකුට කෙවිටෙන් අණින්නාක් මෙන් මා පෙළන්නෙහි ද?

5952. ඉදින් මට මිදීමක් දක්නෙහි නම් හෝ බියෙන් තොර වීමට යමක් දන්නෙහි නම් හෝ ඉන් මට අනුශාසනා කරව. අතීතයෙන් පහරදීමෙන් ඇති (ප්‍රයෝජනය) කිම?

5953. (මහෞෂධ) මෙයින් මිදීමට මිනිසකු විසින් කළ හැකි දේ ඉක් මැ ගියේ ය. මෙය අභිභවනය කිරීමට නො හැක්ක. ඔබ මිදුවීමට නොහැක්කෙමි. මහරජ, (මෙයින් මිදීමට) ඔබ මැ මඟක් දනුව.

5954. සෘද්ධිමත් වූ යශස් ඇත්තා වූ ආකාශචාරී හස්තීහු ඇත්තාහ. යමකුට එබඳු හස්තීහු වෙත් නම් ඔහු හෝ ගෙනැ යන්නා හ.

5955. සෘද්ධිමත් වූ යශස් ඇත්තා වූ ආකාශචාරී අශ්වයෝ ඇත්තාහ. යමකුට එ බඳු අශ්වයෝ වෙත් නම් ඔහු හෝ රැගෙන යන්නාහ.

5956. සෘද්ධිමත් වූ යශස් ඇත්තා වූ ආකාශ චාරී පක්ෂීහු ඇත්තාහ. යමකුට එබඳු පක්ෂීහු වෙත් නම් ඔහු හෝ රැගෙන යන්නාහ.

5957. සෘද්ධිමත් වූ යශස් ඇත්තා වූ ආකාශචාරී යක්ෂයෝ ඇත්තාහ. යමකුට එබඳු යක්ෂයෝ වෙත් නම් ඔහු හෝ රැගෙන යන්නාහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5958. අතීතං මානුසං[1] කම්මං දුක්කරං දුරභිසම්භවං,
න තං සක්කොමි මොචෙතුං අන්තලික්ඛන ඛත්තිය.

5959. අතීරදස්සී පුරිසො මහන්තෙ උදකණ්ණවෙ,
යත්ථ සො ලභතෙ ගාධං[2] තත්ථ සො වින්දතෙ සුඛං.

5960. එවං අම්හස්ව රඤ්ඤෙ ච ත්වං පතිට්ඨා මහොසධ,
ත්වං නොසි මන්තිනං සෙට්ඨො අම්හෙ දුක්ඛා පමොචය.

5961. අතීතං මානුසං කම්මං දුක්කරං දුරභිසම්භවං,
න තං සක්කොමි මොචෙතුං ත්වම්පි ජානස්සු[3] සෙනක.

5962. සුණොහි මෙතං වචනං පස්සසෙතං මහබ්භයං,
සෙනකංදානි පුච්ඡාමි කිං කිච්චං ඉධ මඤ්ඤසි.

5963. අග්ගිං දවාරතො දෙම ගණ්හාමසෙ විකත්තනං,[4]
අඤ්ඤමඤ්ඤං වධිත්වාන ඛිප්පං හෙස්සාම ජීවිතං.
මා නො රාජා[5] බ්‍රහ්මදත්තො චිරං දුක්ඛෙන මාරයි

5964. සුණොහි එතං වචනං පස්සසෙතං මහබ්භයං,
පුක්කුසංදානි පුච්ඡාමි කිං කිච්චං ඉධ මඤ්ඤසි.

5965. විසං ඛාදිත්වා මීය්‍යාම ඛිප්පං හෙස්සාම ජීවිතං,
මා නො රාජා බ්‍රහ්මදත්තො චිරං දුක්ඛෙන මාරයි.

5966. සුණොහි එතං වචනං පස්සසෙතං මහබ්භයං,
කාවින්දංදානි පුච්ඡාමි කිං කිච්චං ඉධ මඤ්ඤසි.

5967. රජ්ජුයා බජ්ඣ මීය්‍යාම පපාතා පපතෙමසෙ,
මා නො රාජා බ්‍රහ්මදත්තො චිරං දුක්ඛෙන මාරයි.

5968. සුණොහි එතං වචනං පස්සසෙතං මහබ්භයං,
දෙවින්දංදානි පුච්ඡාමි කිං කිච්චං ඉධ මඤ්ඤසි.

5969. අග්ගිං දවාරතො දෙම ගණ්හාමසෙ විකත්තනං,
අඤ්ඤමඤ්ඤං වධිත්වාන ඛිප්පං හෙස්සාම ජීවිතං.
න නො සක්කොති මොචෙතුං සුඛෙනෙව මහොසධො.

5970. යථා කදලිනො සාරං අන්වෙසං නාධිගච්ඡති,
එවං අන්වෙසමානා නං පඤ්ඤං නාජ්ඣගමාමසෙ.

---

1. මානුසකං – වි.
2. නාධං – මජසං.
3. පජානස්සු – මජසං.
4. විකන්තනං – මජසං. ස්‍යා.
5. රාජ – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5958. මහරජ, මිනිසුන් විසින් කළ හැකි කායික්‍යයෝ ඉක්ම ගියහ. මෙම කායික්‍යය දුෂ්කර ද අභිභවනය කිරීමට අපහසු ද වෙයි. අහසින් ගෙනැ ගොස් මිදුවීමට ද මම අපොහොසත්මි.

5959. (සෙනක) මහසයුරට වැටී තෙරක් නොදක්නා වූ පිහිටක් මිනිසෙක් යම් තැනක (දිවයිනක්) ලබන්නේ නම් එතැන අපමණ සුවයක් විඳින්නේ ය.

5960. මහෞෂධ පණ්ඩිතය, ඒ නිසා අපට ද රජුට ද පිහිට තෙපිය. මන්ත්‍රීන් අතර තෙපි මැ ශ්‍රේෂ්ඨ වන්නහු ය. අප දුකින් මිදෙවුව මැන.

5961. මිනිසුන් විසින් කළ හැකි කායික්‍යයෝ ඉක්ම ගියහ. මේ බිය දුෂ්කර වූවක් ද අභිභවනය කිරීමට අපහසු වූවක් ද වන්නේ ය. මෙයින් මුදන්නට මම නොපොහොසත්මි. සෙනකය, තෙපි මැ මහක් දනුව.

5962. (වෙදෙහරජ) මගේ මේ වචනය අසව. මේ මහත් බිය බලව. දැන් සෙනකයන් විචාරමි. මෙහිලා තෝ කවරක් සිතන්නෙහි ද?

5963. (සෙනක) "බ්‍රහ්මදත්ත රජ අපට බොහෝ කලක් දුක් දී නොමරාවා" යි දෙර පටන් ගෙට ඕනි දල්වමු. ආයුධ ගනිමු. ඔවුනොවුන් වධ කොට ගෙනැ වහා දිවි අත් හරිමු.

5964. (රජ) මගේ මේ වචනය අසව. මේ මහත් බිය බලව. දැන් පුක්කුසයන් විචාරමි. මෙහි ලා තෝ කුමක් සිතන්නෙහි ද?

5965. (පුක්කුස) බ්‍රහ්මදත්ත රජ අපට බොහෝ කලක් දුක් දී නොමරාවා යි විස කා මියෙමු. වහා දිවි අත් හරිමු.

5966. (රජ) මගේ මේ වචනය අසව. මේ මහත් බිය බලව. දැන් කාවින්දයන් විචාරමි. මෙහිලා තෝ කුමක් සිතන්නෙහි ද?

5967. (කාවින්ද) බ්‍රහ්මදත්ත රජ අපට බොහෝ කලක් දුක් දී නොමරාවා යි රැහැනෙන් බැඳී මියෙමු. ප්‍රපාතයට හෝ පනිමු.

5968. (රජ) මගේ මේ වචනය අසව. මේ මහත් බිය බලව. දැන් දෙවින්දයන් විචාරමි. මෙහි ලා තෝ කුමක් සිතන්නෙහි ද?

5969. (දෙවින්ද) දෙර පටන් ගෙට ගිනි හෝ දල්වමු. ආයුධ ගෙනැ ඔවුනොවුන් වධ කොටැ වහා දිවි අත් හරිමු. මහොසධය අපට සුවසේ මිදීමට නම් නොහැක්කේ ය.

5970. (රජ වැලපෙහි) යම් සේ කෙසෙල් ගස්හි හරය සොයන්නේ ඒ නොලබයි ද, එසේ ගැලවීමට උපායක් සොයන අපි ප්‍රශ්නයට පිළිතුරක් මොවුන්ගෙන් නොලද්දෙමු.

5971. යථා සිම්බලිනො සාරං අනෙචසං නාධිගච්ඡති,
එවං අනෙචසමානානං පඤ්ඤං නාජ්ඣගමාමසෙ.

5972. අදෙසෙ වත නො වුසං[1] කුඤ්ජරානංව නොදකෙ,
සකාසෙ දුම්මනුස්සානං බාලානමවිජානතං.

5973. උඛෙඛධතෙ[2] මෙ හදයං මුඛඤ්ච පරිසුසති,
නිබ්බුතිං නාධිගච්ඡාමි අඤ්ඤදඩ්ඪාව ආතපෙ.

5974. කම්මාරානං යථා උක්කා අනෙතා ඣායති නො බහි,
එවම්පි හදයං මයහං අනෙතා ඣායති නො බහි.

5975. තතො සො පණ්ඩිතො ධීරො අත්ථදසසි මහාසඩ්ඪො,
වෙදෙහං දුක්ඛිතං දිසවා ඉදං වචනමබ්‍රවි.

5976. මා ත්වං භායි මහාරාජ මා ත්වං භායි රථෙසභ,
අහං තං මොචයිස්සාමි රාහුගහිතංව[3] චන්දිමං.

5977. මා ත්වං භායි මහාරාජ මා ත්වං භායි රථෙසභ,
අහං තං මොචයිස්සාමි රාහුගහිතංව සූරියං.

5978. මා ත්වං භායි මහාරාජ මා ත්වං භායි රථෙසභ,
අහං තං මොචයිස්සාමි පඩ්ඩා සත්තංව කුඤ්ජරං.

5979. මා ත්වං භායි මහාරාජ මා ත්වං භායි රථෙසභ,
අහං තං මොචයිස්සාමි පෙළාබද්ධංව පන්නගං.

5980. මා ත්වං භායි මහාරාජ මා ත්වං භායි රථෙසභ,
අහං තං මොචයිස්සාමි පක්ඛිං බද්ධංව පඤ්ජරෙ.

5981. මා ත්වං භායි මහාරාජ මා ත්වං භායි රථෙසභ,
අහං තං මොචයිස්සාමි මච්ඡෙ ජාලගතෙරිව.

5982. මා ත්වං භායි මහාරාජ මා ත්වං භායි රථෙසභ,
අහං තං මොචයිස්සාමි සයොග්ගබලවාහනං.

5983. මා ත්වං භායි මහාරාජ මා ත්වං භායි රථෙසභ,
පඤ්චාලං වාහයිස්සාමි කාකසෙනංව ලෙඩ්ඩුනා.

5984. ආදු පඤ්ඤා කිමත්ථියා අමචෙචා වාපි තාදිසො,
යො තං සම්බාධපක්ඛන්නං දුක්ඛා න පරිමොචයෙ.

---

1. වුට්ඨං – මජ්ඣං.
2. උඛෙඛධති – මජ්ඣං. වී.
3. රාහුග්ගහංව – මජ්ඣං. රාහුගහිතංව – සී්‍ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5971. යම් යේ හිඹුල් ගස්හි ගර සොයන්නේ ඒ නො ලබයි ද එසේ ගැලවීමට උපාය සොයන අපි ප්‍රශ්නයට පිළිතුරක් මොවුන් ගෙන් නො ලද්දෙමු.

9572. දිය නැති මහවනය ඇතුනට සෙයින් අඳුන දුෂ්ය මනුෂ්‍යයන් සමීපයෙහි අපගේ වාසය ඒකාන්තයන් නො සුදුසු පෙදෙසකැ විසීමකි.

5973. මගේ හදවත වෙවුලයි. මුඛය ද වියැළෙයි. ගිනි වැදුනකු අවුවේ හෙලූ කලෙක සේ සැනැසීමක් නො ලබමි.

5974. කඹුරන්ගේ උදුන යම් සේ ඇතුළ දවයි ද පිටත නො දවයි ද, එසේ මැ මාගේ හදවත ද ඇතුළ දූවේ. පිටත නො දූවේ.

5975. ඉක්බිති මහාප්‍රාඥ වූ අක්ෂීදර්ශී මහෞෂධ පණ්ඩිත තෙමේ දුකට පත් වේදෙහරජු දැක මේ වචනය කීය.

5976. මහරජ බිය නො වනු මැන. රාජශ්‍රේෂ්ඨය, බිය නො නො වනු මැන. රාහු ගිලගත් චන්ද්‍රයා සේ මම ඔබ මුදවන්නෙමි.

5977. මහරජ, බිය නො වනු මැන. රාජශ්‍රේෂ්ඨය බිය නො වනු මැන. රාහු ගිලගත් සූර්‍යයා සේ මම ඔබ මුදවන්නෙමි.

5978. මහරජ, බිය නො වනු මැන. රාජශ්‍රේෂ්ඨය, බිය නො වනු මැන. මඩෙහි ගිලුණු ඇතකු සේ මම ඔබ මුදවන්නෙමි.

5979. මහරජ, බිය නො වනු මැන. රාජශ්‍රේෂ්ඨය, බිය නො වනු මැන. පේළාවෙකැ බැඳුණු නාගයකු සේ මම ඔබ මුදවන්නෙමි.

5980. මහරජ, බිය නො වනු මැන. රාජශ්‍රේෂ්ඨය, බිය නො වනු මැන. පඤ්ජරයෙහි බඳධ පක්ෂියකු සේ මම ඔබ මුදවන්නෙමි.

5981. මහරජ, බිය නො වනු මැන. රාජශ්‍රේෂ්ඨය, බිය නො වනු මැන. දැලට හසු වූ මසුන් සේ මම ඔබ මුදවන්නෙමි.

5982. මහරජ, බිය නො වනු මැන. රාජශ්‍රේෂ්ඨය, බිය නො වනු මැන. බලවාහන සහිතව ම මම ඔබ මුදවන්නෙමි.

5983. මහරජ, බිය නො වනු මැන. රාජශ්‍රේෂ්ඨය. බිය නො වනු මැන. කැටෙකින් කපුටු රළක් සේ පඤ්චාල සේනාව පල වා හරින්නෙමි.

5984. යම් ඇමැතියෙක් දුකට පත් රජු දුකින් නො මුදන්නේ නම් ඒ බදු ඇමැතියා කුමටද? ඔහු ගේ නුවණ කුමටද?

5985. එථ මාණවා උට්ඨෙථ මුඛං සොධෙථ සන්ධිනො,
වෙදෙහො සහමච්චෙහි උම්මග්ගෙන[1] ගමිස්සති.

5986. තස්ස තං වචනං සුත්වා පණ්ඩිතස්සානුසාරිනො,
උම්මග්ගදුවාරං විවරිංසු යන්තයුත්තෙ ච අග්ගළෙ.

5987. පුරතො සෙනකො යාති පච්ඡතො ච මහොසධො,
මජ්ඣෙ ච රාජා වෙදෙහො අමච්චපරිවාරිතො.

5988. උම්මග්ගා[2] නික්ඛමිත්වාන වෙදෙහො නාවමාරුහි,
අභිරුළ්හඤ්ච තං ඤත්වා අනුසාසි මහොසධො.

5989. අයං තෙ සාසුරො[3] දෙව අයං සස්සු ජනාධිප,
යථා මාතු පටිපත්ති එවං තෙ හොතු සස්සුයා.

5990. යථාපි නියකො භාතා සඋදරියො එකමාතුකො,
එවං පඤ්චාලචණ්ඩා තෙ දයිතබ්බො රථෙසභ.

5991. අයං පඤ්චාලචණ්ඩී තෙ රාජපුත්ති අභිජ්ඣිතා,
කාමං කරොහි තෙ තාය භරියා තෙ රථෙසභ.

5992. ආරුය්හ නාවං තරමානො කින්නු තීරම්හි තිට්ඨසි,
කිච්ඡා මුත්තම්හ දුක්ඛාතො යාමදානි මහොසධ.

5993. නෙස ධම්මො මහාරාජ යොහං සෙනාය නායකො,
සෙනඞ්ගං පරිහාපෙත්වා අත්තානං පරිමොචයෙ.

5994. නිවෙසනම්හි තෙ දෙව සෙනඞ්ගං පරිහාපිතං,
තං දිනනං බ්‍රහ්මදත්තෙන ආනයිස්සං රථෙසභ.

5995. අප්පසෙනො මහාසෙනං කථං විග්ගය්හ ඨස්සසි,
දුබ්බලො බලවන්තෙන විහඤ්ඤිස්සසි පණ්ඩිත.

5996. අප්පසෙනොපි චෙ මන්ති මහාසෙනං අමන්තිනං,
ජිනාති[4] රාජා රාජානො ආදිච්චොවුදයං තමං.

5997. සුසුඛං වත සංවාසො පණ්ඩිතෙහීති සෙනක,
පක්ඛීව පඤ්ජරෙ බද්ධෙ[5] මච්ඡේ ජාලගතෙරිව.
අමිත්තහත්ථත්ථගතෙ මොචයි නො මහොසධො.

---

1. උම්ඩ්ගෙන - මජ්ඣං. උම්මඞ්ගෙන - ස්‍යා.
2. උම්ඩ්ගා - මජ්ඣං.
3. සසුසුරො - සිමු, මජ්ඣං, ස්‍යා.
4. ජානාථ - මජ්ඣං.
5. බන්ධෙ - මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5985. මාණවකයෙනි, එව, නැඟිටිවු, උමං දොර විවර කරවු. ඇමැතියන් සමග වේදෙහ රජ උමඟින් ගමන් කරන්නේ ය.

5986. මහෞෂධ පණ්ඩිතයන්ගේ බස් ඇසූ අනුචර ජනයෝ උමන් දොර ද යතුරු යෙදූ දොර කවුළු ද විවර කළහ.

5987. සේනකයා ඉදිරියෙහි ද මහෞෂධ පණ්ඩිත තෙමේ පසු පස්හි ද ඇමැති ජනයා පිරිවරන ලද වෙදෙහ රජ මැද ද යෙත්.

5988. උම්ඟින් නික්මුණු වෙදෙහ රජ නැවට නැංගේ ය. මහෞෂධපණ්ඩිත තෙමේ නැවට නැඟි රජුට අනුශාසනා කළේ ය.

5989. දේවයන් වහන්ස, මේ ඔබේ මයිලණුවන්ගේ පුත් ය. මහරජ, මේ ඔබෙ නැන්දණිය යි. යම්සේ මව කෙරෙහි පවත්නේ ද එසේ නැන්දණිය කෙරෙහි ද පවතුව.

5990. මහරජ, යම්සේ එක මව කුසැ උපන් සොහොයුරා කෙරෙහි පවත්නේ ද එසේ මේ පඤ්චාලචණ්ඩ කුමරුට ද ආදර කළයුත්තේ ය.

5991. මහරජ, මෝ තොප විසින් අතිශයින් රුචි කරනු ලබන පඤ්චාලචණ්ඩී රජකුමරිය යි. ඕ තොමෝ තොපගේ බිරිඳ යි. ඇය සමඟ කැමැති සේ පවතිනු මැනැවි.

5992. මහෞෂධ පණ්ඩිතය, වහා නැවු නැඟෙව. කුමක් නිසා ඉවුරු සිටිනෙහි ද, අපි ඉතා අපහසුවෙන් මිදුණෙමෝ වමිහ. දැන් වහා පලායමිහ.

5993. මහරජ, මම සේනාවට නායක වෙමි. සේනාව හැර පියා මම පමණක් මුදවන්නෙම් නම් ඒ සත්පුරුෂ දහම නො වෙයි.

5994. මහරජ, තොපගේ සේනාව ඒ නගරයෙහි හැර දමන ලද්දේ ය. මහරජ, බඹදත්රජු විසින් දෙනු ලබන ඒ සේනාව රැගෙන එන්නෙමි.

5995. පණ්ඩිතය, මදසෙනඟ ඇති කෙපි මහසෙනඟ ඇත්කාට කෙසේ විරුද්ධ වැ සිටිනවු ද? බලවතා විසින් දුර්වලයා පෙළනු ලබන්නේ මැ ය.

5996. මදසෙනඟ ඇති නුවණැත්තා මහා සේනා ඇති අඥානයා ජයගනී. උදහිරු අඳුර දුරු කරන්නාක් මෙන් නුවණැති රජ අනුවණ රජු ජයග්‍රහණය කරයි.

5997. සේනකය, නුවණැත්තන් හා වාසය ඒකාන්තයෙන් සුව ගෙනැ දෙන්නේ ය. පඤ්ජරයෙහි බැඳුණු පක්ෂීන් සේ ද දලෙහි බැඳුණු මසුන් සේ ද සතුරන් අතට පත් අප මහෞෂධ පණ්ඩිතතෙමේ මුදවාලිය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5998. එවමෙතං මහාරාජ පණ්ඩිතා හි සුඛාවහා.
පක්ඛීව පඤ්ජරෙ බද්ධෙ මච්ඡෙ ජාලගතෙරිව;
අමිත්තහත්ථත්ථගතෙ මොචයී නො මහොසධො.

5999. රක්ඛිත්වා කසිණං රත්තිං චූළනීයො මහබ්බලො,
උදෙන්තං අරුණුග්ගමහි උපකාරිං උපාගමි.

6000. ආරුය්හ පවරං නාගං බලවන්තං සට්ඨිහායනං,
රාජා අවොච පඤ්චාලො චූළනීයො මහබ්බලො.

6001. සන්තදෙධා මණිවම්මෙන සරමාදය පාණිනා,
පෙස්සියෙ අජ්ඣභාසිත්ථ පුථුගුම්බෙ සමාගතෙ.

6002. හත්ථාරූහෙ අනීකට්ඨෙ රථිකෙ පත්තිකාරකෙ,
උපාසනමහි කතහත්ථෙ වාළවෙධෙ සමාගතෙ.

6003. පෙසෙථ කුඤ්ජරෙ දන්තී බලවන්තෙ සට්ඨිහායනෙ,
මද්දන්තු කුඤ්ජරා නගරං[1] වෙදෙහෙන සුමාපිතං.

6004. වච්ඡදන්තමුඛා සෙතා තිබිණග්ගා[2] අට්ඨිවෙධිනො,
පනුන්නා ධනුවෙගෙන සම්පතන්තු තරීතරං.[3]

6005. මාණවා වම්මිනො සූරා චිත්‍රදණ්ඩයුතාවුධා,
පක්ඛන්දිනො මහානාගා හත්ථීනං හොන්තු සම්මුඛා.

6006. සත්තියො තෙලධොතායො අච්චිමන්ති[4] පභස්සරා,
විජ්ජොතමානා තිට්ඨන්තු සතරංසා විය තාරකා.

6007. ආවුධබලවන්තානං ගුණිකායූරධාරිනං,
එතාදිසානං යොධානං සඞ්ගාමෙ අපලායිනං.
වෙදෙහො කුතො මුච්චිස්සති සවෙ පක්ඛීව කාහති.[5]

6008. තිංස මෙ පුරිසනාවුත්‍යො සබ්බෙ වෙකෙකනිව්ජිතා,[6]
යෙසං සමං න පස්සාමි කෙවලං මහිමං චරං.

6009. නාගා ච කප්පිතා[7] දන්ති බලවන්තො සට්ඨිහායනා,
යෙසං ඛන්ධෙසු සොභන්ති කුමාරා චාරුදස්සනා.

6010. පීතාලඞ්කාරා පීතවසනා පීතුත්තරනිවාසනා,
නාගක්ඛන්ධෙසු සොභන්ති දෙවපුත්තාව නන්දනෙ.

---

1. මද්දන්තු කුඤ්ජරං නාගං – මජසං.
2. තිණුග්ග – මජසං.
3. තරීතරා – මජසං.
4. අච්චිමන්තා – මජසං.
5. කාහිති – මජසං. වි.
6. නච්චිතා – මජසං.
7. කප්පකා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

5998. මහරජ, එය එසේ මැ ය. නුවණැත්තෝ එකාන්තයෙන් සුව ගෙනැ දෙන්නෝ ය. මැදිරියෙහි බැඳුණු පක්ෂීන් සේ ද දැල්හි බැඳුණු මසුන් සේ ද සතුරන්ගේ අතට පත් අප මහෞෂධ පණ්ඩිතතෙමේ මුදවා ලීයැ.

5999. මහත් බල ඇති චූළනීබ්‍රහ්මදත්ත රජ මුළු රෑ රකවල් කොටැ අරුණලු නැඟෙන කලැ උපකාරී නුවරට එළැඹියේ ය.

6000. මහාබල ඇති පඤ්චාලදේශවාසී බ්‍රහ්මදත්ත රජ සැට අවුරුද්දෙන් මද නැඟී හිඳුනා වූ බලවත් හස්තියකු පිටට පැන නැඟී සිය සෙනහට මෙසේ කී යැ.

6001. මැණික් ඔබා කරන ලද යන්නාහයෙන් සන්නද්ධ වූ රජ බොහෝ යුද්ධශිල්පයන්හි දක්ෂ වූ අතින් දුනුහී ගෙන රැස් වූ පණිවිඩකාර යොධයන්ට පළමු කොට පැවසී යැ.

6002. ඇතුන් නැඟෙන්නා වූ ද අසුන් නැඟෙන්නා වූ ද රිය නැඟෙන්නා වූ ද පයින් ගමන් කරන්නා වූ මහ සෙනඟ ද රැස් වූ අතිදක්ෂ වාලවෙධී ධනුර්ධරයන් ද (ඇමැති ය.)

6003 බලවත් වූ සැට හවුරුද්දෙන් මද නැඟී හිඳුනා වූ දළ ඇති හස්තීන් මෙහෙයවවූ. වෙදෙහ රජු විසින් නිර්මාණය කරවන ලද නගරය ඇත්තු මඩින්වා.

6004 දුනුවෙයින් මුදහළ, නියන් බඳු මුවඇති සුදු පැහැති තියුණු අග ඇති ඇට විදුනා (ශරයෝ) මතුමත්තෙහි (හී වර්ෂා සෙයින්) වැටෙත්වා.

6005. සන්නාහයෙන් සැරසුණු, විසිතුරු දඬුවලින් යුත් ආයුධ අතින් ගත්, ඇතුන් ඉදිරියට වුව පනින්නා වූ නො සැලෙනසුලු මහත් බල ඇති තරුණ යෝධයෝ ඇතුන් වෙතැ එකතුවෙත්වා.

6006. තෙලින් මුවහත් කළ ගිනිසිළු සේ ප්‍රභාස්වර වූ අඩයටි සියක්රැසින් යුත් (ඔසටි) තාරකා සෙයින් බබළමින් සිටිවා.

6007. ආයුධ බලයෙන් යුත්, යුද්ධ සැටට හා අඟු පළඳනා දරන්නා වූ සංග්‍රාමයන්හි නො පසු බස්නා වූ මෙ වැනි යොධයන් වෙතින් කෙසේ නම් වෙදෙහයා මිදෙන්නේ ද? ඉදින් පක්ෂියකු සේ අහසින් ගමන් කළ ද නො මිදෙන්නෙන් මැ ය.

6008. එක් එක් කෙනකු වෙන වෙන මැ නෝරා ගන්නාලද සියල්ල නිස්නව දහසක් වූ මාගේ යෝධයන්ට සම වූවන් මේ මුළු පොළොවෙහි ඇවිද බැලුව ද නො දක්මි.

6009. සැට හවුරුද්දෙන් මද නැඟී හිඳුනා වූ මනා වැ සරසන ලද බලවත් දළ ඇතුන් මතැ රන්වන් කුමාරවරු බබළත්.

6010. නදුනුයනැ දෙවිපුතුන් සේ රන්වන් හඳනා පොරෝනා වෙන් හා සුවර්ණවර්ණාලංකාරයෙන් විභූෂිත යෝධයෝ ඇතුන් පිටැ බබළත්.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6011. පාඨීනවණ්ණා[1] නෙත්තිංසා තෙලධොතා පභස්සරා,
නිට්ඨිතා නරවීරෙහි[2] සමධාරා සුනිස්සිතා.[3]

6012. වෙලලාලිනො වීතමලා සික්කායසමයා දළ්හා,
ගහිතා බලවන්තෙහි සුප්පභාරප්පභාරිහි.

6013. සුවණ්ණථරුසම්පන්නා ලොහිතකච්ඡුපධාරිතා,
විවත්තමානා සොභන්ති විජ්ජුවබ්භසනන්තරෙ.

6014. පතාකා[4] වම්මිනො සූරා අසිචම්මස්ස කොවිද,
ථරුග්ගහා[5] සික්ඛිතාරො නාගක්ඛන්ධාතිපාතිනො.[6]

6015. එදිසෙහි[7] පරික්ඛිත්තො නත්ථි මොක්ඛො ඉතො තව,
පභාවං තෙ න පස්සාමි යෙන ත්වං මිථිලං වජෙ.

6016. කින්නු සන්තරමානොව නාගං පෙසෙසි කුඤ්ජරං,
පහට්ඨරූපො ආපතසි[8] ලද්ධත්ථොසමීති[9] මඤ්ඤසි.

6017. ඔහරෙතං[10] ධනු චාපං ඛුරප්පං පටිසංහර,
ඔහරෙතං සුභං චම්මං වෙළුරියමණිසන්ථතං.[11]

6018. පසන්නමුඛවණ්ණොසි මිහිතපුබ්බඤ්ච භාසසි,
හොති ඛො මරණකාලෙ තාදිසී[12] වණ්ණසම්පද.

6019. මොසං තෙ ගජ්ජිතං[13] රාජ භින්නමන්තොසි ඛත්තිය,
දුග්ගණ්හො හි තයා රාජා ඛළුඞ්ඛෙනෙව[14] සින්ධවො.

6020. තිණ්ණො හියේ‍යා රාජා ගඞ්ගං සාමවේවා සපරිජ්ජනො,
හංසරාජං යථා ධඞ්කො අනුජ්ජවං පපතිස්සසි.

6021. සිගාලා රත්තිභාගෙන ඵුල්ලං දිස්වාන කිංසුකං,
මංසපෙසීති මඤ්ඤන්තා පරිබ්බුළ්හා මිගාධමා.

---

1. පාදීන – මජසං.
2. නරයි රෙහි – මජසං.
3. සනිස්සිතා – මජසං.
4. පථකා – මජසං. ස්‍යා. පටකා – වි.
5. ධනුග්ගහා – මජසං. ස්‍යා.
6. නාගබන්ධ නිපාතිතො – මජසං.
7. එතාදිසෙහි – මජසං. ස්‍යා. වි.
8. ආගමසි – ස්‍යා. ආතපසි – මජසං.
9. සිඞ්ඝෙත්ථොසමීති – මජසං.
10. ඔහාරෙථ – මජසං.
11. සතනිභං – ස්‍යා. සන්ධතං – මජසං.
12. එදිසි – මජසං. ස්‍යා.
13. වජ්ජිතං – මජසං.
14. කළුඞ්ඛෙනෙව – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6011. පෙටියන් බඩ පැ සමාන වර්ණ ඇති තෙලෙහි මුවහත් තබන ලද ප්‍රභාස්වර වූ, නුවණැති මිනිසුන් විසින් නිමවන ලද මනා වැ මුවහත් කරන ලද සම වූ ධාරා (මුවහත) ඇති-

6012. මලකඩින් තොර හිරු රැස් සේ බබළන්නා වූ ඉතා පිරිසුදු යකඩින් නිමැවුණු දැඩි වූ වහා පහර දෙන යොධයන් විසින් ගන්නා ලද-

6013. රන් කම් කළ මිටින් යුත් ලෙහෙවන් කොපු දරන අසිපත්හු ඔබ මොබ පෙරළෙන්නාහු වැසි වලාකුළු අතර විදුලිය සේ බබළත්.

6014. දැරූ සන්නාහ ඇති ශූර වූ කඩු පලිස් දැරීමෙහි අතිදක්ෂ වූ ඇත්කඳ වුව දෙකඩ කිරීමෙහි සමත් කඩු ශිල්පයෙහි හික්මුණු පනාක නම් අභයෙහි කරනම් ගසන යොධයෝ ඇත්තාහ.

6015. මෙ බඳු යෝධයන් විසින් පිරිවරන ලද තට මෙයින් මිදීමෙක් නම් නැත්තේ ය. යම් ක්‍රමයෙකින් තෝ මිථිලා පුරයට යන්නෙහි නම් ඒ වැනි රාජානුභාවයෙක් නො දක්නෙමි.

6016. (මහරජ), කිම වහ වහා උතුම් ඇතු මෙහෙයවන්නෙහි? ප්‍රීතිමත් සවභාවයෙන් පෙරට එන්නෙහි, ආත්මාර්ථය සිද්ධ වී ය යි සිතන්නෙහි ද?

6017. (මහරජ), චාපසංඛ්‍යාත දුන්න දමාපුව මැනව. හී හකුළාපුව මැනව. වෛධූර්‍යමාණික්‍යයෙන් අලංකෘත සන්නාහය තැබුව මැනව.

6018. ප්‍රසන්න මුඛ වර්ණ ඇත්තෙහි. මද සිනා පෙරදැරි කොටැ බෙණෙන්නෙහි. මරණාසන්නයෙහි වනාහී එවැනි වර්ණසම්පත්තියෙක් වේ.

6019. මහරජ, තොපගේ ගර්ජනාව හිස් ය. ක්ෂත්‍රියය, තෙපි භින්නමන්ත්‍රණ ඇති වූවහු ය. කොටළුවකුට ජාති සෞන්දර්යයකු අල්වාපියනු නො පිළිවන් සේ තොප විසිනුදු වේදේහ රජ අල්වාපියනු නො හැක්කේ ම ය.

6020. වේදේහ රජ ඊයේ ඇමැතිවරුන් හා පිරිවර ජනයන් සමඟ ගඟ තරණය කළේ ය. ඔහු ලුහුබඳින්නේ හංස රාජයකු ලුහුබැඳ යන කවුඩකු මෙන් බිමැ හෙන්නේය.

6021. මෘගාධම් සිවල්ලු රාත්‍රිකාලයෙහි සුපුෂ්පිත කැල වෘක්ෂයක් (සඳරැසින්) දැක මස්වැදැලි ය යි සිතන්නෝ පිරිවරා සිටියහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6022. වීතිවත්තාසු රත්තීසු උග්ගතසම්මං දිවාකරෙ,
කිංසුකං ඵුල්ලිතං දිස්වා ආසවිස්සන්තා මිගාධමා.

6023. එවමෙව කුවං රාජ වෙදෙහං පරිවාරිය,[1]
ආසවිස්සන්තෙ ගමිස්සසි සිගාලා[2] කිංසුකං යථා.

6024. ඉමස්ස හත්ථපාදෙ ච කණ්ණනාසඤ්ච ඡින්දථ,
යො මෙ අම්හෙහං හත්ථගතං වෙදෙහං පරිමොචයි.

6025. ඉමං මංසංව පාතබ්බං[3] සූලෙ කත්වා පවත්තථ තං,
යො මෙ අම්හෙහං හත්ථගතං වෙදෙහං පරිමොචයි.

6026. යථාපි ආසභං චම්මං පථව්‍යා විතනියාති,[4]
සීහස්ස අථො ව්‍යග්ඝස්ස හොති සඞ්කුසමාහතං.

6027. එවං තං විතනිස්සාන[5] වෙධයිස්සාමි සත්තියා,
යො මෙ අම්හෙහං හත්ථගතං වෙදෙහං පරිමොචයි.

6028. සචෙ මෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණනාසඤ්ච ඡෙච්ඡසි,
එවං පඤ්ඩාලචණ්ඩස්ස[6] වෙදෙහො ඡෙදයිස්සති.

6029. සචෙ මෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණනාසඤ්ච ඡෙච්ඡසි,
එවං පඤ්ඩාලචණ්ඩියා[7] වෙදෙහො ඡෙදයිස්සති.

6030. සචෙ මෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණනාසඤ්ච ඡෙච්ඡසි,
එවං නන්දාය දෙවියා වෙදෙහො ඡෙදයිස්සති.

6031. සචෙ මෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණනාසඤ්ච ඡෙච්ඡසි,
එවං තෙ පුත්තදරස්ස වෙදෙහො ඡෙදයිස්සති.

6032. සචෙ මංසංව පාතබ්බං සූලෙ කත්වා පචිස්සසි,
එවං පඤ්ඩාලචණ්ඩස්ස වෙදෙහො පාවයිස්සති.

6033. සචෙ මංසංව පාතබ්බං සූලෙ කත්වා පචිස්සසි,
එවං පඤ්ඩාලචණ්ඩියා වෙදෙහො පාවයිස්සති.

6034. සචෙ මංසංව පාතබ්බං සූලෙ කත්වා පචිස්සසි,
එවං නන්දාය දෙවියා වෙදෙහො පාවයිස්සති.

---

1. පරිවාරිකං – මජ්ඣං.
2. සිඞ්ගාලා – මජ්ඣං.
3. ඉමං මංසඤ්චපාතබ්‍යං – මජ්ඣං. සය්හ.
4. විහනිය්‍යති – මජ්ඣං. සය්හ.
5. විහනිස්සාන – මජ්ඣං. සය්හ. වී.
6. පඤ්චාලචණ්ඩස්ස – මජ්ඣං. සය්හ.
7. පඤ්චාලචණ්ඩියා – මජ්ඣං. සය්හ.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6022. හිරු නැඟෑ රැය පහන් වූ කලැ සුපිපි කැල ගස දැකැ ශෘගාලයෝ සුන් වූ ආසා ඇත්තෝ වූහ.

6023. මහරජ, එසෙයින් තෙපි ද වේදේහ රජු පිරිවරා සිටැ කෑලගස වටා සිටී සිවලුන් සේ සුන් වූ ආසා ඇත්තෝ වැ යන්නාහුය.

6024. යමෙක් මා අතට පත් පසමිතුරු වේදේහයා මිදුයේ ද ඒ මොහුගේ අත් පා කන් නාසා ද සිඳිවූ.

6025. යමෙක් මා අතට පත් පසමිතුරු වෙදෙහයා මිදුයේ ද ඒ මොහු ගේ ඇඟ මස් පිසිය යුතු (මෘගාදීන්ගේ) මසක් මෙන් කපා හුලැ ඇනැ පිසත්වා.

6026. යම් සේ වෘෂභයකුගේ හෝ සිංහයකුගේ හෝ ව්‍යාඝ්‍රයකුගේ හෝ සම නහා හුල් ගසා බිමැ අතුරනු ලබන්නේ වෙයි ද,

6027 එසේ මැ යමෙක් මා අතපත් පසමිතුරු වේදේහයා මුදා හළේ ද, ඒ මොහු බිමැ වතුරුවා සැතින් විදවන්නෙමි.

6028. ඉදින් මාගේ අත්පා හෝ කන්නාසා හෝ සිඳින්නෙහි නම් වේදේහ රජ පඤ්චාලචණ්ඩ කුමරාගේ ද එසේ සිදවන්නේ ය.

6029. ඉදින් මාගේ අත්පා හෝ කන්නාසා හෝ සිඳවන්නෙහි නම් වෙදෙහ රජ පඤ්චාලචණ්ඩි කුමරියගේ ද එසේ සිඳවන්නේ ය.

6030. ඉදින් මාගේ අත්පා හෝ කන්නාසා හෝ සිඳින්නෙහි නම් වේදේහ රජ නන්දා දෙවියගේ ද එසේ සිදවන්නේ ය.

6031. ඉදින් මාගේ අත්පා හෝ කන්නාසා හෝ සිඳින්නෙහි නම් වෙදෙහ රජ ඔබගේ පුත්‍රදරුවන්ගේ ද එසේ සිඳවන්නේ ය.

6032. ඉදින් මාගේ මස් කපා හුලැ ඇන පිසන්නෙහි නම් වෙදෙහ රජ පඤ්චාලචණ්ඩි කුමරාගේ ද එසේ පිසවන්නේ ය.

6033. ඉදින් මාගේ මස් කපා හෙලා හුලැ ඇන පිසන්නෙහි නම් වේදේහ රජ පඤ්චාලචණ්ඩ කුමරියගේ ද එසේ පිසවන්නේ ය.

6034. ඉදින් මාගේ මස් කපා හෙලා හුලැ ඇන පිසන්නෙහි නම් වේදේහ රජ නන්දා දේවියගේ ද එසේ පිසවන්නේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6035. සචෙ මංසංව පාතබ්බං සූලෙ කත්වා පචිස්සසි,
එවං තෙ පුත්තදරස්ස වෙදෙහො පාචයිස්සති.

6036. සචෙ මං විතනිත්වාන වෙධයිස්සසි සත්තියා,
එවං පඤ්චාලචණ්ඩස්ස වෙදෙහො වෙධයිස්සති.

6037. සචෙ මං විතනිත්වාන වෙධයිස්සසි සත්තියා,
එවං පඤ්චාලචණ්ඩියා වෙදෙහො වෙධයිස්සති.

6038. සචෙ මං විතනිත්වාන වෙධයිස්සසි සත්තියා,
එවං නන්දය දෙවියා වෙදෙහො වෙධයිස්සති.

6039. සචෙ මං විතනිත්වාන වෙධයිස්සසි සත්තියා,
එවං තෙ පුත්තදරස්ස වෙදෙහො වෙධයිස්සති;
එවං නො මන්තිතං රහො වෙදෙහෙන මයා සහ.

5040. යථා පලසතං[1] චම්මං කොන්තිමන්තී[2]සුනිට්ඨිතං,
උපෙති තනුතාණාය සරානං පටිහන්තවෙ.

6041. සුබාවහො දුක්ඛනුදෙ වෙදෙහස්ස යසස්සිනො,
මතිං තෙ පටිහඤ්ඤාමි උසුං පලසතෙනිව.[3]

6042. ඉඞ්ඝ පස්ස මහාරාජ සුඤ්ඤං අන්තෙපුරං තව,
ඔරොධා ච කුමාරා ච තව මාතා ච ඛත්තිය
උම්මග්ගා[4] නීහරිත්වාන වෙදෙහස්සුපනාමිතා.

6043. ඉඞ්ඝ අන්තෙපුරං මස්හං ගන්ත්වාන විචිනාථ නං,
යථා ඉමස්ස වචනං සච්චං වා යදි වා මුසා.

6044. එවමෙතං මහාරාජ යථා ආහ මහොසධො,
සුඤ්ඤං අන්තෙපුරං සබ්බං කාකපට්ටනකං යථා.

6045. ඉතො ගතා මහාරාජ නාරී සබ්බඞ්ගසොභනා,
කොසුම්භඵලකසුස්සොණී හංසගග්ගරභාණිනී.

6046. ඉතො නීතා මහාරාජ නාරී සබ්බඞ්ගසොභනා,
කොසෙය්‍යවසනා සාමා ජාතරූපසුමෙඛලා.

6047. සුරත්තපාද කල්‍යාණී සුවණ්ණමණිමෙඛලා,
පාරෙවතක්ඛී සුතනු බිම්බොට්ඨා තනුමජ්ඣිමා.

---

1. බලසතං – මජසං.
2. කොන්තිමන්තා – මජසං, ස්‍යා.
3. බලසතෙනවා – මජසං.
4. උම්මඞ්ගා – මජසං, උම්මඞ්ගා – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6035. ඉදින් මෘගාදීන්ගේ පිසියයුතු මසක් සෙයින් මාගේ මස් කපා හුලැ ඇන පිසන්නෙහි නම් වේදේහ රජ ඔබගේ පුත්‍රදාරාවන්ගේ ද එසේ පිසවන්නේ ය.

6036. ඉදින් මා බිමැ වතුරුවා හුල් ගසා විදින්නෙහි නම් වේදේහ රජ පඤ්චාලචණ්ඩ කුමාරයාට ද එසේ විදවන්නේ ය.

6037. ඉදින් මා බිමැ වතුරුවා හුල් ගසා විදින්නෙහි නම් වේදේහ රජ පඤ්චාලචණ්ඩි කුමරියට ද එසේ විදවන්නේය.

6038. ඉදින් මා බිමැ වතුරුවා හුල් ගසා විදින්නෙහි නම් වේදේහ රජ නන්දා දෙවියට ද එසේ විදවන්නේ ය.

6039. ඉදින් මා බිමැ වතුරුවා හුල් ගසා විදින්නෙහි නම් වෙදේහ රජ ඔබගේ පුත්‍රදාරාවනට ද එසේ විදුවන්නේ ය. වෙදේහ රජු මාහා මෙසේ රහසින් මන්ත්‍රණය කරන ලද්දේය.

6040. යම්සේ සම්කරුවන්ගේ සැකින් මනා වැ නිමවන ලද සියයක් පටින් කළ හෙයින් පලසත නම් සන්නාහය ශරයන් වළකා ශරීරාරක්ෂාවට පැමිණේ ද?

6041. එසේ මැ වෙදෙහ රජුගේ දුක් දුරුකොටැ සැප එළවන්නෙමි. පලසත සන්නාහය හී වළකන්නා සේ මාගේ නුවණින් තොපගේ නුවණ වළකන්නෙමි.

6042. මහරජ, එසේ නම් ඔබගේ සිස් වූ අන්තඃපුරය බලව. ක්ෂත්‍රියය, ඔබගේ දේවිය ද, කුමරා ද, මවූ බිසව ද උමඟින් හැරගෙනැ ගොස් වේදෙහ රජුට පවරනලදහ.

6043. එසේ නම් මාගේ අන්තඃපුරයට ගොස් මොහුගේ බස් සැබෑ හෝ බොරු හෝ වේ දැයි සොයා බලව.

6044. මහරජ, මහෞෂධයන් කී දේ සැබෑම ය. සිස් වූ මුළු ඇතොවුර කපුටන් එක් වූ මුහුදු තෙර ගමක් මෙනි.

6045. මහරජ, සවර්ණ ඵලකයක් වැනි ශ්‍රොණියෙන් යුක්ත වූ හංසධෙනුවක සේ මිහිරි තෙපුල් තෙපලන සියලු අඟපසඟින් ශොභමාන වූ නන්ද දේවී තෙල උමඟින් ගියා ය.

6046. මහරජ, කසීසළු හඳනා, රනින් මොනවට කළ මෙවුල්දම් පළඳනා, සවර්ණවර්ණ වූ, සියල් අඟපසඟින් ශෝභමාන වූ නන්ද දේවී මේ උමඟින් ගෙන යන ලද්දීය.

6047. (ඕ නන්ද දේවී තොමෝ) රත්පෑ පා ඇත්තී ය. පඤ්ච කල්‍යාණයෙන් යුක්ත වන්නී ය. රන්මිණිමෙවුල් ඇත්තී ය. පරෙවියනට බදු ඇස් ඇත්තී ය. බිඹුපල වැනි තොල් ඇත්තීය. මනාසිරුරින් හා කෘශ වූ මධ්‍යප්‍රදේශයෙන් ද යුක්ත වන්නී ය.

6048. සුජාතා භුජගලට්ඨිව වෙල්ලිව[1] තනුමජ්ඣිමා,
දීඝඤ්ඤා කෙසා අසිතා ඊසකග්ගපවෙල්ලිතා.

6049. සුජාතා මිගජාපිව[2] හෙමනත්තගිසිඛාරිව,
නදීව ගිරිදුග්ගෙසු සඤ්ඤතා බුද්ධවෙළුහි.

6050. නාගනාසූරු කල්‍යාණී පඨමා නිම්බරුත්ථනී,
නාතිදීඝා නාතිරස්සා නාලොමා නාතිලොමසා.

6051. නන්දය නූන මරණෙන නන්දසි සිරිවාහන,
අහඤ්ච නූන නන්දූ ච ගච්ඡාම යමසාධනං.

6052. දිඛ්ඛං අධීයසෙ මායං අකාසි චක්ඛුමොහනං,
යො මෙ අම්හානං හත්ථගතං වෙදෙහං පරිමොචයි.

6053. අධීයන්ති මහාරාජ දිඛ්ඛමායිධ පණ්ඩිතා,
තෙ මොචයන්ති අත්තානං පණ්ඩිතා මන්තිනො ජනා.

6054. සන්ති මාණවපුත්තා මෙ කුසලා සන්ධිජෙදකා,
යෙසං කතෙන මග්ගෙන වෙදෙහො මිථිලං ගතො.

6055. ඉඞ්ඝ පස්ස මහාරාජ උම්මග්ගං සාධු මාපිතං,
හත්ථීනං අථ අස්සානං රථානං අථ පත්තිනං.
ආලොකභූතං නික්ඛන්තං උම්මග්ගං[3] සාධු නිට්ඨිතං.

6056. ලාභා වත විදෙහානං යස්ස මෙ එදිසා පණ්ඩිතා,
සරෙ වසන්ති විජිතෙ යථා තිංසි මහොසධ.

6057. වුත්තඤ්ඤූ පරිහාරඤ්ඤූ දිගුණං භත්තවෙතනං,
දදාමි විපුලං භොගං භුඤ්ජ කාමෙ රමස්සු ච.
මා විදෙහං පවග්ගමා කිං විදෙහො කරිස්සති.

6058. යො වජෙථ මහාරාජ භත්තාරං ධනකාරණා,
උභින්නඤ්ච භොති ගාරය්හො අත්තනො ච පරස්ස ච;
යාව ජීවෙය්‍ය වෙදෙහො නාඤ්ඤං සස්ස පුරිසො සියා.

---

1. වෙදිව – මජ්ඣං, ස්‍යා.
2. මිගජාපාව – මජ්ඣං.
3. උමඞ්ගං – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6048. මනා වැ හටගත් නාග ලකාවකට බඳු ලෙලෙන ගාත්‍රා ඇත්තී ය. සිඟින් වූ රන්පෝරුවකට බඳු මධ්‍යප්‍රදේශ ඇත්තී ය. දික් වූ, නිල් වූ, අක්බමරු කෙශ කලාප ඇත්තී ය.

6049. ඕ තොමෝ සුජාත මුව පෙල්ලක බඳු ය. හිමවත් කලැ ගිනිසිළුවකට සමාන වන්නී ය. ගිරිදුර්ගයෙකින් ගලා බස්නා කුඩා නළ කොළ සමූහයෙන් ගැවසීගත් නදියක් බඳු රොමරාජී ඇත්තී ය.

6050. ඇත් සොඬෙක අයුරින් පිහිටි ඌරු යුග්මයෙන් ශොභමාන වූවා ය. පඤ්ච කල්‍යාණ ඇත්තී ය. ප්‍රථම වයසැ සිටියා ය. තිඹිරි එල වැනි පියයුරු ඇති ස්ත්‍රීන් අතුරෙන් පළමු වැන්නී ය. නො උස් නො මිටි වූවා ය. ලොම් නැත්තී ද බොහෝ ලොම් ඇත්තී ද, නො වූවා ය.

6051. මහරජ, මෙ වැනි නන්ද දේවියගේ මරණින් ඔබ තුටු වන්නාහු නම් මම ද නන්දදේවී ද යමරජු වෙත යන්නෙමු.

6052. යමෙක් මා අතට පත් පසමිතුරු වෙදෙහයා මිදුයේ වෙ ද, ඒ ඔබ දිව්‍ය මායමක් දන්නාහු ද? ඇසට ඉන්ද්‍රජාලයක් කළාහු ද?

6053. මහරජ, මේ ලෝකයේ නුවණැත්තෝ දිව්‍ය මායම් හදරත්. ඒ පණ්ඩිත මන්ත්‍රී ජනයෝ තමා විපතින් මුදා ගනිත්.

6054. උමං බිඳීමෙහි දක්ෂ තරුණ යෝදයෝ මට ඇත්තා හ. ඔවුන් විසින් කරන ලද උමඟින් වේදේහ රජ මිථිලා පුරයට ගියේ ය.

6055. ආලොකවත් වැ සිටින උමඟ මනා වැ නිම කොටැ ඇත්තේ ය. ඇත්, අස්, රිය, පාබල සෙනඟ පිළිරූ සිතියම් ලෙසින් තනවා ඇත්තේ ය. මහරජ, එසේ නම් මනා වැ නිම වූ උමඟ බලනු මැන.

6056. මහෞෂධය, ඔබ වැනි පණ්ඩිත ජනයෝ යම් ගෙයෙකැ හෝ රටෙකැ හෝ වෙසෙත් නම් ඒ විදෙහ වැස්සනට ද වූයේ මහත් ලාභයෙකි.

6057. වෘත්තිය ද ගම් බිම් ආදිය හා බත් වැටුප ද දෙගුණ කොටැ දෙන්නෙමි. අනිත් බොහෝ සම්පත් ද දෙන්නෙමි. කාමයන් අනුභව කරව, රමණය කරව, විදේහ පුරයට පෙරළා නො යා. විදේහ කුමක් කරන්නේ ද?

6058. මහරජ, යමෙක් ධන හේතුයෙන් තම සවාමියා හරනේ නම් හේ තමා හා මෙරමා යන දෙදෙනා විසින් ම ගැරහිය යුත්තෙක් වේ. වේදේහ රජුගේ දිවි ඇතිතෙක් අනෙකකුගේ සේවකයෙක් නො වන්නෙමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6059. යො චජෙථ මහාරාජ භත්තාරං ධනකාරණා,
උභින්නං හොති ගාරයෙහා අත්තනො ච පරස්ස ච;
යාව තිට්ඨෙය්‍ය වෙදෙහො නාඤ්ඤස්ස විජිතෙ වසෙ.

6060. දම්මි නික්ඛසහස්සං තෙ ගාමාසීතිඤ්ච කාසිසු,
දසීසතානි චත්තාරි දම්මි භරියාසතඤ්ච තෙ;
සබ්බං සෙනඞ්ගමාදය සොත්ථිං ගච්ඡ මහොසධ.

6061. යාචං දදන්තු හත්ථිනං අස්සානං ද්විගුණං විධං,
තප්පෙන්තු අන්නපානෙන රථිකෙ පත්තිකාරකෙ.

6062. හත්ථී අස්සෙ රථෙ පත්ති ගච්ඡෙවාදය පණ්ඩිත,
පස්සතු තං මහාරාජා වෙදෙහො මිථිලං ගතං.

6063. හත්ථී අස්සා රථා පත්ති සෙනා පදිස්සතෙ මහා,
චතුරඞ්ගිනී භිංසරූපා කින්නු මඤ්ඤන්ති පණ්ඩිතා.

6064. ආනන්දෙ තෙ මහාරාජ උත්තමො පතිදිස්සති,
සබ්බං සෙනඞ්ගමාදය සොත්ථිං පත්තො මහොසධො.

6065. යථා පෙතං සුසානස්මිං ඡඩ්ඩෙත්වා චතුරො ජනා,
එවං කම්පිල්ලියෙ ත්‍යම්හා ඡඩ්ඩයිත්වා ඉධාගතා.

6066. අථ ත්වං කෙන වණ්ණෙන කෙන වා පන හෙතුනා,
කෙන වා අත්ථජාතෙන අත්තානං පරිමොචයි.

6067. අත්ථං අත්ථෙන වෙදෙහ මන්තං මන්තෙන ඛත්තිය,
පරිවාරයිස්සං රාජානං ජම්බුදීපංව සාගරො.

6068. දින්නං නික්ඛසහස්සං මෙ ගාමාසීති ච කාසිසු,
දසීසතානි චත්තාරි දින්නං භරියාසතඤ්ච මෙ.
සබ්බං සෙනඞ්ගමාදය සොත්ථිනම්හි ඉධාගතො.

6069. සුසුඛං වත සංවාසො පණ්ඩිතෙහීති සෙනක,
පක්ඛීව පඤ්ජරෙ බද්ධෙ මච්ඡෙ ජාලගතෙරිව;
අමිත්තහත්ථත්ථගතෙ මොචයී නො මහොසධො.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6059. මහරජ, යමෙක් ධන හේතුයෙන් සඛකීය සඛාමියා හරනේ නම් හේ තමා හා මෙරමා යන දෙදෙනා විසින් ම ගර්හා ලැබිය යුත්තෙක් වේ. වෙදෙහ රජු වසනා තාක් අන් විජිතයෙකු නො වසන්නෙමි.

6060. මහෞෂධය, ඔබට රන් නිෂ්ක දහසක් ද, කසී රටෙහි ගම් අසූවක් ද, දසින් සාරසියයක් ද, බිරියන් සියයක් ද දෙමි. සියලු සෙනග ගෙනැ සුවසේ යව.

6061. ඇතුනට හා අසුනට යම් පමණ දෑ අවශ්‍ය වේ ද, එය ද්විගුණ කොට පොහෝනා පමණ දෙත්වා. රථ සේනාවන් හා පාබළ සේනාවන් ආහාර පානයෙන් සතුටු කරත්වා.

6062. මහෞෂධ පණ්ඩිතය, ඇත් අස් රිය පාබළ සේනාවන් ගෙනැ යව. මිථිලා පුරයට ගිය තොප ඒ වේදේහ රජ දකීවා.

6063. ඇත්, අස්, රිය, පාබළ යන අතිවිශාල වූ භයානක චතුරඞ්ගිනී සේනාවක් පෙනේ. පණ්ඩිතවරු ඒ කුමකැ යි සිතන්නාහු ද?

6064. මහරජ, ඔබගේ සිත තුටු කරන උතුමා පෙරළා එනු ඉපනේ. සියලු සෙනහ ගෙනැ මහෞෂධ පඬිතුමා මෙහි සුවසේ පැමිණියේ ය.

6065. යමයේ සතරදෙනෙක් මළ මිනිසකු ඔසොවා ගෙනැ ගොස් අමුසොහොනැ හැරැ දමා එත් ද, එසෙයින් අපි දු තොප කම්පිල්ලිය රටෙහි හැරැ දමා මෙහි ආවෙමු.

6066. එසේ ඇති කලැ කවර ක්‍රමයෙකින්, කවර හේතු යෙකින්, කෙවර අර්‍ථයෙකින් සතුරන්ගෙන් තම දිවි මුදු ගත්තහු ද?

6067. මහරජ, ඔවුන්ගේ අර්‍ථය මාගේ අර්‍ථයෙන් ද ඔවුන්ගේ මන්ත්‍රණය මාගේ මන්ත්‍රණයෙන් ද පිරිවැරුවෙමි. එ මතු නොව දඹදිව පිරිවැරූ සයුර සේ එක් සියක් රජුන් පිරිවරනලද එරජු ද පිරිවරන්නෙමි.

6068. රන් නිෂ්ක දහසක් ද, කසී රටෙහි ගම් අසූවක් ද දුස්සන් සාරසියයක් ද, බිරියන් සියයක් ද මට දෙන ලද ය. සියලු සේනා කොටස් ගෙනැ සුවසේ මෙහි ආවෙමි.

6069. සේනකය, නුවණැත්තන් හා වාසය ඒකාන්තයෙන් සුව ගෙනැ දෙන්නේ ය. මැදිරියෙකැ බැඳුණු කුරුල්ලන් සේ ද දැලෙහි හසු වූ මසුන් සේ ද සතුරන්ගේ අතට පත් අප මහෞෂධ පණ්ඩිත තෙම මුදලීය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6070. එවමෙතං මහාරාජ පණ්ඩිතා හි සුඛාවහා,
පක්ඛීව පඤ්ජරෙ බද්ධෙ මවෙජ ජාලගතෙරිව;
අමිත්තහත්ථගතෙ මොචයි නෝ මහොසධො.

6071. ආහඤ්ඤතු සඛවීණා හෙරියෝ දෙණ්ඩිමානි ච,
නදන්තු මාගධා[1] සඞ්ඛා වඟු වදතු[2] දුන්දුභී.

6072. ඔරොධා ච කුමාරා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සාභිහාරයුං.

6073. හත්ථාරුහා අනීකට්ඨා රථිකා පත්තිකාරකා,
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සාභිහාරයුං.

6074. සමාගතා ජානපදා නෙගමා ච සමාගතා,
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සාභිහාරයුං.

6075. බහුජ්ජනෝ පසන්නොසි දිස්වා පණ්ඩිතමාගතෙ,
පණ්ඩිතඤ්ච අනුපපන්නෙ වෙලුකෙඩපො අවන්දථාති.

මහාඋම්මග්ගජාතකං.

6076. යවෙ වො වුය්හමානානං සන්තාරං උදකණ්ණවෙ,
මනුස්සබලිමෙසානෝ නාවං ගඤ්ඤෙය්‍ය රක්ඛසෝ;
අනුපුබ්බං කථං දත්වා මුඤ්චෙසි දකරක්ඛසෝ.[3]

6077. මාතරං පඨමං දජ්ජං භරියං දත්වාන භාතරං,
තතො සහායං දත්වාන පඤ්චමං දජ්ජං බ්‍රාහ්මණං;
ජටායහං දජ්ජමන්නානං නෙව දජ්ජං මහොසධං.

6078. පොසෙතා තෙ ජඝනත්ථි ව දිසරත්තානුකම්පිකා,
ජම්හී තයි පදුට්ඨම්හි[4] පණ්ඩිතා අත්ථදස්සිනී;
අත්තානං උපනිසං කත්වා වධා තං පරිමොචයි.

6079. තං තාදිසිං පාණදදිං ඔරසං ගබ්භධාරිණිං,
මාතරං කෙන දොසෙන දජ්ජාසි දකරක්ඛසෝ.

---

1. මාගත සඛවා – මජ්ඣං.
2. නදන්තු – මජ්ඣං, ස්‍යා.
3. දකරක්ඛසා – මජ්ඣං, ස්‍යා, ව්.
4. පදුස්සති – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6070. මහරජ, එය එසේ මැ යැ. පණ්ඩිතයන් හා වාසය ඒකාන්තයෙන් සුව ගෙනැ දෙන්නේ ය. මැදිරියෙක්හි බැඳුණු කුරුල්ලන් සේ ද, දැලෙක බැඳුණු මසුන් සේ ද සතුරන්ගේ අතට පත් අප මහෞෂධ පණ්ඩිත තෙම මිදීය.

6071. සියලු වීණාද බෙර ද පණා බෙර ද වාදනය කරවූ. මාගධයන්ගයෝ නාද කෙරෙත්වා. මහබෙර මිහිරි ලෙස නදදේවා.

6072. ඇතොවුරු කාන්තාවෝ ද, කුමාරවරු ද, වෛශ්‍යයෝ ද, බමුණෝ ද බොහෝ වූ ආහාර පාන පණ්ඩිතයන් වෙතැ එළැවූහ.

6073. ඇත්, අස්, රිය, පාබළ සේනාවෝ ද, පණ්ඩිතයනට බොහෝ වූ ආහාර පාන එළැවූහ.

6074. රැස් වූ දනවුවැස්සෝ රැස්වූ නියම්ගම් වැස්සෝ (ඔහු) පණ්ඩිතයනට බොහෝ වූ ආහාර පාන ද එළැවූහ.

6075. පණ්ඩිතයන් ආ කලෑ දැකැ බොහෝ ජනයෝ සතුටට පත්වූහ. පණ්ඩිතයන් මියුළු නුවරට පැමිණි කලැ පිළි හිස සිසැරීම ද පැවැත්විණි.

මහාඋම්මග්ගකාණ්ඩය යි.

6076. ඉදින් තොප සත්දෙන මහත් වූ ගැඹුරු දියෙකැ ගමන් ගන්නා කලැ මිනිස් බිලි අපේක්ෂායෙන් එක් දිය රකුසෙක් නැව ගන්නේ නම් අනුපිළිවෙළින් දිය රකුසාට කෙසේ කවුරුන් දී තමා මුදන්නෙහි ද?

6077. පළමුව වැදූ මව දෙන්නෙමි. (දෙවනුව) නන්ද දේවිය දී (කුන්වැනිව) මලණුවන් ද, ඉක්බිති යහළුවාද දී පස්වැනිව කේවට්ට බමුණා දෙන්නෙමි. සවැනිව මම තමන් ද දෙන්නෙමි. මහෞෂධ පණ්ඩිතයන් නො දෙන්නෙමි

6078. (තලතා දේවී) තොපගේ මව තොප පෝෂණය කළා ය. බොහෝ කල් අනුකම්පා ඇත්තී ය. ජම්භී නම් බ්‍රාහ්මණයා තොප කෙරෙහි කිපුණු කලැ නුවණැති අර්ථදර්ශී මවු තොමෝ අන්‍යයකු ඉදිරිපත් කොටැ නොප වධයෙන් මිදුවා ය.

6079. එසේ ප්‍රාණය දුන් ළෙහි හොවා හැදූ දසමසක් කුසැ දරු මැණියන් කිනම් දෙයෙකින් දිය රකුසාට දෙන්නහු ද?

6080. දහරාවිය අලඞ්කාරා ධාරෙති අපිළන්ධිනං
දෙවාරිකෙ අනීකට්ඨෙ අතිවෙලං පජගසති.[1]

6081. තතොපි පටිරාජානං සයං දූතානි සාසති,
මාතරං තෙන දෙසෙන දජ්ජාහං දකරක්ඛිනො.

6082. ඉත්ථාගුම්බස්ස පවරා අච්චන්තපියවාදිනි,[2]
අනුග්ගතා[3] සීලවති ජායාව අනපායිනි.

6083. අසෙකාධනා පඤ්ඤවති පණ්ඩිතා අත්ථදස්සිනී,
උඞ්කිරිං තෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

6084. බ්‍රහ්මාරඤ්ඤසමාපන්නං අනත්ථවසමාගතං,
සා මං සකානං පුත්තානං අයාචං යාචතෙ ධනං.

6085. සොහං දදාමි සාරත්තො බහුං උච්චාවචං ධනං.
සුදුච්චජං චජිත්වාන පච්ඡා සොචාමි දුම්මනො;
උඞ්කිරිං[4] තෙන දෙසෙන දජ්ජාමි[5] දකරක්ඛිනො.

6086. යෙනොච්චා ජානපද ආනීතා[6] ච පටිග්ගහං,
ආහතං[7] පරරජ්ජෙහි අභිට්ඨාය බහුං ධනං.

6087. ධනුග්ගහානං පවරං සූරං තිබ්බිඤ්ඤමානසං,
භාතරං තෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

6088. මයොච්චා[8] ජානපද ආනීතා ච පටිග්ගහං,
ආහතං පරරජ්ජෙහි අභිට්ඨාය බහුං ධනං.

6089. ධනුග්ගහානං පවරො සූරො තිබ්බිඤ්ඤමානසි ච,
මයායං සුඛිතො රාජා අතිමඤ්ඤති දරකො.

6090. උපට්ඨානම්පි මෙ අය්‍යෙ න සො එති යථා පුරෙ,
භාතරං තෙන දෙසෙන දජ්ජාහං දකරක්ඛිනො.

---

1. සංවජ්ජයති – මජ්ඣං.
2. පියභාණිනි – මජ්ඣං, සී්‍ය.
3. අනුපුබ්බතා –මජ්ඣං, සී්‍ය.
4. උපරි – මජ්ඣං.
5. දජ්ජාහං – මජ්ඣං.
6. ආනීතො – මජ්ඣං.
7. ආහටං – සී්‍ය.
8. යෙනොච්චා – මජ්ඣං, සී්‍ය.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6080. තරුණ කතක සේ නො පැළඳිය යුතු ආභරණ පළඳින්නී ය. දෙරටුපල්ලන් හා සෙබළුන් හා සමඟ බොහෝ කොටැ මහඬින් සිනාසෙන්නී ය.

6081. තවද අසල්වැසි රජුනට (මා කී ලෙස හඟවා) තොමෝ මැ දූතයන් යවන්නී ය. මම ඒ දෙෂය හේතු කොට ගෙන දියරකුසාට මව බිලිකොටැ දෙන්නෙමි.

6082–6083. ස්ත්‍රී සමූහයාට නායක වූ අතිශයින් ප්‍රියවාදී වූ ළදරු කල පටන් අනුව ගියා වූ සිල්වත් වූ සෙවනැල්ල සේ අත් නොහැර පවත්නා වූ ක්‍රෝධ නො කරනසුලු නුවණැති පණ්ඩිත වූ අර්‍ථදර්ශී වූ උබ්බරිය (නන්ද දේවිය) කවර දෙෂයක් නිසා දියරකුසාට දෙන්නහු ද?

6084. කාමසම්භෝගයෙහි ඇලුණු කෙලෙස් වසඟයටපත් මගෙන් ඕ තොමෝ මගේ දරුවනට අයත් නො ඉල්විය යුතු ධනය ඉල්ලන්නී ය.

6085. ඒ මම අතිශයින් ඇලුණෙමි බොහෝ කුලුමහත් ධනය දෙන්නෙමි. නො දියයුතුදේ දී පසුව දෙමනසින් ශෝක කරමි. ඒ දෙෂය නිසා උබ්බරිය දියරකුසාට දෙන්නෙමි.

6086. යමකු විසින් තොපගේ ජනපද වැසියෝ වඩනා ලද්දෝ ද, බැහැර සිටි තෙපි රජයට පමුණුවන ලද්දහු ද, බැහැරි රාජ්‍යයන් ගෙන් බොහෝ ධනය පැහැර ගෙනෙන ලද්දේ ද,

6087. ධනුර්ධරයනට අග්‍ර වූ, ශූර වූ, තීක්ෂ්ණමන්ත්‍රී නම් ඒ සහෝදරයා කවර දෙෂයක් නිසා දියරකුසාට දෙන්නහු ද?

6088. මා විසින් ජනපද වැසියෝ වඩන ලද්දෝ ය. මොණු රජගෙට ගෙනෙන ලදහ. බොහෝ වූ ධනය පර දෙසින් ගෙනෙන ලද්දේ ය.

6089. මම ධනුර්ධරයනට උතුමය, ශූරයෙමි. තියුණු නුවණ ඇත්තෙමි, මා විසින් මේ රජ සුඛිත කරන ලද්දේ ය යි ඒ තරුණ තෙම මා ඉක්මවා හඟියි.

6090. ආයාචාවනි, හෙතෙම පෙර සේ මට උපස්ථානයට ද නො එයි, ඒ දෙෂය හේතුකර ගෙනැ සහෝදරයා දිය රකුසාට දෙන්නොමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6091. එකරත්තෙන උභයො තුවං ච ධනුසෙඛවා,
උභො ජාතෙත්ථ පණ්ඩාලා සභායා සුසමාවයා.

6092. චරියා තං අනුබන්ධිත්ථො එකදුක්ඛසුඛො තව,
උස්සුක්කො තෙ දිවාරත්තං සබ්බකිච්චෙසු ව්‍යාවටො;
සභායං කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

6093. චරියාය[1] අයං අය්‍යෙ පජගසිත්ථො[2] මයා සහ,
අජ්ජාපි තෙන වණ්ණෙන අතිවෙලං පජගසති.[3]

6094. උබ්බරියාපි[4] මෙ අය්‍යෙ මන්තයාමි රහොගතො,
අනාමන්තා පවිසති පුබ්බෙ අප්පටිවෙදිතො.

6095. ලද්ධවාරො කතොකාසො අහිරිකං අනාදරං,
සභායං තෙන දෙසෙන දජ්ජාහං දකරක්ඛිනො.

6096. කුසලො සබ්බනිමිත්තානං රුදඤ්ඤ ආගතාගමො,
උප්පාදෙ[5] සුපිනෙ යුත්තො නිය්‍යාණෙ ච පවෙසනෙ.

6097. පදෙධා[6] භුම්මන්තලික්ඛස්මිං නක්ඛත්තපදකොවිදෙ,
බ්‍රාහ්මණං කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

6098. පරිසායම්පි මෙ අය්‍යෙ මීලයිත්වා[7] උදික්ඛති,
තස්මා අජ්ජ භමුං ලුද්දං දජ්ජාහං දකරක්ඛිනො.

6099. සසමුද්දපරියායං මහිං සාගරකුණ්ඩලං,
වසුන්ධරං ආවසසි අමච්චපරිවාරිතො.

6100. චාතුරන්තො මහාරට්ඨො විජිතාවී මහබ්බලො,
පථව්‍යා එකරාජාසි යසො තෙ විපුලංගතො.

6101. සොළසිත්ථීසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා,
නානාජනපද නරියො[8] දෙවකඤ්ඤපමා සුභා.

---

1. චරියා මං – මජ්ඣං. ස්‍යා.
2. සඤ්ජගසිතො – මජ්ඣං.
3. සංජගසති – මජ්ඣං.
4. උපරියාපිහ – මජ්ඣං.
5. උප්පාතෙ – මජ්ඣං.
6. පටෙඨා – මජ්ඣං. ස්‍යා.
7. උම්මිලිත්වා – මජ්ඣං. ස්‍යා.
8. නාරී – මජ්ඣං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6091–6092. තෙපි ද, ඕ ධනුශෙඛර කුමාරයා ද යන දෙදෙන ම එක්මැ රැයෙක මේ නගරයෙහි මැ උපන් පඤ්චාලයෝ ය. සම වයස්හි යහළුවෝ වූහ. හේ ජනපද චාරිකායෙහි නොහැර පසුගමන් කෙළේ යැ, තොප හා සමාන සුව දුක් ඇත්තේ යැ. දිවා රාත්‍රී උත්සාහවත් වැ සියලු කටයුත්තෙහි නිරත ය. කවර දේෂයෙකින් යහළුවා දිය රකුසාට දෙන්නෙහිද?

6093. ආයුෂ්මානි, මේ තෙම කුඩා කලැ මා සමග හැසිරෙන කල්හි මහහඬින් සිනාසුනේ යැ, අද ද පෙර් සේ මා සමග සීමා ඉක්මවා මහහඬින් සිනාසෙයි.

6094. ආයුෂ්මානි, නන්ද දේවිය සමඟ රහොගත වැ මන්ත්‍රණයෙහි යෙදෙන විටද කලින් නො දන්වා නො විමසා ඇතුළු ගබට ද පිවිසෙයි.

6095. වාරය ලදුයෙමි. කළ අවකාශ ඇත්තෙමි යි ලජ්ජා නැති ආදර නැති යහළුවා ඒ දෙෂයෙන් මම දියරකුසාට දෙන්නෙමි.

6096. සියලු නිමිත්තෙහි දක්ෂවූ සතුන්ගේ හඬ දන්නා වූ උගත් ආගම ඇති වන්දූ සූයුෂ් ග්‍රහණ උල්කාපාත දික්දහ ආදි උත්පාතයන් හා ස්වප්නයන්හි ඉෂ්ටානිෂ්ට ඵල දැනීමෙහි යෙදුණු ගෙන් පිටවීමෙහි හා ගෘහප්‍රවෙශයෙහි ද ශුභාශුභ කීමෙහි දක්ෂ වූ,

6097. භූමියෙහි හා අන්තරීක්ෂයෙහි ද ගුණදෙස් කීමට සමර්ථ වූ නක්ෂත්‍රපදයෙහි ඵලාඵල දැන්මෙහි දක්ෂ වූ පුරොහිත බමුණා කවර දෙෂයක් නිසා දියරකුසාට දෙන්නෙහි ද?

6098. ආයුෂ්මානි, මේ තැනැත්තා පිරිස් මැද ද මා දෙසැ ඇස දල්වා බලයි. එනිසා රෞද්‍ර වූ බැම නැඹීම් ඇති බ්‍රාහ්මණයා මම දිය රකුසාට දෙන්නෙමි.

6099. ඇමතියන් විසින් පිරිවරනලද තෙපි සමුදුර සියාරා ඇති මහා සාගරයට කුණ්ඩලාහරණ වූ සකලවිධ සම්පත්තීන් දරන පෘථිවියෙහි වාස කරන්නහු ය.

6100. සතර මහාසාගරය හිමිකොට ඇති මහරටක් ඇත්තහු යැ, දිනූ සඞ්ග්‍රාම ඇත්තහු යැ, මහාබල ඇත්තහු යැ, මුළුලොවට අසහාය රජ වව. ඔබගේ කීර්තිය මහත් බවට ගියේය.

6101. පැළඳි මිණිකොඩොල් ඇති දිව්‍යකන්‍යාවන් හා සමාන විවිධ ජනපදයනට අයත් යහපත් ස්ත්‍රීහු සොළොස් දහසක් වෙති.

6102. එවං සබ්බඞ්ගසම්පන්නං සබ්බකාමසමිද්ධිනං,
සුඛිතානං පියං දීඝං ජීවිතං ආහු බන්ධිය.

6103. අථ ත්වං කෙන වණ්ණෙන කෙන වා පන හෙතුනා,
පණ්ඩිතං අනුරක්ඛනෙත්තා පාණං වජසි දුච්චජං.

6104. යතොපි ආගතො අය්‍යා මම හත්ථං මහොසධො,
නාභිජානාමි ධීරස්ස අනුමත්තම්පි දුක්කතං.

6105. සචෙ ච කිඤ්චි කාලෙ මරණං මෙ පුරෙ සියා,
පුත්තෙන ච මෙ පපුත්තෙන ච[1] සුඛාපෙය්‍ය මහොසධො.

6106. අනාගතං පච්චුපන්නං සබ්බමත්ථං විපස්සති,
අනාපරාධකම්මන්තං න දජ්ජං දුක්කතිනො.

6107. ඉදං සුණොථ පඤ්චාලා චූළනීයස්ස[2] භාසිතං,
පණ්ඩිතං අනුරක්ඛනෙත්තා පාණං වජති දුච්චජං.

6108. මාතු භරියාය භාතුච්ච සඛිනො බ්‍රාහ්මණස්ස ච,
අත්තනො චාපි පඤ්චාලො ජීවිතං චජති දුච්චජං.

6109. එවං මහත්ථිකා[3] පඤ්ඤා, නිපුණා සාධුචින්තිනී,
දිට්ඨධම්මෙ[4] හිතත්ථාය සම්පරායෙ සුඛාය ච.

දුක්කතඛසපඤ්හා.

6110. හෙරි උප්පලවණ්ණාසි පිතා සුදොධනො අහු,
මාතා ආසි මහාමායා අමරා බිම්බසුන්දරී.

6111. සුවොහමාසි ආනන්දො සාරිපුත්තොසි චූළනී,
මහොසධො ලොකනාථා එවං ධාරෙථ ජාතකං.*

මහාඋම්මග්ගජාතකං නවමං.

---

1. සො මෙ පුත්තෙන පපුත්තෙන ච – මජ්ඣං.
2. චූළනෙය්‍යස්ස – මජ්ඣං.
3. මණ්ඩිකා – මජ්ඣං. ච්. ස්‍යා.
4. දිට්ඨධම්මෙ – මජ්ඣං. ස්‍යා.

* කෙවට්ටො දෙවදත්තොසි කලා චූලනන්දිකා,
පඤ්චාලචණ්ඩි සුනන්දාදෙවී චාසි යසස්සිකා.
අම්බට්ඨො ආසි කාළිඞ්ගෙ පොට්ඨපාදෙ ච පුක්කුසො,
පිලොතිකො ච දෙවිඤ්ඤෙ සෙනකොචාපි සච්චකො.
දෙවින්දගරු දිට්ඨමඞ්ගලිකා සාලිකාචාපි කුණ්ඩලී
වෙදෙහො ලාළුයිත්.

ඉමාපි දෙ ගාථායො බහූසු සීහලපොත්ථකෙසු දිස්සන්ති. ස්‍යාමපොත්ථකෙ ඉතො පිසදිසා. හෙරී ඉච්චාදිකා පන දෙ ගාථායො සබ්බපොත්ථකෙසු එකසදිසා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6102. මහරජ, මෙසේ සුඛිතයන්ගේ සර්වාඛ්‍ය සම්පූර්ණ වූ සකලවිධ කාමයන්ගෙන් සමෘද්ධියට පත් ජීවිතය දීර්ඝ වූයේ ද ප්‍රිය යැ යි පණ්ඩිතයෝ කියත්.

6103. එසේ ඇති කලැ, ඔබ කිනම් කරුණක් නිසා කුමක් හේතුකැර ගෙන පණ්ඩිතයන් රකිමින් හළ නොහැකි ජීවිතය හැරපියන්නහු ද?

6104. ආයුෂ්මානි, මහෞෂධ පණ්ඩිත තෙම යම් දවසක මා වෙත පැමිණියේ ද එතැන් පටන් ඒ නුවණැත්තාගේ කුඩා වූ වරදකුදු නො දනිමි.

6105. ඉදින් කිසි කලෙකැ මාගේ මරණය ප්‍රථමයෙන් සිද්ධ වේ ද, මහෞෂධ පණ්ඩිත තෙම මාගේ දරුමුණුබුරන් සුවපත් කරන්නේ ය.

6106. අනාගත වර්තමාන සකලාර්ථයන් මනාව දකී. නිරපරාධී ක්‍රියා ඇති තැනැත්තා දිය රකුසාට නො දෙමි.

6107. පඤ්චාලරට වැසියනි, චූලනී රජුගේ මේ වචන අසත්වා. මහෞෂධ පණ්ඩිතයන් රකිමින් හළ නොහැකි තම දිවි හරියි.

6108. පඤ්චාල රජ මවගේ ද, බිරිඳගේ ද, සොහොයුරාගේ ද, යහළුවාගේ ද, පුරොහිත බ්‍රාහ්මණයාගේ ද, තමාගේ ද යන සදෙනාගේ දිවි පණ්ඩිතයන් සඳහා හැරයෙයි.

6109. සූක්ෂම වූ ප්‍රඥා තොමෝ මෙසේ මහත් අර්ථ ඇත්තී ය. යහපත් චින්තා ඇත්තී ය. මෙලොව හිත පිණිස ද, පරලෝ සුව පිණිස ද පවත්නී ය.

උදකරාක්ෂස ප්‍රශ්නය යි.

6110. උත්පලවර්ණා තොමෝ එකලැ හෙරි පරිබ්‍රාජිකාව වූවා ය. සුද්ධොදන රජ පියා විය. මායා බිසව මව ද බිම්බාදේවී අමරා දේවී ද වූවා ය.

6111. ආනන්ද ස්ථවිර සුව පොතක විය. ශාරිපුත්‍ර ස්ථවිර චූලනී බ්‍රහ්මදත්ත රජ විය. මහෞෂධ පණ්ඩිත තෙම මෙකලැ ලොකඥාණී වූ බුදුරජාණන් වහන්සේ ය යි මෙසේ ජාතකය දරවූ.

නවවැනි මහාඋම්මඟ්ග ජාතක යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

10. මහාවෙස්සන්තරජාතකං

6112. ඵුසතී[1] වරවාණණ්ණෙ වරස්සු දසධා වරෙ,
පථව්‍යා චාරුපුබ්බඩ්ගී යං තුය්හං මනසො පියං.

6113. දෙවරාජ නමො ත්‍යත්ථු කිං පාපං පකතං මයා,
රම්මා චාවෙසි මං ඨානා වාතොව ධරණීරුහං.

6114. න වෙව තෙ කතං පාපං න ච මෙ ත්වමසි අප්පියා,
පුඤ්ඤක්ඛ තෙ පරික්ඛීණං යෙන තෙවං වදමහං.

6115. සන්තිකෙ මරණං තුය්හං චිනාභාවො භවිස්සති,
පතිග්ගණ්හාහි මෙ එතෙ වරෙ දස පවෙච්ඡතො.

6116. වරං වෙ මෙ අදෙ සක්ක සබ්බභූතානමිස්සර,
සිවිරාජස්ස භද්දන්තෙ තත්ථ අස්සං නිවෙසනෙ.

6117. නීලනෙත්තා නීලභමූ නීලක්ඛී ච යථාමිගි,
ඵුසතී නාම නාමෙන තත්ථපස්සං පුන්දරි.

6118. පුත්තං ලභෙථ වරදං යාචයොගං[2] අමච්ඡරිං,
පූජිතං පතිරාජෙහි කිත්තිමන්තං යසස්සිනං.

6119. ගබ්භං මෙ ධාරයන්තියා මජ්ඣිමඩ්ගං අනුන්නත,[3]
කුච්ඡි අනුන්නතො අස්ස චාපංව ලිඛිතං සමං.

6120. ථනා මෙ නප්පපතෙය්‍යුං පලිතා නස්සන්තු වාසව,
කායෙ රජො න ලිප්පෙථ වජ්ඣං චාපි පමොචයෙ.

6121. මයූරකොඤ්චාභිරුදෙ නාරීවරගණායුතෙ,
බුජ්ජවෙලාපකාකිණ්ණෙ[4] සූතමාගධවණ්ණිතෙ.

---

1. ඵුස්සති – මජ්ඣං. ස්‍යා.
2. යාචයොගී – මජ්ඣං.
3. අනුණ්ණතං – මජ්ඣං. ස්‍යා.
4. බුජ්ජවෙලාවකාකිණ්ණෙ – ස්‍යා. බුජ්ජවෙලාබකාකිණ්ණෙ – වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

10. මහාවෙස්සන්තර ජාතකය

6112. සක්දෙව් රජ: චුසති බිසොවුනි, උතුම් පැහැසපුවෙන් යුත් තැනැත්තිය, දසවිධ වරයක් ලැබූ ගන්න. උතුම් ලකුණින් හොබනා තැනැත්තිය, පොළොවෙහි යමක් තොප සිතට ප්‍රිය නම් එය ගන්න.

6113. චුසතිදේවි: දෙවරජ, ඔබහට නමස්කාර වේවා! මා කවර නම් පවක් කරන ලද ද? සැඩපවන රුකක් හෙළන්නා සේ කුමක් හෙයින් යහපත් තැනින් මා පහ කෙරෙත් ද?

6114. තොප කළ පවෙක් නැත. තෙපි මට අප්‍රිය ද නොවන්නහු. යම් හෙයෙකින් තොපට මෙසේ පවසම් ද ඒ තොපගේ පින් පිරිහුණු බැවිනි.

6115. තොපගේ මරණය ආසන්න ය. (අප කෙරෙත්) වෙන් වීම සිදු වන්නේ ය. මා දෙන මේ දසවිධ වරය පිළිගනු.

6116. සව්සතුනට අධිපති සක්දෙව් රජුනි, ඉදින් මට වරයක් දෙවූ නම් ඔබහට අභිවෘද්ධියක් වේවා පින්වත, සිව්රජුගේ හවනෙහි අගමෙහෙසි වෙම්වා.

6117. සක්දෙව් රජුනි, නිල්වන් ඇස් ඇති මුවැත්තියක සේ නිල්වන් නෙත් නිල්වන් බැම ඇත්තක් වෙම්වා. එහිදු චුසති නමින් යුතු වෙම්වා.

6118. කැමැති සම්පත් දෙන ඉල්වන්නට සුදුසු නොමසුරු කීර්ති ඇති පිරිවර ඇති යටත් රජුන් විසින් පුදනු ලබන පුතකු ලබම්වා.

6119. ගැබ දරන මාගේ කුස උස් නොවේවා. සමසේ ලියවුණු දුනුමිටක් සෙයින් උස් නොවූ මැද පෙදෙස වේවා.

6120. සක්දෙව් රජුනි, මගේ පියොවුරු නොඑල්බෙවා. පැසුණු නිසකෙස් නොපැනේවා. සිරුරෙහි රජස් නොවැකේවා. වධයට පත් වූවන් මුදන්නට ද සමත් වෙම්වා.

6121. පින්වත් සක්දෙව් රජුනි, මොනරුන් හා කොස්ලිහිණියන් විසින් කැරෙන නද ඇති, උත්තම කාන්තාවන් ගැවැසෙන, කුරුන් කුදුන් හා ළදරුවන් බලවතුන් (රජමැදුර රකින රාජ පුරුෂයන්) ගෙත් ආකීර්ණ, වන්දිභටයන් හා කිළිඳුන් විසින් කැරුණු වැණුම් ඇති,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6122. චිත්‍රග්ගළෙරුසුසිතෙ[1] සුරාමංසප්පබොධනෙ,
සිවිරාජස්ස භද්දන්තෙ තත්‍ර අස්සං මහෙසියා.

6123. යෙ තෙ දස වරා දින්නා මයා සබ්බඞ්ගසොභනෙ,
සිවිරාජස්ස වීජිතෙ[2] සබ්බෙ තෙ ලච්ඡසී වරෙ.

6124. ඉදං වත්වාන මඝවා දෙවරාජා සුජම්පති,
ඵුසතියා[3] වරං දත්වා අනුමොදිත්‍ර වාසවො.

දසවරගාථා.

6125. *තතො චුතා සා ඵුසතී ඛත්තියෙ උපපජ්ජථ,
ජෙතුත්තරම්හි නගරෙ සඤ්ජයෙන සමාගමී.

6126. දස මාසෙ ධාරයිත්වාන කරොන්තී පුරපදක්ඛිණං,
වෙස්සානං වීථියා මජ්ඣෙ ජනෙසි ඵුසතී මමං.

6127. න මය්හං මත්තිකං නාමං නපි පෙත්තිකසම්භවං,
ජාතොම්හි වෙස්සවීථියං තස්මා වෙස්සන්තරො අහු.

6128. යදහං දරකො හොමි ජාතියා අට්ඨවස්සිකො,
තදා නිසජ්ජ පාසාදෙ දනං දතුං විචින්තයිං.

6129. හදයං දදෙය්‍යං චක්ඛුම්පි මංසම්පි රුධිරම්පි ච,
දදෙය්‍යං කායං සාවෙත්වා යදි කොචි යාචයෙ[4] මමං.

6130. සභාවං චින්තයන්තස්ස අකම්පිතමසණ්ඨිතං,
අකම්පි තත්‍ර පඨවී සිනෙරුවනවටංසකා.

6131. පරුළ්හකච්ඡනඛලොමා පංකදන්තා රජස්සිරා,
පග්ගය්හ දක්ඛිණං බාහුං කිං මං යාචන්ති බ්‍රාහ්මණා.

6132. රතනං දෙව යාචාම සිවීනං රට්ඨවඩ්ඪන,
දදාහි පවරං නාගං ඊසාදන්තං උරුළ්හවං.

6133. දදාමි න විකම්පාමි යං මං යාචන්ති බ්‍රාහ්මණා,
පහින්නං කුඤ්ජරං දන්තිං ඔපවුය්හං ගජුත්තමං.

---

1. චිත්‍රග්ගළෙ සුසිතෙ – මජසං.
2. භද්දන්තෙ – මජසං.
3. ඵුස්සතියා – මජසං. ස්‍යා. වි.
4. යාචකො – ස්‍යා. වි.
* මරම්ම පොත්කෙ න දිස්සන්ති.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6122. පසඟතුරු රැවට බඳු කන්කලු රැවින් යුත් මනහර විසිතුරු සත්රුවනින් හෙබි දෙරකවුළු ඇති සුරාමසින් ප්‍රබොධ වන මිනිසුන් ඇති ඒ මැදුරෙහි සිවිරජහට අගමෙහෙසුන් තන්හි වෙම්වා.

6123. සක්දෙව් රජ: සියලු අඟපසඟින් හොබනා තැනැත්තිය, මා විසින් යම් දසවර කෙනෙක් තොපට දෙන ලද ද ඒ සියලු වර සිවිරජුගේ රාජ්‍යයෙහි දී ලබන්නහු ය.

6124. මෙපවත් කියා සුජාගේ හිමි වූ මසවත් නම් සක්දෙව්රජ ඵුසතියට දසවරය දී සතුටු සිත් ඇත්තේ විය.

දසවරගාථා යි.

6125. ඒ දෙව්ලොවින් චුත වූ ඒ ඵුසතී තොමෝ ක්ෂත්‍රිය කුලයෙහි උපන්නා ජේතුත්තර නුවර සඤ්ජය කුමරු හා එක් (මෙහෙසි) වූවා ය.

6126. ඵුසති තොමෝ දසමසක් මුළුල්ලෙහි කුසින් දරා නුවර පැදකුණු කරන්නී වාණිජවීථිය මැද කරවූ සූතිසරයෙහි මා ප්‍රසූත කළා.

6127. මාගේ (වෙසතුරු) නම මවුපසට අයත් නො වෙයි, පියපසට ද අයත් නො වෙයි. යම් හෙයෙකින් වෙළෙඳ වීථියක උපනිම් ද එහෙයින් වෙසතුරු නම් වීමි.

6128. මම යම් කලෙක උපතින් අට හැවිරිදි දරුවීම් ද එ කලෑ පහයෙහි (පලක් බැඳ) හිඳැ දන් දෙන්නට සිතීමි.

6129. ඉදින් කිසිවෙක් මා යදනේ නම් (ඔහට) හදවත ද ඇසුදු මසුදු ලෙහෙදු දෙනුයෙම්, කය ද දස්බව අස්වා දෙන්නෙමි.

6130. මසුරු බැව්හි නො පිහිටි අවල වූ දන් දියටි ස්වභාවය සිතන වෙසතුරු කුමරහුගේ සිත අනුව මේරගල මුදුන්මල් කොට ඇති පෘථිවී තොමෝ කම්පිත වූ.

6131. දික් වූ කිහිලි ලොම් නිය වෙරලොම් ඇති මල හුන් දත් ඇති ධූලි වගුළ කෙහෙ ඇති බමුණෝ දකුණ'ත නඟා මා අතින් කුමක් ඉල්වත් ද? (කුමර ඇසී).

6132. සිවිරට වඩන රජතුමනි, රුවනක් ඉල්වම්හ. කවර රුවනෙක යත්: රියහිස් බඳු දළ ඇති බර උසුලනු සමත් උතුම් ඇත් රුවන දුන මැනවි.

6133. බමුණෝ මා අතින් යමක් ඉල්වත් ද ගිලියෙන මද ඇති මනාදළ ඇති රාජවාහන වූ උතුම් ඇත්රජහු දෙමි. කම්පිත නො වෙමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6134. හත්ථිකුම්භතො ඔරුය්හ රාජා වාගාධිමානසෝ,
බ්‍රාහ්මණානං අදා දනං සිවීනං රට්ඨවඩ්ඪනෝ.

6135. තදසි යං භිංසනකං තදසි ලොමහංසනං,
හත්ථිනාගෙ පදිස්සමහි මෙදිනී සමකම්පථ.

6136. තදසි යං භිංසනකං තදසි ලොමහංසනං,
හත්ථිනාගෙ පදිස්සමහි බුබ්භිත්‍ථ නගරං තදා.

6137. සමාකුලං පුරං ආසි සොණ්ඩෝ ච විපුලෝ මහා,
හත්ථිනාගෙ පදිස්සමහි සිවීනං රට්ඨවඩ්ඪනෙ.

6138. අථෙත්‍ථ වත්තති සඞ්ඛෝ තුම්බුලෝ හෙරවෝ මහා,
හත්ථිනාගෙ පදිස්සමහි මෙදිනී සමකම්පථ.

6139. *අථෙත්‍ථ වත්තති සඞ්ඛෝ තුම්බුලෝ හෙරවෝ මහා,
හත්ථිනාගෙ පදිස්සමහි බුබ්භිත්‍ථ නගරං තදා.

6140. අථෙත්‍ථ වත්තති සඞ්ඛෝ තුම්බුලෝ හෙරවෝ මහා,
හත්ථිනාගෙ පදිස්සමහි සිවීනං රට්ඨවඩ්ඪනෙ.

6141. උග්ගා ච රාජපුත්තා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
හත්ථාරුහා අනීකට්ඨා රථිකා පත්තිකාරකා.

6142. කෙවලෝ වාපි නිගමෝ සිවයෝ වාපි සමාගතා,
දිස්වා නාගං නීයමානං තෙ රඤ්ඤෝ පටිවෙදයුං.

6143. විධමං දෙව තෙ රට්ඨං පුත්තෝ වෙස්සන්තරෝ තව,
කථං නෝ හත්ථිනං දජ්ජා නාගං රට්ඨස්ස පූජිතං.

6144. කථං නෝ කුඤ්ජරං දජ්ජා ඊසාදන්තං උරුළ්හවං,
බෙත්තඤ්ඤූ සබ්බයුද්ධානං සබ්බසෙතං ගජුත්තමං.

6145. පණ්ඩුකම්බලසඤ්ඡන්නං පඝිත්තං සත්තුමද්දනං,
දන්තිං සවාළවීජනිං සෙතං කෙලාසසාදිසං.[1]

6146. සසෙතවජ්ඣත්තං සවුපථෙය්‍යං[2] සාථබ්බණං[3] සහත්‍ථිපං,
අග්ඝයානං රාජවාහිං බ්‍රාහ්මණානං අදා ධනං.[4]

---

1. සාදිතං - මජ්ඣං.
2. සඋපාධෙය්‍යං - මජ්ඣං. සුපත්‍ථෙය්‍යං - ය්‍යා.
3. සාධබ්බනං - මජ්ඣ-.
4. ගජං - මජ්ඣං.
* ඉමා ගාථායො මරම්මපොත්ථකෙ න දිස්සන්ති.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6134. සිවිරට වඩන වෙසතුරු මහරජ ත්‍යාගයෙහි පිහිටි සිත් ඇති වැ ඇත් කඳින් බැසැ බමුණන්ට ඇත්රජු දන් දින.

6135. උතුම් ඇත්රජු දුන් කල්හි පොළොව සැලිණ. එසඳ යම් බිහිසුණු බවක් වී ද එසඳ ලොමුදහගැන්ම වී.

6136. ඇත්රජු දුන් කල්හි නුවර කැළැඹිණ, එද යම් භීෂනකයෙක් වී ද එසඳ ලොමුදහගැන්ම වී.

6137. සිවිරට වඩන ඇත්රජහු දුන් කල්හි නුවර අවුල් වීය. මහත් සෝෂයෙක් ද වී.

6138. ඇත්රජු දුන් කල්හි පොළොව කම්පා වීය. එසඳ එහි මහත් වූ බිහිසුණු හඬෙක් පවතී.

6139. එසඳ ඇත්රජු දුන් කල්හි නුවර කැළඹිණ. ඉක්බිති එහි පැතිර උස් වූ බිහිසුණු මහ හඬෙක් පවතී.

6140. සිවිරට වඩන උතුම් ඇතු දන් දුන් කලැ මහත් බිහිසුණු විශාල හඬෙක් ඒ නගරයෙහි පවතී.

6141. ප්‍රසිද්ධ වූ මිනිස්සු ද රජදරුවෝ ද වෙළෙඳෝ ද, බමුණෝ ද ඇතරුවෝ ද අසරුවෝ ද රියැදුරෝ ද පාබළ සෙනහ ද—

6142. මුළු නියම්ගම් වැසි කෙළෙඹියෝ ද සිවිරට වැසියෝ ද එක්රැස් වැ ඇතු රැගෙන යනු දැකැ (පිය) රජුට සැලකළාහ.

6143. දේවයන් වහන්ස, තොපගේ රට නසමින් තොපගේ පුත් වෙසතුරු රජ රටවැසියා පිදූ අපගේ ශ්‍රේෂ්ඨ හස්තියා කෙසේ නම් දෙන්නේ ද?

6144. රියහිස් බදු දළ ඇති බර උසුලනු සමත් සියලු යුදයෙහි ජයගැම් දන් හැම අවයව සුදු වූ අපගේ උතුම් ඇතු කෙසේ නම් දෙන්නේ ද ?

6145. රත්පලසින් වැසුණු මද වැහෙනු වූ සතුරන් මඩනා මනා දළ ඇති කෙලාසකූට පර්වතයට බඳු සුදුපැහැති චාමර සහිත,

6146. සේසත් සහිත වූ බුමුතුරුණු උඩුවියන් ජවනිකා සහිත වූ ඇත් වෙදුන් සහිත වූ ඇත් ගොව්වන් සහිත වූ රජු උසුලන අග්‍ර යාන වූ ධනය කුලිහුරට බමුණන්ට (කවර හෙයින්) දුන්නේ ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6147. අන්නං පානඤ්ච සෝ දජ්ජා වත්ථසෙනාසනානි ච,
එතං ඛෝ දානපතිරූපං එතං ඛෝ බ්‍රාහ්මණාරහං.

6148. අයං තෙ වංසරාජා නෝ සිවීනං රට්ඨවඩ්ඪනං,
කථං වෙස්සන්තරෝ පුත්තෝ ගජං හාපෙති සඤ්ජය.

6149. සචෙ[1] තං න කරිස්සසි සිවීනං වචනං ඉමං,
මඤ්ඤෙ තං සහපුත්තෙන සිවී හන්ත්වා කරිස්සරෙ.

6150. කාමං ජනපදෙ මාසි රට්ඨං වාපි විනස්සතු,
නාහං සිවීනං වචනා රාජපුත්තං අදූසකං;
පබ්බාජෙය්‍යං සකා රට්ඨා පුත්තෝ හි මම ඔරසෝ.

6151. කාමං ජනපදෙ මාසි රට්ඨං වාපි විනස්සතු,
නාහං සිවීනං වචනා රාජපුත්තං අදූසකං;
පබ්බාජෙය්‍යං සකා රට්ඨා පුත්තෝ හි මම අත්‍රජෝ.

6152. නවාහං තස්ස[2] දුබ්භෙය්‍යං අරියසීලවතෝ හි සෝ,
අසිලොකොපි මෙ අස්ස පාපඤ්ච පසවෙ බහුං;
කථං වෙස්සන්තරං පුත්තං සත්ථෙන සාතයාමසෙ.

6153. මා නං දණ්ඩෙන සත්ථෙන න හි සෝ බන්ධනාරහෝ,
පබ්බාජෙහි ච නං රට්ඨා වනෙඝ වසතු පබ්බතෙ.

6154. එසෝ වෙ සිවීනං ජනෙදෝ ජනදං න පනුදම්සෙ,
ඉමං සෝ වසතු රත්තිං කාමෙ ච පරිහරතු.

6155. තතෝ රත්‍යා විවසනෙ සුරියස්සුග්ගමනම්පති,[3]
සමග්ගා සිවයෝ හුත්වා රට්ඨා පබ්බාජයන්තු නං.

6156. උට්ඨෙහි කණ්හෙ තරමානෝ රථෙන වෙස්සන්තරං වද,
සිවයෝ දෙව තෙ ඝාතා නෙගමා ච සමාගතා.

6157. උග්ගා ච රාජපුත්තා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
හත්ථාරුහා අනීකට්ඨා රථිකා පත්තිකාරකා;
කෙවලෝ චාපි නිගමෝ සිවියෝ චාපි සමාගතා.

6158. අසමා රත්‍යා විවසනෙ සුරියස්සුග්ගමනම්පති,
සමග්ගා සිවයෝ හුත්වා රට්ඨා පබ්බාජයුං නං.

---

1. සඛෙ – මජ්ඣං.
2. තස්මිං – මජ්ඣං. සය්හ.
3. සූරියුග්ගමනෙ සති – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6147. හෙතෙම ආහාරපාන ද වස්ත්‍ර ද සෙනසුන් ද දෙන්නේ යැ. තෙල දනට නිසි ය. තෙල බමුණන්ට යෝග්‍ය යැ.

6148. සඤ්ජය රජතුමනි, මේ වෙසතුරු පරපුරු විසින් අපට ආ රජෙක. කොපගේ වෙසතුරු පුත් කෙසේ නම් සිවිරට වඩන ඇතු දෙන්නේ ද?

6149. ඉදින් තෙපි සිවිරට වැසියන්ගේ මෙ බය නො කරන්නවු නම් සිවිරට වැසියෝ පුතු හා සමග තොප අත්පත් කරති සිතමිහ.

6150. ඒකාන්තයෙන් ජනපදය නැති වේවා. රට ද වැනැසේවා. මම සිවිරට වැසියන්ගේ වචන හේතුවින් නිදෙස් රජපුතු සියරටින් නො නෙරනෙමි. මාගේ ඖරසපුත්‍ර හෙයිනි.

6151. ඒකාන්තයෙන් ජනපදය මට නො වේවා. රට ද වැනැසේවා. මම සිවිරට වැසියන්ගේ බස් හෙයින් නිදෙස් රජපුතු සියරටින් නො නෙරනෙමි. හේ මා නිසා උපන් පුත් හෙයිනි.

6152. මම ඔහුට ද්‍රෝහී නො වෙමි. යම් හෙයෙකින් හේ උතුම් සිල් ඇත්තේ ද එහෙයිනි. මට අපකීර්ති ද වෙයි. බොහෝ පව් ද රැස් වේ. කවර හෙයින් වෙසතුරු පුතු අවියෙකින් මරවම් ද යි (සඳමහරජ කී.)

6153. ඔහු දඩින් ද සැතින් ද නො නැසුව මැනැවි. හේ දහගෙට ද නො නිසි ය. ඔහු රටින් නෙරපුව මැනැවි. වඩකගිරියෙහි වෙසේවා යි (සිවිරට වැසියෝ කීහු.)

6154. ඉදින් මේ සිවිරට වැසියන්ගේ කැමැත්ත නම් ඒ කැමැත්ත නො දුරලමිහ. හේ මේ රාත්‍රිය වෙසේවා. කාමසම්පත් ද අනුභව කෙරේවා.

6155. ඉක්බිති රාත්‍රිය අවසන්හි ඉරු උදවන කලැ සිවිරට වැසියෝ සමගි වැ ඔහු රටින් පිට කෙරෙත්වා යි (රජ) කියැ.

6156. කාරියකරවන ඇමැතිය, වහා නැඟෙව. වෙස්සන්තර වෙත ගොස් මෙසේ කියව: දේවයිනි, සිවිහු ද නියම්ගම් වැසි කෙළෙඹියෝ ද එක්රැස් වැ නොපට කිපුණාහ.

6157. ප්‍රසිද්ධ වූ මිනිස්සු ද රජදරුවෝ ද වෛශ්‍යයෝ ද බමුණෝ ද ඇත්රුවෝ ද අසරුවෝ ද රියැදුරෝ ද පාබළ සෙනඟ ද නියම්ගම්වැසි සියල්ලෝ ද සිවිහු ද එක්රැස් වූහ.

6158. මෙ රය ඉක්මැ හිරු උදවන වේලෙහි සිවිහු සමග වැ නොප රටින් නෙරති යනු යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6159. ස කඤ්ඤා තරමානොව සිවිරාජෙන පෙසිතො,
ආමුත්තහත්ථාභරණා සුවත්ථා චන්දනුසිතා.

6160. සීසං නහාතා උදකෙසො ආමුත්තමණිකුණ්ඩලා,
උපාගමී පුරං රම්මං වෙස්සන්තරනිවෙසනං.

6161. තත්ථද්දස කුමාරං සො රමමානං සකෙ[1] පුරෙ,
පරිකිණ්ණං අමවෙහි තිදසානංව වාසවං.

6162. සො තත්ථ ගන්ත්වා රමමානං[2] කඤ්ඤා වෙස්සන්තරං බ්‍රුවි,
දුක්ඛං තෙ වෙදයිස්සාමි මා මෙ කුජ්ඣි රථෙසභ.

6163. වන්දිත්වා රොදමානා සො කඤ්ඤා රාජානමබ්‍රුවි,
හත්ථා මෙසි මහාරාජ සබ්බකාමරසාහරෝ;
දුක්ඛං තෙ වෙදයිස්සාමි තත්ථ අස්සාසයන්තු මං.

6164. සිවයො දෙව තෙ කුද්ධා නෙගමා ච සමාගතා,
උග්ගා ච රාජපුත්තා ච වෙසියානා ච බ්‍රාහ්මණා.

6165. හත්ථාරුහා අනීකට්ඨා රථිකා පත්තිකාරකා,
කෙවලා වාපි නිගමා සිවයො වාපි සමාගතා.

6166. අසමා රත්‍යා විවසනෙ සුරියස්සුග්ගමනම්හි,[3]
සමග්ගා සිවයෙ හුත්වා රට්ඨා පබ්බාජයන්ති තං.

6167. කිස්මිං මෙ සිවයො කුද්ධා නාහං පස්සාමි දුක්කතං,[4]
තමෙව කත්තෙ වියාචික්ඛ කස්මා පබ්බාජයන්ති මං.

6168. උග්ගා ච රාජපුත්තා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
හත්ථාරුහා අනීකට්ඨා රථිකා පත්තිකාරකා;
නාගදන්තෙන තියන්ති තස්මා පබ්බාජයන්ති තං.

6169. හදයං චක්ඛුමිපහං දජ්ජං කිං මෙ බාහිරකං ධනං,
හිරඤ්ඤං වා සුවණ්ණං වා මුත්තා වෙළුරියා මණි.

6170. දක්ඛිණං වාපහං බාහුං දිස්වා යාචකමාගතෙ,
දදෙය්‍යං න විකම්පෙය්‍යං දනෙ මෙ රමතී මනො.

---

1. සකං – මජ්ඣං.
2. තරමානො – මජ්ඣං.
3. සුරියුග්ගනෙ සති – මජ්ඣං.
4. යො න පස්සාමි දුක්කටං – මජ්ඣං. ස්‍යා.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6159. සිව්රජු විසින් මෙහෙයන ලද ඒ කාරියකරවන ඇමැති වෙලෙවි වැ මැ පැළැඳි හස්තාභරණ ඇතියේ මොනොවට හන් පිළී ඇත්තේ සඳුනෙන් සැරැසුණේ,

6160. හිසින් ස්නාන කෙළේ තෙත් කෙහෙ ඇති වැ පළන් මිණිකොඩොල් ඇති වැ වෙසතුරු නිවෙස් වූ රම්‍ය වූ පුරයට එළැඹියේ යැ.

6161. ඒ ඇමැති සිය නුවරැ තව්තිසා දෙවියන් මැඳ ප්‍රීත වන සක්දෙව් රජු මෙන් ඇමැතියන් පිරිවැරූ දුන් දනෙහි සිත් අළවන වෙසතුරු කුමරු දිටී.

6162. ඒ කාරියකරවන ඇමැති එහි ගොස් ප්‍රීත වන වෙසතුරු කුමරුහට මෙසේ කී: රජතුමනි, තොප වහන්සේට දුක් හස්නක් දන්වන්නෙමි. මට නහමක් කිපෙව.

6163. ඒ ඇමැති රජතුමන් වැඳැ හඬමින් මෙසේ කී: මහරජ, තෙපි වනාහි කැමැති සියලු රස ගෙන දෙන මාගේ සවාමි වව. තොප වහන්සේට දුක් හස්නක් දන්වන්නෙමි. එහිලා මා සනසත්වා.

6164. දේවයන් වහන්ස, සිවිහු තොප වහන්සේට කිපියහ. නියම්ගම් වැස්සෝ ද ප්‍රසිද්ධ පුද්ගලයෝ ද රාජපුත්‍රයෝ ද වෙළෙඳෝ ද බමුණෝ ද රැස්වූහ.

6165. ඇතරුවෝ ද අසරුවෝ ද රියසරුවෝ ද පාබළ සෙනඟ ද හුදෙක් නියම්ගම්වැස්සෝ ද සිවිහු ද වූහ.

6166. මෙ රෑ අවසන්හි හිරු උදවන සමයෙහි සිවිහු සමග වැ තොප වගන්සේ රටින් නෙරති යි (කී යැ.)

6167. සිවිහු කවර කරුණෙහි මට කිපියාහු ද? නපුරු කොට කරනලද්දක් මම නො දක්මි. කාරියකරවන ඇමැතිය, මට එය විස්තර කොට කියව. කවර හෙයින් මා නෙරත් ද?

6168. ප්‍රකට පුද්ගලයෝ ද රාජපුත්‍රයෝ ද වෙළෙඳෝ ද බමුණෝ ද ඇතරුවෝ ද අසරුවෝ ද රියසරුවෝ ද පාබළ සෙනඟ ද ඇතු දන් දීම් හේතුයෙන් දෙස් පහළ කෙරෙති. එහෙයින් තොප වහන්සේ නෙරති.

6169. මම හදවත (පපුමස්) ද ඇස් ද දෙන්නෙමි. මාගේ බාහිර ධන දිම ගැන කියනු කිම? රන් හෝ අමුරන් හෝ මුතු මැණික් හෝ වෙරළුමිණි හෝ දෙන්නෙමි.

6170. වෙත පැමිණි යාචකයන් දැකැ දකුණත හෝ දෙන්නෙමි. හො වරදවන්නෙමි. මා සිත දීමෙහි ඇලේ.

6171. කාමං මං සිවයො සබ්බ පබ්බාජෙන්තු හනන්තු වා,
නෙව දනා විරමිස්සං කාමං ජිනන්තු සන්නධා.

6172. එවං තං සිවයො ආහු නෙගමා ච සමාගතා,
කොනාමිමාරාය තීරෙන ගිරිං ආරඤ්ජරං පති;
යෙන පබ්බජිතා යන්ති තෙන ගච්ඡතු සුබ්බතො.

6173. සොහං තෙන ගමිස්සාමි යෙන ගච්ඡන්ති දූසකා,
රත්තින්දිවං මෙ ධම්මථ යාව දනං දදාමහං.

6174. ආමන්තයිත්ථ රාජා නං මද්දීං සබ්බඞ්ගසොභනං,
යං තෙ කිඤ්චි මයා දින්නං ධනං ධඤ්ඤඤ්ච විජ්ජති.

6175. හිරඤ්ඤං වා සුවණ්ණං වා මුත්තා වෙළුරියා බහු,
සබ්බං තා නිදහෙය්‍යාසි යඤ්ච තෙ පෙත්තිකං ධනං.

6176. තමබ්‍රවී රාජපුත්තී මද්දී සබ්බඞ්ගසොභනා,
කුහිං දෙව නිදහෙය්‍යාමි[1] තවෙව අකබාහි පුච්ඡිතො.

6177. සීලවන්තෙසු දජ්ජාසි[2] දනං මද්දී යථාරහං,
න හි දනා පරං අත්ථි පතිට්ඨා සම්පරායිකං.

6178. පුත්තෙසු මද්දී දය්‍යාසි[3] සස්සුයා[4] සසුරම්හි ච,
යො ච තං හන්තා මඤ්ඤය්‍ය සක්කච්චං තං උපට්ඨහෙ.

6179. නො චෙ තං හන්තා මඤ්ඤය්‍ය මයා විප්පවසෙන තෙ,
අඤ්ඤං හන්තාරං පරියෙස මා කිසිත්ථ මයා විනා.

6180. අහං හි වනා ගච්ඡාමි සොරං වාළමිගායුතං,
සංසයො ජීවිතං මය්හං එකකස්ස[5] බ්‍රහාවනෙ.

6181. තමබ්‍රවී රාජපුත්තී මද්දී සබ්බඞ්ගසොභනා,
අහුමෙම කථං නු හණසි පාපකං වත භාසසි.

6182. නෙස ධම්මො මහාරාජ යං ත්වං ගවෙස්‍යය එකකො,
අහමපි තෙන ගච්ඡාමි යෙන ගච්ඡසි ඛත්තිය.

6183. මරණං වා තයා සද්ධිං ජීවිතං වා තයා විනා,
තදෙව මරණං සෙය්‍යො යඤ්ච ජීවෙ තයා විනා.

---

1. නිදහාමි – මජ්ඣං. සය්හ.
2. දජ්ජසි – මජ්ඣං. සය්හ.
3. දයෙයි – මජ්ඣං. සය්හ. ව්.
4. යසස්සුයා – මජ්ඣං. ව්.
5. එකිකස්ස – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6171. ඒකාන්තයෙන් සියලු සිවිහු මා රථින් නෙරත්වා. නොහොත් නසත්වා. (ඔහු) ඒකාන්තයෙන් (මා) සත්කඩක් කොටැ කපත්වා. එහෙත් දීමෙන් නො වළකින්නෙමි යි වෙසතුරු රජ කීය.

6172. සිවිහු ද රැස්වූ නියමගම් වැසියෝ ද (නොපට) මෙසේ කීහ: **කොන්තිමාරු** නමැති ගංතෙරින් **අරඤ්ජර** නමැති පර්වතය බලා වරද කළ රජදරුවෝ යම් මහෙකින් යෙද්ද ඒ මඟින් මතා පැවැතුම් ඇති වෙසතුරු රජ යේවා යි ඇමති අනෙක් හස්නක් දකි.

6173. වරද කළ තැනැත්තෝ යම් මහෙකින් **යන්නාහු** ද එ මඟින් ඒ මම ද යන්නෙමි. මම දනයක් දෙමි. එක් දවසකට මට සමාව දෙට යි වෙසතුරු කී.

6174. වෙසතුරු රජ සියලු අහපසඟින් හොබනා මද්‍රී දේවිය ඇමැතී: මා තොපට දුන් ධනධාන්‍යයක් ඇද්ද

6175. අමුරන් හෝ රත්රන් හෝ බොහෝ වූ **මුතු** හෝ වෙරළුමිණි හෝ ඇද්ද පියාගෙන් (මවුපියන්ගෙන්) **ගෙනෙන** ලද යම් ධනයක් ඇද්ද ඒ සියල්ල නිදන් **කොටැ** තබව**යි කී.**

6176. සියලු අහපසඟින් හොබනා මද්‍රී නම් රජ දුව **දේවයිනි,** කවර නම් තැනෙකැ නිදන් කොට තබනෙමි ද? **විචාරන** ලද මට ඒ ස්ථානය කියවයි පැවැසූ ය.

6177. මද්‍රීදේවිනි, සිලවන්තයන් කෙරෙහි **සුදුසු** පරිදි දෙව. සවියතුනට දනයට වැඩි උතුම් පිහිටෙක් නැත.

6178. **මද්‍රීදේවිනි,** දරුවන් **කෙරෙහි** ද නැදිමයිලන් **කෙරෙහි** ද දයාමෛත්‍රී පතුරව. යමෙක් තොපගේ **සැමියා** යැ යි අදහස් කෙරවු නම් ඔහුට මැනැවින් උපස්ථාන කරට.

6179. මාගේ වෙන් වීමෙන් පසු ඒ මා තොපගේ සැමියකු ලෙය නො සිතව. වෙන **සැමිපුරුෂයකු** සොයා ගනුව. මාගේ වෙන් වීම හේතු කොටැගෙන කෘශ නො වව.

6180. මම **බිහිසුණු** වල්මුවන් ගැවැසුණු මහවනයට යමි. මහවනයෙහි හුදෙකලාවැ වෙසෙන මාගේ ජීවිතය සැක සහිත ය.

6181. හැම අහපසඟින් හොබනා මද්‍රීදේවි, අහෝ පෙර නො පැවැසූ වදනක් (අද) කියහි. ඒකාන්තයෙන් නපුරක්— අනර්‍හයක් (අද) කියහි යැ යි වෙසතුරු රජහට කීවා ය.

6182. මහරජ, යම් හෙයෙකින් හුදෙකලා වැ තෙපි (වනයට) යන්නහු නම් ඒ ධර්මය නො වෙයි. දේවයිනි, යම් තැනකට නෙපි යන්නහු නම් මම ද එ තැනට යමි.

6183. තොප සමග මරණය හෝ තොපගෙන් වියෝ වැ ජීවත්වීම හෝ යන මේ දෙකින් තොපගෙන් වෙන් වැ ජීවත්වීමට වඩා මරණය **උතුම්.**

6184. අඞ්ගං නිජ්ජාලයිත්වාන එකජාලසමාහිතං,
තත්ථ මෙ මරණං සෙය්‍යො යඤ්චෙ ජීවෙ තයා විනා.

6185. යථා ආරඤ්ඤකං නාගං දන්තිං අන්වෙති හත්ථිනී,
ජෙස්සන්තං ගිරිදුග්ගෙසු සමෙසු විසමෙසු ච.

6186. එවං තං අනුගච්ඡාමි පුත්තෙ ආදය පච්ඡතො,
සුහරා තෙ භවිස්සාමි න තෙ හෙස්සාමි දුබ්භරා.

6187. ඉමෙ කුමාරෙ පස්සන්තො මඤ්ජුකෙ පියභාණිනො,[1]
ආසීනෙ[2] වනගුම්බස්මිං න රජ්ජස්ස සරිස්සසි.

6188. ඉමෙ කුමාරෙ පස්සන්තො මඤ්ජුකෙ පියභාණිනො,
කීළන්තෙ වනගුම්බස්මිං න රජ්ජස්ස සරිස්සසි.

6189. ඉමෙ කුමාරෙ පස්සන්තො මඤ්ජුකෙ පියභාණිනො,
අස්සමෙ රමණීයම්හි න රජ්ජස්ස සරිස්සසි.

6190. ඉමෙ කුමාරෙ පස්සන්තො මඤ්ජුකෙ පියභාණිනො,
කීළන්තෙ අස්සමෙ රම්මෙ න රජ්ජස්ස සරිස්සසි.

6191. ඉමෙ කුමාරෙ පස්සන්තො මාලධාරී අලඞ්කතෙ,
අස්සමෙ රමණීයම්හි න රජ්ජස්ස සරිස්සසි.

6192. ඉමෙ කුමාරෙ පස්සන්තො මාලධාරී අලඞ්කතෙ,
කීළන්තෙ අස්සමෙ රම්මෙ න රජ්ජස්ස සරිස්සසි.

6193. යද දක්ඛිසි නච්චන්තෙ කුමාරෙ මාලධාරිනො,[3]
අස්සමෙ රමණීයම්හි න රජ්ජස්ස සරිස්සසි.

6194. යද දක්ඛිසි නච්චන්තෙ කුමාරෙ මාලධාරිනො,
කීළන්තෙ අස්සමෙ රම්මෙ න රජ්ජස්ස සරිස්සසි.

6195. යද දක්ඛිසි මාතඞ්ගං කුඤ්ජරං සට්ඨිහායනං,
එකං අරඤ්ඤෙ විචරන්තං න රජ්ජස්ස සරිස්සසි.

6196. යද දක්ඛිසි මාතඞ්ගං කුඤ්ජරං සට්ඨිහායනං,
සායං[4] පාතො විචරන්තං න රජ්ජස්ස සරිස්සසි.

---

1. පියභාණිනෙ – මජසං. ස්‍යා.
2. ආසනෙ – මජසං.
3. මාලධාරිනෙ – මජසං. ස්‍යා. වි.
4. සාරං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6184. තොපගෙන් වෙන් වැ ජීවත්වීමට වඩා විතකයෙහි ගිනි දල්වා එක මැ ගිනි ජාලාවක් වූ කලැ එහි මාගේ මරණය උතුම්.

6185. යම්සේ ඇතිනි සම විසම ගිරි දුර්ගයන්හි හැසිරෙන අරනවැසි දළඇතකු අනු වැ යේ ද.

6186. එසෙයින් දරුවන් රැගෙන තොප අනු වැ එම්. තොප විසින් සුවසේ පෝෂණය කළ හැකි තැනැත්තියක් වන්නෙමි. දුහර නො වන්නෙමි.

6187. මිහිරි බස් ඇති ප්‍රිය වදන් ඇති මහවනයෙහි වෙසෙන මේ කුමරුන් දක්නේ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6188. මිහිරි බස් ඇති ප්‍රිය වදන් ඇති මහවනයෙහි ක්‍රීඩා කරන මේ කුමරුන් දක්නේ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6189. මිහිරි බස් ඇති ප්‍රිය වදන් ඇති රමණීය ආශ්‍රමයෙහි වෙසෙන මේ කුමරුන් දක්නේ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6190. මිහිරි බස් ඇති ප්‍රිය තෙපුල් ඇති සිත්කලු අසපුවෙහි සෙල්ලම්කරන මේ කුමරුන් දක්නේ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6191. රමණීය අසපුවෙහි මල්මාලා දරන අලංකෘත වූ මේ කුමරුන් දක්නේ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6192. රම්‍ය අසපුවෙහි සෙල්ලම් කරන මල්මාලා දරන අලංකෘත වූ මේ කුමරුන් දක්නේ රාජ්‍යය නොසිහිකරන්නෙහි.

6193. රමණීය අසපුවෙහි මල්මාලා දරමින් නටන කුමරුන් යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6194. රම්‍ය වූ අසපුවෙහි මල්මාලා දරමින් නටන සෙල්ලම් කරන කුමරුන් යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6195. හුදෙකලා වැ වනයෙහි හැසිරෙන සැටවස් පිරුණු මාතඬ නම් ඇතු යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6196. උදේ සවස හැසිරෙන සැටවස් පිරුණු මාතඬ නම් ඇතු යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6197. යද කණෙරුසඞ්ඝස්ස යූථස්ස පුරතෝ වජං,,
කොඤ්චං කාහති මාතඞ්ගා කුඤ්ජරෝ සට්ඨිහායනෝ;
තස්ස තං නදතෝ සුත්වා න රඤ්ඤස්ස සරිස්සති.

6198. දුහතෝ වනවිකාසෙ[1] යද දකඛිසි කාමදං,[2]
වනෙ වාළමිගාකිණ්ණෙ න රඤ්ඤස්ස සරිස්සති.

6199. මිගං දිස්වාන සායනහං පඤ්ඤමාලිනමාගතං,[3]
කිම්පුරිසෙ ච නව්හතෝ න රඤ්ඤස්ස සරිස්සති.

6200. යද සොස්සති[4] නිග්ඝොසං සන්දමානාය සිඤ්ඤියා,
ගීතං කිම්පුරිසානඤ්ච න රඤ්ඤස්ස සරිස්සති.

6201. යද සොස්සති නිග්ඝොසං ගිරිගබ්භරවාරිනෝ,
වස්සමානස්ස ලූකස්ස න රඤ්ඤස්ස සරිස්සති.

6202. යද සීහස්ස ව්‍යග්ඝස්ස බගඝස්ස ගවයස්ස ච,
වත්ත සොස්සති වාළානං න රඤ්ඤස්ස සරිස්සති.

6203. යද මොරිහි පරිකිණ්ණං බරිහීනං[5] මහාකාසීනං,
මොරං දකඛිසි නව්හතෝ න රඤ්ඤස්ස සරිස්සති.

6204. යද මොරිහි පරිකිණ්ණං අණ්ඩජං චිත්‍ර පෙක්ඛුනං,[6]
මොරං දකඛිසි නව්හතෝ න රඤ්ඤස්ස සරිස්සති.

6205. යද මොරිහි පරිකිණ්ණං නීලගීවං සිඛණ්ඩිනං,
මොරං දකඛිසි නව්හතෝ න රඤ්ඤස්ස සරිස්සති.

6206. යද දකඛිසි හෙමන්තෙ පුප්ඵිතෙ ධරණීරුහෙ,
සුරභිසම්පවායන්තෙ න රඤ්ඤස්ස සරිස්සති.

6207. යද හෙමන්තිකෙ මාසෙ හරිතං දකඛිසි මෙදිනිං,
ඉන්දගොපකසඤ්ඡන්නං න රඤ්ඤස්ස සරිස්සති.

6208. යද දකඛිසි හෙමන්තෙ පුප්ඵිතෙ ධරණීරුහෙ,
කුටජං බිම්බජාලඤ්ච පුප්ඵිතං ලොමපද්මකං;[7]
සුරභිසම්පවායන්තෙ න රඤ්ඤස්ස සරිස්සති.

6209. යද හෙමන්තිකෙ මාසෙ වනං දකඛිසි පුප්ඵිතං,
ඔපුප්ඵානි ච පදවානි[8] න රඤ්ඤස්ස සරිස්සති.

ගිම්හන්තවණ්ණනා.

---

1. චිකාලෙ – මජ්ඣං.
2. සාමදෙ – මජ්ඣං.
3. පඤ්චමාලිනි මාගතං. – මජ්ඣං. සය්‍හා. චී.
4. සුස්සති – මජ්ඣං. සය්‍හා.
5. පරිහීනං – මජ්ඣං. වරණීනං – සය්‍හා.
6. පකඛීනං – මජ්ඣං. – පෙක්ඛුනං සීමු.
7. ලොද්‍රපලම්බකං – මජ්ඣං. සය්‍හා.
8. ඛඩානි – මජ්ඣං.

* මෙම පොත්තේ පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6197. යම් කලෙක ඇතිනිරැළෙහි ද ඇත්රැළෙහි ද පෙරටුවැ යන පිරුණු සැටවස් ඇති මාතඞග නම් ඇතා කුණ්භනාද කරන්නේ ද නාද කරන ඔහුගේ ඒ නාදය අසා රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6198. වනමෘගයන් ගැවසුණු කැමැති සම්පත් දෙන දෙපසැ වනයෙහි වනගළ—(එකාබද්ධ වූ මහවනය) යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6199. සවස් වේලෙහි පැමිණි අංදළු පහක් ඇති මුවා ද නටන කිඳුරන් ද දැක රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6200. බැස යන නදියගේ සෝෂාව ද කිඳුරන්ගේ ගී හඬ ද යම් කලෙක අසන්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6201. පර්වත ගුහාවල හැසිරෙන හඬන බකමුහුණන්ගේ නාදය යම් කලෙක අසන්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6202. වනයෙහි (වෙසෙන) සිංහ, ව්‍යාඝ්‍ර, කගවෙහෙණ, ගවර යන සතුන්ගේ ද (සෙසු) වනමෘගයන්ගේ ද නාදය යම් කලෙක අසන්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6203. පර්වත මුදුන්හි සිටින පිල්කළඹින් ගැවැසුණු මොනරියන් පිටිවැරැ නටන මොනරා යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6204. සෙබඩුන් විසින් පිරිවැරුණු විසිතුරු පිල් ඇති බිසුවටින් උපන් නටන මොනරා යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6205. සෙබඩුන් පිරිවරා නිල්ගෙල ඇති හිසැ සිළු ඇති නටන මොනරා යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6206. හේමන්ත ඍතුවෙහි පිපුණු සුවඳ හමන ගස් යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6207. හේමන්ත මාසයෙහි (මැදින් මසැ) රතිඳුගොවවන් ගැවැසුණු නිල් පැහැ යුත් පොළොව යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6208. හේමන්ත ඍතුවෙහි පිපුණු කෙළිදගස් හා රත්කරවුගස් ද ලොත්ගස් හා පියුම්ගස් ද යන මේ සුවඳ හමන ගස් යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

6209. හේමන්ත ඍතුවෙහි පිපුණු වනය ද වැටුණු නෙළුම් මල් ද යම් කලෙක දක්නෙහි ද එකලැ රාජ්‍යය නො සිහිකරන්නෙහි.

හිමවත් වැනුම්.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6210. තෙසං ලාලප්පිතං සුත්වා පුත්තස්ස සුණිසාය ච,
කරුණං පරිදෙවෙසි රාජපුත්ති යසස්සිනී.

6211. සෙය්‍යො විසං මෙ ඛායිතං පපාතා පපතෙය්‍යහං,
රජ්ජුයා බජ්ඣ මීය්‍යාහං
කස්මා වෙස්සන්තරං පුත්තං පබ්බාජෙන්ති අදූසකං.

6212. අජ්ඣායකං දානපතිං යාචයොගං අමච්ඡරිං,
පූජිතං පතිරාජෙහි කිත්තිමන්තං යසස්සිනං;
කස්මා වෙස්සන්තරං පුත්තං පබ්බාජෙන්ති අදූසකං.

6213. මාතාපෙත්තිභරං ජන්තුං කුලෙජෙට්ඨාපචායිකං,
කස්මා වෙස්සන්තරං පුත්තං පබ්බාජෙන්ති අදූසකං.

6214. රඤ්ඤෝ හිතං දෙවහිතං ඤාතීනං සඛීනං හිතං,
හිතං සබ්බස්ස රට්ඨස්ස
කස්මා වෙස්සන්තරං පුත්තං පබ්බාජෙන්ති අදූසකං.

6215. මධූනීව පලාතානි අම්බාව පතිතා ජමා,
එවං හෙස්සති තෙ රට්ඨං පබ්බාජෙන්ති අදූසකං.

6216. හංසො නික්ඛිණපත්තොව පල්ලලස්මිං අනූදකෙ,
අපවිද්ධො[1] අමච්චෙහි එකො රාජ විහීයසි.

6217. තං තං බ්‍රූමි මහාරාජ අත්ථො තෙ මා උපච්චගා,
මා තං සිවීනං වචනා පබ්බාජෙසි අදූසකං.

6218. ධම්මස්සාපචිතිං කුම්මි සිවීනං විනයං ධජං,
පබ්බාජෙමි සකං පුත්තං පාණා පියතරොහි මෙ.

6219. යස්ස පුබ්බෙ ධජග්ගානි කණිකාරාව පුප්ඵිතා,
යායන්තමනුයායන්ති ස්වාජ්ජෙකොව ගම්ස්සති.

6220. යස්ස පුබ්බෙ ධජග්ගානි කණිකාරවනානිව,
යායන්තමනුයායන්ති ස්වාජ්ජෙකොව ගම්ස්සති.

---

1. අපවිට්ඨො – මජසං, ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6210. පුතා යැ ලේලි යැ යන ඔවුන්ගේ විලාප බස් අසා පිරිවර ඇති මදුරජ දූ වූ ඵුසතීදේවී තොමෝ බැගෑ ලෙස හැඬූ ය.

6211. නිවැරැදි වූ වෙස්සන්තර පුතු කවර හෙයින් රටින් පිට කෙරෙත් ද? මා විසින් විස අනුභව කරන ලද්දේ නම් හෝ ප්‍රපාතයෙන් පනින්නෙම් නම් හෝ ගෙලවැල ලා මැරෙන්නෙම් නම් හෝ එයට වඩා උතුම් ය.

6212. ත්‍රිවේදයෙහි ද නානාශිල්පයන්හි ද කෙළ පැමිණි දනපති වූ ඉල්ලන්නට සුදුසු නො මසුරු උපරජුන් විසින් පුදන ලද පතළ කීර්ති ඇති පිරිවර සේනා ඇති නිවැරැදි වෙසතුරු පුතු කවර හෙයින් රටින් පිට කෙරෙත් ද?

6213. මවුපියන් පෝෂණය කරන කුලදෙටුවන් පුදන නිවැරැදි වෙසතුරු පුතු කවර හෙයින් රටින් පිට කෙරෙත් ද?

6214. රජුට හිතැ'ති දෙවියනට හිතැ'ති නෑයනට හිතැ'ති යහළුවනට හිතැ'ති සියලු රටවැසියනට හිතැ'ති නිවැරැදි වෙසතුරු පුතු කවර හෙයින් රටින් පිට කෙරෙත් ද?

6215. (යම්හෙයෙකින්) නිවැරැදි වෙසතුරු පුතු රටින් පිටුවහල් කෙරෙත් ද? (එකලැ) ඔබගේ රට මැස්සන් හැර දමා ගිය මධුපටල (මීවද) මෙන් ද ගිලිහී බිමැ වැටුණු අඹ මෙන් ද වන්නේ ය.

6216. මහරජ, දිය හිඳුණු විලෙක (මඩකඩිත්තෙකැ) පියාපත් හැලුණු හංසයකු මෙන් ඇමැතියන් විසින් හැර දැමූ තෙපි හුදෙකලා යැ, පීඩිත වන්නහු ය.

6217. මහරජ, තොපට එ කරුණ කියමි. ප්‍රයෝජනය නොහොත් අභිවෘද්ධිය (තොප) ඉක්මැ නො යේවා! සිව්රට වැසියන්ගේ බසට නිවැරැදි තැනැත්තා පිටුවහල් නො කරව.

6218. සොඳුර, මම සිවීන්ගේ ධජයක් බඳු වෙසතුරු කුමරු හික්මවමින් පිටුවාහල් කරමි. සිවීන්ගේ ප්‍රවේණිධර්මයට ගරු කරමි. මපුතු වනාහී ප්‍රාණයට ද වඩා මට ප්‍රියතර ය.

6219. පෙරැ යමකුගේ ධවජාග්‍ර පිපුණු කිණිහිරිගස් මෙන් යන්නහු අනුව යෙද්ද (ගියාහු ද) හේ අද හුදෙකලා වැ යන්නේ ය.

6220. පෙරැ යමකුගේ ධවජාග්‍රයෝ පිපුණු කිණිහිරි වනයක් මෙන් යන්නහු අනු වැ යෙද්ද (ගියාහු ද) හේ අද වනාහි හුදෙකලා වැ යන්නේ ය.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6221. යස්ස පුබ්බෙ අණිකානි කණිකාරාව පුපඵිතා,
යායන්තමනුයායන්ති ස්වාජ්ජෙකොව ගමිස්සති.

6222. යස්ස පුබ්බෙ අණිකානි කණිකාරවනානිව,
යායන්තමනුයායන්ති ස්වාජ්ජෙකොව ගමිස්සති.

6223. ඉන්දගොපකවණ්ණාභා ගන්ධාරා පණ්ඩුකම්බලා,
යායන්තමනුයායන්ති ස්වාජ්ජෙකොව ගමිස්සති.

6224. යො පුබ්බෙ හත්ථිනා යාති සිවිකාය රථෙන ච,
ස්වාජ්ජ වෙස්සන්තරො රාජා කථං ගච්ඡති පත්තිකො.

6225. කථං වන්දනලිත්තඞ්ගො නච්චගිතප්පබොධනො,
ඛරාජිනං එරසුඤ්ච ඛාරිකාජඤ්ච භාහිති.[1]

6226. කස්මා නාභිහරීයන්ති කාසාවා අජිනානි වා[2]
පවිසන්තං බ්‍රහාරඤ්ඤං කස්මා චීරං න බජ්ඣරෙ.

6227. කථන්නු චීරං ධාරෙන්ති රාජපබ්බජිතා ජනා,
කථං කුසමයං චීරං මද්දී පරිදහෙස්සති.[3]

6228. කාසියානි ච ධාරෙත්වා ඛොමකොදුම්බරානි ච,[4]
කුසචීරානි ධාරෙන්ති කථං මද්දී කරිස්සති.

6229. වය්ගාහි පරියායිත්වා සිවිකාය රථෙන ච
සා කථජ්ජ අනුච්චඩ්ගී පථං ගච්ඡති පත්තිකා.

6230. යස්සා මුදුතලා හත්ථා චරණා ච සුඛෙධිතා,
සා කථජ්ජ අනුච්චඩ්ගී වනං ගච්ඡති භීරුකා.[5]

6231. යස්සා මුදුතලා පාදා චරණා ච[6] සුඛෙධිතා,[7]
පාදුකාහි සුවණ්ණාහි පීළමානාව ගච්ඡති;
සා කථජ්ජ අනුච්චඩ්ගී පථං ගච්ඡති පත්තිකා.

---

1. භාරිසි – මජ්ඣං, භාරිති – ස්‍යා.
2. ච – මජ්ඣං. ස්‍යා.
3. පරිදහිස්සති – මජ්ඣං
4. ඛොමකොටුම්බරානි ච – මජ්ඣං.
5. පථං ගච්ඡති පත්තිකා – මජ්ඣං. ස්‍යා.
6. චලනාව – ස්‍යා.
7. සුඛෙධිතා – මජ්ඣං. වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6221. පෙර යමකුගේ ඇතුන් ආදී කොටැ ඇති සෙනහ පිපුණු කිණිහිරි ගස් මෙන් යන්නහු අනු වැ යෙද්ද හේ අද හුදෙකලා වැ යෙයි.

6222. පෙර යමකුගේ ඇතුන් ආදී කොටැ ඇති සෙනහ පිපුණු කිණිහිරි වනයක් මෙන් යන්නහු අනු වැ යෙද්ද හේ අද හුදෙකලා වැ යෙයි.

6223. යමකුගේ පෙර ඉඳුගොව්වන්ගේ පැහැයට බඳු ''ගඤ්ඣාර'' රටෙහි සාදන ලද රතුකම්බිලි පෙරවූ සෙනහ යන්නහු අනු වැ යෙද්ද හේ (ගියාඋ ද) අද හුදෙකලා වැ යෙයි.

6224. යමෙක් පෙර ඇතුපිටින් ද දෝලාවෙන් ද රියෙන් ද ගියේ නම් ඒ වෙස්සන්තර රජ තෙමේ අද කෙසේ නම් පයින් යා ද?

6225. යදුන් ගැල්වුණු ශරීර ඇති ගි නැටුමෙන් පුබුදුවන වෙසතුරු රජ තෙමේ අද අදුන්දිවිසම ද පොරොව ද තවුස් පිරිකර ද කෙසේ නම් ගෙනැ යන්නේ ද?

6226. මහවනයට පිවිසෙනුවහට කාසාව වස්ත්‍ර හෝ අදුන්දිවිසම හෝ කවර හෙයින් නො ගෙන යද්ද? කවර හෙයින් වැහැරි (වාකචීර) නො බඳිද්ද?

6227. රජ වැ සිට පැවිදි වූවෝ කෙසේ නම් වැහැරියෙන් කළ සිවුරු දරත් ද? කුසතණයෙන් කළ වැහැරි මද්‍රීදෙවී කෙසේ හඳනී ද?

6228. කසිසළු ද 'ඛොම' රටෙහි 'කොදුම්බර' රටෙහි නිපන් සළු ද ධරා මද්‍රීදෙවී කුසවැහැරි ධරනු කෙසේ නම් කරන්නී ද?

6229. හිදෙළයෙන් ද සිවිකායෙන් ද රියෙන් ද මෙනුවර සිසාරා ඇවිද නිදෙස් සිරුරු ඇති ඕ අද කෙසේ නම් පාගමනින් මහමඟ යා ද?

6230. යමකුගේ සුවසේ වැඩුණු මොළොක් අතුල්පතුල් ඇති හස්තපාදයෝ වෙත් ද, නිදෙස් සිරුරු ඇති බියසුලු ඕ අද කෙසේ නම් වනයට යා ද?

6231. යමකට සුවසේ වැඩුණු මොළොක් අතුල්පතුල් ඇති අත්පා ඇද්ද, යම් ස්ත්‍රියක් රන් මිරිවැඩිසහළින් යුතු වැ මිරිකෙමින් මැ යා ද, ප්‍රශස්ත අවයව ඇති ඕ අද කෙසේ නම් පාගමනින් මහමඟ යා ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6232. යාස්සු ඉත්ථී සහස්සස්ස[1] පුරතො ගච්ඡති මාලිනී,
සා කථජ්ජ අනුච්චඩ්ගී වනං ගච්ඡති එකිකා.

6233. යාස්සු සිවාය සුත්වාන මුහුං උත්තසතෙ පුරෙ,
සා කථජ්ජ අනුච්චඩ්ගී වනං ගච්ඡති භීරුකා.

6234. යාස්සු ඉන්දස්ස ගොත්තස්ස උළුකස්ස පවස්සතො,
සුත්වාන නදතො භීතා වාරුණීව පවෙධති:
සා කථජ්ජ අනුච්චඩ්ගී වනං ගච්ඡති භීරුකා.

6235. සකුණී හතපුත්තාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
චිරං දුක්ඛෙන ඣායිස්සං සුඤ්ඤං ආගම්මිමං පුරං.

6236. සකුණීහතපුත්තාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
කිසා පණ්ඩු භවිස්සාමි පියෙ පුත්තෙ අපස්සතී.

6237. සකුණී හත පුත්තාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
තෙන තෙන පධාවිස්සං පියෙ පුත්තෙ අපස්සතී.

6238. කුරරී[2] හතඡාපාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
චිරං දුක්ඛෙන ඣායිස්සං සුඤ්ඤං ආගම්මිමං පුරං.

6239. කුරරී හතඡාපාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
කිසා පණ්ඩු භවිස්සාමි පියෙ පුත්තෙ අපස්සතී.

6240. කුරරී හතඡාපාව සුඤ්ඤං දිස්වා කුලාවකං,
තෙන තෙන පධාවිස්සං පියෙ පුත්තෙ අපස්සතී.

6241. සා නූන චක්කවාකීව පල්ලලස්මිං අනූදකෙ,
චිරං දුක්ඛෙන ඣායිස්සං සුඤ්ඤං ආගම්මිමං පුරං.

6242. සා නූන චක්කවාකීව පල්ලලස්මිං අනූදකෙ,
කිසා පණ්ඩු භවිස්සාමි පියෙ පුත්තෙ අපස්සතී,

6243. සා නූන චක්කවාකීව පල්ලලස්මිං අනූදකෙ;
තෙන තෙන පධාවිස්සං පියෙ පුත්තෙ අපස්සතී.

---

1. ඉත්ථීසහස්සානං – මජ්ඣං.
2. කුරුරී – මජ්ඣං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6232. පැළැඳි මල්දම් ඇති යම් ස්ත්‍රියක් දහසක් ස්ත්‍රීන්ට පෙරටු වැ යා ද, ප්‍රශස්ත ශරීර ඇති ඕ අද කෙසේ නම් එකලා වැ වනයට යා ද?

6233. යම් ස්ත්‍රියක් පෙරැ සිවල්දෙනකගේ හඬ අසා එකෙණෙහි තැතිගනී ද, අගරහිත සිරුරු ඇති බියසුලු ඕ අද කෙසේ නම් වනයට යා ද?

6234. යම් ස්ත්‍රියක් නාද කරන කෞෂිකගොත්‍ර ඇති මහ-මුහුණුහුගේ හඬ අසා බිය වැ දේවතාවිෂ්ට යක්ෂදාසියක මෙන් වෙවුළා ද අනින්දිත ශරීර ඇති බියසුලු ඕ අද කෙසේ නම් වනයට යා ද?

6235. හිස් වූ කැඳල්ල දැකැ, දරුවන් නට ලිහිණියක මෙන් මම දරුවන්ගෙන් හිස් වූ මෙ නිවෙසට අවුත් බොහෝ කලක් දුකින් සිතිවිලිපර වන්නමු.

6236. හිස් වූ කැඳල්ල දුටු, පැටවුන් මළ කිරිල්ලක මෙන් මම හිස් වූ මෙ නිවෙසට අවුත් (වෙසතුරු මදී) ප්‍රියපුතුන් නො දක්නී කෘශ වැ පඬුවන් වන්නමු.

6237. හිස් වූ කැඳල්ල දුටු, පැටවුන් මළ කිරිල්ලක මෙන් මම හිස් වූ මෙ නිවෙසට අවුත් ප්‍රියපුතුන් නො දක්නී ඒ ඒ තැන දිවැයන්නමු.

6238. හිස් වූ කැඳල්ල දුටු, පැටවුන් නැසුණු උකුසුදෙනක මෙන් මම හිස් වූ මෙ නිවෙසට අවුත් දිගුකලක් සිතිවිලිපර වන්නමු.

6239. හිස් වූ කැඳල්ල දුටු, පැටවුන් මළ උකුසුදෙනක මෙන් ප්‍රියපුතුන් නො දක්නී කෘශ වැ පඬුවන් වන්නමු.

6240. හිස් වූ කැඳල්ල දුටු, පැටවුන් මළ ලිහිණියක මෙන් ප්‍රියපුතුන් නො දක්නී ඒ ඒ තැන දිවැයන්නමු.

6241. දියසිඳි මඩෙහි සක්වා ලිහිණියක මෙන් ඒ මම දරුවන් නැති බැවින් හිස් වූ නිවෙසට අවුත් බොහෝ කලක් ඒකාන්තයෙන් දුකින් සිතිවිලිපර වන්නමු.

6242. දියසුන් මඩෙහි සක්වා ලිහිණියක මෙන් ඒ මම ඒකාන්තයෙන් ප්‍රියපුතුන් නො දක්නී කෘශ වැ පඬුවන් වන්නමු.

6243. දියසිදුණු මඩෙහි සක්වා ලිහිණියක මෙන් මම ඒකාන්තයෙන් ප්‍රියපුතුන් නො දක්නී ඒ ඒ තන්හි දිවැයන්නමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6244. එවං චෙ මෙ විලපන්තියා රාජපුත්තං අදූසකං,
පබ්බාජෙසි වනං රට්ඨා මඤ්ඤෙ හෙස්සාමි ජීවිතං,

6245. තස්සා ලාලප්පිතං සුත්වා සබ්බා අන්තෙපුරෙ බහූ,[1]
බාහා පග්ගය්හ පක්කන්දුං සිවිකඤ්ඤ සමාගතා.

6246. සාලාව සම්පමථිතා මාලුතෙන පමද්දිතා,
සෙන්ති පුත්තා ච දරා ච වෙස්සන්තරනිවෙසනෙ.

6247. ඔරොධා ච කුමාරා ච වෙසියානා ච බ්‍රාහ්මණා,
බාහා පග්ගය්හ පක්කන්දුං වෙස්සන්තරනිවෙසනෙ.

6248. හත්ථාරූහා අනීකට්ඨා රථිකා පත්තිකාරකා,
බාහා පග්ගය්හ පක්කන්දුං වෙස්සන්තරනිවෙසනෙ.

6249. තතො රත්‍යා විවසනෙ සූරියස්සුග්ගමනං පති,
අථ වෙස්සන්තරො රාජා දනං දතුං උපාගමි.

6250. වත්ථානි වත්ථකාමානං සොණ්ඩානං දෙථ වාරුණිං.
භොජනං භොජනත්ථීනං සම්මා දෙථ[2] පවෙච්ඡථ.

6251. මා ච කඤ්චි වණිබ්බකෙ භෙය්‍යිත්ථ ඉධාගතෙ,
තප්පෙථ අන්නපානෙන ගච්ඡන්තු පටිපූජිතා.*

6252. තෙසු මත්තා කිළන්තාව සම්පතන්ති වණිබ්බකා,
නික්ඛමන්තෙ මහාරාජෙ සිවීනං රට්ඨවඩ්ඪනෙ.

6253. අච්ඡෙච්ඡුං වත භො රුක්ඛං සබ්බකාමදදං දුමං,
යථා වෙස්සන්තරං රට්ඨා පබ්බාජෙන්ති අදූසකං.

6254. අච්ඡෙච්ඡුං වත භො රුක්ඛං නානාඵලධරං දුමං,
යථා වෙස්සන්තරං රට්ඨා පබ්බාජෙන්ති අදූසකං.

6255. අච්ඡෙච්ඡුං වත භො රුක්ඛං සබ්බකාමරසාහරං,
යථා වෙස්සන්තරං රට්ඨා පබ්බාජෙන්ති අදූසකං.

---

1. අහූ – මජසං. ස්‍යා.
2. සම්මදෙව – මජසං. ස්‍යා.
* අථෙත්ථ වත්තති සද්දෙ තුමුලො භෙරවො මහා
දනෙන තං නීහරන්ති පුන දනං අද තුවං
අයං ගාථා මරම්ම පොත්ථකෙ දිස්සති.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6244. මෙසේ වැලැපෙන මට අනදර කොට නිදෙස් (වෙසතුරු) රජපුතු රටින් වනයට නෙරපී යැ, මම මදිවී හෙළනෙමී සිතමි.

6245. ඇගේ වැලැපීම අසා රැස් වූ අන්තඃපුරයෙහි බොහෝ සිවි කනාවෝ හිසැ අත් බැඳැගෙන හැඬුහු.

6246. වෙස්සන්තර මාලිගාවෙහි අඹුදරුවෝ ද පවනින් මඩනා ලදු වැ ඇලලගිය සල්වනයක් මෙන් ඇදුවැටෙති.

6247. වෙස්සන්තර මාලිගාවෙහි අන්තඃපුර ස්ත්‍රීහු ද කුමාරයෝ ද වෛශ්‍යයෝ ද බ්‍රාහ්මණයෝ ද හිසැ අත් බැඳැගෙන හැඬුහ.

6248. වෙස්සන්තර මාලිගාවෙහි අසරුවෝ ද ඇතරුවෝ ද රියැදුරෝ ද පාබළ සෙනඟ ද හිසැ අත් බැඳගෙන හැඬුහ.

6249. ඉක්බිති රාත්‍රිය අවසන්හි හිරු උදවන වෙලෙහි වෙසතුරු රජ දන් දෙන පිණිස පැමිණියේ යැ.

6250. වස්ත්‍ර කැමැත්තනට වස්ත්‍ර ද රහසොඬුනට මත්පැන් ද බොජුන් කැමැතියනට බොජුන් ද මැනැවින් දෙවයි (සැටදහසක් ඇමැතියනට එහි) පැමිණෙව යි කී.

6251. මෙහි ආ කිසි යදියකු නො පෙළවු. ආහාරපානයෙන් පිණවවු. මා විසින් පුදනලදු වැ පෙරළා යෙත්වා!

6252. සිවිරට වර්ධනය කරන රජතුමන් නික්මෙන බැල්හි ඔවුනතර වූ යදියෝ මත් වූවන් මෙන් ක්ලාන්ත වූවන් මෙන් බිම ඇදුවැටෙති.

6253. භවත්නි, නිදෙස් වෙසතුරු රජ යම්සේ රටින් නෙරපියත් ද ඔහු එකත්තෙන් නොයෙක් පල දරන රුකක් සිදැලූහ.

6254. භවත්නි, නිදෙස් වෙසතුරු රජ යම්සේ රටින් නෙරපියත් ද ඔහු එකත්තෙන් හැම කැමැතිදෑ දෙන රුකක් සිදැලූහ.

6255. භවත්නි, නිදෙස් වෙසතුරු රජ යම්සේ රටින් නෙරපියත් ද ඔහු එකත්තෙන් සියලු කැමැති රස ඵලවන රුකක් සිදැලූහ.

6256. යෙ වුද්ධා යෙ ච දහරා යෙ ච මජ්ඣිමපොරිසා,
බාහා පග්ගය්හ පක්කන්දුං;
නික්ඛමනෙත්ත මහාරාජෙ සිවීනං රට්ඨවඩ්ඪනෙ.

6257. අතීයකඛා වස්සවරා ඉත්ථාගාරඤ්ච රාජිනො,
බාහා පග්ගය්හ පක්කන්දුං;
නික්ඛමනෙත්ත මහාරාජෙ සිවීනං රට්ඨවඩ්ඪනෙ.

6258. ථියොපි තත්ථ පක්කන්දුං යා තම්හි නගරෙ අහු,
නික්ඛමනෙත්ත මහාරාජෙ සිවීනං රට්ඨවඩ්ඪනෙ.

6259. යෙ බ්‍රාහ්මණා යෙ ච සමණා අෙසුණිවාපි වණිබ්බකා,
බාහා පග්ගය්හ පක්කන්දුං අධම්මො කිර මහා ඉති.

6260. යථා වෙස්සන්තරො රාජා යජමානො සකෙ පුරෙ,
සිවීනං වචනත්ථෙන සම්මා රට්ඨා නිරජ්ජති.

6261. සන්න හත්ථීසතෙ දත්වා සබ්බාලඞ්කාරභූසිතෙ,
සුවණ්ණකච්ඡෙ මාතඞ්ගෙ හෙමකප්පනවාසසෙ.

6262. ආරුළ්හො ගාමණීයෙහි තොමරඞ්කුසපාණිහි,
එස වෙස්සන්තරො රාජා සම්මා රට්ඨා නිරජ්ජති.

6263. සන්න අස්සසතෙ දත්වා සබ්බාලඞ්කාරභූසිතෙ,
ආජානීයෙ ච ජාතියා සින්ධවෙ සීඝවාහනෙ.

6264. ආරුළ්හො ගාමණීයෙහි ඉල්ලියාවාපධාරිහි,
එස වෙස්සන්තරො රාජා සම්මා රට්ඨා නිරජ්ජති.

6265. සන්න රථසතෙ දත්වා සන්නද්ධෙ උසභිතද්ධජෙ,
දීපෙ අට්ඨපි වෙය්‍යග්ඝෙ සබ්බාලඞ්කාරභූසිතෙ.

6266. ආරුළ්හො ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
එස වෙස්සන්තරො රාජා සම්මා රට්ඨා නිරජ්ජති.

6267. සන්න ඉත්ථීසතෙ දත්වා එකමෙකා රථෙ ඨිතා,
සන්නද්ධා නික්ඛරජ්ජුහි සුවණ්ණෙණ අලඞ්කතා.

6268. පිතාලඞ්කාරා පිතවසනා පිතාභරණභූසිතා,
ආළාරපඛුමා[1] හසුලා සුසඤ්ඤා තනුමජ්ඣිමා;
එස වෙස්සන්තරො රාජා සම්මා රට්ඨා නිරජ්ජති.

1. ආළාරපම්හා – මජ්ඣ.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6256. සිවිරට වඩන මහරජ නික්මෙන කලැ බාල වූ ද වෘද්ධ වූ ද මධ්‍යම වූ ද යම් පුරුෂ කෙනෙක් ඇද්ද (ඒ හැම දෙන) හිසැ අත් බැඳැගෙන හැඬුහ.

6257. සිවිරට වඩන මහරජ නික්මැ යන කලැ භූතවිද්‍යාධරයෝ ද බීජොද්ධරණ කළ අන්තඃපුර පාලකයෝ ද ඇතොවුරෝ ද රජවරු ද හිසැ අත් බැඳැගෙන හැඬුහ.

6258. සිවිරට වඩන මහරජ නික්මැයන කලැ එනුවර යම් ස්ත්‍රීහු වූහු නම් ඔහු ද එහි හැඬුහ.

6259. බමුණු යැ මහණ යැ තවද ගුණකියන යදියෝ යැ යන යම් කෙනෙක් ඇද්ද ඒ හැමදෙන හවත්නි, අධර්මයෙකැ යි හිසැ අත් බැඳැගෙන හැඬුහ.

6260. වෙසතුරු රජ යමසේ සිය නුවර දන් දෙනුයේ සිවිරට වැසියන්ගේ වදනින් සියරටින් නික්ම යා ද,

6261-62. සවිබරණින් සරසනලද රන්පොරොදු රන්කසුකම් කළ වස්ත්‍ර ඇති මහසිරුරැති, අඩයටි අකුසු ගත් අත් ඇති ඇතරුවන් නැඟි ඇතුන් සත්සියක් දන් දී සිවිරට වැසියන්ගේ වචනයෙන් මේ වෙසතුරු රජ සියරටින් නික්මැ යයි.

6263-64. දුනුගී ධරන අසරුවන් නැඟි සවිබරණින් සදනලද ඇවලෙවි ගමන් ඇති සින්ධුදේශයෙහි උපන් ආජානෙය (සඬාමියාගේ අදහස දන්නා) අසුන් සත්සියක් දන් දී මේ වෙසතුරු රජ සිය රටින් නික්මැ යයි.

6265-66. දුනුගී එලකායුධ ගත් අත් ඇති රියසරුවන් නැඟි දිවිසමින් හා ව්‍යාඝ්‍රසමින් වට කළ සියලු අලඬකාරයෙන් සරහන ලද නහනලද ධජ ඇති සන්නද්ධ රථ පන්සියක් දන් දී මේ වෙසතුරු රජ සියරටින් නික්ම යයි.

6267-68. රන්බරණින් සැදි, රන්පමුයෙන් (හවඩියෙන්) බඳනා ලද කසාවන් ලකර ඇති, කසාවන් වස්ත්‍ර ඇති, කසාවන් අබරණින් සරසනා ලද විසල් ඇස් ගඩ ඇති, මදසිනා පෙරදුරි කථා ඇති, මනා උකුළු ඇති, සිහිනිහ ඇති සත්සියක් ස්ත්‍රීන් දන් දී මේ වෙසතුරු රජ සියරටින් නික්මෙයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6269. සත්ත ධෙනුසතෙ දත්වා සබ්බා කංසූපධාරණා,[1]
එස වෙස්සන්තරො රාජා සම්භා රට්ඨා නිරජ්ජති.

6270. සත්තදසීසතෙ දත්වා සත්තදසසතානි ච
එස වෙස්සන්තරො රාජා සම්භා රට්ඨා නිරජ්ජති

6271. හත්ථී අස්සෙ රථෙ දත්වා නාරියො ච අලඞ්කතා,
එස වෙස්සන්තරො රාජා සම්භා රට්ඨා නිරජ්ජති.

6272. තදසි යං භිංසනකං තදසි ලොමහංසනං,
මහාදනෙ පදින්නම්හි මෙදිනී සමකම්පථ.

6273. තදසි යං භිංසනකං තදසි ලොමහංසනං,
යං පඤ්ජලිකතො රාජා සම්භා රට්ඨා නිරජ්ජති.

6274. අථෙත්ථ වත්තතී සඤ්ඤෙ තුමුලො භෙරවො මහා,
දනෙන තං නිගරන්ති පුන දනං අද තුවං.

6275. තෙසු මත්තා කිලන්තා ච සම්පතන්ති වණිබ්බකා,
නික්ඛමන්තෙ මහාරාජෙ සිවීනං රට්ඨවඩ්ඪනෙ.

6276. ආමන්තයිත්ථ රාජානං සඤ්ජයං ධම්මිනං වරං,
අවරුද්ධසි මං දෙව වඞ්කං[2] ගච්ඡාමි පබ්බතං.

6277. යෙ හි කෙචි මහාරාජ භූතා යෙ ච භවිස්සරෙ,
අතිත්තා යෙව කාමෙහි ගච්ඡන්ති යමසාධනං.

6278. සොහං සකෙ අභිසසිං යජමානො සකෙ පුරෙ,
සිවීනං වචනත්ථෙන සම්භා රට්ඨා නිරජ්ජහං.

6279. අසං තං පතිසෙවිස්සං වනෙ වාළමිගාකිණ්ණෙ,
ඛග්ගදීපිනිසෙවිතෙ අහං පුඤ්ඤානි කරොමි;
තුම්හෙ පඞ්කම්හි සීදථ.

6280. අනුජානාහි මං අම්ම පබ්බජ්ජා මම රුච්චති,
සොහං සකෙ අභිසසිං යජමානො සකෙ පුරෙ.
සිවීනං වචනත්ථෙන සම්භා රට්ඨා නිරජ්ජහං.

6281. අසං තං පතිසෙවිස්සං වනෙ වාළමිගාකිණ්ණෙ,
ඛග්ගදීපිනිසෙවිතෙ අහං පුඤ්ඤානි කරොමි;
තුම්හෙ පඞ්කම්හි සීදථ.

---

1. කුසුමධාරිනො – මජසං.
2. වඞ්ක ගච්ඡාමි පබ්බතං – මජසං. සයා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6269. එකෙකි දෙන රිදීමුවා කිරිදෝනා බඳුන් සහිත වැ දෙනුන් සත්සියක් දන් දී මෙ වෙසතුරු රජ සියරටින් නික්මෙයි.

6270. සත් සියයක් දසියන් ද සත් සියයක් දසයන් ද දන්දී මේ වෙසතුරු රජ සියරටින් නික්ම යයි.

6271. ඇතුන් ද අසුන් ද රිය ද සරසනලද ස්ත්‍රීන් ද දන් දී මෙ වෙසතුරු රජ සියරටින් නික්මෙයි.

6272. මහදන් දුන් කල්හි මහපොළොව කම්පා විය. එකලැ බිහිසුණු බවෙක් විය. එකල ලොමුදහගැන්මෙක් විය.

6273. යම් කලෙකැ ඇදිලි බැඳි රජ සියරටින් නික්මැ ගියේ ද එකලැ බිහිසුණු බවෙක් විය. එකලැ ලොමුදහගැන්මෙක් වී.

6274. ඉක්බිති ''දන්දීම හේතුවින් තොප රටින් නෙරති. ඒ තෙපි යළිදු දන් දුන්හු'' යයි මහත් බිහිසුණු සෝෂයෙක් පවතී.

6275. සිවීන්ගේ රට වඩන වෙසතුරු රජ (සියරටින්) නික්මෙන කලැ ඒ මහාජනකාය අතුරෙහි ගුණකියා යදනා යදියෝ මත් වූවන් මෙන් ක්ලාන්ත වූවන් මෙන් ඇදවැටෙති.

6276. දැහැමි රජුන් අතුරෙහි උතුම් වූ සඤ්ජය රජ ඇමැතිඃ දේවයිනි තෙපි මා රටින් නෙරපියව. මම වඞ්කගිරියට යෙමි' යි.

6277. මහරජතුමනි, යම් කෙනෙක් (අතීතයෙහි) වූහු ද (අනාගතයෙහි) වන්නාහු ද (වර්තමානයෙහි වෙත් ද) ඔහු හැම දෙන කාමයෙන් තෘප්ත නො වූවාහු මැ මරණයට යෙකි.

6278. ඒ මම සියනුවරැ දන් දෙන්නෙම් තමාගේ නුවර වැසියන් පෙළීමි. ඒ මම සිවිරටවැසියන් ගේ බසින් සියරටින නික්මෙන්නෙමි.

6279. කගවෙහෙණුන් දිවියන් විසින් සෙවුනාලද වල්මුවන් ගැවැසිගත් මහවෙනෙහි විඳියැයුතු ඒ දුක් විඳිනෙමි. මම පින් කෙරෙමි. තෙපි කාමපඞ්කයෙහි (මඩෙහි) ගැලෙව.

6280. මෑණියෙනි, මට (පැවිදි) අනුදනුව, මට පැවිද්ද රිසි වෙයි. ඒ මම සියනුවරැ දන් දෙන්නම් සියනුවරුන් පෙළීමි. ඒ මම සිවිරටවැසියන්ගේ වචන හේතුවින් සියරටින් නික්මෙන්නෙමි.

6281. කගවෙහෙණුන් දිවියන් විසින් සෙවුනාලද වල්මුවන් ගැවැසිගත් මහවෙනෙහි විඳියැයුතු ඒ දුක් විඳිනෙමි. මම පින් කෙරෙමි. තෙපි කාමපඞ්කයෙහි ගැලෙව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6282. අනුජානාමි තං පුත්තං පබ්බජ්ජා තෙ සමිජ්ඣතු,
අයඤ්ච මද්දී කල්‍යාණී සුසඤ්ඤා තනුමජ්ඣිමා;
අච්ඡතං සහ පුත්තෙහි කිං අරඤ්ඤෙ කරිස්සති.

6283. නාහං අකාමා දසිම්පි අරඤ්ඤං නෙතුමුස්සහෙ,
සචෙ ඉච්ඡති අනෙවතු සචෙ නිච්ඡති අච්ඡතු.

6284. තතො සුණ්හං මහාරාජා යාචිතුං පටිපජ්ජථ,
මා චන්දන සමාචාරෙ රජොජල්ලං අධාරයි.

6285. මා කාසියානි ධාරෙත්වා කුසවීරමධාරයි,
දුක්ඛො වාසො අරඤ්ඤස්මිං මා හි ත්වං ලක්ඛණෙ ගමි.

6286. තමබ්‍රවී රාජපුත්ති මද්දී සබ්බඞ්ගසොභනා,
නාහං තං සුබමිච්ඡෙය්‍යං යං මෙ වෙස්සන්තරං විනා.

6287. තමබ්‍රවි මහාරාජා සිවීනං රට්ඨවඩ්ඪනො,
ඉඞ්ඝ මද්දී නිසාමෙහි වනෙ යෙ හොන්ති දුස්සහා.

6288. බහූ කීටා පටංගා ච මකසා මධුමක්ඛිකා,
තෙපි තං තත්ථ හිංසෙය්‍යුං තං තෙ දුක්ඛතරං සියා.

6289. අපරෙ පස්ස සන්තාපෙ නදීනුපනිසෙවිතෙ,
සප්පා අජගරා නාම අවිසා තෙ මහබ්බලා.

6290. තෙ මනුස්සං මිගං වාපි අපි මාසන්තමාගතං,
පරික්ඛිපිත්වා භොගෙහි වසමානෙන්ති අත්තනො.

6291. අඤ්ඤෙපි කණ්හජටිනො අච්ඡා නාම අසම්මිගා,
න තෙහි පුරිසො දිට්ඨො රුක්ඛමාරුය්හ මුච්චති.

6292. සඞ්ඝට්ටයන්තා සිඞ්ගානි තික්ඛග්ගානි පහාරිනො.
මහිසා විවරන්තෙත්ථ නදිං සොතුම්බරං පති.

6293. දිස්වා මිගානං යූථානං ගවං සඤ්චරතං[1] වනෙ,
ධෙනූව වච්ඡගිද්ධාව කථං මද්දී කරිස්සසි.

6294. දිස්වා සම්පතිතෙ සොරෙ දුම්මග්ගෙසු පලවඞ්ගමෙ,
අඛෙත්තඤ්ඤාය තෙ මද්දී භවිතන්තෙ[2] මහබ්භයං.

---

1. සඤ්චරථ – මජ්ජසං.
2. භවිස්සතෙ – මජ්ජසං. භවිස්සන්තෙ – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6282. පුත, පැවිදි අනුදනිමි. නොපගේ පැවිදි සමෘද්ධ වේවා, වැළින් මනා උකුළු ඇති සිහිනිහ ඇති යහපත් වූ මේ මද්‍රී දේවී දරුවන් හා සමග මෙහි මැ සිටීවා, වෙනෙහි කුමක් කරන්නී ද?

6283. නො කැමැත්තෙත් දසියක ද වහයට ගෙනයන්නට මම උත්සාහ නො කෙරෙමි. ඉදින් ඕ කැමැති වූ නම් මා අනුව ඒවා, ඉදින් නො කැමැති වූ නම් සිටීවා.

6284. ඉක්බිති (පිය) මහරජ (පුතුගේ කථා අසා) ලෙහෙලිය යදනට පිළිපන්නෙ යැ: රත්සඳුන් අලෙවි දුන් සිරුරෙහි රජස්දූලි නො දරව.

6285. කසීසළු ධරා කුසවැහැරි නො ධරව. වෙනෙහි වාසය දුකෙකි. සුන්දරලක්ෂණ ඇත්තිය, තෙපි නො යව.

6286. සියලු අහපසඟින් හොබනා මද්‍රී රාජදුහිතා තොමෝ (මයිලණු) රජහට මෙසේ කිවු: ''වෙසතුරු රජුගෙන් වෙන් වැ මට යම් සුවයෙක් ලැබේ නම් මම ඒ සුව නො කැමැත්තමු.

6287. සිවීන්ගේ රට වඩනා මහරජ ඇයට මෙසේ කී: එම්බා මද්‍රී දේවීනි, වනයෙහි නො ඉවසියැහැකි යම්බඳු දුඃඛයෝ වෙත් ද ඒ දුක් අසව.

6288. එහි කුඩා ප්‍රාණීහු යැ පළඟැටියෝ යැ මදුරුවෝ යැ මීමැස්සෝ යැ යන මොහු බොහෝ වෙති. ඔහු ද එහි දී නොපට හිංසා කරන්නාහු යැ. එය තොපට අතිශයින් දුක් වන්නෙ යැ.

6289. ගං ඉවුරු ඇසුරු කළා වූ දුටුවන් තවන අනෙක් සත්ව කෙනකුන් බලව. විෂ නැති පිඹුරු නමැති සර්ප කෙනෙක් ඇති. ඔහු මහත් බල ඇත්තාහ.

6290. ඔහු තමා සමීපයට ආ මිනිසකු හෝ මුවකු හෝ දරණුවැළින් වෙළා තමා වසයට ගනිති.

6291. හිසෙහි කළු වූ අවුල්ලොම් සළා ඇති වලස් නම් අන්‍ය වූ ද දුක් එළවන සිවුපා කෙනෙක් ඇත. ඔවුන් විසින් දක්නාලද පුරුෂයා ගසට නැඟ නො මිදෙයි.

6292. මෙහි ''සෝතුම්බර'' ගංතෙර තියුණු අග ඇති අං ගටමින් පහර දෙන කුළුමීවෝ හැසිරෙති.

6293. වනයෙහි හැසිරෙන මුවරැළ ගවරැළ දැකැ වස්සා කෙරෙහි ලොල් වූ දෙනක මෙන් (දරුවන් නො දක්නා) මද්‍රී කුමක් කරන්නී ද?

6294. මද්‍රීදේවීනි, රුක්මතැ පනන විරූප වූ වඳුරන් දැකැ වනමහ නො දන්නා තොපට මහත් භය වන්නෙ යැ.

6295. යා ත්වං සිවාය සුත්වාන මුහුං උත්තසසෙ පුරෙ,
සා ත්වං වඩ්ඨං අනුප්පත්තා කථං මඤ්ඤි කරිස්සසි.

6296. ඨිතෙ මජ්ඣන්තිකෙ කාලෙ සන්නිසිනෙනසු[1] පක්ඛිසු,
සනතෙව බ්‍රහාරණ්ඤං තත්ථ කිං ගන්තුමිච්ඡසි.

6297. තමබ්‍රවී රාජපුත්ති මඤ්ඤි සබ්බඩ්ගසොභනා,
යානි එතානි අක්ඛාසි වනෙ පටිභයානි මෙ;
සබ්බානි අභිසම්භොස්සං ගච්ඡණ්ඤෙව රථෙසභ.

6298. කාසං කුසං පොටකිලං උසීරං මුඤ්ජබබ්බජං.
උරසා පනුදහෙස්සාමි නාස්ස හෙස්සාමි දුන්නයා.

6299. බහූහි වත චරියාහි කුමාරී වින්දතෙ පතිං,
උදරස්සූපරොධෙන ගොහනුබ්බෙඨනෙන ච.

6300. අග්ගිස්ස පරිචරියාය උදකුම්මුජ්ජනෙන ච,
වෙධබ්බං[2] කටුකං ලොකෙ ගච්ඡණ්ඤෙව රථෙසභ.

6301. අපිස්සා හොති අප්පත්තො උච්ඡිට්ඨමපි භුඤ්ජිතුං,
යො නං හත්ථෙ ගහෙත්වාන අකාමං පරිකඩ්ඪති;
වෙධබ්බං කටුකං ලොකෙ ගච්ඡණ්ඤෙව රථෙසභ.

6302. කෙසග්ගහණමුක්ඛෙපා භුම්‍යා ච පරිසුම්භනා,
දත්වා ච නො පක්කමති බහුං දුක්ඛං අනප්පකං;
වෙධබ්බං කටුකං ලොකෙ ගච්ඡණ්ඤෙව රථෙසභ.

6303. සුක්කච්ඡවී වෙධවෙරා දත්වා සුභගමානිනො,
අකාමං පරිකඩ්ඪන්ති උලූකණ්ඤෙව වායසා;
වෙධබ්බං කටුකං ලොකෙ ගච්ඡණ්ඤෙව රථෙසභ.

6304. අපි ඤාතිකුලෙ ඨිතෙ කංසපජ්ජොතනෙ වසං,
නෙවාතිවාක්‍යං[3] න ලභෙ භාතූහි සබ්කාහි[4] ච;
වෙධබ්බං කටුකං ලොකෙ ගච්ඡණ්ඤෙව රථෙසභ.

6305. නග්ගා නදී අනුදකා නග්ගා රට්ඨං අරාජිකං,
ඉත්ථීපි විධවා නග්ගා යස්සාපි දස භාතරො;
වෙධබ්බං කටුකං ලොකෙ ගච්ඡණ්ඤෙව රථෙසභ.

---

1. සන්නිසිවෙසු – මජසං.
2. වෙධබ්‍යං – මජසං.
3. වාතිවාක්‍යං න ලභෙථ – මජසං.
4. සබ්නීහි ච – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6295. යම් බඳු තෙපි පෙර සිවල්දෙනගේ හඬ අසා පුනපුනා නැති ගතුව, ඒ තෙපි වඬහගිරියට පැමිණියහු කුමක් කරන්නවු ද?

6296. මධ්‍යාහ්න වේලෙහි පක්ෂීන් නිහඬ වැ සිටි කල්හි මහවනය නාද කරන්නාක් වැන්න. එහි කුමට යනු කැමැත්තවු ද?

6297. සර්වාඞ්ග ශෝභන වූ මද්‍රී රාජපුත්‍රී ඒ රජහට මෙසේ කිවු: වනයෙහි යම් ප්‍රතිභය කෙනකුන් මට කීයෙහි ද, ඒ හැම ඉවසන්නමු. උතුමාණෙනි, යන්නමු මැ යි.

6298. කාශතෘණ යැ කුශතෘණ යැ පොටකිල තෘණ යැ සැවැන්න යැ මෘදු තෘණ යැ බඹුස් තෘණ යැ යන මේ (ඉදිරියෙහි සිට) උරයෙන් දෙපසට කොට බැහැර කරන්නමු. මොහු (වෙසකුරු රජු) විසින් දුකසේ ගෙනයන්නක් නො වන්නමු.

6299-6300. කුමාරී තොමෝ බොහෝ වූ ව්‍රතචර්‍යායෙන් සැමියකු ලබාගනී: (රෑ සපුව වඩනු පිණිස) උපවාසයෙන් ද ගවහනුයෙන් උකුළුතලය තැළීමෙන් ද (උදරය) වෙළීමෙන් ද ගිනිපිදීමෙන් ද දියෙහි කිමිදීමෙන් ද යන මෙයිනි. ලොවැ වැන්දඹු බව අමිහිරි යැ, (එහෙයින් හිමියා සමග) යන්නමු මැ යි.

6301. යම් නීචජාතිකයෙක් ඒ වැන්දඹුව නො කැමැත්තෙන් අත ගෙන අදනේ වේ ද, හේ (පළමු) ඇයගේ ඉඳුල් බුදිනට පවා නො ලබනුයේ වෙයි.

6302. (පරපුරුෂයා අසැමික ස්ත්‍රිය) එසවීමෙන් බිම්බැ හෙළා පයින් කෙස් මැඩ අවමන් කරයි. අනල්ප වූ බොහෝ දුක් දී ද ඉවත් වැ නො යයි. මහරජුනි, ලොවැ වැන්දඹු බව කටුක යැ එහෙයින් එකත්නෙන් යන්නමු.

6303. (නහන සුණුයෙන් නැහු) සුදුසිවි ඇති (එයින්) සුන්දර-යම්හ'යි කළ මාහා ඇති විධවාර්ථිකයෝ (වැන්දඹුව පතන්නෝ) අල්පමාත්‍ර ධනයක් දී කවුඩුවෝ මහමුහුණකු අදනා මෙන් නො කැමැත්තෙන් ඇදගනිති. මහරජුනි, ලොවැ විධවා භාවය කටුක යැ එහෙයින් යන්නමු මැ යැ.

6304. රන්කැලුම්න් බබළන ආඪ්‍ය වූ නැකුලෙහි වසන්නි නමුදු සොහොයුරන් යෙහෙළියන් කෙරෙන් නින්දබස් නො ලබන්නි නො වෙමි. මහරජුනි, ලොවැ විධවාත්වය කටුක යැ, එහෙයින් යන්නමු මැ යැ.

6305. දිය නැති ගඟ නග්න යැ; රජ නැති රට නග්න යැ; යම් ස්ත්‍රියකට දසබෑ කෙනෙක් ඇත්තාහු නමුදු වැන්දඹු ස්ත්‍රී ද නග්න යැ. මහරජුනි, ලොවැ පතිශූන්‍යභාවය කටුක යැ, එහෙයින් යන්නමු මැ යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6306. ධජො රථස්ස පඤ්ඤාණං ධූමො පඤ්ඤාණමග්ගිනො,
රාජා රට්ඨස්ස පඤ්ඤාණං භත්තා පඤ්ඤාණමිත්ථියා;
වෙධබ්බං කටුකං ලොකෙ ගච්ඡඤ්ඤව රථෙසභ.

6307. යා දළිද්දී දළිද්දස්ස අඩ්ඪා අඩ්ඪස්ස කිත්තිමා,[1]
තං වෙ දෙවා පසංසන්ති දුක්කරං හි කරොති සා.

6308. සාමිකං අනුබන්ධිස්සං සදා කාසායවාසිනී,
පථව්‍යාපි අභෙජ්ජන්ත්‍යා[2] නිච්ඡෙ වෙස්සන්තරං විනා;
වෙධබ්බං කටුකං ලොකෙ[3] ගච්ඡඤ්ඤව රථෙසභ.

6309. අපි සාගරපරියන්තං බහුවිත්තධරං මහිං,
නානාරතනපරිපූරං නිච්ඡෙ වෙස්සන්තරං විනා.

6310. කථන්නු තාසං හදයං සුබරා වත ඉත්ථියො,
යා සාමිකෙ දුක්කිතම්හි සුබම්චජන්ති අත්තනො.

6311. නික්කමන්තෙ මහාරාජෙ සිවීනං රට්ඨවඩ්ඪනෙ,
තමහං අනුබන්ධිස්සං සබ්බකාමදදෙ හි මෙ.

6312. තමබ්‍රවී මහාරාජා මද්දීං සබ්බඞ්ගසොභනං,
ඉමෙ තෙ දහරා පුත්තා ජාලී කණ්හාජිනා චුභො;
නික්කිප්ප ලක්කිණෙ ගච්ඡ මයං තෙ පොසියාමසෙ.

6313. තමබ්‍රවී රාජපුත්තී මද්දී සබ්බඞ්ගසොභනා,
පියා මෙ පුත්තකා දෙව ජාලී කණ්හාජිනා චුභො;
ත්‍යම්හං තත්ථ රමෙස්සන්ති අරඤ්ඤෙ ජීවසොකිනං.

6314. තමබ්‍රවී මහාරාජා සිවීනං රට්ඨවඩ්ඪනො,
සාලීනං ඔදනං භුත්වා සුචිං මංසූපසෙවනං;
රුක්කඵලානි භුඤ්ජන්තා කථං කාහන්ති දරකා.

6315. භුත්වා සතඵලෙ කංසෙ සොවණ්ණෙ සතරාජිකෙ,
රුක්කපත්තෙසු භුඤ්ජන්තා කථං කාහන්ති දරකා.

6316. කාසියානි ච ධාරෙත්වා බොමකොදුම්බරානි ච,[4]
කුසචීරානි ධාරෙන්තා කථං කාහන්ති දරකා.

---

1. කිත්තිමං – මජසං.
2. අභිජ්ජන්තා – මජසං.
3. වෙධබ්‍යා කටුකිත්ථියා – මජසං. ස්‍යා.
4. කොටුම්බරානී ච – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6306. ධවජය රථයට සලකුණ යැ, ධූමය ගින්නට සලකුණ යැ, රජ රටට සලකුණ යැ, සැමියා ස්ත්‍රියට සලකුණ යි. මහරජුනි, වෙධව්‍යය ලොවැ කටුක යැ, එහෙයින් යන්නමු මැ යැ.

6307. යම් කීර්තිමත් ස්ත්‍රියක් දිළිඳු හිමිහට දිළිඳු වැ පොහොසත් හිමිහට පොහොසත් වැ කල් ගෙවා ද දෙවියෝ එකත්නෙන් ඇය පසසති. යම් හෙයෙකින් ඕ දුෂ්කරයක් කෙරේ ද එහෙයිනි.

6308. හැම කල්හි කසාවත් ධරමින් හිමියා පසුපස්හි යන්නමු. නො බෙදූ පොළොවෙහි ඉසුරු බව ද වෙසතුරු රජ හැර නො රිසියමු. මහරජුනි ලෝකයෙහි වෙධව්‍යය කටුක යැ. එහෙයින් යන්නමු මැ යැ,

6309. බොහෝ සම්පත් ධරන නොයෙක් රුවනින් පිරිපුන් මහසයුරු හිමි කොට ඇති මහපොළොව පවා වෙසතුරු රජ හැර නො කැමැත්තමු.

6310. යම් ස්ත්‍රී කෙනෙක් හිමියා දුක්පත් කල්හි තමාට සුව කැමැති වෙත් නම් ඔවුන්ගේ හදවත කෙබඳු යැ, එවන් ස්ත්‍රීහු අතිශයින් ක්‍රූර වෙත් මැ යි.

6311. සිවීන්ගේ රට වඩන මහරජ නික්ම යන කල්හි මම ඔහු පසුපස්හි යන්නමු. හේ මට සියලු කැමැති සැපත් දෙනුයෙ මැ යි.

6312. සඳමහරජ සර්වාඞ්ගශෝභන වූ ඒ මද්‍රීදෙවියට මෙසේ කි: තොපගේ මේ ජාලි යැ කෘෂ්ණජිනා යැ යන දරු දෙදෙන ළදරු යැ. ඔවුන් මෙහි බහාතබා යව. අපි ඔවුන් පුස්නමිහ.

6313. සර්වාඞ්ගශොභන වූ මද්‍රී රාජපුත්‍රී එ රජහට මෙසේ කිවූ: දේවයිනි, මේ ජාලිය යැ කෘෂ්ණජිනා යැ යන දෙදරු සිඟිත්තෝ මට ප්‍රියයෝ යි. ඔහු ඒ අරනෙහි දී ජීවශොකී (පහ නො වන ශෝක ඇති) අප සිත් අලවන්නාහ.

6314. සිවිරට වඩන සඳමහරජු ඇයට මෙසේ කී: රසමස-වුලෙන් යුතු පිරිසුදු ඇල්සහලේ බත් වළඳා පුරුදු දරුවෝ වන පලවැළ වළඳනු කෙසේ කරන්නාහු ද?

6315. සියක් පලමින් කළ සියක් හිරි ඇදි රන්තලියෙහි වළඳා පුරුදු දරුවෝ රුක්පත්හි වළඳනු කෙසේ කරන්නාහු ද?

6316. කසිසළු කොමුපිළි කෝදුම්බරපිළි ධරා පුරුදු දරුවෝ කුසවැහැරි ධරනු කෙසේ කරන්නාහු ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6317. වස්සාහි පරියායිත්වා සිවිකාය රථෙන ච,
පත්තිකා පරිධාවන්නා කථං කාහන්ති දරකා.

6318. කූටාගාරෙ සයිත්වාන නිවාතෙ ඵුස්සිතග්ගලෙ,
සයන්නා රුක්ඛමූලස්මිං කථං කාහන්ති දරකා.

6319. පල්ලඞ්ඛෙසු සයිත්වාන ගොනකෙ චිත්තසත්ථතෙ,
සයන්නා තිණසත්ථාරෙ කථං කාහන්ති දරකා.

6320. ගන්ධකෙන විලිම්පිත්වා අගරූ[1]චන්දනෙන ච,
රජොජල්ලානි ධාරෙන්නා කථං කාහන්ති දරකා.

6321. චමරිමොරහත්ථෙහි විජිතඞ්ගා සුබෙධිතා,
දට්ඨා[2] ඩංසෙහි මකසෙහි කථං කාහන්ති දරකා.

6322. තමබ්‍රවී රාජපුත්ති මද්දී සබ්බඞ්ගසොභනා,
මා දෙව පරිදෙවෙසි මා ච ත්වං විමනො අහූ;
යථා මයං භවිස්සාම තථා හෙස්සන්ති දරකා.

6323. ඉදං වත්වාන පක්කාමි මද්දී සබ්බඞ්ගසොභනා,
සිවිමග්ගෙන අන්වෙසි පුත්තෙ ආදය ලක්ඛණා.

6324. තතො වෙස්සන්තරො රාජා දනං දත්වාන ඛත්තියො,
පිතු මාතු ච වන්දිත්වා කත්වා ච නං පදක්ඛිණං.

6325. චතුවාහිං රථං යුත්තං සීස[3]මාරුය්හ සන්දනං,
ආදය පුත්තදරණ්ච වඞ්ගං පායාසි පබ්බතං.

6326. තතො වෙස්සන්තරො රාජා යෙනාසි බහුකො ජනො,
ආමන්ත බො තං ගච්ඡාම අරොගා හොන්තු ඤාතයො.

6327. ඉංස මද්දී නිසාමෙහි රම්මරූපංව[4] දිස්සති,
ආවාසො සිවිසෙට්ඨස්ස පෙත්තිකං භවනං මම.

6328. තං බ්‍රාහ්මණා අන්වගමුං තෙ තං අස්සෙ අයාචිසුං,
යාචිතො පටිපාදෙසි චතුන්නං චතුරො හයෙ.

6329. ඉඞ්ඝ මද්දී නිසාමෙහි චිත්තරූපංව දිස්සති,
මිගා රොහිච්චවණ්ණෙන දක්ඛිණස්සා වහන්ති මං.

---

1. අග්ගලු – මජසං. ස්‍යා.
2. ඵුට්ඨා – මජසං. ස්‍යා.
3. සිඞ්ඝ – මජසං.
4. රම්මං පුරංච – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6317. හිදෙළුයෙන් ද සිවිකායෙන් ද රියෙන් ද සිසාරා ඇවිදූ පුරුදු දරුවෝ පාගමනින් ඔබමොබ දුවනු කෙසේ කරන්නාහු ද?

6318. කුළුගෙහි පියුදෙරගුළු ඇති නිවෙස්නෙහි නිදූ පුරුදු දරුවෝ රුක්මුල්හි නිදනු කෙසේ කරන්නාහු ද?

6319. යහන්හි දික් ලොම් ඇති කළුකොඳුපලස්හි විසිතුරු ඇතිරියෙහි නිදූ පුරුදු දරුවෝ තණ ඇතිරියෙහි නිදනු කෙසේ කරන්නාහු ද?

6320. අගිල් සඳුන් සුවඳ සුණුයෙන් විලෙවුන් කොට පුරුදු දරුවෝ රජස්දූලි ධරනු කෙසේ කරන්නාහු ද?

6321. සුවසේ වැඩුණු සෙමෙරවලින් මොනරපිලින් පවන් සලනලද අඟපසඟ ඇති දරුවෝ මැසිමදුරුවන් විසින් ඩසිනලද්දහු කුමක් කරන්නහු ද? (කෙසේ ඉවසන්නහු ද?)

6322. සර්වාඞ්ගශෝභන වූ මද්‍රී රජදූ ඒ සඳමහ රජහට මෙසේ කිවූ: මහරජ නහමක් හඬව. තෙපි නහමක් දෙමිනස්ව, අපි යම්සේ වමෝ ද දරුවෝ ද එසේ වෙති.

6323. සකලාඞ්ගයෙන් හොඹනා මද්‍රී දෙවී මෙතෙපුල් කියා පිටත් වැ ගියා. (යන්නී දූ) සුන්දරලක්ෂණ ඇති මද්‍රී දෙදරුවන් ගෙන සිව්රජහු යායුතු මඟින් ම ගියා (පහයින් බැස රියට නැංගා)

6324. ඉක්බිති කැත්කුල උපන් වෙසතුරු රජ (පෙර දින) දන් දී මවුපියන් වැඳැ පැදකුණු කොට,

6325. අසුන් සතර දෙනකුන් ඇති යොදනලද රියට යුහු වැ නැඟී අඹුදරුවන් ගෙන වඞ්කගිරිය බලා පිටත් වැ ගියේ යැ.

6326. ඉක්බිති වෙසතුරු මහරජ යම් තැනෙක බොහෝ ජනයා රැස් වී ද (එහි රිය මෙහෙයා) නොප දන්වා යම්හ. අපගේ නැයෝ නිරොග වෙත්වයි කී.

6327. කොල, මද්‍රිදේවිය, බලව. සිව්රජහුගේ නිවාසය රමණීය වැ පෙනෙයි. ඒ මා පියපරපුරින් ආ භවන වෙයි.

6328. බමුණෝ සතර දෙනෙක් ඔහු ලුහුබැඳැ ගියෝ ඔහු අසුන් ඉල්වූහ. අයදනාලද වෙසතුරු රජ සතර දෙනාට අසුන් සතර දෙනා සපයා දිනා.

6329. එම්බා මද්‍රිය බලව. විසිතුරු රූපයක් මෙන් පෙනෙයි, (දෙවිපුත්හු) නිත්මුවවෙසින් අවුත් පුහුණු අසුන් මෙන් මා උසුලති.

6330. අථෙත්ථ පඤ්චමො ආග[1] සො තං රථමයාචථ,
තස්ස තං යාචිතොදසි නවස්සුපහතො මනො.

6331. තතො වෙස්සන්තරො රාජා ඔරොපෙත්වා[2] සකං ජනං,
අස්සාසයී අස්සරථං බ්‍රාහ්මණස්ස ධනෙසිනො.

6332. ත්වං මඤ්ඤි කණ්හාජිනං ගණ්හ[3] ලහුකා එසා කණිට්ඨිකා,
අහං ජාලිං ගණ්හිස්සාමි ගරුකො භාතිකො හි සො.

6333. රාජා කුමාරං ආදය රාජපුත්තී ච දරිකං,
සම්මොදමානං පක්කාමුං[4] අඤ්ඤමඤ්ඤපියංවද.

දනකණ්ඩං නිට්ඨිතං.

6334. යදි කෙචි මනුජා එන්ති අනුමග්ගෙ පටිපථෙ,
මග්ගං තෙ පටිපුච්ඡාම කුහිං වඞ්ඝතපබ්බතො.

6335. තෙ තත්ථ අම්හෙ පස්සිත්වා කරුණං පරිදෙවයුං,
දුක්ඛං තෙ පටිවෙදෙන්ති දූරෙ වඞ්ඝතපබ්බතො.

6336. යදි පස්සන්ති පවනෙ දරකා ඵලිතෙ[5] දුමෙ,
තෙසං ඵලානං හෙතුහි උපරොදන්ති දරකා.

6337. රොදන්තෙ දරකෙ දිස්වා උබ්බිග්ගා[6] විපුලා දුමා,
සයමෙවොනමිත්වාන උපගච්ඡන්ති දරකෙ.

6338. ඉදං අච්ඡෙරකං දිස්වා අබ්භුතං ලොමහංසනං,
සාධුකාරං පවත්තෙසි මඤ්ඤි සබ්බඞ්ගසොභනා.

6339. අච්ඡෙරං වත ලොකස්මිං අබ්භුතං ලොමහංසනං,
වෙස්සන්තරස්ස තෙජෙන සයමෙවොනතා දුමා.

6340. සඩ්ඛිපිංසු පථං යක්ඛා අනුකම්පාය දරකෙ,
නික්ඛන්තදිවසෙනෙව චෙතරට්ඨං උපාගමුං.

6341. තෙ ගන්ත්වා දීඝමද්ධානං චෙතරට්ඨමුපාගමුං,
ඉද්ධං ඵීතං ජනපදං බහුමංසසුරොදනං.

---

1. ආගා – මජසං. ස්‍යා.
2. ඔතාරෙත්වා – මජසං.
3. කණ්හං – මජසං. ස්‍යා.
4. පක්කමුං – මජසං.
5. ඵලිතෙ – මජසං.
6. උබ්බිද්ධා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6330. නැවැත මෙ මහැ පස්වැනි බමුණෙක් ආයෙ යැ. හෙ ඔහුගෙන් රථය ඉල්වී. අයදනා ලද්දෙ ඔහට එය දින. ඔබගේ සිත නො පසුබට වී.

6331. ඉක්බිති වෙසතුරු මහරජ අඹුදරුවන් බස්වා ධනය සොයන බමුණාට රථය දී අස්වැසී.

6332. මද්‍රීදෙවීනි, තෙපි කෘෂ්ණාජිනා ගනුව. මේ ළඳරිය නො බර යැ, මම ජාලිය කුමරු ගනිමී. ඒ මහදරු බර ඇතියෙ යි.

6333. රජ තෙම කුමරු ද රජදු දරිය ද ගෙන ඔවුනොවුන් ප්‍රිය තෙපුල් බණනුවෝ සතුටු වෙමින් ගියහ.

දනකාණ්ඩය නිමී.

6334. අනුමහ ද පෙරමහ ද ඉදින් කිසි මිනිස් කෙනෙක් එන්නාහු නම් වඞ්කගිරිය කොහි ද යි ඔවුන් අතින් මහ පිළිවිසුමහ.

6335. ඒ මිනිස්සු එ මහ අප දකැ ශෝකරාවයෙන් හැඬුහ. ඔහු වඞ්කගිරිය දුර යි දුක් දන්වති.

6336. ඉදින් දරුවෝ මහවෙනෙහි පලඟත් රුක් දකිත් ද දරුවෝ දෙදෙන ඒ පල පිණිස වලපිති.

6337. වලප්නා දරුවන් දකැ කම්පිත වූ මීයුරු පලයෙන් විපුල වූ රුක්හු තුමූ මැ නැමී දරුවනට සමීප වෙති.

6338-6339. සර්වාඞ්ගශෝභන වූ මද්‍රීදේවී නොවූවිරු ලොමුදහ ගන්වන මේ අසිරිය දකැ වෙසතුරු රජුගේ තෙදින් රුක්හු තුමූ මැ නතු වූහ. මේ වූ කලි ලොව්හි අපූර්ව වූ ලොමුදහ ගන්වන අසිරියෙක් මැ යි කියා සාධුකාර පැවැත්වූ.

6340. දෙවියෝ දරුවන් කෙරෙහි කරුණාවෙන් මහ හැකුළුහ. (ඔවුන්) නික්මුණු දවස්හි මැ සැරටට පැමිණියහ.

6341. ඔහු දික්මහ ගොස් (ධාන්‍යාදීන්) සමෘද්ධ වූ (වස්ත්‍රාභරණාදීන්) විපුල වූ බොහෝ වූ මස් රහ දිය ඇති දනවියෙන් යුතු චෙතරටට පැමිණියහ.

6342. වෙතියා පරිකරිංසු දිස්වා ලක්ඛණමාගතං,
සුබුමාලී වතයං අය්‍යා පත්තිකා පරිධාවති.

6343. වය්‍ගාහි පරියායිත්වා සිව්කාය ච ඛත්තියා,[1]
සාජ්ජ මද්දී අරණ්ඤසමිං පත්තිකා පරිධාවති.

6344. තං දිස්වා චෙතපාමොක්ඛා රොදමානා උපාගමුං,
කච්චිනනු දෙව කුසලං කච්චි දෙව අනාමයං;
කච්චි පිතා අරොගා තෙ සිව්නණ්ඩ අනාමයං.

6345. කො තෙ බලං මහාරාජ කොනු තෙ රථමණ්ඩලං,
අනස්සකො අරථකො දීඝමද්ධානමාගතො;
කච්චි නාමිත්තෙහි[2] පකතො අනුප්පත්තොසිමං දිසං.

6346. කුසලං චෙව මෙ සම්මා අථො සම්මා අනාමයං,
අථො පිතා අරොගො මෙ සිව්නණ්ඩ අනාමයං.

6347. අහං හි කුණ්ජරං දප්පං ඊසාදන්තං උරුළ්හවං,
ඛෙත්තණ්ඤුං සබ්බයුද්ධානං සබ්බසෙතං ගජුත්තමං.

6348. පණ්ඩුකම්බලසඤ්ඡන්නං පහින්නං සත්තුමද්දනං,
දන්තිං සවාළවීජනිං සෙතං කෙලාසසාදිසං.

6349. සසෙතච්ඡත්තං සඋපථෙය්‍යං[3] සාථබ්බනං සහත්ථිපං,
අග්ගයානං රාජවාහිං බ්‍රාහ්මණානං අදාසහං.[4]

6350. තස්මිං මෙ සිවයො කුද්ධා පිතා ච උපහතො මනො,
අවරුද්ධති[5] මං රාජා වඩ්කං ගච්ඡාමි පබ්බතං;
ඔකාසං සම්මා[6] ජානාථ වනෙ යත්ථ වසාමසෙ.

6351. සවාගතන්තෙ මහාරාජ අථො තෙ අදුරාගතං,
ඉස්සරොසි අනුප්පත්තො යං ඉධත්ථි පවෙදය,

6352. සාකං භිසං මධුං මංසං සුද්ධං සාලීනමොදනං,
පරිභුණ්ජ මහාරාජ පාහුනො නොසි ආගතො.

---

1. රථෙනච – මජ්ඣං. ස්‍යා.
2. කච්චා මිත්තෙහි – මජ්ඣං. ස්‍යා. වි.
3. සඋපධෙය්‍යං – මජ්ඣං.
4. අද ගජං – මජ්ඣං.
5. අවරුඬධි – මජ්ඣං. වි.
6. සම්ම – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6342. සැරට ස්ත්‍රීහු ස්ත්‍රීලක්ෂණයෙන් පරිපූර්ණ මද්‍රීදේවිය ආවා දැකැ පිරිවරාගත්හ. මේ බිසෝ ඉතා සියුමැලි යැ. එතෙකුදු වුව පාගමනින් යෙයි.

6343. මේ බිසෝ පෙර දවස් හිදෙළුවෙන් ද රන්සිවිගෙන් ද ඇවිදු ඕ මද්‍රී අද අරනෙහි පාගමනින් මැ යෙයි.

6344. සැරජහු ඒ වෙසතුරු රජහු දැකැ වලප්මින් එළැඹියහ. දේවයිනි, කිම රොග නැද්ද? දුක් නැද්ද? කිම තොපගේ පිය මහරජ නීරොග වූයෙ ද? සිවිරටවැසියනට දුක් නැද්ද?

6345. මහරජුනි, තොපගේ සෙනඟ කොා ද? තොපගේ රිය මඩුවු කොා ද? කිම සතුරන් විසින් නෙරනාලද ද? අසුන් නැතියෙ මැ රිය නැතියෙ මැ මෙ රටට පැමිණියෙහි ද? යි.

6346. සබඳිනි, මට රෝග නැත, තවද සබඳිනි මට දුක් නැත, මාගේ පියමහරජ නීරොග වෙයි. සිවිරට වැසියනට ද දුක් නැත.

6347. යම්හෙයෙකින් මම රියහිස් බඳු දළ ඇති, බර උසුලනු වූ සියලු යුද්ධයන්ට කෙත් හඳුනනු වූ සවිසුදු වූ හැම ඇතුනට උතුම් වූ ඇතු දන් දිනිම් ද,

6348. රත්පලසින් වසනලද මදවැහෙන සතුරන් මඩනා යහපත් දළ ඇති වල්විදුනා සහිත වූ කෙලාස පර්වතය මෙන් සුදු වූ,

6349. සේසත් සහිත වූ බුමුතුරුණු උඩුවියන් ජවනිකා සහිත වූ ඇත්වෙදුන් සහිත වූ ඇත්ගොවුවන් සහිත වූ රජහු උසුලනු වූ අග්‍රයාන වූ අපගේ හස්තියානය (කලිඟුරටවැසි) බමුණන්ට මම දිනිම් ද,

6350. එකරුණෙහි ලා සිවිරටවැසියෝ මට කිපියහ. මා පියරජ ද ප්‍රතිස සිත් ඇත්තෙ මා නෙරපියයි. (එහෙයින්) වඞ්කගිරියට යෙමි. සබඳිනි, (ඇපි) වෙනෙහි යම් තැනෙකැ වසමෝ නම් එහි අපට නිසි පෙදෙසක් දුන කියව.

6351. මහරජුනි, තොප ආයේ මැනැවැ. තවද තොපගේ ඊම නිදෙසි, මෙයට පැමිණියහු අපට ඉසුරු වව. තොප රිසියෙන යමක් මෙහි ඇත් නම් කියව, (ප්‍රතිපාදන කොට දෙමිහ.)

6352. මහරජුනි, පැමිණි තෙපි අපට ආගන්තුක වව. පලා ද නෙළුඔල ද මී ද මස් ද පිරිසුදු හැල්බත් ද වළඳව.

6353. පටිග්ගහිතං යං දින්නං සබ්බස්ස අග්ගියං කතං,
අවරුද්ධති මං රාජා වඩ්ඪාං ගච්ඡාමි පබ්බතං;
ඔකාසං සම්මා ජානාථ වනෙ යත්ථ වසාමසෙ.

6354. ඉධෙව තාව අච්ඡස්සු වෙතරට්ඨෙ රථෙසභ,
යාව වෙතා ගමිස්සන්ති රඤ්ඤෙ සන්තික යාචිතුං
නිජ්ඣාපෙතුං මහාරාජං සිවීනං රට්ඨවඩ්ඪනං.

6355. තං තං වෙතා පුරක්ඛත්වා[1] පතීතා ලද්ධපච්චයා,
පරිවාරෙත්වාන[2] ගච්ඡන්ති එවං ජානාහි ඛත්තිය.

6356. මා වො රුච්චිත්ථ ගමනං රඤ්ඤෙ සන්තික යාචිතුං
නිජ්ඣාපෙතුං මහාරාජං රාජා තත්ථ න ඉස්සරො.

6357. අච්චුග්ගතාහි සිවයො බලත්ථා නෙගමා ච යෙ,
තෙ පධංසෙතුම්ච්ඡන්ති රාජානං මම කාරණා.

6358. සවෙ එසා පවත්තෙත්ථ රට්ඨස්මිං රට්ඨවඩ්ඪන,
ඉධෙව රජ්ජං කාරෙහි වෙතෙහි පරිවාරිතො.

6359. ඉද්ධං ඵීතඤ්චිදං රට්ඨං ඉද්ධො ජනපදෙ මහා,
මතිං කරොහි ත්වං දෙව රජ්ජස්සමනුසාසිතුං.

6360. න මෙ ජන්දෙ මති අත්ථි රජ්ජස්සමනුසාසිතුං,
පබ්බාජිතස්ස රට්ඨස්මා වෙතපුත්තා සුණාථ මෙ.

6361. අතුට්ඨා සිවයො අස්සු[3] බලත්ථා[4] නෙගමා ච යෙ,
පබ්බාජිතස්ස රට්ඨස්මා වෙතා රජ්ජෙහිසෙවයුං.

6362. අසම්මොදියම්පි වො අස්ස අච්චන්තං මම කාරණා,
සිවීනං භණ්ඩනඤ්චාපි විග්ගහො මෙ න රුච්චති.

6363. අථස්ස භණ්ඩනං සොරං සම්පහාරො අනප්පකො,
එකස්ස කාරණා මස්හං හිංසෙය්‍යුං බහුකෙ ජනෙ.[5]

---

1. පුරක්ඛිත්වා – මජසං.
2. පරිවාරිත්වාන – මජසං.
3. ආසුං – මජසං.
4. බලග්ගා – මජසං ස්‍යා.
5. බහුකො ජනො – මජසං වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6353. හැමදෙනා විසින් පඬුරු කරනලද යමක් ඇද්ද තෙල හැම තොප විසින් දෙනලද මැ මා විසිනුදු පිළිගන්නාලද මැ වේවා. පියමහරජ මා නෙරපියයි. එහෙයින් වඩාගිරියට යෙමි. සබඳිනි, (ඇපි) වෙනෙහි යම් තැනෙකැ වසමෝ ද එහි අපට නිසි පෙදෙසක් දනිවු.

6354. සැරජහු සිව්රට වඩන සඳමහරජහට තොප නිදෙස් බව දන්වන්නට ඔබ අයදනට සඳමහරජ සමීපයට යෙත් ද මහ රජුනි, උන් එන තෙක් මේ සැරට වාස කරව.

6355. සැරජහු ලද පිහිට ඇතියාහු එකරුණින් තුටු වැ තොප පෙරට කොට පිරිවරා (ජයතුරා නුවරට මැ) යෙති. ක්ෂත්‍රියයෙනි, මෙසේ දනුව.

6356. මහරජහට මා නිදෙස් බව දන්වන්නට ඔබ අයදනට රජ අබියසට යැම තෙපි නහමක් රැස්වවු. එකරුණෙහි ලා රජ ද ඉසුරු නො වෙයි.

6357. සිව්හු ද බලකාය ද නියම්ගම්වැසි කෙළෙඹියෝ ද යන ඔහු ඉතා කිපියාහු මැ යි. මා හේතුවින් රජ නෙරනට ද රිසි වෙති.

6358. රට වඩන මහරජුනි, ඉදින් එරට එපවත් වී නම් සැ රටවැසියන් විසින් පිරිවරනලදු වැ මෙහි මැ රජය කරව.

6359. දේවයිනි, මෙරට ද හැම සැපතින් පිරුණෙ යැ; සමෘද්ධ යැ විශාල යැ. මේ රජයට අනුශාසනා කරන්නට තෙපි අදහස් කරව.

6360. රටින් නෙරනාලද මට රාජ්‍යානුශාසනෑ රිස්සෙක් හෝ බුද්ධියක් හෝ නැති. චේතරටවැසියෙනි, මාගේ බස් අසව.

6361. රටින් නෙරනාලද වෙසතුරුහට වෙත රටවැසියෝ රාජ්‍යයෙහි අභිෂෙක දුන්හ යි සිව්හු ද බලකාය ද නියම්ගම් වැසියෝ ද යන යම් කෙනෙක් ඇද්ද. ඔහු (හැමදෙන) නො සතුටු වන්නාහ.

6362. මා නිසා තොපගේ නො සමගි බව ද නිරතුරු කොට වන්නේ යැ. (එකල්හි) සිව්න්ගේ කලහ ද විග්‍රහ ද මට නො රිසියෙයි.

6363. තවද කර්කශ කලහ ද (ඔවුනොවුන්ගේ) පහර දීමුදු නො මද වන්නෙ යැ. එසේ කලැ එකලා මා නිසා බොහෝ දෙනා නැසෙන්නේ යැ.

6364. පටිග්ගහීතං යං දින්නං සබ්බස්ස අග්ගියං කතං,
අවරුද්ධති මං රාජා වඩ්ඪාං ගච්ඡාමි පබ්බතං;
ඔකාසං සම්මා ජානාථ වනෙ යත්ථ වසාමසෙ.

6365. තග්ග තෙ මයමක්ඛාම යථාපි කුසලා තථා,
රාජිසී යත්ථ සම්මන්ති ආහුතග්ගී සමාහිතා.

6366. එස සෙලො මහාරාජ පබ්බතො ගන්ධමාදනො,
යත්ථ ත්වං සහ පුත්තෙහි සහ හරියාය වච්ඡසි.[1]

6367. තං වෙතා අනුසාසිංසු අස්සුනෙත්තා රුදම්මුඛා,
ඉතො ගච්ඡ මහාරාජ උජුං[2] යෙනුත්තරාමුඛො.

6368. අථ දක්ඛිසි භද්දන්තෙ විපුලං[3] නාම පබ්බතං,
නානාදුමගණාකිණ්ණං සීතච්ඡායං මනොරමං.[4]

6369. තමතික්කම්ම භද්දන්තෙ අථ දක්ඛිසි ආපකං,[5]
නදිං කෙතුමතිං නාම ගම්භීරං ගිරිගබ්භරං.

6370. පුථුලොමමච්ඡාකිණ්ණං සුපතිත්ථං මහොදිකං,[6]
තත්ථ නහාත්වා පිවිත්වා ච අස්සාසෙත්වා ච පුත්තකෙ.

6371. අථ දක්ඛිසි භද්දන්තෙ නිග්‍රොධං මධුවිප්ඵලං,[7]
රම්මකෙ සිබරෙ ජාතං සීතච්ඡායං මනොරමං.

6372. අථ දක්ඛිසි භද්දන්තෙ නාලිකං නාම පබ්බතං,
නානාදිජගණාකිණ්ණං සෙලං කිම්පුරිසායුතං.

6373. තස්ස උත්තරපුබ්බෙන මුචලින්දෙ නාම සො සරො,
පුණ්ඩරීකෙහි සඤ්ඡන්නො සෙතසොගන්ධියෙහි ච.

6374. සො වනං මෙසසඞ්ඝාසං ධුවං හරිතසද්දලං,
සීහොවාමීසපෙක්ඛීව වනසණ්ඩං විගාහය;
පුප්ඵරුක්ඛෙහි සඤ්ඡන්නං ඵලරුක්ඛෙහි චූහහං.

---

1. ගච්ඡසි – මජ්ඣං.
2. උජ්ජුං – අට්ඨකථා.
3. වෙපුල්ලං – මජ්ඣං. ස්‍යා.
4. රම්මං – මජ්ඣං.
5. ආපගං – මජ්ඣං. ස්‍යා.
6. මහොදකං – මජ්ඣං. ස්‍යා.
7. මධුවිම්පලං – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6364. තොප විසින් පඬුරු කරනලද යමක් ඇද්ද, එහැම දෙනලද මැ මා විසිනුදු පිළිගන්නාලද මැ වේවා. පියමහරජ මා රටින් නෙරපියයි, (එහෙයින්) වඞ්කගිරියට යෙමි. සබඳිනි, වෙනෙහි යම් තැනෙකැ වසමෝ නම් එයට නිසි අවකාශයක් දනුව.

6365. පුදනලද ගිනි ඇති එකහසින් ඇති රාජර්ෂිහු යම් තැනෙකැ සන්හිදෙත් ද (වෙසෙත් ද) එයට යන මග දැක්ක වනවරකයෝ යමසේ කියද්ද එසෙයින් එකාන්තයෙන් තොපට ඇපි කියමිහ.

6366. මහරජුනි, තෙපි දරුවන් සමග භාර්‍යාව සමග යම් තැනෙකැ වාස කරන්නවු නම් එයට නිසි තෙල පර්වතය ගන්ධමාදන නම් වෙයි.

6367. කඳුළු පිරුණු නෙත් ඇති වලප්නා මුහුණු ඇති සැරටවැසි රජහු (වෙසතුරුහට) අනුශාසනා කළහ; 'මහරජුනි, මෙ මණින් සෘජු වැ උතුරුදිග බලා යව' යි.

6368. තොපට යහපතක් මැ වේවා. ඉක්බිති නොයෙක් කරුගණයෙන් ගැවැසිගත් මනහර සිහිල් සෙවණ ඇති 'විපුල' නම් පර්වතය දක්නහු,

6369–70. ඒ ගල ඉක්ම වැළිදු පොතුලොම මසුන් ගැවැසිගත් මනා තොට ඇති බොහෝ දිය ඇති ගැඹුරු වූ ගල්කුසින් බට කෙතුමතී නම් මහ හොයක් දක්නහු එහි නහා පැන් බී තමා දරුවන් අස්වසා,

6371. තොපට යහපතක් වේවා. ඉක්බිති රමණීය වූ කඳු මුදුන්හි හටගත් මනරම් වූ සිහිල් සෙවණ ඇති මධුරඵල ඇති නුගරුකක් දක්නහු,

6372. ඉක්බිති නොයෙක් ලිහිණිගණයා විසින් ගැවැසිගත් කිඳුරන් ගහන වූ 'නාලික' නම් ශෛලපර්වතය දක්නහු,

6373. ඒ නාලික පර්වතයට ඊශාන තන්හි හෙළපියුම්න් ද හෙල්මැලි කල්හාරයෙන් ද ගැවැසිගත් විලෙක් ඇත. හෙ මුවලින්ද නම් වෙයි.

6374. ඒ තෙපි නිල්වලාකුළක් බඳු වූ නිරතුරු පලාවන් තණබිම් ඇති මල්රුකින් ද පලරුකින් ද යන දෙකින් ගැවැසිගත් වනලැහැබට ගොදුරු කැමැති සිංහයක්හු මෙන් පිවිසෙව.

6375. තත්ථ බින්දුස්සරා වග්ගු නානාවණ්ණා බහූ දීජා,
කූජන්තමුපකූජන්ති[1] උතු සම්පුප්ජීතෙ දුමෙ.

6376. ගන්ත්වා ගිරිවිදුග්ගානං නදීනං පභවානි ච,
සො දක්ඛසි පොක්ඛරණිං කරඤ්ජකකුධායුතං.[2]

6377. පුථුලොමමච්ඡාකිණ්ණං සුපතිත්ථං මහොදිකං,
සමඤ්ච චතුරස්සඤ්ච සාධුං අප්පටිගන්ධියං.

6378. තස්සා උත්තරපුබ්බෙන පණ්ණසාලං අමාපය,[3]
පණ්ණසාලං අමාපෙත්වා උඤ්ඡාචරියාය ඊහථ.

වනප්පවෙසනඛණ්ඩං නිට්ඨිතං.

6379. අහූ වාසී කලිඞ්ගෙසු ජූජකො නාම බ්‍රාහ්මණො,
තසසාසි දහරා භරියා නාමෙනාමිත්තතාපනා.

6380. තා නං තත්ථ ගතාවොචුං නදීඋදකහාරිකා,[4]
ථියො නං පරිහාසිංසු සමාගන්ත්වා කුතූහලා.

6381. අමිත්තා නූන තෙ මාතා අමිත්තො නූන තෙ පිතා
යෙ තං ජිණ්ණස්ස පාදංසු එවං දහරියං සතිං.

6382. අහිතං[5] වත තෙ ඤාතී මන්තයිංසු රහොගතා,
යෙ තං ජිණ්ණස්ස පාදංසු එවං දහරියං සතිං.

6383. දුක්කරං[6] වත තෙ ඤාතී මන්තයිංසු රහොගතා,
යෙ තං ජිණ්ණස්ස පාදංසු එවං දහරියුං සතිං.

6384. පාපකං වත තෙ ඤාතී මන්තයිංසු රහොගතා,
යෙ තං ජිණ්ණස්ස පාදංසු එවං දහරියං සතිං.

6385. අමනාපං වත තෙ ඤාතී මන්තයිංසු රහොගතා,
යෙ තං ජිණ්ණස්ස පාදංසු එවං දහරියං සතිං.

---

1. කූජන්ත මුපකූජජන්ති – අට්ඨකථා.
2. බරඤ්ජ – මජ්ජසං.
3. මමාපය – මජ්ජසං.
4. භාරියා – මජ්ජසං. වි.
5. අහිතං – මජ්ජසං. ස්‍යා. වි.
6. දුක්කටං – මජ්ජසං. වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6375. එහි නොවිසිර පිඬු වැ පවත්නා හඬ ඇති මියුරු රව ඇති නන් පැහැ නන් කුල ඇති බොහෝ සියොත්හු සෘතුසමයෙහි පිපිරුක්හි හිඳ කුල්නවුන් අනුව කුල්නි,

6376-6377. ඒ තෙපි එහි ගොස් යිරිකඳුරු ද නදීනට ප්‍රභවස්ථාන වූ ඌල්විටු (උල්දිය පෙදෙස්) ද කරඳ කුඹුකින් යුත් පොකුලොම් මසුන් ගැවැසිගත් මනා තොට ඇති පිළිකුල් ගඳ නැති මිහිරි වූ බොහෝ දිය පිරුණු සම වැ සිවුරස් වූ පොකුණක් දක්නහු.

6378. ඒ පොකුණට ඉසාන තන්හි පන්සලක් මවන්නහු. පන්සලක් මවාගෙන වනමුල් වනපලයෙන් යැපෙමින් නො පමා වැ වාස කරව.

වනප්‍රවෙශ කාණ්ඩය නිමි.

6379. කලිඟුරට (දුන්නිවිටඨ නම් ගම්) වැසි 'ජූජක' නම් බමුණෙක් වී. ඔහට නමින් 'අමිත්තතාපනා' නම් තරුණ අඹුවක් වුව.

6380. එගමහි ස්ත්‍රීහු දිය ගෙනෙනුව හොයට ගියාහු ඒ අමිත්තතාපනාට මෙසේ කීහු: ඒ ස්ත්‍රීහු කුහුල් ඇතියන් මෙන් පිරිවරාගෙන ඇයට පිරිහෙළා තෙපලූහ.

6381. මෙවන් තුරුණු බව ඇති කල්හි යම් කෙනෙක් තී මේ ජරපත් මහල්ලාට දුන්හු ද තීගේ ඒ මව සැතිරියකැ යි හඟුම්හ. තීගේ ඒ පියා සතුරෙකැ යි හඟුම්හ.

6382. මෙවන් ළදරු බව ඇති කල්හි යම් කෙනෙක් තී මේ දිරාගිය මහල්ලාට දුන්හු ද තීගේ ඒ නැයෝ රහසිගත වූ තිට අහිතයක් මන්ත්‍රණ කළාහු වන.

6383. මෙවන් සොඳුරු ළදරු බව ඇති කල්හි යම් කෙනෙක් තී මේ ජරාජීර්ණ මහල්ලාට දුන්හු ද තීගේ ඒ නැයෝ රහසැ හිඳ තිට දුෂ්කරයක් මන්ත්‍රණ කළාහු වන.

6384. මෙවන් ළදරු විය ඇති කල්හි යම් කෙනෙක් තී මේ ජරපත් මහල්ලාට දුන්හු ද තීගේ ඒ නැයෝ රහසිගත වැ තිට පරිභවයක් මන්ත්‍රණ කළාහු වන.

6385. මෙවන් තුරුණුබව ඇති කල්හි යම් කෙනෙක් තී මේ දිරාගිය මහල්ලාට දුන්හු ද තීගේ ඒ නැයෝ එකලා වැ හිඳ තිට අමනාපයක් බැණගත්හු වන.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6386. අමනාපවාසං වසසි ජිණ්ණෙන පතිනා සහ,
යා ත්වං වසසි ජිණ්ණස්ස මතන්තෙ ජීවිතා වරං.

6387. න හි නූන තුය්හං කල්‍යාණි පිතා මාතා ච සොභනෙ,
අඤ්ඤං භත්තාරං වින්දිංසු යෙ තං ජිණ්ණස්ස පාදංසු;
එවං දහරියං සතිං.

6388. දුය්යිට්ඨං තෙ නවමියං අකතං අග්ගිහුත්තකං,
යෙ තං ජිණ්ණස්ස පාදංසු එවං දහරියං සතිං.

6389. සමණෙ බ්‍රාහ්මණෙ නූන බ්‍රහ්මචරියපරායණෙ,
සා ත්වං ලොකෙ අභිසපි සීලවන්තෙ බහුස්සුතෙ;
යා ත්වං වසසි ජිණ්ණස්ස එවං දහරියං සතිං.

6390. න දුක්ඛං අභිනා දට්ඨං න දුක්ඛං සත්තියා හතං,
තඤ්ච දුක්ඛඤ්ච තිප්පඤ්ච[1] යං පස්සෙ ජිණ්ණකං පතිං.

6391. නත්ථි ඛිඩ්ඩා නත්ථි රතී ජිණ්ණෙන පතිනා සහ,
නත්ථි අල්ලාපසල්ලාපො ජගසිතම්පි[2] න සොභති.

6392. යදා ච දහරො දහරා මන්තයන්ති රහොගතා,
සබ්බෙසං සොකා නස්සන්ති[3] යෙ කෙචි හදයනිස්සිතා.

6393. දහරා ත්වං රූපවතී පුරිසානං අභිපත්ථිතා,
ගච්ඡ ඤාති කුලෙ අච්ඡ කිං ජිණ්ණො රමයිස්සති.

6394. න තෙ බ්‍රාහ්මණ ගච්ඡාමි නදිං උදකහාරියා,
ථියො මං පරිභාසන්ති තයා ජිණ්ණෙන බ්‍රාහ්මණ.

6395. මා මෙ ත්වං අකරා කම්මං මා මෙ උදකමාහරි,
අහං උදකමාහිස්සං මා හොති කුපිතා අහු.

6396. නාහං තම්හි කුලෙ ජාතා යං ත්වං උදකමාහරෙ,
එවං බ්‍රාහ්මණ ජානාහි න තෙ වච්ඡාමහං සරෙ.

6397. සචෙ මෙ දසං දසිං වා නානයිස්සසි බ්‍රාහ්මණ,
එවං බ්‍රාහ්මණ ජානාහි න තෙ වච්ඡාමි සන්තිකෙ.

---

1. තිබ්බඤ්ච – මජ්ජ.
2. ජගසිතුම්පි.
3. සබ්බෙ සොකා වීනස්සන්ති – ස්‍යා. සබ්බා සොකා – මජ්ජ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6386. මෙවන් ළදරු බව ඇති කල්හි නොමනා විසීමක් වසහි, යම් බඳු තෝ මිහල්ලාගේ ගෙහි වාස කෙරෙහි ද ඒ තීගේ ජීවිතයට වඩා මරණය උතුමැ.

6387. කලණ වූ සොඳුරිය, මෙවන් තරුණ බව ඇති කල්හි තී යම් කෙනෙක් මහල්ලාට දුන්හු ද ඒ තීගේ මවු ද පියා ද තිට අනෙක් සැමියකු නො ලත්හ යි හඟුම්හ.

6388. මෙවන් දහර බව ඇති කල්හි තී යම් කෙනෙක් මහල්ලාට දුන්හු ද ඒ තී විසින් නවමී යාගය නපුරු කොට පුදනලද වන. (තී දුන් යාගපිණ්ඩය පළමු කොට මහලු කවුඩකු විසින් ගන්නාලද වන) තී විසින් ගිනිපූජා නො කරනලද වන.

6389. මෙවන් තාරුණ්‍ය ඇති කල්හි යම් බඳු තෝ මහල්ලාගේ ගෙහි වාස කෙරෙහි ද ඒ තෝ ලොව්හි බඹසරෙහි නියැලි සිල්වත් බොහෝ ඇයු පිරූ තැන් ඇති මහණබමුණන්ට ආක්‍රොශ කෙළෙහි වන.

6390. නයකු විසින් ඛහනලද්දේ දුක් නො වෙයි, සැතින් පහරන ලද්දේ දුක් නො වෙයි, යම් ස්ත්‍රියක් මහලු සැමියකු දකී ද හෙ මැ දුක් ද කියුණු දුක් ද වෙයි.

6391. මහලු සැමියා සමග ක්‍රීඩාවක් නැත (නො හොඳි) කාවරති නැත, අල්ලාපසල්ලාප නැත, (කඩදත් විවර කොට සෙන්නහුගේ) සිනා ද නො හොඳි.

6392. යම් කලෙක තරුණයා ද තරුණී ද දෙදෙන රහසි වැ හිඳ රහස් කියද්ද එසඳ තුලුන්ගේ ළය ඇසුරු කළ යම් කිසි ශෝක කෙනෙක් ඇද්ද ඒ හැම ශෝකයෝ නසිති.

6393. තෝ ළදරියෙහි, රූ ඇතියහු, පිරිමින් විසින් වෙසෙසින් පතනලදුවහු, නැඟියා, නැයන්ගේ ගෙහි වස, මහල්ලා (තී පස්කම් ගුණෙන්) කෙසේ රමණය කරන්නේ ද යි කීහු.

6394. බමුණ, තොප මහලු හෙයින් (මෙ ගමැ) ගැහැනු මට පිරිහෙළා කියති. එහෙයින් බමුණ, තොපට දිය ගෙනෙනුව හොයට නො යමි.

6395. තෙපි මට මෙහෙ නො කරව, නහමක් මට දිය ගෙනෙව, මම දිය ගෙනෙමි. භවතී නහමක් කිපෙව.

6396. යම් හෙයෙක්කින් තෙපි දිය ගෙනෙන්නවු නම් මම වනාහි එවන් (සැමියන්ගෙන් මෙහෙ ගන්නා) කුලෙහි නූපන්මි. බමුණ, මම තොපගේ ගෙහි නො වසන්නමි. මෙසේ දනුව.

6397. බමුණ, ඉදින් මට දසකු හෝ දස්සක හෝ නො ගෙනෙන්නවු නම් තොප කෙරෙහි නො වසන්නමි. බමුණ මෙසේ දනුව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6398. නත්ථි මෙ සිප්පට්ඨානං වා ධනං ධඤ්ඤඤ්ච බ්‍රාහ්මණි,
කුතොහං දසං දසිං වා ආනයිස්සාමි හොතියා;
අහං හොනිං උපට්ඨිස්සං මා හොති කුපිතා අහු.

6399. එහි තෙ අහමක්කිස්සං යථා මෙ වචනං සුතං,[1]
එස වෙස්සන්තරෝ රාජා වඞ්ගෙ වසති පබ්බතෙ.

6400. තං ත්වං ගන්ත්වාන යාවස්සු දසං දසිං ච බ්‍රාහ්මණ,
සො තෙ දස්සති යාචිතා දසං දසිඤ්ච කඤ්ඤියො.

6401. ජිණ්ණඤහමස්මි අබලො දීඝො වද්ධා සුදුග්ගමො,
මා හොති පරිදෙවෙසි[2] මා ච ත්වං විමනා අහු;
අහං හොතිං උපට්ඨිස්සං මා හොති කුපිතා අහූ.

6402. යථා අගන්ත්වා සඞ්ගාමං අයුද්ධොව පරාජිතො,
එවමෙව තුවං බ්‍රහ්ම අගන්ත්වාව පරාජිතො.

6403. සචෙ මෙ දසං දසිං වා නානයිස්සසි බ්‍රාහ්මණ,
එවං බ්‍රාහ්මණ ජානාහි න තෙ වච්ඡාමහං සරෙ,
අමනාපං තෙ කරිස්සාමි තං තෙ දුක්ඛං භවිස්සති.

6404. නක්ඛත්තෙ උතුපබ්බෙසු[3] යද මං දක්ඛසි ලඞ්ඝිතං,
අඤ්ඤෙහි සද්ධිං රමමානං තං තෙ දුක්ඛං භවිස්සති.

6405. අදස්සනෙන මය්හං තෙ ජිණ්ණස්ස පරිදෙවතො,
භීයො වඩ්ඪා ච පලිතා බහූ හෙස්සන්ති බ්‍රාහ්මණ.

6406. තතො සො බ්‍රාහ්මණො භීතො බ්‍රාහ්මණියා වසානුගො,
අට්ටිතො කාමරාගෙන බ්‍රාහ්මණිං එතදබ්‍රවී.

6407. පාථෙය්‍යං මෙ කරොහී ත්වං සඞ්කුල්‍යා සගුළානි ච,[4]
මධුපිණ්ඩිකා ච සුකතාශයා සත්තුභත්තඤ්ච බ්‍රාහ්මණි.

6408. ආනයිස්සං මෙථුනකෙ උභෙ දසකුමාරකෙ,
තෙ තං පරිවරිස්සන්ති රත්තින්දිවමතන්දිතා.

6409. ඉදං වත්වා බ්‍රහ්මබන්ධු පටිමුඤ්චි උපාහනා,
තතො සො මන්නායිත්වාන හරියං කත්වා පදක්ඛිණං.

---

1. සුණං – මජ්ඣං.
2. පරිදෙවෙසි – මජ්ඣං.
3. උතුසුබෙබසු – මජ්ඣං.
4. සංගුලා සකලානිව – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6398. බැමිණිය, මා සතු ශිල්පයෙක් හෝ ධනයෙක් ධාන්‍යයෙක් හෝ නැත. මම කිසෙයින් භවතියට දසකු හෝ දූස්සක හෝ ගෙනෙම් ද? මම භවතියට මෙහෙ කරන්නෙමි. භවතී නහමක් කිපෙව.

6399. එව, යම්සේ මා විසින් තෙපුලෙක් අසනලද ද එසෙයින් මම් තොපට කියමි, තෙල වෙසතුරු මහරජ වඞ්ගිරියෙහි වාස කෙරෙයි.

6400. බමුණ, තෙපි (එහි) ගොස් ඔබ අතින් දසකුදු දූස්සක ද යදුව. තොප විසින් යදනාලද එ රජ තොපට දසකුදු දූස්සක ද දෙන්නෙ යැ.

6401. මම මහල්ලෙමි, බල නැත්තෙමි, මහ ද දික් වෙයි, අතිශය දුර්ගම යැ. භවති නො හඬව, තෙපි නහමක් දෙමිනස්ව, මම භවතියට මෙහෙ කරනෙමි, භවතී නො කිපෙව.

6402. බමුණ යම්සේ සටනට නො ගොස් යුද නැතියෙ මැ පැරැදියෙහි ද, එසෙයින් මැ තෙපි නො ගොස් මැ පැරැදියෙහි.

6403. බමුණ ඉදින් මට දසයකු හෝ දසියක හෝ නො ගෙනෙන්නවු නම් මම තොපගේ ගෙහි නො වසමි. බමුණ, මෙසේ දනුව, තොපට නො රුස්නක් කරනෙමි, ඒ තොපට දුක් වන්නෙ යැ.

6404. යම් කලෙකැ (ෂට්ඍතුයෙහි) ඍතුසන්ධීන්හි පවත්නා සැණකෙළියෙහි සර්වාභරණයෙන් සැදුණු මා අත් පිරිමින් හා සමග රමණය කරන්නිය දක්නහු ද ඒ තොපට දුක් වන්නෙ යැ.

6405. මා නො දැක්මෙන් හඬන්නා වූ මහලු තොපගේ වක ද බොහෝ වන්නේ යැ. නර ද බොහෝ වන්නෙ යැ.

6406. ඉක්බිති ඒ බමුණු බියපත් වැ බැමිණියගේ වසයට ගියෙ කාමරාගයෙන් පෙළනලද්දෙ බැමිණියට තෙල කරුණ කී:

6407. බැමිණිය, තෙපි සංකුල වූ ද සකුරු වූ ද මොනවට කළ අත්වට ද අත්සුණු ද බත්පළාවක් (බත්මුලක්) ද මට මහ උපකරණ කොට දෙව.

6408. සමානකුල ඇති කුමරුවන් දෙදෙනකුන් තොපට දස් පිණිස ගෙනෙන්නෙමි. ඔහු දවරය නො මැළි වැ තොපට මෙහෙ කරන්නාහ.

6409. බමුණු මෙසේ කියා වහන් ලි ය. ඉක්බිති හේ රහස් ඔවා දී අඹුව පැදකුණු කොට,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6410. පක්කාමි සො රුණ්ණමුඛො බ්‍රාහ්මණො සහිතබ්බතො,
සිව්නං නගරං ජීතං දසපරියෙසනං වරං.

6411. සො තත්‍ර ගන්ත්වා අවව යෙ තත්‍රාසුං සමාගතා,
කුහිං වෙස්සන්තරො රාජා කත්‍ර පස්සෙමු ඛත්තියං.

6412. සො ජනො තං අවවාසි[1] යෙ තත්‍රාසුං සමාගතා,
තුම්හෙහි බ්‍රහ්මෙ පකතො අතිදනෙන ඛත්තියො;
පබ්බාජිතො සකා රට්ඨා වඩ්ඪෙන වසති පබ්බතෙ.

6413. තුම්හෙහි බ්‍රහ්මෙ පකතො අතිදනෙන ඛත්තියො,
ආදය පුත්තදරඤ්ච වඩ්ඪෙන වසති පබ්බතෙ.

6414. සො චොදිතො බ්‍රාහ්මණියා බ්‍රාහ්මණො කාමගිද්ධිමා,
අසං තං පතිසෙවිත්ථ;
වනෙ වාළමිගාකිණ්ණෙ ඛග්ගදීපිනිසෙවිතෙ.

6415. ආදය බෙලුවං දණ්ඩං අණ්ඩහුත්තං කමණ්ඩලුං,
සො පාවිසි බ්‍රහාරඤ්ඤං යත්‍ර අස්සොසි කාමදං.

6416. තං පවිට්ඨං බ්‍රහාරඤ්ඤං කොකා නං පරිවාරයුං,
වික්කන්දි සො විප්පනට්ඨො දූරෙ පන්ථා අපක්කමි.

6417. තතො සො බ්‍රාහ්මණො ගන්ත්වා භොගලුඤ්ඤෙ අසඤ්ඤතො,
වඩ්ඪාස්සොහරණෙ නට්ඨො,
*[සුනඛෙහි පරිවාරිතො රුක්ඛස්මිඤ්ච නිසින්නොව];
ඉමා ගාථා අභාසථ.

6418. කො රාජපුත්තං නිසභං ජයන්තමපරාජිතං,
භයෙ ඛෙමස්ස දතාරං කො මෙ වෙස්සන්තරං විදූ.

6419. යො යාවතං පතිට්ඨාසි භූතානං ධරණීරිව,
ධරණූපමං මහාරාජං කො මෙ වෙස්සන්තරං විදූ.

6420. යො යාවතං ගතී ආසි සවන්තීනංව සාගරො,
උදධූපමං[2] මහාරාජං කො මෙ වෙස්සන්තරං විදූ.

6421. කල්‍යාණතිත්ථං සුචිමං සීතුදකං මනොරමං,
පුණ්ඩරීකෙහි සංඡන්නං යුත්තං කිඤ්ජක්ඛරෙණුනා;
රහදූපමං[3] මහාරාජං කො මෙ වෙස්සන්තරං විදූ.

---

1. තෙ ජනා තං අවවිංසු – මජසං.
2. තඩූපමං – මජසං.
3. සරූපමං – මජසං.
* ඉමං පාදදවයං සබ්බත්‍ර පොත්ථකෙසු න දිස්සති.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6410. එ බමුණු සමාදන් වූ වුත ඇතියේ වලප්නා මුහුණු ඇතියේ දැසිදසුන් සොයා ඇවිදිනෙ සිවින්ගේ සම්පත්තීන් විපුල වූ ජයතුරා නුවරට පිටත් වැ ගියේ.

6411. හේ එහි ගොස් එහි යම් කෙනෙක් රැස් වැ සිටියාහු ද ඔවුන්ට මෙසේ කී: වෙසතුරු මහරජ කොහි ද? එ රජ කොහි දී දක්මෝ ද ඕ.

6412. එහි යම් කෙනෙක් රැස් වැ සිටියාහු ද එ ජනයා ඔහට මෙසේ කී: බමුණ, තොප විසින් අධික දනයෙන් පෙළන ලද රජ සිය රටින් නෙරනලද්දේ වඞ්ඝගිරියෙහි වාස කෙරෙයි.

6413. බමුණ, තොප විසින් අතිදනයෙන් පෙළනලද රජ තෙම අඹුදරුවන් ද ගෙන ගොස් වඞ්ඝගිරියෙහි වාස කෙරෙයි.

6414. කාමයෙහි ගිජු වූ එ බමුණු බැමිණිය විසින් වොදනා කරනලද්දේ වල්මුවන් විසින් ගැවැසිගත් කඟවෙහෙණුන් හා දිවියන් විසින් සෙවුනා ලද වනයෙහි වින්දයුතු යම් දුකෙක් ඇද්ද එ දුක් අනුභව කෙළේ.

6415. එ බමුණු බෙලුව සැරයටිය ද ගිනි පුදන කෙණෙස්ස ද කමඬලාව ද ගෙන යම් අරනෙකැ කැමැති සැපත් දෙන වෙසතුරු රජ වෙසෙකී ඇයි ද ඒ මහ අරනට පිවිසියෙ යැ.

6416. ඒ මහවල් වන් බමුණු (වන දෙර රක්නහුගේ) බල්ලෝ පිරිවරාගත්හ. හෙ මහ හඬින් හැඬී. මං මුළා වූයේ මඟින් දුරු වැ ගියේ.

6417. ඉක්බිති භෝගයෙහි ගිජු වූ සංයමයක් නැති එ බමුණු ගොස් වඞ්ඝගිරියට යන මඟ මුළා වූයෙ මේ ගාථා කී:

6418. රාජපුත්‍ර වූ උතුම් වූ මසුරුයින් ජය ගන්නා වූ අපරාජිත වූ බියෙහි අභය දෙන්නා වූ වෙසතුරු රජ වසන තැන් කවරෙක් මට දැන කියන්නෙ ද?

6419. යමෙක් යදියනට පිහිට වී ද, පොළොව මෙන් හැම සත්නට පිහිට වූ දෙරණට උපමා වූ ඒ වෙසතුරු මහරජහු (වසන තැන්) කවරෙක් මට දැන කියන්නෙ ද?

6420. ගඞ්ගාවනට සාගරය මෙන් යමෙක් යදියනට පිළිසරණ වී ද සයුරට උපමා වූ වෙසතුරු මහරජහු කවරෙක් මට දැන කියන්නෙ ද?

6421. හෙළපියුමින් සැදුණු කුසුම් රේණුයෙන් යුක් කලණ නොට ඇති පවිත්‍ර වූ සිහිල් සෙවණ ඇති මනරම් විලක් බඳු වූ වෙසතුරු මහරජහු කවරෙක් මට දැන කියන්නෙ ද?

6422. අස්සත්ථංව පථෙ ජාතං සීතච්ඡායං මනොරමං,
සන්තානං විස්සමෙ[1]තාරං කිලන්තානං පටිග්ගහං;
තථූපමං මහාරාජං කො මෙ වෙස්සන්තරං විදූ.

6423. නිග්‍රොධංව පථෙ ජාතං සීතච්ඡායං මනොරමං,
සන්තානං විස්සමෙතාරං කිලන්තානං පටිග්ගහං;
තථූපමං මහාරාජං කො මෙ වෙස්සන්තරං විදූ.

6424. අම්බං ඉව පථෙ ජාතං සීතච්ඡායං මනොරමං,
සන්තානං විස්සමෙතාරං කිලන්තානං පටිග්ගහං;
තථූපමං මහාරාජං කො මෙ වෙස්සන්තරං විදූ.

6425. සාලං ඉව පථෙ ජාතං සීතච්ඡායං මනොරමං,
සන්තානං විස්සමෙතාරං කිලන්තානං පටිග්ගහං;
තථූපමං මහාරාජං කො මෙ වෙස්සන්තරං විදූ.

6426. දුමං ඉව පථෙ ජාතං සීතච්ඡායං මනොරමං,
සන්තානං විස්සමෙතාරං කිලන්තානං පටිග්ගහං;
තථූපමං මහාරාජං කො මෙ වෙස්සන්තරං විදූ.

6427. එවඤ්ච මෙ විලපතො පවිට්ඨස්ස බ්‍රහාවනෙ,
අහං ජානන්ති යො වජ්ජා නන්දිං සො ජනයෙ මමං[2]

6428. එවඤ්ච මෙ විලපතො පවිට්ඨස්ස බ්‍රහාවනෙ,
අහං ජානන්ති යො වජ්ජා (වෙස්සන්තරනිවෙසනං;)
තාය සො එකවාචාය පසවෙ පුඤ්ඤං අනප්පකං.

6429. තස්ස චෙතො පටිස්සොසි අරඤ්ඤෙ ලුද්දකො චරං,[3]
තුම්හෙහි බ්‍රහෙම පකතො අතිදානෙන ඛත්තියො;
පබ්බාජිතො සකා රට්ඨා වචෙන වසති පබ්බතෙ.

6430. තුම්හෙහි බ්‍රහෙම පකතො අතිදානෙන ඛත්තියො,
ආදය පුත්තදරඤ්ච වචෙන වසති පබ්බතෙ.

6431. අකිච්චකාරී දුම්මෙධො රට්ඨා විව[4]නමාගතො,
රාජපුත්තං ගවෙසන්තො ඛකො මච්ඡමිවොදකෙ.

---

1. විසමෙ – මජසං. ස්‍යා.
2. මම – මජසං. ස්‍යා.
3. ලුද්දගොචරො – මජසං. ස්‍යා.
4. පවන – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6422. විඩාපත් ජනයන්ගේ වෙහෙස හරනා වූ මහ මිරිකුණු-වුනට පිහිට වූ සිහිල් සෙවණ ඇති මහමහ නැඟි මනරම් ඇසතු රුකක් යමසේ නම් එබඳු උපමා ඇති වෙසතුරු මහරජහු කවරෙක් මට දැන කියන්නෙ ද?

6423. විඩාපත් ජනයන්ගේ වෙහෙස හරනා වූ මාර්ගක්ලාන්ත-යනට පිහිට වූ සිහිල් සෙවණ ඇති මහමහ නැඟි මනරම් නුග රුකක් යමසේ නම් එබඳු උපමා ඇති වෙසතුරු මහරජහු කවරෙක් මට දැන කියන්නෙ ද?

6424. විඩාපත් ජනයන්ගේ වෙහෙස හරනා වූ මහ මිරිකුණු-වුනට පිහිට වූ සිහිල් සෙවණ ඇති මහමහ නැඟි මනරම් අඹ රුකක් යමසේ නම් එබඳු උපමා ඇති වෙසතුරු මහරජහු කවරෙක් මට දැන කියන්නෙ ද?

6425. විඩාපත් ජනයන්ගේ වෙහෙස හරනා වූ මහමහ පෙළඟුවුනට පිහිට වූ සිහිල් සෙවණ ඇති මහමහ නැඟි මනරම් සල්රුකක් යමසේ නම් එබඳු උපමා ඇති වෙසතුරු මහරජහු කවරෙක් මට දැන කියන්නෙ ද?

6426. විඩාපත් ජනයන්ගේ වෙහෙස හරනා වූ මහමහ මිරිකුණුනට පිහිට වූ සිහිල් සෙවණ ඇති මහමහ නැඟි මනරම් රුකක් යමසේ නම් එබඳු උපමා ඇති වෙසතුරු මහරජහු කවරෙක් මට දැන කියන්නෙ ද?

6427. මහවල්හි මංමුළා වූ මෙසේ වලප්නා මට යමෙක් 'මම දන්මි'යි කී නම් හෙ මට සොමනස් දනවන්නෙ යැ.

6428. මහවෙනෙහි මංමුළා වූ මේසේ වලප්නා මට යමෙක් මම දන්මී' කී නම් හෙ ඒ එක් වදනින් බොහෝ පින් රැස් කරන්නෙ යි.

6429. ඔහට, වැදි වැ වෙනෙහි ඇවිදුනා වෙත රටවැසියෙක් මෙසේ පිළිවදන් ඇස්වී: බමුණ තොප විසින් අතිදුනයෙන් පෙළන ලද රජ තෙම සියරටින් නෙරනලද්දෙ වඞ්ගගිරියෙහි වාස කෙරෙයි.

6430. බමුණ තොප විසින් අධිඤදනයෙන් මඩනාලද වෙසතුරු රජ අඹුදරුවන් ද ගෙනගොස් වඞ්ගගිරියෙහි වේසේ.

6431. නුවණ නැති නො කටයුතු කරනසුලු තෝ දියෙහි මසකු සොයන කොඤකු මෙන් වෙස්සන්තර රාජපුත්‍රයා සොයමින් රටින් නික්ම මහවනයට ආයෙහි.

6432. තස්ස ත්‍යාහං න දස්සාමි ජීවිතං ඉධ බ්‍රාහ්මණ,
අයං හි තේ[1] මයා නුන්නෝ සරෝ පාස්සති[2] ලොහිතං.

6433. සිරෝ තෙ වජ්ඣඨිත්වාන[3] හදයං ඡෙත්වා සබන්ධනං,
පත්තසකුණං[4] යපිස්සාමි තුය්හං මංසෙන බ්‍රාහ්මණ.

6434. තුය්හං මංසෙන මෙදෙන මත්ථකෙන ච බ්‍රාහ්මණ.
ආහුතිං පග්ගහෙස්සාමි ඡෙත්වාන හදයං තව.

6435. තං මෙ සුයිට්ඨං සුහුතං තුය්හං මංසෙන බ්‍රාහ්මණ,
න ච ත්වං රාජපුත්තස්ස හරියං පුත්තෙ ච නෙස්සසි.

6436. අවජේසි බ්‍රාහ්මණෝ දූතෝ වෙතපුත්ත සුණෝහි මෙ,
තස්මා හි දූතං න හනන්ති එස ධම්මෝ සනන්තනෝ.

6437. නිජ්ඣත්තා සිවයෝ සඛෙ පිතා නං දට්ඨුමිච්ඡති,
මාතා ච දුබ්බලා තස්ස අච්චිරා වත්තිනි හීයරෙ.

6438. තෙසාහං පහිතෝ දූතෝ වෙතපුත්ත සුණෝහි මෙ,
රාජපුත්තං නයිස්සාමි යදි ජානාසි සංස මෙ.

6439. පියස්ස මෙ පියෝ දූතෝ පුණ්ණපත්තං දදී තෙ,
ඉමඤ්ච මධුනෝ තුම්බං මිගස්සජීඤ්ච[5] බ්‍රාහ්මණ;
තඤ්ච තෙ දෙසමකඛිස්සං යත්ථ සම්මති කාමදෙ.

පූජකපබ්බං නිට්ඨිතං.

6440. එස සෙලෝ මහාබ්‍රහ්මෙ පබ්භතෝ ගන්ධමාදනෝ,
යත්ථ වෙස්සවණාභාතරා රාජා සහ පුත්තෙහි සම්මති.

6441. ධාරෙන්තෝ බ්‍රාහ්මණං ච [illegible] ආසදඤ්ච මසං ජටං,
චම්මවාසී ජමා සෙති ජාතවෙදං නමස්සති.

6442. එතෙ නීලා පදිස්සන්ති නානාඵලධරා දුමා,
උග්ගතා අබ්භකූටං[6] ච නීලා අඤ්ඤනපබ්බතා.

---

1. අයඤ්හි තෙ මයා – මජ්ඣං.
2. සරෝ විස්සති – මජ්ඣං.
3. බජ්ඣඛිත්වාන – මජ්ඣං.
4. බන්ධසකුණං – මජ්ඣං.
5. සංයමෙ – මජ්ඣං.
6. මිගස්සනඛිඤ්ච – මජ්ඣං.
7. අබ්භකූටාව – මජ්ඣං. සී. ව්.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6432. බමුණ, මම මෙහි දී ඒ නො කටයුතු කරන තට දිවි නො දෙමි. ම විසින් විදුනාලද මේ සරය තාගේ ලේ බොන්නෙ යැ.

6433. බමුණ, තා මරා තාගේ හිස සිඳැ අක්මා සහිත හදමස් කපාගෙනැ තාගේ මසින් මාර්ගදේවතාවන්ට 'පඤ්සකුණ' යාග කරනෙමි. (බිලියම් කරනෙමි)

6434. බමුණ, තාගේ හදමස් කපාගෙනැ තාගේ මසිනුදු මස්-තෙලිනුදු හිස්මුලිනුදු හෝම කරනෙමි.

6435. බමුණ මා විසින් තාගේ මසින් කරනලද එ මොනවට යාග කරනලද මොනොවට පූදනලද කවර හෙයින යත්: ඒ හෙතුවින් තෝ රාජපුත්‍රයාගේ අඹුව හෝ දරුවන් හෝ නො ගෙන යන්නෙහි.

6436. චෙතපුත්‍රය, මාගේ බස් අසව. බමුණා ද දූතයා ද නො මැරියැයුතු වෙයි. එ කරුණෙන් දූතයා නො මරති, මෙ දහම සනාතන (පුරාණ) වෙයි.

6437. හැම සිව්හු සන්හිදුවනලදහ. පියරජ ඔහු දක්නට රිසි වෙයි, ඔහුගේ මවු ද දුබල යැ. නොබෝ කල්හි මැ ඇස් පිරිහෙයි. (නීරතුරු හැඬීමෙන)

6438. මම ඔවුන් විසින් මෙහෙයනලදුයෙමි, චෙතපුත්‍රය මාගේ බස් අසව. වෙසතුරු රජපුතු ගෙනැ යමි. ඉදින් දනී නම් මට කියව.

6439. බමුණ, මාගේ ප්‍රිය (වෙසතුරු) හට ප්‍රිය දූතයෙහි, තට තුටුපඩුරු කොට මේ ඕපිරු ලබුව ද මුවකලවෙ ද දෙමි. කැමැති සැපත් දෙන වෙසතුරු යම් තැනෙකැ වෙසේ ද එ දෙස ද තට කියමි.

ජූජක පර්වය නිමි.

6440. බමුණ යම් තැනෙකැ වෙසතුරු රජ දරුවන් හා සමග වාස කෙරේ ද තෙල පැනෙන ගල ඒ ගඳමහන් පවුව යි. (කඳු පාමුලින් උතුරුදිග බලා ගොස් සක්දෙව් මවාදුන් අසපුවෙහි දක්නෙහි)

6441. (එ රජ) උතුම් තවුස්වෙස් ද දෙහෙට්ල්ල ද ගිනිපූදන සැන්ද ද (හොමදබ්බි) දළමඩුලු ද ධරනුයෙ අඳුන්දිවිසම් ධරනුයෙ බිමැ කොළ ඇතිරියෙහි හොවී. ගිනිදෙවියා පූදයි.

6442. තෙල නිල්වන් වූ නොයෙක් ඵල ධරන වෘක්ෂයෝ නැඟී සිටි වලාකුළු මෙන් නිල්වන් අඳුන් කුළු මෙන් පැනෙති.

6443. ධවස්සකණ්ණා ඛදිරා සාලා ඵන්දනමාලුවා,
සම්පවෙධන්ති වාතෙන සකිං පීතාව මාණවා.

6444. උපරි දුමපරියායෙසු සංගීතියොව සූයරෙ,
නජ්ජුභා කොකිලසඞ්ඝා සම්පතන්ති දුමා දුමං.

6445. අව්හයන්තෙව ගච්ඡන්තං සාඛාපණ්ණ[1]සමෙරිතා,
රමයන්තෙව ආගන්තුං මොදයන්ති නිවාසිනං;
යත්ථ වෙස්සන්තරො රාජා සහ පුත්තෙහි සම්මතී.

6446. ධාරෙන්තො බ්‍රාහ්මණං වණ්ණං ආසදඤ්ච මසංජටං,
චම්මවාසී ජමා සෙති ජාතවෙදං නමස්සති.

6447. අම්බා කපිත්ථා[2] පනසා සාලා ජම්බු විභීතකා,[3]
හරීතකී ආමලකා අස්සත්ථා බදරානි ච,[4]

6448. චාරු තිම්බරුක්ඛා චෙත්ථ නිග්‍රොධා ච කපිත්ථනා,
මධු මධුකා ථෙවන්ති නීවෙ පක්කා වුදුම්බරා.

6449. පාරෙවතා භවෙය්‍යා ච මුද්දීකා ච මධුත්ථිකා,[5]
මධුං අනෙලකං තත්ථ සකමාදය භුඤ්ජරෙ.

6450. අඤ්ඤෙත්ථ පුප්ඵිතා අම්බා අඤ්ඤෙ තිට්ඨන්ති දෙමිලා,
අඤ්ඤෙ ආමා ච පක්කා ච භෙකවණ්ණ[6] තදුභයං.

6451. අථෙත්ථ භෙට්ඨා පුරිසො අම්බපක්කානි ගණ්හති,
ආමානි චෙව පක්කානි වණ්ණගන්ධරසුත්තමෙ.[7]

6452. අතෙව[8] මෙ අච්ඡරියං භිඞ්කාරො පටිභාති මං,
දෙවානම්ව ආවාසො සොභති නන්දනූපමො.

6453. විභෙදිකා නාළිකෙරා ඛජ්ජූරීනං බ්‍රහාවනෙ,
මාලාව ගන්ථිතා ඨන්ති ධජග්ගානෙව දිස්සරෙ;
නානාවණ්ණෙහි පුප්ඵෙහි නභං තාරාචිතාමිව.

6454. කුටජි කුට්ඨතගරා[9] පාටලියො ච පුප්ඵිතා,
පුන්නාගා ගිරිපුන්නාගා කොවිළාරා ච පුප්ඵිතා.

---

1. සාඛාපත්ත – මජ්ජසං. ස්‍යා. වි.
2. කපිට්ඨා – මජ්ජසා.
3. විභෙදකා – මජ්ජසාං. ස්‍යා.
4. පදරානිච – මජ්ජසං.
5. මධුත්තිකා – මජ්ජසං.
6. සිඞ්ගවණ්ණ – මජ්ජසං. ස්‍යා.
7. රසුත්තමා – මජ්ජසං,
8. තථෙව – මජ්ජසං.
9. කුටජා කුට්ඨතගරා – මජ්ජසං. කුටජි කුට්ඨතගරා – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6443 දුව යැ අසු යැ කිහිරි යැ සල් යැ කොළොම් යැ මාළුවා යැ යන වෘක්ෂයෝ එක්වරක් මැ පානය කළ රාහොඩුන් මෙන් පවනින් වෙවුළති.

6444. වෘක්ෂශාඛා මතුයෙහි (සියොතුන් හඬ) දෙවිගී මෙන් ඇසෙයි. විලිකුළුමුළු හා කෙවිලිමුළු ගසින් ගසට පනිති.

6445. යම් පර්වතයෙකැ වෙසතුරු රජ දරුවන් සමග වාස කෙරේ ද (එහි) පවනින් සැලෙන ශාඛාපත්‍රයෝ තමා පියා යනුවහු කැඳවනුවන් වැන්නහ. තමා කරා එන්නහු රමණය කරනුවන් වැන්නහ. නිතිවසන දනන් තුටු කෙරෙති.

6446. (එ රජ එහි) උතුම් තවුස්වෙස් ද දෙහෙවිල්ල ද ගිනිපුදන සැන්ද ද දළමඬුලු ද ධරනුයෙ අඳුන් දිවිසම් ධරනුයෙ බිමැ (පත් ඇතිරියෙහි) හොවී, ගිනි දෙවියා නමදී.

6447. අඹ ද ගිවුළු ද පනා (කොස්) ද සල් ද දඹ ද බුළු ද අරළු ද ඇඹුලු (නෙල්ලි) ද ඇසතු ද ඩෙබර ද,

6448. එහි රන්කිඹිරි රුක් ද නුග ද හෙළ කිඳි ඇසතු ද ඇත. මියුරු රස ඇති මීරුක්හු හොබවති. මිටි රුක්හි විලිකුන් දිඹුල්පල ද ඇත.

6449. කිරිපලු ද එල්ගෙඳ ද මී වැහෙන මිදි ද ඇත. එ වෙනෙහි නිවැසි මී තුමූ මැ ගෙන බුදිති.

6450. ඒ වෙනෙහි ඇතැම් අඹරුක් කෙනෙක් මල්පිපී සිටිති. ඇතැම් අඹරුක් කෙනෙක් මැලැගෙන (පලගනිමින්) සිටිති. ඇතැම් අඹරුක් කෙනෙක් අමු පල ද විලිකුන් පල ද ඇති වැ සිටිති. එ අමු විලිකුන් දෙපල මැ නිල්මැඩියන් වැන්න හ.

6451. තවද ඒ අසපුවෙහි අඹරුක් යට සිටි පුරුෂ තෙම (රුකට නො නැඟී මැ) වර්ණ ගන්ධ රසයෙන් උතුම් වූ අමු අඹ ද විලිකුන් අඹ ද නෙලාගනී.

6452. මට ඉතා මැ අසිරි යැ, මට විස්මය වැ වැටහෙයි, දෙවියනට නිවාස වූ නඳුනුයන මෙන් හොඹ.

6453. ඉඳි රුකින් යැදි මහවෙනෙහි තල් රුක් ද නෙරළු රුක් ද ඇති. සුපිපි රුක් ගෙතූ මල්දම් සෙයින් සිටි, ධවජාග්‍රයන් මෙන් පැනෙයි, නන් පැහැ මලින් තරුවැළින් සැදි අහස මෙනි.

6454. යුළුකෙළිඳ ද උපුල්කොළ ද තුවරලා ද පළොල් රුක් ද පිපී සිටිත්, දෙඹරුක් ද මහදෙඹරුක් ද ගෙනබොළල රුක් ද පිපී සිටිත්.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6455. උඤ්ඤලකා සොමරුක්ඛා අගරු[1]හලලියො බහු,
පුත්තජීවා[2] ච කකුධා[3] අසනා චෙත්ථ පුප්ඵිතා.

6456. කුටජා සලලා නීපා කොසම්බලබුජා ධවා,
සාලා ච පුප්ඵිතා තත්ථ පලාලබලසන්නිභා.[4]

6457. තස්සාවිදූරෙ පොක්ඛරණී භූමිභාගෙ මනොරමෙ,
පදුමුප්පලසඤ්ඡන්නා දෙවානම්ව නන්දනෙ.

6458. අථෙත්ථ පුප්ඵරසමත්තා කොකිලා මඤ්ජුභාණිකා,
අභිනාදෙන්ති පවනං[5] උතුසම්පුප්ඵිතෙ දුමෙ.

6459. භස්සන්ති මකරන්දෙහි[6] පොක්ඛරෙ පොක්ඛරෙ මධු,
අථෙත්ථ වාතා වායන්ති දක්ඛිණා අථ පච්ඡිමා;
පදුමකිඤ්ජක්ඛරෙණුහි ඔකිණ්ණෙණ හොති අස්සමො.

6460. ථූලා සිඞ්ඝාටකා චෙත්ථ සංසාදියා පසාදියා,[7]
මච්ඡකච්ඡපව්‍යාවිද්ධා බහු චෙත්ථ මුපයානකා;
මධුං භිංසෙහි සවති ඛීරං සප්පි මුලාලිහි.[8]

6461. සුරභි තං වනං වාති නානාගන්ධසමෙරිතං,[9]
සම්මද්දතෙව ගන්ධෙන පුප්ඵසාඛාහි තං වනං;
භමරා පුප්ඵගන්ධෙන සමන්තාමිභිනාදිතා.

6462. අථෙත්ථ සකුණා සන්ති නානාවණ්ණා බහූ දිජා,
මොදන්ති සහ හරියාහි අඤ්ඤමඤ්ඤං පකූජිනො.

6463. නන්දිකා ජීවපුත්තා ච ජීව පුත්තා ච පියා ච නො,
පියා පුත්තා පියා නන්ද දිජා පොක්ඛරණීසරා.

6464. මාලාව ගන්ථිතා ඨන්ති ධජග්ගානෙව දිස්සරෙ,
නානාවණ්ණෙහි පුප්ඵෙහි කුසලෙහි සුගන්ධිකා;
යත්ථ වෙස්සන්තරො රාජා සහ පුත්තෙහි සම්මති.

6465. ධාරෙන්තො බ්‍රාහ්මණං වණ්ණං ආසදං ච මසං ජටං,
චම්මවාසී ඡමා සෙති ජාතවෙදං නමස්සති.

---

1. අග්ගලු – මජසං.
2. පුටජීවා – මජසං.
3. කුකකුටා – ස්‍යා.
4. සන්තාභා – මජසං.
5. තං වනං – මජසං. ස්‍යා.
6. මකරන්තෙහි – මජසං.
7. සංසාරියපසාරියා – මජසං.
8. සබ්බිමුළාරිහි – මජසං.
9. සමොදිකා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6455. එහි එරහැන්ද ද සෝමරුක් ද අගිල්රුක් ද බදුලුරුක් ද බොහෝ යැ, අවරි ද සුළුකුඹුක් ද පියාරුක් ද පිපී සිටියි.

6456. එහි මහකෙළිඳ ද සලළ රුක් ද බන්මීරුක් ද කොසඹ රුක් ද දෙල් රුක් ද දඹරුක් ද සල්රුක් ද පිපී සිටියි. (රුක් යට වගළ මල්රැස) පිදුරු කලවිටි වැන්න.

6457. එ අසපුවට නුදුරෙහි මනරම් බිම් පෙදෙසෙකැ දෙවියන්ගේ නඳුනුයනෙහි මෙන් පියුමුපුලෙන් සැදි (සිවුරැස්) පොකුණෙක් ඇත.

6458. තවද එහි පොකුරුමී රසින් මත් වූ මියුරු හඬ ඇති කුරවිකෙව්ල්ලෝ සෘතු සමයෙහි පිපිරුක්හි හිඳ (සියහඬින්) මහ වනය වෙසෙඹින් හඬවති.

6459. මලින් බස්නා මුවරඳින් පොකුරුපතැ පොකුරුපතැ මී ඇත. තවද ඒ අසපුවෙහි දකුණුදෙසින් අවරදෙසින් දසනුදසින් පවන් හමයි. පියුම් කෙසරුයෙන් හා රොනින් එ අසපුව ගැවැසි ගත්තේ වෙයි.

6460. ඒ පොකුණෙහි මහවිල්කටු ද සඩයංජාත හුරුහැල් ද එයින් පතිත වැ හැටි හැල් ද ඇත. රහැබැඳ ඇවිදිනා මස්කැස්බෝ ද ඇත. එහි කකුළුවෝ ද බොහෝ වෙති. නෙළඹලයෙන් මී වැහෙයි, නෙළඹුදැලියෙන් වැහෙන රස කිරිමුසු ගිතෙල් වැන්න.

6461. නන් ගඳින් වැහුණ ඒ වනය සුවඳ හමයි. පුෂ්පශාඛායෙන් ප්‍රවෘත්ත ගන්ධයෙන් එ වනය පැමිණි දනන් මත් කෙරේ මැ යැ. බමරු මල්ගඳින් හාත්පසැ නද දෙති.

6462. තවද එ වෙනෙහි ලිහිණියෝ ඇත. නන් පැහැති බොහෝ ලිහිණිහු ඔවුනොවුන්ට කුල්නාහු ලිහිණි දෙනුන් හා තුටු වෙති.

6463. (වෙසතුරු රජුනි, තෙපි) තුස්ව යි කියන නාදික ලිහිණියෝ ද දරුවන් සමග සැරදෙව යි කියන ජීවපුත්‍රක ලිහිණියෝ ද තෙපි ද සැරදෙව තොප ප්‍රිය දරුවෝ ද සැරදෙත්ව යි කියන ලිහිණියෝ ද තෙපි ද තුටුව තොප දරුවෝ ද තුටුවෙත්වයි කියන ලිහිණියෝ ද පොකුණ මැ නිවෙස් කොට ඇතියහ.

6464. යම් තැනෙකැ වෙසතුරු රජ දරුවන් සමග සන්හිඳේ ද එ වනඟිස් නන් පැහැ මලින් නිපුණයන් විසින් ගෙතූ මල්දම් සෙයින් හොබනෙ යැ.

6465. (එහි වෙසතුරු රජ) තවුස්වෙස් ද දෙහෙට්ල්ල ද හොමදබ්බිය ද දළමඩුලු ද ධරනුයෙ අඳුන්දිවිසම් ධරනුයෙ බිමැ (පන් ඇතිරියෙහි) හොවී. ගිනිදෙවියා නමදී.

6466. ඉදඤ්ච මෙ සත්තුභත්තං මධුනා පටිසංයුතං,
මධුපිණ්ඩිකා ච සුකතායො සත්තුභත්තං දදාමි තෙ.

6467. තුස්සෙව සම්බලං හොතු නාහං ඉච්ඡාමි සම්බලං,
ඉතොපි බ්‍රහ්මෙ ගණ්හාහි ගච්ඡ බ්‍රහ්මෙ යථාසුඛං.

7468. අයං එකපදී එති උජුං ගච්ඡති අස්සමං,
ඉසීපි අච්චුතො තත්ථ පඞ්ඝදන්තො රජස්සිරො;
ධාරෙන්තො බ්‍රාහ්මණං වණ්ණං ආසදඤ්ච මසඤ්ජටං.

6469. චම්මවාසී ජමා සෙති ජාතවෙදං නමස්සති,
තං ත්වං ගන්ත්වාන පුච්ඡස්සු සො තෙ මග්ගං පවක්ඛති.

6470. ඉදං සුත්වා බ්‍රහ්මබන්ධු චෙතං කත්වා පදක්ඛිණං,
උදග්ගචිත්තො පක්කාමි යෙනාසි අච්චුතො[1] ඉසි.

චූළවනවණ්ණනා නිට්ඨිතා.

6471. ගච්ඡන්තො සො භාරද්වාජො අද්දස අච්චුතං ඉසිං,
දිස්වාන තං භාරද්වාජො සම්මොදි ඉසිනා සහ.

6472. කච්චින්නු හොතො කුසලං කච්චි හොතො අනාමයං,
කච්චි උඤ්ඡෙන යාපෙසි කච්චි මූලඵලා බහූ.

6473. කච්චි ඩංසා ච මකසා ච අප්පමෙව සිරිංසපා,[2]
වනෙ වාළමිගාකිණ්ණෙ කච්චි හිංසා න විජ්ජති.

6474. කුසලඤ්චෙව මෙ බ්‍රහ්මෙ අථො බ්‍රහ්මෙ අනාමයං,
අථො උඤ්ඡෙන යාපෙමි අථො මූලඵලා බහූ.

6475. අථො ඩංසා ච මකසා ච අප්පමෙව සිරිංසපා,
වනෙ වාළමිගාකිණ්ණෙ හිංසා මය්ඝං න විජ්ජති.

6476. බහූනි චස්ස පූගානි අස්සමෙ වසතො[3] මම,
නාභිජානාමි උප්පන්නං ආබාධං අමනොරමං.

6477. ස්වාගතං තෙ මහාබ්‍රහ්මෙ අථො තෙ අදූරාගතං,
අන්තො පවිස භද්දන්තෙ පාදෙ පක්ඛාලයස්සු තෙ.

6478. තින්දුකානි පියාලානි මධුකෙ කාසුමාරියො,
ඵලානි බුද්දකප්පානි භුඤ්ජ බ්‍රහ්මෙ වරං වරං.

---

1. මච්චුතො – මජසං.
2. සරිසපා – මජසං.
3. සම්මතො – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6466. (වෙතපුත්‍රය,) මේ මා සතු අත්සුණු බත මීයෙන් හැනුයෙ යැ. මොනවට කළ අත්වට ද අත්සුණුබත ද තොපට දෙමි. (මෙය ගනුව.)

6467. මාර්ගොපකරණ තොපට මැ වේවා. මම තොපගේ මහ උවරණ නො කැමැත්තෙමි. බමුණ, මෙයිනුදු ගනුව, බමුණ සුවසේ යව.

6468. මේ එක්පිය මහ හමුයෙහි එයි, හෙ ද අසපුවට ඉදුරා යෙයි. එ මහැ මැලිදත් ඇති රජස්මුසු හිස් ඇති 'අව්‍යුත' නම් තවුසෙක් ද වෙසෙ යි.

6469. හෙ තවුස්වෙස් ද මල්පල නෙලන අකුසුදු ගිනි පුදන සැන්ද ද දළමඬුලුදු ධරනුයෙ දදුන්දිවිසම් ධරනුයෙ බිමැ (පත් ඇතිරියෙහි) හෝනෙ යැ. ගිනිදෙවියා පුදයි. තෙපි ගොස් ඔහු අතින් පුළුවුස්ව. හෙ තොපට මහ කියන්නෙ යැ.

6470. බමුණු මෙය අසා සෑදරු පැදකුණු කොට 'අව්‍යුත' තවුස් යම් තැනෙකැ වී ද එහි ඔදවැඩි සිතැති වැ පිටත් වැ ගියේ.

සුළුවන වැනුමි.

6471. එ පුජක බමුණු යන්නෙ අව්‍යුත' තවුසා දිටි. බමුණු **ඔහු දැකැ තවුසා සමග පිළිසඳර කෙළේ** යැ.

6472. කිම භවත්හට රෝග නැද් ද? කිම භවත්හට දුක් නැද් ද? කිම වනමුල්පලයෙන් යැපෙහි ද? කිම මුල් හා පලවැළ බොහෝ ඇද්ද?

6473. කිම තොපට මැසිමදුරුවෝ ද දික්දැසප්හු ද අල්ප මැ වෙන් ද? සැඬමුවන් ගැවැසිගත් වෙනෙහි කිම හිංසා නැද්ද?

6474. බමුණ, මට රෝග නැත. තවද මට දුක් නැත. වන මුල්පලවැළින් යැපෙමි. මුල් හා පලවැළ බොහෝ යැ.

6475. තවද මැසිමදුරුවෝ ද දීර්ඝජාති සර්පයෝ ද අල්ප මැ වෙති. සැඬමුවන් ගැවැසිගත් වෙනෙහි මට හිංසා නැත.

6476. බොහෝ අවුරුදු ගණන් අසපුවෙහි වසන මට උපන් නො සිත්කලු රෝගයක් නො දන්මි.

6477. බමුණ තොපට සුවාගත යැ (තොපගේ පැමිණීම මැනැවැ) තවද තොපගේ නො මනා ඊමෙක් නො වෙයි. තොපට යහපතක් වේවා. තොපගේ පා ධොවන කරව. ඇතුළු පන්සලට පිවිසෙව.

6478. බමුණ, නිඹිරිපල යැ පියල්පල යැ මිහිරි කටුඵරමිණිය යැ දඬුඵල්බැ මී යැ යන මේ ඇත. උතුම් උතුම් දෑය විළඳව.

6479. ඉදම්පි පානීයං සීතං ආභතං ගිරිගබ්භරා,
තතො පිව මහාබ්‍රහ්මෙ සවෙ ත්වං අභිකඞ්ඛසි.

6480. පටිග්ගහීතං යං දින්නං සබ්බස්ස අග්ගියං කතං,
සඤ්ජයස්ස සකං පුත්තං සිවීහි විප්පවාසිතං;
තමහං දස්සනමාගතො යදි ජානාසි සංස මෙ.

6481. න භවං එති පුඤ්ඤත්ථං සිවිරාජස්ස දස්සනං,
මඤ්ඤෙ භවං පත්ථයති රඤ්ඤෙ භරියං පතිබ්බතං.

6482. මඤ්ඤෙ කණ්හාජිනං දසිං ජාලිං දසඤ්ච ඉච්ඡසි,
අථවා තයො මාතාපුත්තෙ අරඤ්ඤෙ නෙතුමාගතො;
න තස්ස භොගා විජ්ජන්ති ධනං ධඤ්ඤඤ්ච බ්‍රාහ්මණ.

6483. අකුද්ධරූපාහං භොතො නාහං යාචිතුමාගතො,
සාධු දස්සනමරියානං සන්නිවාසො සදා සුඛො.

6484. අදිට්ඨපුබ්බො සිවිරාජා සිවීහි විප්පවාසිතො,
තමහං දස්සනමාගතො යදි ජානාසි සංස මෙ.

6485. එස සෙලො මහාබ්‍රහ්මෙ පබ්බතො ගන්ධමාදනො,
යත්ථ වෙස්සන්තරො රාජා සහපුත්තෙහි සම්මති.

6486. ධාරෙන්තො බ්‍රාහ්මණං වණ්ණං ආසදඤ්ච මසං ජටං,
චම්මවාසී ජමා සෙති ජාතවෙදං නමස්සති.

6487. එතෙ නීලා පදිස්සන්ති නානාඵලධරා දුමා,
උග්ගතා අබ්භකූටාව නීලා අඤ්ජනපබ්බතා.

6488. ධවස්සකණ්ණා බදිරා සාලාඵන්දනමාලුවා,
සම්පවෙධන්ති වාතෙන සකිං පීතාව මාණවා.

6489. උපරි දුමපරියායෙසු සංගීතියොව සූයරෙ,
නජ්ජුහා කොකිලසඞ්ඝා සම්පතන්ති දුමා දුමං.

6490. අවහයන්තෙව ගච්ඡන්තං සාඛාපත්තසමෙරිතා,[1]
රමයන්තෙව ආගන්තුං මොදයන්ති නිවාසිනං;
යත්ථ වෙස්සන්තරො රාජා සහ පුත්තෙහි සම්මති.

---

1. සමීරිතා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6479. මෙ පැනුදු සිහිලැ. ගල්කුසින් බට හොයින් ගෙනෙන ලද. බමුණ ඉදින් තෙපි රිසියවු නම් එයින් ගෙන පානය කරව.

6480. යමක් තොප විසින් දෙමි යි කී නම් ඒ දෙනලද මැ වේවා මා විසිනුදු පිළිගන්නාලද මැ වේවා. සියල්ල පඬුරු කරන ලද යැ. සඳමහරජුගේ සියපිත් (වෙසතුරු) සිවින් කෙරෙන් වෙන් වැ වසන බව නො දනු ද? මම ඔහු දක්නට අයිමි. ඉදින් දන්නවු නම් මට කියව.

6481. භවත් සිවිරජහු දක්නට පින් පිණිස නො එයි. භවත් රජහට පනිනි වූ අඹුව පතන වනැයි හඟිමි.

6482. කෘෂ්ණාජිනා දූස් කොට ජාලිය දස් කොට රැස්නා වනැයි හඟිමි. නොහොත් මව යැ දෙදරු යැ යන තිදෙනා වනයෙන් ගෙන යන්නට අැයෙ වනැ යි හඟිමි. කොළ බමුණ, ඔහට භෝග නැත. ධනධාන්‍ය ද නැත.

6483. මම භවත්හු විසින් නො කිපියයුතු සැහැවියෙමි. මම කිසිත් යදනට නො ආමි. ආයර්‍යයන්ගේ දැක්ම යහපත. ඔවුන් හා සමග විසීම හැමද සුව යැ.

6484. සිවිමහරජ යම් දවසෙකැ සිවීන් විසින් රටින් නෙරන ලද ද එ දවස් පටන් හෙ මා විසින් නුදුටුවිරු යැ. එයින් මම ඔහු දක්නට අයිමි. ඉදින් දනු නම් මට කියව.

6485. බමුණ, යම් තැනෙකැ වෙසතුරු රජ දරුවන් සමග සන්හිඳේ ද තෙල පැනෙන ගල ඒ ගඳමහන් පව්ව යි.

6486. හේ තවුස්වෙස් ද දෙහෙට්ල්ල ද ගිනිපුදන සැන්ද ද දළමඩුලු ද ධරනුයෙ අදුන්දිවිසම් ධරනුයෙ බිමැ (පත් ඇතිරියෙහි) හොවී. ගිනිදෙවියා පුදයි.

6487. තෙල නිල්වන් වූ නොයෙක් පල ධරන වෘක්ෂයෝ නැඟී සිටි වලාකුළු මෙන් නිල්වන් අදුන්කුළු මෙන් පැනෙති.

6488. දැව යැ අසු යැ කිහිරි යැ සල් යැ කොළොම් යැ මාළුවා යැ යන වෘක්ෂයෝ එක්වරක් පානය කළ රාසොඬුන් මෙන් පවනින් වෙවුළති.

6489. රුක්අතු මතුයෙහි (සියොතුන් හඬ) දෙව්ගී මෙන් ඇසෙයි. විලිකුළුගණුා හා කෙවිලිගණුා ගසින් ගසට පනිති.

6490. යම් තැනෙකැ වෙසතුරු රජ දරුවන් හා සමග වෙසේ ද (එහි) පවනින් සැලෙන කුරුසාපත් තමා පියා යනුවහු කැඳවනුවන් වැන්නහ. තමා කරා එනුවහු රමණය කරනුවන් වැන්නහ. නිති වසන දනන් තුටු කරනුවහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6491. ධාරෙන්තා බ්‍රාහ්මණං වණ්ණං ආසදඤ්ච මසං ජටං,
චම්මවාසී ජමා සෙති ජාතවෙදං නමස්සති.

6492. කරෙරිමාලා විතතා භූමිභාගෙ මනොරමෙ,
සද්දලාහරිතා භූමි න තණ්ඩුධංසතෙ රජො.

6493. මයූරගීවසඞ්කාසා තුලඵස්සසමූපමා,
තිණානි නාතිවත්තන්ති සමන්තා චතුරඞ්ගුලා.

6494. අම්බා ජම්බූ කපිත්ථා ච නිවෙ පක්කා උදුම්බරා,
පරිභොගෙහි රුක්ඛෙහි වනං තං රතිවඩ්ඪනං.

6495. වෙළුරියවණ්ණූපනිභං මධුගුම්බනිසෙවිතං,
සුචිං සුගන්ධං සලිලං ආපො තත්ථපි සන්දති.

6496. තස්සාවිදූරෙ පොක්ඛරණී භූමිභාගෙ මනොරමෙ,
පදුමුප්පලසඤ්ඡන්නා දෙවානමිව නන්දනෙ.

6497. තීණි උප්පලජාතානි තස්මිං සරසි බ්‍රාහ්මණ,
විචිත්‍ර නීලානෙකානී සෙතා ලොහිතකානි ච.

6498. බොමා ච තත්ථ පදුමා සෙතසොගන්ධිකෙහි ච,
කලම්බකෙහි[1] සඤ්ඡන්නා මුවලිඤ්ඤෙ නාම සො සරො.

6499. අථෙත්ථ පදුමා චුල්ලා අපරියන්තාව[2] දිස්සරෙ,
ගීමිනා හෙමන්තිකා චුල්ලා ජණුත්තගසාඋපත්ථරා.

6500. සුරභී සම්පවායන්ති විචිත්‍රා පුප්ඵසණ්ඨිතා,
භමරා පුප්ඵගන්ධෙන සමන්තාමභිනාදිතා.

6501. අථෙත්ථ උදකන්තසම්ං රුක්ඛා තිට්ඨන්ති බ්‍රාහ්මණ,
කදම්බා පාටලි චුල්ලා කොවිළාරා ච පුප්ඵිතා.

6502. අඩෙකාලා කච්චිකාරා ච පාරිජ්ඣුඤ්ඤ ච පුප්ඵිතා,
වාරණසායනා රුක්ඛා මුවලින්දමභිතො[3] සරං,

6503. සිරිසා සෙතපාරිසා සාධු වායන්ති පදමකා,
නිග්ගුණ්ඩී සිරිනිග්ගුණ්ඩී අසනා වෙත්ථ පුප්ඵිතා.

---

1. කලම්බනෙහි – මජ්ඣං.
2. පරියන්තාව – මජ්ඣං.
3. මුහතො – මජ්ඣං. ව්.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6491. (එරජ එහි) තවුස්වෙස් ද පලවැළ නෙළන අකුස්ස ද ගිනි පුදන සැන්ද ද දළමඩුලු ද ධරනුයෙ අදුන්දිවිසම් හඳනුයෙ බිමැ (පත් ඇතිරියෙහි) සයන කෙරෙයි, ගිනිදෙවියා නමදී.

6492. (එ වෙනෙහි) සිත්කලු බිම්පෙදෙස්හි පැතිර සිටි හෙළ-ගිරිතිල්ල මල් ඇති බිම භීතණයෙන් නිල්වන් වූයෙ යැ. එ බිමැ ධූලි නො නැහෙයි.

6493. මොනරකර බඳු වූ හිඹුල්පුළුන් පහස් සම උපමා ඇති තෘණයෝ හාත්පස්හි සතරහුල් ඉක්ම නො වැඩෙති.

6494. අඹ දඹ ගිවුලු ද මිටිරුක්හි විලිකුන් දිඹුල් ද ඇත. (නොයෙක් මල්පලයෙන් සැදි) පරිභොග වෘක්ෂයෙන් එ වන ඇලුම් වඩයි.

6495. මස්කැලන් විසිෑ නිති සෙවුනාලද වෙරළුමිණි වන් පැහැ ඇති පිරිසුදු සුවඳ සිලිල් ඇති (කඳුරැලියෙන් බස්නා) දියදහර එ වනළැව්හි ගළායෙයි.

6496. එයට නුදුරෙහි මනරම් බිම්පෙදෙසෙකැ දෙවියන්ගේ නඳුනුයනෙහි මෙන් පියුමුපුලින් සැදි පොකුණෙක් ඇත.

6497. බමුණ, එ සිවුරැස් පොකුණෙහි තුන් උපුල්ජාතියක් ඇත. **එක් ජාතියක් නිල්පැහැ** වෙයි, **එක්** ජාතියක් සුදුපැහැ වෙයි, **එක් ජාතියක්** ලේපැහැ වෙයි, එ පොකුණ විසිතුරු යැ.

6498. බමුණ, ඒ වනළැහැබහි විලෙකුදු ඇත.* ඒ විලැ හෙළපියුම්හු හෙළ පිළී අතුළ තැන් වැනියහ. හෙළුපුලින් හා හෙල්මැල්ලෙන් ද දියකුරයෙන් ද ගැවැසුණ යැ. එ විල මුවලින්ද නමැ.

6499. තවද ඒ මුදලිඳු විල්හි පිපි පියුම්හු කෙළවර නැත්තවුන් මෙන් පෙනෙන්නාහ. ගිමන් හිමත් සෘතුයෙහි වූ පිපි පියුම්හු දණ පමණ දියෙහි පැතිර සිටිකි.

6500. විසිතුරු මල්පතර සුවඳ පතුරුවයි. බමරු මල්ගඳින් හාත්පසැ අභිනාද කෙරෙති.

6501. තවද බමුණ, ඒ විල්දිය කෙළවර වෘක්ෂයෝ පවතිත්, සුපිපි කොළොම් රුක් යැ පළොල් රුක් යැ පිපි කොබලිල රුක් යැ.

6502. අඟුණ රුක් යැ වැල්කිණිහිරි යැ කරගස් යැ එරබදු යැ නාරුක් යැ යන මෙ රුක් මුදලිඳු විල් වට පිපී සිටි.

6503. මහරි යැ හෙළපළු යැ පියුම්ගස් යැ යන මෙ රුක් මනා සුවඳ හමයි, මහනික ද සුළුනික ද පියාරුක් ද එහි පිපි වන සිටී.

---

* මෙ පාඨය මුද්‍රිත අටුවාවෙහි නැත. වෙසතුරුද සන්නයෙහි ඇත. 'බ්‍රාහ්මණ එසේ සරොපි අස්ථි' යනු පාඨයි.

6504. පංගුරා වකුලා සාලා[1] සොභඤ්ජනා ච පුප්ඵිතා,
කෙතකා කණිකාරා ච කණවෙරා ච පුප්ඵිතා.

6505. අජ්ජුනා අජ්ජුකණ්ණා ච මහානාමා ච පුප්ඵිතා,
සම්පුප්ඵිතග්ගා[2] තිට්ඨන්ති පජ්ජලන්තෙව කිංසුකා.

6506. සෙතපණ්ණී[3] සත්තපණ්ණා කදලියො කුසුම්භරා,
ධනුතක්කාරි පුප්ඵෙහි සිංසපාවරණෙහි[4] ච.

6507. අවජ්ජිවා සබලා රුක්ඛා සල්ලකියො ච පුප්ඵිතා,
සෙතගෙරු ච තගරා මංසිකුට්ඨා කුලාවරා.

6508. දහරා ච රුක්ඛා වුද්ධා ච අකුටිලා චෙත්ථ පුප්ඵිතා,
අස්සමං උභතො ඨන්ති අග්‍යාගාරං සමන්තතො.

6509. අථෙත්ථ උදකන්තස්මිං බහුජාතො එජ්ජණිකො,
මුග්ගතියො කරතියො සෙවාලසිංසකං බහූ.

6510. උඤ්ඤපවන්තං[5] උල්ලුළිතං මක්ඛිකා හිංගුජාලකා,
දසීමකචකො[6] චෙත්ථ බහූ නීචෙකලම්බකා.

6511. එළම්බරකසඤ්ඡන්නා රුක්ඛා තිට්ඨන්ති බ්‍රාහ්මණ,
සත්තාහං ධාරියමානානං ගන්ධො තෙසං න ජීජ්ජති.

6512. උභතො සරං මුචලින්දං පුප්ඵා තිට්ඨන්ති සොභනා,[7]
ඉන්දීවරෙහි සඤ්ඡන්නං වනං තං උපසොභිතං.[8]
අඩ්ඩමාසං ධාරියමානානං ගන්ධො තෙසං න ජීජ්ජති,

6513. නිලපුප්ඵී සෙතවාරී පුප්ඵිතා ගිරිකණ්ණිකා;
කටෙරුකෙහි[9] සඤ්ඡන්නං වනං තං තුලසීහි ච.

6514. සද්දම්මතෙව ගන්ධෙන පුප්ඵසාඛාහි තං වනං,
භමරා පුප්ඵගන්ධෙන සමන්තාමඟිනාදිතා.

---

1. පංකුලා බහුලා සෙලා – මජසං, පංකුරා – ස්‍යා.
2. සුප්‍රප්ඵිතග්ගා – මජසං.
3. සෙතවණ්ණ – මජසං.
4. පාවරණෙහි – මජසං. සී. ස්‍යා.
5. උද්ධාපවත්තං – ස්‍යා. වි.
6. දසීමකුඤ්ජකො – මජසං.
7. නාගසො – මජසං. ස්‍යා.
8. සොභති – මජසං.
9. කලෙරුකෙහි – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6504. පහුරු යැ මුහුළු යැ සල් යැ මුරුංගා යැ යන මෙ රුක් පිපී සිටී. දුනුකේගස් ද කිණිහිරිගස් ද කණේරුගස් ද පිපි වන සිටී.

6505. මහකුඹුක් ද සුළුකුඹුක් ද මහළක් ද පිපි වන සිටියි, මොනොවට පිපි අග ඇති කැලරුක්හු දිලියෙන අහුරු මෙන් සිටිති.

6506. ඇත්දෙමට යැ සත්පත් (රුක්අත්තන) යැ කඳල යැ වනුක් යැ දුනුවලලා හා තිටිභ යැ යන රුක්මලින් ද ඇටවර හා වරණ රුකින් ද එ වන හොබී.

6507. අසුගස් ද තෙලඹු රුක් ද හින්සල් රුක් ද පිපි වන සිටියි. හෙළවසුරුක් ද තුවරලා ද මැසිගස් ද උපුල්කොළ ද කුලුවරගස් ද ඇත.

6508. එ වෙනෙහි සෘජු වූ ද පිපියා වූ ද තරුණ රුක් ද මහලු රුක් ද අසපුව දෙපසැ ද ගිනිහල්ගෙය සිසාරා ද සිටී.

6509. තවද එ විල්හි උදකාන්තයෙහි බහුල වැ හටගත් දමුණු (දඹල) ද ඇත. සිහින්මුහු ද මහමෑ ද කටුකොහොවිලද බෙහෙවැ.

6510. (එ විල) මියර ඇතියෙ යැ. වාතයෙන් අලළන ලද්දෙ යැ. මීමැස්සන් නද දෙන මල්පිපි හුහුගස් හා රත්කරවිගස් ඇතියෙ යැ. සුළු අංගෙන්ද මහඅංගෙන්ද හුරුකලන්ද රුක් මෙහි බෙහෙවැ.

6511. බමුණ, හෙළ කලවැලින් ගැවැසිගත් වෘක්ෂයෝ සිටිති. සන්දවසක් මුළුල්ලෙහි ධරනුලබන ඒ (දසී මකචකාදී) කුසුමයන්ගේ සුවඳ නො සිඳෙයි.

6512. මුදලිදු විල් දෙපසැ හොබනා කුසුම් පවති. එරහැදි රුකින් සැදී එ වන හොබනෙ යැ. අඩමසක් මුළුල්ලෙහි ධරනු ලබන ඒ එරහැදි ආදි කුසුමයන්ගේ සුවඳ නො සිඳෙයි.

6513. (එහි) පිපියා වූ දියමෙරලිය සෙතවාරි නිල්කටරොළු ඇත. එ වනය කටෙරුකයෙන් හා තලාගසින් වැසුණෙ යැ.

6514. එ වනය මල් අත්තෙන් පවත්නා ගඳින් (පැමිණි දනන්) මද දනවා මැ යි. මල්ගඳින් හෘත්පසැ නද දෙන බඹරු වෙති.

6515. තීණිකක්ඛාරුජාතානි[1] තස්මිං සරසි බ්‍රාහ්මණ,
කුම්භමත්තානි චෙකානි මුරජමත්තානි[2] තා උභො.

6516. අථෙත්ථ සාසපො බහුකො[3] නාදියො[4] හරිතායුතො,
අසී තාලාව තිට්ඨන්ති ඡෙජ්ජා ඉන්දීවරා බහූ.

6517. අපෙළාටා සුරියවලලී ච කාළියා[5] මධුගන්ධියා,
අසොකා මුදයන්ති ච වලලිභො බුද්දපුප්ඵියො.

6518. කොරණ්ඩකා අනොජා ච පුප්ඵිතා නාගවල්ලිකා,
රුක්ඛමාරුය්හ තිට්ඨන්ති ඵුල්ලා කිංසුකවල්ලියො.

6519. කටෙරුභා ච වාසන්ති යූථිකා[6] මධුගන්ධියො,
නීලියා සුමනා භණ්ඩී සොභති පදුමුත්තරො.

6520. පාටලී සමුද්දකප්පාසි කණිකාරා ච පුප්ඵිතා,
හෙමජාලාව දිස්සන්ති රුචිරා අගගිසිඛූපමා.

6521. යානි කානි[7] ච පුප්ඵානි ථලජානුදකානි ච,
සබ්බානි තත්ථ දිස්සන්ති එවං රම්මො මහොදධි.

6522. අථස්සා පොක්ඛරණියා පහූතා වාරිගොචරා,
රොහිතා නළපී[8] සිඞ්ගු කුම්භීලා මකරා සුසු.

6523. මධූ ච මධුලට්ඨී ච තාලීසා ච පියඞ්ගුකා,
උන්නකා භද්දමුත්තා ච[9] සතපුප්ඵා[10] ච ලොලුපා.

6524. සුරභී ච රුක්ඛා තගරා[11] පහූතා තුඞ්ගවණ්ටකා,[12]
පද්මකා නරද කුට්ඨා ක්ඩාමකා ච හරෙණුකා.

6525. භලිද්දකා ගන්ධසිලා හිරිවෙරා ච ගුග්ගුලා,
විභෙදිකා[13] චොරකා කුට්ඨා කප්පූරා ච කලිඞ්ගු ච.[14]

6526. අථෙත්ථ සීහව්‍යග්ඝා ච පුරිසාලූ ච හත්ථියො,[15]
එණෙය්‍යා පසද චෙව රොහිච්චා සරභා මිගා.

---

1. කණ්ණරු – මජසං.
2. මුමුමත්තානි – මජසං. මුරමත්තානි – ස්‍යා.
3. බහුසො – මජසං. වි.
4. නාරියො – මජසං.
5. කොළියා – මජසං.
6. යොධිකා – මජසං.
7. තානිච – මජසං.
8. නළපෙ – මජසං.
9. කුටණ්ඩජාභද්දමුට්ඨා – මජසං. කුද්දජා – ස්‍යා.
10. සෙතපුප්ඵා – මජසං. සත්ත – මජසං.ස්‍යා.
11. සුරභිමරුකඛ තග්ගරා – මජසං. සුරභිමරු තගරා – ස්‍යා.
12. බහුකා තුඞ්ගවල්ලිකා – මජසං. ස්‍යා.
13. විභෙදකා – මජසං.
14. කලිංභුකා – මජසං.
15. හත්ථයො – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6515. බමුණ, ඒ විල් අසැ තුන් කැකිරි ජාතියෙකැ. එක් ජාතියක් කළ පමණ වෙයි. දෙ ජාතියක් මිහිතුබෙර පමණ වෙයි.

6516. තවද ඒ අසපු අබියෙස අබ ද හරිතායුත යැ නාදිය යැ යන ලුහුණු ද බෙහෙව. ඉදිරුක්හු තල්රුක් මෙන් සිටිති. මීටින් සිඳැලියැහැකි රන් එරහැදි බෙහෙව.

6517. ගැහැවි සමණවැල් ද හිරිවැල් ද කැලිය ද මිහිගෙඳි ද හෝපලු ද නීතු ද ලබුකොමඩු ද හිඟිනි රුක් ද,

6518. කටුකරඬු ද අනොජා ද පිපී සිටියහ. නාලිය ද හිරමසු වැල් ද ගස් නැඟ පිපිවන මැ සිටිති.

6519. රන්කටුකරඬු ද වැකොඳ ද විනිගස් ද ඉද්ද ද වැල්-සමන් ද යොහොඹු ද ගඳඇඹුලු ද යන මේ රුකින් එ වන හොබී.

6520. පළොල් ද සුරිදුගස් ද කිණිහිරිගස් ද පිපියාහු රැසිරු ගිනිසිළු වැන්නහ. එළාලු රන්දැල් මෙන් පැනෙති.

6521. දියැ ගොඩැ උපදනා යම් කිසි කුසුමයෙක් ඇද්ද එහැම කුසුම් ඒ විල්හි පැනෙති. මහදියකඳ දරන මුදලිදු විල මෙසේ රමණී වෙයි.

6522. තවද ඒ මුදලිදු විල්හි දිය ගොදුරු කොට ඇති, රෙහෙමස්හු ද ඉස්සෝ ද සුතුමස්හු ද කිඹුලෝ ද මෝරු ද සුංසුමාරයෝ ද බොහෝ වෙති.

6523. මී ද වැල්මී ද තලිස්පතුරු ද පුවඟ ද කළුනීර ද වම්මුතු ද සියපුප් ද ලොලුප ද,

6524. තුවරලා යැ තුඩුවණ්ණක යැ පද්මක යැ නරඳ යැ කුටඨ යැ කඩාමක යැ හරෙණුක යැ යන සුවඳ රුක් බෙහෙව.

6525. දෙ කසා ද සිරියෙල් ද හිරිවේරිය ද ගුගුල් ද විහෙදිකා ද සොරමල ද තකුල් ද කපුරු ද කිලිහු ද බෙහෙව.

6526. තවද ඒ වෙනෙහි සිංහයෝ ද ව්‍යාඝ්‍රයෝ ද වෙළෙඹ මුව පක්ෂීහු ද ඇත්හු ද එණි මුවන් හා පසඳ මුවෝ ද රෙහෙ මුවන් හා සරහ මුවෝ ද,

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6527. කොට්ඨුසුණා සුලොපී ච[1] තුලියා නළසන්නිභා,
චමරී චලනී ලඞ්ඝී[2] ඣාපිතා මක්කටා පිවු,

6528. කක්කටා කතමායා ච[3] ඉක්කා ගොණසිරා බහූ,
බග්ගා වරාහා නකුලා කාළකෙත්ථ බහූතසො.

6529. මහිසා සොණා සිගාලා ච පම්පකා ච සමන්තතො,
ආකුච්චා පචලාකා ච චිත්‍රකා චාපි දීපියො.

6530. පෙලකා ච විසාසාද සීහා කොකනිසාතකා,
අට්ඨපාද ච මොරා ච භස්සරා ච කුකුත්ථකා[4],

6531. වඞ්කොරා කුක්කුටා නාගා අඤ්ඤමඤ්ඤං පකූජිනො,
බකා බලාකා නජ්ජුහා දින්දිභා කුඤ්ජවාදිකා.

6532. ව්‍යග්ඝිනසා ලොහපිට්ඨා පම්පකා[5] ජීවජීවකා,
කපිඤ්ජරා තිත්තිරායො කුලාවා පටිකුත්තකා,

6533. මඤ්ඤලකා චෙලකෙදූ භණ්ඩුතිත්තිරනාමකා,
වෙලාබකා පිඩගුලායො ගොධකා[6] අඞ්ගභෙතුකා,

6534. කරවියා ච[7] වග්ගා ච උහුඩ්කාරා ච කුක්කුභා,
නානාදිජගණාකිණ්ණං නානාසරනිකුජ්ජිතං.

6535. අථෙත්ථ සකුණා සන්නී නීලකා[8] මඤ්ජුභාණකා,
මොදන්නී සහ භරියාහි අඤ්ඤමඤ්ඤං පකූජිනො.

6536. අථෙත්ථ සකුණා සන්නී දිජා මඤ්ජුස්සරා සිතා,
සෙතච්ඡිකූටා[9] භද්‍රක්ඛා අණ්ඩජා චිත්‍රපෙක්ඛුණා.[10]

6537. අථෙත්ථ සකුණා සන්නී දිජාමඤ්ජුස්සරා සිතා,
සිඛණ්ඩිනීලගීවාහි අඤ්ඤමඤ්ඤං පකූජිනො.

6538. කුකුත්ථකා[11] කුලීරකා කොට්ඨා පොක්ඛරසාතකා,[12]
කාළාමෙය්‍යා බලීයක්ඛා[13] කදම්ඛා සුවසාළිකා.

---

1. සුණොපිච – මජසං. ස්‍යා. වි.
2. යාසි – මජසං.
3. කටමායා.
4. කුකුටඨකා – මජසං. ස්‍යා.
5. චම්පකා – මජසං. වි.
6. ගොටකා – මජසං.
7. කරවිකා ච – මජසං.
8. සාළිකා – මජසං.
9. සෙතච්ඡිකූට – මජසං.
10. පක්ඛණ – මජසං.
11. කුකුටඨකා – මජසං. ස්‍යා.
12. පොක්ඛරසාටකා – මජසං. ස්‍යා.
13. බලයක්ඛා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6527. කැනහිල්ලු ද කොක්නහවෝ ද ගිජුනහවෝ ද පියා බළල්ලු ද රුක්නහවෝ ද සෙමරහු ද තිත්මුවෝ ද වාමූවෝ ද මහකළුවදුරෝ ද හැලිවදුරෝ ද රිලාවදුරෝ ද,

6528. ගෝණහු ද හඟමොරලියෝ ද වලස්සු ද දඩගෝණහු ද බොහෝ වෙති. කඟවෙහෙණහු ද හූරෝ ද මුගටියෝ ද කළවැද්දෝ ද ඒ විල්තෙර බොහෝ වෙති.

6529. මිහිවෝ ද රුක්නහවෝ ද සිවල්හු ද උණහපුළුවෝ ද හාක්පසැ ඇවිදුනා ගොයි ද ගජකුඹුවෝ ද විත්‍රකයෝ ද දිවියෝ ද මෙහි බොහෝ වෙති.

6530. සාවෝ ද සිනිඹිල්ලෝ ද සිංහයෝ ද කොක්නහනුවෝ ද සරහමුවෝ ද රනමොනරු ද ශ්වේතහංසයෝ ද මහසිනිඹිල්ලෝ ද,

6531. සුවර ලිහිණියෝ ද වනසැවුලෝ ද ඇත්තු ද ඔවුනොවුන්ට රැව්පිළිරැව් දෙන කණකොක්හු ද හෙළකොක්හු ද බස්සෝ ද කිරල්හු ද කොස්ලිහිණියෝ ද දියකාවෝ ද,

6532. උකුස්සෝ ද රත්කොරළුවෝ ද හුණපුපුළුවෝ ද 'ජීව, ජීව' යි හඬන ජීවංජීවක ලිහිණියෝ ද කපිඤ්ජර නම් ලිහිණියෝ ද තිත්වටුවෝ ද වඩුකුරුල්ලෝ ද බටු කුරුල්ලෝ ද,

6533. මඤ්ඤකයෝ ද සලපිඤ්ඡෝ ද මහසැළලිහිණියෝ ද තිත්වටුවෝ ද දනවුලිහිණියෝ ද පිඟුහැලි ලිහිණියෝ ද ගෝලිහිණියෝ ද අඟුහැලි ලිහිණියෝ ද,

6534. කරවී ලිහිණියෝ ද වැසිලිහිණියෝ ද මහමුහුණෝ ද ඇටිකුකුළෝ ද ඒ වෙනෙහි බොහෝ වෙති. ඒ වනය නොයෙක් සියොත්ගණ විසින් ගැවැසිගත්තෙ යැ. නොයෙක් සරින් කුල්නා ලද්දෙ යැ.

6535. තවද ඒ වෙනෙහි මියුරු හඬ ඇති විත්‍රරාජිශකපත්‍ර ලිහිණියෝ ඇත. ඔහු ඔවුනොවුනට රැව්දෙමින් ලිහිණි දෙනුන් හා සමග කූටු වෙති.

6536. තවද එහි ලිහිණි කෙනෙක් ඇත. ඒ ලිහිණියෝ නිබඳ මියුරු හඬ ඇතියහ. සුදුපැහැ නෙත්කණ ඇතියහ. සොඳුරු ඇස් ඇතියහ. බිජුවටින් ජනිතයහ. විසිතුරු පත් ඇතියහ.

6537. තවද එහි ලිහිණියෝ ඇත. ඔහු නිබඳ මියුරු සර ඇතියහ. සිළු ඇතියහ. නිල්ගල ඇතියහ. ඔවුනොවුනට රැව් දෙන්නාහ.

6538. කළු තලල් ලිහිණියෝ ද කුකුළෝ ද කොටස් සකුණියෝ ද තල්රෙහෙරහු ද කලලොහොල්ලෝ ද කළුහොල ලිහිණියෝ ද දියකෙරළියෝ ද ගිරවු ද සැළලිහිණියෝ ද,

6539. හලිද්දා ලොහිතා සෙතා අථෙත්ථ නළකා බහූ,
වාරණා හිඞ්ගුරාජා ච කදම්බා සුවිකොකිලා,

6540. උක්කුසා කුරරා[1] හංසා ආටා පරිවදනතිකා,
පාකහංසා[2] අතිබලා නජ්ජූහා ජීවජීවකා,

6541. පාරෙවටා රවිහංසා චක්කවාකා[3] නදීවරා,
වාරණාභිරුදා රම්මා උභො කාලූපකූජිනො.

6542. අථෙත්ථ සකුණා සන්ති නානාවණ්ණා බහූ දිජා,
මොදන්ති සහ භරියාහි අඤ්ඤමඤ්ඤං පකූජිනො.

6543. අථෙත්ථ සකුණා සන්ති නානාවණ්ණා බහූ දිජා,
සබ්බෙ[4] මඤ්ජූනි කූජන්ති මුවලිඳුමහිතො[5] සරං.

6544. අථෙත්ථ සකුණ සන්ති කරවීයා නාම තෙ දිජා,
මොදන්ති සහ භරියාහි අඤ්ඤමඤ්ඤං පකූජිනො.

6545. අථෙත්ථ සකුණා සන්ති කරවීයා නාම තෙ දිජා,
සබ්බෙ මඤ්ජූනි කූජන්ති මුවලිඳුමහිතො සරං.

6546. එණෙය්‍යපසදකිණ්ණං නාගසංසෙවිතං වනං,
නානාලතාහි සඤ්ඡන්නා කදලීමිගසෙවිතං.

6547. අථෙත්ථ සාසපො බහුකො[6] නීවාරො වරකො බහු,
සාලී අකට්ඨපාකො ච උප්පජ්ජ තත්ථ අනප්පකො.

6548. අයං එකපදී එති උජුං ගච්ඡති අඤ්ඤමං,
බුද්ධං පිපාසං අරතිං තත්ථ පත්තා න විඳති:
යත්ථ වෙස්සන්තරො රාජා සහ පුත්තෙහි සම්මති.

6549. ධාරෙන්තා බ්‍රාහ්මණං වණ්ණං ආසදඤ්ච මසං ජටං,
වම්මිවාසී ඡමා සෙති ජාතවෙදං නමස්සති.

6550. ඉදං සුත්වා බ්‍රහ්මබන්ධු ඉසිං කත්වා පදක්ඛිණං,
උදග්ගචිත්තො පක්කාමි යත්ථ වෙස්සන්තරො අහූ.

මහාවනවණ්ණනා නිට්ඨිතා.

---

1. කුරුරා – මජ්ඣං. සී්‍යා.
2. චාකහංසා – සී්‍යා
3. චකකවක්කා – මජ්ඣං. චාකවාකා – සී්‍යා.
4. සබ්බෙ – මජ්ඣං.
5. රුචලිඳුමුහතො – මජ්ඣං.
6. සාමා බහුකා – මජ්ඣං. සී්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6539. තවද එහි කහ කුරුල්ලෝ ද තඹතොලුවෝ ද සුදු ලිහිණියෝ ද නළක ලිහිණියෝ ද ඇත්ගිපුලිහිණියෝ ද හිංගුරාජයෝ ද මහදියකෙරළියෝ ද සමග වැ සරන ගිරා කොවුල්හු ද,

6540. කළු උකුස්සෝ ද හෙළ උකුස්සෝ ද හංසයෝ ද සැදිමුව ලිහිණියෝ ද පරිවදන්තික ලිහිණියෝ ද පාකහංසයෝ ද අතිබල ලිහිණියෝ ද වලිකුකුළෝ ද ජීවජීවකයෝ ද,

6541. පරෙවියෝ ද හැල්බෝ ද නදියෙහි සරන සක්වාවෝ ද දෙවරුයෙහි මැ රැව් දෙන මනා හඬ ඇති ඇත්ගිපුලිහිණියෝ ද එ විල්හි බොහෝ වෙති.

6542. මෙහි නොයෙක් පැහැ ඇති බොහෝ පක්ෂීහු බිරියන් සමග කුල්නාහු ප්‍රීතවෙති.

6543. මෙහි මුදලිඳු (මුවලින්ද) විල අවට නොයෙක් පැහැ ඇති බොහෝ පක්ෂීහු මියුරු සරින් කුල්නාහ.

6544. මෙහි කුරව් කෙවිල්ලෝ නම් පක්ෂීහු බිරියන් සමග කුල්නාහු ප්‍රීත වෙති.

6545. මෙහි මුදලිඳු (මුවලින්ද) විල අවට කුරව්කෙවිල්ලෝ නම් පක්ෂීහු මියුරු සරින් කුල්නාහු ප්‍රීත වෙති.

6546. එ වනය ඒණිමුවන් හා පසඳමුවන් විසින් ගැවැසි ගත්තෙ යැ, ඇතුන් විසින් සෙවුනාලද්දේ යැ, නන්ලියෙන් වැසුණෙ යැ, කෙහෙල් මුවන් විසින් සෙවුනාලද්දෙ යැ.

6547. තවද එ වෙනෙහි අබ බෙහෙව. හුරුහැල් ද වරා-සොර ද බෙහෙව. නො සාපු තන්හි පැසුණු (සයංජාත) ගැලුදු වනමුල් වනඵල ද එ වෙනෙහි නො මඳ වෙති.

6548. මේ එක්පිය මහ අප සිවි තැන් ධලා එයි. අසපුවට ඉදුරා යෙයි. යම් අසපුයෙකැ වෙසතුරු මහරජ අඹුදරුවන් සමග වාස කෙරේ ද එ අසපුවට පැමිණියෙ සා පවස් උකටලි නො ලැබෙයි.

6549. හෙ තවුස්වෙස් ද (මල්පල නෙලන) අකුස්ස ද ගිනි පුදන සැන්ද ද දළමඩුලු ද ධරනුයෙ අඳුන්දිවිසම් හඳනෙ බිමැ (පත් ඇතිරියෙහි) හොවී. ගිනිදෙව්යා නමදී යි.

6550. එ බමුණු මෙ වදන් අසා තවුසා පැදකුණු කොට ඔද වැඩි සිතැතියෙ යම් තැනෙකැ වෙසතුරු මහරජ වී ද එ තැනට පිටත් වැ ගියේ.

මහ වන වැනුම් නිමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6551. උට්ඨෙහි ජාලි පතිතිට්ඨ පොරාණං විය දිස්සති,
බ්‍රාහ්මණං විය පස්සාමි නන්දියො මාභිකීරරෙ.

6552. අහංපි තාත පස්සාමි යො සො බ්‍රහ්මාව දිස්සති,[1]
අත්ථිකො[2] විය ආයාති අතිථී නො භවිස්සති.

6553. කච්චින්නු භොතො කුසලං කච්චි භොතො අනාමයං,
කච්චි උඤ්ඤෙන යාපෙථ කච්චි මූලඵලා බහු.

6554. කච්චි ඩංසා ච මකසා ච අප්පමෙව සිරිංසපා,[3]
වනෙ වාළමිගාකිණ්ණෙ කච්චි හිංසා න විජ්ජති.

6555. කුසලඤ්චෙව නො බ්‍රහ්මෙ අථො බ්‍රහ්මෙ අනාමයං,
අථො උඤ්ඤෙන යාපෙම අථො මූලඵලා බහු.

6556. අථො ඩංසා ච මකසා ච අප්පමෙව සිරිංසපා,
වනෙ වාළමිගාකිණ්ණෙ හිංසා අම්හං[4] න විජ්ජති.

6557. සත්ත නො මාසෙ වසතං අරඤ්ඤෙ ජීවසොකිනං,
ඉදම්පි පඨමං පස්සාම බ්‍රාහ්මණං දෙවවණ්ණිනං;
ආදය බෙළුවං දණ්ඩං අග්ගිහුත්තං කමණ්ඩලුං.

6558. ස්වාගතං තෙ මහාබ්‍රහ්මෙ අථො තෙ අදුරාගතං,
අන්තො පවිස භද්දන්තෙ පාදෙ පක්ඛාලයස්සු තෙ

6559. තින්දුකානි පියාලානි මධුකෙ කාසුමාරියො,
ඵලානි බුද්දකප්පානි භුඤ්ජ බ්‍රහ්මෙ වරං වරං,

6560. ඉදම්පි පානීයං සීතං ආහතං ගිරිගබ්භරා,
තතො පිව මහාබ්‍රහ්මෙ සචෙ ත්වං අභිකඞ්ඛසි.

6561. අථ ත්වං කෙන වණ්ණෙන කෙන වා පන හෙතුනා,
අනුප්පත්තො බ්‍රහාරඤ්ඤං තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

6562. යථා වාරිවහො පූරො සබ්බකාලෙ න ඛීයති,
එවං තං යාචිතාගඤ්ඡිං[5] පුත්තෙ මෙ දෙහි යාචිතො.

---

1. පදිස්සති – මජ්ජසං.
2. අදධිකො – මජ්ජසං. ස්‍යා. වි.
3. සරිසපා – මජ්ජසං.
4. මයහං – මජ්ජසං.
5. යාචිකා ගඤ්ඡිං – මජ්ජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6551. දැලිසිර නැඟී සිටු, පෙරගමන් යා. පෙර (ජයතුරා නුවර යදියකු මෙන්) දසුනක් පැනෙයි. බමුණකු මෙන් දක්මී. සොම්නස්හු මා සිත පැතිරෙති.

6552. පියාණෙනි, මම ද දක්මි. යමෙක් බමුණකු මෙන් පැනේ ද හෙ ඉලියනුවකු සෙයින් එයි. හේ අපට අමුත්තෙක් වන්නෙ යි.

6553. කිම භවත්හට රොග නැද්ද? කිම භවත්හට දුක් නැද්ද? කිම වනමුල් වනපෙලෙන් යැපෙයි ද? කිම අලපල බොහෝ ඇද්ද?

6554. කිම මැසිමදුරුවෝ ද දීර්ඝජාති සර්පයෝ ද අල්ප මැ වෙත් ද? සැඩමුවන් ගැවැසිගත් වෙනෙහි කිම (උන්ගෙන් වන) හිංසා නැද්ද?

6555. බමුණ, අපට රොග නැත් මැ යැ. තවද බමුණ දුකුදු නැත. වනමුල් වනපලයෙන් යැපෙමි. අලපල බොහෝ ඇත.

6556. තවද මැසිමදුරුවෝ ද උරගජාතීහු ද අල්ප මැ වෙති. වල්මුවන් විසින් ගැවැසිගත් වෙනෙහි අපට උන්ගෙන් හිංසා නො පැනෙයි.

6557. සත්මසක් කල් අරනෙහි වසන ජීවඟොකී අප වසන තැනට බෙලිපැහැ හුණදඬුව ද ගිනිපුදන කෙණෙස්ස ද කමඬලාව ද ගෙන ආ දෙවියන් විසින් වනන ලද මෙ බමුණහු පළමු කොට දක්මහ.

6558. බමුණ, තොපගේ මනා ඊමෙකැ, තවද තොපගේ නො මනා ඊමෙක් නො වෙයි. භවත, තොපගේ පාසහළ ධොවනය කරව. පන්සල ඇතුළට පිවිසෙව.

6559. තිඹිරි යැ පියල් යැ මිහි යැ කටුඵරමිණිය යැ යන ඵලයෝ ද දඬුවෙල්බැ මී ද ඇත. බමුණ උතුම් උතුම් දය වළඳව.

6560. මෙ කළෙහි පැනුදු සිහිල, ගල්කුසින් බට හොයින් අළුයෙ යැ, බමුණ, ඉදින් තෙපි බියැටියවු නම් එයින් ගෙන බොව.

6561. තවද තෙපි කවර කරුණෙකින් හෝ කවර හෙතුයෙකින් හෝ මහවලට පැමිණියවු ද? මා විසින් පුළුවුස්නාලදහු එය මට කියව.

6562. යම්සේ (පස්මහනදියෙහි) පිරුණු දියකඳ හැම කල්හි නො ගෙවේ ද එවන් (නො ගෙවෙන සැදෑහැති) තොප අයදනට අයිමි. අයදනාලද තෙපි මට දෙදරුවන් දෙව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6563. දදමි න විකම්පාමි ඉස්සරො නය බ්‍රාහ්මණ,
පාතො ගතා රාජපුත්තී සායං උඤ්ඡාතො එහීති.[1]

6564. එකරත්තිං වසිත්වාන පාතො ගච්ඡසි බ්‍රාහ්මණ,
තස්සා නහාතෙ උපසාතෙ අථ නෙ මාලධාරිනෙ,

6565. එකරත්තිං වසිත්වාන පාතො ගච්ඡසි බ්‍රාහ්මණ,
නානාපුප්ඵෙහි සඤ්ඡන්නෙන නානාගන්ධවිභූසිතෙ;
නානාමූලඵලාකිණ්ණෙ ගච්ඡිස්සාදය[2] බ්‍රාහ්මණ.

6566. න වාසමභිරොචාමි ගමනං මය්හ රුච්චති,
අන්තරායොපි මෙ අස්ස ගච්ඡඤ්ඤෙව රථෙසභ.

6567. න හෙතා යාචයොගී නං අන්තරායස්ස කාරියා,[3]
ඉත්ථියො[4] මන්තං ජානන්ති සබ්බං ගණ්හන්ති වාමතො.

6568. සද්ධාය දනං දදතො මාසං අද්දක්ඛි[5] මාතරං,
අන්තරායම්පි සා කයිරා ගච්ඡඤ්ඤෙව රථෙසභ.

6569. ආමන්තයස්සු තෙ[6] පුත්තෙ මා තෙ මාතරමද්දසුං,
සද්ධාය දනං දදතො එවං පුඤ්ඤං පවඩ්ඪති.

6570. ආමන්තයස්සු තෙ පුත්තෙ මා තෙ මාතරමද්දසුං,
මාදිසස්ස ධනං දත්වා රාජ සග්ගං ගමිස්සසි.

6571. සචෙ ත්වං නිච්ඡසෙ දට්ඨුං මම භරියං පතිබ්බතං,
අය්‍යකස්සපි[7] දස්සෙහි ජාලිං කණ්හාජිනඤ්චුභො.

6572. ඉමෙ කුමාරෙ දිස්වාන මඤ්ජුකෙ පියභාණිනෙ,
පතීතො සුමනො විත්තො බහුං දස්සති තෙ ධනං.

6573. අච්ඡෙදනස්ස භායාමි රාජපුත්ත සුණොහි මෙ,
රාජා දණ්ඩාය මං දජ්ජා විත්කිණෙය්‍ය හනෙය්‍ය වා;
ජිනො ධනඤ්ච දසෙ ච ගාරය්හස්ස බ්‍රහ්මබන්ධුයා.

6574. ඉමෙ කුමාරෙ දිස්වාන මඤ්ජුකෙ පියභාණිනෙ,
ධම්මෙ ඨිතො මහාරාජා සිවීනං රට්ඨවඩ්ඪනො;
ලද්ධා පීතිසොමනස්සං බහුං දස්සති තෙ ධනං.

---

1. හොහිති – මජසං.
2. ගච්ඡසවාදය – මජසං.
3. කාරිකා – මජසං.
4. ඉත්ථිකා – මජසං.
5. මාසංඅදක්ඛි – මජසං.
6. වො – මජසං.
7. අය්‍යකස්සපි නොදෙහි – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6563. බමුණ (දෙදරුවන්) දෙමි. කම්පා නො වෙමි. සැබෑ වැ ගෙනයව. (කිවයුත්තෙක් ඇති.) රදු (පලවැළයට) උදය මැ ගියා. යවසැ අරනෙන් එයි.

6564. බමුණ, අද එක්රැයක් මෙහි වැසැ අලුයමැ යව. ඒ මද්‍රීය විසින් නහවන ලද මුදුන සිප සනහන ලද තවද මල්දම් පැළැඳි,

6565. නොයෙක් සුවඳ කුසුමින් සදනලද, නොයෙක් සුවඳ විලෙවුනින් සරසන ලද (මහ අහරට දුන්) නොයෙක් අලපලයෙන් යුතු දෙදරුවන් ගෙන යව.

6566. රජතුමනි, (මෙහි එක්රැයක්) විසීම නො රුස්නෙමි. ගමන් මැ මට රිසියෙයි. (මෙහි වීසුව) මට ලාභාන්තරාය ද වෙයි. එහෙයින් යන්නෙමි මැ යැ.

6567. තෙල මාගම්හු අයදමට නිසි දෝ වෙති. පුණ්‍යාන්තරාය ද ලාභාන්තරාය ද කෙරෙති. මායා මන්ත්‍ර දනිති. හැම අවැඩ හෙයින් ගනිති.

6568. සැදහැයෙන් දන් දෙනුවහු මොවුන් මව නො දක්ව. හෝ (මොවුන් දුටු නම්) දනට අන්තරාය ද කරන්නී යැ. එහෙයින් රජතුමනී, යන්නෙමි මැ යැ.

6569. තොප දෙදරුවන් කැඳව. ඒ දරුවෝ මව නහමක් දකිත්වා. මෙසේ සැදැහැයෙන් දන් දෙන්නාහට පින් වැඩෙයි.

6570. තොප දෙදරුවන් කැඳව, ඒ දරුවෝ මව නො දකිත්වා. මහරජතුමනි, මා වැන්නකුට පුත්‍රධනය දී දෙව්ලෝ යන්නවු යැ.

6571. ඉදින් තෙපි මට පතිනි වූ බිරිය දක්නට නො රිස්සහු නම් දලිසිරු කන්සිරු දෙදරුවන් මුත්නා (සඳමහරජ) හට හෝ දක්වවු.

6572. සිත්කලු වූ පිය තෙපුල් බණන ලමී දෙදරුවන් දැකැ ඔදවැඩි සොම්නස් වූ තුටු වූ මුත්නා රජ තොපට බොහෝ ධනය දෙන්නෙ යැ.

6573. (මා අතින් දරුවන්) පැහැරගැනුමට බියෙමි. රාජපුත්‍රය මබස් අසව. එරජ මා දඩුවමට ඇමැතියනට දෙන්නෙ හෝ යැ, රජ මා විකුණන්නෙ හෝ යැ, ඝාතන කරන්නෙ හෝ යැ. ධනය ද දාසයන් ද පිරිහුණෙමි බැමිණිය විසින් ගැරහියැයුතු වෙමි.

6574. සිත්කලු වූ ප්‍රිය තෙපුල් බණන මේ දෙදරුවන් දැක සිවිරට වඩන දහමෙහි සිටි මහරජ ප්‍රීති සොම්නස් ලැබැ තොපට බොහෝ ධනය දෙන්නේ යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6575. නාහං තම්පි කරිස්සාමි යං මං ත්වං අනුසාසසි,
දරකෙ ච අහං නෙස්සං බ්‍රාහ්මණියා පරිවාරකෙ,

6576. තතො කුමාරා බ්‍යථිතා සුත්වා ලුද්දස්ස භාසිතං,
තෙන තෙන පධාවිංසු ජාලිකණ්හාජිනා වුභො

6577. එහි තාත පියපුත්ත පූරෙථ මම පාරමිං,
හදයං මෙභිසිඤ්චථ කරොථ වචනං මම.

6578. යානනාවා ච මෙ හොථ අවලා භවසාගරෙ,
ජාතිපාරං තරිස්සාමි[1] සන්තාරෙස්සං[2] සදෙවකෙ.

6579. එහි අම්ම පියසීනි[3] පූරෙථ මම පාරමිං,[4]
හදයං මෙභිසිඤ්චථ කරොථ වචනං මම.

6580. යානනාවා ච මෙ හොථ අවලා භවසාගරෙ,
ජාතිපාරං තරිස්සාමි උද්ධරිස්සං සදෙවකෙ.

6581. තතො කුමාරෙ ආදය ජාලිං කණ්හාජිනක්ඛුභො,
බ්‍රාහ්මණස්ස අදා දනං සිවීනං රට්ඨවඩ්ඪනො.

6582. තතො කුමාරෙ ආදය ජාලිං කණ්හාජිනක්ඛුභො,
බ්‍රාහ්මණස්ස අදා වීතෙහා පුත්තකෙ දනමුත්තමං.

6583. තදසි යං භිංසනකං තදසි ලොමහංසනං,
යං කුමාරෙ පදිස්සාමිහි මෙදිනී සමකම්පථ.

6584. තදසි යං භිංසනකං තදසි ලොමහංසනං,
යං පඤ්ජලිකතො රාජා කුමාරෙ සුඛවඩ්ඪිතෙ;
බ්‍රාහ්මණස්ස අදා දනං සිවීනං රට්ඨවඩ්ඪනො.

6585. තතො සො බ්‍රාහ්මණො ලුද්දො ලතං දනෙහි ඡින්දිය,
ලතාය හත්ථෙ බන්ධිත්වා ලතාය අනුමජ්ජථ,[6]

6586. තතො සො රජ්ජුමාදය දණ්ඩඤ්චාදය බ්‍රාහ්මණො,
ආකොටයන්තා තෙ නෙති සිවිරාජස්ස පෙකඛතො.

6587. තතො කුමාරා පඝාමුං බ්‍රාහ්මණස්ස පමුඤ්චිය,
අස්සුපුණ්ණෙහි නෙත්තෙහි පිතරං සො උදික්ඛති.

---

1. කරිස්සාමි – මජයං.
2. සන්ධාරියං – මජයං.
3. ධිතා – මජයං. වී.
4. පියා මෙ දන පාරමී – මජයං. සාහා. වී.
5. වීතෙහා – මජයං.
6. අනුපජ්ජත – මජයං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6575. මහරජ තෙපි මට යමක් කියවු නම් එ ද නො කෙරෙමි. මම මේ දෙදරුවන් බැමිණියට දස මෙහෙයට ගෙන යෙමි.

6576. ඉක්බිති දැලිසිරු කන්සිරු දෙකුමරහු රුදුරු බමුණුහුගේ බස් අසා වෙවුළන්නාහු ඒ ඒ තන්හි දිවූහ.

6577. දරුව ප්‍රියපුත්‍රය, එව. මාගේ පැරැමී පුරව. මාගේ ළය තෙමවු. මාගේ තෙපුල් කරවු.

6578. බවසයුරෙහි මට නිසල වූ ගමන් නැවක් වව. දෑ සයුරෙහි එතෙරට තරණය කරනෙමි. දෙවියන් සහිත ලෝවැසියනුදු තරණය කරවන්නෙමි,

6579. දරුව, ප්‍රිය දියැණියෙනි, මාගේ දානපාරමිතා පුරව. මාගේ ළය තෙමව. මාගේ වචනය කරව.

6580. සසර සයුරෙහි මට නිසල ගමන් නැව වව. දෑ සයුරෙහි පරතෙරට යන්නෙමි. දෙවියන් සහිත ලෝකයා සසර සයුරෙන් නංඟාලන්නෙමි.

6581. ඉක්බිති සිවිරට වඩන වෙසතුරු මහරජ දැලිසිරු කන්සිරු දෙදරුවන් අත් ගෙන බමුණුහට දන් දින.

6582. ඉක්බිති දැලිසිරු කන්සිරු දෙදරුවන් ගෙන තුටු සිත් ඇත්තෙ දෙදරුවන් උතුම් දන් කොට බමුණුහට දින.

6583. යම් කලෙකැ දෙදරුවන් දුන් කල්හි මහපොළොව ප්‍රකම්පිත වූ ද එකල්හි යම් බිහිසුණු බවෙක් වී ද එසඳ ලොමුදහ ගැන්මෙක් වී.

6584. යම් කලෙකැ සිවිරට වඩන වෙසතුරු මහරජ කළ බැදිදිලි ඇති වැ සුවසේ වුසූ දෙදරුවන් බමුණුහට දන් දුන්නෙ ද එදවස් යම් බිහිසුණු බවෙක් වී ද එදවස් ලොමුදහගැන්මෙක් වී.

6585. ඉක්බිති එ රුදුරු බමුණු වැලක් දනින් සිඳැගෙනැ වැලින් දැත් බැඳැ වැලින් පහර දින.

6586. ඉක්බිති එ බමුණු රැහැන ගෙන දණ්ඩක් ද ගෙන වෙසතුරු රජු බලා සිටිය දී තළමින් (දරුවන්) ගෙන යයි.

6587. (පැකිළ හුණු බමුණු අතින් වැල ගැලවී ගිය) ඉක්බිති දෙදරුවෝ බමුණු අතින් මිදී (බෝසතුන් කරා) පලාගියහ. කඳුළු පිරි ඇසින් ඒ ජාලිය කුමර පියාණන් බලයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6588. වෙධං අස්සත්ථපත්තංව පිතු පාදනි වන්දති,
පිතුපාදනි වන්දිත්වා ඉදං වචනමබ්‍රවි.

6589. අම්මා ච තාත නික්ඛන්තා ත්වං ච නො තාත දස්සසි,
යාව අම්මම්පි පස්සෙමු අථ නො තාත දස්සසි.

6590. අම්මා ච තාත නික්ඛන්තා ත්වං ච නො තාත දස්සසි,
මා නො ත්වං තාත අදද යාව අම්මාපි එති[1] නො;
තදයං බ්‍රාහ්මණො කාමං වික්කිණාතු හනාතු වා.

6591. බලඞ්ඝපාදෙ[2] අද්ධනඛො අථො ඔවද්ධපිණ්ඩිකො,
දීඝුත්තරොට්ඨො චපලො කළාරො භග්ගනාසකො.

6592. කුම්භොදරො භග්ගපිට්ඨි අථො විසම චක්ඛුලො,[3]
ලොහමස්සු හරිතකෙසො වලීනං තිලකාහතො.

6593. පිඞ්ගලො ච චිනතො ච චිකටො[4] ච බ්‍රහා ඛරො,
අජිනානි ච සත්තද්ධො අමනුස්සො භයානකො.

6594. මනුස්සො උදහු යක්ඛො මංසලොහිතභොජනො,
ගාමා අරඤ්ඤං ආගම්ම ධනං තං තාත යාචති,
නීයමානෙ පිසාවෙන කින්නු තාත උදික්ඛසි.

6595. අස්මා නූන තෙ හදයං ආයසං දළ්හබන්ධනං.
යො නො බද්ධෙ න ජානාසි බ්‍රාහ්මණෙන ධනෙසිනා,
අච්චායිකෙන ලුද්දෙන යො නො ගාවොව සුම්භති.

6596. ඉධෙව අච්ඡතං කණ්හා න සා ජානාසි කිසම්චි,
මිගීව ඛීරසම්මත්තා යූථා[5] හීනා පකන්දති,

6597. න මෙ ඉදං තථා දුක්ඛං ලබ්භා හි පුමුනා ඉදං,
යඤ්ච අම්මං න පස්සාමි[6] තං මෙ දුක්ඛතරං ඉතො.

6598. න මෙ ඉදං තථා දුක්ඛං ලබ්භා හි පුමුනා ඉදං,
යඤ්ච තාතං න පස්සාමි තං මෙ දුක්ඛතරං ඉතො.

---

1. එතු – මජසං.
2. බිලඞ්ඝපාදෙ – මජසං.
3. චක්ඛුකො – මජසං. ස්‍යා.
4. චිකතො – මජසං. වි.
5. යුධා – මජසං.
6. න පස්සිස්සං – මජසං. ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6588. බෝපත් සෙයින් වෙවුළමින් පියාණන් පා වඳී. පියාණන් පා වැඳ මෙවදන් කී.

6589. පියාණෙනි, අම්මා ද පන්සලින් බැහැර නික්මගියා යැ. පියාණෙනි තෙපි ද අප බමුණුහට දෙන්නවු යැ. යම්තාක් අම්මා ද දක්මෝ නම් එසඳ අප දෙව.

6590. පියාණෙනි, අම්මා ද නික්මගියා. තෙපි ද අප බමුණුහට දෙන්නවූ යැ, පියාණෙනි, තෙපි අප නහමක් දෙව. යම් තාක් අපගේ මවු තොමෝ ඒ ද එසඳ මෙ බමුණු රිසි සේ අප විකුණාවා, හෝ මරා පියවයි.

6591. මෙ බමුණු බකලපා ඇත්තෙ යැ; කුණුනිය ඇත්තෙ යැ; තවද එලෙන පිඩිමස් ඇත්තෙ යැ; දිගු උඩුතොල ඇත්තෙ යැ; මහතොලු යැ; නිකුත්දළ ඇත්තෙ යැ; බුන් නාසා ඇත්තෙ යැ.

6592. සැළ බඳු උදර ඇතියෙ යැ; බුන් පිටඇට ඇතියෙ යැ; තවද වමරැයි යැ; තඹදැළි ඇතියෙ යැ; පිඟුවන් කෙහෙ ඇතියෙ යැ; සම්රැලි ඇතියෙ යැ; කළුතලකැලලි ඇතියෙ යැ.

6593. පිඟුඇස් ඇතියෙ යැ; කටිය පිට කඳට වකැ විසුළුපා ඇතියෙ යැ; මහසිරැරු ඇතියෙ යැ; අදුන්දිවිසම් ධැරයෙ යැ; යකකු වැන්න. බිය එළවනුයෙ යැ.

6594. මිනිසෙක් දෝ හෝ නොහොත් මස්ලේ බුදිනා යකෙක් දෝහෝ යි සිතම්, ගමින් වලට අවුත් පුත්‍රධනය ඉල්වයි. පියාණෙනි, මේ පිසාචයා විසින් ගෙනයනු ලබන අප කුමට උදසීන වැ බලව.

6595. තොපගේ ළය ගල කෙළෙ යයි හඟිම්. යපතින් තර කොට බඳනාලද වනැ යි සිතම්, යම්බඳු තෙපි ධනය සොයන ඉතා රුදුරු බමුණා විසින් බඳනාලද අප දෝ දනුව. ඒ බමුණු අප ගෙරින් මෙන් තළාපියයි.

6596. කෘෂ්ණජිනා මෙහි මැ හිඳීවා. ඕ කිසි දුකක් නොදනී. කිරෙන් මත් වූ මුවරළින් ගිලිහුණු මුවපෙල්ලක මෙන් (මව නොදකැ) හඬයි.

6597. මෙ (පහරනා) දුක් මට එවන් දුක් නොවෙයි. මෙ දුක් පිරිමියකු විසින් ලදයුතු මැ යැ. යම් හෙයෙකින් අම්මා නොදකිම් ද ඒ දුක මට මෙයට වඩා ඉතා දුක් වෙයි.

6598. මම (පහරනා) දුක් මට එවන් දුක් නොවෙයි. මෙ දුක් පිරිමනියකු විසින් ලදයුතු මැ යැ. යම් හෙයෙකින් පියා නොදකිම් ද එදුක මට මෙයට වඩා දුක්තර වෙයි.

6599. සා නූන කපණා අම්මා විරරත්තාය රුච්ඡති,
කණ්හාජිනං අපස්සන්‍යි කුමාරිං චාරුදස්සනිං.

6600. සො නූන කපණො තාතො විරරත්තාය රුච්ඡති,
කණ්හාජිනං අපස්සන්තා කුමාරිං චාරුදස්සනිං.

6601. සා නූන කපණා අම්මා විරං රුච්ඡති අස්සමෙ,
කණ්හාජිනං අපස්සන්‍යි කුමාරිං චාරුදස්සනිං.

6602. සො නූන කපණො තාතො විරං රුච්ඡති අස්සමෙ,
කණ්හාජිනං අපස්සන්තා කුමාරිං චාරුදස්සනිං.

6603. සා නූන කපණා අම්මා විරරත්තාය රුච්ඡති,
අඩ්ඪරත්තෙ ව රත්තෙ වා නදීව අවසුච්ඡති.

6604. සො නූන කපණො තාතො විරරත්තාය රුච්ඡති,
අඩ්ඪරත්තෙ ව රත්තෙ වා නදීව අවසුච්ඡති.[1]

6605. ඉමෙ තෙ ජම්බුකා රුක්ඛා වෙදිසා සින්ධුවාරිකා,[2]
විවිධානි රුක්ඛජාතානි තානි අජ්ජ ජහාමසෙ.

6606. අම්බා පනසා වෙමෙ නිග්‍රොධා ච කපිත්ථනා,
විවිධානි ඵලජාතානි තානි අජ්ජ ජහාමසෙ.

6607. ඉමෙ තිට්ඨන්ති ආරාමා අයං සීතොදිකා[3] නදී,
යත්ථසු පුබ්බෙ කීළාම තානි අජ්ජ ජහාමසෙ,

6608. විවිධානි පුප්ඵජාතානි අසමං උපරි පබ්බතෙ,
යානෙසු පුබ්බෙ ධාරෙම තානි අජ්ජ ජහාමසෙ.

6609. විවිධානි ඵලජාතානි අසමං උපරි පබ්බතෙ,
යානෙසු පුබ්බෙ භුඤ්ජාම තානි අජ්ජ ජහාමසෙ.

6610. ඉමෙ නො හත්ථිකා අස්සා බලිවද්දා ච නො ඉමෙ,
යෙහිසසු පුබ්බෙ කීළාම තානි අජ්ජ ජහාමසෙ.

6611. නීයමානා කුමාරා තෙ පිතරං එතදබ්‍රුවුං,
අම්මං ආරොග්‍යං වජ්ජාසි ඣං ච තාත සුඛී භව.

---

1. අවසුස්සසි - මජ්ඣං.
2. සිංඛුවාරිතා - මජ්ඣං. ව්.
3. සීතුදකා - මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6599. මනෝඥදර්ශන ඇති කෘෂ්ණාජිනා කුමරිය නො දක්නා ඒ අප බැගෑපත් මවු තොමෝ බොහෝ කලක් වලප්නී ය යි සිතමි.

6600. මනකල් දසුන් ඇති කන්හිරු කුමරිය නො දක්නා ඒ අප බැගෑපත් පිය තෙම බොහෝ කලක් වලප්නෙ ය යි සිතමි.

6601. සොඳුරු දුකුම් ඇති කන්හිරු කුමරිය නො දක්නා ඒ අප බැගෑපත් මව අසපුවෙහි හිඳ බොහෝ කල් වලපිනී සිතමි.

6602. සොඳුරු දුකුම් ඇති කන්හිරු නො දක්නා ඒ අප බැගෑපත් පියා අසපුවෙහි හිඳ බොහෝ කල් වලපිනී සිතමි.

6603. ඒ අප බැගෑපත් මව අඩරයැ හෝ මුළුරයැ හෝ (අප සිහි කොට) බොහෝ කල් වලපිනී සිතමි. වැලැපෑ නදියක් මෙන් වියළෙනී සිතමි.

6604. ඒ අප බැගෑපත් පියා අඩරයැ හෝ මුළුරයැ හෝ (අප සිහි කොට) බොහෝ කල් වලපිනී සිතමි. වැලැපෑ නදියක් මෙන් වියළෙනී සිතමි.

6605. මොහු ඒ (අපට කෙළි බිමැ සෙවණ දුන්) දඹ රුක්හ. එලෙන අතු ඇති සිදුවර (නික) යැ, නන් වැදැරුම් රුක්දැ යැ, එ හැම අද හැරපියා (සමුගෙන) යමහ.

6606. මොහු ඇසතු රුක්හ; පනා රුක්හ; නුග රුක්හ; හෙළ කිඳි ඇසතු රුක්හ; නන් වැදැරුම් පලරුක්දැ යැ. එ හැම අද හැරපියා යමහ.

6607. පෙර යම් තැනෙකැ හිඳ කෙළුමෝ නම් මේ ඒ අරමුහු පවතිත්. සිහිල් දිය ඇති මේ හොය ද පවතී. එ හැම අද හැරපියා යමහ.

6608. මේ ගල්මුදුනෙහි නන් වැදැරුම් යම් මල් ජාති කෙනකුන් පෙර පලදිමෝ ද එ හැම අද හැරපියා යමහ.

6609. මේ ගල් මුදුනෙහි නන් වැදැරුම් යම් එල ජාති කෙනකුන් පෙර වළඳමෝ ද එ හැම අද හැරපියා යමහ.

6610. පෙර යමෙකින් කෙළියමෝ ද මොහු ඒ අපගේ ඇත් පෙතැලි රූ යැ අස්පෙතැල්ලෝ යැ මොහු අපගේ ගොන්පෙතැල්ලෝ යැ එ හැම අද හැරපියා යමහ.

6611. බමුණහු විසින් ගෙන යනු ලබන එ කුමරහු පිය මහරජහට මෙ තෙපුල් කීහු: අම්මාට අප අරොග බව කියව පියාණෙනි, තෙපිදු සුවපත්ව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6612. ඉමෙ නො හත්ථිකා අස්සා බලිවඤ්ච නො ඉමෙ,
තානි අම්මාය දජ්ජාසි සොකං තෙහි විනෙස්සති.[1]

6613. ඉමෙ නො හත්ථිකා අස්සා බලිවඤ්ච නො ඉමෙ,
තානි අම්මා උදික්ඛන්ති සොකං පටිවිනෙස්සති.

6614. තතො වෙස්සන්තරො රාජා දනං දත්වාන ඛත්තියො,
පණ්ණසාලං පවිසිත්වා කරුණං පරිදෙවයි.

6615. කන්වජ්ජ ඡාතා තසිතා උපරුච්ඡන්ති දරකා,
සායං සංවෙසනාකාලෙ කො නෙ දස්සති භොජනං.

6616. කංන්වජ්ජ ඡාතා තසිතා උපරුච්ඡන්ති දරකා,
සායං සංවෙසනාකාලෙ අම්ම ඡාතම්හ දෙථ නො.

6617. කථන්නු පථං ගච්ඡන්ති පත්තිකා අනුපාහනා,
සන්තා සූණෙහි පාදෙහි කො නෙ හත්ථෙ ගහෙස්සති.

6618. කථන්නු සො න ලජ්ජෙය්‍ය සම්මුඛා පහරං මම,
අදූසකානං පුත්තානං අලජ්ජී වත බ්‍රාහ්මණො.

6619. යො හි මෙ දසි දසස්ස අඤ්ඤෙ වා පන පෙස්සියො,[2]
තස්සාපි සුවිහීනස්ස කො ලජ්ජී පහරිස්සති.

6620. වාරිජස්සෙව මෙ සතො බද්ධස්ස කුමිනාමුඛෙ,
අක්කොසති පහරති පියෙ පුත්තෙ අපස්සතො.

6621. ආදුං[3] චාපං ගහෙත්වාන ඛග්ගං බන්ධිත්වා වාමතො,
ආනයාමි සකෙ පුත්තෙ පුත්තානං හි වධො දුඛො.

6622. අට්ඨානමෙතං[4] දුක්ඛරූපං යං කුමාරා විහඤ්ඤරෙ,
සතඤ්ච ධම්මමඤ්ඤාය කො දත්වා අථ තප්පති.

6623. සච්චං කිරෙවමාහංසු නරා එකච්චියා ඉධ,
යස්ස නත්ථි සකා මාතා යථා නත්ථි[5] තථෙව සො.

---

1. විනස්සති – මජසං.
2. පෙසියො – මජසං.
3. ධනං – මජසං.
4. අට්ඨාහිමෙතං – PTS.
5. පිතා අත්ථි – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6612. මොහු අපගේ කෙළි ඇත් පෙතැල්ලෝ යැ අස් පෙතැල්ලෝ යැ මොහු ද අපගේ ගොන් පෙතැල්ලෝ යැ එ හැම අම්මාට දෙව එයින් පුත්‍රශොක දුරුකරගන්නී යැ.

6613. මොහු අපගේ කෙළි ඇත්රූ යැ අස්රූ යැ ගොන්රූ යැ එ හැම අම්මා පුනපුනා බලන්නී යැ එයින් ශොක දුරුකර ගන්නී යැ.

6614. ක්ෂත්‍රිය වූ ඒ වෙස්සන්තර රජ පුත්‍රදන දී ඉක්බිති (දරුවන් හඬන හඬ අසා) පන්සලට පිවිසැ බැගෑපත් වැ (මතු කියන සේ) පරිදෙවනා කෙළේ (හැඩී.)

6615. මාගේ දෙදරුවෝ සාපවස් ඇතියාහු අද කවරක්හු වෙත හඬා කියත් ද? සවස වළඳනා වේලෙහි කවරෙක් ඔවුනට බොජුනක් දේ ද?

6616. මාගේ දෙදරුවෝ සාපවස් ඇතියාහු අද කවරක්හු වෙත හඬා කියද්ද? සවස වළඳනා වේලෙහි මැණියෙනි, සාගිනි ඇතියම්හ, අපට අහර දෙවයි කවරක අයදිද්ද?

6617. පාගමන් යෙදුණු වහන් නැති මාගේ දෙදරුවෝ ගමන්හි මිරිකුණාහු ඉදිමුණු පයින් සැටයොදුන් මහ කෙසේ නම් යෙද්දෝ කවරෙක් විඩාහරනට ඔවුන් අත්හි ගනිත් දෝ හෝ.

6618. මාගේ නිදෙස් දරුවනට මා හමුයෙහි පහර දෙන එ බමුණු කෙසේ නම් ලජ්ජා නො වන්නේ ද? බමුණු ලජ්ජා නැතියෙක් මැ යි.

6619. යමෙක් වනාහි මාගේ දුසියකගේ දුසයෙක් වී ද නොහොත් අන් මෙහෙකරුවෙක් හෝ වී ද ඔහට ද වඩා හීනතරයෙක් හෝ වී ද ඔහට පවා ලජ්ජා ඇති කවරෙක් නම් පහර දෙන්නේ ද? (නො දේ මැ යි.)

6620. කෙළිනෙහි බැඳුණු මසකු මෙන් වූ මා බලාසිටිය දී මැ මාගේ ප්‍රිය දරුවනට ආක්‍රොශ කෙරෙයි; පහර දෙයි. කියා හැඩී.

6621. වැළිත් වම්දසරුවෙහි කඩුව බැඳැ දුන්න ගෙන (ලුහුබැඳැ ගොස්) සිය දරුවන් ගෙන එම් දෝහෝ, දරුවනට දෙන වධ දුකෙකි.

6622. යම් හෙයෙකින් දරුවෝ වෙහෙසෙත් ද තෙල වෙහෙස ඒකාන්තයෙන් මට දුක් දෙනසුලු යැ. වැළිත් පෙර බෝසතුන්ගේ ප්‍රවේණිධර්මය දැනැ කවරෙක් නම් දන් දී පසුතැවේ ද?

6623. මෙ ලොව්හි ඇතැම් මිනිස් කෙනෙක් යමක්හු අබියෙසැ සිය මව යම්සේ නැත් ද එසෙයින් ම හෙ ද නැතැයි සැබවක් මැ කීහු යැ.

6624. එහි කණ්හ මරිස්සාම නත්ථෝ ජීවිතෙන නෝ,
දින්නමිකාපි[1] ජනින්දෙන බ්‍රාහ්මණස්ස ධනෙසිනෝ;
අවවායිකස්ස ලුද්දස්ස යෝ නෝ ගාවොව සුම්භති.

6625. ඉමෙ තෙ ජම්බුකා රුක්ඛා වෙදිසා සින්ධුවාරිකා,
විවිධානි රුක්ඛජාතානි තානි කණ්හ ජහාමසෙ.

6626. අස්සත්ථා පනසා වෙමෙ නිග්‍රොධා ච කපිත්ථනා,
විවිධානි ඵලජාතානි තානි කණ්හ ජහාමසෙ.

6627. ඉමෙ තිට්ඨන්ති ආරාමා අයං සීතොදිකා නදී,
යත්ථසසු පුබ්බෙ කීළාම තානි කණ්හ ජහාමසෙ.

6628. විවිධානි පුප්ඵජාතානි අසමිං උපරි පබ්බතෙ,
යානදසු පුබ්බෙ ධාරෙම තානි කණ්හ ජහාමසෙ.

6629. විවිධානි ඵලජාතානි අසමිං උපරි පබ්බතෙ,
යානස්සු පුබ්බෙ භුඤ්ජාම තානි කණ්හ ජහාමසෙ.

6630. ඉමෙ නෝ හත්ථිකා අස්සා බලිවද්ද ච නෝ ඉමෙ,
යෙභිස්සු පුබ්බෙ කීළාම තානි කණ්හ ජහාමසෙ.

6631. නීයමානා කුමාරා තෙ බ්‍රාහ්මණස්ස පමුඤ්චිය,
තෙන තෙන පධාවිංසු ජාලී කණ්හාජිනා චුභො.

6632. තතො සො රජ්ජුමාදාය දණ්ඩඤ්චාදාය බ්‍රාහ්මණෝ,
ආකොටයන්තො තෙ නෙති සිවිරාජස්ස පෙක්ඛතො.

6633. තං තං කණ්හාජිනාවොව අයං මං තාත බ්‍රාහ්මණෝ,
ලට්ඨියා පතිකොටෙති සරෙ ජාතංව දුස්සියං.

6634. න චායං බ්‍රාහ්මණෝ තාත ධම්මිකා හොතනි බ්‍රාහ්මණා,
යක්ඛා බ්‍රාහ්මණවණ්ණන බාදිතුං තාත නෙති නෝ;
නියමානෙ පිසාවෙන කිනත්තු තාත උදික්ඛසි.

6635. ඉමෙ නෝ පාදුකා දුක්ඛා දීඝො වද්ධා සුදුග්ගමෝ,
නීවෙ වොලම්බතෙ සුරියෝ බ්‍රාහ්මණෝ ච තරෙති[2] නෝ.

6636. ඔකන්දමසි[3] භූතානි පබ්බතානි වනානි ච,
සරස්ස සිරසා වන්දම සුපතිට්ඨෝ ච ආදකෙ.[4]

---

1. දින්නමාසී – මජ්ඣං.
2. ධාරෙති – මජ්ඣං.
3. ඔක්කන්තා – මජ්ඣං. ඔකන්දමසෙ – සාහා.
4. ආවකෙ – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6624. කෘෂ්ණාජිනාවෙනි, ධනය සොයන ඉතා රුදුරු බමුණුහට පියරජු විසින් අපි දෙනලදුම්හ. එව මියම්හ. යමෙක් ගෙරිනට මෙන් අපට පහර දේ ද ඔහු වෙත අපට දිවියෙන් කම් නැත.

6625. මොහු ඒ (අපට බිමැ සෙවණ දුන්) දඹ රුක්හ, එලෙන අතු ඇති සිඳුවර (නික) යැ. නන් වැදැරුම් රුක්දැ යැ, එ හැම අද හැරපියා (සමුගෙන) යම්හ.

6626. මොහු ඇසතු රුක්හ, පනා රුක්හ, නුග රුක්හ, හෙළ කිඳි ඇසතු රුක්හ, නන් වැදැරුම් පලරුක්දැ යැ. එ හැම අද හැරපියා යම්හ.

6627. පෙර යම් තැනෙකැ හිඳ කෙළුමෝ නම් මේ ඒ අරමුහු පවකිත්. සිහිල් දිය ඇති මේ හොයද පවති. එ හැම අද හැරපියා යම්හ.

6628. මේ ගල් මුදුනෙහි නන් වැදැරුම් යම් මල් ජාති කෙනකුන් පෙර පැලැඳුමෝ ද එ හැම අද හැරපියා යම්හ.

6629. මේ ගල් මුදුනෙහි නන් වැදැරුම් යම් ඵල ජාති කෙනකුන් පෙර වැළැඳුමෝ ද එ හැම අද හැරපියා යම්හ.

6630. පෙර යමෙකින් කෙළියමෝ ද මොහු ඒ අපගේ ඇත් පෙතැලිරු යැ, අස් පෙතැල්ලෝ යැ, මොහු අපගේ ගොන් පෙතැල්ලෝ යැ, එ හැම අද හැරපියා යම්හ.

6631. බැඳැගෙනයනු ලබන ඒ ජාලිය කෘෂ්ණාජිනා දෙකුමරහු බමුණා අතින් මිදී ඒ ඒ තන්හි දිවගියහ.

6632. ඉක්බිති එ බමුණු රැහැන ගෙන දණ්ඩක්ද ගෙන සිවි රජහු බලා සිටිය දී තළමින් ඔවුන් දෙදෙනා ගෙනයයි.

6633. කෘෂ්ණාජිනා ඒ පියරජහට මෙ තෙපුල් කිවූ: පියාණෙනි, මෙ බමුණු තමා ගෙහි උපන් දාස්සකට මෙන් වැල්කොනින් පහර දෙයි.

6634. පියාණෙනි, මෙ බමුණෙක් නොවෙයි, බමුණෝ දැහැමි වෙති. පියාණෙනි, යකෙක් බමුණු වෙසින් අප කන්නට ගෙන යයි. පියාණෙනි, යකකු විසින් ගෙනයනු ලබන කල්හි කුමට උපෙක්ෂාවෙන් බලන්නහු ද?

6635. අපගේ මේ පතුල්සුභූ රිදෙයි. මහ ද දිගැ, ඉතා දුදුලැ. හිරුදු පහත එල්බෙයි. (බැසැ යයි) මේ බමුණුදු අප වෙලෙවි කෙරෙයි.

6636. පර්වතයෙහි උපන් දෙවියන් ද වෙනෙහි උපන් දෙවියන් ද යටහත් වැ හඬගා යදුම්හ. මෙ විල් අරක්ගත් දෙවියන් ද මුදුනින් වදුම්හ. මනා තොට ඇති නදියෙහි උපන් දෙවියන් ද වදුම්හ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6637. තිණලතා ච ඔසද්ධ්‍යා පඛ්ඛතානි වනානි ච,
අම්මං ආරොග්‍යං වජ්ජාථ අයං නො නෙතී බ්‍රාහ්මණො

6638. වජ්ජන්තු භොන්තො අම්මඤ්ච මඤ්ඤිං අම්හාකමාතරං,
සචෙ අනුපතිතුකාමාසි ඛිප්පං අනුපතියාසි නො.

6639. අයං එකපදී එති උජුං ගච්ඡති අස්සමං,
තමෙවනුපතෙය්‍යාසි අපි පස්සෙසි නො ලහුං.

6640. අහො වත රෙ ජටිනි වනමූලඵලහාරිකෙ,
සුඤ්ඤං දිස්වාන අස්සමං තං තෙ දුක්ඛං භවිස්සති.

6641. අතිවෙලං නූන අම්මාය උඤ්ඡාලද්ධො අනප්පකො,
යා නො බද්ධෙ[1] න ජානාති බ්‍රාහ්මණෙන ධනෙසිනා;
අච්චායිකෙන ලුද්දෙන යො නො ගාවොව සුම්භති.

6642. අහජ්ජ[2] අම්මං පස්සෙමු සායං උඤ්ඡාතො ආගතං,
දජ්ජා අම්මා බ්‍රාහ්මණස්ස ඵලං ඛුද්දෙන මිස්සිතං.

6643. තදයං අසිතො ධාතො න බාළ්හං තරයෙය්‍ය නො,
සූණා ච වත නො පාද බාළ්හං තාරෙති බ්‍රාහ්මණො;
ඉති තත්ථ විලපිංසු කුමාරා මාතුගිද්ධිනො.

කුමාරපබ්බං.

6644. තෙසං ලාලප්පිතං සුත්වා තයො වාලා වනෙ මිගා,
සීහො ව්‍යග්ඝො ච දීපී ච ඉදං වචනමබ්‍රවුං.

6645. මාහෙව නො රාජපුත්තී සායං උඤ්ඡාතො ආගමා,
මාහෙවම්හාකං නිබ්භොගෙ භෙඨයිත්ථ[3] වනෙ මිගා.

6646. සීහො චෙනං විභෙඨෙය්‍ය ව්‍යග්ඝො දීපි ච ලක්ඛණං,
නෙව ජාලීකුමාරස්ස කුතො කණ්හාජිනා සියා;
උභයෙනෙව ජීයෙථ පතිං පුත්තෙ ච ලක්ඛණාති.

---

1. බන්ධෙ – මජ්ඣං. වි.
2. අපජ්ජ – මජ්ඣං. ස්‍යා.
3. බංධයිත්ථ – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6637. තෘණ දෙවියනි, ලිය දෙවියනි, ඔසයි දෙවියනි, ගිරි දෙවියනි, වන දෙවියනි, අම්මාට අප අරොග බව කියව. මෙ බමුණු අප මරමින් ගෙන යයි.

6638. භවත්නි, ඉදින් අප ලුහුබැඳ ඉයටි වූහු නම් "වහා අප අනුව යවයි" අප මැණියන් මද්දීදේවීන්ට කියත්වා.

6639. මේ එක්පියමහ අප කරා එයි. සෘජු වැ අසපුවට යෙයි. එ හසර මහ මැ අනුව යව. ඔවුන් වහා දක්නෙහි නම් මැනැවැයි කියව.

6640. අහෝ පරිහානියෙකි. දළමඩලු ඇත්තිය, වනමුල්පල ගෙනෙන්නිය, අප නැති හිස් අසපුව දැකැ එ තොපට දුක් වන්නෙ යැ.

6641. යමෙක් අප ගෙරින් සෙයින් මරා ද ඒ ඉතා රැදුරු වූ ධනය සොයන බමුණා විසින් බඳනාලද අප තතු යම් මවක් නොදනී ද ඒ මව විසින් වේලා ඉක් මැ නොමඳ අලපල ලබන ලද වන.

6642. අලමුල් පලවැළ නෙළාගෙන සවස වලින් ආ මව අද දක්මෝ නම් යෙහෙකි. අම්මා දඩුයෙල්බෑ මීයෙන් හැනූ පලවැළ මේ බමුණුහට දෙන්නී යැ.

6643. එසඳ පලවැළ වැළඳූ එහෙයින් මැ සුහිත වූ මෙ බමුණු අප වෙලෙව් වැ නො ගෙනයන්නෙ යැ. අපගේ පාදයෝ ඉතා ඉදිමැ ගියහ. මෙ බමුණු අප වෙලෙව් වැ ගෙනයයි කියා මවට ලොල් වූ කුමරහු එ මහ වැලැපියෝ.

කුමාරපර්ව යි.

6644. ඒ දරුවන් දෙදෙනාගේ විලාප අසා (වනදෙවියෝ) දෙව්පුතුන් තිදෙනකුන්ට මෙ වදන් කීහු: තෙපි සිහ, වග, දිවි යන වනවැසි සැඩමුව වෙස් ගනුව.

6645. අපගේ රදු සවසැ වලින් නහමක් යේවා, අප නිති වළඳනා වෙනෙහි සැඩ මුවෝ ඇය නහමක් පෙළත්වා.

6646. සිංහයෙක් හෝ ව්‍යාඝ්‍රයෙක් හෝ දිවියෙක් හෝ ඒ සිරිමතිය (ඉදින්) වෙහෙසී නම් ජාලිය කුමර නො මැ පවත්නෙ යැ කෘෂ්ණාජිනා කොයින් පවත්නී ද? එ බිසෝ සිරිමතී සවාමියා ය දෙදරුවනැ යන දෙකොටසින් මැ පිරිහෙන්නී යැ. (එයින් තෙපි මනා කොට ඇය රකුවයි) කීහු.

6647. ඛණිත්තිකං මෙ පතති[1] දක්ඛිණක්ඛී ච ඵන්දති,[2]
අඵලා ඵලිනො රුක්ඛා සබ්බා මුය්හන්ති මෙ දිසා.

6648. තස්සා සායනහකාලම්හි අස්සමාගමනං පති,
අත්ථඞ්ගතම්හි[3] සුරියම්හි වාලා පන්ථෙ උපට්ඨහුං.

6649. නීචෙ වොලම්බතෙ සුරියො දූරෙ ච වත අස්සමො,
යඤ්ච නෙසං ඉතො හස්සං[4] තං තෙ භුඤ්ජෙය්‍යුං භොජනං.

6650. සො නූන ඛත්තියො එකො පණ්ණසාලාය අච්ඡති,
තොසෙන්තො දරකෙ ජාතෙ මමං දිස්වා අනායතිං.

6651. තෙ නූන පුත්තකා මය්හං කපණාය වරාකියා,
සායං සංවෙසනාකාලෙ ඛීරපීතාව[5] අච්ඡරෙ.

6652. තෙ නූන පුත්තකා මය්හං කපණාය වරාකියා,
සායං සංවෙසනාකාලෙ වාරිපීතාව අච්ඡරෙ.

6653. තෙ නූන පුත්තකා මය්හං කපණාය වරාකියා,
පච්චුග්ගතා මං තිට්ඨන්ති වච්ඡා බාලාව මාතරං.

6654. තෙ නූන පුත්තකා මය්හං කපණාය වරාකියා,
පච්චුග්ගතා මං තිට්ඨන්ති හංසාව උපරි පල්ලලෙ.

6655. තෙ නූන පුත්තකා මය්හං කපණාය වරාකියා,
පච්චුග්ගතා මං තිට්ඨන්ති අස්සමස්සාවිදූරතො.

6656. එකායනො එකපථො සරා සොබ්හා ච පස්සතො,
අඤ්ඤං මග්ගං න පස්සාමි යෙන ගච්ඡෙය්‍ය අස්සමං.

6657. මිගා නමත්ථු රාජානො කානනස්මිං මහබ්බලා,
ධම්මෙන භාතරො හොථ මග්ගං මෙ දෙථ යාචිතා.

6658. අවරුද්ධස්සහං භරියා රාජපුත්තස්ස සිරීමතො,
තඤ්චාහං නාතිමඤ්ඤාමි රාමං සීතාවනුබ්බතා.

6659. තුම්පෙ ච පුත්තෙ පස්සෙථ සායං සංවෙසනං පති,
අහඤ්ච පුත්තෙ පස්සෙය්‍යං ජාලිං කණ්හාජිනඤ්චුභො.

---

1. පතිතං - මජසං. ස්‍යා.
2. පන්දති - මජසං.
3. අත්ථමෙන්තම්හි - මජසං.
4. ගිස්සං - මජසං. ස්‍යා.
5. වාරිපීතාව - මජසං

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6647. මා අතින් බණිත්තිය (අල කණන හුල) ගිලිහෙයි. දකුණැස ද සැලෙයි. පල ඇති රුක් පල නැතියන් වැන්න. මට හැම දිසාවෝ මුළා වැ පැනෙති.

6648. ඒ මා සවස් වේලෙහි හිරු අස්තයට ගිය කල්හි අසපුව බලා එන කල්හි සැඩ සිවුපාවෝ පෙරමඟ නැඟී සිටියහ.

6649. හිරු ද පහත එල්බෙයි. අසපුව ද ඉතා දුර වෙයි, ඔවුනට යමක් මෙයින් ගෙන යම් ද ඔවුහු ඵ බොජුන් වළඳනාහ. (අන් බොජුන් නැති.)

6650. ඵ රජ මා නො එන්නා දැකැ හඬන සාගිනි ඇති දරුවන් සහමින් පන්සල්හි එකලා වැ හිඳිනෙ යයි සිතමි.

6651. බැගෑ වූ පින් නැති මාගේ ඒ දරුවෝ සවසැ බොජුන් වේලෙහි කිරිබොන දරුවන් (කිරි නො ලැබ නිදන) මෙන් නිදති සිතමි.

6652. බැගෑ වූ පින් නැති මාගේ ඒ දරුවෝ සවසැ බුදුනා වේලෙහි පැනට හඬා නො ලැබ නිදනුවන් මෙන් නිදති සිතමි.

6653. බැගෑ වූ පින් නැති මාගේ ඒ දරුවන් ම්වුදෙන පෙර මහට අවුත් සිටුනා බාල වස්සන් මෙන් මා පෙරමහට අවුත් සිටිති සිතමි.

6654. බැගෑ වූ පින් නැති මාගේ ඒ දරුවෝ විල් පිට හංස පොතකයන් මෙන් මා පෙරමඟට අවුත් සිටිති සිතමි.

6655. බැගෑ වූ පින් නැති මාගේ ඒ දරුවෝ අසපු අඹියෙස්හි මා පෙරමඟට අවුත් සිටිති සිතමි.

6656. එක්පියමහෙකැ, හෙ ද එක් මැ මහෙකැ, දෙපසැ විල් හා හෙල් යැ. යම් මහෙකින් අසපුවට යන්නෙමි නම් එබඳු අන් මහක් නො දකිමි.

6657. වෙනෙහි මහබල ඇති මුවරජහට නමස්කාර වේවා, දැහැමින් මට සොහොයුරෝ වවු. මා විසින් අයදනාලද තෙපි මට මහ (අවකාශ) දෙවු.

6658. මම රටින් නෙරනාලද සිරිමත් වෙසතුරු මහරජහු අඹු වෙමි. මම ඔහු රාමරජහට අනුගත වූ සීතා දේවිය මෙන් ඉක්ම (අනිකකු) නො සිතමි.

6659. තෙපිදු (මට මහ පියා) සවසැ ගොදුරු ගන්නා වේලෙහි තොප දරුවන් බලවු. මම ද දැලිසිරු කන්සිරු දෙදරුවන් දක්නෙමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6660. බහුං විදං මූලඵලං භක්ඛො චායං අනප්පකො,
තතො උපඩඪං දස්සාමි මග්ගං මෙ දෙථ යාචිතා.

6661. රාජපුත්ති ච නො මාතා රාජපුත්තො ච නො පිතා,
ධම්මෙන භාතරො හොථ මග්ගං මෙ දෙථ යාචිතා.

6662. තස්සා ලාලප්පමානාය බහුං කාරුඤ්ඤසංහිතං,
සුත්වා නෙලපතිං වාචං වාලා පත්ථා අපක්කමුං.

6663. ඉමම්හි නං පදෙසම්හි පුත්තකා පංසුකුණ්ඨිතා,
පච්චුග්ගතා මං තිට්ඨන්ති වච්ඡා බාලාව මාතරං.

6664. ඉමම්හි නං පදෙසම්හි පුත්තකා පංසුකුණ්ඨිතා,
පච්චුග්ගතා මං තිට්ඨන්ති හංසාව උපරි පල්ලලෙ.

6665. ඉමම්හි නං පදෙසම්හි පුත්තකා පංසුකුණ්ඨිතා.
පච්චුග්ගතා මං තිට්ඨන්ති අස්සමස්සාවිදූරතො.

6666. තෙ මිගා විය උක්කණ්ණා සමන්තාමභිධාවිනො,
ආනන්දිතා පමුදිතා වග්ගමානාව කම්පරෙ.
ත්‍යජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණ්හාජිනක්ඛුභො.

6667. ඡකලීව[1] මිගී ඡාපං පක්ඛී මුත්තාව පඤ්ජරා,
ඔහාය පුත්තෙ නික්ඛමිං සීහීවාමිසගිද්ධිනි;
ත්‍යජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණ්හාජිනක්ඛුභො.

6668. ඉදං තෙසං පරක්කන්තං නාගානමිව පබ්බතෙ,
චිතකා පරිකිණ්ණායො[2] අස්සමස්සාවිදූරතො;
ත්‍යජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණ්හාජිනක්ඛුභො.

6669. වාලුකායපි[3] ඔකිණ්ණා පුත්තකා පංසුකුණ්ඨිතා,
සමන්තා මභිධාවන්ති තෙ න පස්සාමි දරකෙ.

6670. යෙ මං පුරෙ පච්චුදෙන්ති[4] අරඤ්ඤදූරමායතිං,
ත්‍යජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණ්හාජිනක්ඛුභො.

6671. ඡකලිංව මිගිං ඡාපා පච්චුග්ගන්ත්වාන අස්සමං,
දූරෙ මං පටිවිලොකෙන්ති තෙ න පස්සාමි දරකෙ.

---

1. ඡගලීව–මජ්ජසං.
2. උපතිණ්ණයො–මජ්ජසං.
3. වාලිකායපි–මජ්ජසං
4. පච්චුඩෙන්ති–මජ්ජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6660. මෙ අල හා පලවැළ බෙහෙව. මෙ කැයුතු දෑ අනල්ප යැ. ඉන් අඩක් නොපට දෙමි. මා විසින් අයදනාලද තෙපි මට මහ අවසර දෙව.

6661. අප මවු රදු යැ අප පියෙ රජ යැ (තෙපි මට) දූහැමින් සොහොයුරු වව. මා විසින් අයදනාලද තෙපි මට මහ අවකාශ දෙව.

6662. වලප්නා වූ ඇගේ බැගෑ බැවින් මුසු බොහෝ වූ මියුරු තෙපුල් අසා සැඩ මුව වෙස් ගත් දෙවිපුත්හු මඟින් පහ වැ ගියෝ.

6663. පස් වැකුණු සිරුරු ඇති මා දරුසිඟිත්තෝ මවුදෙන පෙරමහට ආ බාල වස්සන් මෙන් මා පෙරමහට ආවාහු (පෙර) මෙ තන්හි සිටිකි.

6664. පස් වැකි ගත් ඇති දෙදරු බිළිදුහු විල්පිට හස්පොවුවන් මෙන් මා පෙරමහට ආවාහු පෙර මෙ පෙදෙසැ සිටිකි.

6665. පස් තවරණත් සිරුරු ඇති දෙදරුසුහඟු, මා පෙරමහට ආවාහු අසපු අබියෙසැ මෙ තන්හි සිටිකි.

6666. ඒ දෙදරුවෝ (මව පෙරමහට එන) කන් හුවාගත් මුවපොවුවන් මෙන් මා දැකැ තුටු වූවාහු ප්‍රමුදිත වූවාහු අවටින් දුවනුවෝ පනනුවන් මෙන් මාගේ ළය සලති. ඒ ජාලිය කෘෂ්ණාජිනා දෙදරුවන් අද නො දක්මි.

6667. පැටවුන් පියා ගොදුරට ගිය එළු දෙනක මෙන් මුව පෙල්ලක මෙන් කැදැල්ල පියා ගිය කිරිල්ලක මෙන් ගොදුරට ගිපු වූ සිහ දෙනක මෙන් දරුවන් පියා (අහර සොයා) නික්මුණමු. ඒ මම ජාලිය කෘෂ්ණාජිනා දෙදරුවන් අද නො දක්මි.

6668. පර්වතයෙහි ඇතුන්ගේ පිය සටහන් සෙයින් මේ ඔවුන් කෙළෑ ඇවිදි පියසටහන් පැනෙයි. අසපුව අබියෙසැ (ඔවුන් රැස් කළ) වැලිසැයෝ විසුළහ. ඒ දැලිසිරු කන්සිරු දෙදෙන අද නො දක්මි.

6669. පස් තවරගත් වැල්ලෙනුදු ගැවැසිගත් දරුවෝ මා සිසාරා දිවයෙති. ඒ දරුවන් නො දක්මි.

6670. පෙර දවස් යම් දරු කෙනෙක් වලින් එන මා දුරදී මැ දැකැ පෙරමගට එත් ද අද ඒ දැලිසිරු කන්සිරු දෙදරුවන් නො දක්මි.

6671. (ඔහු පෙර දවස්) අසපුවෙන් පෙරමහට අවුත් මවු එළු දෙන මුව දෙන බලා සිටුනා පැටවුන් මෙන් දුර සිටැ මා බලති. ඒ දරුවන් නො දක්මි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6672. ඉදං ච තෙසං කීළන්තං පතිතං පණ්ඩුබෙලුවං,
ත්‍යජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණ්හාජිනණ්ඩුහො.

6673. ථනා ච මය්හිමෙ පූරා උරො ච සම්පදලති,
ත්‍යජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණ්හාජිනණ්ඩුහො.

6674. උච්ඡඞ්ගෙ මෙ විචින්නති ථනා එකාවලම්බති,
ත්‍යජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණ්හාජිනණ්ඩුහො.

6675. යස්සු සායන්හසමයං පුත්තකා පංසුකුණ්ඨිතා,
උච්ඡඞ්ගෙ මෙ විචත්තන්ති තෙ න පස්සාමි දරකෙ.

6676. අයං සො අස්සමො පුබ්බෙ සමජ්ජො පටිභාති මං,
ත්‍යජ්ජ පුත්තෙ අපස්සන්ත්‍යා භමතෙ විය අස්සමො.

6677. කිම්දං අප්පසඤ්ඤෙව අස්සමො පටිභාති මං,
කාකොලාපි න වස්සන්ති මතා මෙ නූන දරකා.

6678. කිම්දං අප්පසඤ්ඤෙව අස්සමො පටිභාති මං,
සකුණාපි න වස්සන්ති මතා මෙ නූන දරකා.

6679. කිම්දං තුණ්හීභූතොසි අපි රත්තෙව මෙ මනො,
කාකොලාපි න වස්සන්ති මතා මෙ නූන දරකා.

6680. කිම්දං තුණ්හීභූතොසි අපි රත්තෙව මෙ මනො,
සකුණාපි න වස්සන්ති මතා මෙ නූන දරකා.

6681. කච්චිනූ මෙ අය්‍යපුත්ත මිගා ඛාදිංසු දරකෙ,
අරණ්ඤෙ ඉරිනෙ[1] විවනෙ කෙන නීතා මෙ දරකා.

6682. ආදු තෙ පහිතා දූතා ආදු සුත්තා පියංවද,
ආදු බහි නො නික්ඛන්තා බිඩ්ඩාසු පසුතා නු තෙ.

6683. නෙවාසං කෙසා දිස්සන්ති භත්ථපාද න ජාලිනො,
සකුණානං ච ඔපාතො කෙන නීතා මෙ දරකා.

6684. ඉදං තතො දුක්ඛතරං සල්ලවිද්ධො යථා වණෙ,
ත්‍යජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණ්හාජිනණ්ඩුහො.

---

1. ඉරිනෙ වනෙ–මජ්ජසං, ස්‍යා. ස්‍යා. වි. ඊරනෙ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6672. මෙ ද ඔවුන් කෙළිබඩු වූ ගිලිහී වැටුණු විලිකුන් බෙලිපල යැ. ඒ දූලිසිරු කන්සිරු දෙදරුවන් අද නො දක්මි.

6673. මාගේ මෙ දෙතන කිරෙන් පිරුණහ. ළය පැළෙනු වැන්න. ඒ දූලිසිරු කන්සිරු දෙපුතුන් අද නො දක්මි.

6674. එකෙක් මා හිණ සොයයි. එකක් තනය එල්බගනියි. ඒ දූලිසිරු කන්සිරු දෙදරුවන් අද නො දක්මි.

6675. යම් දරු කෙනෙක් පස් වැකි සිරුරු ඇති වැ සවස් වේලෙහි මාගේ ඇකයෙහි පෙරළෙත් ද ඒ දරුවන් නො දක්මි.

6676. පෙර දවස් (යම් අසපුවක්) කෙළිමඩුල්ලක් මෙන් මට වැටහුණේ වේ ද මේ ඒ අසපුව යි. අද ඒ දරුවන් නො දක්නා මට අසපුව භ්‍රමණය වන්නාක් මෙනි.

6677. මෙ කිමෙකැ? අසපුව නිහඬ වැ මෙන් මට වැටහෙයි. වන කවුඩෝ ද නො හඬති. මාගේ දෙදරුවෝ මළාහු දෝ හෝ.

6678. මෙ කිමැ? අසපුව නිහඬ වැ මෙන් මට වැටහෙයි. සියොන්හු ද නො හඬති. මාගේ දරුවෝ මළාහු හෝ?

6679. මෙ කිම? නිහඬ වූයෙහි මාගේ සිත (සිහින දුටු) රාත්‍රියෙහි මෙනි. වනකවුඩෝ ද නො හඬති. මාගේ දරුවෝ මළහ හෝ?

6680. මෙ කිම? නිහඬ වූයෙහි මාගේ සිත සිහින දුටු රැයැ මෙනි. සියොන්හු ද නො හඬති. මාගේ දරුවෝ මළහ හෝ?

6681. කිම හෝ හිමිසඳිනි, මාගේ දරුවෝ සැඬ සිවුපාවෝ කෑහු ද? නිරොජ වූ ජනශූන්‍ය වූ අරනෙහි මාගේ දරුවෝ කවරකු විසින් ගෙන යන ලද්දහු ද?

6682. නොහොත් තොප විසින් දූතමෙහෙ කොට යවන ලද්දහු ද? නොහොත් ප්‍රිය තෙපුල් ඇති දරුවෝ නිදිගත්තාහු ද? නොහොත් ඔහු ක්‍රීඩායෙහි යෙදී බැහැරැ ගියාහු ද?

6683. ඔවුන්ගේ අඳුන්වන් කෙශයෝ නො පැනෙති. ජාලා-වනද්ධ අත්පා ද නො පැනෙත් මැ යැ. ලිහිණි කෙනකුන්ගේ බැස්මෙක් හෝ වී ද? මාගේ දරුවෝ කවරක්හු විසින් ගෙන යනලද වෙත් ද?

6684. අද ඒ ජාලිය කෘෂ්ණාජිනා දෙපුතුන් නො දකිමි ද, එදුකට වඩා (තොප නො බණන) මෙ දුක ඉතා දුකැ. හුලින් විදුනාලද වණයක් මෙනි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6685. ඉදම්පි දුතියං සල්ලං කමෙපති හදයං මම
යඤ්ච පුත්තෙ න පස්සාමි තඤ්ච මං නාභිභාසසි.

6686. අජ්ජෙව මෙ ඉමං රත්තිං රාජපුත්තෙ න සංසසි,
මඤ්ඤෙ උකකනාසත්තං මං පාතො දකඛසි නො මතං.

6687. නනු මද්දි වරාරොහා රාජපුත්තී යසස්සිනී,
පාතො ගතාසි උඤ්ඤාය කිමිදං සායමාගතා.

6688. නනු ත්වං සද්දමස්සොසි යෙ සරං පාතුමාගතා,
සීහස්ස විනදනාතස්ස ව්‍යග්ඝස්ස ච නිකූජිතං.

6689. අහු පුඛඛනිමිත්තං මෙ විවරනත්‍යා බ්‍රහාවනෙ,
ඛණිත්තො මෙ හත්ථා පතිතො උගගීවඤ්චාපි අංසතො.

6690. තදහං ඛ්‍යථිතා භීතා පුට්ඨුං කත්වාන අඤ්ජලිං,
සඛිා දිසා නමස්සිස්සං අපි සොත්ථී ඉතො සියා.

6691. මා හෙව නො රාජපුත්තෙ හතො සීහෙන දීපිනා,
දරකා වා පරාමට්ඨා අවජකොකතරක්ඛසී හි.[1]

6692. සීහො ව්‍යග්ඝෙසා ච දීපී ච තයො වාලා වනෙ මිගා,
තෙ මං පරියාවරුං මග්ගං තෙන සායමහි ආගතා.

6693. අහං පතිඤ්ච පුත්තෙ ච ආවෙරම්ව මාණවො,
අනුවත්තිතා[2] දිවාරත්තිං ජටිනී බ්‍රහමචාරිනි.

6694. අජිනානි පරිදහිත්වා වනමූලඵලහාරියා,
විවරාමි දිවාරත්තිං තුම්හං කාමා හි පුත්තකා,

6695. ඉමං[3] සුවණ්ණභාලිදදිං ආහතං පණ්ඩුඛෙළවං,
රුකඛපක්කානි වාහාසිං ඉමෙ තෙ පුත්තා කීළනා.

6696. ඉමං මුළාලවටකං[4] සාලුකං පිඤ්ජරොදකං,[5]
භුඤ්ජ බුදෙහි සංයුත්තං සහ පුත්තෙහි බත්තියා.

6697. පදුමං ජාලිනො දෙහි කුමුදං පන කුමාරියා,
මාලිනෙ පස්ස නාවවෙත්ත සිවි පුත්තානි අච්චය.

6698. තතො කණ්හාජිනායාපි නිසාමෙහි රථෙසභ,
මඤ්ඤුස්සාරාය වග්ගුයා අස්සමං උපයන්තියා.[6]

---

1. තරවෙජහි–මජ්ඣං.
2. අනුඨිතා–මජ්ඣං.
3. අහං–මජ්ඣං, වි.
4. වත්තකං–මජ්ඣං.
5. පිඤ්ජරෙදකං–මජ්ඣං.
6. උපගඤ්ඡියා–මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6685. අද මම ඒ දෙදරුවන් නො දක්මි. තෙපි දු මා හා නො බණනුවහ. මෙ දෙවැනි හුල ද මාගේ ළය කම්පා කරවයි.

6686. රාජපුත්‍රයෙනි, අද මේ රෑ මා හා නො බණනවු නම් පහ වැ ගිය දිවි ඇති මා උදය මළ එකක දක්නවු යැ.

6687. යශස්වී මද්‍රී රාජපුත්‍රිය, උතුම් වළහ ඇති තෙපි වන-මුල් පලවැළ පිණිස උදය මැ ගියහු නොද? මේ කිකරුණෙක. (වේලා ඉක් මැ) සවසැ ආවහු නොද?

6688. යම් සිවුපා කෙනෙක් දිය බොන්නට විලට ආහු ද ඔවුනතුරෙන් තෙපි වෙසෙසින් නාද කරන සිංහයාගේ ද ව්‍යාඝ්‍රයා-ගේ ද (සෙසු සතුන්ගේ ද) එකනින්නාද හඬ නො ඇසුහු ද?

6689. මහවෙනෙහි සැරිසරන මට පෙර නිමිති පහළ වී, මා අතින් අල කණන හුල ගිලිහී වැටුණෙ යැ. දසරුයෙන් පලවැළ පැස ගිලිහී වැටුණෙ යැ.

6690. එසඳ මම කම්පිත වැ බියපත් වැ වෙන වෙන ඇඳිලි බැඳැ මෙයින් සෙත් වන්නෙ යැ යි සිතා හැම දිසා වැන්දමු.

6691. අප හිමි රජපිත් සිංහයකු විසින් හෝ දිවියකු විසින් හෝ නහමක් නැසේවා. දරුවෝ ද වලස් වෘක තරසුන් විසින් නහමක් නැසෙත්වා' යි.

6692. සිහ යැ වග යැ දිවි යැ යන සැඩ වන සිවුපාවෝ තිදෙනෙකි. උහු මට මහ ඇවිරුහ. එහෙයින් කල් ඉක් මැ සවසැ ආමු.

6693. මම දළමඬුලු දරන්නී බඹසර කරන්නී අතැවැසි මාණවකයෙක් ඇදුරක්හු මෙන් හිමිහට ද දරුවනට ද දවරය නො පමාව මෙහෙ කළමු.

6694. දරුවනි, මම තොප කැමැත්තෙන් අඳුන්දිවිසම් පෙරෙවැ වනමුල් පලවැළ ගෙනයන්නී දවරය ඇවිදිනමු.

6695. දරුවනි, (තොප නහන පිණිස) මෙ රන්වන් කසා කල්ක ගෙනෙනලද යැ. (තොප කෙළනට) රන්වන් බෙලිපල ගෙනෙන ලද යැ රුක්හි විලිකුන් මිහිරි පල ද ගෙන ආමු. මෙ තොපට කෙළිබඩු යැ.

6696. මේ නෙලුඹුදැලි වළලු යැ ඔලු යැ පිඤ්ඡරයුග යැ යන මේ ඇත. රජතුමනි, දඬුයෙල්බෑ මීයෙන් හනනලදු වැ දරුවන් හා එක් වැ වළඳ කරව.

6697. ජාලියහට පියුම දෙව. කුමරියට ඇඹුලමල දෙව. මල් පැළැඳැ නටන දරුවන් බලව. සිව්රාජයෙනි, දරුවන් කැඳව.

6698. රජතුමනි, ඉක්බිති මියුරු හඬ ඇති ලීලා ඇති කෘෂ්ණාජිනාව ද අසපුව කරා යන්නිය බලව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6699. සමානසුබදුකඛමහා රථා පඛඛජිතා උහො,
අපි සිවිපුත්තෙ පසෙසයි ජාලිං කණහාජිනඤඤුහො.

6700. සමණෙ බ්‍රාහ්මණෙ නූන බ්‍රහ්මචරියපරායනෙ,
අහං ලොකෙ අභිසපිං සීලවන්තො බහුස්සුතෙ;
තස්සජ්ජ පුත්තෙ න පස්සාමි ජාලිං කණහාජිනඤඤුහො.

6701. ඉමෙ තෙ ජම්බුකා රුක්ඛා වෙදිසා සිඤ්ඤවාරිකා,
විවිධානි රුක්ඛජාතානි තෙ කුමාරා න දිස්සරෙ.

6702. අස්සත්ථා පනසා වෙමෙ නිග්‍රොධා ච කපිත්ථනා,
විවිධානි ඵලජාතානි තෙ කුමාරා න දිස්සරෙ.

6703. ඉමෙ කිටඨනාති ආරාමා අයං සීතොදිකා නදී,
යත්ථසසු පුබ්බෙ කීළිංසු තෙ කුමාරා න දිස්සරෙ.

6704. විවිධානි පුපඵජාතානි අස්සිං උපරිපබ්බතෙ,
යානෙසසු පුබ්බෙ ධාරිංසු තෙ කුමාරා න දිස්සරෙ.

6705. විවිධානි ඵලජාතානි අස්සිං උපරිපබ්බතෙ,
යානෙසසු පුබ්බෙ භුඤ්ජිංසු තෙ කුමාරා න දිස්සරෙ.

6706. ඉමෙ තෙ හත්ථිකා අස්සා බලිවද්දා ච තෙ ඉමෙ,
යෙහිසසු පුබ්බෙ කීළිංසු තෙ කුමාරා න දිස්සරෙ.

6707. ඉමෙ සාමා සසොලූකා[1] බහූකා කදලිමිගා,
යෙහිසසු පුබ්බෙ කීළිංසු තෙ කුමාරා න දිස්සරෙ.

6708. ඉමෙ හංසා ච කොඤ්චා ච මයූරා චිත්‍රපෙඛුනා,
යෙහිසසු පුබ්බෙ කීළිංසු තෙ කුමාරා න දිස්සරෙ.

6709. ඉමා තා වනගුම්බායො පුපඵිතා සබ්බකාලිකා,
යත්ථසසු පුබ්බෙ කීළිංසු තෙ කුමාරා න දිස්සරෙ.

6710. ඉමා තා පොක්ඛරණියො රම්මා වක්කවාකූපකූජිතා,
මණ්ඩූකෙහි සඤ්ඡන්නා පදුමුප්පලකෙහි ච;
යත්ථසසු පුබ්බෙ කීළිංසු තෙ කුමාරා න දිස්සරෙ.

6711. න තෙ කටඨානි භින්නානි න තෙ උදකමාහතං,
අග්ගිපි තෙ න භාපිතො කින්නු මඤ්ඤව ඣායසි.

---

1. සසං–මජසං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6699. රටින් නෙරනලද අපි දෙදෙනමෝ යමාන සුවදුක් ඇතියමිහ. සිව්මහරජුනි, ජාලිය කෘෂ්ණාජිනා දෙදරුවන් දුටුවහු ද?

6700. මම ලොව්හි බඹසර පිහිට කොට ඇති බොහෝ ඇසූ පිරූ තැන් ඇති සිල්වත් මහණුන් ද බමුණන් ද හැවූ වන්මි. එහෙයින් අද ඒ දැලිසිරූ කන්සිරූ දෙදරුවන් නො දක්මි.

6701. මේ ඒ (දරුවන් කෙළි බිමැ) දඹරුක් යැ. එලෙන අතු ඇති සිඳුවර යැ. නන් වැදෑරුම් රුක්දෑ යැ. ඒ කුමරුවෝ නො පැනෙති.

6702. මේ ඒ ඇසතු රුක් යැ, පනා රුක් යැ, නුග රුක් යැ, හෙළකිඳි ඇසතු රුක් යැ. නන් වැදෑරුම් පලරුක් දෑ යැ, ඒ කුමරුවෝ නො පැනෙති.

6703. පෙර යම් තැනෙකැ හිඳ ක්‍රීඩා කෙරෙත් නම් මේ ඒ අරම් පවතී. මේ සිහිල් දිය ඇති හොය ද පවතී. ඒ කුමරුවෝ නො පැනෙති.

6704. පෙර යම් කුසුම ජාතීන් පැළැඳියාහු ද මේ ගල් මුදුනෙහි ඒ **විවිධ පුෂ්පජාති** ඇත. ඒ කුමරුවෝ නො පැනෙති.

6705. පෙර යම් ඵලජාතීන් වැළඳුහු ද මේ ගල්මුදුනෙහි ඒ විවිධ ඵලජාති ඇත. ඒ කුමරුවෝ නො පැනෙති.

6706. පෙර යම් පෙතැලිරුවින් ක්‍රීඩා කළාහු ද මේ ඒ ඇත් පෙතැලිරූ යැ, අස්පෙතැලිරූ යැ, මේ ඒ ගොන්පෙතැලි රූ ද ඇත. ඒ කුමරුවෝ නො පැනෙති.

6707. පෙර යම් කෙනකුන් හා සම ක්‍රීඩා කළාහු නම් මේ ඒ කුඩා සම්වන් මුවෝ යැ සාවෝ යැ මහමුහුණෝ යැ බොහෝ වූ කෙහෙල්මුවෝ යැ, ඒ කුමරුවෝ නො පැනෙති.

6708. මේ ඒ හංසයෝ යැ කොස් ලිහිණියෝ යැ විසිතුරු පිල්කලබ ඇති මොනරු යැ. ඒ කුමරුවෝ නො පැනෙති.

6709. පෙර යම් තැනෙකැ ක්‍රීඩා කළාහු නම් මේ ඒ හැම කල්හි පිපී සිටි වනලැහැබිහු යැ ඒ කුමරුවෝ නො පැනෙති.

6710. පෙර යම් තැනෙක ක්‍රීඩා කළාහු නම් මේ ඒ සක්වා-ලිහිණියන් ළඟ හිඳ කුල්නා හෙල්මැල්ලෙනුදු පියුම්නුදු උපුලෙනුදු ගැවැසිගත් රමණීය පොකුණු ඇත. ඒ කුමරුවෝ නො පැනෙති.

6711. තොප විසින් දර නො බිඳිනලද, තොප විසින් දිය නො ගෙනෙනලද, තොප විසින් ගිනි ද නො දල්වනලද, කිම නො දන්නා බාලයකු මෙන් සිහිවිලිපර වවු ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6712. පියෝ පියෙන යඤ්ඤම්ම සමෝ මෙ ව්‍යපහඤ්ඤති,
තඤ්ඤ පුත්තෙන න පස්සාමි ජාලිං කණ්හාජිනඤ්චුභෝ.

6713. න ඛෝ නෝ දෙව පස්සාමි යෙන තෙ නිහතා මතා,
කාකොලාපි න වස්සන්ති හතා මෙ නූන දරකා.

6714. න ඛෝ නෝ දෙව පස්සාමි යෙන තෙ නිහතා මතා,
සකුණාපි න වස්සන්ති මතා මෙ නූන දරකා.

6715. සා තත්ථ පරිදෙවිත්වා පඤ්ඤතානි වනානි ච,
පුනදෙවස්සමං ගන්ත්වා සාමිකස්සන්ති[1] රොදති.

6716. න ඛෝ නෝ දෙව පස්සාමි යෙන තෙ නිහතා මතා,
කාකොලාපි න වස්සන්ති හතා මෙ නූන දරකා.

6717. න ඛෝ නෝ දෙව පස්සාමි යෙන තෙ නිහතා[2] මතා,
සකුණාපි න වස්සන්ති මතා මෙ නූන දරකා.

6718. න ඛෝ නෝ දෙව පස්සාමි යෙන තෙ නිහතා මතා,
විවරන්ති රුක්ඛමූලෙසු පඤ්ඤතෙසු ගුහාසු ච.

6719. ඉති මද්‍රී වරාරොහා රාජපුත්ති යසස්සිනී,
බාහා පග්ගය්හ කන්දිත්වා තත්ථෙව පතිතා ඡමා.

6720. තමජ්ඣුපත්තං රාජපුත්තිං උදකෙන අභිසිඤ්චථ,
අස්සත්ථං තං විදිත්වාන අථ නං එතදබ්‍රවි.

6721. ආදියෙනෙව තෙ මද්දී දුක්ඛං න කාතුම්වජ්ජිසං,
දළ්හෙ යාවකො වුද්ධා බ්‍රාහ්මණෝ සරමාගතෝ;
තස්ස දින්නා මයා පුත්තා මද්දී මා භායි අස්සස.[3]

6722. මං පස්ස මද්දී මා පුත්තෝ මා බාළ්හං පරිදෙවසි,
ලච්ඡාම පුත්තෙ ජීවන්තා අරොගා ච භවාමසෙ.

6723. පුත්තෙ පසුඤ්ච ධඤ්ඤඤ්ච යඤ්ච අඤ්ඤං ඝරෙ ධනං,
දජ්ජා සප්පුරිසෝ දානං දිස්වා යාවකමාගතෙ;
අනුමොදහි මෙ මද්දී පුත්තකෙ දානමුත්තමං.

---

1. සාමිකසස්සන්තිකෙ-මජ්ඣං.
2. නිහතා ඨා, නිහටා-මජ්ඣං.
3. අස්සාස-මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6712. තෙපි මට ප්‍රියව, ප්‍රිය වූ තොප හා සමග එක් වැ සම වැ වීදුනා දුක් මා විසින් නසනු ලැබේ. (අද එසේ නො වේ.) ඒ ජාලිය කෘෂ්ණජිනා දෙදරුවන් අද නො දක්මි.

6713. දෙවයිනි, අපගේ දරුවන් නො දක්මි. යම් කිසිවකු විසින් ඔහු ගෙනයනලදහු ද? නොහොත් මළාහු ද? (මළ දවස් හඬනා) වනකවුඩෝ ද නො හඬති. මාගේ දරුවෝ කිසිවක්හු විසින් ගෙනයනලද වන.

6714. දෙවයිනි, අපගේ දරුවන් නො දක්මි. යම් කිසිවකු විසින් ඔහු ගෙනයනලදහු ද? නොහොත් මළාහු ද? සියොත්හු ද නො හඬති. මාගේ දරුවෝ මළාහු වන.

6715. ඒ බිසෝ ඒ වඞ්කගිරියෙහි පර්වතයන් ද වනයන් ද බලමින් හඬා ඇවිද යළිදු අසපුවට ගොස් සැමියා වෙත හඬයි.

6716. දෙවයිනි, අපගේ දරුවන් නො දක්මි. යම් කිසිවකු විසින් ඔහු ගෙනයනලදහු ද? නොහොත් මළාහු ද? වනකවුඩෝ ද නො හඬති. මාගේ දරුවෝ කිසිවක්හු විසින් ගෙනයනලද වන.

6717. දෙවයිනි, අපගේ දරුවන් නො දක්මි. යම්කිසිවක්හු විසින් ඔහු ගෙනයන ලදහු ද? නොහොත් මළාහු ද? සියොත්හු ද නො හඬති. මාගේ දරුවෝ මළාහු වන.

6718. දෙවයිනි, පර්වතයෙහි රුක්මුල්හි ගල්ලෙන්හි ඇවිදිනී අපගේ දරුවන් නො දක්මි. ඔහු යම් කිසිවකු විසින් ගෙනයන ලදහු ද? නොහොත් මළාහු ද?

6719. මෙසේ යශස්වී වූ උතුම් වළඟ ඇති මදුරදු දෙහොත් හිසැ බැඳැ හඬා එහි මැ බිමැ ඇදහුණු.

6720. (තමා හම්යෙහි) නිසන් වූ ඒ රදුව (මුහුණ) දියෙන් තෙමී. ඉක්බිති ඇය අස්වස් ලද බව දැනැ ඇයට තෙල තෙපුල් කී:

6721. මද්‍රී දේවීනි, ආදියෙහි මැ තොපට ශ්‍රද්ධයක් කරන්නට නො කැමැති වීමි. දිළිඳු වූ මහලු වූ යාචක බමුණෙක් ගෙට ආයෙ යැ. ඔහට මා විසින් දරුවෝ දෙන ලදහ. මද්‍රිය නො බව, අස්වස්ව.

6722. මද්‍රී දේවීනි, මා බලව, දරුවන් නහමක් බලව, නහමක් දැඩි කොට හඬව, ජීවත් වන්නමෝ අරොග ද වමෝ නම් දරුවන් ලබම්හ.

6723. සත්පුරුෂ තෙම යදියා ආ කල්හි දැකැ දරුවනුදු සිවුපාවුනුදු ගෙහි අනෙක් යම් ධනයෙකුත් ඇද්ද ඒ හැම ද දන් දෙන්නෙ යැ. මද්‍රී දේවීනි, දරුවන් කෙරෙහි පිහිටි මාගේ උතුම් දන අනුමෝදන්ව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6724. අනුමොදමි තෙ දෙව පුත්තකෙ දනමුත්තමං,
දත්වා චිත්තං පසාදෙහි භීයො දනදදෙ භව.

6725. යො ත්වං මච්ඡෙරභූතෙසු මනුස්සෙසු ජනාධිප,
බ්‍රාහ්මණස්ස අද දනං සිවීනං රට්ඨවඩ්ඪනො.

6726. නිත්තාදිතා තෙ පඨවී සඤ්ඤෙ තෙ තිදිවං ගතො,
සමන්තා විජ්ජුතා ආගුං ගිරීනංව පටිස්සුතා.

6727. තස්ස තෙ අනුමොදන්ති උභො නාරදපබ්බතා
ඉන්දෙ ච බ්‍රහ්මා ච පජාපතී ච
සොමො යමො වෙස්සවණො ච රාජා
සබ්බෙ දෙවා අනුමොදන්ති තාවතිංසා ස ඉන්දකා.

6728. ඉති මද්දී වරාරොහා රාජපුත්ති යස්සසිනී,
වෙස්සන්තරස්ස අනුමොදි ප්‍රත්තකෙ දනමුත්තමං.

මද්දිපබ්බං නිට්ඨිතං.

6729. තතො රක්‍යා වීවසනෙ සුරියස්සුග්ගමනම්පති,
සක්කො බ්‍රාහ්මණවණ්ණෙන පාතො තෙසං අදිස්සථ.[1]

6730. කච්චින්නු භොතො කුසලං කච්චි භොතො අනාමයං.
කච්චි උඤ්ඤෙන යාපෙථ කච්චි මූලඵලාබහු.

6731. කච්චි ඩංයා ච මකසා ච අප්පමෙව සිරිංසපා,[2]
වනෙ වාලමිගාකිණ්ණෙ කච්චි හිංසා න විජ්ජති.

6732. කුසලඤ්චෙව නො බ්‍රහ්මෙ අථො බ්‍රහ්මෙ අනාමයං,
අථො උඤ්ඤෙන යාපෙම අථො මූලඵලාබහු.

6733. අථො ඩංසා ච මකසා ච අප්පමෙව සිරිංසපා,
වනෙ වාලමිගාකිණ්ණෙ හිංසා අම්හං න විජ්ජති.

6734. සත්ත නො මාසෙ වසතං අරඤ්ඤෙ ජීවසොකිනං,
ඉදම්පි දුතියං පස්සාම බ්‍රාහ්මණං දෙවවණ්ණිනං;
ආදය බෙළුවං දණ්ඩං ධාරෙන්තං අජිනක්ඛිපං.

6735. ස්වාගතන්තෙ මහාබ්‍රහ්මෙ අථොතෙ අදුරාගතං,
අන්තො පවිස භද්දන්තෙ පාදෙ පක්ඛාලයස්සු තෙ.

---

1. අදසසථ–මජසං.
2. සරීසපා–මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6724. දෙවයිනි, තොප දරුවන් කෙරෙහි පිහිටි උතුම් දන අනුමෝදන් වෙමි. දන් දී සිත පහදව. පුනපුනා දන් දෙනුයෙ වව.

6725. ජනාධිපතිය, සිවිරට වඩනා යම් බදු තෙපි මසුරුමලින් මැඩුණු මිනිසුන් අතුරෙහි බමුණුහට පුත්‍රදනය දුන්නහු යැ (අසිරියෙකි.)

6726. තොප විසින් මහපොළොව හඬවනලද. තොප කිත්ගොස දෙව්ලොවට ගියෙ යැ. අකල් විදුලිය අවට හැසිරිණි. පර්වතයන්ගේ පිළිරැව්මෙන් නැඟිණ.

6727. තොපගේ ඒ පුත්‍රදනය නාරද යැ පර්වත යැ යන දෙනිකායයෙහි දෙවිවරයෝ අනුමෝදන් වෙති. ඉන්ද්‍ර ද බ්‍රහ්ම ද ප්‍රජාපති ද සොමදෙව ද යමදෙව් ද වෙසවුණු රජ ද ඉන්ද්‍ර සහිත වූ හැම තව්තිසා වැසි දෙවියෝ ද අනුමෝදන් වෙත්.

6728. යසපිරිවර ඇති උතුම් රූ ඇති මද්‍දරදු මෙසේ වෙසතුරු මහරජහුගේ උතුම් වූ පුත්‍රදනය අනුමෝදන් වූව.

මද්‍රී පර්වය නිමි.

6729. ඉක්ඛිති ශ්‍ර අවසන්හි හිරු උදවත් මැ සක්දෙව්රජ (ජරපත්) බමුණු වෙසෙකින් යුතු වැ අලුයම්හි ඒ දෙදෙනාහට පැනිණි.

6730. කිම භවත්හට රෝග නැද්ද? කිම භවන්හට දුක් නැද්ද? කිම වනමුල්පලයෙන් යැපෙවු ද? කිම අල හා පලවැළ බොහෝ ඇද්ද?

6731. කිම මැසිමදුරුවෝ ද සර්පජාතීහු ද අල්ප වෙත් ද? චණ්ඩමෘගයන්ගෙත් ගැවැසිගත් වෙනෙහි කිම හිංසා නැද්ද යි.

6732. බමුණාණෙනි, අපට රෝග නැත් මැ යැ, තවද බමුණාණෙනි, අපට දුක් නැත් මැ යැ, තවද වනමුල්පෙලෙන් යැපෙමහ. තවද අල හා පලවැළ බොහෝ ඇත.

6733. මැසිමදුරුවෝ ද සරිසෘපයෝ ද අල්ප මැ යැ, වල් මුවන් ගැවැසිගත් වෙනෙහි අපට හිංසා නො පැනෙයි.

6734. සත්මසක් මුළුල්ලෙහි වෙනෙහි වසන ජීවශොකී වූ අප වෙතට බෙලි පැහැ හුණදණ්ඩ (සැරයටිය) ගෙන ආ අඳුන් දිව්‍යම් ධරන දෙවියන් පසස්නා මේ දෙවැනි බමුණහු ද දක්මෝ.

6735. බමුණ, තොපගේ මනා ඊමෙකි. තවද තොපගේ නොමනා ඊමෙක් නො වෙයි. තොපට යහපතක් වේවා, තොපගේ දෙපා ධොවන කරව, පන්සල තුළට පිවිසෙව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6736 තිත්‍ථුකානි පියාලානි මධුකෙ කාසුමාරියො,
එලානි බුද්දකප්පානී භුඤ්ජ බ්‍රහ්මෙ වරං වරං.

6737. ඉදම්පි පානීයං සීතං ආභතං ගිරිගබ්භරා,
තතො පිව මහාබ්‍රහ්මෙ සචෙ ත්වං අභිකඞ්ඛසි.

6738. අථ ත්වං කෙන වණ්ණෙන කෙන වා පන හෙතුනා,
අථප්පත්තො බ්‍රහාරඤ්ඤං තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

6739. යථා වාරිවහො පූරො සබ්බකාලං න ඛීයති,
එවං තං යාචිතාගඤ්ජිං භරියං මෙ දෙහි යාචිතො.

6740. දදාමි න විකම්පාමි යං මං යාචසි බ්‍රාහ්මණ,
සන්තං නප්පටිගුහාමි[1] දනෙ මෙ රමතී මනො.

6741. මද්දිං හත්ථෙ ගහෙත්වාන උදකස්ස ච කමණ්ඩලුං,
බ්‍රහ්මණස්ස අද දනං සිවීනං රට්ඨවඩ්ඪනො.

6742. තදසි යං භිංසනකං තදසි ලොමහංසනං,
මද්දිං පරිච්චජන්තස්ස මෙදිනී සමකම්පථ.

6743. නෙවස්ස මද්දී භකුටී[2] න සන්ධීයති න රොදති,
පෙක්ඛතෙවස්ස තුණ්හී සා එසො ජානාති යං වරං.

6744. ජාලිං කණ්හාජිනං ධීතං මද්දිදෙවිං පතිබ්බතං,
චජමානො න චින්තෙසිං බොධියා යෙව කාරණා.

6745. න මෙ දෙස්සා උභො පුත්තා මද්දී දෙවී න දෙස්සියා,
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා පියෙ අදසභං.

6746. කොමාරී යස්සහං[3] භරියා සාමිකො මම ඉස්සරො,
යස්සිච්ඡෙ තස්ස මං දජ්ජා වික්කිණෙය්‍ය හනෙය්‍ය වා.

---

1. නප්පටිගුය්හාමි–මජසං.
2. හාකුටී–මජසං
3. කොමාරියාහං–ස්‍යා. කොමාරී යසසාහං. මජසං.
* චරියාපිටක අකිත්තිවග්ග 9.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6736. තිඹිරිපල යැ පියල්පල යැ මී පල යැ කටුඵරමිණිය යැ යන මෙ පලවැළ දඬුවෙල්බෑ මී වැන්න, බමුණාණෙනි උතුම් උතුම් පල ගෙන වළඳව.

6737. ගල්කුසින් බට හොයින් අළ මෙ (කළෙහි) පැන් ද සිහිලැ. බමුණාණෙනි, ඉදින් තෙපි බියැටියහු නම් එයින් ගෙන පානය කරව.

6738. තවද තෙපි කිනම් කරුණෙකින් කිනම් හෙතුයෙකින් මහ අරනට පැමිණියවු ද? මා විසින් පුළුවුස්නාලදහු එ කරුණ කියව.

6739. යම්සේ පිරුණු නදී හැම කල්හි නො සිඳේ ද එ බඳු වූ තොප අයදනට අයිමි. මා විසින් අයදනාලද තෙපි මට තොපගේ අඹුව දෙව යි.

6740. බමුණාණෙනි, තෙපි යමක් මා අතින් ඉල්වවු නම් එය දෙමි. (දෙන්නට) නො සැලෙමි. ඇති දැය නො සඟවමි. මා සිත දනයෙහි ඇලෙයි. (කියා)

6741. මද්‍රී බිසව අත්හි ගෙන දිය පිරි කමඬලාව ද ගෙන (අතැ පැන් එව) සිව්රට වඩනා වෙසතුරු රජ බමුණුහට දන් දින.

6742. එ දවස් යම් බිහිසුණු බවෙක් වී ද, එ දවස් ලොමුදහ ගැන්මෙක් වී. මද්‍රීදේවිය පරිත්‍යාග කරත් මැ මහපොළෝ කම්පා වුව.

6743. මද්‍රී දෙවී (රොෂයෙන්) මුව නො හැකිළැ යැ. දුර්මුඛ නො වූ යැ, නො හැඬූ යැ. මියෙන් නො බැණැ තෙල වෙසතුරු රජ මට යම් වෘද්ධියක් ඇත් ද එය දනී යි ඔහු මුහුණ බලමින් මැ සිටියා.

6744. (මා පුතු) ජාලිය ද දුහිතෘ කෘෂ්ණාජිනා ද පතිනි මද්‍රී දෙවිය ද බුදු බව මැ පිණිස ත්‍යාග කරනුයෙම් නො සිතීමි.

6745. දෙදරුවෝ මට දෙවෂ්‍ය (අප්‍රිය) නො වෙති. මද්‍රී දෙවිය ද දෙවෂ්‍ය නො වෙයි. (ඔවුනට වඩා) සර්වඥ බව මට ප්‍රිය වෙයි. එ හෙයින් මම ප්‍රිය වූ අඹුදරුවන් දින්මි.

6746. කුමරි වූ මම යමක්හට භාර්‍යා වූමු ද ස්වාමි වූ තෙපි මට ඉසුරු වව. යමක්හට දෙන කැමැත්තවු නම් ඔහට මා දෙනු මැනැවැ. (ධන කැමැත) විකුණත් මැනැවැ (මස් කැමැත) මරත් මැනැවි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6747. තෙසං සඞ්කප්පමඤ්ඤාය දෙවිත්තෙ එතදබ්‍රවි,
සබ්බෙ ජිතා තෙ පව්වුහා යෙ දිබ්බා යෙ ච මානුසා.

6748. නිත්තාදිතා තෙ පඨවී සඤ්ඤෙ තෙ තිදිවං ගතො,
සමන්තා විජ්ජුතා ආගුං ගිරීනංච පටිස්සුතා.

6749. තස්ස තෙ අනුමොදන්ති උභො නාරදපබ්බතා,
ඉන්දෙ ච බ්‍රහ්මා ච පජාපතී ච,
සොමො යමො වෙස්සවණො ච රාජා
සබ්බෙ දෙවා අනුමොදන්ති දුක්කරං හි කරොති සො.

6750. දුද්දදං දදමානානං දුක්කරං කම්ම කුබ්බතං,
අසන්තො නානුකුබ්බන්ති සතං ධම්මො දුරන්තයො.

6751. තස්මා සතඤ්ච අසතඤ්ච නානා හොති ඉතොගති,
අසන්තො නිරයං යන්ති සන්තො සග්ගපරායණා.

6752. යමෙතං කුමාරෙ අදද හරියං අදද වනෙ වසං,
බ්‍රහ්මයානමනොක්කම්ම සග්ගෙ තෙ තං විපච්චතු.[1]

6753. දදමි හොතො හරියං මද්දිං සබ්බඞ්ගසොභනං,
ත්වඤ්ඤෙව මද්දියා ජන්තො මද්දී ච පතිනා සහ.

6754. යථා පයො ච සඞ්ඛො ච උභො සමානවණ්ණිනො,
එවං තුවං ච මද්දී ච සමානමනචෙතසා.

6755. අවරුද්ධෙත්ථ අරඤ්ඤස්මිං උභො සම්මථ අස්සමෙ,
ඛත්තියා ගොත්තසම්පන්නා සුජාතා මාතුපෙත්තිතො;
යථා පුඤ්ඤානි කයිරාථ දදන්තා අපරාපරං.

6756. සක්කොහමස්මි දෙවිත්තෙ ආගතොස්මි තවන්තිකෙ,
වරං වරස්සු රාජිසි වරෙ අට්ඨ දදමි තෙ.

6757. වරං චෙ මෙ අදෙ සක්ක සබ්බභූතානමිස්සර,
පිතා මං අනුමොදෙය්‍ය ඉතො පත්තං සකං ඝරං;
ආසනෙන නිමන්තෙය්‍ය පඨමං තං වරං වරෙ.

---

1. විපච්චිතං–මජ්ඣං, වි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6747. සක්දෙව් රජ ඔවුන්ගේ අදහස් දැනැ තෙල වදන් කී: යම් දිව්‍ය වූත් යම් මානුසිකවූත් (සැපත් වළහන මාත්සර්‍යය් සඞ්ඛ්‍යාත) පසමිතුරු කෙනෙක් වූ නම් එ හැමදෙන (අඹු දරුවන් දෙන) තොප විසින් දිනන ලදහ.

6748. තොප විසින් පෘථිවි නින්නාද කරවනලද, කිත්ගොස දෙව්ලොවට ගියෙ යැ, අකල් විදුලිය හිමවත සිසාර ගියා යැ, පර්වතයන්ගේ මෙන් පිළිරැව් නැඟිණ.

6749. තොපගේ ඒ දන නාරද යැ පර්වත යැ යන දෙනිකායයෙහි දෙවියෝ අනුමෝදන් වෙති, ඉන්ද්‍ර යැ බ්‍රහ්ම යැ ප්‍රජාපති යැ සොම යැ යම යැ යන දෙව්වරු ද වෙසවුණු මහරජ ද අනුමෝදන් වෙති. එ වෙසතුරු රජ දුෂ්කරයක් කෙරෙයි කියා හැම දෙවියෝ අනුමෝදන් වෙත්.

6750. අසත්පුරුෂයෝ වනාහි නො දියහැකි දය දෙනුවන් නො කටහැකි කිස කරනුවන් අනුකරණ ෆනා කෙරෙති. සත්පුරුෂයන්ගේ ධර්මය (අදහස්) සිතා නො දතහැකි.

6751. එ හෙයින් සත්පුරුෂයන්ගේ ද අසත්පුරුෂයන්ගේ ද මෙලොවින් සැවැ පරලෝගමන් වෙන් වෙන් වෙයි. අසත්පුරුෂයෝ නිරය යෙති. සත්පුරුෂයෝ සවර්ගපරායණ වෙත්.

6752. යම් හෙයෙකින් වෙනෙහි වෙසෙමින් දරුවන් දිනි ද අඹුව දිනි ද (එයින් නිපන්) තෙල බ්‍රහ්මයානය අවා බිම නො බැසැ සවර්ගයෙහි තොපට විපාක දේවා.

6753. සර්වඞ්ගශොභන වූ මද්‍රී දෙවිය හවත්හට භාර්‍යය් කොට දෙමි. මද්‍රී බිසවට තෙපි මැ නිසියහු, මද්‍රී ද හිමියා හා වසන්නට නිස්ස.

6754. යම්සේ කිරි ද ධොත සංඛය ද දෙක සම පැහැ ඇත්තාහු ද එ සෙයින් මැ තෙපි ද මද්‍රී ද (ආචාරාදීන්) සම වූ සිතින් යුක්ත වව.

6755. මවුපිය දෙපසින් සුජාත වූ ගොත්‍රයෙන් සමෘද්ධ වූ ක්ෂත්‍රිය වූ තෙපි දෙදෙන රටින් නෙරනලදහු මේ වෙනෙහි අසපුවෙකැ වාස කරවු. යළි යළි දන්දෙමින් පොහොනා පමණින් පින් කරව.

6756. මම දෙවියනට අධිපති සක්දෙව් රජ වෙමි. තොප සමීපයට අයිමි. රාජර්ෂිය, කැමැති වරයක් අයදුව, තොපට අටවරයක් දෙමි.

6757. හැම දෙවියනට අධිපති සක්දෙවිරජුනි, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් මා පියෙ මේ වෙනෙන් සියගෙට පැමිණීම පිළිගනීවා. සිහසුනෙන් පවරාවා. මේ වරය පළමු කොට ඉල්ලමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6758. පුරිසස්ස වධං න රොචෙය්‍යං අපිකිඤ්චිසකාරිකං,
වජ්ඣං වධඤ්ච මොචෙය්‍යං දුතියෙතං වරං වරෙ.

6759. යෙ වුද්ධා යෙ ච දහරා යෙ ච මජ්ඣිමපොරිසා,
මමෙව උපජීවෙය්‍යුං තතියෙතං වරං වරෙ.

6760. පරදාරං න ගවෙසෙය්‍යං සදාරපසුතො සියං,
ඵීනං වසං නගවෙසෙය්‍යං චතුත්ථෙතං වරං වරෙ,

6761. පුත්තො මෙ සක්ක ජායෙථ සො ච දීඝායුකො සියා,
ධම්මෙන ජිනෙ පඨවිං පඤ්චමෙතං වරං වරෙ.

6762. තතො රත්‍යා විවසනෙ සූරියස්සුග්ගමනම්පති,
දිබ්බා භක්ඛා පාතුභවෙය්‍යුං ඡට්ඨමෙතං වරං වරෙ.

6763. දදතො මෙ න ඛීයෙථ දත්වා නානුතපෙය්‍යහං,
දදං චිත්තං පසාදෙය්‍යං සත්තමෙතං වරං වරෙ.

6764. ඉතො චිමුච්චමානාහං සග්ගගාමී විසෙසගූ,
අනිබ්බත්තී තතො අඤ්ඤං අට්ඨමෙතං වරං වරෙ.

6765. තස්ස තං වචනං සුත්වා දෙවිස්සෙ එතදබ්‍රවි,
අව්‍හං වත තෙ තාතො පිතා තං දට්ඨුමෙස්සති.

6766. ඉදං වත්වාන මඝවා දෙවරාජා සුජම්පති,
වෙස්සන්තරෙ වරං දත්වා සග්ගකායං අපක්කමී.

සක්කපබ්බං නිට්ඨිතං.

6767. කඤ්ඤතං මුඛමාභාති හෙමං වුත්තත්තමගගිනා,
නික්ඛංව ජාතරූපස්ස උක්කාමුඛපහංසිතං.

6768. උභො සදිසපච්චඩ්හා උභො සදිසලක්ඛණා,
ජාලිස්ස සදිසො එකො එකා කණ්හාජිනා යථා.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6758. පුරුෂයක්හට වධ රුචි නො කෙරෙම්වා. දරුණු කම් කළ වධයට පැමිණවියැ යුත්තා ද වධයෙන් මුදනම්වා. මේ වරය දෙවනු කොට ඉල්වමි.

6759. යම් මහලු මිනිස් කෙනෙක් ඇද්ද, යම් ළදරු කෙනෙක් ඇද්ද, යම් මධ්‍යම පුරුෂ කෙනෙක් ඇද්ද, එ හැම දෙනා මා නිසා මැ ජීවත් වෙත්වා. මේ වරය තුන්වනු කොට ඉල්වමි.

6760. පරඹුවන් කරා නො යෙම්වා. සවදර සන්තොෂයෙහි නියැලෙම්වා. මාගමුන් වශයට නො යෙම්වා. මේ වරය සතරවනු කොට ඉල්වමි.

6761. සක්දෙවිරජුනි, මට පුතෙක් උපදිවා, හේ ද දීර්ඝායු ඇති වේවා. පෘථිවිය දුහැමින් දිනාවා (රජ කෙරේවා.) මේ වරය පස්වනු කොට ඉල්වමි.

6762. මා ජයතුරා නුවරට පැමිණි ඉක්බිති රෑ අවසන්හි හිරු උදවත් මැ දිවබොජුන් පහළ වේවා. මේ වරය සවනු කොට ඉල්වමි.

6763. මා දන් දෙත් මැ ක්ෂය නො වේවා. මම දන් දී නො පසුතැවෙම්වා. දෙමින් සිත පහදවම්වා. මේ වරය සත්වනු කොට ඉල්වමි.

6764. මම මේ ජාතියෙන් මිදෙනුයෙම් (තුසිපුරවදනා) වෙසෙස් ගමන් ඇති වැ සුගති ගමන් ඇති වෙම්වා. ඉක්බිති භවයෙහි පුනර්භව නැතියෙක් (බුදු) වෙම්වා. මේ වරය අටවනු කොට ඉල්වමි.

6765. ඒ වෙසතුරුහුගේ එ තෙපුල් අසා සක්දෙවිරජ තෙල තෙපුල් කී:- තොපගේ පියම්හරජ නොබෝ කල්හි තොප දක්නට එන්නෙ යැ යි.

6766. සුජා දෙවහනගේ හිමි වූ 'මඝ' නම් සක්දෙවිරජ මෙ වදන් කියා වෙසතුරු රජහට වර දී දෙව්ලොවට ගියේ යි.

ශක්‍ර පර්වය නිමි.

6767. ගින්නෙන් තවනලද රත්රන් සෙයින්, උදුනෙහි ලා පැහැ නැඟූ රන්කොඩොලක් සෙයින් තෙල කවරක්හුගේ මුහුණ බබළා ද?

6768. දෙදෙනා මැ සමාන අඟ පසඟ ඇතියහ, දෙදෙනා මැ යමාන ලක්ෂණ ඇතියහ, එකෙක් ජාලිය සමාන යැ, එකක් කෘෂ්ණාජිනා වැන්න.

6769. සීහා බිලාව නිකඛන්තා උභො සමපතිරූපකා,
ජාතරූපමයා යෙව ඉමෙ දිස්සන්ති දූරකා.

6770. කුතො නු භවං[1] භාරද්වාජ ඉමෙ ආනෙසි දූරකෙ,
අජ්ජ රට්ඨමනුපපන්නා කුතො ආගච්ඡසි බ්‍රාහ්මණ.[2]

6771. මයඤ්ඤෙත දූරකා දෙව දින්නා විඤ්ඤෙන සඤ්ඤය,
අජ්ජ පන්නරසා රත්තී යතො දින්නාමෙ[3] දූරකා.

6772. කෙන වා වාවපෙය්‍යෙන[4] සම්මාඤ්ඤයෙන සද්දහෙ,
කො තෙ තං දනමදද පුත්තකෙ දනමුත්තමං.

6773. යො යාවතං පනිට්ඨාසි භූතානං ධරණිරිව,
සො මෙ වෙස්සන්තරො රාජා පුත්තෙදසි වනෙ වසං.

6774. යො යාවතං ගති ආසි සවන්තීනංව සාගරො,
සො මෙ වෙස්සන්තරො රාජා පුත්තෙදසි වනෙ වසං.

6775. දුක්කතං වත හො රඤ්ඤ සද්ධෙන සරමෙසිනා,
කථං නු පුත්තකෙ දජ්ජා අරඤ්ඤෙ අවරුද්ධකෙ.

6776. ඉමං හොනෙහා නිසාමෙථ යාවන්තෙත්ථ සමාගතා,
කථං වෙස්සන්තරො රාජා පුත්තෙදසි වනෙ වසං.

6777. දසං දසික්ඛු සො දජ්ජා අස්සං වාස්සතරිරථං,[5]
හත්ථික්ඛු කුඤ්ජරං දජ්ජා කථං සො දජ්ජා දූරකෙ.

6778. යස්ස නත්ථි[6] සරෙ දූසො අස්සෙසා වාස්සතරිරථො,
හත්ථී ච කුඤ්ජරෝ නාගො කිං සො දජ්ජා පිතාමහ.

6779. දනමස්ස පසංසාම න ච නින්දාම[7] පුත්තකා,
කථන්නු හදයං ආසි තුම්හෙ දත්වා වණිබ්බකෙ.

---

1. භවං - මජ්ඣං.
2. කුහිං ගච්ඡසි බ්‍රාහ්මණ - මජ්ඣං.
3. ලබා - ස්‍යා.
4. වාවාය පෙය්‍යෙන - ස්‍යා. කෙන වාවාපෙය්‍යෙන - මජ්ඣං.
5. අස්සං වස්සතරිරථං - මජ්ඣං.
6. නස්ස - මජ්ඣං. නාස්ස - ස්‍යා.
7. නාවනින්දාම - මජ්ඣං. ස්‍යා.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6769. දෙදෙනා මැ ඔවුනොවුන්ට සමාන රූ ඇකියාහු ගුහා-යෙන් නික්මුණු සිහපොවුවන් වැනියහ. මේ දරුවෝ රනින් මවන ලද්දවුන් සේ පැනෙති.

6770-71. භවත් බමුණ, අද මෙ රටට පැමිණි ඔබ කොහි සිට එන්නෙහි ද? මේ දෙදරුවන් කොහි සිට ගෙනෙහි ද? සඳමහරජතුමනි, මේ දරුවෝ මට පහන් වූවකු විසින් දෙනලදහ, මේ දරුවෝ යම් දවසෙකැ මට දෙන ලද්දහු ද එතන් පටන් අද පසළොස්වන රාත්‍රිය යි.

6772. බමුණ, තා විසින් කවර නම් ප්‍රියවචනයෙන් ලබන ලදහු ද? සත්‍ය කරුණෙන් (අප) හදහව. කවරෙක් තට තමා දරුවන් උතුම් දන් කොට ඒ දන් දිනි ද?

6773. යමෙක් සත්නට මහපොළොව සෙයින් යදියනට පිහිට වී ද එ වෙසතුරු මහරජ වෙනෙහි වසනුයෙ තමා දරුවන් මට දින.

6774. යමෙක් නදීනට සාගරය මෙන් යදියනට පිහිට වී ද, එ වෙසතුරු මහරජ වෙනෙහි වසනුයෙ තමා දරුවන් මට දින.

6775. භවත්නි, සැදැහැති ගිහිගෙයි විසියටි රජහු විසින් එකත්නෙන් අයුක්තියක් කරනලද, රටින් නෙරනලදු වැ වෙනෙහි වසනුයෙ කුමට දරුවන් දෙන්නෙ යැ?

6776. භවත්නි, මෙහි යම්තාක් දෙනා රැස්වූහු ද එහැමදෙනා මේ අසවු, වෙසතුරු රජ වෙනෙහි වසනුයෙ කුමට දරුවන් දිනි ද?

6777. හෙ දසියක ද දසයකුද අශ්වයකුද අශ්වතරයන් යෙදූ රියක්ද දේවා, උතුම් ඇතකුදු දේවා, හෙ කුමට දරුවන් දෙන්නෙ යැ යි.

6778. මුත්තණුවනි, යමක්හට ගෙහි දසෙක් හෝ අසෙක් හෝ උතුම් අසුන් යෙදූ රියෙක් හෝ ගැඹුරු හඬ ඇති උතුම් ඇතෙක් හෝ නැත් නම් හේ කුමක් දෙන්නෙ යැ?

6779. දරුවනි, ඔහුගේ දන් පසසමිහ, තොප යදියාට දී ඔහු ළය කෙසේ වී දෝ හෝ?

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6780. දුක්ඛස්ස හදයං ආසි අථො උණ්හම්පි පස්සසි,
රොහිණීහෙව තම්බක්ඛී පිතා අස්සූනි වත්තයි,

6781. යං තං කණ්හාජිනාවොච අයං මං තාත බ්‍රාහ්මණො,
ලට්ඨියා පතිකොටෙති සරෙ ජාතංව දසියං.

6782. න චායං බ්‍රාහ්මණො තාත ධම්මිකා හොන්ති බ්‍රාහ්මණා,
යක්ඛො බ්‍රාහ්මණවණ්ණෙන ඛාදිතුං තාත නෙති නො;
නීයමානෙ පිසාචෙන කින්නු තාත උදික්ඛසි.

6783. රාජපුත්තී ච වො මාතා රාජපුත්තො ච වො පිතා,
පුබ්බෙ මෙ අඩ්ඪමාරුය්හ කින්නු තිට්ඨථ ආරකා.

6784. රාජපුත්තී ච නො මාතා රාජපුත්තො ච නො පිතා,
දසා මයං බ්‍රාහ්මණස්ස තස්මා තිට්ඨාම ආරකා.

6785. මා සම්මෙවං අවචුත්ථ දය්හතෙ හදයං මම,
චිතකා වීය[1] මෙ කායො ආසනෙ න සුඛං ලභෙ.

6786. මා සම්මෙවං අවචුත්ථ භීය්‍යො සොකං ජනෙථ මං,
නික්කිණිස්සාමි දණ්ඩෙන න වො දසා භවිස්සථ.

6787. කිමගසියං හි වො තාත බ්‍රාහ්මණස්ස පිතා අද,
යථාභූතං මෙ අක්ඛාථ පටිපාදෙන්තු බ්‍රාහ්මණං.

6788. සහස්සගසං හි මං තාත බ්‍රාහ්මණස්ස පිතා අද.
අච්ඡං කණ්හාජිනං කඤ්ඤං හත්ථිනා[2] ච සතෙන ච.

6789. උට්ඨෙහි කත්තෙ තරමානො බ්‍රාහ්මණස්ස අවාකර,[3]
දසීසතං දසසතං ගවං හත්ථුසභං සතං;
ජාතරූපසහස්සඤ්ච පුත්තානං දෙහි නික්කයං.

6790. තතො කත්තා තරමානො බ්‍රාහ්මණස්ස අවාකරි,
දාසීසතං දසසතං ගවං හත්ථුසභා සතං;
ජාතරූපසහස්සඤ්ච පුත්තානං දසි නික්කයං.

6791. නික්කිණිත්වා නහාපෙත්වා භොජයිත්වාන දරකෙ,
සමලඞ්කරිත්වා හණ්ඩෙන උච්ඡඩ්ඩෙ උපවෙසයුං.

---

1. චිතකායංව – මජ්ඣං.
2. හත්ථි ආදිකෙන ච – ස්‍යා. හත්ථිනාදිසතෙනව – මජ්ඣං.
3. අවාකරි – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6780. ඔහුගේ ළය (කන්සිරා කී වදනින්) දුක් වී, එ මතු නො වෙයි. මියෙන් උණු උඩුහුරු නල විහිට. රෙහෙණ නකත් සෙයින් තඹ පැහැ ඇස් ඇති මා පියෙ කඳුළු හෙළී.

6781. කන්සිරා මෙසේ යම් වදනක් කිවු ද, ''පියාණෙනි, මේ බමුණු ගෙහි උපන් දැස්සකට මෙන් මට පහර දෙයි.

6782. පියාණෙනි, මේ බමුණෙක් නො වෙයි, බමුණෝ දැහැමි වෙති. පියාණෙනි, යකෙක් බමුණු වෙසින් අප කන්නට ගෙන යයි. පියාණෙනි, යකකු විසින් ගෙන යනු ලබන කල්හි කුමට උපේක්ෂායෙන් බලා සිටිවු ද?'' යි.

6783. තොප මවු රාජපුත්‍රී යැ, තොප පියෙ රාජපුත්‍ර යැ පෙර මාගේ ඇකයෙහි නැඟී හිඳුව, කිම දැන් දුරු සිටීවු ද?

6784. අපගේ මවු රාජපුත්‍රී යැ, අපගේ පියෙ රාජපුත්‍ර යැ දැන් අපි බමුණුහුගේ දසයෝ වම්හ. එහෙයින් දුරු සිටුම්හ.

6785. සබඳ එසේ නහමක් කියව. මාගේ ළය දැවෙයි. මාගේ සිරුර අහුරු රසකට නැඟ කලක් වැන්න. හුනස්නෙහි සුව නො ලැබෙම්.

6786. සබඳ එසේ නහමක් කියව. බෙහෙවින් මට සෝ දනවවු. ධන දී විකිණිගන්මි. තෙපි දස් නො වවු.

6787. දරුවෙනි, තොප පියෙ තොප කොතෙක් අගය කොට මෙ බමුණුහට දින් ද? සබවස මැ කියව, බමුණුහට ධනය ප්‍රතිපාදන කෙරෙත්වා.

6788. මුත්නාවෙනි, මා පියෙ මා දහසක් අගය කොට බමුණුහට දින. කනිටු කෘෂ්ණාජිනා කන්‍යාව ඇතුන් සියයෙන් ද අශ්වාදි හැම සියයෙන් ද අගය කෙළේ.

6789. කාරිය කරවන ඇමැතිය, නැඟී සිටුව. යුහු වැ (මොහට) දියැයුතු තාක් දෙව. දැස්සන් සියයකුදු දසුන් සියයකුදු ඇතුන් සියයකුදු ගොනුන් සියයකුදු දෙනුන් සියයකුදු රන්නික දහසකුදු දරුවනට නිෂ්ක්‍රය (විකිණිගත් මිල) දෙව.

6790. ඉක්බිති කාරිය කරවන ඇමැති යුහු වැ දැසුන් සියයකුදු දසුන් සියයකුදු ඇතුන් සියයකුදු ගොනුන් සියයකුදු දෙනුන් සියයකුදු රන්නික දහසකුදු දරුවනට නිෂ්ක්‍රය දින.

6791. දරුවන් නිසේ කොට ගෙන නහවා වළඳවා අලඬාර-යෙන් සද ඇකයෙහි හිඳුවූහ.

6793. සීසං නහාතේ සුච්චත්ථේ සබ්බාභරණභූසිතෙ,
රාජා අඩ්ඪෙ කරිත්වාන අය්‍යකො පරිපුච්ඡථ.

6794. කුණ්ඩලෙ සුසිතෙ මාලෙ සබ්බාලඞ්කාරභූසිතෙ,[1]
රාජා අඩ්ඪෙ කරිත්වාන ඉදං වචනමබ්‍රවි:

6795. කච්චි උභො අරොගා තෙ ජාලි මාතාපිතා තව,
කච්චි උඤ්ඤෙන යාපෙන්ති කච්චි මූලඵලා බහූ.

6796. කච්චි ඩංසා ච මකසා ච අප්පමෙව සිරිංසපා,
වනෙ වාලමිගාකිණ්ණෙ හිංසා තෙසං න විජ්ජති.[2]

6797. අථො උභො අරොගා මෙ දෙව මාතාපිතා මම,
අථො උඤ්ඤෙන යාපෙන්ති අථො මූලඵලා බහූ.

6798. අථො ඩංසා ච මකසා ච අප්පමෙව සිරිංසපා,
වනෙ වාලමිගාකිණ්ණෙ හිංසා තෙසං න විජ්ජති.

6799. ඛණන්තාලූකලම්බානි බිළාලි තක්කලානි ච,
කොලං භල්ලාටකං බෙල්ලං සා නො ආහච්ච පොසති.

6800. යඤ්චෙව සා ආහරති වනමූලඵලභාරිකා,
තං නො සබ්බෙ සමාගන්ත්වා රත්තිං භුඤ්ජාම නො දිවා.

6801. අම්මා ච නො කිසා පණ්ඩු ආහරන්ති දුමපඵලං,[3]
වාතාතපෙන සුඛුමාලී පදුමං හත්ථගතාමිව.

6802. අම්මාය පතනූ කෙසා විචරන්ත්‍යා බ්‍රහාවනෙ,
වනෙ වාලමිගාකිණ්ණෙ ඛග්ගදීපිනිසෙවිතෙ.

6803. කෙසෙසු ජටං බන්ධිත්වා කච්ඡෙ ජල්ලමධාරයි,
චම්මවාසී ඡමා සෙති ජාතවෙදං නමස්සති.

6804. පුත්තා පියා මනුස්සානං ලොකස්මිං උදපජ්ජිසුං,
නහ නූනම්හාකං අය්‍යස්ස පුත්තෙ සෙනහො අජායථ.

6805. දුක්කතඤ්ච හි නො පුත්ත භූනහච්චා කතං මයා,
යොහං සිවීනං වචනා පබ්බාජෙසිං අදූසකං.

---

1. සබ්බාභරණභූසිතෙ – මජසං
2. කච්චිහිංසා න විජ්ජති – මජසං.
3. දුමුපඵලං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6793. මුත්නා මහරජ හිසින් ස්නාන කළ, පිරිසුදු වස්ත්‍ර හැඳි, සව්බරණින් සැදි දරුවන් ඇකයෙහි හිඳුවාගෙන පිළිව්සි.

6794. රජ තෙම රැව්දෙන කොඩොල් ඇති, පැළැඳි මල්දම ඇති, සව්බරණින් සදනලද දරුවන් ඈකයෙහි හිඳුවාගෙන මෙවදන් කී:

6795. කියග ජාලිය, තොපගේ මවුපිය දෙදෙන නීරෝගි ද? කිම වනමුල් පලයෙන් යැපෙත් ද? කිම අල හා පලවැළ බොහෝ ඇත් ද?

6796. කිම මැසිමදුරුවෝ සර්පයෝ අල්ප මැ වෙත් ද? කිම ව්‍යාලමෘගයන්ගෙන් ගැවැසිගත් වනයෙහි ඔවුනට පීඩා නැත් ද?

6797. එසේ යැ දේවයිනි, මාගේ මවුපිය දෙදෙන නීරොගී වෙති. එසේ මැ වනමුල් පලවැළයෙන් යැපෙති. එසේ මැ අල හා පලවැළ බොහෝ ඇත.

6798. එසේ මැ මැසිමදුරුවෝ ද සර්පජාතීහු ද අල්ප මැ වෙති. වල්මුවන්ගෙන් ගැවැසිගත් වෙනෙහි ඔවුනට පීඩා නැත.

6799. ඒ මවු කොමෝ අල ද භූරුඅල ද කටුඅල ද කොකටිය අල ද කණිමින් ඩෙබරපල ද බදුලුපල ද බෙලිපල ද ගෙනවුත් අප පොෂණ කරයි.

6800. වනමුල් පල ගෙන එන ඒ මවු යම් මැ දෑයක් ගෙන ඒ ද අපි හැම දෙනමෝ එක් වැ එය රාත්‍රියෙහි වළඳමහ. දහවල් නො වළඳමහ.

6801. අපගේ අම්මා ද සියුමැලි වූවා රුක්පල ගෙන එන්නී අවුසුළඟින් වැහැරී සුදු වැ ගියා. අතින් මැඩී පියුමක් වැන්න.

6802. ව්‍යාලමෘගයන්ගෙන් ආකීර්ණ වූ කගවෙහෙණුන් දිවියන් විසින් නිති සෙවුනාලද මහවනයෙහි ඇවිදුනා අම්මාගේ කෙස් ඉතා තුනී වැ ගියේ යැ.

6803. කෙස්හි දළමඩුලු බැඳැ සිටී. දෙකිසිලි දැලි ධරයි. සම හඳනී යැ. බිමැ හොවී. ගිනි පුදයි.

6804. ලොවහි මිනිසුනට දරුවෝ ප්‍රිය වැ උපදිති. අපගේ මුත්නාවන්ට දරුසනා නූපන් වනැ යි සිතමහ යි.

6805. දරුව, අප විසින් නපුරක් කරනලද. මා විසින් අභිවෘද්ධිය නසන ක්‍රියාවක් කරනලද. ඒ මම සිවිරටවැසියන්ගේ බසින් නිදෙස් පුතු රටින් නෙරපිමි.

6806. යං මෙ කිඤ්චි ඉධ අත්ථි ධනං ධඤ්ඤඤ්ච විජ්ජති,
එතු වෙස්සන්තරෝ රාජා සිව්රට්ඨේ පසාසතු.

6807. න දෙව මය්හං වචනා එහිති සිව්සුත්තමෝ,
සයමෙව දෙවෝ ගන්ත්වාන සිඤ්ච හොගෙහි අත්තජං.

6808. තතෝ සෙනාපතිං රාජා සඤ්ජයෝ අජ්ඣභාසථ,
හත්ථී අස්සා රථා පත්ති සෙනා සන්නාහයන්තු නං.
නෙගමා ච මං අනෙන්තු බ්‍රාහ්මණා ච පුරොහිතා.

6809. තතෝ සට්ඨිසහස්සානි යුධිනෝ චාරුදස්සනා,
විපමායන්තු සන්නද්ධා නානාවණ්ණෙහිලඞ්කතා.

6810. නීලවත්ථධරානෙකෙ පීතානෙකෙ නිවාසිතා,
අනෙකෙ ලොහිතඋණ්හීසා යුද්ධානෙකෙ නිවාසිතා;
විපමායන්තු සන්නද්ධා නානාවණ්ණෙහිලඞ්කතා.[1]

6811. හිමවා යථා ගන්ධධරෝ පබ්බතෝ ගන්ධමාදනෝ,
නානාරුක්ඛෙහි සඤ්ඡන්නෝ මහාභූතගණාලයෝ.

6812. ඔසධෙහි ච දිබ්බෙහි දිසා භාති පවාති ච,
විපමායන්තු සන්නද්ධා දිසා භන්තු පවන්තු ච.[2]

6813. තතෝ නාගසහස්සානි යොජයන්තු චතුද්දස,
සුවණ්ණකච්ඡා මාතඞ්ගා හෙමකප්පනවාසසා.

6814. ආරුළ්හා ගාමණීයෙහි තොමරඞ්කුසපාණිහි,
විපමායන්තු සන්නද්ධා හත්ථීකණ්ඩෙහි දන්තිකා.

6815. තතෝ අස්සසහස්සානි යොජයන්තු චතුද්දස,
ආජානීයාව ජාතියා සින්ධවා සීසවාහනා.

6816. ආරුළ්හා ගාමණීයෙහි ඉල්ලියා[3] චාපධාරිහි,
විපමායන්තු සන්නද්ධා අස්සපිට්ඨෙහිලඞ්කතා.

6817. තතෝ රථසහස්සානි යොජයන්තු චතුද්දස,[4]
අයෝ සුකතනෙමියෝ සුවණ්ණවිතපක්කරෙ.

---

1. නානාවණ්ණෙහි – මජ්ඣං.
2. දිසා භාති පවාතිව – මජ්ඣං.
3. ඉත්තියා – මජ්ඣං.
4. චාතුද්දස – මජ්ඣං.

* මෙම පොත්හි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6806. පුත, මෙහි මා සතු යම් කිසිවක් ඇද්ද, ධනධාන්‍යයක් ඇද්ද, එ හැම දෙමි. වෙසතුරු රජ ඒවා. සිවිරට අනුශාසනා කෙරේවා.

6807. දේවයිනි, සිවිරටවැසියන් කෙරෙහි උතුම් වූ වෙසතුරු රජ මාගේ බසින් නො එයි. දේවයෝ තුමූ මැ ගොස් පුතණුවන් භෝගයෙන් අභිෂේක කරව.

6808. ඉක්බිති සඳමහරජ සෙනෙවිහට මෙසේ කී: ඇත් අස් රිය පාබළ සෙනාවෝ සන්නද්ධ වෙත්වා. නිගමවැසියෝ ද පෙරෙව් බමුණෝ ද මා අනු වැ එත්වා.

6809. ඉක්බිති මනහර දසුන් ඇති සැටදහසක් යෝධයෝ සන්නද්ධ වැ නන් පැහැයෙන් සැරසුණාහු වහා එත්වා.

6810. ඇතැම් කෙනෙක් නීලවස්ත්‍රධර වැ ඇතැම් කෙනෙක් පීතවස්ත්‍රධර වැ අන්‍යයෝ රක්තවර්ණ උෂ්ණීෂ (නළල්පට) ධර වැ ඇතැම් කෙනෙක් ශ්වේතවස්ත්‍රධර වැ මෙසේ නන් පිළියෙන් සැරසුණාහු සන්නද්ධ වැ නො ලස් වැ එත්වා.

6811. සුවද මල්පල ඇති එ හෙයින් මැ 'ගඳමහන්' නම් ඇති නොයෙක් රුකින් වැසුණු යක්ෂ රාක්ෂසාදි මහාභූතගණයාට නිවාස වූ හිමවත් පර්වතය යමසේ-

6812. දිවඔසුයෙන් දිසා බබළා ද සුවද හමා ද එ සෙයින් සන්නද්ධ වූවාහු යුහු වැ එත්වා. පළන් අබරණින් දිසා බබළත්වා තවරගත් විලවුන් සුවද හමත්වා.

6813–14. ඉක්බිති රන්පොරොදු ඇති මහත් ශරීර ඇති රන්-සැදින් සදනලද, අඩයටි හා අකුසු ගත්අත් ඇති ඇතරුවන් විසින් අරා හිඳුනාලද තුදුස්දහසක් ඇතුන් යොදත්වා. දක්වනලද විහඟණ ඇති සන්නද්ධයෝ ඇත් කඳවින් යුහු වැ එත්වා.

6815–16. ඉක්බිති දුනු හී ධරන අසරුවන් විසින් අරා හිඳුනා ලද ජාතියෙන් ආජානෙය වූ සින්ධුදෙශයෙහි උපන් ශීඝ්‍රවාහන වූ තුදුස්දහසක් අසුන් යොදත්වා. අලඞ්කෘත වැ සන්නද්ධ වූවාහු අස්පිටින් යුහු වැ එත්වා.

6817. ඉක්බිති අය ලොහොයෙන් මොනවට කරනලද නිම්-වළලු ඇති, රන්කම් කළ රථාවයව ඇති, තුදුස්දහසක් රිය යොදත්වා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 20 හි ඇතුලත් කර ඇත.

6818. ආරොපෙන්තු ධජෙ තත්ථ චම්මානි කවචානි ච,
විපඤ්ඤෙන්තු ච වාපානි දළ්හධම්මා පහාරිනො;
ඛිපමායන්තු සන්නද්ධා රථෙසු රථජීවිනො.

6819. ලාජා ඔලොපියා[1] පුපඵා මාලාගන්ධිවිලෙපනා,
අන්නියානි ච පිට්ඨන්තු යෙන මගෙගන එහිති.

6820. ගාමෙ ගාමෙ සතං කුම්භා මෙරයස්ස සුරාය ච,
මගගමඤ්ච පතිතිට්ඨන්තු[2] යෙන මගෙගන එහිති.

6821. මංසා පූවා සඞ්කුලියා කුම්මාසා මච්ඡසංයුතා,
මගගමඤ්ච පතිතිට්ඨන්තු යෙන මගෙගන එහිති.

6822. සප්පි තෙලං දධිං බිරං කඛු[3] වීහි බහූ සුරා,
මගගමහි පතිතිට්ඨන්තු යෙන මගෙගන එහිති.

6823. ආළාරිකා ච සූද ච නටනට්ටක ගායකා,[4]
පාණිස්සරා කුම්භථූනියො මණ්ඩකා[5] සොකඩ්ඩායිකා.

6824. ආහණ්ඩෙන්තු සඛවිණා හෙරියො දෙණ්ඩිමානි[6] ච,
බරමුඛානි ධම්මන්තු වදන්තු එකපොක්ඛරා.

6825. මුතිඞ්ගා පණවා සඞ්ඛා ගොධා පරිවදෙනිකා,
දින්දිමානි ච හණ්ඩන්තු කුටුම්බදින්දිමානි ච.

6826. සා සෙනා මහති ආසි උයුත්තා සිවිවාහිනී,
ජාලිනා මගගනායෙන වඩ්ඪං පායාසි පඛතං.

